අභිධර්ම මාතිකා අධ්‍යයන ප්‍රවේශය

පූජ්‍ය කඩුවෙල අතුලකදණ හිමි

අභිධර්ම මාතිකා අධ්‍යයන ප්‍රවේශය

පටුනට මෙතනින් පිවිසිය හැක.

පටුන වෙත

අභිධර්ම මාතිකා අධ්‍යයන ප්‍රවේශය

මහාවිහාරවංශාවතංස, විනය විභූෂණ, ගණපාමොක්ඛාචාරිය,
ශාසන ජෝතිකාභිධජ

පූජ්‍යපාද නුවරඑළියේ ඤාණසීලාභිධාන

මහාස්ථවිරයන් වහන්සේගේ
ශිෂ්‍ය

ත්‍රිපිටකාචාර්‍ය, ශාස්ත්‍රපති

පූජ්‍ය කඩුවෙල අතුලඤාණ හිමි

විසින් සම්පාදිතයි

කර්තෘ විසින් ප්‍රකාශිත වෙනත් ධර්ම ග්‍රන්ථ

- පට්ඨාන ත්‍රි රාශිය (2022)
- පට්ඨාන ප්‍රකරණ අධ්‍යයන ප්‍රවේශය (ශුද්ධ සංඛ්‍යා සහ ස්වරූපාර්ථ) (2023)

සබ්බදානං ධම්මදානං ජිනාති

අභිධර්ම පිටකයට අයත් ධම්මසංගණිප්‍රකරණය හැදෑරීමට අත්වැලක් ලෙස සකස් වන "අභිධර්ම මාතිකා අධ්‍යයන ප්‍රවේශය" නමැති මෙම ග්‍රන්ථය මුද්‍රණය කරන්නට ලැබීම ඉමහත් ධර්ම ප්‍රීතිය උපදවන්නක් බව කිව යුතුය. ඊට හේතුව නම් සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් වදාළ අභිධර්ම පිටකය හැදෑරීමට මෙන් ම තදනුරූපව ප්‍රායෝගිකව සිය දිවියට යොදා ගන්නට කැමැති බොහෝ ගිහි-පැවිදි පිරිස සිටින බැවිනි. මෙම ග්‍රන්ථය මුද්‍රණය කිරීම සඳහා අවකාශ ලැබෙන්නේ ද දායක පින්වතුන්ගේ සසුන් හිතකාමී අධ්‍යාශය මෙන් ම ධර්මවිනයට ඇති ලැදි භාවය නිසා ම යැයි කීම අතිශයෝක්තියක් නොවනු ඇතැ'යි සිතමි.

තථාගත දේශනාව සිහි කරන අප සැම දන්නා කාරණය නම් "සියලු දානයට වඩා ධර්ම දානය උතුම් බව" යි. ධර්මය නො අසන්නාහු නම් සත්ත්වයෝ හැන්දක් පමණ කැඳ හෝ බත් හෝ දන් නො දෙන්නාහ. එසේ ම සියලු ම බුදුරජාණන් වහන්සේලා සහ පසේ බුදුරජාණන් වහන්සේලා හැරපියා කල්පයක් පුරාවට වැසි වසින කල්හි වැහි බින්දු වුව ද ගණන් කිරීමට හැකි ප්‍රඥාවෙන් සමන්විත වූ සැරියුත් ආදි තෙරවරු වුව ද ස්වකීය ඥානයෙන් ම සෝවාන් ආදි මගපල ලබන්නට සමත් නො වෙති. අස්සජී තෙරුන් වහන්සේලා විසින් කියනු ලැබූ ධර්මය අසා ම මගපල ලැබූහ. සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ධර්මදේශනාවෙන් ශ්‍රාවක පාරමී ඥානය සාක්ෂාත්කාර කළහ. එබැවින් ධර්ම දානය උතුම් වේ.

මුද්‍රණය සඳහා අවස්ථාව සලසා දෙන දායක මහතා විසින් කරනු ලබන්නේ ද ධර්ම දානමය පුණ්‍ය කර්මයකි. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් දේශිත ථෙරීය පරම්පරානුයාත ව අපට ලැබුණු ධම්මසංගණිප්‍රකරණය හැදෑරීමට පදනම සකසන්නා වූ මෙම ග්‍රන්ථය, මුද්‍රණය කොට සැදැහැති ධර්මකාමීන් වෙත බෙදා දීමට කළ අදහස ද ප්‍රශංසාර්හ ය.

මෙම ධර්ම ග්‍රන්ථය මුද්‍රණය සඳහා සද්භාවයෙන් හා ඉතාමත් උනන්දුවෙන් ස්වකීය දායකත්වය දුන් ශාසනාභිවෘද්ධිකාමී දායක පිරිස

වන සුජීවා ගුණහේරත් මහත්මිය, ජනක විතානගේ මහතා, අනුරාධ ප්‍රනාන්දු මහතා සහ පවුලේ පින්වතුන්, සමිත හෙට්ටිආරච්චි මහතා යන පින්වත් සැමදෙනාට ම මෙම ධර්ම දානමය පුණ්‍යය සුඛ ප්‍රතිපදාවෙන් ඉතා ම ඉක්මන් මොහොතක දී නිවන් අවබෝධය පිණිස හේතු වේවා! සියලු යහපත වේවා! පින් කැමැති සම්‍යක්දෘෂ්ටික වූ සියළු දෙව් බඹුන් මෙපින් අනුමෝදන් වෙත්වා!

තව ද සුජීවා ගුණහේරත් මහත්මිය නමින් අභාවප්‍රාප්ත තම පියාණන් වහන්සේ වන වෛද්‍යාචාර්ය ධර්මරත්න ගුණහේරත් මහතාට ද 2021.01.16 වන දින අභාවප්‍රාප්ත වූ එංගලන්තයේ ජීවත් වූ වෛද්‍යාචාර්ය මාලින්ද දිසානායක මහතාට හා 2022.09.25 දින අභාවප්‍රාප්ත වූ ජේ.එච්. කරුණාපාල පියාණන් වහන්සේට ද ඇතුළුව මියපරලොව ගිය පින් අනුමෝදන් වනු කැමැති සියලු ඥාති හිතමිත්‍රාදීන්ට මෙපින් අනුමෝදන් කරමු. එසේ ම සුජීවත්ව සිටින එතුමියගේ මැණියන් වහන්සේ වන චන්ද්‍රා ගුණහේරත් මහත්මියට ධර්ම මාර්ගය පහසුවෙන් වඩා මෙ අත්බවෙහි ම මගපල නිවන් අවබෝධ කරගැනීමට මෙන් ම කර්තෘ වන අප ඇතුළු මගපල නිවන සඳහා වීර්යය වඩන්නා වූ සියළු මහෝත්තමයාණන් වහන්සේලාට නිවන් පූරණය කරන්නට උපකාරක ධර්මයක් ම වේවා. මෙම ධර්ම දානමය කුශලයෙහි ලා එතුමියව සමාදන් කළ චාමිනී සමන්තිකා හා ලෙස්ලි යන දෙපළ සහ ග්‍රන්ථ මුද්‍රණයෙහි සම්බන්ධීකරණ කටයුතු කරන සමිත හෙට්ටිආරච්චි මහතාට සහ උපකාර කළ සැමට මෙම ධර්ම දානය උත්තරීතර ශක්තිමත් පාරමී ධර්මයක් ම වේවා යැයි අපි ඉත සිතින් ප්‍රාර්ථනා කරමු.

මීට,

මෙත් සිතින්,

පූජ්‍ය කඩුවෙල අතුලඤ්ඤණ හිමි.

තිපිටක කම්හෝජ විහාරය,
උතුරු ශැන් ප්‍රාන්තය,
නෞන්ජෝ නගරය,
මියන්මාරය.
2023-01-10

ඇදුරු ආශිර්වාදය

අභිධර්ම මාතිකා අධ්‍යයන ප්‍රවේශය නමින් අද දින ප්‍රකාශයට පත් වන මේ ග්‍රන්ථය ධම්මසංගණිප්‍රකරණය හැදෑරීමට ප්‍රථමයෙන් අධ්‍යයනය කිරීමට විරචිත අගනා ග්‍රන්ථයකි.

අභිධර්මය ත්‍රිපිටක පාළියෙහි ඇතුලත් පරම ගම්භීර ධර්මයයි. එහි පිවිසුම ධම්මසංගණිප්‍රකරණයයි. එබැවින් ධම්මසංගණිප්‍රකරණය හදාරණ ශිෂ්‍යයින් මනාව එහි ප්‍රාගුණ්‍යය ඇති කරගත යුතු වෙයි. පුරාණ මහාවිහාරයීය පරියප්ති සම්ප්‍රදාය තුල ධම්මසංගණියෙහි එන මාතෘකා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළේ මේ හේතුවෙනි. ධම්මසංගණියෙහි එන මාතෘකා උදුරා මාතිකාපාළියත් ඒ මාතිකාපාළියම සුවසේ උගැන්ම පිණිස පරිවාර ග්‍රන්ථ කිහිපයකුත් රැසයුණේ මේ හේතුවෙන්ය.

මහාවිහාර වංශාලංකාර, අභිධර්මඤ්ඤෙය්‍යාභිධජ, ශාසන ජෝතික, ථේරවාදි ධර්ම අධ්‍යයන පීඨයේ කථිකාචාර්ය, ත්‍රිපිටකාචාර්ය කඩුවෙල අතුලඤාණ ස්ථවිරයන්වහන්සේ අවුරුදු කිහිපයක් පුරාවට බුරුම රට පරියප්ති මධ්‍යස්ථානයන් හී සැරිසරමින් ඒ ඒ තැතින් උගත යුතු ධර්ම කොටස් මනාව හදාරමින් විශේෂයෙන් ම අභිධර්මය පිළිබඳ විශේෂඥ දැනුමක් ඇතිකරගත් යතිවරයෙකි.

පටුන වෙත

උන්වහන්සේ බුරුම දේශයට වැඩම කරනුයේ ත්, එම දේශයෙදි ඉගෙන ගැනීම් කටයුතු කරනුයේ ත් ගුරුවරුන්ගේ ආරාධනා හා ආශිර්වාදය ඇතිව වීමත් විශේෂත්වයකි. ගතින් සැතපුම් දහස් ගණනකින් ඈත සිට මේ කටයුතු වල නියුතු වූ ඒ සත්පුරුෂ ශිෂ්‍යවරයා, සිතින් ගුරුශිෂ්‍ය සබඳතා කිසි ලෙසකින්වත් අත්නොහළේය. හැකි සැම විට ගුරුන් විමසා කටයුතු කිරීමට වගබලාගත් බවද කිවමනාය.

එබඳු සත්පුරුෂ උගතෙකු අතින් අද දින අභිධර්ම පරියප්තිකාමීන් හට පිදෙන මේ; අභිධර්ම මාතිකා අධ්‍යයන ප්‍රවේශය නම් කෘතිය බුදුසසුනේ චිරපැවැත්මට හේතුවනු නොඅනුමානයි.

එය සහශ්‍ර සංඛ්‍යාත සිසුන් පිරිසකට ධම්මසංගණි ප්‍රකරණය පහසුවෙන් ඉගෙනීමට මහත් පිටුවහලක් වනු නොඅනුමානයි. මේ සිසුවරයා නිර්මාණය කිරීම වෙනුවෙන් අප කළ හැම ශාසන සංග්‍රහයකටම ප්‍රතිසාධාරණයක් ඔහු විසින් ඉටු කරනු දැක සොම්නස් වෙමි. දහම් මිහිරෙන් සැනසෙමි.

කඩුවෙල අතුලඤාණ ස්ථවිරයන්වහන්සේගේ ධර්මඥාන හා ශාස්ත්‍රඥාන තවතවත් දියුණු වේවා! ලක්දිව බුදු සසුනට එය ආලෝකයක් වේවා!

මෙයට සසුන් දියුණුව පතන මා,

නුවරඑළියේ ඤාණසීල මහා ස්ථවිර.

ඇදුරු පරපුරේ ආශිර්වාදය

ඉර සඳු දෙදෙනාටම කළ හැක්කේ ලෝකයාට ආලෝකය දී අන්ධකාරය දුරලීමයි. එවැනි ඉර සඳු දහසක් පැයුවේ ද, ලෝක සත්වයාගේ මෝහය දුරලීමට නොහැකිය. එය ලොවුතුරා බුදුරජාණන් වහන්සේ නැමැති ඒ අසම සම උත්තමයන්ගේ පහළවීමෙන් පමණක් සිදුවන අතිශය දුර්ලභ කරුණකි. රාග, ද්වේශ, මෝහ නම් වූ ගින්නෙන් දැවෙමින් ජාති, ජරා, ව්‍යාධි, මරණාදී සංසාර දුකෙන් කෙළිලොම් කරනා ලෝ සතාට බුදු කෙනෙකුන්ගේ පහළ වීමෙන් ඒ උත්තම ධර්මය තුලින් ධම්මානුචාරී වීමත් යනු ලෝසතාට ඇති එක ම පිළිසරණයි. ඒ කුමක් හෙයින් ද යත්, භාග්‍යවතුන් වහන්සේගේ උතුම් ධර්මය ලෝ සතාට දුකෙන් තොර වූ සදාතනික සැපය වන නිර්වාණය කරා රැගෙන යන බැවිනි.

එදා අප භාග්‍යවතුන් වහන්සේ වදාළා "පඤ්ඤාවන්තස්සායං ධම්මො නායං ධම්මො දුප්පඤ්ඤස්ස" යනුවෙන් මේ ධර්මය නුවණ ඇති සත්වයාට යි. දුප්පඤ්ඤයා හට නොවන බව යි. එවැනි නුවණ ඇති සත්වයෝ මේ ලෝකයේ අතිශය දුර්ලභයි.

වත්මන් යුගයේ මෙන් ම අනාගතයේ සිටින නුවණැති සත්වයන් සඳහා තම තමන්ගේ ප්‍රඥාව දියුණු කරනු වස් පූජ්‍ය කඩුවෙල අතුලඤාණ හිමියන් මේ ගන්නා උත්සාහය ප්‍රශංසා කළ යුතු යි. මීට ප්‍රථමව ද පට්ඨාන ත්‍රි රාශිය නැමැති පොත සම්පූර්ණකොට මහත් ශාසනික මෙහෙවරක් සිදු කළ අතර එය බොහෝ පිරිසකට වැඩ දායකයැයි සිතමි. එපමණකින් නොනැවතී "අභිධර්ම මාතිකා අධ්‍යයන ප්‍රවේශය" නැමැති මෙම ග්‍රන්ථය සකස් කිරීමේ අරමුණ ද

බුදු සසුනේ ඵල නෙලන්නන්ට පහසුවෙන් එය සිදු කිරීමට මග සැලසීම යි. ධම්මසඞ්ගණී ප්‍රකරණයේ ඇතුළත් වී ඇති මෙම මාතිකා කොටස පහසුවෙන් විස්තර ඇතිව ඉගෙනීමට මෙම ග්‍රන්ථය සම්පාදනය ද නිහතමානීව අගය කරමි.

පූජ්‍ය නා උයනේ අරියධම්ම මහතෙරුන් වහන්සේ සහ තවත් උගතුන් වහන්සේලාගේ ග්‍රන්ථ තුලින් වගේ ම ස්ව ඥාණයෙන් සම්පාදනය කරන ලද මෙම ග්‍රන්ථය බොහෝ සත්වයන්ට වැඩ දායක වෙත්වා. පූජ්‍ය කඩුවෙල අතුලඤාණ ස්වාමින්වහන්සේ ප්‍රධානව මෙම පොත සම්පාදනයට යම් උපකාරයක් කළ හැමටත්, මහ තෙරුන් වහන්සේලාටත් නිවන පසක් වේවා. මෙම පොත පරිශීලනය කරන සැමටත් මෝහාන්ධකාරය දුරලා වහ වහා ම නිවන ම අවබෝධ වේවායි මෙත් සිතින් සිහිපත් කරමි.

මෙයට

මෙතැති,

පහලවිටියල ජනානන්ද ස්ථවිර.

ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ මහෝපාධ්‍යා,

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රමාධිපති,

ප්‍රධාන අනුශාසක හා ප්‍රධානාචාර්ය,

ශ්‍රී කල්‍යාණධර්ම ආශ්‍රමය,

කොළඹ 07.

"අභිධර්ම මාතිකා අධ්‍යයන ප්‍රවේශය - සුභාංශංසනය"

අභිධර්ම මාතිකා අධ්‍යයන ප්‍රවේශය යන නමින් පූජ්‍ය කඩුවෙල අතුලඤාණ අයුෂ්මතුන් වහන්සේ ලියා ඇති මේ ග්‍රන්ථය අභිධර්මය හදාරන ගිහි පැවිදි හැම කෙනාටම අතිශයින් ප්‍රයෝජනවත් ග්‍රන්ථයකි. අභිධර්ම ප්‍රවේශය යනු අප භාග්‍යවතුන් වහන්සේ බුද්ධත්වය අවබෝධ කිරීමෙන් සතර වන සතියේ දෙවියන් විසින් මවා පෑ රුවන් ගෙහි දී ඉතාම ගැඹුරු අභිධර්මය සම්මන්ත්‍රනය කරමින් සිටිය දී භාග්‍යවතුන් වහන්සේගේ ඉතා සියුම් ගැඹුරු ඥානය ප්‍රභාශ්වර වීමෙන්, නාම රූප සම්මශ්‍රමය වීමෙන් පට්ඨාන ප්‍රහරනයට බැස ගනිමින් ඉතා සියුම් ධර්මයන් භාග්‍යවතුන් වහන්සේගේ ඥානයට ගෝචර වීමෙන් විවිධ නය ක්‍රමයෙන් ප්‍රභාශ්වර වූ ප්‍රඥාවෙන් අතිශයින් සතුටක් ඇති වූ බැවින් ලේ ධාතුව ද අතිශයින් ප්‍රභාෂ්වර වී ඇත. බුද්ධ ශීර්ෂයෙන් ෂඩ් වර්ණ බුදුරැස් මාලාවන් විහිදෙන්න විය. භාග්‍යවතුන් වහන්සේගේ ඥානය හා ප්‍රීතිය එකතු වීමෙන් ගුඹුරු ධර්මයන් කරා බස ගත් බව ප්‍රකට කරුණකි.

එවැනි ගැඹුරු ධර්මයක් ගැන විස්තර සහිතව ඉදිරිපත් කිරීම අභිධර්ම න්‍යාය ක්‍රම හදාරන නවක ගිහි පැවිදි අයට මග පෙන්වන ඉතා ප්‍රයෝජනවත් ග්‍රන්ථයක් බව අපට පැවසිය හැකිය.

පටුන වෙත

මෙම විස්තර සහිත ග්‍රන්ථය ලියා දැක්වීමට පූජ්‍ය අතුලඤාණ ආයුෂ්මතුන් විසින් කරන ලද උත්සාහය පැසසුම් සහගතය.

සතං සමාගමො හොතු - යාව නිබ්බානපත්තියා.

මේ වගට,

මෛත්‍රියෙන්,

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා සංඝ සභාවේ

ගරු ප්‍රධාන සභාපති,

ත්‍රිපිටකාචාර්ය, කම්මට්ඨානාචාර්ය,

පූජ්‍යපාද මීතලාවේ විනීත ස්ථවිර වම්හ.

අතිවිස්තාරිත පරමාර්ථ ධර්මයෝ

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් සත් වැනි වස්සාන කාලය තව්තිසා දෙව්ලොව ගත කළ සේක. එහි දී තුන් මාසයක් පුරාවට අභිධර්ම දේශනාව වදාළහ. 42000 ක් වූ ධර්මස්කන්ධය අභිධර්ම පිටකයට ඇතුලත් ය. බුදුරජාණන් වහන්සේ තුන්මසක් වදාළ ධර්මය පොත්වලට ගැනීම කරන්නේ නම් ග්‍රන්ථ සිය ගණනක් වේ. සැරියුත් මහරහතන් වහන්සේට වදාළ ධර්මය ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා 500 නමකට ඉගැන්වූහ. ඒ ධර්මය අප සතුව ඇත.

ධම්මසඞ්ගණී ප්‍රකරණය, විභඞ්ගප්‍රකරණය, ධාතුකථා ප්‍රකරණය, පුග්ගලපඤ්ඤත්ති ප්‍රකරණය, කථාවත්ථු ප්‍රකරණය, යමක ප්‍රකරණය, පට්ඨාන ප්‍රකරණය යැයි ග්‍රන්ථ සතකි. මහා සාගරය වෙරළ ආසන්න නොගැඹුරුය. ඉදිරියට යෑමෙන් ක්‍රමක් ක්‍රමයෙන් ගැඹුරු වේ. එසේ අභිධර්ම දේශනය ද ක්‍රම ක්‍රමයෙන් ගැඹුරු වේ. සමන්ත පට්ඨාන ප්‍රකරණය ඉතා ගැඹුරුය. ගුරු මුඛයෙන් ම ලබාගත යුතු ය.

අභිධර්ම මාතිකා යන කොට මෙම ග්‍රන්ථයට ඇතුලත් ය. බුරුම භාෂාවෙන් තිබුණ ග්‍රන්ථයක් මෙසේ සිංහල භාෂාවට නංවා පාඨක ඔබ අතට පත්වීම සතුටට කාරණයකි. පූජ්‍යපාද කඩුවෙල අතුලඤාණ ස්ථවිරයන් වහන්සේ මහා නුවණකින් මෙය පරිවර්තනය කිරීම ගැන සතුටු වෙමි.

තික මාතිකා 22 කි. එය මනාකොට හැදෑරීමෙන් චිත්ත, චෛතසික, රූප, නිර්වාණ යන සතර පරමාර්ථ පිළිබඳව දැන ගත

හැකිය. එක සිතක් තුල ස්කන්ධ, ආයතන, ධාතු, සත්‍ය මනාකොට විභාග කොට දක්වා ඇත. ඒ අනුව මාතිකා පාළිය අති විශිෂ්ඨය. මෙම ග්‍රන්ථය ඉගෙන ගැනීමට පළමුව සිත් 89, චෛතසික 52, රූප 28, නිර්වාණය ඉගෙන ගත යුතු ය. කුසල් සිත් 21, අකුසල් සිත් 12, විපාක සිත් 30, ක්‍රියා සිත් 20 මනාව ඉගෙන ගත යුතු ය. සබ්බචිත්තසාධාරණ චෛතසික 7, ප්‍රකීර්ණක චෛතසික 8, අන්‍යසමාන චෛතසික 13, අකුසල චෛතසික 14, සෝභන චෛතසික 25 දැනගත යුතු ය.

කාමාවචර සිත්	54	භූමි භේදයෙන් සිත් 89
රූපාවචර සිත්	15	
අරූපාවචර සිත්	12	
ලොකෝත්තර සිත්	08	
අකුසල් සිත්	12	ජාති භේදයෙන් සිත් 89
කුසල් සිත්	21	
විපාක සිත්	36	
ක්‍රියා සිත්	20	
අහේතුක සිත්	18	අහේතුක සහේතුක භේදයෙන් සිත් 89
සහේතුක සිත්	71	
අශෝභන සිත්	30	අශෝභන ශෝභන භේදයෙන් සිත් 89
ශෝභන සිත්	59	
කාමාවචර සිත්	54	සිත් 89
මහද්ගත සිත්	27	
ලොකෝත්තර සිත්	08	
සුඛ සහගත සිත්	01	ඉන්ද්‍රිය භේදයෙන් සිත් 89
සෝමනස්ස සහගත සිත්	38	
දුක්ඛ සහගත සිත්	01	
දෙමනස්ස සහගත සිත්	02	
උපෙක්ඛා සහගත සිත්	47	
සුඛ සහගත සිත්	31	වේදනා භේදයෙන් සිත් 89
දුක්ඛ සහගත සිත්	03	
උපෙක්ඛා සහගත සිත්	55	
ප්‍රථම ධ්‍යාන සිත්	11	ධ්‍යාන භේදයෙන් සිත් 67
දුතිය ධ්‍යාන සිත්	11	
තතිය ධ්‍යාන සිත්	11	
චතුත්ථ ධ්‍යාන සිත්	11	
පඤ්චම ධ්‍යාන සිත්	55	

කාමාවචර සිත්	54	භූමි භේදයෙන් සිත් 121
රූපාවචර සිත්	15	
අරූපාවචර සිත්	12	
ලොකෝත්තර සිත්	40	
අකුසල් සිත්	12	ජාති භේදයෙන් සිත් 121
කුසල් සිත්	37	
විපාක සිත්	52	
කිරියා සිත්	20	
සුඛ සහගත සිත්	01	ඉන්ද්‍රිය භේදයෙන් සිත් 121
සෝමනස්ස සහගත සිත්	62	
දුක්ඛ සහගත සිත්	01	
දෙමනස්ස සහගත සිත්	02	
උපෙක්ඛා සහගත සිත්	55	
සුඛ සහගත සිත්	63	වේදනා භේදයෙන් සිත් 121
දුක්ඛ සහගත සිත්	03	
උපෙක්ඛා සහගත සිත්	55	
සහේතුක සිත්	18	අහේතුක සහේතුක භේදයෙන් සිත් 121
අහේතුක සිත්	103	
ලෞකික සිත්	81	ලෞකික ලෝකෝත්තර භේදයෙන් සිත් 121
ලොකොත්තර සිත්	40	

කුසලා ධම්මා, අකුසලා ධම්මා, අබ්‍යාකතා ධම්මා යනුවෙන් ආරම්භකොට තික මාතිකා 22ක්, දුක මාතිකා 100ක් සහ සුත්තන්ත මාතිකා 42ක් වදාළහ.

එමනිසා අධ්‍යනය ලබන සියලුම දෙනා මූලික දැනුම ලබාගත යුතු ය. ඉන් අනතුරුව ත්‍රික මාතිකාපාළිය අර්ථ හැදෑරිය යුතු ය. මෙය හරිහැටි ඉගෙන ගැනීම කරන්නේ නම් "චුල්ල සෝතාපන්න" යැයි කියනු ලැබේ. සෝවාන් මාර්ගඵල නොලැබුවත් එවැනි කෙනෙක් වැනිය යැයි සඳහන් වේ.

පූජ්‍ය කඩුවෙල අතුලඤාණ ස්වාමින්වහන්සේගේ කෘත හස්ත භාවයකින් භාවිත හිතකින් සාංසාරික පුහුණුවක් නිසා මෙම ග්‍රන්ථය ඔබ අප අතට පත් කෙරේ. කීපවිටක් කියවා ඉගෙන ගැනීමට උත්සාහවත් විය යුතු ය.

ලේඛකධූරය හොබවන පූජ්‍ය කඩුවෙල අතුලඤාණ ස්ථවිරයන් වහන්සේට තෙරුවන් සරණින් නිදුක් නීරෝගී සුව දිගාසිරි ලැබේවා.

ධර්ම ඥාණය තව තවත් දියුණු වේවා. බුද්ධ සාසනයට මහඟු සේවයක් කිරීමට ශක්තිය බලය ධෛර්ය ඥාණය ලැබේවායි මෙත් සිතින් ආශිර්වාද කරමි.

මෙයට,

ශ්‍රී කළ්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ මහා ලේඛකාධිකාරී,

ත්‍රිපිටකාචාර්‍ය, ත්‍රිපිටක විශාරද,

පූජ්‍යපාද කහගොල්ලේ සොමවංස මහා ස්ථවිර,

ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානය,

ගල්දූව, කහව,

අම්බලන්ගොඩ.

අභිධර්ම ප්‍රකරණයෙහි පැමිණි මාතිකා

කෙනට්ඨෙන මාතිකා? මාතුසමට්ඨෙන. මාතා වියාති හි මාතිකා.
(මෝහවිච්ඡේදනී)

කෙනට්ඨෙන මාතිකා? කුමන අර්ථයකින් මාතිකාවෝ නම් වෙත්ද? **මාතුසමට්ඨෙන.** මවකට සමාන අර්ථයෙනි. **මාතා වියාති හි මාතිකා.** මවක් මෙන් වන්නේනුයි **මාතිකා** ය.

යථාහි මාතා නානාවිධෙ පුත්තෙ පසවති, තෙ පාලෙති, පොසෙති ච. (මො.වි) මවු තොමෝ යම් සේ වනාහි නානාවිධ පුත්‍රයන් ප්‍රසූත කරයි ද, ඔවුන් පාලනය කරයි ද, පෝෂණය කරයි ද. **එවමයම්පි නානාවිධෙ ධම්මෙ, අත්ථෙ ච පසවති, තෙ ච අවිනස්සමානෙ පාලෙති, පොසෙති ච. තස්මා "මාතිකා'ති වුච්චති.** (මො.වි) මෙපරිද්දෙන් ම මේ නානාවිධ ධර්මයන් අර්ථ වශයෙන් ප්‍රසූත කරයි ද, ඒ ධර්ම විනාශ වීමට නොදී පාලනය කරයි ද, අර්ථ වශයෙන් පෝෂණය කරයි ද යන අර්ථය හේතු කරගෙන මාතිකා යැයි කියනු ලැබේ.

මාතිකං හි නිස්සාය ධම්මසඞ්ගණි ආදී සත්තප්පකරණවසෙන විත්ථාරීයමානා අනත්තාපරිමාණා ධම්මා. (මො.වි) මාතිකාවක් හේතුකොට ගෙන වනාහි අර්ථ කියන්නේ නම් ධම්මසංගණී ආදී සත්තප්‍රකරණ වශයෙන් විස්තර කරන්නා වූ අනන්ත අපරිමාණ ධර්මයෝ ය. එනම් ධර්මස්කන්ධ සතළිස් දෙදහසක් වූ ධර්මයෝ මාතිකා පද පිහිටකොට හේතුකොට පවතින බව දත යුතු යි.

අත්ථා ච තාය පසූතා, පාලිතා පොසිතා විය මාතිකා'ති දට්ඨබ්බා. (මො.වි) සත්තප්‍රකරණගත අර්ථයෝ මේ මාතෘකා පදයන් හේතුකොට ගෙන ම අර්ථ ප්‍රසූත වෙත්, අර්ථ පාලනය වෙත්, අර්ථ පෝෂණය වෙත් යන මෙයින් මාතිකා යන අර්ථය දත යුතු යි. එවැනි මාතිකා නයක්‍රම සතකි.

පටුන වෙත

1. **ධම්මසඞ්ගණිමාතිකා**
2. **විභඞ්ගමාතිකා**
3. **ධාතුකථාමාතිකා**
4. **පුග්ගලපඤ්ඤත්තිමාතිකා**
5. **කථාවත්ථුමාතිකා**
6. **යමකමාතිකා**
7. **පට්ඨානමාතිකා** නම්.

ධම්මසඞ්ගණිමාතිකා තොමෝ ප්‍රධාන වශයෙන් **තිකමාතිකා**, දුකමාතිකා වශයෙන් දෙවදෑරුම් වෙත්. **ද්වාවීසති තිකා තිකමාතිකා නාම.** දෙවිසි තිකයෝ **තිකමාතිකා** නම් වෙත්. **ද්වෙචත්තාළීසසතදුකා දුකමාතිකා නාම.** එකසිය සතළිස්දෙකක් වූ දුක පදයෝ **දුකමාතිකා** නම් වේ. මෙකී මාතිකා පදයෝ **ආහච්චභාසිතා, සාවකභාසිතා** වශයෙන් දෙවදෑරුම් වෙත්.

ද්වාවීසති තිකාචෙව, හෙතුධම්මා න හෙතුධම්මා -පෙ- සරණා ධම්මා අරණා ධම්මා. යන තිකමාතිකා පද දෙවිස්සත් දුකමාතිකා පද සීයත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට වදාළ සත්තප්‍රකරණයට ම මාතිකා වූ බැවින් **ආහච්චභාසිතා** නම් වේ. ඉන්පසු **විජ්ජාභාගිනො ධම්මා අවිජ්ජාභාගිනො ධම්මා -පෙ- ඛයෙඤාණං අනුප්පාදෙඤාණං.** යන දෙසාළිස් සූත්‍රාන්තික දුකයෝ ධර්මසේනාපති සාරිපුත්ත තෙරුන් වහන්සේ විසින් තබන ලද මාතෘකා බැවින් **සාවකභාසිත** නම් වේ. එසේ මාතෘකා තැබූ තෙරුන් වහන්සේ අත්තනොමතික ඤාණයෙන් බැහැරව **ඒකකනිපාත, දුකනිපාත, සඞ්ගීතිසූත්‍ර, දසුත්තරසූත්‍රයන්හි** අර්ථයන් එකට එකතුකොට ආභිධම්මික තෙරුන්ගේ සූත්‍රයට ඇති අලසකම දුරු කිරීම සඳහා ම තබන ලද්දේ ය.

මෙකී සියලුම මාතිකා පදයෝ සප්‍රදේශ, නිප්‍රදේශ වශයෙන් කොටස් දෙකක් වෙත්. එහි දී තිකමාතිකාපද නවයකුත් දුකමාතිකාපද සැත්තෑඑකකුත් පරමාර්ථ ධර්මයන් සියල්ල ඇතුලත් නොවන බැවින් **සප්‍රදේශ** නම් වෙත්. ඉතිරි තෙළෙස් තිකයෝත් එක් සැත්තෑවක් වූ දුකයෝත් ඉතිරිවක් නොවූ සතර පරමාර්ථයෝ ම එහි ඇතුලත් වූ බැවින් **නිප්‍රදේශ** නම් වෙත්. ඒ ඒ මාතිකාවන් හැඳින්වීම සඳහා **ආදිපද** වශයෙන් හෝ **සබ්බපද** වශයෙන් ගෙන හඳුන්වනු ලැබේ. එනම්

කුසලා ධම්මා, අකුසලා ධම්මා, අබ්‍යාකතා ධම්මා යන මාතෘකා තුන ආදිපදය ගෙන **කුසලත්තික** නමින් හඳුන්වයි. **සුඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා -පෙ- ධම්මා.** යන මාතෘකා පදය **සබ්බපද** හෙවත් පොදු ලක්ෂණය ගෙන **වෙදනත්තික** වශයෙන් හඳුන්වනු ලැබේ. මෙලෙස සියලු මාතෘකාවන් හඳුන්වන නාමය තේරුම් කරගත යුතු ය. මේ සියලු මාතිකා පද මාතෘකා පද පසළොසක් යටතෙහි අර්ථ බෙදත්. එනම් **තිකමාතිකාව** එකම පරිච්ඡේදයකි. **ආසවගොච්ඡක, සංයොජනගොච්ඡක, ගන්ථගොච්ඡක, ඔඝගොච්ඡක, යොගගොච්ඡක, නීවරණගොච්ඡක, පරාමාසගොච්ඡක, මහන්තරදුක, උපාදානගොච්ඡක, කිලෙසගොච්ඡක, පිට්ඨිදුක, සුත්තන්තිකදුක** වශයෙන් පරිච්ඡේද දාහතරකි. මෙකී පරිච්ඡේද පසළොසකින් කෙරෙන අර්ථ විභාගය මාතිකා විභාගය යි.

මෙකී මාතිකාවන් ඉගෙනීමේ දී ගුරුමුඛයෙන් තොරව අර්ථ හැදෑරීමේ දී බොහෝ තැන්හි සිදුවන සම්මෝහනය වැළැක්වීම සඳහා ධම්සඟුනුමාතිකා හා එහි නික්ඛේප අට්ඨකථාගත අර්ථයන් ගෙන ලියවුණු සංග්‍රහ ග්‍රන්ථ අතර බුරුම සම්ප්‍රදායෙන් සීහළ භාෂාවට නැගෙන **"මාතිකා අධ්‍යයන ප්‍රවේශය"** නැමැති ග්‍රන්ථය සියලු ගැට ලිහමින් බොහෝ දෙනාට මාතිකා අත්පොතක් සේ පරිහරණය කළ හැකි අතිප්‍රශස්ථ ග්‍රන්ථයකි.

එය හෙළ බසට මනාව අරුත් සැපයූ පූජනීය කඩුවෙල අතුලඤාණ ස්වාමින් වහන්සේට තව තවත් උසස් ආකාරයෙන් මෙවැනි ම ග්‍රන්ථ ලක් බුදු සසුනට දායාද කිරීමෙහි ලා සියළු ශක්තිය ධෛර්‍ය වීර්‍ය වාසනාව නො අඩුව රත්නත්‍රයේ ආශිර්වාද බලයෙන් සහ දෙවියන්ගේ දැහැමි රැකවරණයෙන් ද, මෙපින් බෙලෙන් ද, ලැබෙවායි මෙත් සිතින් ආශිර්වාද කරමි හ.

සබ්බේ සත්තා භවන්තු සුඛිතමුදිතත්තා!

මෙයට

දිගන සුගතවංස ස්ථවිර.

ත්‍රිපිටකාචාර්‍ය, අභිධර්ම විශාරද.

පටුන වෙත

ප්‍රස්තාවනාව

දීපංකර බුදුරජාණන් වහන්සේගේ පාදමූලයෙහි විවරණ ලද අප මහබෝසතාණෝ අනන්ත සත්ත්වයන් කෙරෙහි පතළ මහාකරුණාවෙන් යුතු ව සාරාසඞ්ඛෙය්‍ය කල්ප ලක්ෂයක් පාරමී ධර්මයන් පූරණය කොට දඹදිව බුද්ධගයා බෝධි මණ්ඩපයේ දී සවාසනා සකල ක්ලේශයන් මතු නූපදනා ලෙස ප්‍රහාණය කොට ගෞතම නමින් බුද්ධ රාජ්‍යයට පැමිණ වදළ සේක. බුද්ධත්ත්වයේ පටන් පරිනිර්වාණය දක්වා ලෝක සත්ත්වයන් ස්වර්ග මාර්ගයේ ද මෝක්ෂ මාර්ගයේ ද පිහිටුවමින් ධර්මරාජයාණන් වහන්සේ වදළා වූ ඒ ශ්‍රී සද්ධර්මය සංගීතිකාරක මහරහතන් වහන්සේලා විසින් විනය පිටකය, සූත්‍ර පිටකය සහ අභිධර්ම පිටකය යනුවෙන් පිටකත්‍රයකින් සංග්‍රහ කරන ලදී.

කාය වාග් අසංවරයන්ගේ හික්මවීම සිදු කරන ප්‍රාතිමෝක්ෂ සංඛ්‍යාත ශීලය විනය පිටකාන්තර්ගත ය. බුදුරජාණන් වහන්සේ ඒ ඒ වෙනෙය්‍ය ජනයන්ගේ ආසයානුසය දකිමින් ඒ ඒ සත්ත්වයන්ට අනුරූපව උපමා උපමේය භාවිත කරමින් නොයෙක් ස්ථානවල දී වදළ දේශනා සූත්‍ර පිටකයෙහි ඇතුළත් වේ.

කාම, රූප, අරූප යන භවත්‍රයට ඇතුලත් වන චිත්ත, චෛතසික, රූප, නිර්වාණ සඞ්ඛ්‍යාත පරමාර්ථ ධර්මයන් නොයෙක් ආකාරයෙන්

ගෙන අනවශේෂ වශයෙන් වදාළ වූ දේශනාව අභිධර්ම පිටකයෙහි ඇතුළත් වේ.

අභිධර්මය (අභිධම්ම) යන පදය අත්ථසාලිනී අටුවාවෙහි විස්තර කරනුයේ අධික වූ ධර්මය, විශේෂ වූ ධර්මය (ධම්මාතිරෙක ධම්මවිසෙසට්ඨෙන) යනුවෙනි. "අභිධම්ම" යන පදයේ 'අභි' උපසර්ගය මඟින් අතිරේක සහ විශේෂ යන අර්ථයන් ප්‍රකාශ කෙරේ. සූත්‍ර පිටකයේ දී රූපස්කන්ධය අතීත, අනාගත, ප්‍රත්‍යුත්පන්න, ආධ්‍යාත්මික, බාහිර, ඕළාරික, සූක්ෂ්ම, හීන, ප්‍රණීත, දූර, සන්තික යනුවෙන් එකොළොස් ආකාරයකට බෙදා දැක්වේ. අභිධර්ම පිටකයේ දී රූපය පටිනිද්දේසය සහිත ව, එනම් ඉහත සඳහන් කළ එකොළොස් පදයන් එක එකක් තවදුරටත් පැහැදිලි කිරීම් වශයෙන් ද අභිධම්මභාජනීය වශයෙන් තවත් නය ක්‍රම රාශියකින් ද පඤ්හපුච්ඡකයේ දී ප්‍රශ්න උත්තර ක්‍රමයට ද යන තුන් ආකාරයකින් අධික වූ ද විශේෂ වූ ද පාලියකින් විග්‍රහ කෙරේ. මේ ආකාරයට පරමාර්ථ ධර්මයන් පිළිබඳව විශේෂ විභාගයක් සිදු කරමින් ඇති අධික සහ විශේෂ වූ ධර්මය අභිධර්මය යි.

භාග්‍යවතුන් වහන්සේ විසින් ආඥා බාහුල්‍යයෙන් දේශනා කොට ඇති බැවින් විනය පිටකය 'ආණාදෙසනා' යැයි ද ව්‍යවහාර බාහුල්‍යයෙන් දේශනා කොට ඇති බැවින් සූත්‍ර පිටකය 'වොහාරදෙසනා' යැයි ද පරමාර්ථ බාහුල්‍යයෙන් දේශනා කොට ඇති බැවින් අභිධර්ම පිටකය 'පරමත්ථදෙසනා' යැයි ද කියනු ලැබේ. මෙම පරමාර්ථයෙන් විනිර්මුක්ත වූ විදර්ශනාවක් නොමැති බැවින් අභිධර්ම පිටකය භාවනාවට මහෝපකාරී වේ.

අසූහාරදහසක් වූ ධර්ම ස්කන්ධයන්ගෙන් සංග්‍රහ කොට වදාළා වූ ත්‍රිපිටක ධර්මයෙහි ස්කන්ධයන් සතළිස් දෙදහසක් ම අභිධර්ම පිටකයෙහි ඇතුළත් වේ. එම අභිධර්ම පිටකය ධම්මසංගණිප්පකරණය, විභංගප්පකරණය, ධාතුකථාප්පකරණය, පුග්ගලපඤ්ඤත්තිප්පකරණය, කථාවත්ථුප්පකරණය, යමකප්පකරණය, පට්ඨානප්පකරණය යනුවෙන් සප්ත ප්‍රකරණයකින් සමන්විත වේ. මෙම සප්ත ප්‍රකරණය ඉගෙන ගැනීමේ දී අභිධර්ම නය ක්‍රම දැන සිටීම අතිශය වැදගත් වේ.

අභිධර්ම මාතිකා අධ්‍යයන ප්‍රවේශය

එම සප්ත ප්‍රකරණය අතරින් ධම්මසංගණිප්පකරණය ඒ නාම-රූප ධර්මයන් බෙද දක්වන අතර එය අභිධර්මයේ පදනම වේ. එය චිත්ත කාණ්ඩය, රූප කාණ්ඩය, නික්ෂේප කාණ්ඩය, අත්ථුද්ධාර වශයෙන් කාණ්ඩ සතරකට බෙදේ. මෙම කාණ්ඩ සතරට පෙර අභිධර්මයේ පැමිණෙන මාතෘකා (මාතිකා) දේශනා කොට ඇත. මෙම ප්‍රකරණයේ දී සිදු කෙරෙනුයේ එම මාතිකා දීර්ඝ වශයෙන් විස්තර කිරීම යි. මෙම මාතිකා අභිධර්ම මාතිකා, සූත්‍රාන්ත මාතිකා වශයෙන් කොටස් දෙකකට බෙදේ. අභිධර්ම මාතිකාවන් තික මාතිකා, දුක මාතිකා වශයෙන් නැවත කොටස් දෙකකට බෙදේ. මාතිකා සඳහා පැමිණෙන පදර්ථ සහ ස්වරූපාර්ථ මනාව දැනසිටීම ධම්මසංගණී ප්‍රකරණය පහසුවෙන් අධ්‍යයනය කිරීමට පදනම වේ. තව ද එය සෙසු ප්‍රකරණයන්ට ද පදනම වේ.

අභිධර්ම මාතිකා අධ්‍යයන ප්‍රවේශය නමැති මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීමෙහි ලා අපගේ මූලික පරමාර්ථය නම් මාතිකා ස්වරූපාර්ථ පහසුවෙන් අවබෝධ කරගැනීමට ක්‍රමයක් සකස් කිරීම යි. සාමාන්‍යයෙන් ලංකාවේ මාතිකා ඉගැන්වීමේ දී සිදු කෙරෙනුයේ ඉහත සඳහන් ග්‍රන්ථයක් භාවිත කරමින් ගුරුවරයෙකු විසින් ග්‍රණ්ථිස්ථාන පැහැදිලි කරමින් කරුණු විස්තර කරගෙන යෑම ය. මේ වන විට සිංහල බසින් ලියවී ඇති ග්‍රන්ථවල එම ග්‍රණ්ථිස්ථාන විස්තර කර ඇත්තේ ස්වල්ප වශයෙනි. නමුත් මෙම ග්‍රන්ථයෙහි දී බුරුම බසින් ලියා ඇති ග්‍රන්ථවල පැහැදිලි කර ඇති ග්‍රණ්ථිස්ථාන මෙන් ම තවත් විස්තර කළ යුතු කොටස් ද ඇතුළත් කොට ඇත. එබැවින් මෙම ග්‍රන්ථය ගුරුවරයෙකු හට ඉගැන්වුම් ක්‍රියාවලියේ දී ද තනිව අධ්‍යයනය කරන ශිෂ්‍යයෙකු හට ඉගෙනීමේ ක්‍රියාවලියේ දී ද පහසුවක් වනු ඇත.

මෙම ග්‍රන්ථය සකස් කිරීමේ දී අප සැකිල්ල වශයෙන් යොදා ගත්තේ නාථයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේ විසින් සම්පාදිත අභිධර්ම භාවනා ග්‍රන්ථයේ පළමු කොටස හා දෙවන කොටස යි. ඊට හේතුව නම් උන්වහන්සේ විසින් ඉතා ප්‍රශස්ත ආකාරයෙන් සරල බසකින් කරුණු ඉදිරිපත් කර තිබීමත් අප විසින් භාවිත කළ මාතිකා ස්වරූපාර්ථ දැක්වන බුරුම පොතකින්

ස්වරූපාර්ථ පරිවර්තනය කළ ද එහි වෙනසක් නොවන බැවිනි. එබැවින් මාහිමිපාණන් වහන්සේ විසින් සම්පාදනය කරන ලද ග්‍රන්ථයෙහි ඇතුළත් නොවී තිබුණු කරුණු ඇතුළත් කිරීමට අපගේ වැඩි අවධානය යොමු වීය. තව ද සද්ධම්මපාල රත්නායක දසසිල් උපාසක මහතා විසින් රචිත අභිධම්ම මාතිකා පාළි ව්‍යාඛ්‍යානය නමැති ග්‍රන්ථයෙන් ද කොටස් කිහිපයක් මෙම ග්‍රන්ථයට ඇතුළත් කර ඇත. පුරාණයේ පටන් පැවත එන බුරුම පොත්වල ඇතැම් තැන්වල ස්වරූපාර්ථ දැක්වීමේ දී ස්ථාන කිහිපයක සුළු වෙනස්කම් දක්නට ඇත. පසුකාලීන වැඩසිටි අභිධර්මයෙහි දක්ෂ ධර්මාචාර්යයන් වහන්සේලා විසින් එම වෙනස්කම් පිළිබඳව පෙළ, අටුවා, ටීකා භාවිත කරමින් කරුණු කාරණා දක්වමින් විනිශ්චයන් ලබා දී ඇත. එම කරුණු ද සැලකිල්ලට ගනිමින් සිංහල බසින් ලියවී ඇති එමග්‍රන්ථ ද්වයෙහි සඳහන් ස්වරූපාර්ථ ද පෙළ, අටුවා, ටීකාවන්ට විසදෘශ නොවන ලෙස අප විසින් මෙම ග්‍රන්ථය තුළ සංශෝධනය කර ඇත.

මාතිකා ස්වරූපාර්ථ ඉගෙන ගැනීම සඳහා බුරුම බසින් සම්පාදනය වී ඇති ග්‍රන්ථ රාශියකි. ඒ අතරින් මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීමේ දී යොදගත් ග්‍රන්ථ සහ ඒවායේ කතුවරයන් වහන්සේලාගේ නම් පහත පරිදි වේ.

ග්‍රන්ථයේ නම	කතුවරයා
මාතිකා ධාතුකථා පැන්ගුන්	අශින් කුමාර හිමි (පැන්ගුන් සයාඩෝ)
මාතිකා ධාතුකථා කුඤ්චිකා	අශින් විමලබුද්ධි හිමි
මාතිකා ධාතුකථා පාරගු	අශින් නාරද හිමි (මූලපට්ඨාන සයාඩෝ)
මාතිකා ධාතුකථා ලැ'සවුන්	අශින් තිලොකාභිවංස හිමි (ඉන්සෙයන් සයාඩෝ)
අත්ථසාලිනී භාසාටීකා (අත්ථසාලිනී බුරුම සන්නය)	අශින් ජනකාභිවංස හිමි (භාසාටීකා සයාඩෝ)

අභිධර්ම මාතිකා පහසුවෙන් අධ්‍යයනය කොට ධම්මසංගණිප්‍රකරණය පහසුවෙන් අධ්‍යයනය කිරීමට උපස්තම්භක වේ ය යන කල්‍යාණාධ්‍යාශයෙන් යුතුව අප විසින් මෙම ග්‍රන්ථය සම්පාදනය කරන ලදී.

උපකාරානුස්මෘතිය

අප විසින් මෙම ග්‍රන්ථය පරිවර්තනය කොට රැස් කළ පුණ්‍ය ශක්තිය අනුමෝදනාවට විෂය වන සත්පුරුෂයෝ බොහෝ දෙනෙක්. ඒ කවර හෙයින් ද? යත්, මෙම ග්‍රන්ථය භික්ෂූන් වහන්සේලා බොහෝ දෙනෙකුගේ උත්සාහයක ප්‍රතිඵලයක ලෙස මුද්‍රණය වන බැවිනි.

ප්‍රථමයෙන් අභිධර්ම භාවනා ග්‍රන්ථය සම්පාදනය කළෝ අපගේ උපාධ්‍යායෝත්තම අතිපූජ්‍ය නාඋයනේ අරියධම්ම මාහිමිපාණෝ ය. උන්වහන්සේ ද ප්‍රාර්ථනීය අත්‍යුත්තම සම්බුද්ධරාජ්‍යයට පැමිණීම පිණිස අපේ මේ කුශලය පාරමිතාවක් ම වේවා!

අතිශයින් සිල්වත් ගුණවත් ධර්මවිනයධර සඟ පරපුරකට තෝතැන්නක් වූ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංඝ සංස්ථාවෙහි වර්තමානයේ නායකත්වය උසුලන මෙම ශාසනික කර්තව්‍යයන්ට ආශීර්වාද එකතු කළ අතිපූජ්‍ය පහළවිටියල ජනානන්දාභිධාන නායක මාහිමිපාණන් වහන්සේට ද මෙම පුණ්‍යලාභය ප්‍රාර්ථනීය බෝධිඥනයකින් නිවන් අවබෝධය පිණිස හේතු වේවා! තව ද යෝගාශ්‍රමීය සඟ පරපුර දිනෙන් දින ධර්ම ශාස්ත්‍රඥනයෙන් ද භාවනා ඥනයෙන් ද ඔප් නැංවෙනු බලා ආශංසන කරමින් තුටු වන ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රමයේ සභාපති ධුරන්ධර අතිපූජ්‍ය මීතලාවේ විනීතාභිධාන නායක මාහිමිපාණන් වහන්සේ ද අපගේ මේ පින් බෙලෙන් දීර්ඝායුෂ ලැබ නිදුකින් සුවසේ නිවන් මඟ ගමන් කරත්වා. පර්යාප්ති ශාසනය දියුණු කිරීමෙහි ලා ස්වච්ඡන්දයෙන් යුතුව නිරතුරු වෙහෙසෙන ශ්‍රී ලංකා රාමඤ්ඤ මහානිකායේ අතිපූජ්‍ය මහා නායක මකුලැවේ විමල නායක මාහිමිපාණන් වහන්සේ පෙරමුණ ගනිති. අපගේ ග්‍රන්ථ කරණයෙහි ලා ස්වකීය ආශීර්වාදාත්මක ආශංසනය එක් කළ උන්වහන්සේට ද මෙම පුණ්‍යශක්තිය තව තවත් ශාසනික මෙහෙවර සිදු කරමින් සුවසේ නිවනින් සැනසීම පිණිස හේතු වේවා! ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ මහාලේඛකාධිකාරී ධුරන්ධර පූජ්‍ය කහගොල්ලේ සෝමවංසාභිධාන මහාස්ථවිරයන් වහන්සේ අපගේ

මෙම ග්‍රන්ථකරණය මාහැඟි ශාසනික කර්තව්‍යයක් සේ සලකා අනුග්‍රහ දැක්වූහ. අපට ආශංසන එක් කළ උන්වහන්සේට ද සුව ප්‍රතිපදවෙන් නිවන් අවබෝධය පිණිස මෙම පුණ්‍ය ලාභය හේතු වේවා! අපගේ මෙම පරිවර්තනය කියවා බලා අපට අනුග්‍රහ පිණිස ආශීර්වාද එක් කළෝ කලක් අපගේ අභිධර්මාධ්‍යයනයට මහත් සේ උපකාර කළ ඇදුරුවරයාණෝ නම් පූජ්‍ය දිගන සුගතවංස මාහිමිපාණෝ ය. උන්වහන්සේට ද අපගේ මෙම පුණ්‍ය ශක්තිය උතුම් නිවන් අවබෝධය පිණිස හේතු වේවා!

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස ධර්ම ශාස්ත්‍ර අධ්‍යයනයෙහි මෙන් ම මතු පරපුර වෙනුවෙන් දයාද කිරීමේ වගකීම අප සතු බව අපට කියා දෙමින් මෙවන් කර්තව්‍යයන් උදෙසා අප මෙහෙයවූ නියමුවාණෝ අන් කිසිවෙකුත් නොව අප ගුරුදේවෝත්තමයන් වහන්සේ ය. අතිපූජ්‍ය නුවරඑළියේ ඤාණසීලාභිධාන ගුරුදේවෝත්තම ලොකු ස්වාමීන් වහන්සේ අපගේ මෙම පුණ්‍ය ලාභය සාදර සිතින් අනුමෝදන් වෙත්වා! උන්වහන්සේ ප්‍රාර්ථනා කරන පරිද්දෙන් සුව සේ මෙම ජීවිතයේ ම උතුම් මහරහත් භාවයෙන් නිවන් පසක් කර ගැනීමට මෙම කුශල ශක්තිය හේතු වේවා! තව ද අප අත්‍යුත්තම ප්‍රව්‍රජ්‍යාවට පත් තැන් පටන් ධර්මවිනයෙන් මෙන් ම ආධ්‍යාත්මික මග පෙන්වීමෙන් ද අප ශක්තිමත් කළ පූජ්‍ය ගලේවෙල ඤාණදස්සන ස්වාමීන් වහන්සේට ද මෙම පුණ්‍ය ශක්තිය උතුම් චතුරාර්ය සත්‍යය අවබෝධය පිණිස ම හේතු වේවා! එපමණක් නොව නිරතුරු අප දිරිමත් කරමින් ශාසනික වගකීම අපට සිහි කරදුන් පූජ්‍ය කුණ්ඩසාලේ අරණගවේසී ස්වාමීන් වහන්සේ ද මෙම කුශලය අනුමෝදන් ව උතුම් නිවනින් සැනසෙත්වා!

2015 වර්ෂයේ අවසන් භාගයේ දිද්දෙණිය රණගිරිලෙන අරණ්‍ය සේනාසනයට වැඩම කරමින් සඟ පිරිසට අභිධර්මාර්ථ සංග්‍රහය කියා දුන් ත්‍රිපිටකාචාර්ය, අභිධර්ම විශාරද පූජ්‍ය දිගන සුගතවංස ස්වාමීන් වහන්සේ සහ 2016 වර්ෂයේ දී අරණ්‍යයෙහි නේවාසිකව වැඩ හිඳිමින් ධම්මසංගණිප්‍රකරණයේ පටන් යමකප්‍රකරණය දක්වා ග්‍රන්ථ හැදෑරවූ පූජ්‍ය නාමල්ගමුවේ පඤ්ඤසේඛර ස්වාමීන් වහන්සේ යන ගුරු ස්වාමීන් වහන්සේලා දෙන ම අපගේ අභිධර්ම අධ්‍යයනයෙහි දී අපට මහෝපකාරී වූවෙව් ය. උන්වහන්සේලාගෙන් ලද සදුපකාරය ද

කෘතවේදීව පුණ්‍යානුමෝදනා ශීර්ෂයෙන් යුතුව ගෞරව සම්ප්‍රයුක්තව සිහිපත් කරමි.

මෙම ග්‍රන්ථය අප විසින් සම්පාදනය කිරීම ආරම්භ කළේ 2019 වර්ෂයේ අග භාගයේ දී ය. වෙනත් අධ්‍යයන කටයුතුවල නිරත වෙමින් අවස්ථාව ලැබෙන පරිදි මෙම ග්‍රන්ථයේ කටයුතු සම්පාදනය කළ බැවින් ග්‍රන්ථය නිම කිරීම 2022 ඔක්තෝම්බර් මාසයේ දී සිදු විය. කාලය ගත වීමට තවත් හේතුවක් නම් මෙම ග්‍රන්ථය සම්පාදනයේ දී බුරුම බසින් කරන ලද පරිවර්තනයට අමතරව අභිධර්ම භාවනා පොතේ කොටස් දෙක ද එකතු කිරීමේ දී යතුරු ලියනය සහ සෝදුපත් බැලීමට සිදු වීම යි.

යටකී කාල පරිච්ඡේදය තුළ දී මෙම ග්‍රන්ථය නිම කිරීම සඳහා තමන් වහන්සේලාගේ ශක්ති ප්‍රමාණයෙන් කාලය කැප කරමින් උපකාර කළ භික්ෂූන් වහන්සේලා බොහෝ ය. 2018 වර්ෂයේ අග භාගයේ මියන්මාරයට වැඩමවීමෙන් අනතුරුව මෙබඳු ග්‍රන්ථ සිංහල බසින් සකස් කිරීම පිළිබඳව අපව නිරතුරුව උනන්දු කරමින් මේ කර්තව්‍යයට යොමු කළ කල්‍යාණ මිත්‍රයන් වහන්සේලා වූයේ පූජ්‍ය දිද්දෙණියේ අරියදස්සන ස්වාමීන් වහන්සේ සහ පූජ්‍ය මහව ඤාණාලෝක ස්වාමීන් වහන්සේ ය. ඒ ස්වාමීන් වහන්සේලා මේ ග්‍රන්ථයේ ඇතැම් කොටස්වල ශෝධ්‍ය පත්‍ර බැලීම සහ කරුණු ඉදිරිපත් කිරීම පිළිබඳව උපදෙස් දෙමින් ද දායක වූ බව කෘතඥතා පූර්වකව සිහිපත් කරමි. තව ද අවස්ථා කිහිපයක දී පූජ්‍ය පැල්මඩුල්ලේ විජිතානන්ද ස්වාමීන් වහන්සේ ද බුරුම පරිවර්තනයේ ශෝධ්‍ය පත්‍ර බැලීම සහ ග්‍රන්ථය ඉදිරිපත් කළ යුතු පිළිවෙළ සම්බන්ධයෙන් තම අදහස් පළ කිරීම ආදී නොයෙක් කටයුතුවල දී උපකාර කළ බව කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

අවසාන අදියරේ දී ශෝධ්‍ය පත්‍ර බැලීම සඳහා උපකාර කළේ පූජ්‍ය කුණ්ඩසාලේ අරණගවේසී ස්වාමීන් වහන්සේ ය. උන්වහන්සේ විසින් මෙම ග්‍රන්ථයට අදළව කරුණු ඉදිරිපත් කිරීම, ශෝධ්‍යපත්‍ර බැලීම සඳහා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා යොමු කිරීම ආදී නොයෙක් ආකාරවලින් උපකාර කළ බව සිහිපත් කරමු. එම කාලයේ දී සෝදුපත් බලමින් අඩුපාඩු සකස් කළ පූජ්‍ය නේපාලයේ සෝමරතන ස්වාමීන් වහන්සේගේ උපකාරය ද කෘතඥතා පූර්වකව සිහිපත් කරමි. තව ද

මෙම ග්‍රන්ථයෙහි අභිධ්‍යාර්ථයන්ගේ නිරවද්‍යතාව පරීක්ෂා කරමින් විශේෂ සෝදුපත් බැලීමක යෙදුණු පූජාපිටියේ සූරියරතන ආයුෂ්මතුන් වහන්සේගේ උපකාරය ද කෘතඥතා පූර්වකව සිහිපත් කරමි. අවසාන අදියරේ දී සෝදුපත් බැලීම, සංස්කරණය ආදී සහ නොයෙක් කටයුතුවල දී මෙන් ම ග්‍රන්ථකරණයෙහි අපව දිරිමත් කරන ශක්තියක් වන පූජ්‍ය ගල්පොතුගොඩ ඤාණවංස ස්වාමීන් වහන්සේගේ උපකාරය ද කෘතඥතා පූර්වකව සිහිපත් කරමි. තව ද ගාල්ලේ ඤාණෝභාස ස්වාමීන් වහන්සේ, පුවක්පිටියේ සුමංගලරතන ස්වාමීන් වහන්සේ, බලංගොඩ ඤණදීප ආයුෂ්මතුන් වහන්සේ, හෝමාගම ඤණිස්සර ආයුෂ්මතුන් වහන්සේ, ගංගොඩවිල පඤ්ඤතිස්ස ආයුෂ්මතුන් වහන්සේ, මිනුවන්ගොඩ පඤ්ඤසීහ ආයුෂ්මතුන් වහන්සේ ඇතුළු මෙම ග්‍රන්ථය සඳහා ධර්ම උපකාරක කළ සෙසු දිද්දෙණිය අරණ්‍යවාසී භික්ෂූන් වහන්සේලා ද කෘතඥතා පූර්වකව සිහිපත් කරමි. අභිධර්ම මාතිකා පොතෙහි පළමු කොටස සංස්කරණය කිරීමේ අභිලාශයෙන් මීට වර්ෂ කිහිපයකට පෙර නාඋයන අරණ්‍ය සේනාසනයේ ස්වාමීන් වහන්සේ නමක් විසින් සිදු කර තිබූ අතර එම ස්වාමීන් වහන්සේගෙන් ලද උපකාරය ද මෙත් සිතින් යුතුව සිහිපත් කරමු.

ග්‍රන්ථයෙහි ඇති ග්‍රණ්ථිස්ථාන පැහැදිලි කරදුන් මියන්මාරයේ ප්‍යින්-ඌ-ල්වින් ප්‍රදේශයේ ප්‍යින්සා ග්‍රාමවාසී අශින් මණ්ඩල ස්වාමීන් වහන්සේගේ කාරුණික උපකාරය ද සිහිපත් කරමි. මීට අමතරව මියන්මාරයේ දී අප හට ධර්මයෙන් ආමිෂයෙන් අනුග්‍රහ කරන්නා වූ සියලු ස්වාමීන් වහන්සේලා ද මෙත් සිතින් සිහිපත් කරමි. මෙම භික්ෂූන් වහන්සේලා මේ ග්‍රන්ථය සඳහා ස්වකීය දායකත්වය ලබා දුන්නේ අපට කරන පෞද්ගලික උපකාරයක් ලෙස සලකා නොව ත්‍රිවිධ ශාසනයෙහි දියුණුව අපේක්ෂා කරමින් ය. එබැවින් මෙම කුශලයේ ශක්තිය මේ සියලු ස්වාමීන් වහන්සේලාට සුව සේ පාරමිතා ධර්මයන් සපුරා ප්‍රාර්ථනීය බෝධියකින් අමෘත සඞ්ඛ්‍යාත නිර්වාණය අවබෝධ කරගැනීමට උපකාර වේවා! සියලු සම්‍යක් ප්‍රාර්ථනා සඵල වේවා!

මහත් කාලයක් හා පරිශ්‍රමයක් දරමින් ධර්ම දන ශීර්ෂයෙන් අභිධර්ම මාතිකා දෙවන කොටස යතුරු ලියනය කරමින් උපකාර කළ වෙලියට් රත්නසීලී උපාසිකා මාතාව ද කෘතඥතා පූර්වකව සිහිපත්

කරමු. එතුමියට ද මෙම ධර්ම පූජාව සුබ ප්‍රතිපදාවෙන් ඉතා ම ඉක්මන් මොහොතක දී නිවන් අවබෝධය පිණිස හේතු වේවා!

තව ද මෙම ග්‍රන්ථ සම්පාදනයෙන් රැස් කර ගත් අප්‍රමාණ කුශල ශක්තිය සුජීවත්ව සිටින දයාබර මැණියන්ට සහ පියාණන්ට නිදුක් නීරෝගී සුවය පිණිසත් චිර ජීවනය පිණිසත් ආධ්‍යාත්මික ශක්තියක් වේවා! නිරතුරු පහන් සිතින් උපකාර කරන පිටකවරය නිර්මාණය කර දුන් පින් කැමැති ජයනාත් පරාක්‍රම මහතාට ද අපගේ ග්‍රන්ථ මුද්‍රණ කාර්යයෙහි උපකාර කරන සමිත හෙට්ටිආරච්චි මහතාට ද මේ කුශලය නිවන් මග පාරමී ධර්මයක් ම වේවා! පැවිදි වූ දින පටන් සිවුපසයෙන් උපකාර කළ ලංකාවේ සහ මියන්මාරයේ දායක කාරකාදීන්ටත් සියලු ගිහි පැවිදි කල්‍යාණ මිත්‍රයන්ටත් අනුමෝදන් කරමු. ඒ සියල්ලෝ ම සුබ ප්‍රතිපදාවෙන් නිවන් අවබෝධ කරගනිත්වා!

සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා!

මීට
මෙත් සිතින්,
පූජ්‍ය කඩුවෙල අතුලඤාණ හිමි.

තිපිටක කම්හෝජ විහාරය,
උතුරු ශැන් ප්‍රාන්තය,
නෞන්ජෝ නගරය,
මියන්මාරය.
2023-01-18

පටුන වෙත

අභිධර්ම පිටකය අධ්‍යයනය

පහාරාද සූත්‍රයේ වදාළ පරිදි මහමුහුද අනුපිළිවෙළින් ගැඹුරු වන්නා සේ බුද්ධ ශාසනය ද අනුපූර්ව හික්මීම, අනුපූර්ව ක්‍රියා පිළිවෙළ සහ අනුපූර්ව ප්‍රතිපත්තියෙන් යුක්ත වූවකි. අනුපූර්ව ප්‍රතිපදවකින් තොර ව අර්හත්වය සාක්ෂාත් කළ නොහැක. පර්යාප්ති ශාසනය සැලකූ විට සෙසු පිටකයන්ට වඩා අභිධර්ම පිටකය අනුපූර්ව ශික්ෂණයකින් යුතුව ගමන් කළ යුතු වේ. කවර හෙයකින් ද යත්, අභිධර්ම පිටකය බුදුරජාණන් වහන්සේ විසින් තෙමසක් පුරා අඛණ්ඩව කරනා ලද දේශනාවක් බැවින් එය සකල අභිධර්ම දේශනාව ම හා සම්බන්ධව පවතින්නක් බැවිනි. එබැවින් අනුපිළිවෙළ නොඉක්මවා ඉගෙන ගැනීමෙන් ම නිවැරදි ධර්මාවබෝධයක් ලැබිය හැකිය.

සප්ත ප්‍රකරණයෙහි පළමුවෙන් ම ඇති ධම්මසංගණී ප්‍රකරණය අධ්‍යයනය කිරීමේ දී අනුපිළවෙළක් ඇත. ධම්මසංගණී ප්‍රකරණයට පෙර අභිධර්මාර්ථ සංග්‍රහය අධ්‍යයනය කළ යුතු වේ. අභිධර්මාර්ථ සංග්‍රහය සහ තද්පරිවාරිත ග්‍රන්ථ මඟින් අභිධර්මය පිළිබඳව මූලික පදනම සැකසුණු පසුව අභිධර්ම මාතිකා ස්වරූපාර්ථ ප්‍රගුණ කළ යුතු වේ. අභිධර්ම මාතිකා පිළිබඳව අධ්‍යයනයේ දී ඒ පිළිබඳව ලියැවුණු ස්වරූපාර්ථ ග්‍රන්ථ ගැන අවබෝධය වැදගත් වේ.

අභිධර්ම නය සහ ස්වරූපාර්ථ ග්‍රන්ථ

සප්ත ප්‍රකරණයන් අතරින් ප්‍රකරණ සතරක ඇති නය ක්‍රම මූලික වශයෙන් ආභිධර්මික ශිෂ්‍යයෙකු විසින් අධ්‍යයනය කළ යුතු වේ. ධම්මසංගණී නය, ධාතුකථා නය, යමක නය සහ පට්ඨාන නය යනු එම නය ක්‍රම සතර යි. එහි දී සිදු කෙරෙනුයේ ධම්මසංගණී ආදී ග්‍රන්ථ සතරෙහි දේශනාව පැමිණෙන ක්‍රමය පරමාර්ථ ධර්ම (ස්වරූපාර්ථ[1]) ඇහිඳිමින් ඉගෙන ගැනීම යි. මෙම ක්‍රමයට ඉගෙන ගැනීම සඳහා බුරුම බසින් ලියවී ඇති ග්‍රන්ථවලට "අයකෞ'" යන නම ව්‍යවහාර කෙරේ. "අයකෞ'" යනු පරමාර්ථ (ස්වරූපාර්ථ) උද්ධරණය යි. මෙම ස්වරූපාර්ථ ග්‍රන්ථවල පාළියෙහි එන පද සඳහා අර්ථ දැක්වීම ද සිදුකෙරේ.

වර්තමානයේ ථෙරවාදී අභිධර්ම අධ්‍යයනයෙහි ලා භාවිත කරන අභිධර්ම ස්වරූපාර්ථ ග්‍රන්ථයන්ගේ ප්‍රභවය සිදු වී ඇත්තේ බුරුම දේශයේ දී ය. බු.ව. 2081 (ව්‍ය.ව 1538) න් පසුව ඉහළ බුරුමයේ රතනාපුරයේ (ඉන්වා) තාලුන් රජ සමයේ (ව්‍ය.ව 1629-1648) වැඩ වාසය කළ මුනින්දඝෝෂ ස්වාමීන් වහන්සේගේ ඇදුරු පරපුර විසින් (තිපිටකාලඞ්කාර යන ගෞරව නාමය ලද විනයාලංකාර ටීකාචරියන් වහන්සේ) මුලින් ම ස්වරූපාර්ථ ග්‍රන්ථ රචනා කිරීම ආරම්භ කොට ඇත.[2]

පසුකාලීනව වැඩසිටි ඇදුරු පරපුර සතකට අයත් භික්ෂූන් වහන්සේලා අභිධර්ම ස්වරූපාර්ථ ග්‍රන්ථයන් රචනා කළ බව සඳහන් වී ඇති නමුදු වත්මන්හිබුරුමයේ භාවිත වනුයේ ග්‍රන්ථ පරපුර තුනකට අයත් මාතිකා[3], ධාතුකථා, යමක සහ පට්ඨාන ස්වරූපාර්ථ ග්‍රන්ථ ය. එම ග්‍රන්ථ අතරින් මාතිකා ස්වරූපාර්ථ ග්‍රන්ථය බු.ව. 2330 දී (ව්‍ය.ව. 1787) වරතේජො හිමියන් විසින් ද ධාතුකථා ස්වරූපාර්ථ ග්‍රන්ථය බු.ව. 2377 දී (ව්‍ය.ව. 1787) ජම්බුදීපධජ හිමියන් විසින් ද යමක සහ පට්ඨාන ස්වරූපාර්ථ ග්‍රන්ථ දෙක 'තිපිටකාලඞ්කාරසාමි මහාධම්මරාජාධිරාජගුරු', 'නන්දමේධාභිසිරි

---

[1] ස්වරූපාර්ථ සඳහා 'අභිධෙය්‍යාර්ථ' යන නම ද භාවිත කෙරේ.

[2] **මාතිකා ධාතුකථා අයාකෞ' (බුරුම) - සංඥපනය (පි. ච-ජ)**

[3] ධම්මසංගණී නය ක්‍රමය ඉගෙන ගැනීම සඳහා අභිධර්ම මාතිකා (මාතෘකා) අධ්‍යයනය කළ යුතු වේ.

පරමධජමහාධම්මරාජාධිරාජගුරු' යන ගෞරව නාම ද්වයෙන් ප්‍රකට නන්දමේධා ස්වාමීන් වහන්සේ විසින් රචිත ස්වරූපාර්ථ ග්‍රන්ථ ය.

බුරුම රටින් ලද උපසම්පදාවලින් අනතුරුව මෙම ග්‍රන්ථයන්ගෙන් කොටසක් දහනව වන ශත වර්ෂයේ අගභාගයේ පටන් සිංහලයට පරිවර්තනය වී ඇත.[4] එම ග්‍රන්ථ නම් -

ග්‍රන්ථයේ නම	අදාළ ප්‍රකරණ ග්‍රන්ථය	කතුවරයා	වර්ෂය
අභිධම්ම මාතිකා පාළිය සහ සුත්තන්ත පාළිය	ධම්මසංගණී ප්‍රකරණය - මාතිකා	පූජ්‍ය විමලසාර හිමි	1910
අභිධර්ම භාවනා පළමු කොටස		පූජ්‍ය නාඋයනේ අරියධම්ම හිමි	1996
අභිධර්ම භාවනා දෙවන කොටස		පූජ්‍ය නාඋයනේ අරියධම්ම හිමි	-
අභිධර්ම මාතිකා ස්වරූපාර්ථ		සීලවතී පිරිස් මහත්මිය	-
අභිධම්ම මාතිකා පාළි ව්‍යාඛ්‍යානය		උපාසක සද්ධම්මපාල රත්නායක මහතා	1949
ධාතුකථා පාළි ව්‍යාඛ්‍යානය	ධාතුකථා ප්‍රකරණය	පූජ්‍ය ගුණරතන ස්ථවිර	1912

---

[4] යූ ඤුණින්ද සයාඩෝ මහාස්ථවිරයන් වහන්සේ සහ නාඋයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේ විසින් පරිවර්තනය කරන ලද **යමකවාචනා මාර්ගය** ග්‍රන්ථයේ පෙරවදනේ දී උන්වහන්සේ අනුමාන කරනුයේ ශ්‍රී ලංකාවේ බුද්ධ ශාසනයේ දියුණු ව පැවති අතීතයේ දී අභිධර්ම ස්වරූප කථන ග්‍රන්ථයන් සිංහල භාෂාවෙන් පවතින්නට ඇති බවත්, පසුකාලීනව සිදු වූ ශාසන විලෝපයන්හි දී ඒ ග්‍රන්ථ අතුරුදන් වන්නට ඇති බවත් ය. **යමකවාචනා මාර්ගය (සිංහල) - හැඳින්වීම**

යමක වාචනා මාර්ගය	යමක ප්‍රකරණය	යූ. ඤුණින්ද සයාඩෝ, පූජ්‍ය නාඋයනේ අරියධම්ම මාහිමි	1990
පට්ඨාන උද්දේස පාළ්‍යාර්ථ භාව සන්නය	පට්ඨාන ප්‍රකරණය	පූජ්‍ය හඳුන්කඩුවේ සුමන හිමි	-
පට්ඨාන මහා ප්‍රකරණ සන්නය		පූජ්‍ය රේරුකානේ චන්දවිමල හිමි	1956
පට්ඨාන දේසනා සාරය		පූජ්‍ය යාගෝඩ ධර්මප්‍රභා හිමි	1962

සිංහලයට පරිවර්තනය වී ඇති ඉහතින් දක්වා ඇති ග්‍රන්ථයක් හෝ මෙම ග්‍රන්ථය පදනම් කරගනිමින් මාතිකා ස්වරූපාර්ථ පළමු කොට උද්ග්‍රණය කළ යුතු වේ. ධම්මසංගණි ප්‍රකරණය අධ්‍යයනය මුල පටන් සිදු කළ යුත්තේ ඉන් අනතුරුව යි. එය ද අධ්‍යයනය කළ යුත්තේ අත්ථසාලිනී අටුවාව සමඟ යි. එය ද මෙම ක්‍රමයට ඉගෙනීමක් ලද ආචාර්යන් වහන්සේ නමකගේ සමීපයෙහි කරන්නේ නම් ඉන් ලැබෙන ඵලය මනා වූවක් වේ.

ඵලය දෙස බලා හේතුවගේ ස්වභාවය පිළිබඳව කිව හැකි ය. යම් ගිහි හෝ පැවිදි පින්වතෙකුගේ ධර්ම විනිශ්චයන්, ධර්ම දේශනා හෝ වෙනත් ලේඛනයක් දෙස බලා එම ඵලය සඳහා නිවැරදිව ම අටුවා ටීකාවන්ගේ විනිශ්චයන් ලැබී ඇත්දැයි දත හැක. වර්තමානයේ දී ධම්මසංගණි ප්‍රකරණය උගන්වන ඇතැම් භික්ෂූන් වහන්සේලා මාතිකා ස්වරූපාර්ථ පිළිබඳව කිසිදු ඉගැන්වීමක් නොකොට ධම්මසංගණි පාලියෙහි අග භාගයේ ඇති රූප කාණ්ඩයෙන් ඉගැන්වීම අරඹත්. ධම්මසංගණි පාලියෙහි මුල කොටසේ ඇති මාතිකා පදයන් යොදගනිමින් භාග්‍යවතුන් වහන්සේ රූප කාණ්ඩයේ රූප ධර්මයන් විභාග කොට වදාළ බැවින් මාතිකා පදයන් නිවැරදිව අවබෝධ නොකොට රූප කාණ්ඩය නිවැරදිව වටහා ගත නො හැක. එබැවින් ඒ භික්ෂූන් වහන්සේලා සිදුකරනුයේ රූප කාණ්ඩය දිග හැර ගෙන තමන්ගේ සිතට එන යමක් ගිහි-පැවිදි පින්වතුන් හට ඉගැන්වීම යි. මෙයින් ත්‍රිවිධ ශාසනයේ පරිහානියක් විනා අන් කිසිවක් අපේක්ෂා

කළ නො හැකිය. එබැවින් බුද්ධ වචනය ඉගෙන ගැනීමේ කල්‍යාණාධ්‍යාශයෙන් යුත් ගිහි පැවිදි සත්පුරුෂයෝ පැරණි ආචාර්යයන් වහන්සේලා අනුගමනය කරත්වා.

ධම්මසංගණී ප්‍රකරණයෙන් අනතුරුව පැමිණෙනුයේ විභඞ්ග ප්‍රකරණය යි. විභඞ්ග ප්‍රකරණයෙහි දී ධම්මසංගණියෙහි වදළා වූ ධර්මයන් මාතෘකා දහඅටක් යටතේ බෙද දක්වමින් දේශනා කොට වදළහ. විභඞ්ග ප්‍රකරණය ද අටුවාව සමඟ අධ්‍යයනය කළ යුතු වේ. විභංග අටුවාව කියවීමේ දී ඒ සඳහා මොරටුවේ මේධානන්ද ස්ථවිරයන් විසින් සම්පාදනය කර ඇති "අභිධර්මාර්ථ ප්‍රදීපිකා නම් විභංග අටුවා සන්නය" යොදා ගත හැක.

විභඞ්ග ප්‍රකරණයෙන් අනතුරුව පැමිණෙනුයේ ධාතුකථා ප්‍රකරණය යි. මෙම ප්‍රකරණය ද ඉහත දැක්වූ අභිධර්ම නය සතරෙන් එකක් වන බැවින් අටුවාව සහිතව පරිවාර ග්‍රන්ථයන් සමඟ අධ්‍යයනය කළ යුතු වේ. 1912 වර්ෂයේ දී පූජ්‍ය ගුණරතන ස්ථවිරයන් විසින් සම්පාදනය කරන ලද "ධාතුකථා පාළි වාඛ්‍යානය" මෙහි සන්නය වේ. අප විසින් සම්පාදිත "ධාතුකථා ප්‍රකරණ අධ්‍යයන ප්‍රවේශය" ග්‍රන්ථයෙන් අටුවාවෙහි දැක්වෙන ක්‍රමය සහ මියන්මාර්යේ ධාතුකථා අධ්‍යයන ක්‍රමයෙන් ධාතුකථා නය විස්තර කරන බැවින් එයින් ද අධ්‍යයනට උපකාරයක් සැලසෙනු ඇත.

ධාතුකථා ප්‍රකරණයෙන් අනතුරුව පැමිණෙනුයේ පුග්ගලපඤ්ඤත්ති ප්‍රකරණය යි. මෙය ද අටුවාව සමඟ අධ්‍යයනය කළ යුතු වේ.

පුග්ගලපඤ්ඤත්ති ප්‍රකරණයෙන් අනතුරුව පැමිණෙනුයේ කථාවත්ථු ප්‍රකරණය යි. එහි ද මුලින් පැමිණෙන පුග්ගලකථා පිළිබඳව දක්වන නය ක්‍රමය අටුවාව සමඟ අධ්‍යයනය කර මනාව ග්‍රහණය කර ගත යුතු ය. ඉන් අනතුරුව පිළිවෙළින් එම ග්‍රන්ථය අධ්‍යයනය කළ යුතු වේ.

කථාවත්ථු ප්‍රකරණයෙන් අනතුරුව පැමිණෙනුයේ යමක ප්‍රකරණය යි. මෙම ප්‍රකරණය ද ඉහත දැක්වූ අභිධර්ම නය සතරෙන් එකක් වන බැවින් අටුවාව සහිතව පරිවාර ග්‍රන්ථයන් සමඟ අධ්‍යයනය කළ යුතු වේ. 1990 වර්ෂයේ දී පූජ්‍ය යූ. ඤාණින්ද සයාඩෝ සහ පූජ්‍ය

නාථයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේලා විසින් සිංහලයට පරිවර්තනය කරන ලද "යමකවාචනා මාර්ගය" මෙහි සන්නය වේ. අප විසින් සම්පාදිත "යමක ප්‍රකරණ අධ්‍යයන ප්‍රවේශය" ග්‍රන්ථයෙන් මියන්මාර්යේ යමක ප්‍රකරණය අධ්‍යයන ක්‍රමය විස්තර කරන බැවින් එයින් ද අධ්‍යයනට උපකාරයක් සැලසේ.

යමක ප්‍රකරණයෙන් අනතුරුව පැමිණෙනුයේ පට්ඨාන මහාප්‍රකරණය යි. පට්ඨාන ප්‍රකරණය අධ්‍යයනය කිරීමේ දී ඊට අවශ්‍ය පදනම මනා සේ සකසා ගත යුතු වේ. අභිධර්මාර්ථ සංග්‍රහයේ නව වන පරිච්ඡේදයේ පැමිණෙන ප්‍රත්‍ය විස්තරය මනාව දත යුතු වේ. එම විස්තරය අභිධර්මාර්ථ සංග්‍රහයට ලියවී ඇති අභිධර්ම මාර්ගය, අභිධර්මාර්ථ චන්ද්‍රිකාව ආදී පරිවාර ග්‍රන්ථයන්ගෙන් ලබා ගත හැක. තව ද අතිපූජනීය නාථයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේ විසින් පරිවර්තනය අරඹන ලද අප විසින් අවසන් කරන ලද "පට්ඨාන ත්‍රිරාශිය" ග්‍රන්ථය යොදා ගනිමින් එම දැනුම තව දුරටත් දියුණු කර ගත හැක. කුසල ත්‍රික පට්ඨානය අධ්‍යයනයේ දී ඇතැම් කරුණු මනාව වටහා ගැනීමට කුසල ත්‍රිකයට අමතරව සෙසු අභිධර්ම මාතෘකා ද දැන සිටීම උපකාර වන බැවින් ඒ පිළිබඳව අධ්‍යයනයක් කොට මනා පසුබිමක් සකසා ගෙන සිටීම වැදගත් වේ.

පට්ඨාන ප්‍රකරණය සඳහා සිංහලෙන් ලියවී ඇති සන්නය "පට්ඨාන ප්‍රකරණ මහා සන්නය" වේ. එහි පළමු කොටස අතිපූජනීය රේරුකානේ චන්දවිමල මහානායක හිමිපාණන් විසින් සම්පාදනය කරන ලද අතර දෙවන කොටස අප විසින් බුරුම බසින් සිංහලයට පරිවර්තනය කරන ලදී. එම ග්‍රන්ථයන් දෙක පට්ඨානය අධ්‍යයනයේ දී යොදා ගත යුතු වේ. තව ද අටුවාව ද යොදා ගත යුතු වේ. අප විසින් බුරුම බසින් සිංහලයට පරිවර්තනය කරන ලද "පට්ඨාන ප්‍රකරණ අටුවා සන්නය" අටුවාව අධ්‍යයනය සඳහා උපකාර කර ගත හැකි වේ. පට්ඨාන සන්නයෙන් සිදු කරනුයේ ඒ ඒ පාළියට අදළ ස්වරූපාර්ථ පැහැදිලි කිරීම යි.

පට්ඨාන පාළිය සහ එහි සන්නය පමණක් යොදා ගනිමින් පට්ඨාන ප්‍රකරණය අධ්‍යයනය කිරීම දුෂ්කර කටයුත්තකි. පට්ඨාන නය ක්‍රමය පිළිබඳව ගුරුවරුන්ගෙන් උගත යුතු ය. එහි දී ත්‍රික පට්ඨානයන් අතරින් පළමුව පැමිණෙන කුසලත්තික පට්ඨානය මුලින් අධ්‍යයනය

කළ යුතු වේ. වර්තමානයේ බුරුම රට කුසලත්තික පට්ඨානය ඉගැන්වීමේ දී ප්‍රකරණයේ ඇති පිළිවෙළින් පණ්ණත්ති වාරයෙන් ආරම්භ කොට පටිච්චවාර යනාදි පිළිවෙළින් සිදු නො කොට සත්වැනි වාරය වන පඤ්හාවාරයෙන් අරඹනු ලැබේ. පඤ්හාවාරය උගන්වා අවසන් වූ විට සෙසු වාරයෝ උගන්වනු ලැබෙති. මෙම ක්‍රමවේදය පදනම් කරගෙන අප විසින් සම්පාදිත "පට්ඨාන ප්‍රකරණ අධ්‍යයන ප්‍රවේශය" ග්‍රන්ථය මාර්ගෝපදේශය සපයයි.

අභිධර්ම පිටකය යනු අධිප්‍රඥ ශික්ෂාව ය. එබැවින් විදර්ශනා මාර්ගයේ දී අභිධර්ම පිටකය මහෝපකාරී ය. නාමරූප පරිච්ඡේදය මනාව සම්පාදනය කරගැනීම විදර්ශනාවේ පදනම වේ. මෙහි දී අතිශය සියුම් වූ නාමරූප ධර්මයන් නිවැරදිව හඳුනාගැනීමට අභිධර්ම පර්යාප්තිය වැදගත් වේ. පදනම දුබල වූ කල ගොඩනැගිල්ලක් කඩා වැටෙන්නාක් මෙන් විදර්ශනාවෙහි පදනම මනාව සකස් නොවූ කල විදර්ශනාව පහසුවෙන් සිදු කරගත නොහැකි වේ. තව ද කඞ්ඛාවිතරණී විශුද්ධිය මනාව සම්පාදනය කර ගැනීමෙහි ලා පටිච්චසමුප්පාදය සහ පට්ඨානයෙහි පැමිණෙන සූවිසි ප්‍රත්‍යයන් පිළිබඳව ඇති දැනුම ද උපකාරී වේ. මේ අනුව සැලකූ විට විදර්ශනාව ශක්තිමත් කරමින් මාර්ගය වැඩීමට අභිධර්ම අධ්‍යයනයෙන් ලැබෙනුයේ මනා වූ උපස්තම්භනයකි. එබැවින් පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ සඞ්ඛ්‍යාත ත්‍රිවිධ ශාසනයෙහි වෘද්ධියට පැමිණීමට සහ ශාසනයේ චිරස්ථිතිය උදෙසා අභිධර්ම අධ්‍යයනය නිවැරදිව සිදු කළ යුතු වේ.

පටුන වෙත

අභිධර්ම මාතිකා අධ්‍යයන ප්‍රවේශය

ප්‍රථම මුද්‍රණය: 2023 ජනවාරි

ISBN 978-624-6357-01-6

ප්‍රකාශනය ථේරවාද ප්‍රකාශන සමිතිය

ධර්ම දානය පිළිබඳ විමසීම්: සමිත හෙට්ටිආරච්චි - 074 070 7850

කඤ්චුක නිර්මාණය: ජයනාත් පරාක්‍රම

මුද්‍රණය:

පාරමි ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්

නො. 235/1, වැලිපිල්ලෑව, ගණේමුල්ල.

දුරකථන : 071 300 80 50 parameepublication@gmail.com

කර්තෘවරයන් වහන්සේ විසින් පට්ඨාන මහාප්‍රකරණය සම්බන්ධයෙන් පවත්වනු ලබන පාඩම් මාලාව සහ අත්පත්‍රිකා පහත සබැඳිවලින් ලබා ගත හැක.

www.sadaham.net/ratanagara
www.youtube.com/@ratanagara

YouTube

පටුන

සබ්බදානං ධම්මදානං ජිනාති ---------- iv

ඇදුරු ආශිර්වාදය ---------- vi

ඇදුරු පරපුරේ ආශිර්වාදය ---------- viii

"අභිධර්ම මාතිකා අධ්‍යයන ප්‍රවේශය - සුභාංශංසනය" ---------- x

අතිවිස්තාරිත පරමාර්ථ ධර්මයෝ ---------- xii

අභිධර්ම ප්‍රකරණයෙහි පැමිණි මාතිකා ---------- xvi

ප්‍රස්තාවනාව ---------- xx

අභිධර්ම පිටකය අධ්‍යයනය ---------- xxx

පටුන ---------- xxxviii

නිදානය ---------- 1

ත්‍රික මාතිකා ස්වරූපාර්ථ ---------- 15

01. කුසල ත්‍රිකය ---------- 15

02. වේදනා ත්‍රිකය ---------- 25

03. විපාක ත්‍රිකය ---------- 33

04. උපාදින්න ත්‍රිකය ---------- 36

05. සංකිලිට්ඨ ත්‍රිකය ---------- 42

06. විතර්ක ත්‍රිකය ---------- 45

07. ප්‍රීති ත්‍රිකය ---------- 51

08. දස්සන ත්‍රිකය ---------- 54

09. දස්සනහේතු ත්‍රිකය ---------- 61

10. ආචයගාමී ත්‍රිකය ---------- 66

11. සෙක්ඛ ත්‍රිකය ---------- 69

12. පරිත්ත ත්‍රිකය ---------- 73

13. පරිත්තාරම්මණ ත්‍රිකය ---------- 76
14. හීන ත්‍රිකය ---------- 80
15. මිච්ඡත්ත ත්‍රිකය ---------- 82
16. මග්ගාරම්මණ ත්‍රිකය ---------- 88
17. උප්පන්න ත්‍රිකය ---------- 100
18. අතීත ත්‍රිකය ---------- 104
19. අතීතාරම්මණ ත්‍රිකය ---------- 106
20. අජ්ඣත්ත ත්‍රිකය ---------- 110
21. අජ්ඣත්තාරම්මණ ත්‍රිකය ---------- 112
22. සනිදස්සන ත්‍රිකය ---------- 115
ත්‍රික පිළිබඳව ---------- 118
ත්‍රික මාතිකා - විශ්ලේෂණය ---------- 119
ත්‍රික මාතිකා - අභ්‍යාස ---------- 123
අභිධර්ම දුක මාතිකා ස්වරූපාර්ථ ---------- 134
01. හේතු ගොච්ඡකය ---------- 134
02. චුල්ලන්තර දුකය ---------- 151
සප්පච්චය දුකය ---------- 153
සංඛත දුකය ---------- 156
සනිදස්සන දුකය ---------- 157
සප්පටිඝ දුකය ---------- 158
රූපී දුකය ---------- 159
ලෝකිය දුකය ---------- 160
කෙනචි විඤ්ඤෙය්‍ය දුකය ---------- 162
03. ආසව ගොච්ඡකය ---------- 167
04. සංයෝජන ගොච්ඡකය ---------- 185
05. ගන්ථ ගොච්ඡකය ---------- 201
06. ඔඝ ගොච්ඡකය ---------- 216
07. යොග ගොච්ඡකය ---------- 225

පටුන වෙත

08. නීවරණ ගොච්ඡකය ---------- 234
09. පරාමාස ගොච්ඡකය ---------- 245
10. මහන්තර දුකය ---------- 256
සාරම්මණ දුකය ---------- 258
චිත්ත දුකය ---------- 262
චෙතසික දුකය ---------- 264
චිත්තසම්පයුත්ත දුකය ---------- 265
චිත්ත සංසට්ඨ දුකය ---------- 266
චිත්ත සමුට්ඨාන දුකය ---------- 267
චිත්තසහභූ දුකය ---------- 268
චිත්තානුපරිවත්ති දුකය ---------- 269
චිත්තසංසට්ඨසමුට්ඨාන දුකය ---------- 270
චිත්තසංසට්ඨසමුට්ඨානසහභූ දුකය ---------- 270
චිත්තසංසට්ඨසමුට්ඨානුපරිවත්ති දුකය ---------- 271
අජ්ඣත්තික දුකය ---------- 272
උපාද දුකය ---------- 273
උපාදින්න දුකය ---------- 274
11. උපාදාන ගොච්ඡකය ---------- 276
12. කිලෙස ගොච්ඡකය ---------- 285
13. පිට්ඨිදුකය ---------- 295
දස්සනෙන පහාතබ්බ දුකය ---------- 299
භාවනාය පහාතබ්බ දුකය ---------- 301
දස්සනෙන පහාතබ්බහෙතුක දුකය ---------- 302
භාවනාය පහාතබ්බ හේතුක දුකය ---------- 303
සවිතක්ක දුකය ---------- 304
සවිචාර දුකය ---------- 305
සප්පීතික දුකය ---------- 305
පීති සහගත දුකය ---------- 306

සුඛ සහගත දුකය ---------- 307
උපේක්ඛා සහගත දුකය ---------- 307
කාමාවචර දුකය ---------- 308
රූපාවචර දුකය ---------- 309
අරූපාවචර දුකය ---------- 310
පරියාපන්න දුකය ---------- 310
නියාානික දුකය ---------- 311
නියත දුකය ---------- 313
සඋත්තර දුකය ---------- 314
සරණ දුකය ---------- 315
අභිධර්ම දුක මාතිකා - අභ්‍යාස ---------- 319
සූත්‍රාන්තික දුක මාතිකා ස්වරූපාර්ථ ---------- 325
01. විජ්ජාභාගි දුකය ---------- 325
02. විජ්ජූපම දුකය ---------- 331
03. බාල දුකය ---------- 334
04. කණ්හ දුකය ---------- 336
05. තපනීය දුකය ---------- 337
06. අධිවචන දුකය ---------- 338
07. නිරුත්ති දුකය ---------- 341
08. පඤ්ඤත්ති දුකය ---------- 342
09. නාමරූප දුකය ---------- 343
10. අවිජ්ජා දුකය ---------- 344
11. භවදිට්ඨි දුකය ---------- 346
12. සස්සතදිට්ඨි දුකය ---------- 346
13. අන්තවාදිට්ඨි දුකය ---------- 347
14. පුබ්බන්තානුදිට්ඨි දුකය ---------- 348
15. අභිරික දුකය ---------- 348
16. හිරී දුකය ---------- 349

පටුන වෙත

17. දොවචස්සතා දුකය ---------- 350
18. සොවචස්සතා දුකය ---------- 351
19. ආපත්ති කුසලතා දුකය ---------- 352
20. සමාපත්ති කුසලතා දුකය ---------- 353
21. ධාතු කුසලතා දුකය ---------- 354
22. ආයතන කුසලතා දුකය ---------- 355
23. ඨාන කුසලතා දුකය ---------- 356
24. අජ්ජව දුකය ---------- 357
25. ඛන්තී දුකය ---------- 358
26. සාඛල්‍ය දුකය ---------- 359
27. ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා දුකය ---------- 360
28. ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා දුකය ---------- 361
29. මුට්ඨ සච්ච දුකය ---------- 362
30. සති දුකය ---------- 362
31. පටිසංඛාන දුකය ---------- 363
32. සමථ දුකය ---------- 364
33. සමථ නිමිත්ත දුකය ---------- 365
34. පග්ගාහ දුකය ---------- 366
35. සීල විපත්ති දුකය ---------- 366
36. සීල සම්පද දුකය ---------- 367
37. සීල විසුද්ධි දුකය ---------- 369
38. දිට්ඨි විසුද්ධි දුකය ---------- 371
39. සංවේජනීයට්ඨාන දුකය ---------- 372
40. අසන්තුට්ඨිතා දුකය ---------- 374
41. විජ්ජා දුක ---------- 375
42. ඛයෙ ඤාණ දුකය ---------- 375
සුත්තන්තික දුක මාතිකා - අභ්‍යාස ---------- 378

අභිධර්ම මාතිකා වර්ණනා

නිදානය

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේ [1] සාරාසඞ්ඛ්‍යෙය කල්ප ලක්ෂයක් [2] තිස්සේ පිරූ බෝධි සම්භාර[3] හේතුවෙන් දඹදිව නේරඤ්ජරා නදී තීරයෙහි බුද්ධගයා ශුද්ධ භූමියෙහි පිහිටි බෝධි මණ්ඩලයේ දී[4] උපතින් පන්තිස් වන වසරෙහි වෙසක් පුර පසළොස් වක් පොහෝ දින අළුයම් කාලයේ දී සර්වඥතා ඥාන ප්‍රතිලාභයත් සමඟ පෙර පසු නොවී ගම්භීර අභිධර්මය[5] ස්වයම්භූඥානයෙන්[6] අවබෝධ කොට දැන වදාළ සේක.

බුද්ධත්වයට පත් වීමෙන් පසු සතරවැනි රතනසර සතියේ දී[7] ගම්භීර අභිධර්මය සම්මර්ශනය කරමින් ශ්‍රී බුද්ධ දේහයෙන් සවණක් ඝන බුද්ධ රශ්මීන්[8] විහිදුවමින් ඥාන ක්‍රීඩාව කරන්නාක්[9] මෙන් ආවර්ජනා කළ සේක. බුද්ධත්වයෙන් සත්වැනි වසරෙහි සැවැත් නුවර දී[10] යමා මහපෙළහර[11] පා වදාරා තව්තිසා භවනයට[12] වැඩම කොට වස් තුන් මාසයක් මුළුල්ලේ මාතෘදිව්‍ය රාජයාණන් ප්‍රධාන දසදහසක් සක්වළ දෙව් බඹුන් මැද[13] අති විස්තාර අභිධර්මය[14] දේශනා කොට වදාළ සේක.

දින අනූවක් මුළුල්ලේ අතරක් නැතිව අභිධර්ම දේශනාව පවත්වමින් සැමදා දිවා පිණ්ඩපාත වේලාව සලකා නිර්මිත බුදු රුවක් මවා පා මෙතෙක් මේ දේශනය කෙරේවා යැයි අදිටන් කොට උතුරු කුරු දිවයිනට පිඬු සිඟා වැඩ හිමවත අනවතප්ත විල් තෙර[15] පැන් සැනසී දන් වළඳා එහි දී උපස්ථානයට වඩින සැරියුත් මහරහතන් වහන්සේට[16] අතිසංක්ෂිප්ත අභිධර්ම දේශනාව[17] පවත්වා වදාළ සේක.

සැවැත් නුවර දී යමා මහපෙළහර දැක සසුන් ගතව පැවිදි වූ පන්සියයක් පමණ වූ නවක සඟ පිරිසට[18] සැරියුත් මහරහතන් වහන්සේ විසින් උගන්වන ලද්දා වූ සර්වඥයන් වහන්සේගේ ම ශ්‍රී මුඛයෙන් දේශනා කරන ලද අභිධර්මය නාති විස්තාර නාති සංක්ෂිප්ත දේශනාව නම් වේ. එය වනාහි ධම්මසංගණී ප්‍රකරණය, විභඞ්ග

පටුන වෙත

ප්‍රකරණය, ධාතුකථා ප්‍රකරණය, පුග්ගලපඤ්ඤත්ති ප්‍රකරණය, කථාවත්ථු ප්‍රකරණය, යමක ප්‍රකරණය සහ පට්ඨාන මහාප්‍රකරණය නමින් ප්‍රකරණ සතකින් සමන්විත වේ.

දෙව්ලොව දී වදාළ අති විස්තාර වූ ද අනවතප්ත විල් තෙර දී වදාළ අති සංක්ෂිප්ත වූ ද සප්ත ප්‍රකරණයෙන් සමන්විත වූ නාති විස්තාර නාති සංක්ෂිප්ත වූ ද ත්‍රිවිධ වූ ගම්භීර අභිධර්ම දේශනාවෙහි සකල පරමාර්ථ ධර්මයෝ සතර දෙනෙක් වෙති. චිත්ත පරමාර්ථය[19], චෛතසික පරමාර්ථය[20], රූප පරමාර්ථය[21] හා නිර්වාණ පරමාර්ථය[22] නමිනි. මෙතැන් සිට සතර පරමාර්ථය හා සම්බන්ධ වූ සබ්බත්ථික මාතිකා භාවනා ක්‍රමය දැක්වේ[23].

සබ්බත්ථික මාතිකා භාවනා වාක්‍ය

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට වදාරන ලද්දා වූ අභිධර්ම සප්ත ප්‍රකරණයෙහි වූ අති උත්තම අර්ථයෙන් ද අවිපරීත අර්ථයෙන් ද පරමාර්ථ නම් වූ ධර්මයෝ චිත්තය, චෛතසිකය, රූපය, නිර්වාණය යැයි සතරාකාර වන්නාහ.

එකුන්අනූ චිත්තයෝ ය, දෙපනස් චෛතසිකයෝ ය, අටවිසි රූපයෝ ය, නිර්වාණය යැයි කියන ලද්දා වූ සතර පරමාර්ථ ධර්මයෝ වනාහි ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම් වෙති. ආයතන වශයෙන් දොළොස්වැදෑරුම් වෙති. ධාතු වශයෙන් අටළොස්වැදෑරම් වෙති. ආර්ය සත්‍ය වශයෙන් සිවුවැදෑරුම් වෙති.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, රූප අටවිස්ස රූපස්කන්ධය නම් වේ. චෛතසික දෙපනස අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වේ. සඤ්ඤා චෛතසිකය සඤ්ඤාස්කන්ධය නම් වේ. ඉතිරි සම පනස් චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වේ. සිත් එකුන්අනූව විඤ්ඤාණස්කන්ධය නම් වේ. නිර්වාණය උත්පාද, ඨිති, භඞ්ග නම් වූ අවස්ථාවන් නැති බැවින් ද අතීතානාගතවර්තමාන ආදී කාල භේදයකට අයත් නැති බැවින් ද ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත නම් වේ. මෙසේ ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම් වන්නාහ.

ආයතන වශයෙන් දොළොස්වැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, අටවිසි රූපය අතුරෙන් චක්ඛු ප්‍රසාද රූපය චක්ඛායතනය නම්. සෝත

ප්‍රසාද රූපය සෝතායතනය නම්. ඝාන ප්‍රසාද රූපය ඝානායතනය නම්. ජිව්හා ප්‍රසාද රූපය ජිව්හායතනය නම්. කාය ප්‍රසාද රූපය කායායතනය නම්. වර්ණ රූපය රූපායතනය නම්. ශබ්ද රූපය සද්දායතනය නම්. ගන්ධ රූපය ගන්ධායතනය නම්. රස රූපය රසායතනය නම්. පඨවි, තේජෝ, වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම්. සිත් අසූනවය මනායතනය නම්. චෛතසික දෙපනස අපෝධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හෘදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාශ රූපය, කාය විඤ්ඤත්ති රූපය, වචී විඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සූක්ෂ්ම රූප සොළොස හා නිර්වාණය ද යන මේ ධර්ම සමූහය ධම්මායතනය නම්. මෙසේ ආයතන වශයෙන් දොළොස්වැදෑරුම් වෙති.

ධාතු වශයෙන් අටළොස්වැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, අටවිසි රූපය අතුරෙන් චක්ඛු ප්‍රසාද රූපය චක්ඛු ධාතුව නම්. සෝත ප්‍රසාද රූපය සෝත ධාතුව නම්. ඝාන ප්‍රසාද රූපය ඝාන ධාතුව නම්. ජිව්හා ප්‍රසාද රූපය ජිව්හා ධාතුව නම්. කාය ප්‍රසාද රූපය කාය ධාතුව නම්. වර්ණ රූපය රූප ධාතුව නම්. ශබ්ද රූපය සද්ද ධාතුව නම්. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම්. රස රූපය රස ධාතුව නම්. පඨවි, තේජෝ, වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම්. චක්ඛුවිඤ්ඤාණ දෙසිත චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම්. සෝතවිඤ්ඤාණ දෙසිත සෝතවිඤ්ඤාණ ධාතුව නම්. ඝානවිඤ්ඤාණ දෙසිත ඝානවිඤ්ඤාණ ධාතුව නම්. ජිව්හාවිඤ්ඤාණ දෙසිත ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම්. කායවිඤ්ඤාණ දෙසිත කායවිඤ්ඤාණ ධාතුව නම්. පඤ්චද්වාරාවජ්ජන සිත හා සම්පටිච්ඡන දෙසිත මනෝ ධාතුව නම්. ඉතිරි සසැත්තෑ චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම්.

චෛතසික දෙපනසය අපෝධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හෘදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාශ රූපය, කාය විඤ්ඤත්ති රූපය, වචී විඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සූක්ෂ්ම රූප සොළොස හා නිර්වාණය ද යන මේ ධර්ම සමූහය ධම්මධාතුව නම්.

පටුන වෙත

ආර්ය සත්‍ය වශයෙන් සිවුවැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, ලෞකික සිත් එක්අසූව ද ලෝභ චෛතසිකය හැර ඉතිරි එක්පනස් චෛතසිකය ද අටවිසි රූපය ද දුක්ඛ සත්‍යය නම්.

ලෝභ චෛතසිකය සමුදය සත්‍යය නම්. නිර්වාණය නිරෝධ සත්‍යය නම්. ලෝකෝත්තර සතර මාර්ග චිත්තයෙහි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුණා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි නම් වූ මාර්ගාංග අට දෙන මාර්ග සත්‍යය නම්. ඉතිරි මාර්ග චිත්තෝත්පාදයෝ එකුන්තිස හා ඵල චිත්තෝත්පාදයෝ සත්තිස සත්‍ය විනිර්මුක්ත වෙති. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් සිවුවැදෑරුම් වෙති.

ත්‍රිලක්ෂණ විදර්ශනාව

- සබ්බත්ථික මාතිකා විදර්ශනා භාවනාවෙහි දී පහළ වූ නාමරූප, ස්කන්ධ, ආයතන, ධාතු නම් වූ පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

- ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

- තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

- අනිත්‍ය වූ, දුක්ඛ වූ, අනාත්ම වූ නාම, රූප, ස්කන්ධ, ආයතන, ධාතු නම් වූ පරමාර්ථ ධර්ම සමූහය පීළන, සංඛත, සන්තාප, විපරිණාම අර්ථයෙන් සමන්වාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍ය නම් වන්නේය.

- ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව ආයූහන, නිදාන, සංයෝග, පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේය.

- ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ නිර්වාණ ධාතුව නිස්සරණ, විවේක, අසංඛත, අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේය.

පටුන වෙත

- ඒ නිරෝධ සත්‍යය අවබෝධ කරගැනීම පිණිස වැඩිය යුතු වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය නියාන, හේතු, දස්සන, ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වේ.

මේ භාවනාමය කුශලානිසංස ධර්මය මෙම චතුරාර්ය සත්‍ය ධර්මය සුව සේ අවබෝධ කරගැනීම පිණිස ම හේතු වේවා වාසනා වේවා.

(මෙම ත්‍රිලක්ෂණ විදර්ශනාව සෑම මාතිකාවක් අවසානයේ දී ම සිදුකළ යුතු ය).

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළා වූ අභිධර්මපිටකය වනාහි ධම්මසංගණී, විභඞ්ග, ධාතුකථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන මහාප්‍රකරණය නමින් සත්වැදෑරුම් වන්නේය.

ඒ අභිධර්ම සප්ත ප්‍රකරණය අතුරෙන් ද ධම්මසංගණී ප්‍රකරණය පළමු කොට වදාළ සේක. එය ද චිත්තුප්පාද කාණ්ඩය[24], රූප කාණ්ඩය[25], නික්ෂේප කාණ්ඩය[26], අර්ථකථා කාණ්ඩය[27], යැයි සිවුවැදෑරුම් වන්නේය.

ඒ කාණ්ඩ සතර අතුරෙන් ද චිත්තුප්පාද කාණ්ඩය පළමු කොට වදාළ සේක. ඒ චිත්තුප්පාද කාණ්ඩය ද මාතෘකාව, පදභාජනීය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් ද මාතෘකාව පළමු කොට වදාළ සේක.

එම තික මාතිකා සහ දුක මාතිකා යන මාතිකා දෙවර්ගය[28] අතරින් තික මාතිකා පළමුව වදාරන ලදී. එම තික මාතිකාවෝ[29] කුසල ත්‍රිකය, වෙදනා ත්‍රිකය, විපාක ත්‍රිකය, උපාදින්න ත්‍රිකය, සංකිලිට්ඨ ත්‍රිකය, විතර්ක ත්‍රිකය, ප්‍රීති ත්‍රිකය, දස්සන ත්‍රිකය, දස්සනහේතු ත්‍රිකය, ආචයගාමී ත්‍රිකය, සෙක්ඛ ත්‍රිකය, පරිත්ත ත්‍රිකය, පරිත්තාරම්මණ ත්‍රිකය, හීන ත්‍රිකය, මිච්ඡත්ත ත්‍රිකය, මග්ගාරම්මණ ත්‍රිකය, උප්පන්න ත්‍රිකය, අතීත ත්‍රිකය, අතීතාරම්මණ ත්‍රිකය, අජ්ඣත්ත ත්‍රිකය, අජ්ඣත්තාරම්මණ ත්‍රිකය, සනිදස්සන ත්‍රිකය වශයෙන් ත්‍රික දෙවිස්සකි.

එම දෙවිස්සක් වූ මාතිකා අතරින් කුසල ත්‍රිකය පළමුව වදාරන ලදී. එම කුසල ත්‍රිකය ප්‍රථම පදය, දෙවන පදය, තෙවන පදය වශයෙන් තෙවැදෑරුම් වේ.

පද විස්තරය

1. **තුන්ලෝකාග්‍ර** - කාම, රූප, අරූප නම් වූ තුන්ලෝකයෙහි ම සීලයෙන්, සමාධියෙන්, ප්‍රඥාවෙන්, විමුක්තියෙන්, විමුක්තිඥාන දර්ශනයෙන්, රූපයෙන්, දේශනා විලාශයෙන්, පාරමී පුණ්‍ය භාග්‍යයෙන් අග්‍ර වූ තථාමියන් වහන්සේ ය.

   භාග්‍යවත් - සදේවක ලෝකවාසීන්ගේ පුණ්‍ය භාග්‍යයට වඩා ශත සහස්‍ර ගුණයෙන් අධික වූ පාරමී පුණ්‍ය භාග්‍යයෙන් සමන්වාගත බැවිනුත් පඤ්ච මාරයන් භග්න කළ බැවිනුත්, ඓශ්වර්ය භාග්‍යාදී සයාකාර භාග්‍ය ගුණයෙන් යුක්ත බැවිනුත් සියළු ධර්මය බෙදා දහම් දෙසූ බැවිනුත් උතුම් මිනිස්දම් භජනය කළ බැවිනුත් සසර ගමනට හේතු වූ අවිද්‍යා, තෘෂ්ණා, කර්ම ක්ලේශයන් වමාරා දමා නිර්වාණ අමෘතය වැළඳූ බැවිනුත් බුදුරජාණන් වහන්සේ භාග්‍යවත් නම් වෙති.

   අරහත් - වාසනා සහිත සකල ක්ලේශයන් කෙරෙන් දුරු වූ බැවිනුත් රාගාදී කෙලෙස් සතුරන් නැසූ බැවිනුත් සංසාර භව චක්‍රය සිඳ බිඳ දැමූ බැවිනුත් සියළු පූජාවන්ට සුදුසු බැවිනුත් රහසිනුදු පවක් නැති පිරිසිදු සන්තාන ඇති බැවිනුත් බුදුරජාණන් වහන්සේ අරහත් නම් වෙති.

   සම්‍යක් සම්බුද්ධ - පිරිසිඳ දත යුතු වූ දුක ය, ප්‍රහාණය කළ යුතු වූ සමුදය ය, ප්‍රත්‍යක්ෂ කළ යුතු වූ නිරෝධය ය, භාවනා වශයෙන් වැඩිය යුතු වූ මාර්ගය ය යන චතුරාර්ය සත්‍යය අනුන්ගේ උපදෙසක් නැතිව ඉතිරියක් ද නැතිව මනා සේ තමන් වහන්සේ ම අවබෝධ කළ හෙයින් සම්‍යක් සම්බුද්ධ නම් වෙති.

   සර්වඥරාජෝත්තමයන් වහන්සේ - හේතුවෙන් හටගත් සංඛත නම් වූ ද හේතුවකින් හට නොගත් අසංඛත ධාතු නම් වූ නිර්වාණය ද යන ලෞකික ලෝකෝත්තර වූ සියළු දේ ද සංස්කාර, විකාර, ලක්ෂණ, ප්‍රඥප්ති, නිර්වාණ නම් වූ පඤ්චවිධ

ඥෙය මණ්ඩලය සර්වාකාරයෙන් දැන වදාළ බැවින් සර්වඥරාජෝත්තමයන් වහන්සේ එනම් වෙති.

2. **සාරාසඞ්ඛ්‍යෙය්‍ය කල්ප ලක්ෂයක්** - පර්වත උපමාවෙන්, සාසප උපමාවෙන් කල්පනා කොට ගනු ලබන කාලය කල්ප නම්. ආයුකල්ප, අන්තර්කල්ප, අසංඛ්‍යකල්ප, මහාකල්ප නමින් එය සතරාකාරය ය. මනුෂ්‍ය ලෝකයෙහි ඒ ඒ කාලයට නියමිත පරමායුෂය ආයුෂ් කල්පය ය. ලෝකයෙහි අවුරුදු අසංඛ්‍යෙය්‍ය ආයුෂය අඩු වී දශ වර්ෂයට බැස ගන්නා කාලය අන්තර් කල්පය ය. එවැනි අන්තර් කල්ප විස්සක් එක අසංඛ්‍ය කල්පයකි. අසංඛ්‍ය කල්ප සතරක් මහාකල්ප එකකි. මහාකල්පයක හතරෙන් එක කොටසක් වූ විවට්ටට්ඨායී අසංඛ්‍ය කල්පය තුළ පමණක් සතර අපාය, මනුෂ්‍ය ලෝකය, දිව්‍ය ලෝකය සහ, බ්‍රහ්ම ලෝක කොටසක ස්ථානයන්හි සත්ත්වයෝ වාසය කරති. එය අන්තර් කල්ප විස්සකි. ගින්නෙන් හෝ ජලයෙන් හෝ වාතයෙන් හෝ ලෝකය විනාශ වෙමින් පවත්නා වූ අන්තර් කල්ප විස්සක් පමණ කාලය සංවට්ට අසංඛ්‍ය කල්පය නම්. ලෝකය විනාශ වී අජටාකාශ බවට පත්වී පවත්නා වූ අන්තර් කල්ප විස්සක් පමණ කාලය සංවට්ටට්ඨායී අසංඛ්‍ය කල්පය නම්. නැවත සක්වළ හැදෙමින් පවත්නා වූ අන්තර් කල්ප විස්සක් පමණ කාලය විවට්ට අසංඛ්‍ය කල්පය නම්. මෙසේ අන්තර් කල්ප අසූවක දීර්ඝ කාලය එක් මහාකල්පයකි.

අසංඛ්‍යෙය්‍ය - සංඛ්‍යා පථයෙහි අන්තිම දීර්ඝ සංඛ්‍යාව අසංඛ්‍යෙය්‍යය යි. එකයි බින්දු එකසිය හතළිහක් ඇත්තේ අසංඛ්‍යෙය්‍යට ය. අසංඛ්‍යෙය්‍ය ලැබෙන්නේ මෙසේ ය.

එක් වරක් දහය දහයයි (1×10=10); දසවරක් දසය සියයයි (10×10=100); සියවරක් දසය දහසයි (100×10=1000); දහස් වරක් දසය දසදහසයි (1000×10=10,000); දසදහස් වරක් දසය ලක්ෂයයි (10,000×10=100,000); ලක්ෂ වරක් දසය දසලක්ෂයයි (100,000×10=1,000,000); දසලක්ෂ වරක් දසය කෝටියයි (1,000,000×10=10,000,000); කෝටි වරක් කෝටිය ප්‍රකෝටියයි (එකයි බින්දු (14) දහ හතරයි); ප්‍රකෝටි වරක් කෝටිය කෝටිප්‍රකෝටි එකයි (එකයි බින්දු (21) විසි එකයි); කෝටි ප්‍රකෝටි

වරක් කෝටිය නහුත එකයි (එකයි බින්දු (28) විසි අටයි); නහුත වරක් කෝටිය නින්නහුත එකයි (එකයි බින්දු (35) තිස් පහයි); නින්නහුත වරක් කෝටිය අක්බෝහිණී එකයි (එකයි බින්දු (42) හතළිස් දෙකයි); අක්බෝහිණී වරක් කෝටිය බින්දු එකයි (එකයි බින්දු (49) හතළිස් නවයයි); බින්දු වරක් කෝටිය අබ්බුද එකයි (එකයි බින්දු (56) පනස් හයයි); අබ්බුද වරක් කෝටිය නිරබ්බුද එකයි (එකයි බින්දු (63) හැට තුනයි); නිරබ්බුද වරක් කෝටිය අහහ එකයි (එකයි බින්දු (70) හැත්තෑවයි); අහහ වරක් කෝටිය අබබ එකයි (එකයි බින්දු (77) හැත්තෑ හතයි); අබබ වරක් කෝටිය අටට එකයි (එකයි බින්දු (84) අසූහතරයි); අටට වරක් කෝටිය සෝගන්ධික එකයි (එකයි බින්දු (91) අනූඑකයි); සෝගන්ධික වරක් කෝටිය උත්පල එකයි (එකයි බින්දු (98) අනූඅටයි); උත්පල වරක් කෝටිය කුමුද එකයි (එකයි බින්දු (105) එකසිය පහයි); කුමුද වරක් කෝටිය පුණ්ඩරීක එකයි (එකයි බින්දු (112) එකසිය දොළොසයි); පුණ්ඩරීක වරක් කෝටිය පදුම එකයි (එකයි බින්දු (119) එකසිය දහනවයයි); පදුම වරක් කෝටිය කථාන එකයි (එකයි බින්දු (126) එකසිය විසිහයයි) කථාන වරක් කෝටිය මහාකථාන එකයි (එකයි බින්දු (133) එකසිය තිස්තුනයි); මහාකථාන වරක් කෝටිය අසංඛෙය්‍ය එකයි (එකයි බින්දු (140) එකසිය හතළිහයි)

සාරාසංඛ්‍ය කල්ප ලක්ෂය - කල්ප ලක්ෂයක් අධික කොට ඇති ඉහත දැක්වූ මහා කල්පය අසංඛ්‍ය සතරක් වූ අති දීර්ඝ කාලයකි.

3. **බෝධි සම්භාර** - සතර මාර්ග ඥාන, සර්වඥතා ඥාන, නිර්වාණ ධාතු නැමති බෝධිය පිණිස රැස් කරනු ලැබෙන පාරමී ගුණ ධර්මයෝ ය.

4. **දඹදිව** - ආදි කල්පයෙහි හටගත් ස්වර්ණමය ජම්බු වෘක්ෂය හේතු කොට ලැබූ නම් ඇති මහාද්වීපය දඹදිව ය. **නේරඤ්ජරා** - බුද්ධගයාව හරහා ගලා යන මහා ගංගාවකි. **බුද්ධගයා** - ගයාව නම් වූ ප්‍රදේශයෙහි දී තථාගතයන් වහන්සේ බුදු බවට පත් වූ තැන් සිට ඒ ප්‍රදේශය බුද්ධගයා නමින් ප්‍රසිද්ධ විය. **බෝධි මණ්ඩලය** - ආදි කල්පයේ සියල්ලට පළමුවෙන් මතුවන

පොළොතලය බෝධි මණ්ඩලය යි. කකුසඳ, කෝණාගමන, කාශ්‍යප නම් වූ අතීත බුදුරජාණන් වහන්සේලා බුද්ධත්වයට පැමිණි ස්ථානය ද එය ම ය. සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය සමඟ ම පෙර පසු නොවී එතැන අස්වත්ථ බෝධිවෘක්ෂය පහළ වී ඇත. අතිශ්‍රේෂ්ඨ, අතිඋත්තමාර්ථයෙන් එම ස්ථානය බෝධි මණ්ඩලය නමින් හැඳින්වේ.

5. **අභිධර්මය** - 'අභි' - විශිෂ්ට වූ, 'අභි' - අතිරේක වූ ධර්මය අභිධර්මය ය. සූත්‍රාන්ත පිටකයෙහි ස්කන්ධ, ආයතන, ධාතු ආදී වූ ද චිත්ත, චෛතසික, රූප හා නිර්වාණ නම් වූ ද පරමාර්ථ ධර්මයන් එක් එක් කොටසක් විනා ඉතිරි නැතිව දේශනා කොට නොමැත. අභිධර්ම සප්ත ප්‍රකරණය වනාහි පරමාර්ථ ධර්මයන් ඉතිරි නැතිව සර්ව සම්පූර්ණව දේශනා කොට ඇත. එනිසා සූත්‍රාන්තයට වඩා විශිෂ්ට වූ ද අතිරේක වූ ද පරමාර්ථ ධර්මය අභිධර්මය නම් වේ.

6. **ස්වයම්භූඥානය** - අන් කෙනෙකුගේ උපදේශයකින් තොරව තමන් වහන්සේගේ ම සන්තානයෙහි පහළ වන ඥානය ස්වයම්භූඥානය යි.

7. **රතනඝර** - බුදු වීමෙන් සතරවැනි සතියෙහි දී සර්වඥයන් වහන්සේ බෝධිවෘක්ෂයට වයඹ දෙස පිහිටි ස්ථානයක වැඩහිඳ ධර්මය සම්මර්ශනය කළ සේක. එතැන වැඩහිඳීමට දෙවියන් විසින් රුවන් ගෙයක් මවන ලදී. ධර්ම රත්නය සම්මර්ශනය කළ හෙයින් ද එතැන රතනඝර නමින් හැඳින්වේ.

8. **සවණක් ඝන බුදු රැස්** - සර්වඥ ශ්‍රී දේහයෙන් නිකුත් වූ නිල්, කහ, ලේ (රතු), සුදු, මදටිය හා මිශ්‍ර යන පාට සයකින් යුක්ත වූ අසිරිමත් බුදු රැස් සවණක් ඝන බුදු රැස් නමින් හැඳින්වේ.

9. **ඥාන ක්‍රීඩාව** - මහාසාගර පත්ලෙහි මහාමත්ස්‍යයන්ට ක්‍රීඩා කරන්නට ලැබෙන්නා සේ සර්වඥතාඥානයට රිසි සේ හැසිරීමට ඉඩ ලැබුණේ අභිධර්මයෙහි සමන්ත පට්ඨාන මහාප්‍රකරණයෙහි ය. එය ඥාන ක්‍රීඩාවක් වැනි ය.

10. **සැවැත් නුවර** - අචිරවතී ගඟ අසබඩ පිහිටි, කොසොල් රාජධානියෙහි අගනුවර යි. තථාගතයන් වහන්සේ වස් කාල විසිපහක් ම වැඩසිටියේ සැවැත් නුවර ඇසුරු කොටගෙන ය.

11. **යමා මහපෙළහර** - සර්වඥයන් වහන්සේ හැර කිසි ම ඍද්ධිවන්තයකුට පෑ නොහැකි අතිවිශේෂ ප්‍රාතිහාර්යයකි. බුදු වී දෙවැනි සති අන්තයේ දී ද ඥාති සමාගමයෙහි දී ද සැවැත් නුවර ගණ්ඩම්බ රුක් මුල දී ද පාටීකපුත්‍ර සමාගමයෙහි දී දැයි තථාගතයන් වහන්සේ සතර වරක දී යමා මහපෙළහර පෑ සේක.

12. **තව්තිසා භවන** - මහපොළොවෙහි සිට යොදුන් 42,000 ක් ඉහළින් චාතුර්මහාරාජික දෙව්ලොව ද එතැන් සිට යොදුන් 42,000 ක් ඉහළින් තව්තිසා භවන ද පිහිටා තිබේ. ශ්‍රක භවන යනු ද එයට ම නමකි. මිනිස් ලොව අවුරුදු සියයක් එහි එක් දවසකි. එවැනි දවස් තිහක් මාසයකි. එවැනි මාස දොළහක් වසරකි. දිව්‍ය වර්ෂ දහසක් එහි පරමායුෂ වේ. මිනිස් ලොව වර්ෂ ගණනින් වර්ෂ තුන්කෙළ හැටලක්ෂයකි. සර්වඥයන් වහන්සේ තෙමසක් මුළුල්ලේ අභිධර්ම දේශනාව කළ සේක් තව්තිසා භවනේ දී ය. අපට තෙමස එහි විනාඩි නවයකි.

13. **වස්සාන තුන් මාසය** - වසරකට ඍතු තුනකි. හේමන්ත, ගිම්හාන, වස්සාන යනුවෙනි. බක්, වෙසක්, පොසොන්, ඇසළ යන මාස හතර ගිම්හානය යි. නිකිණි, බිනර, වප්, ඉල් යන මාස හතර වස්සානය යි. උඳුවප්, දුරුතු, නවම්, මැදින් යන මාස හතර හේමන්තය යි. ඇසළ පෝය ගෙවී අව පැළවිය දින සිට වප් පුර පසළොස්වක් දින තෙක් වස්සාන තුන් මාසය යැයි ද ඉල් මාසය චීවර මාසය යැයි ද කියනු ලැබේ.

මාතෘ දිව්‍යරාජයාණෝ - බුද්ධාංකුර සිද්ධාර්ථ කුමාරයන් වහන්සේ බිහි කළ මහාමයා මවුබිසව එයින් සත්වැනි දින එනම් වෙසක් අව සතවක දින මනුලොවින් චුත වී තුසිත දෙව්ලොව දිව්‍යරාජයෙක් වී උපනි. මාතෘ දිව්‍යරාජයාණෝ යනු එතුමා ය. සියලු බෝසත් මවුවරු බෝසත් උපතින් සත්වැනි දින මනුලොවින් චුතවීමත් තුසිත භවනයෙහි දෙව්රජ කෙනකු වී ඉපදීමත් ආවේණික ධර්මතාවකි.

පටුන වෙත

දසදහසක් සක්වළ දෙවිබඹුන් - අවීචියේ සිට භවාග්‍රය තෙක් ඇති එක්තිස් භූමිය එක සක්වළකි. මේ මගුල් සක්වළ අවට ඇත්තා වූ එවැනි සක්වළ දසදහස ජාති ක්ෂේත්‍රය නමින් ද හැඳින්වේ. තථාගතයන් වහන්සේගේ ප්‍රතිසන්ධිය, උප්පත්තිය, බුද්ධත්වය, ධම්මචක්ක දේශනය, ආයු සංස්කාර අත්හැරීම, පිරිනිවීම යන අවස්ථාවන්හි දී කම්පිත වන්නේ මේ දසදහසක් සක්වළ යි. බුදු සසුනක දී මග පල නිවන් ලැබෙන්නේ ද මේ දසදහසක් සක්වළවාසීන්ට ය. දසසහසක් සක්වළින් බණ ඇසීමට පැමිණි කාමාවචර දිව්‍යලෝකයන්හි දෙවියෝ ද රූපාවචර බ්‍රහ්මලෝකයන්හි බ්‍රහ්මයෝ ද වූහ.

14. **අතිවිස්තාර අභිධර්මය** - සර්වඥයන් වහන්සේ විසින් තෙමසක් මුළුල්ලේ දෙසූ ධර්මය අනන්ත අප්‍රමාණ ය. සාමන්‍ය මිනිසෙක් එක වචනයක් කියන කෙටි කාලය තුළ ආනන්ද හිමියෝ වචන අටක් කියති. ආනන්ද මාහිමියන් වහන්සේ වචනයක් කියන කෙටි කාලය තුළ සර්වඥයන් වහන්සේ වචන දහසයක් කියති. සුව සේ පියවෙන දෙතොල, දිගු පුළුල් තුනී ජිව්හා ධාතුව, සොළොස් වක් චන්ද්‍ර රේඛාව වැනි වූ දෙහනුව, නාභියේ සිට පිත් සෙම් නොබැඳුණු ස්වර නාලය, අෂ්ටාංග සමන්වාගත බ්‍රහ්මස්වරය, මානෙල් මල් සුවඳ විහිදෙන ශ්‍රී මුඛ පද්මය, සුදු බුදු රැස් විහිදෙන දළදා සතර, කල්ප කෝටි සතසහස්‍ර ගණනක් තිස්සේ පිරූ වාග් සුචරිතය යනාදී සම්පත්හි පිහිටා දිවා රාත්‍රී අතරක් නැර සර්වඥයන් වහන්සේ දෙසූ අභිධර්මය අනන්ත අප්‍රමාණ බැවින් එය අතිවිස්තාර අභිධර්ම දේශනාව නම් වේ.

15. **උතුරුකුරු දිවයින, අනවතප්ත විල** - නියතයෙන් පන්සිල් රකින, මගේ කියා කිසිවක් නොගන්නා, ස්වයංජාත සුවඳ රත්හැල් අනුභව කරන, කල්ප වෘක්ෂයෙන් ඇඳුම්-පැළඳුම් ආදී සම්පත් විඳින මග පල නිවන් යාමට අවකාශයක් නැති මිනිසුන් වෙසෙන මහත් ද්වීපයකි. අනවතප්ත විල - චිත්‍රකූට, කාලකූට, ස්වර්ණකූට, රජතකූට, ගන්ධමාදන නම් වූ පර්වත පසෙකින් වට වී හිරු එළියක් නොවදින යොදුන් පනහක් වට ඇති ඉතාමත් සිසිල් පිරිසිදු ජලය පිරි විලකි.

16. **සැරියුත් මහරහතන් වහන්සේ** - ඒකාසංඛෙය්‍ය කල්ප ලක්‍ෂයක් පිරූ පාරමිතා ඇති ප්‍රඥාවෙන් අගතැන්පත් වූ ධර්මසේනාධිපති අග්‍රශ්‍රාවකයන් වහන්සේ ය.

17. **අතිසංක්‍ෂිප්ත අභිධර්ම දේශනාව** - සර්වඥයන් වහන්සේ දිනපතා සැට පැයක් තිස්සේ දෙසූ ධර්මයේ මාතෘකා සියල්ල සැරියුත් මහරහතන් වහන්සේට දෙසූ සේක. අභිධර්ම සප්ත ප්‍රකරණයට ම සාධාරණ වූ එම මාතෘකා දේශනාව අතිසංක්‍ෂිප්ත අභිධර්ම දේශනාව යි.

    නාති විස්තාර නාති සංක්‍ෂිප්ත අභිධර්ම දේශනාව - සර්වඥයන් වහන්සේගෙන් ලැබුණ මාතෘකා අනුව මනුෂ්‍යයන්ට උද්ග්‍රහණ, ධාරණ, දේශන හා වාචනයට තරම් ප්‍රමාණවත්ව සැරියුත් මහරහතන් වහන්සේ විසින් ශිෂ්‍යයන්ට ඉගැන්වූ අභිධර්ම සප්ත ප්‍රකරණය නාති විස්තාර නාති සංක්‍ෂිප්ත අභිධර්ම දේශනාව යි.

18. **පන්සියයක් පමණ වූ සඟ පිරිස** - කාශ්‍යප බුද්ධ ශාසන කාලයේ දී අභිධර්ම සඞ්ගායනාවකට නිතර කන් දී සිත් පහදවා ගත් කිරි වවුලෝ පන්සියයක් දෙනා ඒ පිනෙන් ම දෙව්ලොව ඉපිද සැප විඳ සැවැත් නුවර පින් ඇති දරු පිරිසක් ව ඉපිද සිටියහ. යමා මහපෙළහර දැක පැහැදී සැරියුත් මහරහතන් වහන්සේ වෙත පැවිදි වූහ. එම තෙමස තුළ අභිධර්ම පිටකය උගෙන අවසන් වූ දින රහත් ඵලයට පත්වූහ.

19. **චිත්ත පරමාර්ථය** - විසිතුරු දේ නිපදවන, තමන් ම විසිතුරු, කර්ම ක්ලේශයන් විසින් උපදවන, සන්තානය රකින, ආත්ම සන්තානය ගොඩනගන, විසිතුරු අරමුණු ගන්නා යන අර්ථ සයකින් යුක්ත වූ චිත්තය නම් අරූපී ධර්මයකි. සිත් අසූනවයක් හෝ එකසිය විසිඑකක් වේ.

20. **චෛතසික පරමාර්ථය** - සිතෙහි හටගත් අර්ථයෙන් එනම් වේ. ඒවා දෙපනසකි.

21. **රූප පරමාර්ථය** - ශීතෝෂ්ණාදී විරුද්ධ ප්‍රත්‍යයෙන් වෙනස් වන සුලු ඖදාරික පරමාර්ථයකි. එය විසිඅට වැදෑරුම් වේ.

22. **නිර්වාණය පරමාර්ථය** - හේතු ප්‍රත්‍යයකින් සකස් නොවූ අසංඛත ධාතුව ය. තෘෂ්ණාවට අරමුණු නොවන බැවින් හා එකොළොස් මහගිනිමැළ නිවුණු බැවින් ද නිර්වාණය නම් වේ.

23. **සබ්බත්තික මාතිකාව** - කුසලා ධම්මා යනාදී වශයෙන් ධම්මසඞ්ගණී ප්‍රකරණයෙහි වදාළ අභිධර්ම මාතෘකාගත සියළු පරමාර්ථ ධර්මයන් ස්කන්ධ, ආයතන, ධාතු සහ ආර්ය සත්‍ය වශයෙන් බෙදා දක්වමින් අභිධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණය කරන ශිෂ්‍යයන්ගේ අවබෝධය විශද කිරීමේ අධ්‍යාශයෙන් යුතුව පුරාණාචාර්යයන් වහන්සේලා විසින් සබ්බත්තික මාතිකාව ගෙනහැර දැක්වූහ. මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් ධම්මසඞ්ගණී ප්‍රකරණයෙහි වදාළ මාතිකාවක් නොවන අතර පුරාණාචාර්යයන් වහන්සේලා විසින් දක්වන ලද්දකි.

24. **චිත්තුප්පාද කාණ්ඩය** - චිත්ත චෛතසිකයන් විස්තරාත්මකව දක්වන පාළිය චිත්තුප්පාද කාණ්ඩය යි. චිත්තවිභත්ති යනුවෙන් ද හඳුන්වනු ලැබේ.

25. **රූප කාණ්ඩය** - ඒකවිධ ආදී නයක්‍රමවලින් මාතිකා තබා රූපය විස්තරාත්මකව දක්වන පාළිය රූප කාණ්ඩය යි. රූප විභත්ති යනුවෙන් ද හඳුන්වනු ලැබේ.

26. **නික්ෂේප කාණ්ඩය** - මූල, ස්කන්ධ, ද්වාර, භූමි ආදි වශයෙන් සංක්ෂේපයෙන් දක්වන පාළිය නික්ෂේප කාණ්ඩය යි. නික්ඛෙප රාසි යනුවෙන් ද හඳුන්වනු ලැබේ.

27. **අර්ථකථා කාණ්ඩය** - ත්‍රිපිටක බුද්ධවචනයන්ගේ අර්ථෝද්ධාරභූත වූ සරණ දුකය දක්වා ඇති පාළිය අර්ථකථා කාණ්ඩය යි. අත්ථුද්ධාර යනුවෙන් ද හඳුන්වනු ලැබේ.

28. **මාතිකා** - (මාතා වියාති මාතිකා) මවක් මෙන් වේ නු යි 'මාතිකා' නම් වේ. කවරක් නිසා ද? යත්, මව දරුවන් බිහිකරනා බැවිනි. මාතිකාවන් (මාතෘකා) 'නිද්දෙස' (නිර්දේශ) බිහිකරයි. මෙසේ බිහි කරන ස්වභාවයෙන් මවකට සමාන වේ.

(මාතිකා වියාති මාතිකා) - දිය ඇළක් මෙන් වේ නු යි 'මාතිකා' නම් වේ. කවරක් නිසා ද? යත්, දිය ඇළ කෙත්-වතු, පොකුණු,

කුඩා ඇළවල් ආදියට ඇතුළුවෙයි. මාතෘකාව ද නිර්දේශයට අර්ථ වශයෙන් ඇතුළුවෙයි. මෙසේ ඇතුළුවන ස්වභාවයෙන් සමාන ය.

තවත් ක්‍රමයකින් දක්වුවහොත් දිය ඇළ කෙත්-වතු, පොකුණු, කුඩා ඇළවල් සමඟ සම්බන්ධව පවතී. මාතිකාව ද නිර්දේශයට අර්ථ වශයෙන් සම්බන්ධ වී පවතී. මෙසේ සම්බන්ධ වන ස්වභාවයෙන් ද සමාන ය.

පදභාජනීය - මාතිකාවල පැමිණෙන පදයන් විස්තරාත්මකව දක්වන පාළිය 'පදභාජනීය' නම් වේ.

29. **ත්‍රික මාතිකා** - පරමාර්ථ ධර්ම කොට්ඨාශත්‍රයක් එක් කරමින් (පදත්‍රයක් වශයෙන්) දේශනා කරන්නා වූ ශබ්ද පෙළ 'ත්‍රිකයක්' (තික) නම් වේ. මෙසේ පරමාර්ථ ධර්මත්‍රයක් එක් කරමින් දේශනා කරන පදත්‍රය ද, එබඳු පදත්‍රය බැගින් දේශනා කර දක්වන ලද සුචිපත්‍රය (පටුන) ද තික මාතිකා නම් වේ.

දුක මාතිකා - පරමාර්ථ ධර්ම කොට්ඨාශ දෙකක් එක් කරමින් (පද දෙකක් වශයෙන්) දේශනා කරන්නා වූ ශබ්ද පෙළ 'දුකයක්' නම් වේ. මෙසේ පරමාර්ථ ධර්ම කොට්ඨාශ දෙකක් එක් කරමින් දේශනා කරන පදද්වය ද, එබඳු පදද්වය බැගින් දේශනා කර දක්වන ලද සුචිපත්‍රය (පටුන) ද දුක මාතිකා නම් වේ.

ත්‍රික මාතිකා ස්වරූපාර්ථ

01. කුසල ත්‍රිකය

ප්‍රථම පදය - කුසලා ධම්මා, දෙවන පදය - අකුසලා ධම්මා, තෙවන පදය - අබ්‍යාකතා ධම්මා

ස්වරූපාර්ථ වගුව

පද	ස්වරූපාර්ථ	සංග්‍රහය			
		ස්[1]	ආ	ධා	ස
ප	කු-21, චෙ-38	4	2	2	2
දු	අකු-12, චෙ-27	4	2	2	2
ත	වි-36, ක්‍රි-20, චෙ-38, රූ-28, නි	5	12	18	2

වාචනය - ඒ ධර්ම තුන අතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. ඒ කෙසේ ද? යත්, - කුසලා ධම්මා යනුවෙනි. ඉන් අනතුරුව දෙවන පදය වදාළ සේක. දේශනාව වනාහි - අකුසලා ධම්මා යනුවෙනි. ඉන් අනතුරුව තෙවන පදය වදාළ සේක. දේශනාව වනාහි - අබ්‍යාකතා ධම්මා යනුවෙනි.

කුසලා (අනවජ්ජසුඛවිපාකලක්ඛණා) - අනවද්‍ය ඉෂ්ට විපාක දීම ලක්ෂණ කොට ඇත්තා වූ, **ධම්මා (නිස්සත්තනිජ්ජීවසභාවා)** - නිස්සත්ව, නිජ්ජීව ස්වභාව පරමාර්ථ ධර්ම කෙනෙක් **(සන්ති, සංවිජ්ජන්ති)** - විද්‍යාමානව ඇත්තාහ.

අකුසලා (සාවජ්ජදුක්ඛවිපාකලක්ඛණා) - සාවද්‍ය අනිෂ්ට විපාක දීම ලක්ෂණ කොට ඇත්තා වූ, **ධම්මා (නිස්සත්තනිජ්ජීවසභාවා)** -

---

1. **සංකේත:** ස් - ස්කන්ධ, ආ - ආයතන, ධා - ධාතු, ස - සත්‍ය, කු - කුසල, අ - අකුසල, වි - විපාක, ක්‍රි - ක්‍රියා, නි - නිර්වාණය ආදි කෙටි සංකේතයන් මෙම ග්‍රන්ථයෙහි සුදුසු ප රිදි දැක්වේ.

පටුන වෙත

නිස්සත්ව, නිජ්ජීව ස්වභාව පරමාර්ථ ධර්ම කෙනෙක් **(සන්ති,සංවිජ්ජන්ති)** - විද්‍යාමානව ඇත්තාහ.

අබ්‍යාකතා (කුසලාකුසලභාවෙන අකථිතා, අඤ්ඤභාවෙන කථිතා) - කුශලාකුශල වශයෙන් නොවදාරා අන්‍ය ස්වභාවයකින් වදාරන ලද්දා වූ, **ධම්මා (නිස්සත්තනිජ්ජීවසභාවා)** - නිස්සත්ව, නිජ්ජීව ස්වභාව පරමාර්ථ ධර්ම කෙනෙක් **(සන්ති, සංවිජ්ජන්ති)** - විද්‍යාමානව ඇත්තාහ.[2]

---

2. <u>**කුසලා**</u> - "කුච්ඡිතෙ පාපකෙ ධම්මෙ සලයන්ති චලයන්ති කම්පෙන්ති විද්ධංසෙන්ති'ති = කුසලා" නින්දිත වූ පාපධර්මයන් සලනය, චලනය, කම්පනය, විධ්වංසනය කරන අර්ථයෙන් කුසල ධර්ම නම්.

නින්දිතාකාරයෙන් සන්තානයෙහි සයනය කරත් නු යි අකුසලයෝ 'කුස' නම් වෙති. ඒ කුස නම් වූ අකුසලයන් ලුනනය, ඡින්දනය කෙරෙත් නු යි ද කුසල ධර්ම නම් වේ. "කුච්ඡිතෙන වා ආකාරෙන සයන්තී'ති කුසා, තෙ අකුසලසංඛාතෙ කුසෙ ලුනන්ති ඡින්දන්තී'ති කුසලා".

නින්දිත වූ පාපයන් ලියාලන තුනී කරන කෙළවර කරන බැවින් ද ප්‍රඥාව 'කුස' නම් වේ. ඒ කුස නම් වූ ප්‍රඥාවෙන් (කෙලෙස්) ලියාලිය යුතු බැවින් ද ගත යුතු බැවින් ද පැවැත්විය යුතු බැවින් ද කුසල ධර්ම වේ. "කුච්ඡිතානං වා සානතො තනුකරණතො ඔසානකරණතො ඤාණං කුසං නාම, තේන කුසේන ලාතබ්බාති කුසලා, ගහෙතබ්බා පවත්තෙතබ්බාති අත්ථො".

තව ද කුස තණ කොළය දෙපැත්තෙන් කැපෙන්නේ යම් සේ ද එසේ ම මෙම කුසලය උපන්නා වූ ද උපදින්නට තිබෙන්නා වූ ද කෙලෙස් සිඳින බැවින් කුසල ධර්ම නම් වෙති. "යථා වා කුසා, උභයභාගගතං හත්ථප්පදෙසං ලුනන්ති, එවම්මෙපි උපන්නානුප්පන්නභාවෙන උභයභාගගතං කිලෙසපක්ඛං ලුනන්ති, තස්මා කුසා විය ලුනන්තී'ති'පි කුසලා."

පටුන වෙත

අනවජ්ජ - න+අවජ්ජ යැයි පද බෙදාගත යුතු යි. (වජ්ජිතබ්බන්'ති = වජ්ජං, වජ්ජමෙව අවජ්ජං, නත්ථි අවජ්ජං යෙසන්ති = අනවජ්ජා) අවලාදයට ලක්වීමට සුදුසු බැවින් ක්ලේශයෝ වජ්ජ (අවජ්ජ) යැයි කියනු ලැබේ. ක්ලේශ දෝෂයන්ගෙන් විරහිත කුසල, විපාක, ක්‍රියා (කුසල, අව්‍යාකෘත ධර්මයෝ) අනවජ්ජ යැයි කියනු ලැබේ. (ජාත්‍යාචාරාදීහි නිහීනොයන්ති අවදිතබ්බො'ති අවජ්ජො. තබ්භාවත්ථො චෙත්ථ අකාරො. වද වියත්තියං වාචායං. ණ්‍යා ද්‍යස්ස ජ්ජො (අ+ √වද ණ්‍ය)).

සුඛ - මෙහි 'සුඛ' ශබ්දය සුඛ වේදනා අර්ථය ප්‍රකාශ නො කරයි. 'ඉට්ඨ' (ඉෂ්ට) ශබ්දයාගේ පර්යායක් (පර්යාය වචනය යනු සමානාර්ථය ඇති වචනය යි) වෙයි. එම නිසා 'ඉෂ්ට විපාක දීම ලක්ෂණ කොට ඇත්තා වූ' යනුවෙන් අර්ථ දක්වා ඇත.

සුඛවිපාක - විපාක ශබ්දය දක්වන ක්‍රම දෙකකි. මුඛ්‍ය විපාකය වන නාම විපාක හෙවත් නාමස්කන්ධ සතර දක්වන ක්‍රමය පළමු වැන්න යි. විපාකයේ සියලු ඵලයන් සලකමින් නාම විපාක සහ රූප විපාක හෙවත් ස්කන්ධ පඤ්චකය දක්වන ක්‍රමය දෙවැන්න යි. එම ක්‍රම දෙක ම 'ඉෂ්ට විපාක දීම ලක්ෂණ කොට ඇත්තා වූ' යන අර්ථයෙහි ඇතුළත් වේ. විපාකා ධම්මා යන මෙම මාතිකාවේ ගනු ලබන්නේ මින් පළමු වැන්න යි.

එම නිසා සුඛවිපාක පදයේ ස්වරූපාර්ථ සඳහා අහේතුක කුසල විපාක 08, මහාවිපාක 08, මහග්ගත විපාක 09, ඵල සිත් 04 වශයෙන් සිත් 29ක් ද තත් සම්ප්‍රයුක්ත චෛතසික 36ක් ද යන නාම විපාක ද කර්මජ රූප 20 ද ගැනීම සුදුසු ය.

අනවජ්ජසුඛවිපාක - 'අනවජ්ජ' වචනයෙන් කුසල ධර්මයන් පවතින අවස්ථාවේ ඇති සුඛය (පවත්තිසුඛතා) ප්‍රකාශ කරයි. 'සුඛවිපාක' වචනයෙන් විපාක දෙන අවස්ථාවේ ඇති සුඛය (විපාකසුඛතා) ප්‍රකාශ කරනු ලබයි. මෙසේ අර්ථ දෙකක් ඇතුළත් කරවීම සඳහා එක් පදයක් පමණක් නොදක්වා **අනවජ්ජසුඛවිපාක** යැයි පද දෙකක් දැක්වූහ. (වෙනත් නයක්‍රම සඳහා මූලටීකාව පරිශීලනය කරන්න).

පටුන වෙත

අනවජ්ජසුඛවිපාකලක්ඛණා - අනවද්‍ය ඉෂ්ට විපාක දීම ලක්ෂණ කොට ඇත්තා වූ, නොහොත් අනවද්‍ය ඉෂ්ට විපාක සහිත ව ලක්ෂිත වන්නා වූ, නොහොත් අනවද්‍ය බව ද ඉෂ්ට විපාකයාගේ ලක්ෂණ ඇති බව ද යන ලක්ෂණ ඇති යනුවෙන් මූලටීකාචාර්යයන් වහන්සේගේ අදහසට අනුව අර්ථ දැක්විය හැක.

අකුසලා - (න කුසලා = අකුසලා) **කුසලා** - කුසලයෝ; **න** - නො වේ. 'කුසලයෝ නො වෙති' යන ප්‍රකාශය කුසලයන්ට ප්‍රතිවිරුද්ධ යන අර්ථය ම ගනියි. කවරක් නිසා ද? යත්, **න** = අ ශබ්දය විරුද්ධ ප්‍රතිපක්ෂ අර්ථය ප්‍රකාශ කරන බැවිනි.

සාවජ්ජ - සහ+අවජ්ජ - ගර්හාවට සුදුසු වන ක්ලේශයන් සමඟ පවතින අකුසල ධර්මයන් 'සාවජ්ජ' නම් වේ.

දුක්ඛවිපාක - අකුසල විපාක සිත් 7, චෛතසික 10, කර්මජ රූප 20 දුක්ඛවිපාක ධර්මයෝ නම් වෙති.

සාවජ්ජදුක්ඛවිපාකලක්ඛණා - වද්‍ය වූ ධර්ම සමඟ පවතින අනිෂ්ට විපාක ලක්ෂණ ඇති, නොහොත් වද්‍ය වූ ධර්ම සමඟ පවතින අනිෂ්ට විපාකයෙන් ලක්ෂිත, නොහොත් වද්‍ය වූ ධර්ම සමඟ පවතින ඇති බව, අනිෂ්ට විපාක ඇති බව යන ලක්ෂණ ඇති යනුවෙන් අර්ථ දැක්විය හැක.

අබ්‍යාකතා - (න බ්‍යාකතා'ති = අබ්‍යාකතා) 'බ්‍යාකරොති' යන පදයේ අර්ථය 'ප්‍රකාශ කිරීම' යන්නයි. මෙම ත්‍රිකයෙහි දේශනා කරන ලද (ප්‍රකාශ කරන ලද) ධර්මයන් නම් කුසල සහ අකුසලයෝ ය. මෙහි දී දේශනා කොට වදාළ (ප්‍රකාශ කළ) ධර්මයෝ නොවන බැවින් 'අබ්‍යාකත' නම් වේ. එමනිසා අටුවාචාරීන් වහන්සේ "කුසල අකුසලභාවයෙන් දේශනා නොකරන ලදී" (කුසලාකුසලභාවෙන අකථිතා'ති අත්ථො) යැයි නැවතත් විස්තර කළහ."කුසලාකුසලයන්ගේ භාවයෙන් දේශනා නො කොට කෙසේ දේශනා කරන ලද ද?" යන පැනයට පිළිතුරු වශයෙන් "අන්‍යභාවයෙන් දේශනා කරන ලදී" (අඤ්ඤභාවෙන කථිතා) යැයි ස්වරූපාර්ථ දක්වන ආචාර්යයන් වහන්සේ විස්තර කරති. මෙහි දී 'අ' ශබ්දය සඳහා ඇති බොහෝ

කුසලා ධම්මා යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් **ස්වරූපාර්ථ වශයෙන් එක්විසි කුසල චිත්තයෝ ද තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකයෝ ද ලැබෙති.** ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

ස්කන්ධ වශයෙන් සතරවැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, අටතිස් චෛතසිකය අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වේ. සඤ්ඤා චෛතසිකය සඤ්ඤාස්කන්ධය නම් වේ. ඉතිරි සතිස් චෛතසික සංස්කාරස්කන්ධය නම් වේ. එක්විසි කුසල චිත්තය විඤ්ඤාණස්කන්ධය නම් වේ. මෙසේ ස්කන්ධ වශයෙන් සතරවැදෑරම් වෙති.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, එක්විසි කුසල චිත්තය මනායතනය නම් වේ. අටතිස් චෛතසිකය ධම්මායතනය නම් වේ.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, එක්විසි කුසල චිත්තය මනෝධාතු නම් වේ. අටතිස් චෛතසිකය ධම්මධාතු නම් වේ. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වෙති.

ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, ලෞකික කුසල් සිත් සතළොස ද තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වේ. සතර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුණා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සෝතාපත්ති මාර්ගාංගයෝ අටදෙන එක් වරක් ද

අර්ථයන් අතරින් අන්‍යාර්ථය ලැබේ යැයි ගැනීම සුදුසු ය. පෙර දේශනා කරන ලද, එනම් 'ව්‍යාකත' නම් වූ කුසල අකුසලයන්ගෙන් අන්‍ය වූ ධර්මයන් යැයි අදහස් වේ.

සම්මා සංකප්ප වර්ජිත සත්දෙන සතර වරක් ද සකදාගාමී මාර්ගාංගයෝ අටදෙන එක් වරක් ද සත්දෙන සතර වරක් ද අනාගාමී මාර්ගාංගයෝ අටදෙන එක් වරක් ද සත්දෙන සතර වරක් ද අර්හත් මාර්ගාංගයෝ අටදෙන එක් වරක් ද සත්දෙන සතර වරක් ද යන මෙතෙක් ධර්මයෝ මාර්ග සත්‍යය නම් වෙති. අතිරික්ත මාර්ග චිත්තෝත්පාදයෝ එකුන්තිස්දෙනා සත්‍ය විනිර්මුක්ත වෙති.

මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වෙති.[3]

අකුසලා ධම්මා යන දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දොළොස් අකුසල චිත්තයෝ ද තත් සම්ප්‍රයුක්ත සත්විසි චෛතසිකයෝ ද යන මේ ධර්මයෝ ලැබෙති.

ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

ස්කන්ධ වශයෙන් සතරවැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, සත්විසි චෛතසිකය අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වේ. සඤ්ඤා චෛතසිකය සඤ්ඤාස්කන්ධය නම් වේ. ඉතිරි පස්විසි චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වේ.

---

3. **මාර්ගාංග අට සහ මාර්ගාංග සත** - ප්‍රථමධ්‍යානයෙහි විතර්කය නම් වූ සම්මාසංකප්ප මාර්ගාංගය යෙදේ. දුතියධ්‍යානයේ පටන් නො යෙදේ. එම නිසා ප්‍රථමධ්‍යානය සඳහා මාර්ගාංග අටක් ලෙස ද දුතියධ්‍යානාදිය සඳහා මාර්ගාංග සතක් යැයි කියනු ලැබේ.

මාර්ග චිත්තෝත්පාදයෝ එකුන්තිස්දෙනා - මාර්ග සිත් සතරෙහි චෛතසික 36 කි. එම චෛතසිකයන්හි ඇති මාර්ග සත්‍යයට ඇතුළත් මාර්ග ධර්මයන් අට අඩුකළ විට චෛතසික 28ක් ඉතිරි වේ. ඒවා අතරින් මාර්ග සිත් සතර (ආරම්මණවිජානන ලක්ෂණයෙන් සමාන බැවින්) ඒකත්වයෙන් ගනු ලැබේ. එයට චෛතසික 28 එකතු කළ විට මාර්ග චිත්තුප්පාදයෝ 29ක් වෙති. (චිත්තෝපාදයක් යනු යම් සිතක් උපදින අවස්ථාවේ ඇති නාම ධර්මයන් සියල්ලේ ම එකතුව යි).

පටුන වෙත

දොළොස් අකුසල චිත්තය විඤ්ඤාණස්කන්ධය නම් වේ. මෙසේ ස්කන්ධ වශයෙන් සතර වැදෑරුම් වෙති.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, දොළොස් අකුසල චිත්තය මනායතනය නම් වේ. සත්විසි චෛතසිකය ධම්මායතනය නම් වේ. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වෙති.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, දොළොස් අකුසල චිත්තය මනෝවිඤ්ඤාණධාතුව නම් වේ. සත්විසි චෛතසිකය ධම්මධාතුව නම් වේ. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වෙති.

ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, දොළොස් අකුසල චිත්තය ද සත්විසි චෛතසිකයන් අතුරෙන් ලෝභය වර්ජිත සවිසි චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වේ. ලෝභ චෛතසිකය සමුදය සත්‍යය නම් වේ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වෙති.

අබ්‍යාකතා ධම්මා යන තෘතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සතිස් විපාක චිත්තය ද විසි ක්‍රියා චිත්තය ද තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද අටවිසි රූපය ද නිර්වාණය ද යන මෙතෙක් ධර්මයෝ ලැබෙති.

ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, අටවිසි රූපය රූපස්කන්ධය නම් වේ. අටතිස් චෛතසිකයන් අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වේ. සඤ්ඤා චෛතසිකය සඤ්ඤාස්කන්ධය නම් වේ. ඉතිරි සතිස් චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වේ. සතිස් විපාක චිත්තය ද විසි ක්‍රියා චිත්තය ද විඤ්ඤාණස්කන්ධය නම් වේ. <u>නිර්වාණ ධාතුව ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත වේ</u>. මෙසේ ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම් වන්නාහ.

ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, අටවිසි රූපය අතුරෙන් චක්ඛුප්‍රසාද රූපය චක්ඛායතනය නම් වේ.

සෝතප්‍රසාද රූපය සෝතායතනය නම් වේ. ඝානප්‍රසාද රූපය ඝානායතනය නම් වේ. ජිව්හාප්‍රසාද රූපය ජිව්හායතනය නම් වේ. කායප්‍රසාද රූපය කායායතනය නම් වේ. වර්ණ රූපය රූපායතනය නම් වේ. සද්ද රූපය සද්දායතනය නම් වේ. ගන්ධ රූපය ගන්ධායතනය නම් වේ. රස රූපය රසායතනය නම් වේ. පඨවි, තේජෝ, වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වේ. සතිස් විපාක චිත්තය ද විසි ක්‍රියා චිත්තය ද මනායතනය නම් වේ. අටතිස් චෛතසිකය ද අපෝධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හෘදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාශ රූපය, කාය විඤ්ඤත්ති රූපය, වචී විඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සූක්ෂ්ම රූප සොළොස ද නිර්වාණ ධාතුව ද යන මෙතෙක් මේ ධර්ම සමූහය ධම්මායතනය නම් වේ. මෙසේ ආයතන වශයෙන් දොළොස්වැදෑරුම් වන්නාහ.

ධාතු වශයෙන් අටළොස්වැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, අටවිසි රූපය අතුරෙන් චක්ඛු ප්‍රසාද රූපය චක්ඛුධාතුව නම් වේ. සෝත ප්‍රසාද රූපය සෝතධාතුව නම් වේ. ඝාන ප්‍රසාද රූපය ඝානධාතුව නම් වේ. ජිව්හා ප්‍රසාද රූපය ජිව්හාධාතුව නම් වේ. කාය ප්‍රසාද රූපය කායධාතුව නම් වේ. වර්ණ රූපය වර්ණධාතුව නම් වේ. සද්ද රූපය සද්දධාතුව නම් වේ. ගන්ධ රූපය ගන්ධධාතුව නම් වේ. රස රූපය රස ධාතුව නම් වේ. පඨවි, තේජෝ, වායෝ නම් වූ භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බධාතුව නම් වේ. චක්ඛුවිඤ්ඤාණ දෙසිත චක්ඛුවිඤ්ඤාණධාතුව නම් වේ. සෝතවිඤ්ඤාණ දෙසිත සෝතවිඤ්ඤාණධාතුව නම් වේ. ඝානවිඤ්ඤාණ දෙසිත ඝානවිඤ්ඤාණධාතුව නම් වේ. ජිව්හාවිඤ්ඤාණ දෙසිත ජිව්හාවිඤ්ඤාණධාතුව නම් වේ. කායවිඤ්ඤාණ දෙසිත කායවිඤ්ඤාණධාතුව නම් වේ. පඤ්චද්වාරාවජ්ජනය හා සම්පටිච්ඡන දෙසිත මනෝධාතුව නම් වේ. ඉතිරි සූවිසි විපාක චිත්තය ද එකුන්විසි ක්‍රියා චිත්තය ද මනෝවිඤ්ඤාණධාතුව නම් වේ. අටතිස් චෛතසිකය ද අපෝධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හෘදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාශ රූපය, කාය විඤ්ඤත්ති රූපය, වචී විඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සූක්ෂ්ම

රූප සොළොස ද නිර්වාණ ධාතුව ද යන මෙතෙක් මේ ධර්ම සමූහය ධම්මධාතු නම් වේ. මෙසේ ධාතු වශයෙන් අටළොස්වැදෑරුම් වන්නාහ.

ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, ලෞකික විපාක සිත් දෙතිස ද විසි ක්‍රියා චිත්තය ද තත් සම්ප්‍රයුක්ත පන්තිස් චෛතසිකය ද අටවිසි රූපය ද යන මෙතෙක් මේ ධර්ම සමූහය දුක්ඛ සත්‍යය නම් වේ. නිර්වාණ ධාතුව නිරෝධ සත්‍යය නම් වේ. ලෝකෝත්තර ඵල චිත්තෝත්පාදයෝ සත්තිස දෙන සත්‍ය විනිර්මුක්ත නම් වෙති. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.[4]

---

4. **නිර්වාණ ධාතුව ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත වීම** - අභිධර්මාර්ථ සංග්‍රහයේ "භෙදාභාවෙන නිබ්බානං - ඛන්ධසඞ්ගහනිස්සට්ඨං" යන ප්‍රකාශයට අනුව නිවනට අතීත අනාගතාදී වශයෙන් භේදයක් බෙදීමක් නොමැති බැවින් ස්කන්ධයන්ට ඇතුළත් නො වේ. එම නිසා "නිර්වාණ ධාතුව ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත වේ." යැයි ඉහත දැක්වේ.

තත් සම්ප්‍රයුක්ත පන්තිස් චෛතසිකය - විපාක සිත් 36, ක්‍රියා සිත් 20 යන අබ්‍යාකත සිත් සියල්ල සඳහා ස්වරූපාර්ථ උද්ධරණය කරන විට ඵල සිත් සතර එහි ඇතුළත් වන බැවින් විරති චෛතසික ත්‍රය ද ගණිමින් "තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය" යැයි දක්වන ලදී. ලෞකික විපාක සිත් 32, ක්‍රියා සිත් 20 යන දුක්ඛාර්ය සත්‍යය දැක්වෙන ස්ථානයේ මාර්ග-ඵල සිත් සතර ඇතුළත් නොවන බැවින් විරති චෛතසික ත්‍රය නො යෙදේ. එම නිසා "තත් සම්ප්‍රයුක්ත පන්තිස් චෛතසිකය" යැයි කිව යුතු වේ.

ලෝකෝත්තර ඵල චිත්තෝත්පාදයෝ සත්තිස - ඵල සිත් සතරෙහි චෛතසික 36ක් යෙදේ. ඵල සිත් සතර (ආරම්මණවිජානන ලක්ෂණයෙන් සමාන බැවින්) ඒකත්වයෙන් ගෙන එයට චෛතසික 36 එකතු කළ විට ඵල චිත්තුප්පාදයෝ 37කි.

කුසලා ධම්මා, අකුසලා ධම්මා, අබ්‍යාකතා ධම්මා යැයි දේශනා කරන ලද මෙම ශබ්ද අනුපිළිවෙළ පරමාර්ථ ධර්මයන් තුනක ආකාරයෙන් සමූහගත කරමින් දේශනා කර ඇති බැවින් ත්‍රික නම් වේ. එම ත්‍රික ආදිලබ්ධනාම ත්‍රික, සර්වලබ්ධනාම ත්‍රික වශයෙන් දෙවර්ගයක් වේ. එම දෙවර්ගය අතරින් ආරම්භයෙහි දක්වා ඇති කුසල ශබ්දයෙන් 'කුසල ත්‍රිකය' යැයි කීමට ලැබෙන නාමය ඇති බැවින් **ආදිලබ්ධනාම ත්‍රිකයකි.**

සප්‍රදේශ ත්‍රික, නිප්‍රදේශ ත්‍රික වශයෙන් දෙවර්ගයක් වේ. එම දෙවර්ගය අතරින් ඉතිරි වූ පරමාර්ථ ධර්ම නැති බැවින් නිප්‍රදේශ ත්‍රිකයකි.[5]

---

5. **ආදිලබ්ධනාම ත්‍රිකය** - මුල් පදය පදනම් කරගෙන ලැබෙන නාමය ඇති ත්‍රිකය **ආදිලබ්ධනාම ත්‍රිකය** නම් වේ. (ආදි - ආරම්භයේ; ලද්ධ - ලබන ලද; නාම - නාමය).

සර්වලබ්ධනාම ත්‍රිකය - පද තුන ම පදනම් කරගෙන ලැබෙන නාමය ඇති ත්‍රිකය සර්වලබ්ධනාම ත්‍රිකය නම් වේ. (සබ්බ - සියලු; ලද්ධ - ලබන ලද; නාම - නාමය).

සප්‍රදේශ ත්‍රික - ත්‍රිකපදයන්හි ඇතුළත් නොවූ, පරමාර්ථ ධර්මයන් ඇති ත්‍රිකයන් "සප්‍රදේශ" නම් වේ. (ස - සහිත; පදෙස - ඉතිරිව). මෙසේ ත්‍රික පදයන්හි ඇතුළත් නො වී අවශේෂ වන පරමාර්ථ ධර්මයන් සඳහා
"**ත්‍රිකමුක්ත**" යැයි කියනු ලැබේ. ස්වරූපාර්ථ වගුවෙහි එය "මුක්ත" ලෙස දක්වා ඇත.

නිප්‍රදේශ ත්‍රික - ත්‍රික පදයන්හි පරමාර්ථ ධර්මයන් සියල්ල ඇතුළත් වී අවශේෂ වන පරමාර්ථ ධර්මයන් නොමැති ත්‍රිකයෝ "නිප්‍රදේශ" නම් වෙති.

02. වේදනා ත්‍රිකය

ප්‍රථම පදය - සුඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා, දෙවන පදය - දුක්ඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා, තෙවන පදය - අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා

ස්වරූපාර්ථ වගුව

පදය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
		ස්	ආ	ධා	ස
ප	සුඛසහගත සිත් - 63, චෛ 46 (දේස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, විචිකිච්ඡා හැර)	3	2	3	3
දු	දුක්ඛසහගත සිත් - 3, චෛ 21 (වේදනා, ලෝභ, දිට්ඨි, මාන, ප්‍රීති, විචිකිච්ඡා හැර)	3	2	3	1
ත	උපෙක්ඛා සහගත සිත් - 55, චෛ 46 (වේදනා, ප්‍රීති, දේස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච හැර)	3	2	7	3
මුක්ත	සුඛ වේ-63, දුක්ඛ වේ-3, උපෙක්ඛා වේ-55, රූප, නිර්වාණය				

වාචනය - කුසල ත්‍රිකය දේශනා කිරීමෙන් අනතුරුව වෙදනා ත්‍රිකය වදාළ සේක. එම වෙදනා ත්‍රිකය ද ප්‍රථම පදය, දෙවන පදය, තෙවන පදය වශයෙන් තෙවැදෑරුම් වේ. ඒ ධර්ම තුන අතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. දේශනාව වනාහි - සුඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා යනුවෙනි. ඉන් අනතුරුව දෙවන පදය වදාළ සේක. දේශනාව වනාහි - දුක්ඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා යනුවෙනි. ඉන් අනතුරුව තෙවන පදය වදාළ සේක. දේශනාව වනාහි - අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා යනුවෙනි.

පටුන වෙත

සුඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා - සුඛාය වේදනාය - ඉෂ්ටාරම්මණ රසානුභවනය ලක්ෂණ කොට ඇත්තා වූ සැප වේදනාව සමඟ, සම්පයුත්තා - ඒකෝත්පාදාදී භාවයෙන් මිශ්‍ර වූ, ධම්මා - නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්ම කෙනෙක්, (සන්ති සංවිජ්ජන්ති) විද්‍යාමානව ඇත්තාහ.

දුක්ඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා - දුක්ඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා - අනිෂ්ටාරම්මණ රසානුභවනය ලක්ෂණ කොට ඇත්තා වූ දුක් වේදනාව සමඟ, සම්පයුත්තා - ඒකෝත්පාදාදී භාවයෙන් මිශ්‍ර වූ, ධම්මා - නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්ම කෙනෙක්, (සන්ති සංවිජ්ජන්ති) විද්‍යාමානව ඇත්තාහ.

අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා - අදුක්ඛමසුඛාය - මධ්‍යස්ථාරම්මණ රසානුභවනය ලක්ෂණ කොට ඇත්තා වූ සැපත් නො වූ දුකත් නො වූ උපේක්ෂා වේදනාව සමඟ, සම්පයුත්තා - ඒකෝත්පාදාදී භාවයෙන් මිශ්‍ර වූ, ධම්මා - නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්ම කෙනෙක්, (සන්ති සංවිජ්ජන්ති) විද්‍යාමානව ඇත්තාහ.[6]

---

6. <u>සුඛාය</u> - (සුඛයතී'ති = සුඛා) සම්ප්‍රයුක්ත ධර්මයන් සහ කරජ කාය සැපයට පත් කරන බැවින් වේදනාවන් තෙසැට 'සුඛ' නම් වේ. 'වෙදනා' පදයෙහි විශේෂණයක් වීම නිසා "සුඛාය" යැයි ස්ත්‍රීලිංග වශයෙන් දේශනා කරන ලදී. මෙහි සම්ප්‍රයුක්ත ධර්මයෝ නම් සුඛ වේදනාව සමඟ යෙදෙන චිත්ත චෛතසිකයෝය. කරජ කාය නම් ශරීරය යි.

වෙදනාය - (ආරම්මණරසං වෙදයති අනුභවතී'ති = වෙදනා) ආරම්මණයාගේ රසය විඳින බැවින් වෙදනා නම් වේ.

සම්පයුත්තා - (සමං පකාරෙති යුත්තා'ති = සම්පයුත්තා) තමා සමඟ යෙදෙන චිත්ත චෛතසිකයන් සමඟ එකට ඉපදීම, එකට නිරුද්ධ වීම, එක අරමුණක් ගැනීම, සමාන නිශ්‍රය ඇති බව යන ලක්ෂණයන්ගේ වශයෙන් සමව යෙදෙන ධර්මයන් මින් අදහස් වේ. එමනිසා "ඒකෝත්පාදාදී භාවයෙන් මිශ්‍ර වූ" යැයි අර්ථ දැක්වා ඇත.

පටුන වෙත

සුඛාය වේදනාය සම්පයුත්තා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සුඛ සහගත තෙසැට චිත්තය ද තත් සම්ප්‍රයුක්ත වූ වේදනා, දෝස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, විචිකිච්ඡා වර්ජිත සසාළිස් චෛතසිකයෝ ද ලැබෙති.

ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් තුනකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් තුනකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද? යත් සසාළිස් චෛතසිකය අතුරෙන් සඤ්ඤා චෛතසිකය සඤ්ඤාස්කන්ධය නම් වේ. ඉතිරි පන්සාළිස් චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වේ. සුඛ සහගත තෙසැට චිත්තය විඤ්ඤාණස්කන්ධය නම් වේ. මෙසේ ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, සුඛ සහගත තෙසැට චිත්තය මනායතනය නම් වේ. තත් සම්ප්‍රයුක්ත වූ සසාළිස් චෛතසිකය ධම්මායතනය නම් වේ. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

ධාතු වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, සුඛ සහගත කාය විඤ්ඤාණ චිත්තය කායවිඤ්ඤාණධාතුව නම් වේ. ඉතිරි සුඛ සහගත දෙසැට චිත්තය මනෝවිඤ්ඤාණධාතුව නම් වේ. සසාළිස් චෛතසිකය ධම්මධාතුව නම් වේ. මෙසේ ධාතු වශයෙන්

<u>දුක්ඛාය</u> - (දුක්ඛීයතී'ති දුක්ඛා) සම්ප්‍රයුක්ත ධර්මයන් සහ කරජ කාය දුක්ඛයට පත් කරන බැවින් (ද්වේෂ මූල සිත් දෙකෙහි සහ දුක්ඛ සහගත කායවිඤ්ඤාණයේ ඇති වේදනා ත්‍රය) 'දුක්ඛ' නම් වේ.

<u>අදුක්ඛමසුඛාය</u> - (න දුක්ඛා = අදුක්ඛා; න සුඛා = අසුඛා; අදුක්ඛා ච සා අසුඛා චාති= අදුක්ඛමසුඛා; 'ම'කාරාගමයයි.) දුක්ඛ ද නොවන, සුඛ ද නොවන (දුක්ඛයෙන් ද අන්‍ය වන, සුඛයෙන් ද අන්‍ය වන) වේදනා 55 අදුක්ඛමසුඛ නම් වේ.

තෙවැදෑරුම් වන්නාහ.

ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, ලෞකික සුඛ සහගත සිත් එක්තිස ද තත් සම්ප්‍රයුක්ත වූ ලෝභය වර්ජිත පන්සාළිස් චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වේ. ලෝභ චෛතසිකය සමුදය සත්‍ය නම් වේ. සුඛ සහගත මාර්ග චිත්තයන් සමඟ යෙදුණා වූ සම්මා දිට්ඨි ආදී සෝවාන් මාර්ගාංග අටදෙන එක් වරක් ද සම්මා සංකප්ප වර්ජිත සත්දෙන තුන් වරක් ද සකදාගාමී මාර්ගාංග අටදෙන එක් වරක් ද සත්දෙන තුන් වරක් ද අනාගාමී මාර්ගාංග අටදෙන එක් වරක් ද සත්දෙන තුන් වරක් ද අර්හත් මාර්ගාංග අටදෙන එක් වරක් ද සත්දෙන තුන් වරක් ද යන මෙතෙක් මේ මාර්ගාංගයෝ මාර්ග සත්‍ය නම් වෙති.

ඉතිරි සුඛ සහගත නොවන මාර්ග චිත්තෝත්පාදයෝ අටවිසිදෙන හා ඵල චිත්තෝත්පාදයෝ සතිස්දෙන සත්‍ය විනිර්මුක්ත නම් වෙති. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.[7]

---

7. **වේදනා, දෝස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, විචිකිච්ඡා වර්ජිත** - වේදනාව සමඟ සම්ප්‍රයුක්ත වන වෙනත් වේදනාවක් නොමැති බැවින් වේදනාව ඉවත් කරනු ලැබේ. සුඛ සහගත සිත් සමඟ සම්ප්‍රයුක්ත නොවන බැවින් දෝෂාදි චෛතසිකයන් ද ඉවත් කරනු ලැබේ. සෙසු පදයන්හි ද මෙම ක්‍රමයෙන් සැලකිය යුතු යි.

ලෞකික සුඛසහගත සිත් එක්තිස - සුඛ සහගත කාය විඤ්ඤාණය, කාමාවචර සොමනස්ස සිත් 18, මහග්ගත සොමනස්ස සිත් 12 වශයෙන් ලෞකික සුඛ සහගත සිත් 31කි.

සුඛ සහගත මාර්ග චිත්තයන් - එක් එක් මාර්ග සිතක ප්‍රථමධ්‍යාන, ද්විතීයධ්‍යාන, තෘතීයධ්‍යාන, චතුර්ථධ්‍යාන වශයෙන් සෝමනස්ස සතර බැගින් ඇති බැවින් මාර්ග සිත් සතරෙහි සෝමනස්ස සහගත සිත් සොළසකි. (4×4=16).

සුඛ සහගත නොවන මාර්ග චිත්තෝත්පාදයෝ අටවිසිදෙන - සුඛ සහගත මාර්ග සිත් 16හි ඇති වේදනාව හැර චෛතසික 35 කි. මාර්ග සත්‍යය සඳහා ලැබෙන මාර්ගාංග අට අඩු කළ විට චෛතසික 27ක්

දුක්ඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දුක්ඛසහගත සිත් තිදෙන ද තත් සම්ප්‍රයුක්ත වූ වේදනා, ප්‍රීති, ලෝභ, මාන, දිට්ඨි, විචිකිච්ඡා වර්ජිත එක්විසි චෛතසිකයෝ ද ලැබෙති.

ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් තුනකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් තුනකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි.

ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, දුක්ඛසහගත එක්විසි චෛතසිකය අතුරෙන් සඤ්ඤා චෛතසිකය සඤ්ඤාස්කන්ධය නම් වේ. ඉතිරි සමවිසි චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වේ. දුක්ඛසහගත සිත් තිදෙන විඤ්ඤාණස්කන්ධය නම් වේ. මෙසේ ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වෙති.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, දුක්ඛසහගත සිත් තිදෙන මනායතනය නම් වේ. එක්විසි චෛතසිකය ධම්මායතනය නම් වේ. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

ධාතු වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, දුක්ඛසහගත කායවිඤ්ඤාණය කායවිඤ්ඤාණධාතුව නම් වේ. දෝමනස්සසහගත දෙසිත මනෝවිඤ්ඤාණධාතුව නම් වේ. එක්විසි

ඉතිරි වේ. සුඛ සහගත මාර්ග සිත් 16 ඒකත්වයෙන් ගෙන චෛතසික 27ට එකතු කළ විට මාර්ග චිත්තෝත්පාදයෝ 28ක් වේ.

ඵල චිත්තෝත්පාදයෝ සතිස්දෙන - සුඛ සහගත ඵල සිත් 16හි ද චෛතසික 35ක් යෙදේ. එම ඵල සිත්වල ඇති මාර්ගාංග අට මාර්ග සත්‍යයට ඇතුළත් නොවන බැවින් මාර්ග චිත්තෝත්පාදයන් ගණනයේ දී මෙන් අඩු කිරීමට අවශ්‍ය නො වේ. පෙර මෙන් සුඛ සහගත ඵල සිත් 16 ද ඒකත්වයෙන් ගෙන චෛතසික 35ට එකතු කළ විට මාර්ග චිත්තෝත්පාදයෝ 36ක් වේ.

චෛතසිකය ධම්මධාතුව නම් වේ. මෙසේ ධාතු වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

ආර්ය සත්‍ය වශයෙන් එක්වැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, දුක්ඛසහගත සිත් තිදෙන ද තත් සම්ප්‍රයුක්ත චෛතසික එක්විස්ස ද දුක්ඛසත්‍ය නම් වේ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් එක්වැදෑරුම් වන්නාහ.

අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා - යන තෘතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් උපේක්ෂා සහගත සිත් පස්පනස ද තත් සම්ප්‍රයුක්ත වේදනා, ප්‍රීති, දෝස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච වර්ජිත සසාළිස් චෛතසිකයෝ ද ලැබෙති.

ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් තුනකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් සතකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, සසාළිස් චෛතසිකයන් අතුරෙන් සඤ්ඤා චෛතසිකය සඤ්ඤාස්කන්ධය නම් වේ. ඉතිරි පන්සාළිස් චෛතසික සංස්කාරස්කන්ධය නම් වේ. උපේක්ෂා සහගත සිත් පස්පනස විඤ්ඤාණස්කන්ධය නම් වේ. මෙසේ ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, උපෙක්ඛා සහගත සිත් පස්පනස මනායතනය නම් වේ. තත් සම්ප්‍රයුක්ත වූ සසාළිස් චෛතසික ධම්මායතනය නම් වේ. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

ධාතු වශයෙන් සත්වැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, චක්ඛුවිඤ්ඤාණ දෙසිත චක්ඛුවිඤ්ඤාණධාතුව නම් වේ. සෝතවිඤ්ඤාණ දෙසිත සෝතවිඤ්ඤාණධාතුව නම් වේ. ඝානවිඤ්ඤාණ දෙසිත ඝානවිඤ්ඤාණධාතුව නම් වේ. ජිව්හාවිඤ්ඤාණ දෙසිත ජිව්හාවිඤ්ඤාණධාතුව නම් වේ. පඤ්චද්වාරාවජ්ජන සිත හා සම්පටිච්ඡන දෙසිත මනෝධාතුව නම් වේ. ඉතිරි උපේක්ෂා සහගත සූසාළිස් සිත මනෝවිඤ්ඤාණධාතුව නම් වේ. සසාළිස් චෛතසික ධම්මධාතුව නම් වේ. මෙසේ ධාතු වශයෙන් සත්වැදෑරුම් වන්නාහ.

පටුන වෙත

ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, ලෞකික උපෙක්ඛා සහගත සිත් සත්සාළිස ද තත් සම්ප්‍රයුක්ත ලෝභය වර්ජිත පන්සාළිස් චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වේ. ලෝභය සමුදය සත්‍යය නම් වේ. උපෙක්ඛා සහගත සතර මාර්ගයන් සමඟ යෙදුණා වූ සම්මා සංකප්ප වර්ජිත සම්මා දිට්ඨි, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි නම් වූ සෝවාන් මාර්ගාංග සත්දෙන ද සකදාගාමී මාර්ගාංග සත්දෙන ද අනාගාමී මාර්ගාංග සත්දෙන ද අර්හත් මාර්ගාංග සත්දෙන ද මාර්ග සත්‍යය නම් වේ. ඉතිරි මාර්ග චිත්තෝත්පාද සවිස්ස ද ඵල චිත්තෝත්පාද තිස්තුන්දෙන ද සත්‍ය විනිර්මුක්ත වෙති. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.[8]

---

8. **ලෞකික උපෙක්ඛා සහගත සිත්** - කාමාවචර උපෙක්ඛා සහගත සිත් 32, මහග්ගත උපෙක්ඛා සහගත 15 වශයෙන් ලෞකික උපෙක්ඛා සහගත සිත් 47කි.

උපෙක්ඛා සහගත සතර මාර්ගයන් - සෝවාන් පඤ්චමධ්‍යාන මාර්ගය, සකෘදාගාමී පඤ්චමධ්‍යාන මාර්ගය, අනාගාමී පඤ්චමධ්‍යාන මාර්ගය, අර්හත් පඤ්චමධ්‍යාන මාර්ගය යනුවෙන් උපෙක්ඛා සහගත මාර්ග සිත් සතරකි.

මාර්ගාංග සත්දෙන - මෙම ත්‍රික පදයේ ස්වරූපාර්ථ වන උපෙක්ඛා සහගත මාර්ග සිත් සතරෙහි වේදනා, විතර්ක සහ ප්‍රීති හැර චෛතසික 32ක් යෙදේ. විතර්කය සම්මා සඞ්කප්ප මාර්ගාංගය වේ. මෙසේ සම්මා සඞ්කප්ප මාර්ගාංගය සඳහා ලැබෙන විතර්කය ඇතුළත් නොවන බැවින් "සෝවාන් මාර්ගාංග සත්දෙන -පෙ- අර්හත් මාර්ගාංග සත්දෙන ද මාර්ග සත්‍ය නම් වේ" යැයි දක්වීය.

මාර්ග චිත්තෝත්පාද සවිස්ස - මෙම තුන්වන පදයෙහි ඇති උපේක්ෂා සහගත සිත් සතරෙහි වේදනා, විතර්ක, ප්‍රීති හැර චෛතසික 32ක් යෙදේ. මෙයින් සම්මා සඞ්කප්ප මාර්ගාංගය හැර සෙසු මාර්ගාංග සත අඩු කළ විට චෛතසික 25ක් ලැබේ. උපේක්ෂා සහගත මාර්ග සිත් සතර ඒකත්වයෙන් ගෙන චෛතසික 25 එකතු කළ විට මාර්ග චිත්තෝත්පාදයෝ 26ක් වෙති.

මේ ශබ්දාවලිය හෙවත් වේදනා ත්‍රිකය වනාහි පරමාර්ථ ධර්මයන් පද තුනකින් වදාළ බැවින් ත්‍රික නම් වේ. පද තුනෙන් ලබන ලද නම් ඇති හෙයින් සර්වලබ්ධනාමත්‍රික නම් වේ. සුඛ වේදනා තෙසැට දෙන ද දුක්ඛ වේදනා තිදෙනා ද උපේක්ෂා වේදනා පස්පනස ද අටවිසි රූපය ද නිර්වාණය ද යන මෙතෙක් ධර්මයන් මේ ත්‍රිකයට ඇතුළත් නොවන බැවින් සප්‍රදේශ ත්‍රික නම් වේ.[9]

ඵල චිත්තෝත්පාද තිස්තුන්දෙන - උපේක්ෂා සහගත ඵල සිත් සතරෙහි ද වේදනා, විතර්ක සහ ප්‍රීති හැර චෛතසික 32ක් යෙදේ. ඒවා අතරින් ඵල සිත් සතර ඒකත්වයෙන් ගෙන චෛතසික 32 එකතු කළ විට මාර්ග චිත්තෝත්පාදයෝ 33ක් වේ.

9. **සර්වලබ්ධනාම ත්‍රික** - (අක්ඛරසමූහපද, පදසමූහපද දෙක අතරින් මීට අදාළව පදසමූහපදය ම ගත යුතු යි. අක්ඛරසමූහපද නො ගත යුතු යි. - අක්ඛරපදසමූහ පද නම් අක්ෂරයන් එක්ව සෑදෙන පදයෝ ය. උදා -'කු','ස','ලා' යන අක්ෂර එක්වී 'කුසලා' යන පදය සැකසීම යි. පදසමූහපද නම් පද කිහිපයක් එක්ව සෑදෙන පදයෝ ය. උදා - 'සුඛාය', 'වෙදනාය', 'සම්පයුත්තා', 'ධම්මා' යන පද එක්වී 'සුඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා' යන පදය සැකසීම යි.)

සුඛ වේදනා තෙසැට දෙන - සිත් ගණන සංක්ෂේපයෙන් දක්වන විට වේදනා 89ක් ද විස්තාර වශයෙන් දක්වන විට 121ක් ද ලැබේ. මෙහි දී විස්තාර ක්‍රමයෙන් සලකා සුඛවෙදනා 63ක් ලෙස පෙන්වා ඇත.

පටුන වෙත

03. විපාක ත්‍රිකය

ප්‍රථම පදය - විපාකා ධම්මා, දෙවන පදය - විපාකධම්මධම්මා, තෙවන පදය - නෙව විපාක න විපාකධම්මධම්මා

ස්වරූපාර්ථ වගුව

පදය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
		ස්	ආ	ධා	ස
ප	වි-36, චෙ-38	4	2	8	1
දු	කු-21, අකු-12, චෙ -52	4	2	2	3
ත	ක්‍රි-20, චෙ-35, රූප, නි	5	12	13	2

විපාකා - ඔවුනොවුන් හට ප්‍රතිපක්ෂ වූ කුශලාකුශලයන්ගේ ප්‍රතිඵලය වන්නා වූ; ධම්මා - නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ධර්මයෝ ඇත්තාහ.

විපාකධම්මධම්මා - විපාකධම්ම - සැප දුක් විපාක උපදවන ස්වභාව ඇත්තා වූ, ධම්මා - නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නෙව විපාක න විපාකධම්මධම්මා - නේවවිපාක - ඔවුනොවුන් හට ප්‍රතිපක්ෂ වූ කුශලාකුශලයන්ගේ විපාක ද නො වූ, න විපාකධම්ම - සැප දුක් උපදවන ස්වභාව ද නැත්තා වූ, ධම්මා - නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[10]

---

10. <u>විපාකා</u> -'වි' ශබ්දය "විසිට්ඨ" අර්ථය ප්‍රකාශ කරයි. "විසිට්ඨ" යනු සම නොවන, විශේෂ, වෙනස් බව යි. ඒ විශේෂ භාවය කෙසේ ද? යත් කුසලය නිරවද්‍ය, ඉෂ්ට විපාක ඇති කිරීමේ (සුක්ක - යහපත්) ලක්ෂණය ඇති අතර අකුසලයට සාවද්‍ය, අනිෂ්ට විපාක ඇති කිරීමේ (කණ්හ - අයහපත්) ලක්ෂණය ඇත. මෙසේ 'විසිට්ඨ' වන

කුශලාකුශලයන්ගේ ඵලය විපාක නම් වේ. (අඤ්ඤමඤ්ඤවිසිට්ඨානං කුසලාකුසලානං පාකාති = විපාකා)

කුශලාකුශලයන් හේතුවෙන් ජනිත වන විපාක නාමස්කන්ධ නම් වූ නාම විපාක සහ කර්මජ රූප නම් රූප විපාක යන දෙක ම වෙනත් තැන්වල දී විපාක සඳහා දක්වන්නේ නමුදු මෙහි දී **රූළ්හීනය** සහ **ඒකදේසූපචාර** වශයෙන් විපාක නාමස්කන්ධයන් පමණක් ම වදාළහ. කර්මජ රූප නම් වූ රූප විපාක නො වදාළහ. එම නිසා "විපක්කභාවමාපන්නානං අරූපධම්මානමෙතං අධිවචනං" (මෙම 'විපාක' යන නම මේරීමට පැමිණි අරූපධර්මයන්ට නමකි) යැයි අටුවාචාරීන් වහන්සේ දැක්වූහ. *("මහියං රවතීති මයූරො - පොළොවෙහි කෑගසයි'නුයි මයූර නම් වේ" යන නිරුක්තියෙහි මයූර ශබ්දය පෙළොවෙහි සිට කෑගසන් සත්ත්වයන් සියල්ල ම සමඟ සම්බන්ධ වූයේ නමුදු රූළ්හි නයෙන් මොණරා කෙරෙහි පමණක් ප්‍රකට වේ. ඒකදේසූපචාර නය නම් ඒකදේශයාගේ අභේද ව්‍යවහාරය යි. "රුක්ඛං ඡින්දති - ගස කපයි, පටො දඩ්ඩො - වස්ත්‍රය දැවෙන ලදී" යන ආදියෙහි ශාඛාපත්‍ර, පුෂ්පඵල ආදිය ද, දශාදි වූ ද සමුදයෙහි පැවති රුක්ඛපට ශබ්දයෝ ඒ ශාඛාදි වූ හෝ දශාදි වූ හෝ එක් අවයවක්හිදු පවතිත්. එබැවින් වෘක්ෂයාගේ ශාඛාවක් සිඳින කලත් - "රුක්ඛං ඡින්දති" යැයි ද, වස්ත්‍රයාගේ දහවලු ආදී එක් තැනක් දැවුණු කලත් - "පටො දඩ්ඩො" යැයි කියත්. - ව්‍යාකරණසද්දසින්ධු සහ භාසාටීකා ඇසුරෙනි.)*

<u>විපාකධම්මධම්මා</u> - මෙම පදයෙහි 'ධම්ම' ශබ්දයන් දෙක අතරින් පළමු ධම්ම ශබ්දය 'සභාව' අර්ථය ප්‍රකාශ කරයි. දෙවන ධම්ම ශබ්දය 'කුසලා ධම්මා' ආදියෙහි පැමිණෙන ආකාරයට 'නිස්සත්ව නිජ්ජීව' අර්ථය ප්‍රකාශ කරයි. එම නිසා "විපාකසභාවධම්මා" යැයි අටුවාචාරීන් වහන්සේ දැක්වූහ. එබැවින් අටුවාචාරීන් වහන්සේගේ අදහසට අනුව "සැප දුක් විපාක උපදවන ස්වභාව ඇත්තා වූ, නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ" යැයි අර්ථ දැක්වීම සුදුසු වේ.

'සැප දුක් විපාක උපදවන ස්වභාව ඇත්තා වූ' යනු සැප දුක් විපාක නම් වූ ඵලය උපදවන හේතුව වනු කුශලාකුශල ධර්මයෝ ය. එම

විපාකා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සතිස් විපාක චිත්තයෝ ද තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකයෝ ද ලැබෙති. -පෙ-

ආර්ය සත්‍ය වශයෙන් එක්වැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, ලෞකික විපාක සිත් දෙතිස ද තත් සම්ප්‍රයුක්ත පන්තිස් චෛතසික ද දුක්ඛ සත්‍යය නම් වේ. ලෝකෝත්තර ඵල චිත්තෝත්පාදයෝ සත්තිස්දෙන සත්‍ය විනිර්මුක්ත නම් වෙති. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් එක්වැදෑරුම් වන්නාහ. (ආදිලබ්ධනාම ත්‍රිකයකි, නිප්‍රදේශ ත්‍රිකයකි) සෙසු කොටස් සුගම යි.[11]

විපාකධම්මධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දොළොස් අකුසල චිත්තයෝ ද එක් විසි කුසල චිත්තය ද තත් සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකයෝ ද ලැබෙති. -පෙ-

නෙවවිපාක න විපාකධම්මධම්මා - යන තෘතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි විසි ක්‍රියා චිත්තය ද තත් සම්ප්‍රයුක්ත පන්තිස් චෛතසිකය ද අටවිසි රූපය ද නිර්වාණය ද යන මේ ධර්මයෝ ලැබෙති. -පෙ-

---

නිසා 'විපාකධම්මධම්මා' පදයේ ස්වරූපාර්ථ වශයෙන් කුසල සිත් 21, අකුසල් සිත් 12 සහ තත් සම්ප්‍රයුක්ත චෛතසික 52 ලැබේ.

11. **ලෞකික විපාක සිත් දෙතිස ද තත් සම්ප්‍රයුක්ත පන්තිස් චෛතසිකය** - විපාක සිත් 36 සඳහා ලෞකික සහ ලෝකෝත්තර යන විපාක දෙවර්ගයෙහි විරති චෛතසික යෙදේ. ඒ සිත්වල චෛතසික 38කි. නමුත් ආර්ය සත්‍ය වශයෙන් දැක්වීමේ දී **විපාකා ධම්මා** සඳහා දුක්ඛාර්ය සත්‍යය පමණක් යෙදේ. ලෝකෝත්තර විපාක සත්‍ය විනිර්මුක්ත වේ. ලෞකික විපාක සිත් දෙතිසෙහි විරති නොයෙදෙන බැවින් එහි යෙදෙනුයේ චෛතසික 35ක් පමණි.

04. උපාදින්න ත්‍රිකය

ප්‍රථම පදය - උපාදින්නුපාදානියා ධම්මා, දෙවන පදය - අනුපාදින්නුපාදානියා ධම්මා, තෙවන පදය - අනුපාදින්නඅනුපාදානියාධම්මා

ස්වරූපාර්ථ වගුව

පදය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
		ස්	ආ	ධා	ස
ප	ලෞවි-32, චෛ-35, කර්මජ රූප-20	5	11	17	1
දු	අකු-12, ලෞකු-17, ක්‍රි-20, චෛ-52, ත්‍රිජ රූප (චිත්තජ-17,උතුජ-15,ආහාරජ -14)	5	7	8	2
ත	ලෝකුත්තර-8, චෛ-36, නි	4	2	2	2

උපාදින්නුපාදානියා - **උපාදින්න** - පූර්ව භවයේ දී තෘෂ්ණා දෘෂ්ටීන්ගෙන් ගත් අරමුණක් අනුව රැස් කළ කර්මය විසින් ස්වකීය ඵල භාවයෙන් ළඟා කොට ගන්නා ලද්දා වූ ද, **උපාදානියා** - තෘෂ්ණා, දෘෂ්ටි උපාදානයන්ට හිත වූ ද, **ධම්මා** - නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අනුපාදින්නුපාදානියා - **අනුපාදින්න** - පූර්ව භවයක දී තෘෂ්ණා දෘෂ්ටීන්ගෙන් ගත් අරමුණක් අනුව රැස් කළ කර්මයක ඵල භාවයෙන් ළඟා කොට නොගන්නා ලද, **උපාදානියා** - තෘෂ්ණා, දෘෂ්ටි උපාදානයන්ට හිත වූ, **ධම්මා** - නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අනුපාදින්නඅනුපාදානියා - **අනුපාදින්න** - පූර්ව භවයක දී තෘෂ්ණා, දෘෂ්ටීන්ගෙන් ගත් අරමුණක් අනුව රැස් කළ කර්මයක ඵල භාවයෙන් ළඟා කොට නොගන්නා ලද්දා වූ ද, **අනුපාදානියා** - තෘෂ්ණා, දෘෂ්ටි උපාදානයන්ට හිත නො වූ ද, **ධම්මා** - නිස්සත්ව

නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[12]

---

12. **උපාදින්නුපාදානියා** - 'උප + ආදින්න + උපාදාන + ඉය' යැයි පද බෙදාගත යුතු යි. මෙම පදය තේරුම් ගැනීමේ පහසුවා සඳහා (ක) 'උපාදාන' නම් වූ ධර්මතා (ඛ) 'උපාදානිය' නම් වූ ධර්මතා (ග) 'උපාදින්න' නම් වූ ධර්මතා (ඝ) 'උපාදින්නුපාදානිය' නම් වූ ධර්මතා ආදී වශයෙන් බෙදා ගත යුතු වේ.

(ක) උපාදාන - (භුසං ආදියතී'ති = උපාදානා) අරමුණු දැඩි ලෙස ගැනීමට සමත් ලෝභ, දිට්ඨි ආදිය 'උපාදාන' නම් වේ.

(ඛ) උපාදානිය - (උපාදානානං හිතා = උපාදානියා) උපාදානයන්ට හිතෙෂී ධර්මතාවන් 'උපාදානිය' නම් වේ. 'උපාදානයන්ට හිතෙෂී' යනුවෙන් අදහස් කරනුයේ උපාදානයන්ට අරමුණු වීම යි. (උපාදානයන්ගේ අරමුණුවලට ලක්වීම යි) එමනිසා තණ්හා, දිට්ඨි යැයි කියන ලද උපාදාන ධර්මයන්ට අරමුණු වන ලෞකික සිත් 81, චෛතසික 52, රූප 28 යන ධර්මතා "උපාදානිය" නම් වේ.

(ග) උපාදින්න - **"ආරම්මණකරණවසෙන තණ්හාදිට්ඨීහි උපෙතෙන කම්මුනා ආදින්නා, ඵලභාවෙන ගහිතා'ති = උපාදින්නා"** යැයි අර්ථකථාව විස්තර කරයි. **ආරම්මණකරණවසෙන** - අරමුණු කිරීම් වශයෙන්; **තණ්හාදිට්ඨීහි** - තෘෂ්ණා දෘෂ්ටිගෙන්; **උපෙතෙන** - පමුණුවන ලද්දා වූ; **කම්මුනා** - කර්මය විසින්; **ආදින්නා** - ගන්නා ලද්දා වූ ධර්මයෝ ය. **ඵලභාවෙන** - ඵල භාවයෙන්; **ගහිතා ඉති** - ගන්නා ලද්දා වූ ධර්මයෝ යැයි; **උපාදින්නා** - උපාදින්නා නම් වෙති.

උපාදින්න පදය **"උප + ආදින්න"** ලෙස පද බෙදා ගත යුතු යි. මෙහි 'උප' ශබ්දය 'උපෙත' (එළඹෙන) අර්ථයෙහි ය. "උප+ 'ඉ' ධාතුව, ත ප්‍රත්‍යය යි". **උපයීයතෙ** - පමුණුවනු ලැබේ; **ඉති උපෙතං.** ඒ 'උපෙත' පදය සඳහා අභිධ්‍යෙයාර්ථය "කම්මුනා" වේ. 'උපෙත' යන්නෙහි 'ත' ප්‍රත්‍යයාගේ කර්තෘ 'තණ්හාදිට්ඨීහි' යැයි අතිරේකව විවරණය කරන ලදී. තෘෂ්ණා දෘෂ්ටීහු කෙසේ පමුණුවන්නාහු ද යන පැනයට පිළිතුරු වශයෙන් 'ආරම්මණකරණවසෙන' යැයි ඇතුළත් කරන ලදී. 'අරමුණු කිරීම් වශයෙන් පමුණුවන ලද්දා වූ' යැයි මෙයින් අදහස් වේ.

ආදින්න - "**ආදියන්තෙ'ති = ආදින්නා**" **ආදියන්තෙති** - ගනු ලැබෙත් නු යි; **ආදින්නා** - ආදින්නා නම් වේ. 'ආදින්නා' පදය 'ඵලභාවෙන ගහිතා - ඵල භාවයෙන් ගන්නා ලද ධර්මයෝ' යැයි විවරණය කෙරේ. තෘෂ්ණා දෘෂ්ටීන් විසින් අරමුණු කිරීම් වශයෙන් පමුණුවන ලද්දා වූ කර්මය වනාහි "මේ ධර්මයෝ මගේ ඵලයෝ වෙත්" යැයි ගනු ලබන බවී අදහස් කෙරේ. තෘෂ්ණා දෘෂ්ටීන් විසින් ලෞකික ධර්මයන් අරමුණු කිරීම හේතුවෙන් ඒ අරමුණු කිරීමට ලක්වන කර්මයෝ ද ලෞකික කර්මයෝ වෙති. ඒ හේතුවෙන් 'උපාදින්න' සඳහා ලෞකික කුශල අකුශලයන්ගේ ඵලයන් වන ලෞකික විපාක 32, චෛතසික 35, කර්මජ රූප 20 ලැබේ.

ඉහත **උපාදානියා** සඳහා සියලු ලෞකික කුශලාකුශල පමණක් නොව සියලු ත්‍රෛභූමක ධර්මයෝ අරමුණු කරනුයේ නමුදු ලෞකික කුශලාකුශලයෝ ලෞකික විපාකයන් සහ කර්මජ රූපයන් "මේවා අපගේ ඵලයෝ ය, අපගේ ඵලයෝ ය" යැයි ගනුලබයි. කවර හේතුවක් නිසා ද? යත්, ලෞකික කුශලාකුශලයන්ගේ හේතුවෙන් ඒ ලෞකික ඵලයන් උපදින බැවිනි. මෙම නය ක්‍රමය සඳහා ත්‍රෛභූමික කර්මය 'උපෙත' යැයි කීමට ලැබේ.

(සති ච සබ්බතෙභූමකධම්මානං උපාදානාරම්මණත්තෙ යෙහි විපාකකටත්තාරූපානි අම්හෙහි නිබ්බත්තත්තා අම්හාකං එතානි ඵලානී'ති ගණ්හන්තෙහි විය ආදින්නානි, තානි තෙභූමකකම්මානි කම්මභාවෙන එකත්තං උපනෙත්වා උපෙතන්ති ඉධ ගහිතානි)

(ඝ) උපාදින්නුපාදානියා - (උපාදින්නා ච තෙ උපාදානියා චා'ති = උපාදින්නුපාදානියා) උපාදින්න ද උපාදානිය ද වන්නා වූ ලෞකික විපාක සිත් 32, චෛතසික 35, කර්මජ රූප 20 "උපාදින්නුපාදානියා" නම් වේ. එමනිසා ප්‍රථම පදය සඳහා මෙම ස්වරූපාර්ථ ලැබේ.

අනුපාදින්නුපාදානියා - 'උපාදින්න' නො වී 'උපාදානිය' වන්නා වූ අකුසල සිත් 12, ලෞකික කුසල් සිත් 17, ක්‍රියා සිත් 20, චෛතසික 52, ත්‍රිජ රූප (කර්මජ රූප හැර සෙසු චිත්තජ, උතුජ හා ආහාරජ රූප) "අනුපාදින්නුපාදානියා" ධර්මතාවෝ වෙත්.

උපාදින්නුපාදානියා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික විපාක දෙතිස (32), තත් සම්ප්‍රයුක්ත චෛතසික පන්තිස ද (35), කර්මජ රූප විස්ස ද (20) ලැබෙයි. -පෙ-

ආයතන වශයෙන් එකොළොස්වැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, විසි කර්මජ රූපයන් අතුරෙන් චක්ඛු ප්‍රසාද රූපය චක්ඛායතනය නම් වේ. සෝත ප්‍රසාද රූපය සෝතායතනය නම් වේ. ඝාන ප්‍රසාද රූපය ඝානායතනය නම් වේ. ජිව්හා ප්‍රසාද රූපය ජිව්හායතනය නම් වේ. කාය ප්‍රසාද රූපය කායායතනය නම් වේ. වර්ණ රූපය රූපායතනය නම් වේ. ගන්ධ රූපය ගන්ධායතනය නම් වේ. රස රූපය රසායතනය නම් වේ. පඨවි, තේජෝ, වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වේ. ලෞකික විපාක සිත් දෙතිස මනායතනය නම් වේ. පන්තිස් චෛතසිකය, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, පරිච්ඡේද රූපය, උපචය රූපය, සන්තති රූපය යන සුඛුම රූප නවය ධම්මායතනය නම් වේ. තවත් ක්‍රමයකින් ගතහොත් ජරතා, අනිච්චතා දෙක එක් කළ කල්හි සුඛුම රූප එකොළොස ද ධම්මායතනය නම් වේ. මෙසේ ආයතන වශයෙන් එකොළොස්වැදෑරුම් වන්නාහ.[13]

අනුපාදින්නඅනුපාදානියා - 'උපාදින්න' නො වී 'උපාදානිය'ද නොවන්නා වූ ලෝකෝත්තර සිත් 08, චෛතසික 36, නිර්වාණය "අනුපාදින්න අනුපාදානියා" නම් වූ ධර්මතාවෝ ය.

උපාදින්නඅනුපාදානියා - 'උපාදින්න' වන්නා වූ 'උපාදානිය' නොවන්නා වූ ධර්මතා විශේෂයක් නොමැත. එමනිසා මෙම ත්‍රිකයෙහි ත්‍රිකමුක්ත ධර්මයන් නැත.

13. **කර්මජ රූප විස්ස** - අභිධර්මාර්ථ සංග්‍රහයේ දී මුඛ්‍ය වශයෙන් අදහස් කරමින් ඒකාන්ත කර්මජ රූප 9ක් ද, අනේකාන්ත 9ක් ද වශයෙන් කර්මජ රූප 18ක් ද දක්වන ලදී. නමුත් ස්වරූපාර්ථ උද්ධරණයේ දී උපචය සහ සන්තති රූපයන් ගෙන කර්මජ රූප 20ක් ලෙස දක්වා ඇත. උපචය සහ සන්තති රූපයන් රූප උපදවන්නා වූ

අනුපාදින්නුපාදානියා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දොළොස් අකුසල් සිත් ය (12), ලෞකික කුසල් සිත් සතළොසය (17), ක්‍රියා සිත් විස්සය (20) තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපනසය (52) චිත්තජ රූප සතළොසය (17), ඍතුජ රූප පසළොසය (15), ආහාරජ රූප තුදුසය (14) යන මේ ධර්මයෝ ලැබෙන්නාහ. -පෙ-

ආයතන වශයෙන් සත්වැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්,

කර්මාදී ප්‍රත්‍ය ධර්මයන්ගේ ශක්ති ව්‍යාපාර අවසන් නො වී නිෂ්පන්න රූප අටාළොසගේ උත්පාදය වීම හේතුවෙන් පර්යාය වශයෙන් ඒ කර්මාදී ප්‍රත්‍ය සතර නිසා උපදී යැයි ගෙන එම උපචය සහ සන්තති රූපයන් ද ඇතුළත් කරමින් කර්මජ රූප 20ක් ලෙස දක්වා ඇත. චිත්තජ රූප 17, ඍතුජ රූප 15, ආහාරජ රූප 14 යන තැන්හි ද මෙම ක්‍රමයෙන් ම සැලකිය යුතු යි.

සුඛුම රූප නවය (පළමු ක්‍රමය), ඒකාදශය (දෙවන ක්‍රමය) - සුඛුම රූප 16 කි. "විඤ්ඤත්තියං චිත්තජමෙව, ලහුතාදිත්තයං උතුචිත්තාහාරෙහි සම්භොති" යනුවෙන් දක්වා ඇති බැවින් කාය විඤ්ඤත්ති, වචී විඤ්ඤත්ති, රූපලහුතා, මුදුතා, කම්මඤ්ඤතා යන පරමාර්ථ ධර්මයන් පස උපාදින්න සඳහා නො ලැබේ. තව ද කර්මජ රූප විස්සෙහි ජරතා, අනිච්චතා ද ඇතුළත් නො වේ. මේ අනුව ස්වරූපාර්ථ උද්ධරණයේ දී සුඛුම රූප 09 පමණක් ම ගනු ලැබේ. තවත් ක්‍රමයකින් දැක්වුවහොත් කර්මජ රූපයන්ගේ ස්ථිතිය සහ භඞ්ගය වීම හේතුවෙන් ජරතා සහ අනිච්චතා ඉවත් කිරීමට ද නුසුදුසු ය. එනිසා ඒවා ද ඇතුළත් කළ විට සුඛුම රූප 11කි. එබැවින් 'ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, පරිච්ඡේද රූපය, උපචය රූපය, සන්තති රූපය යන සුඛුම රූප නවය ධම්මායතනය නම් වේ. තවත් ක්‍රමයකින් ගතහොත් ජරතා, අනිච්චතා දෙක එක් කළ කල්හි සුඛුම රූප එකොළොස ද ධම්මායතනය නම් වේ' යැයි දක්වන ලදී.

පටුන වෙත

චිත්තජ, ඍතුජ, ආහාරජ යන තිජරූපයන් අතුරෙන් වර්ණ රූපය රූපායතනය නම් වේ. -පෙ- පඨවි, තේජෝ, වායෝ ඵොට්ඨබ්බායතනය නම් වේ. අකුසල් සිත් දොළොස, ලෞකික කුසල් සිත් සතළොස හා ක්‍රියා සිත් විස්ස ද මනායතනය නම් වේ. දෙපනස් චෛතසිකය ද ආපෝධාතුව, ආහාරරූපය, පරිච්ඡේද රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචී විඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය වශයෙන් සුඛුම රූප දසය ධම්මායතනය නම් වේ. තවත් නය ක්‍රමයකින් ගතහොත් ජරතා රූපය, අනිච්චතා රූපය යන දෙක එක් කළ කල්හි සුඛුම රූපදොළොස ද ධම්මායතනය නම් වේ. මෙසේ ආයතන වශයෙන් සත්වැදෑරුම් වන්නාහ.

අනුපාදින්න අනුපාදානියා ධම්මා යන තෘතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අටදෙනය, තත් සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකය හා නිර්වාණය යන මේ ධර්මයෝ ලැබෙති. -පෙ- ආදිලබ්ධනාම ත්‍රිකයකි, නිප්‍රදේශ ත්‍රිකයකි.[14]

---

14. **සුඛුම රූප දසය (පළමු නය), දොළොස (දෙවන නය)** - "හදයඉන්ද්‍රියරූපානි කම්මජානෙව" යැයි දක්වන ලද බැවින් සුඛුම රූපයන්ගෙන් "ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය" වශයෙන් ඒකාන්ත කර්මජ රූප සතර නො ගනියි. ජරතා සහ අනිච්චතා රූපයන් ද ත්‍රිජරූපවල ඇතුළත් නො වේ. මේ අනුව ස්වරූපාර්ථ උද්ධරණයේ දී සුඛුම රූප 10ක් ගනුලබයි. තවත් ක්‍රමයකින් දැක්වුවහොත් ත්‍රිජ රූපයන්ගේ ස්ථිතිය සහ භඞ්ගය වීම හේතුවෙන් ජරතා සහ අනච්චතා ඉවත් කිරීමට ද නුසුදුසු ය. එනිසා ඒවා ද ඇතුළත් කළ විට සුඛුම රූප 12කි. එබැවින් ජරතා, අනිච්චතා රූපයන් ඇතුළත් කරමින් ද නොකරමින් ද "ආපෝධාතුව, ආහාරරූපය, පරිච්ඡේද රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචී විඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය වශයෙන් සුඛුම රූප දසය ධම්මායතනය නම් වේ. තවත් නය ක්‍රමයකින් ගතහොත් ජරතා රූපය,

05. සංකිලිට්ඨ ත්‍රිකය

ප්‍රථම පදය - සංකිලිට්ඨසංකිලේසිකා ධම්මා, දෙවන පදය - අසංකිලිට්ඨසංකිලේසිකා ධම්මා, තෙවන පදය - අසංකිලිට්ඨඅසංකිලේසිකා ධම්මා

ස්වරූපාර්ථ වගුව

පදය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
		ස්	ආ	ධා	ස
ප	අකු-12, චෙ-27	4	2	2	2
දු	ලෞකික කුසල්-17, ලෞකික විපාක-32, ක්‍රියා-20, චෙ-38, රූ-28	5	12	18	1
ත	ලොකු-8, චෙ-36, නිර්වාණය	4	2	2	2

සංකිලිට්ඨසංකිලෙසිකා ධම්මා - සංකිලිට්ඨ - ලෝභාදී කෙලෙසුන් විසින් කෙලෙසන ලද්දා වූ, සංකිලේසිකා ධම්මා - ලෝභාදී කෙලෙසුන්ට හිත වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අසංකිලිට්ඨසංකිලෙසිකා ධම්මා අසංකිලිට්ඨ - ලෝභාදී කෙලෙසුන් විසින් නොකෙලෙසන ලද්දා වූ, සංකිලේසිකා ධම්මා - ලෝභාදී කෙලෙසුන්ට හිත වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අසංකිලිට්ඨඅසංකිලෙසිකා ධම්මා අසංකිලිට්ඨ - ලෝභාදී කෙලෙසුන් විසින් නොකෙලෙසන ලද්දා වූ, අසංකිලේසිකා ධම්මා - ලෝභාදී වූ

අනිච්චතා රූපය යන දෙක එක් කළ කල්හි සුඛුම රූප දොළොස ද ධම්මායතනය නම් වේ" යැයි දක්වන ලදී.

පටුන වෙත

කෙලෙසුන්ට හිත නො වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ. [15]

---

15. **සංකිලිට්ඨ** - සංකිලිට්ඨ - කෙලෙසන, බාධා කරන, දවන, තවන, උපතාපනය කරන කෙලෙසුන් සමඟ යෙදුණා වූ ධර්මතා සියල්ල සංකිලිට්ඨ නම් වේ. (සංකිලෙසෙතී'ති = සංකිලෙසො, විබාධති උපතාපෙති වාති අත්ථො, සංකිලෙසෙන සමන්නාගතා සංකිලිට්ඨා)

සංකිලේස - සංකිලේසා - සන්තානය දවන තවන හිංසා පීඩාවට පත් කරන ක්ලේශ ධර්ම දස දෙනෙක් ඇත. ලෝභය, ද්වේෂය, මෝහය, මානය, දෘෂ්ටිය, විචිකිච්ඡාව, ථීන, උද්ධච්ච, අහිරික හා අනොත්තප්ප යන දසදෙනා ය.

(අ) සංකිලිට්ඨ වන සංකිලෙස නොවන ධර්මයෝ නම් අකුසල සිත් 12, ක්ලේශ දසයට අයත් නොවන චෛතසික 17 යි.

(ආ) සංකිලිට්ඨ වන සංකිලෙස නොවන ධර්මතා නැත.

(ඉ) සංකිලිට්ඨ ද වන සංකිලෙස ද වන ධර්මතාවෝ නම් දස ක්ලේශයෝ ය.

(ඊ) සංකිලිට්ඨ ද නො වී සංකිලිට්ඨ ද නොව ධර්මතාවෝ නම් කුසල, විපාක, ක්‍රියා චිත්තුප්පාද සහ රූප, නිර්වාණය යන ධර්මතාවෝ ය. මෙසේ සතර ආකාරයට ධර්මතා බෙදනු ලබයි.

සංකිලේසික - කෙලෙසුන්ට අරමුණු වන බැවින් ද කෙලෙසුන්ට ගොදුරු වන බැවින් ද කෙලෙසුන්ට අරමුණු වීම නොවැළැක්විය හැකි බැවින් ද කෙලෙස් පහළ වීමට ආරම්මණ ප්‍රත්‍ය වන බැවින් ද සංකිලේසික නම් වේ. "අත්තානං ආරම්මණං කත්වා පවත්තනෙන සංකිලෙසං අරහන්ති, සංකිලෙසෙ වා නියුත්තා, තස්ස ආරම්මණභාවං අනතික්කමනතො'ති = සංකිලෙසිකා, සංකිලෙසස්ස ආරම්මණපච්චයභූතානං එතං අධිවචනං" යන අටුවා පාඨයෙන් ඉහත දැක්වූ තේරුම කියැවේ. අභිධෙය්‍යාර්ථ ලෙස ලෞකික සිත් 81, චෛතසික 52 සහ රූප 28 'සංකිලෙසික' යටතට ගැනෙයි.

(ආදිලබ්ධනාම ත්‍රිකයකි, නිප්‍රදේශ ත්‍රිකයකි.)

සංකිලිට්ඨසංකිලෙසිකා - (සංකිලිට්ඨා ච තෙ සංකිලෙසිකා'ති = සංකිලිට්ඨසංකිලෙසිකා). සංකිලිට්ඨ වන්නා වූ ද සංකිලෙසික වන්නා වූ ද ධර්මතාවෝ ය. එම ධර්මතාවෝ නම් අකුසල සිත් 12 සහ චෛතසික 27 යි.

අසංකිලිට්ඨසංකිලෙසිකා - සංකිලිට්ඨ ද නොවන සංකිලෙසික නොවන ධර්මතාවෝ 'අසංකිලිට්ඨසංකිලෙසිකා' වේ. එම ධර්මතාවෝ නම් ලෞකික කුසල සිත් 17, ලෞකික විපාක සිත් 32, ක්‍රියා සිත් 20 සහ රූප 28 යි.

අසංකිලිට්ඨඅසංකිලෙසිකා සංකිලිට්ඨ නොවන සංකිලෙසික ද නොවන ධර්මතාවෝ 'අසංකිලිට්ඨඅසංකිලෙසික' නම් වේ. එම ධර්මතාවෝ නම් ලෝකෝත්තර සිත් 08, චෛතසික 36 සහ නිර්වාණය යි.

සංකිලිට්ඨඅසංකිලෙසිකා - සංකිලිට්ඨ වන්නා වූ සංකිලෙසික නොවන්නා වූ ධර්මතා නැත. එමනිසා මෙම ත්‍රිකයෙහි ද ත්‍රික මුක්ත ධර්මතා නැත.

06. විතර්ක ත්‍රිකය

ප්‍රථම පදය - සවිතක්කසවිචාරා ධම්මා, දෙවන පදය - අවිතක්කවිචාරමත්තා ධම්මා, තෙවන පදය - අවිතක්කඅවිචාරා ධම්මා

ස්වරූපාර්ථ වගුව

පදය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
		ස්	ආ	ධා	ස
ප	සවිතර්කසවිචාර සිත්-55, චෛ-50 (විතර්ක, විචාර හැර)	4	2	3	3
දු	දුතියධ්‍යාන-11, චෛ-36 (විතර්ක, විචාර හැර), සවිතර්කසවිචාර සිත් සිත්වල ඇති විතර්ක-55	4	2	2	2
ත	අවිතර්ක සිත්-55, චෛ-36, දුතිය ධ්‍යාන සිත්වල විචාර-11, රූප 28, නිර්වාණය	5	12	17	3
මුක්ත	සවිතර්කසවිචාර සිත්වල විචාර-55				

සවිතක්කසවිචාරා - සවිතක්ක - විතර්කය ද සහිත වූ, සවිචාරා ධම්මා - විචාරය ද සහිත වූ, නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අවිතක්කවිචාරමත්තා - අවිතක්ක - විතර්කය රහිත වූ, විචාරමත්තා ධම්මා - විචාරය පමණක් ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අවිතක්කඅවිචාරා - අවිතක්ක - විතර්කය ද රහිත වූ, අවිචාරා ධම්මා විචාරය ද රහිත වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව

පටුන වෙත

ධර්මයෝ ඇත්තාහ.[16]

---

16. **සවිතක්කා** - (සහ විතක්කෙන යෙ වත්තන්තී'ති = සවිතක්කා). විතර්කය සමඟ පවතින ධර්මයෝ සවිතක්ක නම් වෙති. එසේ වුව ද මෙම ප්‍රකාශයට අනුව සහජාත වශයෙන් උපදින ධර්මයන් සවිතක්කා ධම්මා සඳහා නො ගනුලබයි. සම්ප්‍රයෝග වශයෙන් (ඒකුත්පාදාදී වශයෙන් යෙදෙන) යෙදෙන ධර්මයන් ම ගනු ලබයි. (සම්පයොගවසෙන පවත්තමානෙන සහ විතක්කෙන = සවිතක්කා).

එම නිසා විතර්කය සමඟ නොයෙදෙන ද්විපඤ්ච විඤ්ඤාණ සිත් 10 හැර සෙසු කාමාවචර සිත් 44, ප්‍රථමධ්‍යාන සිත් 11 වශයෙන් = සවිතර්ක සිත් 55, විතර්ක චෛතසිකය හැර චෛතසික 51 'සවිතක්ක' ධර්මයෝ නම් වෙති. මෙහි විතර්කය අත්හරිනුයේ විතර්කය සමඟ පවතින ධර්මයක් ලෙස 'විතර්කය' දැක්විය නොහැකි බැවිනි. උපමාවකින් - බුද්ධරක්ඛිත භික්ෂුව සමඟ විහාරයේ වාසය කරන භික්ෂූන් වහන්සේලා නම් කරනු යැයි කිවහොත් බුද්ධරක්ඛිත භික්ෂුව, බුද්ධරක්ඛිත භික්ෂුව සමඟ වාසය කරයි යැයි කීමට නොහැකි මෙනි.

සවිචාරා - (සහ විචාරෙන යෙ වත්තන්තී'ති = සවිචාරා). විචාරය සමඟ සම්ප්‍රයෝග වශයෙන් යෙදෙන ද්විපඤ්ච විඤ්ඤාණ සිත් 10 හැර සෙසු කාමාවචර සිත් 44, ප්‍රථමධ්‍යාන සිත් 11, ද්විතීයධ්‍යාන සිත් 11 වශයෙන් සවිචාර සිත් 66, විචාර චෛතසිකය හැර චෛතසික 51 'සවිචාර' ධර්මයෝ නම් වෙති. මෙම පදයේ ද විචාරය අත්හැරීම 'සවිතක්කා' පදයේ දී විතර්කය අත්හළ ක්‍රමයට ම සැළකිය යුතු ය.

අවිතක්ක - (නත්ථි විතක්කො එතෙසන්ති = අවිතක්කා). විතර්ක නො යෙදෙන ද්විපඤ්ච විඤ්ඤාණ සිත් 10, ද්විතීයධ්‍යාන සිත් 11, තෘතීයධ්‍යාන සිත් 11, චතුර්ථධ්‍යාන සිත් 11, පඤ්චමධ්‍යාන සිත් 23 වශයෙන් අවිතක්ක සිත් 66 ද විතර්කය හැර චෛතසික 47, විතර්ක 55, රූප, නිර්වාණ යන ධර්මතා 'අවිතක්ක' ධර්මතා නම් වේ.

අවිචාරා - (නත්ථි විචාරො එතෙසන්ති = අවිචාරා). විචාරය සමඟ නො යෙදෙන අවිචාර සිත් 55, විතර්ක විචාර හැර චෛතසික 46, විචාර 66, රූප, නිර්වාණ යන ධර්මතා 'අවිචාර' නම් වේ.

පටුන වෙත

සවිතක්කසවිචාරා ධම්මා යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් විතර්ක විචාර සහිත පස්පනස් (55) චිත්තයෝ ද තත් සම්ප්‍රයුක්ත වූ විතර්ක විචාර දෙක වර්ජිත සමපනස් (50) චෛතසිකයෝ ද ලැබෙති.

ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, ලෞකික සවිතක්ක සවිචාර සිත් සත්සාළිස ද තත් සම්ප්‍රයුක්ත ලෝභය වර්ජිත චෛතසික එකුන්පනස ද දුක්ඛ සත්‍යය නම් වේ. ලෝභ චෛතසිකය සමුදය සත්‍යය නම් වේ. සතර මාරග සම්ප්‍රයුක්ත

මෙසේ පද සතරක් සම්බන්ධව මූලික අවබෝධයක් ඇති කල්හි මෙම ත්‍රිකය පහසුවෙන් තේරුම් ගතහැක.

(අ) සවිතක්කසවිචාර - (සවිතක්කා ච තෙ සවිචාරා චා'ති = සවිතක්කසවිචාරා). විතර්කය සමඟ ද යෙදෙන, විචාරය සමඟ ද යෙදෙන සවිතර්ක සවිචාර සිත් 55, විතර්ක විචාර හැර චෛතසික 50 ද 'සවිතක්කසවිචාර' නම් වේ. මෙහි විතර්කය සහ විචාරය යන දෙක චෛතසික් දෙක ම ඉවත් වේ.

(ආ) අවිතක්කවිචාරමත්ත - (විචාරොව මත්තා පමාණං එතෙසන්ති = විචාරමත්තා; අවිතක්කා ච තෙ විචාරමත්තා චා'ති = අවිතක්කඅවිචාරමත්තා). විතර්කය සමඟ නොයෙදෙන විචාරය සමඟ පමණක් යෙදෙන ද්විතීයධ්‍යාන සිත් 11, විතර්ක විචාර හැර චෛතසික 36, සවිතර්ක සවිචාර සිත් 55 යෙදෙන විතර්ක චෛතසික 55 'අවිතක්කවිචාරමත්ත' නම් වේ.

(ඉ) විතක්කමත්තඅවිචාර - විතර්කය සමඟ පමණක් යෙදෙන, විචාරය සමඟ නොයෙදෙන සවිතර්ක සවිචාර සිත් 55හි ඇති විචාර චෛතසික 55 'විතක්කමත්තඅවිචාර' වේ. මෙම ධර්මයෝ ත්‍රික මුක්ත වෙති.

(ඊ) අවිතක්කඅවිචාර - විතර්කය සමඟ ද නොයෙදෙන්නා වූ විචාරය සමඟ ද නොයෙදෙන්නා වූ අවිතර්ක අවිචාර සිත් 55, විතර්ක විචාර හැර චෛතසික 36, ද්විතීයධ්‍යාන සිත් 11හි ඇති විචාර චෛතසික 11, රූප 28 සහ නිර්වාණය 'අවිතක්කඅවිචාර' ධර්මතා නම් වේ.

වූ සම්මා දිට්ඨි, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සෝවාන් මාර්ගාංගයෝ සත්දෙන ද සකදාගාමී මාර්ගාංගයෝ සත්දෙන ද අනාගාමී මාර්ගාංගයෝ සත්දෙන ද අර්හත් මාර්ගාංගයෝ සත්දෙන ද මාර්ග සත්‍යය නම් වෙති. අතිරික්ත මාර්ග චිත්තෝත්පාදයෝ අටවිසිදෙන ද ඵලචිත්තෝත්පාදයෝ පන්තිස් දෙන ද සත්‍ය විනිර්මුක්ත වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.[17]

අවිතක්කවිචාරමත්තා ධම්මා යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ද්විතීය ධ්‍යාන සිත් එකොළොස ද තත් සම්ප්‍රයුක්ත විතර්ක, විචාර දෙක වර්ජිත සතිස් චෛතසිකය ද සවිතක්ක සවිචාර සිත් පස්පනසෙහි වූ පස්පනස් විතර්කයෝ ද ලැබෙති.

ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, ලෞකික ද්විතීයධ්‍යාන සිත් තුන ද තත් සම්ප්‍රයුක්ත විචාර වර්ජිත තෙතිස් චෛතසිකය ද ලෞකික සවිතක්ක සවිචාර සිත් සත්සාළිසෙහි

---

17. **ලෞකික සවිතක්ක සවිචාර සිත් සත්සාළිස** - ද්විපඤ්ච විඤ්ඤාණ හැර කාමාවචර සිත් 44, රූපාවචර ප්‍රථමධ්‍යාන සිත් 03 වශයෙන් වන සිත් 47 ලෞකික සවිතක්ක සවිචාර සිත් නම් වේ.

අතිරික්ත මාර්ග චිත්තෝත්පාදයෝ අටවිසිදෙන - විතර්ක ත්‍රිකයේ සෑම පදයක දී ම ස්වරූපාර්ථයන් සඳහා විතර්කය සහ විචාරය නොගනියි. එසේ නොගත් විට මාර්ග සිතෙහි යෙදෙන චෛතසික 34ක් ඉතිරි වේ. ඒවා අතරින් විතර්කය ඇතුළත් නොවන බැවින් මාර්ගාංග සතකි. මාර්ග සිතෙහි යෙදෙන චෛතසික 34න් එම මාර්ගාංග සත අඩු කළ විට චෛතසික 27ක් ඉතිරි වේ. මාර්ග සිත් ඒකත්වයෙන් ගෙන චෛතසිකයන්ට එකතු කළ විට මාර්ග චිත්තෝත්පාද 28 ක් වේ.

ඵල චිත්තෝත්පාදයෝ පන්තිස්දෙන - ඵල සිත්වල ද විතර්ක විචාර හැර චෛතසික 34ක් ම යෙදේ. ඵල සිත් ඒකත්වයෙන් ගෙන චෛතසිකයන්ට එකතු කළ විට ඵල චිත්තෝත්පාද 35 ක් වේ.

පටුන වෙත

වූ විතර්ක සත්සාළිස ද දුක්ඛ සත්‍යය නම් වේ. ලෝකෝත්තර ද්විතීය ධ්‍යානය සමඟ යෙදුණා වූ සම්මා සංකප්ප වර්ජිත සම්මා දිට්ඨි ආදී සෝවාන් මාර්ගාංග සත්දෙන ද සකදාගාමී මාර්ගාංග සත්දෙන ද අනාගාමී මාර්ගාංග සත්දෙන ද අර්හත් මාර්ගාංග සත්දෙන ද ලෝකෝත්තර ප්‍රථමධ්‍යාන සතර මාර්ග චිත්තයන් හා සම්ප්‍රයුක්ත වූ සම්මා සංකප්ප සතරදෙන ද මාර්ග සත්‍යය නම් වේ. ඉතිරි මාර්ග චිත්තෝත්පාද අටවිසිදෙන ද ඵල චිත්තෝත්පාද පන්තිස්දෙන ද සවිතක්ක සවිචාර ඵල සිත් සතර හා සම්ප්‍රයුක්ත විතර්ක සතර ද සත්‍ය විනිර්මුක්ත වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.[18]

අවිතක්කඅවිචාරා ධම්මා යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අවිතක්ක අවිචාර සිත් පස්පනස ද තත් සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකය ද ද්විතීය ධ්‍යාන සිත් එකොළොසෙහි වූ විචාර එකොළොස ද, අටවිසි රූපය ද නිර්වාණය ද යන මෙතෙක් ධර්මයෝ ලැබෙති.

ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, ලෞකික අවිතක්ක අවිචාර සිත් එක්තිස ද තත් සම්ප්‍රයුක්ත චෛතසික තෙතිස ද, රූපාවචර ද්විතීයධ්‍යාන විචාර තුන ද අටවිසි රූපය ද දුක්ඛ සත්‍යය නම් වේ. නිර්වාණය නිරෝධ සත්‍යය නම් වේ. සතර මාර්ග අවිතක්ක අවිචාර සිත් දොළොසෙහි වූ සම්මා දිට්ඨි ආදී වූ සම්මා

---

18. **(ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ) විතර්ක** සහ **ආර්ය සත්‍ය** - ලෞකික සවිතර්ක සවිචාර සිත් සතළිස් සතෙහි ඇති විතර්ක සතළිස්සත දුක්ඛ සත්‍යය නම් වේ. ප්‍රථමධ්‍යාන මාර්ග සිත් සතරෙහි ඇති විතර්ක සතර මාර්ග සත්‍යය නම් වේ. එම නිසා "ලෝකෝත්තර ද්විතීය ධ්‍යානය සමඟ යෙදුණා වූ සම්මා සංකප්ප වර්ජිත සම්මා දිට්ඨි ආදී -පෙ- මාර්ග සත්‍යය නම් වේ" යැයි දක්වන ලදී. ප්‍රථමධ්‍යාන ඵල සිත් සතරෙහි ඇති විතර්ක චෛතසික සතර සත්‍ය විනිර්මුක්ත වේ. එමනිසා "ඵලචිත්තෝත්පාද පන්තිස්දෙන ද සවිතක්ක සවිචාර ඵල සිත් සතර හා සම්ප්‍රයුක්ත විතර්ක සතර ද සත්‍ය විනිර්මුක්ත වන්නාහ" යැයි දක්වන ලදී.

පටුන වෙත

සංකප්ප වර්ජිත සෝවාන් මාර්ගාංගයෝ සත්දෙන ද සකදාගාමී මාර්ගාංගයෝ සත්දෙන ද අනාගාමී මාර්ගාංගයෝ සත්දෙන ද අර්හත් මාර්ගාංගයෝ සත්දෙන ද මාර්ග සත්‍යය නම් වේ.* අතිරික්ත මාර්ග චිත්තෝත්පාදයෝ අටවිසිදෙන ද ඵල චිත්තෝත්පාදයෝ පන්තිස්දෙන ද ද්විතීයධ්‍යාන සිත් අටෙහි යෙදෙන විචාර අට ද සත්‍ය විනිර්මුක්ත වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.[19]

---

19. **ලෞකික අවිතක්ක අවිචාර සිත්** - ද්විපඤ්ච විඤ්ඤාණ සිත් 10, රූපාවචර තෘතීයධ්‍යාන සිත් 03, චතුර්ථධ්‍යාන සිත් 03, පඤ්චමධ්‍යාන සිත් 03, අරූපාවචර සිත් 12 වශයෙන් 31ක් වූ සිත් ලෞකික අවිතක්ක අවිචාර සිත් වේ.

චෛතසික තෙතිස - ලෞකික ද්විතීයධ්‍යාන ආදියෙහි විරති නොයෙදෙන බැවින් චෛතසික 33ක් පමණක් ලැබේ. විතර්ක විචාරයන් ද අත්හැර ඇති බව දත යුතු යි.

***විචාර සහ ආර්ය සත්‍ය** - ලෞකික ද්විතීයධ්‍යාන සිත් තුනෙහි ඇති විචාර චෛතසික තුන දුක්ඛ සත්‍යය නම් වේ. ලෝකෝත්තර ද්විතීයධ්‍යාන සිත් අටෙහි ඇති විචාර චෛතසික අට සත්‍ය විනිර්මුක්ත වේ.

සවිතර්කසවිචාර සිත්වල ඇති විචාර 55 ත්‍රික මුක්ත වීම - මෙම විචාර 55 ත්‍රිකයේ පදවලින් ඉවත් වන ආකාරය පහත පරිදි වටහා ගත යුතු ය.

- පළමු පදයේ දී සවිතර්කසවිචාර සිත්වල යෙදෙන විතර්ක, විචාර යන චෛතසික දෙක ඉවත් වන බැවින් එම පදයෙන් මෙම විචාර 55 ඉවත් වේ.

- දෙවන පදයේ දී අවිතර්කවිචාර මාත්‍ර වන ධර්මයන් සඳහා විතර්කය නොයෙදෙන නමුත් විචාරය යෙදෙන ධර්මයන් ගන්නා බැවින් එම පදයෙන් මෙම විචර 55 ඉවත් වේ.

- තෙවන පදයේ දී අවිතර්කඅවිචාර වන ධර්මයන් සඳහා විතර්කය ද විචාරය ද නොයෙදෙන ධර්මයන් ගනු ලැබේ. සවිතර්කසවිචාර

07. ප්‍රීති ත්‍රිකය

ප්‍රථම පදය - පීතිසහගතා ධම්මා, දෙවන පදය - සුඛසහගතා ධම්මා, තෙවන පදය - උපෙක්ඛාසහගතා ධම්මා

ස්වරූපාර්ථ වගුව

පදය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
		ස්	ආ	ධා	ස
ප	ප්‍රීති සහගත සිත්-51, චෙ.-46(දේස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, විචිකිච්චා, ප්‍රීති හැර)	4	2	2	3
දු	සුඛ සහගත සිත්-63, චෙ.-46(දේස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, විචිකිච්චා, වේදනා හැර)	3	2	3	3
ත	උපෙක්ඛා සහගත සිත්-55, චෙ.-46 (දේස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, විචිකිච්චා, වේදනා හැර)	3	2	7	3
මුක්ත	සුඛසහගත කායවිඤ්ඤාණය සහ චතුර්ථ ධ්‍යාන සිත්11හි ඇති සුඛවෙදනා 12, උපෙක්ඛා වෙදනා-55, දුක්ඛසහගත සිත් 3, චෙ-22, රූප-28, නිර්වාණය				

සිත්වල ඇති විචාරයන් අවිතර්ක නොවන බැවින් එම පදයෙන් ද මෙම විචාර 55 ඉවත් වේ.

පටුන වෙත

පීතිසහගතා ධම්මා - ඉෂ්ටාරම්මණයෙහි පිනායාම ලක්ෂණ කොට ඇත්තා වූ, ප්‍රීතිය සමඟ ඒකෝත්පාදාදී භාවයෙන් මිශ්‍ර වූ, නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සුඛසහගතා ධම්මා - ඉෂ්ටාරම්මණ රසානුභවන ලක්ෂණ වූ කායික මානසික සුඛ වේදනාව හා සමඟ ඒකෝත්පාදාදී භාවයෙන් මිශ්‍ර වූ, නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

උපෙක්ඛාසහගතා ධම්මා - ඉෂ්ට මධ්‍යස්ථාරම්මණ රසානුභවන ලක්ෂණ වූ උපේක්ෂා වේදනාව හා සමඟ ඒකෝත්පාදාදී භාවයෙන් මිශ්‍ර වූ, නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[20]

පීතිසහගතා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ප්‍රීති සහගත එක්පනස් චිත්තයෝ ද ප්‍රීති දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච, විචිකිච්ඡා වර්ජිත සසාළිස් චෛතසිකයෝ ද ලැබෙති.

ආර්ය සත්‍ය වශයෙන් තුන්වැදෑරුම් වන්නාහු කෙසේ ද? යත්, ලෞකික ප්‍රීති සහගත සත්විසි චිත්තය ද තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත පන්සාළිස් චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වේ. ලෝභ චෛතසිකය සමුදය සත්‍යය නම් වේ. ප්‍රීති සහගත සතර මාර්ග චිත්තයන්හි යෙදුණා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සෝවාන් මාර්ගාංගයෝ අටදෙන එක්වරක් හා සත්දෙන දෙවරක් ද සකදාගාමී මාර්ගාංගයෝ අටදෙන එක්වරක් හා සත්දෙන දෙවරක් ද අනාගාමී මාර්ගාංගයෝ අටදෙන එක්වරක් හා සත්දෙන දෙවරක් ද අර්හත් මාර්ගාංගයෝ අටදෙන එක්වරක් හා සත්දෙන

---

20. **පීතිසහගතා** - (පීතියා සහ එකුප්පාදාදිභාවං ගතා'ති = පීතිසහගතා). ප්‍රීතිය සමඟ ඒකෝත්පාදාදි භාවයට පැමිණි ධර්මයෝ " පීතිසහගතා" නම් වෙති. සෙසු පදයෝ ද මෙම ක්‍රමයෙන් දත යුතු යි.

උපෙක්ඛාසහගතා ධම්මා - (සුඛදුක්ඛාකාරපවත්තිං උපෙක්ඛතී'ති = උපෙක්ඛා). අදුක්ඛමසුඛ වේදනාව යි. උපේක්ෂාව ඉෂ්ට අනිෂ්ට අරමුණු මධ්‍යස්ථව බලන බැවින් 'උපෙක්ඛා' නම් වේ.

දෙවරක් ද යන මේ ධර්මයෝ මාර්ග සත්‍යය නම් වෙති. ඉතිරි මාර්ග චිත්තෝත්පාද අටවිසි දෙන ද ප්‍රීති සහගත ඵල චිත්තෝත්පාද සතිස්දෙන ද සත්‍ය විනිර්මුක්ත වෙති. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.[21]

සුඛසහගතා ධම්මා යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සුඛසහගත තෙසැට චිත්තයෝ ද තත් සම්ප්‍රයුක්ත වේදනා, දෝස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, විචිකිච්ඡා වර්ජිත සසාළිස් චෛතසිකයෝ ද ලැබෙති.

උපෙක්ඛාසහගතා ධම්මා යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් උපේක්ෂා සහගත පස්පනස් චිත්තයෝ ද වේදනා, ප්‍රීති, දෝස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච වර්ජිත සසාළිස් චෛතසිකයෝ ද ලැබෙති.[22]

---

21. **ප්‍රීති, දෝස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, විචිකිච්ඡා වර්ජිත** - ප්‍රීති චෛතසිකය එම ප්‍රීති චෛතසිකය සමග ම සම්ප්‍රයුක්ත නො වේ. එමනිසා **ප්‍රීතිසහගතා** සඳහා ප්‍රීති චෛතසිකය අත්හැර ස්වරූපාර්ථ ගනු ලබයි. ප්‍රීතිය, සුඛය සහ උපේක්ෂාව සමඟ සම්ප්‍රයුක්ත වන සිත්වල දෝස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, විචිකිච්ඡා චෛතසිකයන් නොයෙදෙන බැවින් ඒවා ද අත්හරිනු ලබයි.

22. **මෙම ත්‍රිකය දේශනා කිරීම** - මෙම ත්‍රිකයේ ද්විතීය පදය සහ තෘතීය පදය වේදනා ත්‍රිකයේ දී දේශනා කරන ලදී. ප්‍රථම පදය පමණක් විශේෂ වේ. මෙසේ වේදනා ත්‍රිකයෙන් පද දෙකක් ගෙන කවර හේතුවක් නිසා මෙසේ දේශනා කළ සේක් ද?

චතුර්ථධ්‍යාන සිත් එකොළොසෙහි සහ සුඛ සහගත කායවිඤ්ඤාණ සිත්වල ඇති සුඛය, ප්‍රීතිය විරහිත (ප්‍රීතිය නොයෙදෙන) වන බැවින් නිප්‍රීතිකසුඛ (නිප්පීතික) සුඛ නම් වේ. ප්‍රීති සහගත සිත් එක්පනසෙහි ඇති සුඛය ප්‍රීතිය සමඟ යෙදෙන බැවින් සප්‍රීතිකසුඛ (සප්පීතික) නම් වේ. මෙසේ නිප්‍රීතික සුඛ, සප්‍රීතික සුඛ යන ප්‍රීති වර්ග දෙකෙහි ඇති විශේෂ වෙනස දැක්වීම් වශයෙන් වේදනා ත්‍රිකයෙන් පද දෙකක් ගනිමින් මෙම ත්‍රිකය වදාළ සේක.

03. දස්සන ත්‍රිකය

ප්‍රථම පදය - දස්සනෙන පහාතබ්බා ධම්මා, දෙවන පදය - භාවනාය පහාතබ්බා ධම්මා, තෙවන පදය - නෙවදස්සනෙන න භාවනාය පහාතබ්බා ධම්මා

ස්වරූපාර්ථ වගුව

පදය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
		ස්	ආ	ධා	ස
ප	සෝ මාර්ග(ප්‍රහාණය කරන) දිට්ඨි සම්-4, විචි-1, චෙ-22, (මාන, දෙස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච හැර) (තනුක කරන) අපායගාමිනී දිට්ඨි විප්-4, දෝ-2, චෙ-25 (දිට්ඨි, විචිකිච්ඡා හැර)	4	2	2	2
දු	(සක-තනුක කරන) ඔෘදාරික දිට්ඨි විප්-4, දෝ-2, චෙ-25 (දිට්ඨි, විචිකිච්ඡා හැර) (අනා-ප්‍රහාණය කරන) කාමරාග සං දිට්ඨි විප්-4, දෝ-2, චෙ-25 (අර්-ප්‍රහාණය කරන) රූප අරූප සං දිට්ඨි විප්-4, උද්-1, චෙ -21 (දිට්ඨි, විචිකිච්ඡා, දෙස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච හැර)	4	2	2	2
ත	කු-21, වි-36, ක්‍රි-20, චෙ-38, රූප-28, නිර්වාණය	5	12	18	3

දස්සනෙන පහාතබ්බා - දස්සනෙන - සෝවාන් මාර්ගඥානයෙන්, පහාතබ්බා ධම්මා - ප්‍රහාණය කටයුතු වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

පටුන වෙත

භාවනාය පහාතබ්බා - භාවනාය - සකදාගාමී, අනාගාමී, අර්හත් නම් වූ මතු මාර්ගත්‍රයෙන්, පහතබ්බා ධම්මා - ප්‍රහාණය කටයුතු වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නෙවදස්සනෙන න භාවනාය පහාතබ්බා ධම්මා - දස්සනෙන - සෝවාන් මාර්ගඥානයෙන්, නේවපහාතබ්බා - ප්‍රහාණය කටයුතු නො වූ ද, භාවනාය - සකදාගාමී, අනාගාමී, අර්හත් නම් වූ මතු මාර්ගත්‍රයෙන්, න පහාතබ්බා ධම්මා - ප්‍රහාණය කටයුතු නො වූ ද නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[23]

---

23. **දස්සනෙන පහාතබ්බා** - (නිබ්බානං පස්සති = දස්සනං). නිර්වාණය දකින බැවින් සෝවාන් මාර්ගය දස්සන නම් වේ. 'දස්සන - දැකීම' යන පදයෙන් අදහස් වනුයේ සෝවාන් මාර්ග සිතින් අරමුණු කිරීම් වශයෙන් නිවන දැකීම යි. ප්‍රතිවේධ කිරීම නො වේ. මාර්ග චිත්ත වීථියේ දී ගෝත්‍රභූ සිත ප්‍රථමයෙන් ම නිර්වාණය අරමුණු කරයි. එම අරමුණු කිරීමේ දී ක්ලේශ ප්‍රහාණයක් සිදු නොකරන බැවින් " දස්සන" යන නාමය ලැබීමට සුදුසු නො වේ. සෝවාන් මාර්ගය ම ක්ලේශ ප්‍රහාණය සහ නිර්වාණ අරමුණු කිරීම හේතුවෙන් (අත්ථරුළ්හි අතිසය නය ක්‍රමයෙන්) 'දස්සන' යන නම ලැබීමට සුදුසු වේ.

අතිසය නය නම් යමක් සඳහා ලැබෙන සියලුම අර්ථ නොගෙන අධික වූව පමණක් ගැනීම යි. උදා - අභිරූපස්ස කඤ්ඤා දාතබ්බා - අභිරූපී වූ පුරුෂයාට කන්‍යාව දිය යුතු ය". මෙම වාක්‍යයෙහි "අභිරූපස්ස - අභිරූපී වූ පුරුෂයාට" යැයි පැවසීමේ දී 'අභිරූපී පුරුෂයා' යන නම ලැබීමට සුදුසු සියලු පුරුෂයන් නොගෙන අභිරූපී පුරුෂයන් අතරින් විශේෂයෙන් අභිරූපී පුරුෂයා යන අධික වූ (අතිශය වූ) පුද්ගලයා පමණක් ගැනීම අදහස් වේ. මෙහි ද ගෝත්‍රභූ සහ සෝවාන් මාර්ග සිත යන සිත් දෙකෙන් ම නිර්වාණය දකිනුයේ නමුදු අධික වූ, විශේෂ වූ සෝවාන් මාර්ග සිත පමණක් "දස්සන" යනුවෙන් හඳුන්වයි.

භාවනාය පහාතබ්බා - (භාවෙතී'ති = භාවනා). සකෘදාගාමී, අනාගාමී සහ අර්හත් යන මතු මාර්ග ත්‍රය සෝවාන් මාර්ගය මඟින් දක්නා ලද චතුරාර්ය සත්‍ය ධර්මයන් ප්‍රගුණ කිරීම් වශයෙන් වඩනු ලබයි.

සෝවාන් මාර්ගය මඟින් දක්නා ලද ධර්මයන් වඩාත් පිරිසුදුව, ගැඹුරින් දකිනු ලබයි. එමනිසා 'භාවනා' නම් වේ.

ඒ ඒ මාර්ග සිතෙන් ප්‍රහාණය වන කෙළෙස්

ප්‍රහාණ කටයුතු ධර්ම (ප්‍රහාතව්‍ය ධර්ම)	ප්‍රහාණය කරන ධර්ම (පහායක ධර්ම)
1. දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතර, විචිකිච්ඡා සිත (දිට්ඨි, විචිකිච්ඡා යන ක්ලේෂ දෙක මෙම සිත්වල ඇතුලත් වේ.)	මෙම සිත් පස සෝවාන් මාර්ගයෙන් ප්‍රහාණය කරනු ලැබේ.
2. දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර, ද්වේෂ මූල සිත් දෙක (මාන, ලෝභ, ද්වේෂ, ඊන යන මෙම ක්ලේෂ සතර මෙම සිත්වල ඇතුලත් වේ.)	
2.1 අපාය ගමනීය වන දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර, ද්වේෂ මූල සිත් දෙක	සෝවාන් මාර්ගයෙන් තනුකරණ වශයෙන් ප්‍රහාණය කරනු ලැබේ.
2.2 ඖදරික වන දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර, ද්වේෂ මූල සිත් දෙක	සකදාගාමී මාර්ගයෙන් තනුකරණ වශයෙන් ප්‍රහාණය කරනු ලැබේ.
2.3 කාමරාගය සමඟ සම්ප්‍රයුක්ත වන දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර, ද්වේෂ මූල සිත් දෙක	අනාගාමී මාර්ගයෙන් අනවශේෂ වශයෙන් ප්‍රහාණය කරනු ලැබේ.

පටුන වෙත

දස්සනෙන පහාතබ්බා ධම්මා යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සෝවාන් මාර්ගයෙන් සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය වන්නා වූ දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත ලෝභ

2.4 රූපරාග, අරූපරාග සමඟ සම්ප්‍රයුක්ත වන දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර	අර්හත් මාර්ගයෙන් අනවශේෂ වශයෙන් ප්‍රහාණය කරනු ලැබේ.
3. උද්ධච්ච සහගත සිත	අර්හත් මාර්ගයෙන් අනවශේෂ වශයෙන් ප්‍රහාණය කරනු ලැබේ.

'**නෙව සහ න**' **පද** - (තතියපදං උභයපටිපක්ඛෙපෙන වුත්තං). මෙම තෘතීය පදය පෙර පද දෙක ප්‍රතික්ෂේප කිරීම් වශයෙන් බුදුරජාණන් වහන්සේ විසින් වදාරන ලද්දේ යැයි අටුවාචාරීන් වහන්සේ දැක්වූහ. මෙසේ සාමඤ්ඤ වශයෙන් දේශනා කරන ලදුයේ නමුදු "නෙව සහ න" යන පදවලින් (1) සෝවාන් මාර්ගය, (2) මතු මාර්ග ත්‍රය යැයි කියනා ලද පහායක (ප්‍රහාණ කෘත්‍යය සිදු කරන) මාර්ග සිත් ප්‍රතික්ෂේප නො කරයි. පෙර පද දෙකෙන් දේශනා කරනා ලද ප්‍රහාතව්‍ය (පහාතබ්බ) ධර්මයන් දෙවර්ගය ම ප්‍රතික්ෂේප කෙරේ. මේ නිසා ප්‍රථම පද දෙකෙහි ස්වරූපාර්ථයන්ගෙන් අවශේෂ වන සියලු ම ධර්මයන් තෘතීය පදයෙහි ස්වරූපාර්ථ වශයෙන් ලැබේ.

එම නිසා "දස්සනෙන - සෝවාන් මාර්ගඥානයෙන්, නෙවපහාතබ්බා - ප්‍රහාණය කටයුතු නො වූ ද, භාවනාය - සකදාගාමී, අනාගාමී, අර්හත් නම් වූ මතු මාර්ගත්‍රයෙන්, න පහාතබ්බා ධම්මා - ප්‍රහාණය කටයුතු නො වූ ද නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ" යැයි අර්ථ දැක්විය යුතු වේ.

"නෙව දස්සනෙන - සෝවාන් මාර්ගය නොවන ධර්මයෝ, න භාවනාය - මතු මාර්ග ත්‍රය නොවන ධර්මයෝ, පහාතබ්බා" ආදි වශයෙන් අර්ථ දැක්වීම නුසුදුසු ය. ස්වරූපාර්ථයන්හි එක පදයක් ලෙස සලකමින් අර්ථ දක්වා ඇත්තේ නමුදු මෙය සමාසයක් නොව වාක්‍යයකි.

පටුන වෙත

මූල අකුසල් සිත් සතර ද විචිකිච්ඡා සහගත මෝහ මූල අකුසල චිත්තය ද මාන, දෝස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච වර්ජිත තත් සම්ප්‍රයුක්ත දෙවිසි චෛතසිකය ද සෝවාන් මාර්ගයෙන් තුනී කටයුතු වූ අපායගාමිනී ශක්තියෙන් යුක්ත වන දෘෂ්ටිගත විප්‍රයුක්ත ලෝභ මූල අකුසල සිත් සතර ද්වේෂ මූල සිත් දෙක ද තත් සම්ප්‍රයුක්ත වූ දිට්ඨි, විචිකිච්ඡා වර්ජිත පස්විසි චෛතසිකයෝ ද ලැබෙන්නාහ. (ස්ථාන දෙකෙහි දී ම අකුසල සිත් 11, චෛතසික 27 වේ. ස්කන්ධාදිය උදුරනු).

භාවනාය පහාතබ්බා ධම්මා යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සකදාගාමී මාර්ගයෙන් තුනී කිරීම් වශයෙන් ප්‍රහාණය කටයුතු වූ ඕදාරික දෘෂ්ටිගත විප්‍රයුක්ත ලෝභ මූල අකුසල් සිත් සතර ද දෝස මූල අකුසල් සිත් දෙක ද අනාගාමී මාර්ගයෙන් නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කටයුතු වූ කාමරාගයෙන් යුක්ත වූ දෘෂ්ටිගත විප්‍රයුක්ත ලෝභ මූල සිත් සතර ද දෝස මූල සිත් දෙක ද තත් සම්ප්‍රයුක්ත පස්විසි චෛතසිකය ද අර්හත් මාර්ගයෙන් නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කටයුතු වූ රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා සමඟ යෙදුණා වූ දෘෂ්ටිගත විප්‍රයුක්ත ලෝභ මූල සිත් සතර ද උද්ධච්ච සහගත චිත්තයෝ ද දෘෂ්ටි, විචිකිච්ඡා දෙක වර්ජිත එක්විසි චෛතසිකයෝ ද ලැබෙන්නාහ. (ස්ථාන දෙකෙහි දී ම අකුසල සිත් 7, චෛතසික 25 වේ. දිට්ඨි සහ විචිකිච්ඡා හැර ස්කන්ධාදිය උදුරනු).

නෙවදස්සනෙන න භාවනාය පහාතබ්බා ධම්මා යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශෙයන් කුසල් සිත් එක්විස්ස ද විපාක සිත් සතිස ද ක්‍රියා සිත් විස්ස ද තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද අටවිසි රූපය ද නිර්වාණය ද ලැබෙන්නාහ.[24]

---

24. දස්සනෙන පහාතබ්බා පදයේ අභිධ්‍යාර්ථ කොටස් දෙකකින් දක්වා ඇත. පළමු කොටසින් සෝවාන් මාර්ගයෙන් සමුච්ඡේද (අනවශේෂ) වශයෙන් ප්‍රහාණය වන දිට්ඨිගත සම්ප්‍රයුක්ත ලෝභ මූල සිත් සතර සහ විචිකිච්ඡා සිත දැක්වේ. එම සිත් සමඟ මාන, ද්වේෂ, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච හැර චෛතසික විසිදෙකක් සම්ප්‍රයුක්ත වේ. දෙවන කොටසෙන් සෝවාන් මාර්ගය මගින් තුනී කිරීම් වශයෙන්

දුරු කරන්නා වූ දිට්ඨිගත විප්‍රයුක්ත ලෝභ මූල සිත් සතර සහ ද්වේෂ මූල සිත්වල ඇති අපායගාමී ශක්තිය දැක්වේ. එම සිත් සමඟ දිට්ඨි, විචිකිච්ඡා වර්ජිත චෛතසික විසිපහක් සම්ප්‍රයුක්ත වේ.

ධම්මසංගණී අටුවාවෙහි ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච යන චෛතසික ද සෝවාන් මාර්ගයෙන් ප්‍රහාණය වන බව දැක්වීය. (සෝතාපත්තිමග්ගෙන කුක්කුච්චවිචිකිච්ඡා පහීයන්ති ..... ඉස්සාමච්ඡරියානි සෝතාපත්තිමග්ගෙන). නමුත් මෙහි දස්සනෙන පහාතබ්බා පදයේ ස්වරූපාර්ථ සඳහා සෝවාන් මාර්ගයෙන් අනවශේෂ වශයෙන් ප්‍රහාණය වන ධර්ම දැක්වීමේ දී ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච අත්හැර ඇත. අටුවාවෙහි අදහස ටීකාවල වැඩි දුරටත් විස්තර වේ.

සෝවාන් මාර්ගයෙන් කුක්කුච්චය ප්‍රහාණය වේ යැයි අටුවාවෙහි අදහස් කරනුයේ කුක්කුච්චපකත භාවය යි. සෝවාන් මාර්ග ඤාණයෙන් එම කුක්කුච්චපකත භාවය ප්‍රහාණය වූ පසු භික්ෂූන් වහන්සේලා කුක්කුච්චපකත තත්වයෙන් ආපත්තීන්වලට නො පැමිණෙති. අනාගාමී මාර්ගයෙන් කරන ලද අකුසලයන් සහ නොකරන ලද කුසලයන් ගැන විපිළිසර වීම යන කුක්කුච්චය දුරු වෙයි. තවත් ක්‍රමයකින් දැක්වුවහොත් සෝවාන් මාර්ගයෙන් ඖදාරික කුක්කුච්චය ප්‍රහාණය වේ. අනාගාමී මාර්යෙයන් සූක්ෂම වූ කුක්කුච්චය ප්‍රහාණය වේ. එම හේතුව නිසා දස්සනෙන පහාතබ්බා පදයේ ස්වරූපාර්ථවල දී කුක්කුච්චය අත්හරිනු ලැබේ. නමුත් භාවනාය පහාතබ්බා පදයේ ස්වරූපාර්ථවල ඇති අනාගාමී මාර්ගයෙන් අනවශේෂ වශයෙන් ප්‍රහාණය කරන ද්වේෂ මූල සිත් දෙක සහ තත්සම්ප්‍රයුක්ත චෛතසිකයන්හි ඉස්සා, මච්ඡරිය, කුක්කුච්චය ඇතුලත් වේ. (කතාකතාකුසලාකුසලවිසයං යං විප්පටිසාරභූතං කුක්කුච්චං, තං ඉධ තතියඤාණවජ්ඣං වුත්තං. යං පන කුක්කුච්චපකතතාය ආපත්තිමාපජ්ජතීති (පාචි. අට්ඨ. 438; කඞ්ඛා. අට්ඨ. නිදානවණ්ණනා) වුත්තං කුක්කුච්චං, තං සන්ධාය "කුක්කුච්චවිචිකිච්ඡා සොතාපත්තිමග්ගෙන පහීයන්තී"ති අට්ඨසාලිනියං වුත්තං. තස්මා ද්වින්නං වචනානං අධිප්පායො

වෙදිතබ්බො. අඤ්ඤෙසුපි එදිසෙසු ඨානෙසු අධිප්පායො මග්ගිතබ්බො, න විරොධතො පච්චෙතබ්බො. ඔළාරිකානවසෙසප්පහානං වා සන්ධාය කුක්කුච්චස්ස පඨමතතියඤාණවජ්ඣතා වුත්තාති වෙදිතබ්බං. - විසුද්ධිමග්ගමහාටීකා)

සෝවාන් මාර්ගයෙන් ඉස්සා, මච්ඡරිය චෛතසික ප්‍රහාණය වේ යැයි අටුවාවෙහි අදහස් කරනුයේ එම චෛතසික දෙකෙහි අපායගාමී ශක්තියෙහි දුරු වීම යි. (ඉස්සාමච්ඡරියානං අපායගමනීයතාය පඨමවජ්ඣා වුත්තා - දීඝනිකාය මහාවග්ගටීකා)

පටුන වෙත

09. දස්සනහේතු ත්‍රිකය

ප්‍රථම පදය - දස්සනෙන පහාතබ්බහෙතුකා ධම්මා, දෙවන පදය- භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා, තෙවන පදය - නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා

ස්වරූපාර්ථ වගුව

පදය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
		ස්	ආ	ධා	ස
ප	සෝ මාර්ග(ප්‍රහාණය කරන) දිට්ඨි සම්-4, විචි-1, විචි. සිතේ මෝහය හැර චෙ-22, (දෙස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ඡය, මාන, මොහය හැර) (තනුක කරන) අපායගාමිනී දිට්ඨි විප්-4, දෝ-2, චෙ-25 (දිට්ඨි,විචිකිච්ඡා හැර)	4	2	2	2
දු	(සක-තනුක කරන) ඔෞදාරික දිට්ඨි විප්-4, දෝ-2 (අනා-ප්‍රහාණය කරන) කාමරාග සං දිට්ඨි විප්-4, දෝ-2, චෙ-25(දිට්ඨි,විචිකිච්ඡා හැර) (අර්-ප්‍රහාණය කරන) රූප අරූප සං දිට්ඨි විප්-4, උද්-1, උද්. සිතේ මෝහය හැර චෙ -21(දිට්ඨි, විචිකිච්ඡා, දෙස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච හැර)	4	2	2	2
ත	කු-21, වි-36, ත්‍රි-20, මෝහ සිත් 02 මෝහය හැර චෙ-38, රූප 28, නිර්වාණය	5	12	18	3

දස්සනෙන පහාතබ්බහෙතුකා ධම්මා - දස්සනෙන - සෝතාපත්ති මාර්ගඥාන දර්ශනයෙන්, පහාතබ්බහෙතුකා ධම්මා - ප්‍රහාණය කටයුතු හේතු ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

පටුන වෙත

භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා - භාවනාය - සකාදාගාමී, අනාගාමී, අර්හත් නම් වූ මතු මාර්ගත්‍රයෙන්, පහාතබ්බහෙතුකා ධම්මා - ප්‍රහාණය කටයුතු හේතු ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නෙවදස්සනේන න භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා - දස්සනෙන - සෝතාපත්ති මාර්ගඥාන දර්ශනයෙන් ද, නෙව පහාතබ්බහෙතුකා - ප්‍රහාණය කටයුතු හේතු නැත්තා වූ ද, භාවනාය - මතු මාර්ගත්‍රයෙන්, න පහාතබ්බහෙතුකා ධම්මා - ප්‍රහාණය කටයුතු හේතු නැත්තා වූ ද නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[25]

---

25. **දස්සනෙන පහාතබ්බහෙතුකා** - (දස්සනෙන පහාතබ්බා හෙතු එතෙසන්'ති = දස්සනෙන පහාතබ්බහෙතුකා). සෝවාන් මාර්ගය මඟින් ප්‍රහාණය කළ යුතු වූ බව ද, සම්ප්‍රයුක්ත හේතු සහිත බව ද යන අංග ද්වයෙන් සම්පූර්ණ වන්නා වූ ධර්මතා 'දස්සනෙන පහාතබ්බහෙතුකා' නම් වේ.

භාවනාය පහාතබ්බහෙතුකා - මතු මාර්ග ත්‍රය මඟින් ප්‍රහාණය කළ යුතු වූ ඇති බව ද, සම්ප්‍රයුක්ත හේතු සහිත බව ද යන අංග ද්වයෙන් සම්පූර්ණ වන්නා වූ ධර්මතා 'භාවනාය පහාතබ්බහෙතුකා' නම් වේ.

නෙවදස්සනෙන න භාවනාය පහාතබ්බහෙතුකා - (නෙව දස්සනෙන පහාතබ්බා හෙතු එතෙසං අත්ථී'ති = නෙවදස්සනෙන පහාතබ්බහෙතුකා. නෙව දස්සනෙන පහාතබ්බා හෙතු එතෙසං අත්ථී'ති = න භාවනාය පහාතබ්බහෙතුකා. නෙව දස්සනෙන පහාතබ්බහෙතුකා ච තෙ න භාවනාය පහාතබ්බහෙතුකා චා'ති = නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බහෙතුකා. පෙර ඇති පහාතබ්බහෙතුක පදය ලොප් කරන්න) සෝවාන් මාර්ගය මඟින් ප්‍රහාණය කරන හේතු නැත්තා වූ ද (මෙම වචනයෙන් ප්‍රථම පදයට සම්බන්ධ ධර්මයන් ප්‍රතික්ෂේප කරයි) මතු මාර්ග ත්‍රය මඟින් ප්‍රහාණය කරන හේතු නැත්තා වූ ද (මෙම වචනයෙන් ද්විතීය පදයට සම්බන්ධ ධර්මතා ප්‍රතික්ෂේප කරයි) ධර්මතාවෝ "නෙවදස්සනෙන න භාවනාය පහාතබ්බහෙතුකා" නම් වේ. එමනිසා ප්‍රථම සහ ද්විතීය පදය සඳහා

දස්සනෙන පහාතබ්බහෙතුකා ධම්මා යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සෝතාපත්ති මාර්ගයෙන් නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කටයුතු වූ දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත ලෝභ මූල සිත් සතර ද විචිකිච්ඡා සහගත චිත්තය ද තත් සම්ප්‍රයුක්ත වූ මාන, දෝස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච හා විචිකිච්ඡා සහගත සිතෙහි මෝහය ද වර්ජිත වූ අවශේෂ චෛතසික දෙවිසිදෙන ද සෝතාපත්ති මාර්ගයෙන් තුනී කටයුතු වූ අපායගාමිනී ශක්තිය ඇති දෘෂ්ටිගත විප්‍රයුක්ත ලෝභ මූල සිත් සතර ද දෝස මූල සිත් දෙක ද දිට්ඨි, විචිකිච්ඡා වර්ජිත පස්විසි චෛතසිකයෝ ද ලැබෙන්නාහ.[26]

භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සකදාගාමී මාර්ගයෙන්

උද්ධරණය නොවන අවශේෂ වන ධර්මතා මෙම තෘතීය පදයාගේ ස්වරූපාර්ථ ලෙස ලැබේ.

26. විචිකිච්ඡා සහගත සිතෙහි මෝහය ද වර්ජිත වූ - "පහාතබ්බහෙතුකා ධම්මා - ප්‍රහාණය කටයුතු හේතු ඇත්තා වූ" යන්නෙහි හේතු සඳහා ස්වරූපාර්ථ ගැනීමේදී අකුසල සිත්හි යෙදෙන ලෝභ, ද්වේෂ, මෝහ යන හේතු ත්‍රය සැළකිය යුතු ය. සෝවාන් මාර්ගයෙන් නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කරන දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරෙහි හේතු දෙකක් ද, විචිකිච්ඡා සහගත සිතෙහි එක් හේතුවක් ද යෙදේ. දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සහ තත් සම්ප්‍රයුක්ත චෛතසිකයන් සමඟ ලෝභය සහ මෝහය යන හේතු දෙක යෙදෙන බැවින් ඒ ධර්මයන් "ලෝභය සහ මෝහය යන හේතු ඇත්තා වූ ධර්මයන්" වේ. එහිදී ලෝභය මෝහයටත්, මෝහය ලෝභයටත් හේතු භාවයෙන් ප්‍රත්‍යය වන බැවින් මෙම සිත් සතරෙහි ලෝභය සහ මෝහය "හේතු ඇත්තාවූ ධර්මයෝ" වෙත්. නමුත් විචිකිච්ඡා සිතෙහි මෝහය නම් එකම හේතුවක් පමණක් යෙදෙන බැවින් එම මෝහයට හේතු භාවයෙන් ප්‍රත්‍ය වන හේතුවක් නොමැත. මෝහය සෙසු ධර්මයන්ට හේතු ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේ. "විචිකිච්ඡා සහගත සිතෙහි මෝහය ද වර්ජිත" යනුවෙන් දැක්වෙන්නේ එබැවිනි.

තුනී කිරීම් වශයෙන් ප්‍රහාණය කටයුතු වූ ඕළාරික දෘෂ්ටිගත විප්‍රයුක්ත සිත් සතර ද දෝස මූල සිත් දෙක ද අනාගාමී මාර්ගයෙන් නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කටයුතු වූ කාමරාගයෙන් යුක්ත වූ දෘෂ්ටිගත විප්‍රයුක්ත සිත් සතර ද දෝස මූල සිත් දෙක ද තත් සම්ප්‍රයුක්ත පස්විසි චෛතසිකයෝ ද, අර්හත් මාර්ගයෙන් නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කටයුතු වූ රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිද්‍යාවන් සමඟ යෙදුණා වූ දෘෂ්ටිගත විප්‍රයුක්ත සිත් සතර ද උද්ධච්ච සහගත සිත ද උද්ධච්ච සහගත සිතෙහි මෝහය හා දිට්ඨි, විචිකිච්ඡා වර්ජිත එක්විසි චෛතසිකයෝ ද ලැබෙති. (ස්ථාන දෙකෙහි දී ම අකුසල සිත් 7, චෛතසික 25 වේ. දිට්ඨි සහ විචිකිච්ඡා හැර ස්කන්ධාදිය උදුරා දක්වන්න)[27]

නෙවදස්සනෙන න භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා යන තෘතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් කුසල් සිත් එක්විස්ස ද විපාක සිත් සතිස ද ක්‍රියා සිත් විස්ස ද තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද මෝහ මූල සිත් දෙකෙහි ඇති මෝහය ද රූප විසිඅට ද නිර්වාණය ද යන ධර්මයෝ ලැබෙන්නාහ.[28]

ස්වරූපාර්ථ - දස්සන ත්‍රිකයේ ස්වරූපාර්ථ සමඟ මෙය මඳක් වෙනස් වේ. ප්‍රථම පදය සම්බන්ධව විචිකිච්ඡා සහගත සිතෙහි ඇති මෝහය ඉවත් කෙරේ. චෛතසිකයන්ගේ ගණනය අඩු නො වේ. ද්විතීය පදය සම්බන්ධව ද උද්ධච්ච සිතෙහි මෝහය ඉවත් කෙරේ. චෛතසිකයන්ගේ ගණනය අඩු නො වේ. එක්විස්සක් ම වේ. එම විචිකිච්ඡා සහගත සහ උද්ධච්ච සහගත සිතෙහි ඇති මෝහය තෘතීය

---

27. **උද්ධච්ච සහගත සිතෙහි මෝහය වර්ජිත** - අර්හත් මාර්ගයෙන් ප්‍රහාණය කරන උද්ධච්ච සිතෙහි ද එක් හේතුවක් පමණක් යෙදෙන බැවින් ඉහත විචිකිච්ඡා සිතෙහි ක්‍රමයෙන් ම දත යුතු යි.

28. **මෝහ මූල සිත් දෙකෙහි ඇති මෝහය ද** - 'දස්සනෙන පහාතබ්බහෙතුකා ධම්මා' සහ 'භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා' පදවලින් අවශේෂ වන විචිකිච්ඡා සහගත සිතෙහි මෝහය ද උද්ධච්ච සහගත සිතෙහි මෝහය මෙයින් අදහස් වේ.

පටුන වෙත

පදය සඳහා ලැබේ. "මෝහ මූල සිත් දෙකෙහි ඇති මෝහය" යනුවෙන් චෛතසික 38න් පසුව ඇතුළත් කර ඇත. මෙපමණක් ම විශේෂ වේ.

10. ආචයගාමී ත්‍රිකය

ප්‍රථම පදය - ආචයගාමිනො ධම්මා, දෙවන පදය - අපචයගාමිනො ධම්මා, තෙවන පදය - නෙවාචයගාමිනො නාපචයගාමිනො ධම්මා

ස්වරූපාර්ථ වගුව

පදය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
		ස්	ආ	ධා	ස
ප	අකු-12, ලොකු-17, චෙ-52	4	2	2	2
දු	මාර්ග-4, චෙ-36	4	2	2	1
ත	වි-36, ක්‍රි-20, චෙ-38, රූ28, නි	5	12	18	2

ආචයගාමිනො ධම්මා - කර්ම ක්ලේශ විසින් රැස් කරනු ලබන්නා වූ ද චුති ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති වශයෙන් විපාක ගෙන දෙන්නා වූ ද නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අපචයගාමිනො ධම්මා - ලෝකෝත්තර නිර්වාණය ගෙන දෙන්නා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නෙවාචය නාපචයගාමිනො ධම්මා - නේවාචයගාමිනො - කර්ම ක්ලේශ විසින් රැස් කරනු නොලබන්නා වූ ද චුති, ප්‍රතිසන්ධි, ප්‍රවෘත්ති වශයෙන් විපාක නොගෙන දෙන්නා වූ ද, න අපචයගාමිනෝ ධම්මා - නිර්වාණය නොගෙන දෙන්නා වූ ද නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[29]

---

29. **ආචය** - (ආචයතී'ති = ආචයො). කර්ම ක්ලේශයන් විසින් රැස් කරවන ලද බැවින් ද උපදවන ලද බැවින් ද ප්‍රතිසන්ධි, චුති, ගති යන ලෞකික විපාක නාම ස්කන්ධ ධර්මයෝ 'ආචය' නම් වෙති. (විපාක චිත්තයන්ගේ ප්‍රතිසන්ධි වශයෙන් පැවතීම, ප්‍රතිසන්ධියෙන් අනතුරුව ප්‍රථම භවාංග පටන් වීථි චිත්තයන්ගේ අන්තරයෙහි අඛණ්ඩව

පහළවීම, අවසානයේ දී චුති වශයෙන් පැවතීම ආදිය 'රැස් කිරීම' යැයි කියනු ලබයි.)

චුතියෙන් අනතුරුව පැමිණෙන භවය 'ගති' යැයි කියනු ලැබේ. එම භවයෙහි දී ද (ගති) විපාක ධර්මයෝ ප්‍රතිසන්ධියේ පටන් ආරම්භ වී අඛණ්ඩව පහළ වන්නේය. මෙසේ අඛණ්ඩව පහළ වන ස්වභාව හේතුවෙන් ප්‍රතිසන්ධි, චුති, ගති යන ලෞකික විපාක නාම ස්කන්ධයෝ 'පවත්ති' (ප්‍රවෘත්ති) යැයි කියති.

එම සියලු ධර්මයෝ කර්ම, ක්ලේශ මගින් රැස් කරන ලද විපාක ධර්මයන් වන බැවින් "ආචය" යැයි කියනු ලබයි.

ආචයගාමිනො - (ගච්ඡතී'ති = ගාමිනො, ආචයං ගාමිනො = ආචය ගාමිනො) ප්‍රතිසන්ධි, චුති, ගති යන ලෞකික විපාක නාමස්කන්ධයෝ යැයි කියන ලද 'ආචයට' (එම විපාක නාම ස්කන්ධ නම් වූ ඵලය ඇති කරවීම් වශයෙන්) පැමිණෙන ස්වභාවය ඇති බැවින් ලෞකික කුශලාකුශලයෝ 'ආචයගාමී' යැයි කියනු ලබයි.

"ආචයගාමිනො - කර්ම ක්ලේශ විසින් රැස් කරනු ලැබෙන්නා වූ ද චුති, ප්‍රතිසන්ධි, ප්‍රවෘත්ති වශයෙන් විපාක ගෙන දෙන්නා වූ" යැයි අර්ථ දැක්වීම සුදුසු වේ.

දෙවන නය - (ගමෙන්ති'ති = ගාමිනො, ආචයං ගාමිනො = ආචයගාමිනො) යමෙකුගේ සන්තානයෙහි පැවතුණහොත් ඒ සත්ත්වයා චුති, ප්‍රතිසන්ධි ගති යැයි කියනු ලබන "ආචය"ට පමුණුවන බැවින් ද ලෞකික කුශලාකුශලයෝ 'ආචයගාමී' වේ.

මෙම නය ක්‍රමයෙහි අදහසට අනුව "ආචයගාමිනො - කර්ම ක්ලේශ විසින් රැස් කරනු ලබන්නා වූ චුති, ප්‍රතිසන්ධි ගති යන 'ආචයට' පමුණුවන ස්වභාවය ඇති" යැයි අර්ථ දැක්වීම සුදුසු වේ.

චය - 'චය' ශබ්දය 'ආචය' ශබ්දය සමඟ සමාන වේ. "ආ" උපසර්ගය පමණක් විශේෂ වේ. (චීයතෙ'ති = චයො) කර්ම ක්ලේශයන් රැස් කරන ලද ප්‍රතිසන්ධි, චුති, ගති (ලෞකික විපාක නාම ස්කන්ධ) 'චය' යැයි කියනු ලබයි.

ආචයගාමිනො ධම්මා යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් දොළොස ද ලෞකික කුසල් සිත් සතළොස ද තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපනස ද ලැබෙන්නේය.

අපචයගාමිනො ධම්මා යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සතර මාර්ග චිත්තය ද තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද ලැබෙන්නේය.

නේවාචයගාමිනො න අපචයගාමිනො ධම්මා යන තෘතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් විපාක සිත් සතිස ද ක්‍රියා සිත් විස්ස ද තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද අටවිසි රූපය ද නිර්වාණය ද ලැබෙන්නේය.

අපචය - (අපෙතං චයා = අපචයං). නිර්වාණය වනාහි කර්ම ක්ලේශයන් මගින් රැස් කරවන ලද, පවත්වන ලද ප්‍රතිසන්ධි, චුති, ගතීන්ගෙන් බැහැර කරයි. එම නිසා 'අපචය' යැයි නාමය ලබයි.

අපචයගාමී - ආර්ය මාර්ගයෝ කර්ම ක්ලේශයන් රැස්කරවන ලද, පවත්වන ලද ප්‍රතිසන්ධි, චුති, ගතීන්ගෙන් බැහැර ඇති නිර්වාණයට අරමුණු කිරීම් වශයෙන් පමුණුවයි. එමනිසා 'අපචයගාමී' යැයි නාමය ලැබේ.

මෙහි දී ද "කර්ම ක්ලේශයන් රැස් කරවන ලද ප්‍රතිසන්ධි, චුති, ගතීන්ගෙන් බැහැරව ඇති නිර්වාණය ම අරමුණු කිරීම් වශයෙන් පමුණුවන්නා වූ" යැයි අර්ථ දැක්වීම සුදුසු වේ. අටුවාවෙහි තවත් නය ක්‍රමවලින් විවරණය කර ඇත.

11. සෙක්ඛ ත්‍රිකය

ප්‍රථම පදය - සෙක්ඛා ධම්මා, දෙවන පදය - අසෙක්ඛා ධම්මා, තෙවන පදය - නෙව සෙක්ඛා නාසෙක්ඛා ධම්මා

ස්වරූපාර්ථ වගුව

පදය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
		ස්	ආ	ධා	ස
ප	(අර්හත් ඵලය හැර) ලොකෝත්තර සිත් 7, චෛ 36	4	2	2	1
දු	අර්හත් ඵල සිත්-1, චෛ-36	4	2	2	-
ත	ලෞකික සිත් 81, චෛ-52, රූප-28, නිර්වාණය	5	12	18	3

සෙක්ඛා ධම්මා - ත්‍රිවිධ ශික්ෂාවෙහි හික්මෙන්නා වූ සප්ත ශෛක්ෂයන්ට අයත් වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අසෙක්ඛා ධම්මා - අශෛක්ෂ වූ ක්ෂීණාශ්‍රවයන්ට අයත් වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නේවසෙක්ඛා නාසෙක්ඛාධම්මා - සප්ත ශෛක්ෂයන්ට ද අයත් නො වූ අශෛක්ෂ ක්ෂීණාශ්‍රවයන්ට ද අයත් නො වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[30]

---

30. **සික්ඛා** - (සික්ඛිතබ්බා'ති = සික්ඛායො). සීල, සමාධි, ප්‍රඥාවෝ හික්මීමට සුදුසු ධර්මයෝ වෙත්. එමනිසා "සික්ඛා" යැයි නම ලැබේ.

සෙක්ඛා පදය ක්‍රම තුනකට අර්ථ දක්වා ඇත.

1. **සෙක්ඛා** - (තීසු සික්ඛාසු ජාතා'ති = සෙක්ඛා). ශික්ෂාත්‍රයෙහි පවතින ධර්මයෝ 'සෙක්ඛ' නම් වේ. 'පවතින' යැයි කියන කල්හි 'ඇතුළත් වන' යන අර්ථය ඇත. අධිප්‍රඥා ශික්ෂාවෙහි සම්මා දිට්ඨි, සම්මා

සංකප්ප යන මාර්ගාංග ඇතුළත් වේ. අධිසීල ශික්ෂාවෙහි සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා සංකප්ප, සම්මා ආජීව යන මාර්ගාංග ඇතුළත් වේ. අධිචිත්ත ශික්ෂාවෙහි සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන මාර්ගාංග ඇතුළත් වේ. මෙසේ වෙන් වෙන්ව ඇතුලත් වීම හේතුවෙන් ඒ මාර්ගාංග ධර්ම අට සමඟ යෙදෙන මාර්ග චිත්තෝත්පාදයෝ ද පහළ ඵල ත්‍රයෙහි චිත්තුප්පාදයෝ ද එම ශික්ෂා ත්‍රයෙහි ඇතුළත් වෙති. (අර්හත් ඵලය ඇතුලත් නොවීමට හේතුව අසෙක්ඛා පදයේ පැහැදිලි කිරීමෙහි දී පැමිණේ.) මෙම ප්‍රථම නය ක්‍රමය සඳහා "සෙක්ඛා - ශික්ෂාත්‍රයෙහි ඇත්තා වූ" යැයි අර්ථ දෙනු ලැබේ.

2. දෙවන ක්‍රමය - (සික්ඛනං සීලං එතෙසන්'ති = සෙක්ඛා. සත්තන්නං සෙක්ඛානං එතෙති'පි = සික්ඛා). සප්ත ශෛක්ෂ පුද්ගලයන්ට අයත් බැවින් 'සෙක්ඛ' නම් වේ. සතර මාර්ග සහ සෝවාන්, සකදාගාමී, අනාගාමී ඵල සිත් තුන ලැබූ ශෛක්ෂ පුද්ගලෙයෝ තවමත් ශික්ෂාවේ පරිපූර්ණත්වයට පැමිණ නොමැති බැවින් හික්මෙත්. එම සතර මාර්ග, පහළ ඵල සිත් තුන ශෛක්ෂ පුද්ගලයන්ට විශේෂිත වස්තුහු වෙත්. මෙම දෙවන නය ක්‍රමය සඳහා "ත්‍රිවිධ ශික්ෂාවෙහි හික්මෙන්නා වූ ශෛක්ෂයන්ට අයත් වූ" යැයි අර්ථ දී ඇත.

3. තෙවන ක්‍රමය - (සික්ඛා සීලං එතෙසං'ති = සෙක්ඛා. අපරියොසිතසික්ඛත්තා සයමෙව සික්ඛන්තී'ති'පි = සෙක්ඛා). තවමත් ශික්ෂාව පරිපූර්ණය නොකරන ලද බැවින් ශෛක්ෂ පුද්ගලයෝ සත්දෙන තමන් වහන්සේලා ම ත්‍රිශික්ෂාවෙහි හික්මෙති. එම නිසා එම ශෛක්ෂ පුද්ගලයන් සත්දෙනාට 'සෙක්ඛ' යැයි කියනු ලැබේ. මෙම තෘතීය නය ක්‍රමයේ අදහසට අනුව "සෙක්ඛා - තමා විසින් පුහුණු කරන්නා වූ" යැයි අර්ථ දක්වා ඇත.

අසෙක්ඛා - ඉහත 'සෙක්ඛා' පදයේ "සෙක්ඛා - ශික්ෂාත්‍රයෙහි ඇත්තා වූ" යන වචනාර්ථය සැළකූ විට ඒ ත්‍රිශික්ෂාවන්හි ඇත්තා වූ අර්හත් ඵල ශික්ෂාවෙන් පරිපූර්ණ වූ රහතන් වහන්සේ සෙසු ශෛක්ෂයන් මෙන් ශෛක්ෂ භාවයෙන් සැළකිය යුතු වේ ද නො වේ ද යන සංශය මතු වේ. තව ද "ත්‍රිවිධ ශික්ෂාවෙහි හික්මෙන්නා වූ ශෛක්ෂයන්ට අයත්

වූ" යන වචනාර්ථය ද "සෙක්ඛා - තමා විසින් පුහුණු කරන්නා වූ" යන වචනාර්ථය ද සැළකූ විට, අර්හත් ඵලය සඳහා ද 'සෙක්ඛා' යැයි කීමට සුදුසු වේ ද නො වේ ද යන සංශයක් ඇත. නමුත් අර්හත් අර්හත් ඵලය 'සෙක්ඛා' යන්නට ඇතුලත් නොවී සතර මාර්ග සහ පහළ ඵල සිත් තුන පමණක් පැමිණෙන බව දැක්වීම සඳහා "අසෙක්ඛා (න + සෙක්ඛා)" යනුවෙන් ප්‍රතිශේධ කරමින් වදළ සේක. (යත්ථ ආසඞ්කා තත්ථ පටිසෙධො කාතබ්බො - යම් තැනක සංශයක් වේ ද එහි ('න-අ' යන) ප්‍රතිෂේධයන් කළ යුතු වේ. මෙය පරිභාෂා සූත්‍රයකි).

අර්හත් ඵලයෙහි පවතින්නා වූ ශික්ෂාව ශික්ෂාව නිම කරන ලද බැවින් ශික්ෂා කෘත්‍යයක් සිදු නො කරයි. හුදෙක් ශික්ෂාවේ ඵල භාවයෙන් සිටියි. එබැවින් "සික්ඛා" යන වචනය අර්හත් ඵලය සඳහා ව්‍යවහාර කිරීමට සුදුසු නොවේ. අර්හත් ඵලයෙන් සමන්වාගත වූ රහතන් වහන්සේට ද "සෙක්ඛ" යන වචනය ව්‍යවහාර කිරීමට සුදුසු නොවේ. අර්හත් ඵල ශික්ෂාව සමඟ සම්ප්‍රයුක්ත වන ධර්ම ද හික්මෙන්නා වූ ස්වභාවය ඇත්තේ නො වෙයි. එබැවින් අර්හත් ඵලය ශෛක්ෂ ධර්ම නො වේ. පහළ ඵල සිත් තුනෙහි ඇති ශික්ෂාව මතු සකදාගාමී මාර්ගයට, විදර්ශනාවට ආදීයට උපනිශ්‍රය වන බැවින් "සික්ඛා" යැයි කීමට සුදුසු ය. එයින් සමන්වාගත ආර්යයන් වහන්සේලාට "සෙක්ඛ" යැයි ව්‍යවහාර කිරීමට සුදුසු වේ. එම ධර්ම සමඟ සම්ප්‍රයුක්ත ධර්ම ද හික්මෙන්නා වූ ස්වභාවය ඇත්තේ වෙයි. එබැවින් ශෛක්ෂ ධර්ම වේ. මේ "අසෙක්ඛා" පදයේ නකාරයේ ඇති ප්‍රතිෂේධ අර්ථය යි.

දෙවන ක්‍රමය - (වුඩ්ඪිප්පත්තා වා සෙක්ඛා'ති'පි අසෙක්ඛා). වෘද්ධියට පැමිණ අවසන් වූ ධර්මයෝ 'අසෙක්ඛ' නම් වේ. "න" ශබ්දයේ වෘද්ධි අර්ථයෙහි යෙදේ. මනුෂ්‍ය ජීවිතයක ම වැඩිය යුතු උපරිමට වයසට පැමිණීම වයෝවෘද්ධ යැයි කියනු ලැබේ. එමෙන් සෙක්ඛ ධර්ම සත අතරින් ද වෘද්ධතමයා වන අර්හත් මාර්ගයට "අසෙක්ඛ" යැයි කියනු ලැබේ. එසේ වුව ද අර්හත් මාර්ගය සහ ධ්‍යානංගයන්ගේ යෙදීම ආදියෙන් සමාන වන බැවින් සදිසූපචාර වශයෙන් අර්හත් ඵලයට ම "අසෙක්ඛ" යැයි කියනු ලැබේ.

සෙක්ඛා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අර්හත් ඵල සිත වර්ජිත ලෝකෝත්තර සිත් සත ද තත් සම්ප්‍රයුක්ත වූ චෛතසික සතිස ද ලැබෙන්නේය.

අසෙක්ඛා ධම්මා යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අර්හත් ඵලචිත්තය ද තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද ලැබෙන්නේය.

නේවසෙක්ඛා නාසෙක්ඛා ධම්මා යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක්අසූව ද චෛතසික දෙපනස ද රූප අටවිස්ස ද නිර්වාණය ද ලැබෙන්නේය.

නිවැරදි ය - අර්හත් මාර්ගය සහ අර්හත් ඵලය අතරින් අර්හත් මාර්ගය පරිඥඥේඥ ආදි කෘත්‍ය සිදු කරයි. අර්හත් ඵලය විපාක ගෙන දෙන්නා වූ විපාක ධර්මයක් වීම පමණක් විශේෂ වේ. ධ්‍යානාංග ආදිය යෙදීම ප්‍රථම ධ්‍යාන අර්හත් මාර්ගය, ප්‍රථම ධ්‍යාන අර්හත් ඵලය ආදිය වශයෙන් සංසන්දනය කළ කල්හි විශේෂයක් නොමැත. මේ අනුව අර්හත් මාර්ගය සහ අර්හත් ඵලය අසෙක්ඛ භාවයෙන් සමාන වීම නිසා සදිසූපචාර නයෙන් අර්හත් ඵලය පමණක් "අසෙක්ඛ" යැයි කියනු ලැබේ.

12. පරිත්ත ත්‍රිකය

ප්‍රථම පදය - පරිත්තා ධම්මා, දෙවන පදය - මහග්ගතා ධම්මා, තෙවන පදය - අප්පමාණා ධම්මා

ස්වරූපාර්ථ වගුව

පදය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
		ස්	ආ	ධා	ස
ප	කාමසිත්-54, චෛ-52, රූප	5	12	18	2
දු	මහද්ගත සිත්-27, චෛ-35 (විරති හැර)	4	2	2	1
ත	ලෝකෝත්තර සිත්-8, චෛ-36, නිර්වාණය	4	2	2	2

පරිත්තා ධම්මා - අල්පානුභාව ඇති බැවින් පරිත්ත නම් වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

මහග්ගතා ධම්මා - මහත් බවට පැමිණි බැවින් ධ්‍යානලාභීන්ට අයත් නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අප්පමාණා ධම්මා - රාගාදී කෙලෙසුන්ගෙන් තොර බැවින් ප්‍රමාණ කළ නොහැකි ගුණ ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[31]

---

31. **පරිත්ත** - (ආදීයතෙ ඛණ්ඩීයතෙ'ති = අත්තං, සමන්තතො අත්තං = පරිත්තං). කුඩා වූ වස්තුවක් පිරිසිඳ දැක්විය නොහැකි දෙයක් නො වේ. එම වස්තුවේ හාත්පසින් ද බාහිරින් ද පිරිසිඳිය හැකි වේ. එම නිසා 'පරිත්ත' යන නම ලැබේ.

(පරිත්තං වියා'ති = පරිත්තා). කාමාවචර ධර්මයෝ මහද්ගත ධර්මයන් ක්ලේශයන් යටපත් කිරීමට සමර්ථ නො වෙති, මහත් වූ විපාක දීමට සමත් නො වෙති. තව ද (ධ්‍යාන සමාපත්ති මෙන්) දීර්ඝ කාලයක්

නො පැවතීම නිසා අල්පානුභාව ඇති බැවින් ස්වල්ප වන්නා වූ වස්තූන් සමඟ සමාන වේ. එම නිසා 'පරිත්ත' යන නාමය ලැබී ඇත.

"පරිත්තා - ස්වල්පානුභාව ඇති බව හේතුවෙන් හාත්පසින් පිරිසිදීම් ඇති වස්තූන් හා සමඟ සමාන වන" යැයි අර්ථ දැක්වීම සුදුසු වේ.

මහග්ගත - (මහත්තං ගතා'ති = මහග්ගතා). රූප, අරූප ධර්මයෝ ක්ලේශයන් යටපත් කරන බව, මහත් වූ විපාක දීමට සමත් වීම, දීර්ඝ කාලයක් පැවතීම හේතුවෙන් මහත්භාවයට පැමිණි ධර්මයෝ වෙත්. එමනිසා 'මහග්ගත' යන නාමය ලබයි.

දෙවන ක්‍රමය - (මහන්තෙහි ගතා = මහග්ගතා). එම රූපාවචර අරූපාවචර ධර්මයෝ මහත් වූ ඡන්ද, චිත්ත, විරිය, වීමංසා යන ඍද්ධිපාදයන්ගෙන් පරිපූර්ණ පුද්ගලයන් විසින් පැමිණෙන, ලබාගන්නා ධර්මයන් නිසා 'මහග්ගත' නම් වේ.

පමාණ - (පමිණන්තී'ති = පමාණා). රාගාදී ධර්මයන් මගින් 'මෙම පුද්ගලයා ගුණ වශයෙන් මෙපමණකි' යැයි සංසන්දනය කිරීමට, මැනීමට හැකි වේ. එම නිසා 'පමාණ' නම් වේ.

උදාහරණයක් ලෙස 'තමා රහතන් වහන්සේ කෙනෙක් ය' යැයි සිතන්නා වූ පුද්ගලයෙකුට විසභාග අරමුණක් එළඹි විට රාගය පහළ වූ කල්හි එම රාගය විසින් "නුඹ අර්හත්වය ලබාගෙන නොමැත, පෘථග්ජනයෙකි" ආදි වශයෙන් ස්වකීය තත්ත්වය මැන දක්වන්නාක් මෙන් කටයුතු කරයි. ද්වේෂ ආදිය සමඟ ද මෙම ක්‍රමය අනුව සලකනු. එම නිසා "රාගාදී ධර්මතාවන්ගෙන් මෙම පුද්ගලයා -පෙ- 'පමාණ' නම් වේ" යැයි ප්‍රකාශ කළ හැක.

අප්පමාණ - (නත්ථි පමාණං එතෙසන්'ති = අප්පමාණා) රාගාදී ධර්මයන්ට අරමුණු කිරීම් වශයෙන් ලෝකෝත්තර ධර්මයන් අරමුණු කළ නොහැක. සංසන්දනය කළ නොහැක. එමනිසා ලෝකෝත්තර ධර්මයෝ 'අප්පමාණ' යන නම ලබති. ("අ" ශබ්දය අභාව අර්ථය ප්‍රකාශ කරයි).

පටුන වෙත

පරිත්තා ධම්මා යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් කාමාවචර සිත් සිවුපනස ද තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපනස ද අටවිසි රූපය ද ලැබෙන්නේය.

මහග්ගතා ධම්මා යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් මහග්ගත සිත් සත්විස්ස ද තත් සම්ප්‍රයුක්ත චෛතසික පන්තිස ද ලැබෙන්නේය.

අප්පමාණා ධම්මා යන තෘතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අටදෙනා ද තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද නිර්වාණය ද ලැබෙන්නේය.

දෙවන ක්‍රමය (න පමාණා = අප්පමාණා). ලෝකෝත්තර ධර්මතාවෝ 'පමාණ' යන නම ලබන රාගාදීන්ගේ ප්‍රතිවිරුද්ධ පක්ෂයෙහි වෙති. එමනිසා ද "අප්පමාණ" යන නම ලබත්. ('අ' ශබ්දය විරුද්ධාර්ථය ප්‍රකාශ කරයි). ටීකාවෙහි අටුවාවේ එන ක්‍රමයට වෙනස් ආකාරයකින් විවරණය කර ඇත.

13. පරිත්තාරම්මණ ත්‍රිකය

ප්‍රථම පදය - පරිත්තාරම්මණා ධම්මා, දෙවන පදය - මහග්ගතාරම්මණා ධම්මා, තෙවන පදය - අප්පමාණාරම්මණා ධම්මා

ස්වරූපාර්ථ වගුව

පදය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
		ස්	ආ	ධා	ස
ප	(ඒකාන්ත) ද්වි-10, මනොද්වාර-3, සන්-3, මහා වි-8, හසි-1, චෙ-33(විරති-3, අප්‍රමාණ්‍ය-2 හැර) (අනෙකාන්ත) අකු-12, මනොද්වාරාවජ්ජනය, මහාකු-8,ක්‍රි-8, අභිඤ්ඤා-02. චෙ-50 (අප්‍රමාණ්‍ය හැර)	4	2	8	2
දු	(ඒකාන්ත) විඤ්ඤා-3, නෙවස-3, චෙ-30 (අනෙකාන්ත) අකු-12, මනෝද්වාරාවජ්ජනය, මහාකු-8, ක්‍රි-8, අභිඤ්ඤා-02, චෙ-47(විරති, අප්‍රමාණ්‍ය හැර)	4	2	2	2
ත	(ඒකාන්ත) ලෝකෝත්තර-8, චෙ-36 (අප්‍රමාණ්‍ය හැර) (අනෙකාන්ත) මනෝද්වාරාවජ්ජනය, ඤාසංමහාකු-4, ඤාසං ක්‍රියා-4, අභිඤ්ඤා-02. චෙ-33	4	2	2	2
මුක්ත	ප්‍රඥප්තිය ඒකාන්තව අරමුණු කරන සිත් -21, චෙ-35, අනේකාන්ත-31, රූප -28, නිර්වාණය				

පටුන වෙත

පරිත්තාරම්මණා ධම්මා - පරිත්ත ධර්මයෝ ම අරමුණු කිරීම් ඇත්තා වූ, නොහොත් - පරිත්ත ධර්මයෝ අරමුණු කරන්නා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ. **මහග්ගතාරම්මණා ධම්මා** - මහග්ගත ධර්මයෝ ම අරමුණු කිරීම් ඇත්තාවූ, නොහොත් - මහග්ගත ධර්මයෝ අරමුණු කරන්නා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අප්පමාණාරම්මණා ධම්මා - අප්පමාණ ධර්මයෝ ම අරමුණු කිරීම් ඇත්තාවූ, නොහොත් - අප්පමාණ ධර්මයෝ අරමුණු කරන්නා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

පරිත්තාරම්මණා ධම්මා යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් කාම ධර්මයන් (පරිත්ත ධර්මයන්) ඒකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ ද්විපඤ්ච විඤ්ඤාණ සිත් දසය ද මනෝධාතු ත්‍රය ද සන්තීරණ ත්‍රය ද මහාවිපාක සිත් අට ද හසිතුප්පාදය ද තත් සම්ප්‍රයුක්ත චෛතසික තෙතිස ද කාම ධර්මයන් (පරිත්ත ධර්මයන්) අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ අකුසල සිත් දොළොස ද මනෝද්වාරාවජ්ජනය ද සන්තීරණ ත්‍රය ද මහාකුසල සිත් අට ද මහාක්‍රියා සිත් අට ද අභිඥා කෘත්‍යවත් පඤ්චමධ්‍යාන සිත් දෙක ද තත් සම්ප්‍රයුක්ත අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික සමපනස ද ලැබෙන්නේය.[32] (පරිත්තාරම්මණ සිත් 56, චෛතසික පනස ගෙන ස්කන්ධාදිය උදුරා දක්වන්න.)

---

32. විශේෂයෙන් දත යුතු - සෑම විටක දී ම අරමුණු කරන සිත් "ඒකාන්ත වශයෙන් අරමුණ කරන" යනුවෙන් ද ඒකාන්තයෙන් අරමුණු නොකරන සිත් "අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ" යනුවෙන් ද දැක්විණි. අප්‍රමාණ්‍ය චෛතසිකයෝ සත්ව ප්‍රඥප්තිය ම අරමුණු කරයි. කාම ධර්මයන් අරමුණු නො කරයි. මෙසේ අරමුණු නානත්වයෙන් අප්‍රමාණ්‍ය චෛතසික ප්‍රථම පදයෙන් ඉවත් වේ. ඒකාන්ත සිත් 25, අනේකාන්ත සිත් 31 වශයෙන් පරිත්තාරම්මණ සිත් 56ක් ඇත. කාමාවචර සිත් 54 අභිඤ්ඤා සිත් දෙක වේ.

මහග්ගතාරම්මණා ධම්මා යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් මහග්ගත ධර්මයන් ඒකාන්තයෙන් අරමුණු කරන්නා වූ විඤ්ඤාණඤ්චායතන සිත් තුන ද නේවසඤ්ඤානාසඤ්ඤායතන සිත් තුන ද තත් සම්ප්‍රයුක්ත සමතිස් චෛතසික ද මහග්ගත ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ අකුසල සිත් දොළොස ද මනෝද්වාරාවජ්ජනය ද මහාකුසල සිත් අට ද මහාක්‍රියා සිත් අට ද අභිඥා කෘත්‍යවත් පඤ්චමධ්‍යාන සිත් දෙක ද තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික සත්සාළිස ද ලැබෙන්නේය. (ඒකන්ත-6, අනේකාන්ත-31 වශයෙන් මහග්ගතාරම්මණ සිත් 37ක් වේ. චෛතසික 47කි. ස්කන්ධාදිය උඳුරා දක්වන්න)[33]

අප්පමාණාරම්මණා ධම්මා යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අප්‍රමාණ ධර්මයන් ඒකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ ලෝකෝත්තර සිත් අටදෙනා ද තත් සම්ප්‍රයුක්ත වූ චෛතසික සතිස ද ලෝකෝත්තර ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ මහාකුසල මහාක්‍රියා ඤාණසම්ප්‍රයුක්ත සිත් අටදෙන ද මනෝද්වාරාවජ්ජනය ද අභිඥා දෙසිත ද තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය වර්ජිත තෙතිස් චෛතසිකයෝ ද ලැබෙන්නාහ.

---

33. විරති අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික සත්සාළිස - ලෞකික විරතිය ව්‍යතික්‍රමණයට සුදුසු වස්තුවක් එළඹි කල්හි එයින් විරමණය වන අවස්ථාවල දී යෙදේ. ලෞකික විරතිය ව්‍යතික්‍රමණය කළයුතු වස්තුව වන ප්‍රත්‍යුත්පන්න වන්නා වූ කාමාවචර සිත්, චෛතසික සහ රූප ධර්මයන් ම අරමුණු කරයි. එම නිසා ලෞකික විරති සහ අප්‍රමාණ්‍ය චෛතසිකයන් යන දෙවර්ගයට ම මහද්ගත ධර්මයන් අරමුණු කළ නොහැක. එමනිසා ද්විතීය පදයෙහි විරති අප්‍රමාණ්‍ය හැර ස්වරූපාර්ථ ලැබේ.

පටුන වෙත

(ඒකන්ත-8, අනේකාන්ත-11 වශයෙන් අප්පමාණාරම්මණ සිත් 19ක් වේ. චෛතසික 36කි. ස්කන්ධාදිය උදුරා දක්වන්න)[34]

ත්‍රිකමුක්ත ධර්ම - ප්‍රඥප්ති ධර්මයන් ඒකාන්ත වශයෙන් අරමුණු කරන ආකාසානඤ්චායතන සිත් 03, ආකිඤ්චඤ්ඤායතන සිත් 03, අභිඥා සිත් 02 හැර රූපාවචර සිත් 15, තත් සම්ප්‍රයුක්ත චෛතසික 35, ප්‍රඥප්ති ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන අකුසල සිත් 12, මනෝද්වාරාවජ්ජනය, මහකුසල් සිත් 08, මහාක්‍රියා සිත් 08, අභිඥා සිත් 02, තත් සම්ප්‍රයුක්ත විරති හැර චෛතසික 49, රූප 28, නිර්වාණය යැයි කියන ලද සෙසු පරමාර්ථ ධර්මයන් ඇති බැවින් සප්‍රදේශ ත්‍රිකයකි.[35]

---

34. **චෛතසිකයන් සළකන ආකාරය** - තෘතීය පදයෙහි අනේකාන්ත සිත් සඳහා ස්වරූපාර්ථ ගැනීමේදී විරති අප්‍රමාණ්‍ය දෙවර්ගය ම අත්හැරිය යුතුය. කවර හෙයින් අප්‍රමාණ්‍ය නොගන්නා ලද්දේ ද යත්, ඉහතින් කියූ ආකාරයට ලෞකික විරතිය කාමාවචර ධර්මයන් ම අරමුණු කරන අතර අප්‍රමාණ්‍ය චෛතසිකයන් විසින් සත්ව ප්‍රඥප්තිය ම අරමුණු කරන හෙයිනි.

35. **ත්‍රිකමුක්ත ධර්ම** - සිත් 89, චෛතසික 52, රූප 28, නිර්වාණය, ප්‍රඥප්ති යන මෙම ධර්මයන්ට ෂඩ්ආරම්මණ යැයි කියනු ලැබේ. මෙම ෂඩ්ආරම්මණයන් කාම, මහද්ගත, අප්‍රමාණ්‍ය, ප්‍රඥප්ති යනුවෙන් සතර ආකාරයකට බෙදේ. මෙම ත්‍රික පදයන්ගේ ස්වරූපාර්ථයන්හි 'ඒකාන්ත ප්‍රඥප්ති ආරම්මණ සහ අනේකාන්ත ප්‍රඥප්ති ආරම්මණ' ඇතුළත් නො වී ත්‍රික මුක්ත ධර්මයන් බවට පත් වේ. එමනිසා ඒ ඒකාන්ත අනේකාන්ත ප්‍රඥප්ති සිත් සහ අනාරම්මණ වන රූප, නිර්වාණය යන ධර්මයන් ත්‍රික මුක්ත ලෙස උද්ධරණය කරන ලදී.

'අභිඥා සිත් 02 හැර රූපාවචර සිත් 15' යැයි ප්‍රකාශ කරන තැන අභිඥා තත්ත්වයට නොපැමිණි (අභිඥා කෘත්‍යය නොසිදුකරන) රූපාවචර ධ්‍යානයෝ ද ඇති නිසා අභිඥා චිත්තයන් අත්හරින්නේ නමුදු සිත් ගණනයේ දී මෙම සිත් නො අත්හරිනු ලබයි.

14. හීන ත්‍රිකය

ප්‍රථම පදය - හීනා ධම්මා, දෙවන පදය - මජ්ඣිමා ධම්මා, තෙවන පදය - පණීතා ධම්මා

ස්වරූපාර්ථ වගුව

පදය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
		ස්	ආ	ධා	ස
ප	අකු-12, චෙ-27	4	2	2	2
දු	ලෞකු-17, ලෞවි-32, ක්‍රි-20, චෙ-52, රූ-28	5	12	18	1
ත	ලෝකෝත්තර-8, චෙ-36, නි	4	2	2	2

හීනා ධම්මා - ලාමක වූ නින්දිත අකුසල නම් වූ නිස්සත්තව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

මජ්ඣිමා ධම්මා - හීන ද නො වූ ප්‍රණීත ද නො වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

පණීතා ධම්මා - උත්තමාර්ථයෙන් ප්‍රණීත නම් වූ නිස්සත්ව

ත්‍රිකයන්ට ඇතුළත් වන්නා වූ ද, ත්‍රික මුක්ත වන්නා වූ ද ධර්මයෝ - අකුසල සිත් 12, මනෝද්වරාවජ්ජනය, මහාකුසල් සිත් 08, මහාක්‍රියා සිත් 08, අභිඥා සිත් 02 යන මෙම සිත් 31 ඒ ඒ අරමුණුවලට අනුව සුදුසු පරිදි ත්‍රික පදයන්ගේ ස්වරූපාර්ථවල ඇතුළත් වේ. ත්‍රික මුක්තවල ද ඇතුළත් වේ. එම නිසා මෙම සිත් 31 ත්‍රිකයන්ට ඇතුළත් වන්නා වූ ද ත්‍රික මුක්ත වන්නා වූ ද ධර්මයෝ යැයි කීමට සුදුසු වෙති.

සෙසු ආරම්මණ ත්‍රිකයන්හි ද සුදුසු පරිදි බෙදා වෙන් කරනු ලබයි. උදාහරණයක් ලෙස ගවයෙක් ඒ ඒ අවස්ථාවලට සුදුසු පරිදි වච්ඡ-වස්සා, දම්ම - නාම්බා, බලිවද්ද - ගොනා, බලිවර්දයා, ජරග්ගව-මහළු ගවයා යැයි නොයෙක් ආකාරයට ව්‍යවහාර කරන්නාක් මෙනි.

පටුන වෙත

නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[36]

හීනා ධම්මා යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළොස ද තත් සම්ප්‍රයුක්ත චෛතසික සත්විස්ස ද ලැබෙන්නේය.

මජ්ඣිමා ධම්මා යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික කුසල් සිත් සතළොස ද ලෞකික විපාක සිත් දෙතිස ද ක්‍රියා සිත් විස්ස ද තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද අටවිසි රූපය ද ලැබෙන්නේය.

පණීතා ධම්මා යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අටදෙන ද තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද නිර්වාණය ද ලැබෙන්නේය.

---

36. **හීනා** - (හීයන්තෙ'ති = හීනා). අකුසල ධර්මයෝ බැහැර කළයුතු, බැහැර කිරීමට සුදුසු ධර්මයෝ වෙත්. පහත් ධර්මයෝ වෙත්. එමනිසා "හීන" නම් වෙත්. (හීනා'ති ලාමකා අකුසලා ධම්මා).

මජ්ඣිම - (මජ්ඣෙ භවා'ති = මජ්ඣිමා). ලෞකික විපාක හා ක්‍රියා යන නාම ස්කන්ධයන් සහ රූප ධර්මයන් හීන වන්නා වූ අකුසල ධර්ම සහ උත්කෘෂ්ට වන්නා වූ ලෝකෝත්තර ධර්ම අතර (මධ්‍යයෙහි) පවතී. එමනිසා (එම ලෞකික විපාක හා ක්‍රියා යන නාම ස්කන්ධයන් සහ රූප ධර්මයන්) 'මජ්ඣිම' යන නාමයෙන් දේශනා කළ සේක.

පණීතා - (පකට්ඨං නීතා = පණීතා). උත්කෘෂ්ට බවට පමුණුවන බැවින් "පණීත" නම් වේ. මාර්ග ඵල සහ නිර්වාණය යැයි කියන ලද ලෝකෝත්තර ධර්මයෝ උසස් ම උත්තරීතර ම වන බැවින් ද ප්‍රත්‍යවේක්ෂණ වීථිවලින් දින මුළුල්ලේ ම ප්‍රත්‍යවේක්ෂණය කළේ නමුදු සන්තෘප්තියට පත් නොවීම හේතුවෙන් ද ඵලසමාපත්තියට දින මුළුල්ලේ ම සමවැදී සිටියේ නමුදු සන්තෘප්තියට පත් නොවීම හේතුවෙන් ද 'පණීත' යන නාමය ලබති. (උත්තමත්ථෙන අතප්පකට්ඨෙන ච පණීතා ලොකුත්තරා ධම්මා).

පටුන වෙත

15. මිච්ඡත්ත ත්‍රිකය

ප්‍රථම පදය - මිච්ඡත්තනියතා ධම්මා, දෙවන පදය - සම්මත්තනියතා ධම්මා, තෙවන පදය - අනියතා ධම්මා

ස්වරූපාර්ථ වගුව

පදය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
		ස්	ආ	ධා	ස
ප	නියත මිථ්‍යා-පෙ-දිට්ඨි සං. සිත් සතරෙහි සත්වැනි ජවනය, චෙ-21(මාන, දේස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ඡ, විචිකිච්ඡා හැර) පඤ්චානන්තරිය-පෙ-ද්වේෂ සිත් දෙකෙහි සත්වැනි ජවනය, චෙ-22 (ප්‍රීති, ලෝභ, මාන, දිඨි, විචිකිච්ඡා හැර)	4	2	2	2
දු	මාර්ග සිත්-4, චෙ-36	4	2	2	1
ත	නියත මිථ්‍යා-පෙ-දිට්ඨි සං. සිත් සතරෙහි සත්වැනි ජවනය, පඤ්චානන්තරිය-පෙ-ද්වේෂ සිත් දෙකෙහි සත්වැනි ජවනය හැර අකු12, ලෞ.කු-17, විපාක-36, ක්‍රියා-20, චෙ-52, රූප-28, නිර්වාණය	5	12	18	3

මිච්ඡත්තනියතා ධම්මා - විපරීත ස්වභාව ඇති බැවින් චුතියට අනතුරුව ම විපාක දීම නියත කොට ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සම්මත්තනියතා ධම්මා - අවිපරීත ස්වභාව ඇති බැවින් තමාගේ පැවැත්මට අනතුරුව ම විපාක දීම ඒකාන්ත නියත කොට ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

පටුන වෙත

අනියතා ධම්මා - විපරීත ස්වභාවයෙන් හෝ අවිපරීත ස්වභාවයෙන් අනේකාන්ත වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[37]

---

37. **මිච්ඡත්ත**- (මිච්ඡා අත්තා යෙසන්'ති = මිච්ඡත්තා) ආනන්තර්ය කර්ම පස, නියත මිථ්‍යාදෘෂ්ටිය යන ධර්ම පස පවිටු විපාක ගෙන දෙන ස්වභාවය ඇති බැවින් "මිච්ඡත්ත" නම් වේ. ('අත්ත' ශබ්දය ස්වභාව අර්ථය ප්‍රකාශ කරයි.)

මාතෘඝාතක, පිතෘඝාතක ආදි පඤ්චානන්තර්ය කර්මයන් සිදුකරන පුද්ගලයෝ "මේ මව්පියන්ගේ මරණයෙන් පසු ඔවුන්ගේ වස්තුව මගේ ප්‍රයෝජනය සඳහා වේ ය" ආදී වශයෙන් අපේක්ෂාවක් ඇතිව මව මැරීම, පියා මැරීම යනාදි පඤ්චානන්තර්ය කර්ම සිදුකරත්. එසේ කර්මය කළේ නමුදු කර්මය සිදුකිරීමෙන් පසු අත්අඩංගුවට ගැනීම, සිරගත කිරීම, චිත්ත පශ්චාත්තාපය, මරණය, මරණයෙන් අනතුරුව අවීචියට වැටීම ආදිය සිදුවේ. ඒවා සම්බන්ධව අපේක්ෂාවක් නැති වීම හේතුවෙන් එම මව මැරීම, පියා මැරීම ආදි පඤ්චානන්තර්ය කර්ම "මිච්ඡත්ත" ස්වභාවයට යයි.

මිථ්‍යාදෘෂ්ටිය ගත් පුද්ගලයා "මෙම දෘෂ්ටිය ගැනීම ම මගේ යහපත පිණිස හේතු වන්නේය" යනාදී වශයෙන් අපේක්ෂාවෙන් මිථ්‍යාදෘෂ්ටිය ගනියි. එසේ වුව ද ඒ වැරදි දෘෂ්ටිය ඇති කල්හි වර්තමාන භවයේ නොදැන සිටියේ නමුදු මරණයෙන් මතු අවීචියට වැටීම ආදී පිළිබඳව අපේක්ෂාවක් නැති වීම හේතුවෙන් ඒ නියත මිථ්‍යාදෘෂ්ටිය ගැනීම ද "මිච්ඡත්ත" ස්වභාවයට යයි.

තව ද අශුභාදී ලක්ෂණ ඇති පඤ්චස්කන්ධය ශුභාදී වශයෙන් වරදවා ග්‍රහණය කරගැනීම හේතුවෙන් ද පඤ්චානන්තර්ය කර්මයන් සිදු කරයි. නියත මිථ්‍යාදෘෂ්ටිය ද ගනියි. එසේ වන විට උපාදානය කරගෙන සිටින පරිදි ශුභ ආදිය නො වී සත්‍ය වශයෙන් ම ඇති අශුභ ආදිය තමන් සිතා සිටින ආකාරයට ප්‍රතිවිරුද්ධ ලෙස පවතින බැවින් එම පඤ්චානන්තර්ය කර්මය ද නියත මිථ්‍යාදෘෂ්ටිය "මිච්ඡත්ත" ස්වභාවයට යයි.

මේ අනුව "මිච්ඡත්ත" ස්වභාවය ඇති බැවින් එම පඤ්චානන්තර්‍ය කර්ම සහ නියත මිථ්‍යාදෘෂ්ටිය 'මිච්ඡත්ත' යැයි කියනු ලබයි. ('හිතසුඛාවහා මෙ භවිස්සන්ති'තී එවං ආසීසිතා'පි තථා අභාවතො, අසුභාදීසුයෙව සුභන්'ති ආදිවිපරිතප්පවත්තිතො ච මිච්ඡාසභාවා'ති = මිච්ඡත්තා).

නියතා - (නියමන්තී'ති = නියතා). පඤ්චානන්තර්‍ය කර්ම සහ නියත මිථ්‍යාදෘෂ්ටිය විපාක දීමේ දී චුතියට අනතුරුව නියත වශයෙන් ම විපාක දෙන බැවින් 'නියත' නාමය ලබයි.

පඤ්චානන්තර්‍ය කර්ම කිහිපයක් සිදුකර ඇති විට ඒවා අතරින් බලවත් ම කර්මය ඉදිරිපත් වී අවීචියෙහි ඉපදීමට හේතු වේ. සෙසු කර්මයෝ ඒ විපාකය දෙන්නා වූ කර්මයට උපස්ථම්භ වන අතර ප්‍රතිසන්ධි විපාක නො දෙත්. මෙසේ බලවත් කර්මය විපාක දෙන කල්හි සෙසු කර්මයන් හට විපාක දීමට අවසරයක් නොදීම හේතුවෙන් "විපාක දීමේ දී චුතියට අනතුරුව නියත වශයෙන් ම" යැයි දක්වන ලදී.

මෙසේ විපාක දෙන අවස්ථාවේ දී විපාක දීමට අවකාශයක් නොලබන කර්මයන් අතර නියත සහ ආනන්තර්‍ය ස්වභාවය ඇති වෙනත් කර්ම පැවතිය හැකි ද? යම් ආනන්තර්‍ය කර්මයක් තමාට වඩා බලවත් වෙනත් ආනන්තර්‍ය කර්මයක් ඇති විට විපාක නොදී පවතියි. තමාට වඩා බලවත් ආනන්තර්‍ය කර්මයක් නැති විට චුතියට අනතුරුව ඒකාන්තයෙන් විපාක දෙයි.

මිච්ඡත්තනියතා - (මිච්ඡත්තා ච තෙ නියතා චා'ති = මිච්ඡත්තනියතා). "මිච්ඡත්ත" ස්වභාවය ඇති බව, චුතියට අනතුරුව විපාක දීම යන අංග ද්වයෙන් සමන්විත පඤ්චානන්තර්‍ය කර්ම සහ නියත මිථ්‍යාදෘෂ්ටිය 'මිච්ඡත්තනියතා' යන නාමය ලබයි.

නියතමිච්ඡාදිට්ඨි - (මිච්ඡා පස්සතී'ති = මිච්ඡාදිට්ඨි). සත්‍ය ස්වභාවයට අනුව නොදකිමින් "මිච්ඡත්ත" ආකාරයෙන් දකින්නා වූ දිට්ඨි චෛතසිකය ම 'මිච්ඡාදිට්ඨි' නම් වේ. (නියතා ච සා මිච්ඡාදිට්ඨි චා'ති = නියතමිච්ඡාදිට්ඨි). චුතියට අනතුරුව ඒකාන්තයෙන් ම විපාක දෙන

නාස්තික දෘෂ්ටිය, අහේතුක දෘෂ්ටිය, අකිරිය දෘෂ්ටිය යන දෘෂ්ටි වර්ග තුන 'නියත මිථ්‍යාදෘෂ්ටි' නම් වේ.

නාස්තික දෘෂ්ටිය - මතු භවයන්හි විපාක නැත යැයි විපාක ප්‍රතික්ෂේප කරන්නා වූ දෘෂ්ටිය 'නාස්තික දෘෂ්ටිය' නම් වේ. විපාකය ප්‍රතික්ෂේප කළ කල්හි කර්මය ප්‍රතික්ෂේප කළේ වෙයි. (විපාකං පතිබාහෙන්තෙනා'පි කම්මං පතිබාහිතං හොති).

අහේතුක දෘෂ්ටිය - හේතුවක් ද නැත, ඵලයක් ද නැත යැයි හේතු-ඵල ප්‍රතික්ෂේප කරන දෘෂ්ටිය 'අහෙතුක දෘෂ්ටිය' නම් වේ. හේතුවක් නැත යන ප්‍රකාශයෙන් හේතුව නිසා ඇති වන ඵලය ද නැත යැයි කීමට පැමිණේ. එම නිසා හේතු-ඵල දෙක ප්‍රතික්ෂේප කිරීම වේ. ('නත්ථි හෙතු'ති වදන්තො උභයං පටිබාහති).

අකිරිය දෘෂ්ටිය - පින් පව් සිදු කළේ නමුදු කිසිවක් සිදු නො වේ. පින් පව් සිදු කිරීම නම් වූ හේතු සඞ්ඛ්‍යාත කර්මය ප්‍රතික්ෂේප කරන දෘෂ්ටිය 'අකිරිය දෘෂ්ටිය' නම් වේ. හේතු සඞ්ඛ්‍යාත වූ කර්මය ප්‍රතික්ෂේප කළ කල්හි ඵල සඞ්ඛ්‍යාත විපාකය ද ප්‍රතික්ෂේප කළේ වෙයි. (කම්මං පටිබාහෙන්තෙනා'පි විපාකො පතිබාහිතො හොති).

මෙසේ මිථ්‍යාදෘෂ්ටි තුන් වර්ගය ම කර්මය සහ විපාක ප්‍රතික්ෂේප කරයි.

පඤ්චානන්තර්‍ය - (අනන්තරෙ නියුත්තං = ආනන්තරියං). චුතියට අනතුරුව දෙවෙනි භවයේ දී විපාක දෙන්නා වූ කර්මය 'ආනන්තර්‍ය' නම් වේ. එය (1) මාතුඝාතක - මව මැරීම (2) පිතුඝාතක - පියා මැරීම (3) අරහන්තඝාතක - රහතන් වහන්සේලා මැරීම (4) ලොහිතුප්පාදක- භාග්‍යවතුන් වහන්සේගේ ලේ සෙලවීම (5) සංඝභේදක - සංඝ භේදක කර්මය යැයි පස් ආකාර වේ. එමනිසා පඤ්චානන්තර්‍ය යැයි කියනු ලබයි.

පඤ්චානන්තර්‍ය කර්මයන්ගේ බලවත් වන ආකාරය - මෙම කර්ම පස අතරින් පෙර පෙර ඇති කර්මයන්ට වඩා පසු පසු කර්මයන් බලවත් වේ. එසේ නමුදු මව්පියන්ගේ සීලය සමාන වන විට මවගේ

මිච්ඡත්තනියතා ධම්මා යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් නියත මිථ්‍යාදෘෂ්ටි කර්මය වශයෙන් හටගන්නා වූ දිට්ඨිගත සම්ප්‍රයුක්ත චිත්ත - වීථි සතරෙහි සත්වන ජවනයෝ ද මාන, දෝස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, විචිකිච්ඡා වර්ජිත තත් සම්ප්‍රයුක්ත එක්විසි චෛතසිකයෝ ද මාතෘඝාතනාදී පඤ්චානන්තර්‍ය කර්ම වශයෙන් පවත්නා වූ දෝස මූලික වීථි දෙකෙහි සත්වැනි ජවනයෝ ද ප්‍රීති, ලෝභ, මාන, දිට්ඨි, විචිකිච්ඡා වර්ජිත තත් සම්ප්‍රයුක්ත දෙවිසි චෛතසිකයෝ ද ලැබෙන්නාහ.[38]

සම්මත්තනියතා ධම්මා යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සතර මාර්ග චිත්තය ද තත් සම්ප්‍රයුක්ත සතිස් චෛතසික ද ලැබෙන්නේය.[39]

ගුණය මහත් බැවින් මාතෘඝාතක කර්මය බලවත් වේ. පියාගේ සීලය උසස් වන විට පිතෘඝාතක කර්මය බලවත් වේ.

38. **සත්වැනි ජවනය** - ජවන සත අතරින් ප්‍රථම ජවනය දෘෂ්ටධර්ම වේද්‍ය කර්මය වේ. සුදුසු ප්‍රත්‍යය සකස් ව ඇති කල්හි මේ භවයේ දී විපාක ලබා දෙයි. මැද ජවන පස අපරාපරියවේදනීය කර්මය නම් වේ. තෘතීය භවයේ පටන් නිර්වාණය දක්වා අවකාශයක් ලැබුණු කල්හි විපාක දෙයි. සත්වැනි ජවනය උපපද්‍යවේද්‍ය කර්මය වේ. චුතියට අනතුරුව දෙවන භවයේ දී විපාක දෙයි. එමනිසා **මිච්ඡත්ත නියතා ධම්මා** සඳහා ස්වරූපාර්ථය ලෙස සත්වැනි ජවනය උද්ධරණය කර ඇත. ප්‍රථම ජවනය සහ මැද ජවන පස තෘතීය පදයෙහි ඇතුළත් වේ. එමනිසා තෘතීය පදය සඳහා "නියත මිච්ඡාදිට්ඨි -පෙ- සත්වැනි ජවනය ද සතර මාර්ග චිත්තය ද වර්ජිත කොට" යැයි විශේෂයක් දක්වමින් ස්වරූපාර්ථ උද්ධරණය කරන ලදී.

39. **සම්මත්ත** - (සම්මා අත්තා එතෙසන්'ති = සම්මත්තා). සතර මාර්ගය අවිපරීත ස්වභාවය ඇති ධර්මයන් ඇත්තේ වෙයි. එමනිසා 'සම්මත්ත' නම් වේ.

යෝගී පුද්ගලයා මෙම මාර්ගඥානය ඉපදවීමෙන් ලැබෙන්නා වූ සුඛය ඒකාන්තයෙන් ලබන්නෙමි යන අභිලාශයෙන් යුතුව මාර්ගය ඉපදවීම

අනියතා ධම්මා යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් නියත මිච්ඡාදිට්ඨි වශයෙන් පැවති දිට්ඨිගත සම්ප්‍රයුක්ත චිත්ත වීථි සතරෙහි වූ සත්වැනි ජවනය ද පඤ්චානන්තර්‍ය කර්ම වශයෙන් පැවැති දෝස මූල චිත්ත වීථි දෙකෙහි සත්වැනි ජවනය ද සතර මාර්ග චිත්තය ද වර්ජිත කොට ඇත්තා වූ පස්අසූ චිත්තය ද තත් සම්ප්‍රයුක්ත දෙපනස් චෛතසිකය ද අටවිසි රූපය ද නිර්වාණය ද ලැබෙන්නේය.[40]

පිණිස වීර්‍ය කරයි. මාර්ගය ලැබීමත් සමඟ ම ඵලය නැමැති විපාකය ද ඉන් අනතුරුව ඵල සමාපත්තිය නැමැති විපාකය ද දුගතියෙන් මිදීම ආදි ප්‍රතිඵලයන් ලැබීම හේතුවෙන් අභිලාශය සඵල වීම නිසා ඒ මාර්ග ධර්මයන්ට අවිපරීත ස්වභාවය ඇති ධර්මයන් ඇත.

තව ද මාර්ගය උපදවන්නා වූ පුද්ගලයා අසුභ, අනිත්‍ය ආදි වශයෙන් ඇත්තා වූ පඤ්චස්කන්ධය පිළිබඳව සුභ, නිත්‍ය ආදි වශයෙන් වැරදි සංඥා අතහැර අසුභ, අනිත්‍ය වශයෙන් නිවැරදි සංඥා ලැබීම ද නිසා ඒ මාර්ග ධර්මයන්ට අවිපරීත ස්වභාවය ඇති ධර්මයන් ඇත. එමනිසා සතර මාර්ගයන්ට 'සම්මත්ත' යැයි කියනු ලබයි.

සම්මත්තනියතා - (සම්මත්තා ච තෙ නියතා චා'ති = සම්මත්තනියතා). අවිපරීත ස්වභාව ඇත්තා වූ ද තමාට අනතුරුව ම ඒකාන්තයෙන් විපාක දීම යන අඞ්ග ද්වයෙන් සම්පූර්ණ වන සතර මාර්ගයෝ 'සම්මත්තනියතා' නම් වේ.

40. **අනියතා** - (උභයථාපි න නියතා'ති = අනියතා). මිච්ඡත්ත, සම්මත්ත යන ආකාර දෙක වශයෙන් ඒකාන්ත නොවන ධර්මයෝ "අනියත" නම් වෙති.

16. මග්ගාරම්මණ ත්‍රිකය

ප්‍රථම පදය - මග්ගාරම්මණා ධම්මා, දෙවන පදය - මග්ගහෙතුකා ධම්මා, තෙවන පදය - මග්ගාධිපතිනො ධම්මා

ස්වරූපාර්ථ වගුව

පදය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
		ස්	ආ	ධා	ස
ප	- සෝවාන් මාර්ගය අරමුණු කරන සෝවාන් පුද්ගලයාගේ මනෝද්වාරාවර්ජනය, ඤාණසං.කු-4, කුසල අභිඥා සිත - සෝවාන්,සකෘදාගාමි මාර්ගය අරමුණු කරන සකෘදාගාමි පුද්ගලයාගේ මනෝද්වාරාවර්ජනය, ඤාණසං.කු-4, කුසල අභිඥා සිත - සෝවාන්,සකෘදාගාමි, අනාගාමී මාර්ගය අරමුණු කරන අනාගාමි පුද්ගලයාගේ මනෝද්වාරාවර්ජනය, ඤාණසංකු-4, කුසල අභිඥා සිත - සතර මාර්ගය අරමුණු කරන රහතන්වහන්සේගේ මනෝද්වාරාවර්ජනය, ඤාණසංක්‍රියා-4, ක්‍රියා අභිඥා සිත, චෙ.-33 (විරති, අප්‍රමාණ්‍ය හැර)	4	2	2	1
දු	(ප්‍ර) මාර්ග සිත් 04, චෙ-28 (මාර්ගාංග වර්ජිත) (දු) මාර්ග සිත් 04, චෙ-36	4	2	2	1

පටුන වෙත

	(තෘ) මාර්ග සිත් 04, චෛ-35 (අමෝහ වර්ජිත)				
ත	(ප්‍ර) - සෝවාන් මාර්ගය ගරු කරමින් අරමුණු කරන සෝවාන් පුද්ගලයාගේ ඤාණ සං. මහාකුසල සිත් 04 - සකෘදාගාමි මාර්ගය ගරු කරමින් අරමුණු කරන සකෘදාගාමි පුද්ගලයාගේ ඤාණ සං.මහාකුසල සිත් 04 - අනාගාමි මාර්ගය ගරු කරමින් අරමුණු කරන අනාගාමි පුද්ගලයාගේ ඤාණ සං. මහාකුසල සිත් 04 (ව) - අර්හත් මාර්ගය ගරු කරමින් අරමුණු කරන රහතන් වහන්සේගේ මහාක්‍රියා සිත් 04 චෛ. 33 (විරති, අප්‍රමාණ්‍ය හැර) (දු) මාර්ග සිත් 04, විරිය-වීරිය හැර චෛ-35,වීමංසා-වීමංසා හැර චෛ-35, (ත) අධිපති බවට පත්වෙන වීරිය, විමංසා	4	2	2	2
මුක්ත	මාර්ගය අරමුණු නොකරන අකු-12, අහේ-17,ඤ.විප්.කු-4, ඤ.විප්.ක්‍රි-4, අභිඥා සිත් 2 හැර රූපාවචර සිත්-15, අරූ-12, ඵල-4, චෛ-52 මාර්ගය අරමුණු නොකරන මනෝද්වාරාවජ්ජනය, ඤ.සං.කු-4, ඤ.සං.ක්‍රි-4, අභිඥා සිත් 2, චෛ-48, රූප, නිර්වාණ				

මග්ගාරම්මණා ධම්මා - මාර්ගය ම අරමුණු කිරීම් වශයෙන් ඇත්තා වූ, නොහොත් - මාර්ගය ම අරමුණු කරන්නා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

මග්ගහේතුකා ධම්මා - (පළමු ක්‍රමය) මාර්ගය යැයි කියන ලද හේතු ඇත්තා වූ ද *(දෙවන ක්‍රමය) මාර්ගය සමඟ යෙදෙන්නා වූ හේතු ඇත්තා වූ ද *(තෙවන ක්‍රමය) සම්මා දිට්ඨි මාර්ගාංගය යැයි කියනා ලද හේතු ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

මග්ගාධිපතිනො ධම්මා - මාර්ගය ම ආරම්මණාධිපති ප්‍රත්‍ය කොට ඇත්තා වූ ද (දෙවන ක්‍රමය) මාර්ගයෙහි ම පිහිටි සහජාතාධිපති ප්‍රත්‍ය ඇත්තා වූ ද (තෙවන ක්‍රමය) මාර්ගය ම සහජාතාධිපති ප්‍රත්‍යය කොට ඇත්තා වූ ද නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

(*පාලියෙහි සහ අට්ඨකථාවෙහි ඇති ක්‍රමවලට අනුව දක්වා ඇති ද්විතීය පදයෙහි දෙවන හා තෙවන ක්‍රමය සඳහා අර්ථ දැක්වීම් පහත විස්තර කොට ඇත.)[41]

මග්ගාරම්මණා ධම්මා යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සෝවාන් මාර්ග සිත අරමුණු කොට ඇත්තා වූ සෝවාන් ආර්ය පුද්ගලයාගේ මනෝද්වාරාවජ්ජනය ද ඥාන සම්ප්‍රයුක්ත මහකුසල් සිත් සතර ද අභිඥා කුසල් සිත ද සෝවාන්, සකදාගාමී මාර්ගය අරමුණු කොට ඇත්තා වූ සකදාගාමී ආර්ය පුද්ගලයාගේ මනෝද්වාරාවර්ජනය ද ඥාන සම්ප්‍රයුක්ත මහකුසල් සිත්

---

41. **මග්ග** - (නිබ්බාණං මග්ගති ගවෙසතී'ති = මග්ගො) සෝවාන් ආදි සතර මාර්ගයෝ නිර්වාණය ගවේෂණය කරයි, අරමුණු කරයි. එමනිසා 'මග්ග' නම් වේ. (√මග්ග - ගවෙසන්ත, 'අ' ප්‍රත්‍යය).

දෙවන ක්‍රමය - (කිලෙසෙ මාරෙන්තො ගච්ඡතී'ති = මග්ගො) සෝවාන් ආදි සතර මාර්ගයෝ ක්ලේශයන් මරමින් නිර්වාණය වෙත අරමුණු කිරීම් වශයෙන් යයි. එමනිසා 'මග්ග' නම් වේ. (මාරෙන්ත සද්ද උපපද √ගමු 'ක්වි' ප්‍රත්‍යය).

පටුන වෙත

සතර ද අභිඥා කුසල් සිත ද සෝවාන්, සකදාගාමී, අනාගාමී මාර්ගත්‍රය ම අරමුණු කොට ඇත්තා වූ අනාගාමී ආර්ය පුද්ගලයාගේ මනෝද්වාරාවර්ජන සිත ද ඥාන සම්ප්‍රයුක්ත මහකුසල් සිත් සතර ද අභිඥා කුසල් සිත ද සෝවාන්, සකදාගාමී, අනාගාමී, අර්හත් යන සතර මාර්ගය ම අරමුණු කොට ඇත්තා වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ මනෝද්වාරාවර්ජනය ද ඥාන සම්ප්‍රයුක්ත මහාක්‍රියා සිත් සතර ද අභිඥා ක්‍රියා සිත ද විරති අප්‍රමාණ්‍ය වර්ජිත වූ තත් සම්ප්‍රයුක්ත තෙතිස් චෛතසිකයෝ ද ලැබෙන්නාහ. (මග්ගාරම්මණ සිත් 11කි)[42]

---

[42] **මග්ගාරම්මණා** - (මග්ගො ආරම්මණං එතෙසන්'ති = මග්ගාරම්මණා) මාර්ගය ම අරමුණු කිරීම් ඇත්තා වූ, මාර්ගය ම අරමුණු කරන්නා වූ ධර්මයෝ 'මග්ගාරම්මණ' නම් වේ. මාර්ගය අරමුණු කරන්නා වූ සිත්වල මනෝද්වාරාවජ්ජනය, ඥාන සම්ප්‍රයුක්ත මහාකුසල් සිත් සතර, ඥාන සම්ප්‍රයුක්ත මහාක්‍රියා සිත් සතර, අභිඥා සිත් දෙක වශයෙන් සිත් 11 ක් ඇත. අරමුණු කිරීමට හැකි පුද්ගලයෝ නම් සතර ඵලස්ථ පුද්ගලයෝ ම ය.

එම පුද්ගලයන් අතරින් පහළ පහළ ඵලස්ථ පුද්ගලයෝ ලැබුවා වූ, පැමිණියා වූ, මාර්ගයන් පමණක් අරමුණු කිරීමට සමර්ථ වෙත්. තවමත් නොලැබුවා වූ, ස්වකීය සන්තානයෙහි නොපැවැති මතු මතු මාර්ගයන් අරමුණු කිරීමට අසමර්ථ වෙත්.

පහළ පහළ ඵලස්ථ පුද්ගලයන්ට මතු මතු මාර්ගයන් අරමුණු කිරීමට නොහැකි වන කල්හි පෘථග්ජන පුද්ගලයන්ට මාර්ගය අරමුණු කළ හැකි ද යන්නෙහි සැකයක් නැත. සත්‍ය වශයෙන් ම අරමුණු කළ නොහැක. තව ද මග්ගාරම්මණ සිත් නොමැති බැවින් මාර්ගස්ථ පුද්ගලයන්ට මාර්ගය ද අරමුණු කළ නොහැක. එමනිසා ඵලස්ථ පුද්ගලයෝ සිවුදෙනා ම පමණක් මාර්ගය අරමුණු කිරීමට සමර්ථයෝ වෙති.

මාර්ගය අරමුණු කරන්නා වූ සිත්වල මනෝද්වාරාවජ්ජනය, ඥාන සම්ප්‍රයුක්ත මහාකුසල් සිත් සතර, ඥාන සම්ප්‍රයුක්ත මහාක්‍රියා සිත් සතර, අභිඥා සිත් දෙක වශයෙන් සිත් 11 ක් ඇත. (ඤාණසම්පයුත්ත

මග්ගහෙතුකා ධම්මා යන ද්විතීය පදයාගේ "මාර්ගය යැයි කියන ලද හේතු ඇත්තා වූ" යන <u>ප්‍රථම අර්ථ විකල්පයෙන්</u> ලැබිය යුතු

කාමාවචරකුසලානිචෙව -පෙ- වොට්ඨබ්බනඤ්චෙ'ති සබ්බථාපි සබ්බාරම්මණානි.)

එම සිත් අතරින් ඥාන සම්ප්‍රයුක්ත මහාකුසල් සිත් සතර සහ කුසල් අභිඥා යන සිත් පස පහළ ඵලස්ථ පුද්ගලයන්ගේ සන්තානයෙහි ඇත. රහතන් වහන්සේගේ සන්තානයෙහි නැත.

මහාක්‍රියා ඥාන සම්ප්‍රයුක්ත සතර, ක්‍රියා අභිඥා වශයෙන් රහතන් වහන්සේගේ සන්තානයෙහි ම පවතියි. පහළ ඵලස්ථ පුද්ගලයන්ගේ සන්තානයෙහි නැත.

මනෝද්වාරාවර්ජන සිත වනාහි සතර ඵලස්ථ පුද්ගලයන්ගේ සන්තානයෙහි පවතියි. එමනිසා "සෝවාන් මාර්ග සිත අරමුණු කොට ඇත්තා වූ සෝවාන් ආර්ය පුද්ගලයාගේ මනෝද්වාරාවර්ජනය ද ඥාන සම්ප්‍රයුක්ත මහාකුසල් සිත් සතර ද අභිඥා කුසල් සිත ද -පෙ- සතර මාර්ගය ම අරමුණු කොට ඇත්තා වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ මනෝද්වාරාවර්ජනය ද ඥාන සම්ප්‍රයුක්ත මහාක්‍රියා සිත් සතර ද අභිඥා ක්‍රියා සිත" යැයි දක්වන ලදී.

තව ද ලෞකික විරතිය කාම ධර්මයන් ම අරමුණු කරයි. අප්‍රමාණ්‍ය චෛතසිකයෝ ද සත්ව ප්‍රඥප්තිය අරමුණු කරති. මාර්ගය අරමුණු නො කරයි. මෙසේ ආරම්මණ නානත්වය හේතුවෙන් විරති සහ අප්‍රමාණ්‍ය චෛතසිකයෝ නොයෙදීම නිසා "විරති අප්‍රමාණ්‍ය වර්ජිත වූ තත් සම්ප්‍රයුක්ත තෙතිස් චෛතසිකයෝ ද ලැබෙන්නාහ" යැයි දක්වන ලදී.

මාර්ගය ඒකාන්ත වශයෙන් අරමුණු කරන ධර්මයන් නැත. ඇත්තේ මාර්ගය අනේකාන්ත වශයෙන් අරමුණු කරන ධර්මයන් ම ය. ඒ නිසා "ඒකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ, අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ" යැයි විශේෂයක් නොදැක්වුව ද ස්වරූපාර්ථයන්හි දක්වා ඇත්තේ අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ ධර්මයෝ ම ය.

අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් මාර්ග සිත් සතර ද මාර්ගාංග අට වර්ජිත අටවිසි චෛතසික ද ලැබෙන්නේය.[43]

"මාර්ගය සමඟ සම්ප්‍රයුක්ත - යෙදෙන්නා වූ හේතු ඇත්තා වූ" යන ද්විතීය අර්ථ විකල්පයෙන් ලැබිය යුතු අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, මාර්ග සිත් සතර ද තත් සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකයෝ ද ලැබෙන්නාහ.[44]

---

43. **මග්ගහෙතුකා (පළමු අර්ථ විකල්පය)** - (අට්ඨඞ්ගිකො'පි මග්ගො පච්චයට්ඨෙන එතෙසං හෙතු'ති = මග්ගහෙතුකා). මෙහි දී 'හෙතු' පදයේ 'ප්‍රත්‍ය අර්ථය' ගනු ලැබේ. 'මාර්ග ප්‍රත්‍යය' යැයි කියන ලද හේතු නම් මාර්ග ප්‍රත්‍යයේ ප්‍රත්‍ය ධර්ම නම් මාර්ගාංග අට යි. මේ අර්ථ විකල්පයෙහි 'මග්ග - මාර්ගය' සඳහා සතර මාර්ගයන්හි ඇතුළත් මාර්ගාංග අට ගත යුතු වේ. 'හෙතු' සඳහා ලෝභාදි හේතු සය නො ගතයුතු ය. එබැවින් 'හෙතුක - හේතු ඇති' ධර්ම වනුයේ ඒ මාර්ගාංග සමඟ සම්ප්‍රයුක්ත වන ධර්ම ය. "අට්ඨඞ්ගික මාර්ගය යැයි කියන ලද හේතු ඇති ධර්මයෝ (ආර්ය අෂ්ටාංගික මාර්ගය සමග සම්ප්‍රයුක්ත ධර්මතා)" 'මග්ගහෙතුකා' වේ.

මාර්ගාංග අට වර්ජිත අටවිසි චෛතසිකයෝ - මාර්ගාංග අට ම හේතුව වේ. හේතු ඇත්තා වූ (හෙතුක) ධර්මයෝ නො වෙත්. එම නිසා "මාර්ගාංග අට වර්ජිත අටවිසි චෛතසිකයෝ ද ලැබෙන්නාහ" යැයි මාර්ගාංග ධර්මයන් අට අත්හැර ස්වරූපාර්ථ දක්වා ඇත.

මෙම ප්‍රථම අර්ථ විකල්පය "අරියමග්ගසමඞ්ගිස්ස මග්ගඞ්ගානි ඨපෙත්වා තං සම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො. ඉමෙ ධම්මා මග්ගහෙතුකා" යැයි නික්ෂේප කාණ්ඩ පාළිය සමඟ සම වේ.

44. **(මග්ගහෙතුකා ද්විතීය අර්ථ විකල්පය)** - (මග්ගෙන සම්පයුත්තා වා හෙතු, මග්ගෙ වා හෙතු'ති = මග්ගහෙතු. තෙ එතෙසං හෙතු'ති = මග්ගහෙතුකා) මෙහි 'හෙතු' සඳහා 'මූල අර්ථය' ගනු ලැබේ. ඉහත පද විග්‍රහයේ දී "මග්ගහෙතුකා" යන මුළු පදය ම එකවර විවරණය

නොකොට "මග්ගහෙතු" පදය මුලින් දක්වා දෙවන "මග්ගහෙතුකා" පදය විස්තර කරයි.

එහි දී "මග්ගහෙතු" පදය ද කොටස් දෙකකින් විස්තර කොට ඇත.

පළමු කොටස - "මග්ගෙන සම්පයුත්තා වා හෙතු මග්ගහෙතු" - මාර්ගාංග අටෙහි ඇතුලත් නොවන එහෙත් මාර්ගාංග සමඟ සම්ප්‍රයුක්ත වන අලෝභ, අද්වේෂ යන හේතු දෙක (මූල දෙක) මාර්ගය සමඟ සම්ප්‍රයුක්ත වේ. එබැවින් මෙම හේතු දෙකට "මග්ගහෙතු" යැයි කියනු ලැබේ.

දෙවන කොටස - "මග්ගෙ හෙතු වා හෙතු මග්ගහෙතු" - මාර්ගාංග අට යැයි කියන ලද මාර්ගයෙහි ඇතුළත් වන්නා වූ සම්මාදිට්ඨි මාර්ගාංගය නම් වූ අමෝහ හේතුව (මූලය) 'මග්ගහෙතු' නම් වේ.

ඉහත කොටස් දෙකෙහි පැමිණෙන අලෝභ, අද්වේෂ, අමෝහ යන හේතු තුන ම මෙහි "මග්ගහෙතු" වේ.

ඉන් අනතුරුව "මග්ගහෙතුකා" පදය විග්‍රහ කොට ඇත. "තෙ එතෙසං හෙතුති = මග්ගහෙතුකා" - මාර්ගය සමඟ සම්ප්‍රයුක්ත හේතු, මාර්ගයෙහි ඇතුළත් වන්නා වූ හේතු ඇති ධර්මයෝ 'මග්ගහෙතුක' නම් වෙති.

මෙම ද්විතීය අර්ථ විකල්පයෙහි දක්වා ඇත්තේ නික්ෂේප කාණ්ඩ පාළියෙහි "මග්ගහෙතුකා" සඳහා දක්වා ඇති තෙවන නය ක්‍රමය යි. එනම් "අරියමග්ගසමඞ්ගිස්ස අලොභො අදොසො (මග්ගසම්පයුත්තා හෙතු සඳහා) අමොහො (මග්ගහෙතු සඳහා) - ඉමෙ ධම්මා මග්ගහෙතු. තංසම්පයුත්තො වෙදනාක්ඛන්ධො-පෙ- විඤ්ඤාණක්ඛන්ධො" ඉමෙ ධම්මා මග්ගහෙතුකා." (ආර්ය මාර්ග සමඞ්ගීහුගේ අලෝභය, අදෝසය, අමෝහය යන මේ ධර්මයෝ මාර්ගහේතුහු ය. උන් හා සම්ප්‍රයුක්ත වූ වේදනාස්කන්ධ ය. සඤ්ඤස්කන්ධය ය. සංස්කාරස්කන්ධය ය. විඤ්ඤණස්කන්ධ ය යන මේ ධර්මයෝ මාර්ගහේතුකයෝ ය). මෙය මූලටීකාවෙහි "යො පන තත්ථෙව අරියමග්ගසමඞ්ගිස්ස අලොභො

"සම්මා දිට්ඨි මාර්ගාංගය යැයි කියනා ලද" යන තෘතීය අර්ථ විකල්පයෙන් ලැබිය යුතු අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් මාර්ග සිත් සතර ද අමෝහ වර්ජිත තෙතිස් චෛතසිකයෝ ද ලැබෙන්නාහ.[45]

අදොසො අමොහො. ඉමෙ ධම්මා මග්ගහෙත'ති ආදි නයො වුත්තො. තං දස්සෙතුං මග්ගසම්පයුත්තො වා'ති ආදි වුත්තං" යැයි දක්වන ලදී.

හේතු ත්‍රය ඔවුනොවුන්ට හේතු භාවයෙන් ප්‍රත්‍යය වන බැවින් ඒවා ද 'මග්ගහෙතුක' වලට ඇතුළත් වෙති. එබැවින් මෙම අර්ථ විකල්පයේ දී කිසිදු ධර්මයකුදු අවශේෂ නොකොට "මාර්ග සිත් 04, හේතු ත්‍රය සමඟ යෙදෙන චෛතසික 36" ස්වරූපාර්ථ ලෙස ගත යුතු යි.

අභිධර්ම භාවනා ග්‍රන්ථය

මෙම දුතිය අර්ථ විකල්පයට අදාළව අභිධර්ම භාවනා ග්‍රන්ථයෙහි දී "මාර්ගයෙහි පිහිටි හේතු ඇත්තා වූ" යැයි අර්ථ දක්වා ස්වරූපාර්ථ වශයෙන් මාර්ග සිත් සතර ද තත් සම්ප්‍රයුක්ත අලෝභ, අදෝස, අමෝහ වර්ජිත තෙතිස් චෛතසිකයෝ ද ලැබෙන්නාහ" යනුවෙන් දක්වා ඇත. ඉහත පැහැදිලි කිරීමට අනුව එය නො සැසඳේ.

45. **(මග්ගහෙතුකා තෘතීය අර්ථ විකල්පය)** - (සම්මාදිට්ඨි සයං මග්ගො චෙව හෙතු ච ඉති මග්ගො හෙතු එතෙසන්'ති = මග්ගහෙතු). සම්මා දිට්ඨිය මාර්ගාංග ධර්මයන්හි ඇතුළත් බැවින් මාර්ගය ද නම් වේ. හේතු සයෙහි ඇතුළත් වන අමෝහ හේතු භාවයෙන් නැවතත් ඇතුලත් වන බැවින් හේතු නම් වේ. (සම්මදිට්ඨි සයං මග්ගො චෙව හෙතු ච). මෙසේ මාර්ගය ද වන්නා වූ, හේතු ද වන්නා වූ සම්මා දිට්ඨි මාර්ගාංගය ඇත්තා වූ (සම්මා දිට්ඨිය මාර්ගාංගය සමඟ සම්ප්‍රයුක්ත වන්නා වූ) ධර්මයෝ 'මග්ගහෙතුක' නම් වෙති.

මෙම නය ක්‍රමයේ අදහසට අනුව "මග්ගහෙතුකා - සම්මා දිට්ඨි මාර්ගාංගය යැයි කියනා ලද හේතු ඇත්තා වූ" යැයි අර්ථ දක්වා "මාර්ග සිත් සතර ද තත් සම්ප්‍රයුක්ත අමෝහ වර්ජිත පන්තිස් චෛතසිකයෝ ද ලැබෙන්නාහ" යන ස්වරූපාර්ථ ගැනීම සුදුසු ය.

මග්ගාධිපතිනො ධම්මා යන තෘතීය පදයාගේ "මාර්ගය ම ආරම්මණ අධිපති ප්‍රත්‍යය කොට ඇත්තා වූ" යන ප්‍රථම අර්ථ විකල්පයෙන් ලැබිය යුතු අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සෝවාන් මාර්ගය අධිපති කොට අරමුණු කරන්නා වූ සෝවාන් ආර්ය පුද්ගලයාගේ ඥාන සම්ප්‍රයුක්ත මහකුසල් සිත් සතර ද සෝවාන් සකදාගාමී මාර්ගය අධිපති කොට අරමුණු කරන්නා වූ සකදාගාමී ආර්ය පුද්ගලයාගේ ඥාන සම්ප්‍රයුක්ත මහකුසල් සිත් සතර ද සෝවාන් සකදාගාමී අනාගාමී මාර්ගත්‍රය අධිපති කොට අරමුණු කරන්නා වූ අනාගාමී ආර්ය පුද්ගලයාගේ ඥාන සම්ප්‍රයුක්ත මහකුසල් සිත් සතර ද සෝවාන් සකදාගාමී අනාගාමී අර්හත් සතර මාර්ගය ම අධිපති කොට අරමුණු කරන්නා වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ ඥාන සම්ප්‍රයුක්ත මහාක්‍රියා සිත් සතර ද විරති අප්‍රමාණ්‍ය වර්ජිත තත් සම්ප්‍රයුක්ත තෙතිස් චෛතසිකයෝ ද ලැබෙන්නාහ.[46]

(මාර්ගයේ පිහිටි යැයි කියන ලද සෙසු සම්ප්‍රයුක්ත හේතු නැති බැවින් අමෝහය අත්හරිනු ලබයි).

මෙම ක්‍රමය "අරියමග්ගසමඞ්ගිස්ස සම්මාදිට්ඨි මග්ගො චෙව හෙතු ච. සම්මාදිට්ඨිං ඨපෙත්වා තං සම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො. ඉමෙ ධම්මා මග්ගහෙතුකා" යැයි දක්වන නික්ෂේප කාණ්ඩයෙහි එන පාළිය සමඟ සැසඳේ.

46. **අධිපති** - (අධීනානං පති = අධිපති) තමා සමඟ සම්ප්‍රයුක්ත වන්නා වූ ධර්මයන්ට ඊශ්වරත්වය ගන්නා වූ ධර්ම විශේෂය 'අධිපති' නම් වේ. තමා සමඟ සම්බන්ධ වන්නා වූ ධර්මයන් අභිභවනය කරන්නා වූ ධර්මයෝ ය යන අදහස යි.

(මග්ගාධිපතිනො ප්‍රථම අර්ථ විකල්පය) - (මග්ගො අධිපති එතෙසන්'ති = මග්ගාධිපතිනො) මාර්ගය ම ආරම්මණාධිපති ප්‍රත්‍ය ඇත්තා වූ ධර්මයෝ 'මග්ගාධිපති' නම් වේ. (අටුවාවෙහි සාමාන්‍ය වශයෙන් විවරණය කර ඇත. ආරම්මණාධිපති, සහජාතාධිපති වශයෙන් බෙදීමක් නැත. ටීකාවෙහි විස්තාරාත්මකව දක්වා ඇත. එමනිසා ආචාර්යයන් වහන්සේලා ක්‍රම දෙකකින් බෙදා දැක්වූ සේක).

"මාර්ගයේ පිහිටි සහජාතාධිපති ප්‍රත්‍ය ඇත්තා වූ" ද්විතීය අර්ථ විකල්පයෙන් ලැබිය යුතු අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සතර මාර්ග චිත්තයෝ ද විරියාධිපති ප්‍රත්‍යය ලැබෙන කල්හි වීර්යය වර්ජිත පන්තිස් චෛතසිකයෝ ද වීමංසාධිපති ප්‍රත්‍ය ලැබෙන කල්හි වීමංසා වර්ජිත පන්තිස් චෛතසිකයෝ ද ලැබෙන්නාහ.[47]

"මග්ගාධිපතිනො - මාර්ගය ම ආරම්මණාධිපති ප්‍රත්‍ය කොට ඇත්තා වූ" යැයි අර්ථ දැක්වීම සුදුසු වේ.

මාර්ගය ගරු කරමින් අරමුණු කරන්නා වූ ඥාන සම්ප්‍රයුක්ත මහාකුසල් සිත් සතර සහ ඥාන සම්ප්‍රයුක්ත මහාක්‍රියා සිත් සතර මෙහි ස්වරූපාර්ථ ලෙස ලැබේ.

මාර්ගය අරමුණු කරන්නා වූ පුද්ගලයන් වනාහි ඵලස්ථ පුද්ගලයෝ සතරදෙනා ය. එම සතර ඵලස්ථ පුද්ගලයෝ ද ස්වකීය මාර්ගය ගරු කරමින් අරමුණු කරති. අන්‍යයන්ගේ මාර්ගයන් ගරු කරමින් අරමුණු කළ නො හැකිය.

පහළ ඵලස්ථ පුද්ගලයන් තිදෙනාගේ සන්තානයෙහි ඇති මාර්ග ගරු කරමින් අරමුණු කරනුයේ ඥාන සම්ප්‍රයුක්ත මහාකුසල් සිත් සතර විසින් ය. රහතන් වහන්සේගේ සන්තානයෙහි ඇති මාර්ග ගරු කරමින් අරමුණු කරන්නා වූ සිත නම් ඥාන සම්ප්‍රයුක්ත මහාක්‍රියා සිත් සතර විසින් ය.

ඒ හේතුවෙන් "සෝවාන් මාර්ගය අධිපති කොට අරමුණු කරන්නා වූ සෝවාන් ආර්ය පුද්ගලයාගේ ඥාන සම්ප්‍රයුක්ත මහාකුසල් සිත් සතර" ආදි වශයෙන් බෙදා දක්වමින් ස්වරූපාර්ථ දක්වා ඇත. විරති සහ අප්‍රමාණ්‍ය චෛතසිකයන්ගෙන් මාර්ගය අරමුණු නොකළ හැකි බැවින් අත්හරින ලදී. මෙම ක්‍රමය අනුව ආරම්මණාධිපති ප්‍රත්‍යයෝත්පන්නයන් දැක්වේ.

47. (මග්ගාධිපතිනො දෙවන අර්ථ විකල්පය) - මාර්ගයෙහි ම පිහිටි සහජාතාධිපති ප්‍රත්‍යය ඇති ධර්මයෝ (මාර්ගයෙහි පිහිටි යැයි කියනු

"මාර්ගය ම සහජාතාධිපති ප්‍රත්‍යය කොට ඇත්තා වූ" යන තෘතීය අර්ථ විකල්පයෙන් ලැබිය යුතු අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සම්මා දිට්ඨි - සම්මා වායාම නම් වූ විරිය, වීමංසාවෝ ලැබෙන්නාහ. ත්‍රිවිධ අර්ථ විකල්පයට අයත් වූ ඥාන සම්ප්‍රයුක්ත මහාකුසල, මහාක්‍රියා සිත් අටදෙනා ය, සතර මාර්ග චිත්ත හා අප්‍රමාණ්‍ය වර්ජිත තත් සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකයෝ ලැබෙන්නාහ. (මග්ගාධිපති සිත් 12, චෛතසික 36)[48]

ලබන සහජාතාධිපති ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ) 'මග්ගාධිපති' නම් වේ.

චත්තාරො අධිපති ඡන්දාධිපති විරියාධිපති චිත්තාධිපති වීමංසාධිපති යන්නට අනුව ඡන්ද, චිත්ත, විරිය, වීමංසා යන සහජාතාධිපති ප්‍රත්‍යය වන්නා වූ ධර්මයෝ සතරකි. එම අධිපති ධර්මයෝ සතර ම මාර්ගය නො වෙති. වීරියාධිපති මාර්ගාංගයන්හි සම්මා වායාම වශයෙන් ඇතුළත් වේ. වීමංසාධිපති ද සම්මාදිට්ඨි මාර්ගාංගය වශයෙන් ඇතුළත් වේ. එමනිසා විරිය සහ වීමංසාව මාර්ගය ද වෙයි, අධිපති ද වෙයි. මාර්ගයෙහි ම පිහිටි සහජාතාධිපති ප්‍රත්‍යය වේ.

තවද අධිපති බවට පත් වන විට එක් ධර්මයක් පමණක් අධිපති බවට පත් වේ. ධර්මයෝ දෙකක් එකවර අධිපති බවට පත් නො වෙති. එබැවින් මෙම දෙවන අර්ථ විකල්පයේ දී "සතර මාර්ග චිත්තයෝ ද විරියාධිපති ප්‍රත්‍යය ලැබෙන කල්හි වීර්යය වර්ජිත පන්තිස් චෛතසිකයෝ ද වීමංසාධිපති ප්‍රත්‍ය ලැබෙන කල්හි වීමංසා වර්ජිත පන්තිස් චෛතසිකයෝ ද ලැබෙන්නාහ" (මෙම ක්‍රමයෙන් සහජාතාධිපති ප්‍රත්‍යයෝත්පන්නයෝ දැක්වේ.

48. (**මග්ගාධිපතිනො තෙවන අර්ථ විකල්පය**) - (මග්ගො අධිපති = මග්ගාධිපති). මාර්ගය ම සහජාතාධිපති ප්‍රත්‍යය කොට ඇත්තා වූ ධර්මයෝ 'මග්ගාධිපති' නම් වෙති. මාර්ගය ද වන්නා වූ අධිපති ප්‍රත්‍යය ද වන්නා වූ ධර්මයෝ මග්ගාධිපති යන නාමය ලබයි යැයි අදහස් කරන ලදී.

ත්‍රිකමුක්ත ධර්මයෝ - මාර්ගය අරමුණු කිරීමට නො හැකි අකුසල් සිත් 12, මනෝද්වාරාවර්ජනය හැර අහේතුක සිත් 17, ඥාන සම්ප්‍රයුක්ත මහකුසල් සිත් 04, මහාවිපාක සිත් 08, ඥාන විප්‍රයුක්ත මහාක්‍රියා සිත් 04, අභිඥා සිත් දෙක හැර රූපාවචර සිත් 15, අරූපාවචර සිත් 12, ඵල සිත් 04 සහ තත් විප්‍රයුක්ත චෛතසික 52.

මාර්ගය අරමුණු නොකරන්නා වූ (මාර්ගය අරමුණු නොකරන අවස්ථාවල දී) මනෝද්වාරාවර්ජන සිත, ඥානසම්ප්‍රයුක්ත මහකුසල් සිත් 04, ඥාන සම්ප්‍රයුක්ත මහාක්‍රියා සිත් 04, අභිඥා සිත් 02, චෛතසික 36, රූප 28, නිර්වාණය යන පරමාර්ථ ධර්මයන් ඇති නිසා සප්‍රදේශ ත්‍රිකයක් වේ.

ඒ මාර්ගය ද වන්නා වූ අධිපති ප්‍රත්‍යය ද වන්නා වූ ධර්මයෝ නම් දක්වන ලද විරිය සහ වීමංසාවෝ ය. එම ධර්ම දෙක අධිපති වශයෙන් එකවිට නො යෙදේ. විරිය අධිපති බවට පත් වන විට වීමංසා අධිපති බවට පත් නො වේ. වීමංසා අධිපති බවට පත් වන විට විරිය අධිපති බවට පත් නො වේ. ඒ හේතුවෙන් "මග්ගාධිපතිනො - මාර්ගය ම සහජාතාධිපති ප්‍රත්‍යය කොට ඇත්තා වූ" යැයි අර්ථ දක්වා අධිපති බවට පත්වෙන විරිය, වීමංසා ලැබේ යැයි ස්වරූපාර්ථ දක්වන ලදී. (මෙම ක්‍රමයෙන් සහජාතාධිපති ප්‍රත්‍ය ධර්මයෝ දක්වන ලදී.)

17. උප්පන්න ත්‍රිකය

ප්‍රථම පදය - උප්පන්නා ධම්මා, දෙවන පදය - අනුප්පන්නා ධම්මා, තෙවන පදය - උප්පාදිනො ධම්මා

ස්වරූපාර්ථ වගුව

පදය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
		ස්	ආ	ධා	ස
ප	ප්‍රත්‍යුප්පන්න-සිත්-89, චෛ-52, රූප 28	5	12	18	3
දු	අනාගත- අකු-12, කුස-21, ක්‍රි-20, චෛ-52, ත්‍රිජ රූප (චිත්තජ, ඍතුජ, ආහාරජ)	5	7	8	3
ත	අනාගත- විපාක-36, චෛ-38, කර්මජ රූප-20	5	11	17	1
මුක්ත	නිර්වාණය				

උප්පන්නා ධම්මා - උත්පාද, ඨිති, භඞ්ග නම් වූ ක්ෂණත්‍රයට පැමිණෙමින් පවත්නා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අනුප්පන්නා ධම්මා - උත්පාද, ඨිති, භඞ්ග නම් වූ ක්ෂණත්‍රයට පැමිණෙමින් නො පවත්නා වූ ද නොපැමිණියා වූ ද නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

උප්පාදිනො ධම්මා - අවසන් වූ කාරණේකදේශයක් ඇති බැවින් අවශ්‍යයෙන් මතු ඉපදීම ස්වභාව කොට ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[49]

---

49. **උප්පන්නා** - (උද්ධං පන්නා ගතා පවත්තා'ති = උප්පන්නා). වර්තමාන චිත්ත, චෛතසික, රූප ධර්මයෝ උත්පාද, ඨිති, භඞ්ග යන

ක්ෂණත්‍රයට පැමිණෙමින් පවතින බැවින් 'උප්පන්න' නම් වේ.

මෙම ප්‍රථම පදය "සන්තති ප්‍රත්‍යුප්පන්නය, ඛණ ප්‍රත්‍යුප්පන්නය, අද්ධාන ප්‍රත්‍යුප්පන්නය" යන ප්‍රත්‍යුප්පන්න තෙවර්ගය අතරින් ඛණ ප්‍රත්‍යුප්පන්න වශයෙන් දේශනා කරන ලදී. ඒ අනුව මෙහි ස්වරූපාර්ථ වශයෙන් උත්පාද, ස්ථිත, භඞ්ග යන ක්ෂණත්‍රයට පැමිණෙමින් ඇති වර්තමාන චිත්ත, චෛතසික සහ රූප ගනියි.

අනුප්පන්නා - (න උප්පන්නා'ති = අනුප්පන්නා). උප්පන්න නොවන අනාගත ධර්මයෝ 'අනුප්පන්න' නම් වෙති.

ක්ෂණත්‍රයෙහි පවතින්නා වූ ප්‍රත්‍යයෝත්පන්න ධර්ම 'උපන්නා' යැයි වදාරා ඉන් පසු 'අනුප්පන්නා' යැයි වදාළ බැවින් 'උප්පන්න' නොවන සියලු පරමාර්ථ ධර්ම වන අතීත සහ අනාගත ධර්ම සියල්ල ම 'අනුප්පන්නා'යැයි සැලකිය යුතු තැනට පත් වේ. නමුත් නික්ෂේප කාණ්ඩ අටුවාවේ "මෙම ත්‍රිකය ප්‍රත්‍යුත්පන්න සහ අනාගත යන කාල දෙක වශයෙන් පූර්ණය කරමින් වදාළ සේක" (අයං පන තිකො ද්වින්නං අද්ධානං වසෙන පූරෙත්වා දස්සිතො) යනුවෙන් ද ටීකාවේ "අනුප්පන්නා යන මෙයින් සියලු උප්පන්න භාවය ප්‍රතිශේධිත ය" (අනුපන්නා'ති එතෙන සබ්බො උප්පන්නභාවො පටිසිද්ධො) යැයි වදාළහ. එබැවින් 'අනුප්පන්නා' සඳහා අතීත ධර්ම නොගෙන අනාගත ධර්ම ම ගතයුතු වේ.

උප්පන්න පදය නිර්වචනය කරනුයේ "උප්පාදතො පට්ඨාය යාවභඞ්ගා උද්ධං පන්නා ගතා පවත්තා ඉති උප්පන්නා" යනුවෙනි. (උප්පාදතො - උත්පාදයේ; පට්ඨාය - පටන්; යාවභඞ්ගා - භංගය දක්වා; උද්ධං - මත්තෙහි; පන්නා ගතා පවත්තා - පවත්නා; ඉති උප්පන්නා. "උප්පන්නා" පදයේ 'උ' උපසර්ගය 'උද්ධං' යන අර්ථය ද 'පන්න' පදයේ 'පද' ධාතුව ගමනාර්ථය ද ප්‍රකාශ කරයි. මෙහි ගමනාර්ථය නම් තැනකින් තැනකට යාමක් නොව පැවතීමයි. එබැවින් 'උද්ධං-පන්නා ගතා පවත්තා' යැයි විවරණය කළහ). "උප්පජ්ජිංසූති උප්පන්නා" (උප්පජ්ජිංසු - උත්පාදයේ පටන් භඞ්ගය දක්වා පැමිණ අවසන් වූ; ඉති උප්පන්නා) යැයි නිර්වචනය කළහොත් අතීත ධර්මයන්ට 'උප්පන්න' යැයි කිව හැක. නමුත් "උද්ධං+පන්නා

ගතා පවත්තා උප්පන්නා" යැයි නිර්වචනය කොට ඇති බැවින් ප්‍රත්‍යුත්පන්න ධර්මයන්ට 'උප්පන්න' යැයි කීමට ලැබේ. 'අනුප්පන්නා' පදයෙන් 'උප්පන්න' ධර්මයන් ප්‍රතිශේධ කොට ඇති බැවින් ඒ සඳහා අනාගත ධර්මයන් ම ගනු ලබයි.

අනුප්පන්නා - උත්පාද, ඨිති, භඞ්ග නම් වූ ක්ෂණත්‍රයට නොපැමිණියා වූ ද ඒ ක්ෂණත්‍රයට පැමිණෙමින් නොපවත්නා වූ යනුවෙන් අර්ථ දැක්වේ.

උප්පාදිනො - (පරිනිට්ඨිතකාරණෙකදෙසත්තා අවස්සං උප්පජ්ජිස්සතී'ති = උප්පාදිනො) අවසන් වූ කාරණේකදේශයක් ඇති බැවින් අවශ්‍යයෙන් මතු ඉපදීම ස්වභාව කොට ඇති ධර්මයන් උප්පාදිනො නම් වේ. මෙහි "පරිනිට්ඨිතකාරණේකදේස - අවසන් වූ කාරණේකදේශයක්" යනු කුමක් ද? (කාරණ+ඒකදේශ) කර්මය යන හේතුව (කාරණය) ද විපාකය යන ඵලය ද යන මෙම දෙක අතරින් ඒකදේශයක් (කොටසක්) වන හේතුව (කාරණය) නිම වී ඇත. අවසන් වූ කාරණේකදේශය හේතුවෙන් කෙතරම් කාලයක් ගත වී වුව ද ඒකාන්තයෙන් ම උපදින්නා වූ ඵලය "අවශ්‍යයෙන් මතු ඉපදීම ස්වභාව කොට ඇත" (අවස්සං උප්පජ්ජිස්සති) යන්නෙන් දැක්වේ. අවසන් වූ කාරණේකදේශයක් ඇති අවශ්‍යයෙන් මතු ඉපදීමේ ස්වභාවය නැති ධර්මයන් (ඒකාන්තයෙන් නූපදින්නා වූ ධර්මයන්) 'උප්පාදිනො' සඳහා ඇතුළත් නො වේ.

අනුප්පන්නා ධම්මා සහ උප්පාදිනො ධම්මා සඳහා ස්වරූපාර්ථ ගැනීම - අනුප්පන්නා සහ උප්පාදිනො පදවලින් දැක්වෙනුයේ අනාගත කාලය ය. **අනුප්පන්නා** පදයේ ස්වරූපාර්ථ සඳහා අනාගත ධර්මයන් අතරින් විපාක නාම ස්කන්ධ සහ කර්මජ රූප අත්හැර පාරිසේස නයෙන් සෙසු ධර්මයන් උද්ධරණය කරනු ලබයි. එම පරමාර්ථ ධර්මයන් **උප්පාදිනො** සඳහා ලැබේ. *(පාරිසේස නය නම් කියා අවසන් වූවෙන් ද ඉදිරියෙහි කියන්නා වූවෙන් ද අවශේෂය ගතයුතු නය යි. "සො ඉමං සදෙවකං සමාරකං" යන උදාහරණයෙහි "සදෙවකං - දෙවියන් සහිත වූ" සඳහා ඉදිරියෙහි කියන්නා වූ "සමාරකං - වශවර්තී දිව්‍ය භූමියෙන්" අවශේෂය වන දිව්‍ය භූමි පස ගතයුතු වේ).* විපාක

උප්පන්නා ධම්මා යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් උත්පාද, ඨිති, භඞ්ග නම් වූ ක්ෂණත්‍රයට පැමිණෙමින් පවත්නා වූ වර්තමාන කාලික වූ එකුන්අනූ චිත්තය ද චෛතසික දෙපනස ද අටවිසි රූපය ද ලැබෙන්නේය.

අනුප්පන්නා ධම්මා යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් කුසල් සිත් එක්විස්ස ද අකුසල් සිත් දොළොස ද ක්‍රියා සිත් විස්ස ද චෛතසික දෙපනස ද චිත්තජ රූප සතළොස ද ඍතුජ රූප පසළොස ද ආහාරජ රූප තුදුස ද ලැබෙන්නේය.

උප්පාදිනො ධම්මා යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි විපාක සිත් සතිස ද තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද කර්මජ රූප විස්ස ද ලැබෙන්නේය.

නාම ස්කන්ධ සහ කටත්තා රූප **උප්පාදිනො ධම්මා** පදයේ ස්වරූපාර්ථ සඳහා ලැබීමට හේතුව කවරේ ද? යත්, "මෙත්තෙය්‍යබොධිසත්තස්ස මග්ගො අනුප්පන්නො නාම. ඵලං උප්පාදිනො ධම්මායෙව නාමජාතං - මෛත්‍රී බෝධිසත්වයන් වහන්සේගේ මාර්ග සිත අනුප්පන්නො නම් වේ. ඵල සිත උප්පාදිනො ධම්මා යැයි ම නම් වීය" යන නික්ෂේප කාණ්ඩ අටුවා පාළියට අනුව ය.

ත්‍රික මුක්ත - අතීත සිත් 89, චෛ - 52, රූප 28 මෙම ත්‍රිකයාගේ ත්‍රික පද තුනට ඇතුළු නොවීම නිසා ත්‍රික මුක්ත පදයක් ලෙස නොගත යුතු ය. කාල විමුක්ත නිර්වාණය පමණක් ත්‍රික මුක්ත පදයක් ලෙස ලැබේ. කවරක් නිසා ද? යත්, මෙම ත්‍රිකය ප්‍රත්‍යුත්පන්න සහ අනාගත යන කාල දෙක වශයෙන් පූර්ණය කරමින් වදාළ බැවිනි. එමනිසා අතීත ධර්මයන් නොගත යුතු ය. (නිබ්බානං න වත්තබ්බං උප්පන්නන්ති උප්පාදී'ති'පි - නිර්වාණය උප්පන්නං යැයි හෝ උප්පාදි යැයි හෝ නොකිව යුතු ය" ධම්මසඞ්ගණි අට්ඨකථා කාණ්ඩය).

13. අතීත ත්‍රිකය

ප්‍රථම පදය - අතීතා ධම්මා, දෙවන පදය - අනාගතා ධම්මා, තෙවන පදය - පච්චුප්පන්නා ධම්මා

ස්වරූපාර්ථ වගුව

පදය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
		ස්	ආ	ධා	ස
ප	අතීත වන්නාවූ සිත්-89, චෛ-52, රූප-28	5	12	18	3
දු	අනාගත වන්නාවූ සිත්-89, චෛ-52, රූප-28	5	12	18	3
ත	ප්‍රත්‍යුප්පන්න වන්නාවූ සිත්-89, චෛ-52, රූප-28	5	12	18	3
මුක්ත	නිර්වාණය				

අතීතා ධම්මා - උත්පාදාදි ක්ෂණත්‍රයට පැමිණ ඉක්ම ගියා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අනාගතා ධම්මා - උත්පාදාදි ක්ෂණත්‍රයට නොපැමිණියා වූ මත්තෙහි පැමිණෙනු ලබන්නා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

පච්චුප්පන්නා ධම්මා - උත්පාදාදි ක්ෂණත්‍රයට පැමිණෙමින් පවත්නා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[50]

---

50. **අතීතා** - (අතික්කමිත්වා ඉතො ගතා පවත්තා'ති = අතීතා). උත්පාද, ඨිති, භඞ්ග ක්ෂණත්‍රය ඉක්මගියා වූ ස්වකීය කක්ඛළ, ඵුසන ආදි ස්වභාව ඇති පරමාර්ථධර්මයෝ 'අතීත' නම් වෙති.

අනාගතා - (න ආගතා = අනාගතා). උත්පාද, ඨිති, භඞ්ග ක්ෂණත්‍රයට

අතීතා ධම්මා යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ඉපිද නිරුද්ධ වූ එකුන්අනූ චිත්තය ද දෙපනස් චෛතසිකය ද අටවිසි රූපය ද ලැබෙන්නේය.

අනාගතා ධම්මා යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් උත්පාදාදි ක්ෂණත්‍රයට මතු පැමිණෙන්නා වූ එකුන්අනූ චිත්තය ද දෙපනස් චෛතසිකය ද අටවිසි රූපය ද ලැබෙන්නේය.

පච්චුප්පන්නා ධම්මා යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් උත්පාදාදි ක්ෂණත්‍රයට පැමිණෙමින් පවත්නා වූ එකුන්අනූ චිත්තය ද දෙපනස් චෛතසිකය ද අටවිසි රූපය ද ලැබෙන්නේය.

තවමත් නොපැමිණියා වූ ස්වකීය වූ කක්ඛළ, ඵුසන ආදි ස්වභාව ඇති පරමාර්ථ ධර්මයෝ 'අනාගතා' නම් වෙති.

පච්චුප්පන්නා - (පටිච්ච උප්පන්නා'ති = පච්චුප්පන්නා). උත්පාද, ඨිති, භඞ්ග යන ක්ෂණත්‍රයෙහි පවතින්නා වූ යොනිසො මනසිකාර ආදි ඒ ඒ හේතුන්වලට අනුව පහළ වන පරමාර්ථ ධර්මයෝ 'පච්චුප්පන්න' නම් වෙති.

ත්‍රිකමුක්ත - නිර්වාණය කාලත්‍රයට ම ඇතුළත් නො වේ. කාල තුනෙන් ම විනිර්මුක්ත ධර්මයක් වේ. එමනිසා නිර්වාණය කාල තුන වශයෙන් බෙදා දක්වා දේශනා කරන ලද මෙම ත්‍රිකයෙහි ත්‍රික මුක්ත ධර්මයක් වේ.

19. අතීතාරම්මණ ත්‍රිකය

ප්‍රථම පදය - අතීතාරම්මණා ධම්මා, දෙවන පදය - අනාගතාරම්මණා ධම්මා, තෙවන පදය - පච්චුප්පන්නාරම්මණා ධම්මා

ස්වරූපාර්ථ වගුව

පදය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
		ස්	ආ	ධා	ස
ප	(ඒකාන්ත) විඤ්ඤා-3, නෙවස-3. චෙ-30 (අනේකාන්ත) මනෝද්වාරාවජ්ජන, කාම ජවන්-29, තදාරම්මණ-11, අභිඥා සිත් 2, චෙ-47 (විරති, අප්‍රමාණ්‍ය හැර)	4	2	2	2
දු	(අනේකාන්ත) මනෝද්වාරාවජ්ජන, කාම ජවන්-29, තදාරම්මණ-11, අභිඥා සිත් 2, චෙ-47 (විරති, අප්‍රමාණ්‍ය හැර)	4	2	2	2
ත	(ඒකාන්ත) ද්විපඤ්ච වි-10, මනෝධාතු-3, චෙ-10 (ඡන්ද, ප්‍රීති, විරිය හැර) (අනේකාන්ත) මනෝද්වාරාවජ්ජන, කාම ජවන්-29, තදාරම්මණ-11, අභිඥා සිත් 2, චෙ-50 (අප්‍රමාණ්‍ය හැර)	4	2	8	2
මුක්ත	ප්‍රඥප්ති ඒකාන්ත, ප්‍රඥප්ති අනේකාන්ත, අප්‍රමාණ්‍ය ඒකාන්ත, අප්‍රමාණ්‍ය අනේකාන්ත, රූප, නිර්වාණ				

අතීතාරම්මණා ධම්මා - අතීත ධර්මයන් අරමුණු කිරීම් ඇත්තා වූ, නොහොත් - අතීත ධර්මයන් අරමුණු කරන්නා වූ නිස්සත්ව

පටුන වෙත

නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අනාගතාරම්මණා ධම්මා - අතීත ධර්මයන් අරමුණු කිරීම් ඇත්තා වූ, නොහොත් - අතීත ධර්මයන් අරමුණු කරන්නා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

පච්චුප්පන්නාරම්මණා ධම්මා - අතීත ධර්මයන් අරමුණු කිරීම් ඇත්තා වූ, නොහොත් - අතීත ධර්මයන් අරමුණු කරන්නා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[51]

අතීතාරම්මණා ධම්මා යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අතීත ධර්මයන් ඒකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ විඤ්ඤාණඤ්චායතන නේවසඤ්ඤානාසඤ්ඤායතන සිත් සදෙන ද තත් සම්ප්‍රයුක්ත චෛතසික සමතිස්දෙන ද අතීත ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ කාම ජවන එකුන්තිස්දෙන ද මනෝද්වාරාවර්ජන ක්‍රියා සිත ද තදාරම්මණ එකොළොස ද අභිඥා දෙසිත ද තත් සම්ප්‍රයුක්ත අප්‍රමාණ්‍ය විරති වර්ජිත චෛතසික සත්සාළිස්දෙන ද ලැබෙන්නේය.[52]

---

51. **අතීතාරම්මණා** - (අතීතං ආරම්මණං එතෙසන්ති = අතීතාරම්මණා). අතීත නාම රූප ස්කන්ධයන් අරමුණු කරන්නා වූ ධර්මයෝ 'අතීතාරම්මණ' නම් වෙති. (සෙසු පදයන් ද මෙම ක්‍රමයෙන් ගතයුතු යි)

52. **අප්‍රමාණ්‍ය වර්ජිත** - අප්‍රමාණ්‍ය චෛතසිකයෝ කාල විමුක්ත වූ සත්ව ප්‍රඥප්තිය අරමුණු කරයි. අතීත, අනාගත, ප්‍රත්‍යුත්පන්න නාම රූප ස්කන්ධයන් අරමුණු කිරීමට සමර්ථ නො වෙත්. එමනිසා පද ත්‍රිකයෙන් ම අප්‍රමාණ්‍ය ධර්මයන් අතහැර ස්වරූපාර්ථ දක්වා ඇත.

විරති වර්ජිත - ලෞකික විරතිය ව්‍යතික්‍රමණය කළයුතු වස්තුව යැයි කියන ලද ප්‍රත්‍යුත්පන්න වන්නා වූ කාමාවචර නාම රූප ධර්මයන් ඒකාන්තයෙන් අරමුණු කරයි. එමනිසා ප්‍රථම සහ දෙවන පදයන් විරතිය අතහැර ස්වරූපාර්ථ දක්වයි. තෘතීය පදයේ දී එසේ අත්හැරීමට අවශ්‍ය නො වේ.

අනාගතාරම්මණා ධම්මා යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අනාගත ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ මනෝද්වාරාවර්ජන සිත ද කාම ජවන් එකුන්තිස ද තදාරම්මණ එකොළොස ද අභිඥා දෙසිත ද අප්‍රමාණ්‍ය වර්ජිත තත් සම්ප්‍රයුක්ත චෛතසික සමපනස ද ලැබෙන්නේය.

පච්චුප්පන්නාරම්මණා ධම්මා යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වර්තමාන ධර්මයන් ඒකාන්තයෙන් අරමුණු කරන්නා වූ දෙපස් විඤ්ඤාණය ද මනෝධාතු ත්‍රිකය ද ඡන්ද, ප්‍රීති, වීර්ය වර්ජිත තත් සම්ප්‍රයුක්ත චෛතසික දසය ද වර්තමාන ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ මනෝද්වාරාවර්ජනය ද කාම ජවන් එකුන්තිස ද තදාරම්මණ එකොළොස ද අභිඥා දෙසිත ද අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික සමපනස ද ලැබෙන්නේය.

ත්‍රික මුක්ත ධර්මයෝ - ප්‍රඥප්ති ධර්මයන් ඒකාන්තයෙන් අරමුණු කරන්නා වූ -පෙ- විරති හැර චෛතසික 49, අප්‍රමාණ්‍ය ධර්මයන් ඒකාන්තයෙන් අරමුණු කරන ලෝකෝත්තර සිත් 08 සහ තත් සම්ප්‍රයුක්ත චෛතසික 36, අප්‍රමාණ්‍ය ධර්මයන් අරමුණු කරන්නා වූ මනෝද්වාරාවර්ජන සිත, ඥාන සම්ප්‍රයුක්ත මහකුසල් සිත් 04, ඥාන සම්ප්‍රයුක්ත මහාක්‍රියා සිත් 04, අභිඥා සිත් 02 තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික 33, රූප 28, නිර්වාණය.[53]

---

53. **ත්‍රික මුක්ත** - මෙම ත්‍රිකයේ දී කාල විමුක්ත වන්නා වූ ප්‍රඥප්ති ඒකාන්ත, ප්‍රඥප්ති අනේකාන්ත, නිර්වාණ ඒකාන්ත, නිර්වාණ අනේකාන්ත සහ අනාරම්මණ වන්නා වූ රූප සහ නිර්වාණය ත්‍රික මුක්ත වේ. ස්වරූපාර්ථ දැක්වීමේ දී නිර්වාණය අප්‍රමාණ ධර්මය යන නමින් ඇතුළත් කොට ඇත.

අප්‍රමාණ අනේකාන්තවල දී ඥාන සම්ප්‍රයුක්ත මහාකුසල්, ඥාන සම්ප්‍රයුක්ත මහාක්‍රියා සිත්වල විරති අප්‍රමාණ්‍ය චෛතසිකයන් සුදුසු පරිදි ඇතුළත් කළ හැකිය. එසේ වුව ද ඥාන සම්ප්‍රයුක්ත මහාකුසල් සිතෙහි ඇති විරතිය ලෞකික විරතියකි. ලෞකික විරතිය

සාමාන්‍යයෙන් වර්තමාන කාමාවර නාම රූප ධර්මයන් අරමුණු කරයි. කාල විමුක්ත නිර්වාණය අරමුණු කිරීමට නො හැකිය. මහාකුසල්, ක්‍රියා සිත්වල අප්‍රමාණ්‍ය චෛතසිකයෝ සත්ත්ව ප්‍රඥප්තිය ම අරමුණු කරති. පරමාර්ථ වන්නා වූ නිර්වාණය අරමුණු කිරීමට නො හැකිය. එමනිසා විරති අප්‍රමාණ්‍ය චෛතසික අත්හරිනු ලබයි.

පටුන වෙත

20. අජ්ඣත්ත ත්‍රිකය

ප්‍රථම පදය - අජ්ඣත්තා ධම්මා, දෙවන පදය - බහිද්ධා ධම්මා, තෙවන පදය - අජ්ඣත්තබහිද්ධා ධම්මා

ස්වරූපාර්ථ වගුව

පදය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
		ස්	ආ	ධා	ස
ප	ආධ්‍යාත්මික සන්තානයෙහි ඇති සිත්-89, චෙ-52, රූප-28	5	12	18	3
දු	බාහිර සන්තානයෙහි ඇති සිත්-89, චෙ-52, රූප-28, නිර්වාණය	5	12	18	4
ත	ආධ්‍යාත්මික බාහිර සන්තානයන්හි ඇති සිත්-89, චෙ-52, රූප-28	5	12	18	3

අජ්ඣත්තා ධම්මා - ආධ්‍යාත්මික සන්තානයෙහි පවත්නා වූ (තම-තමාගේ සන්තානයේ පවත්නා වූ) නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

බහිද්ධා ධම්මා- ඉන්ද්‍රිය බද්ධ වූ ද නො වූ ද බාහිර සන්තානයෙහි පවත්නා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අජ්ඣත්තබහිද්ධා ධම්මා - ආධ්‍යාත්මික වූ ද බාහිර වූ ද සන්තානයන්හි පවත්නා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අජ්ඣත්තා ධම්මා යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ආධ්‍යාත්මික සන්තානයෙහි හටගන්නා වූ එකුන්අනූ චිත්තය ද දෙපණස් චෛතසිකය ද අටවිසි රූපය ද ලැබෙන්නේය.

බහිද්ධා ධම්මා යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් බාහිර සන්තානයෙහි හටගන්නා වූ එකුන්අනූ චිත්තය ද දෙපණස් චෛතසිකය ද අටවිසි රූපය නිර්වාණය ද ලැබෙන්නේය.

පටුන වෙත

අජ්ඣත්තබහිද්ධා ධම්මා යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ආධ්‍යාත්මික හා බාහිර සන්තානයන්හි හටගන්නා වූ එකුන්අනූ චිත්තය ද දෙපණස් චෛතසිකය ද අටවිසි රූපය ද ලැබෙන්නාහ.[54]

---

54. **අජ්ඣත්තා** - 'අධි + අත්ත' යැයි පද බෙදා ගතයුතු යි. (අත්තානං අධිකිච්ච පවත්තා'ති = අජ්ඣත්තා). ආත්ම ග්‍රහණයට ලක්වන සත්ත්වයා තුළ ඇතුළත් නාමරූප ධර්මයෝ 'අජ්ඣත්ත' නම් වෙති. එම අජ්ඣත්තය සතර ආකාර ය.

1. ගොචරජ්ඣත්ත - ආරම්මණ වන අජ්ඣත්ත ෂඩාරම්මණයෝ ය.
2. නියකජ්ඣත්ත - ස්වකීය සන්තානයෙහි ඇති නාම රූප ධර්ම ය.
3. අජ්ඣත්තජ්ඣත්ත - ආධ්‍යාත්මික ආයතන සය ය.
4. විසයජ්ඣත්ත - සිත විශේෂ වශයෙන් බැසගන්නා වූ ඊශ්වර ස්ථානය නම් වූ අජ්ඣත්තය යි. එනම් ඵල සමාපත්තීන් ය.

ඉහත සතර අජ්ඣත්ත අතරින් මෙහි ලා නියකජ්ඣත්තය අදහස් කෙරේ. නියක අජ්ඣත්තය සඳහා ස්වරූපාර්ථ ලෙස ලැබෙනුයේ සිත් - 89, චෛතසික - 52, රූප 28 යන පරමාර්ථ ධර්මයන් ය.

බහිද්ධා - (තතො බාහිරභූතා පන ඉන්ද්‍රියබද්ධා වා අනින්ද්‍රියබද්ධා වා බහිද්ධා නාම). ඒ අජ්ඣත්ත ධර්මයන්ගෙන් බැහැරව ඇති සත්ව සන්තානයන් හා සම්බන්ධ ඉන්ද්‍රියබද්ධ ධර්මයෝ ද අනින්ද්‍රියබද්ධ ධර්මයෝ ද 'බහිද්ධ' නම් වෙති. අජ්ඣත්ත යනුවෙන් ඉහත දැක්වූ ධර්මයන්ගෙන් බැහැර වූවක් බැවින් මෙම දෙවෙනි පදයේ ස්වරූපාර්ථ සඳහා නිර්වාණය ද ඇතුළත් වේ. මෙම අනින්ද්‍රිය බද්ධ රූප සහ නිර්වාණය සත්ව සන්තානයන්හි ඇතුලත් නොවූ බැවින් ඒකාන්ත බහිද්ධ ධර්මයන් වේ.

අජ්ඣත්තබහිද්ධා - (අජ්ඣත්තා ච තෙ බහිද්ධාචා'ති = අජ්ඣත්තබහිද්ධා). ආධ්‍යාත්මික බහිද්ධ දෙක ම වන්නා වූ ධර්මයෝ ය. ආධ්‍යාත්මික වූ ද බාහිර වූ ද සත්ව සන්තානයන්හි ඇතුලත් වන සත්වයන්ගේ ආත්ම ග්‍රහණයට විෂය වන සිත් - 89, චෛතසික - 52, රූප 28 යන පරමාර්ථ ධර්ම මෙහි ඇතුලත් වේ.

පටුන වෙත

21. අජ්ඣත්තාරම්මණ ත්‍රිකය

ප්‍රථම පදය - අජ්ඣත්තාරම්මණා ධම්මා, දෙවන පදය - බහිද්ධාරම්මණා ධම්මා, තෙවන පදය - අජ්ඣත්තබහිද්ධාරම්මණා ධම්මා

ස්වරූපාර්ථ වගුව

පදය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
		ස්	ආ	ධා	ස
ප	(ඒකාන්ත) විඤ්ඤාණඤ්චායතන-3, නෙවසඤ්ඤා.-3. චෙ-30 (අනේකාන්ත) කාමාවචර-54, අභිඥා-02, චෙ-49 (ඉස්සා, අප්‍රමාණ්‍ය හැර)	4	2	8	2
දු	(ඒකාන්ත) ආකාසානඤ්චායතන-3 අභිඥා සිත් දෙක හැර රූපාවචර-15, ලොකෝත්තර-08, චෙ-38 (අනේකාන්ත) කාමාවචර-54, අභිඥා-02, *චෙ-51 (මච්ඡරිය හැර)	4	2	8	3
ත	(අනේකාන්ත) කාමාවචර-54, අභිඥා-02, චෙ-48 (ඉස්සා, මච්ඡරිය, අප්‍රමාණ්‍ය හැර)	4	2	8	2
මුක්ත	ආකිඤ්ච-03, චෙ-30, එම ආකිඤ්ච. නාස්තිභාව ප්‍රඥප්තිය අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ අකු-12, මහා කු-08,මහා ක්‍රියා - 08,මනෝද්වාරාවර්ජනය, අභිඥා-02, චෙ-46, රූප, නිර්වාණය				

පටුන වෙත

අජ්ඣත්තාරම්මණා ධම්මා - ආධ්‍යාත්මික ධර්මයන් අරමුණු කොට පවත්නා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

බහිද්ධාරම්මණා ධම්මා - බාහිර ධර්මයන් අරමුණු කොට ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අජ්ඣත්තබහිද්ධාරම්මණා ධම්මා - ආධ්‍යාත්මික වූ ද බාහිර වූ ද ධර්මයන් අරමුණු කොට පවත්නා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[55]

අජ්ඣත්තාරම්මණා ධම්මා යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ආධ්‍යාත්මික ධර්මයන් ඒකාන්ත වශයෙන් අරමුණු කොට ඇත්තා වූ විඤ්ඤාණඤ්චායතන නේවසඤ්ඤානාසඤ්ඤායතන සිත් සයදෙන ද තත් සම්ප්‍රයුක්ත චෛතසික සමතිස්දෙන ද ආධ්‍යාත්මික ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ කාමාවචර සිත් සිවුපනස ද අභිඥා දෙසිත ද තත් සම්ප්‍රයුක්ත ඉස්සා - අප්‍රමාණ්‍ය වර්ජිත එකුන්පනස් චෛතසිකය ද ලැබෙන්නේය.[56]

---

55. **අජ්ඣත්තාරම්මණා ධම්මා** - (අජ්ඣත්තං ආරම්මණං එතෙසන්'ති = අජ්ඣත්තාරම්මණා). ආධ්‍යාත්මික ධර්මයෝ අරමුණු කරන්නා වූ ධර්මයෝ 'අජ්ඣත්තාරම්මණ' නම් වෙති. (සෙසු පදයන් ද මෙම ක්‍රමයෙන් ගතයුතු යි).

56. **චෛතසික සලකන ආකාරය** - ඊර්ෂ්‍යාව අන්‍යයන්ගේ සම්පත්තිය නම් වූ බහිද්ධ ධර්මයන් අරමුණු කරයි. අප්‍රමාණ්‍ය චෛතසිකයෝ සත්ත්ව ප්‍රඥප්තිය නම් වූ බහිද්ධ ධර්මය ම අරමුණු කරයි. එමනිසා ප්‍රථම පදයේ දී සහ තෘතීය පදයේ දී අත්හරිනු ලබයි.

මච්ඡරිය චෛතසිකය මෙම ත්‍රිකයේ දී උද්ධරණය කළ යුතු ආකාරය - (1) ආවාස මච්ඡරිය - වාසස්ථානය පිළිබඳ මසුරු බව (2) කුල මච්ඡරිය - තමාගේ දායක පවුල්වලට, නෑ පවුල්වලට අන්‍ය භික්ෂූන්ගේ පැමිණීම අකැමැති බව (3) ලාභ මච්ඡරිය - අන්‍යයන් සිවුපසය ලබනවාට අකැමැති බව (4) වණ්ණ මච්ඡරිය - ශරීර වර්ණය හා ගුණ

බහිද්ධාරම්මණා ධම්මා යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් බාහිර ධර්මයන් ඒකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ ආකාසානඤ්චායතන සිත් තුන ද අභිඥා වර්ජිත රූපාවචර සිත් පසළොස ද ලෝකෝත්තර සිත් අට ද තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද බාහිර ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ කාම සිත් සිවුපනස ද අභිඥා දෙසිත ද මච්ඡරිය වර්ජිත තත් සම්ප්‍රයුක්ත එක්පනස් චෛතසික ද ලැබෙන්නේය.[57]

අජ්ඣත්තබහිද්ධාරම්මණා ධම්මා යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ආධ්‍යාත්මික වූ ද බාහ්‍ය වූ ද ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ සිවුපනස් කාමාවචර චිත්තය ද අභිඥා දෙසිත ද ඉස්සා, මච්ඡරිය, අප්පමඤ්ඤා වර්ජිත අටසාළිස් චෛතසික ද ලැබෙන්නේය.

වර්ණය පිළිබඳ මසුරු බව (5) ධම්ම මච්ඡරිය - තමා දත් ධර්මය අන්‍ය භික්ෂූන් දැන ගන්නවාට අකැමැති බව.

මෙසේ උපදින්නා වූ මච්ඡරිය ආවාස ආදී වශයෙන් අරමුණු කරන විට අජ්ඣත්ත බහිද්ධ යන දෙක ම අරමුණු කරයි. ඒ හේතුවෙන් මෙම ත්‍රිකයේ දී කිසිදු පදයක් සඳහා මච්ඡරිය අත්නොහැරිය යුතු යි. නමුත් ස්වරූපාර්ථ ග්‍රන්ථවල ද්විතීය සහ තෘතීය පදයන්හි ස්වරූපාර්ථ සඳහා මච්ඡරිය අත්හැර ඇත. විමසිය යුතු යි.

57 **රූපාවචර සිත් පසළොස** - රූපාවචර ධ්‍යානයන්ගේ අරමුණ වනුයේ නියකජ්ඣත්තයෙන් බැහැර වූ (බහිද්ධ වන) පඨවි ආදී කසිණ ආරම්මණයෝ ය. එබැවින් එය බහිද්ධාරම්මණ සඳහා ඇතුලත් වීය.

22. සනිදස්සන ත්‍රිකය

ප්‍රථම පදය - සනිදස්සනසප්පටිඝා ධම්මා, දෙවන පදය - අනිදස්සනසප්පටිඝා ධම්මා, තෙවන පදය - අනිදස්සනඅප්පටිඝා ධම්මා

ස්වරූපාර්ථ වගුව

පදය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
		ස්	ආ	ධා	ස
ප	රූපාරම්මණය	1	1	1	1
දු	රූපාරම්මණය හැර ඔෞදාරික රූප-11	1	9	9	1
ත	සිත්-89, චෛ-52, සුඛුම රූප -16, නිර්වණය	5	2	8	4

සනිදස්සනසප්පටිඝා ධම්මා - චක්ඛුවිඤ්ඤාණයෙන් දැකිය යුතු බව නම් වූ නිදර්ශන සහිත වූ හෙවත් දැකීම් සහිත චක්ඛුද්වාරයෙහි ආපාථගත විය යුතු බව නම් වූ පටිඝ සහිත වූ හෙවත් සැපීම් වූ ද නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අනිදස්සනසප්පටිඝා ධම්මා - චක්ඛුවිඤ්ඤාණයෙන් දැකිය නොහැකි බැවින් අනිදර්ශන නම් වූ ද එහෙත් ද්වාරාරම්මණ වශයෙන් ගැටීම් සහිත වූ ද නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අනිදස්සනඅප්පටිඝා ධම්මා - චක්ඛුවිඤ්ඤාණයෙන් දැකිය නොහැකි බැවින් අනිදර්ශන නම් වූ ද ද්වාරාරම්මණයෙන් ගැටීමක් නැති බැවින් අප්පටිඝ නම් වූ ද නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[58]

---

58. **සනිදස්සන** - (නිදස්සීයතෙ'ති = නිදස්සනං). දර්ශනයට ලක් වන

රූපාරම්මණය 'නිදස්සන' නම් වේ. (සහ නිදස්සනෙන යෙ වත්තන්තී'ති = සනිදස්සනා). දැකිය හැකි භාවය යන ආරම්මණ ශක්තිය ඇත්තා වූ රූපාරම්මණය 'සනිදස්සන' නම් වේ.

අනිදස්සන - (නත්ථි නිදස්සනං එතෙසන්'ති = අනිදස්සනා). දැකීමට හැකි දැකිය හැකි භාවය යන ආරම්මණ ශක්තිය නැත්තා වූ රූපාරම්මණය හැර සෙසු සත්විසි රූපය 'අනිදස්සන' නම් වේ.

සප්පටිඝා - (පටිහඤ්ඤතී'ති = පටිඝො). ගැටෙන්නා වූ පඤ්ච ප්‍රසාද සහ පඤ්චාරම්මණයෝ (ඖදාරික රූප දොළොස) 'පටිඝ' නම් වෙති. (සහ පටිඝෙන යෙ වත්තන්තී'ති = සප්පටිඝා) ද්වාර ආරම්මණ වශයෙන් ගැටීම් සමඟ ඇත්තා වූ පඤ්ච ප්‍රසාද සහ පඤ්චාරම්මණයෝ 'සප්පටිඝ' නම් වෙති.

අප්පටිඝා - (නත්ථි පටිඝො එතෙසන්'ති = අප්පටිඝා). ගැටීම් රහිත බව ඇත්තා වූ සූඛුම රූප සොළොස, නාම ස්කන්ධ සතර සහ නිර්වාණය "අප්පටිඝ" නම් වේ. "රූපායතනං සනිදස්සනරූපං, ඉතරං අනිදස්සනරූපං, පසාදවිසයසඞ්ඛාතං ද්වාදසවිධම්පි ඔළාරිකරූපං සන්තිකෙ රූපං සප්පටිඝරූපඤ්ච, ඉතරං සුඛුමරූපං දූරෙරූපං අප්පටිඝරූපඤ්ච - රූපායතනය සනිදර්ශන රූපයකි. සෙසු රූප අනිදර්ශන රූප ය. ප්‍රසාදවිෂය සඞ්ඛ්‍යාත වූ දෙළොස් වැදෑරුම් රූපයෝ ඕදරික රූපයෝ ද, සන්තික රූපයෝ ද, සප්‍රතිඝ රූපයෝ ද වෙති. සෙසු සොළොස් රූපයෝ සුඛුම රූපයෝ ද, දූර රූපයෝ ද, අප්‍රතිඝ රූපයෝද වෙති." යනුවෙන් අභිධර්මාර්ථ සංග්‍රහයේ පැමිණෙන ප්‍රකාශය රූප ධර්මයන් පමණක් සනිදස්සන, අනිදස්සන, සප්පටිඝ, අප්පටිඝ ලෙස බෙදා දක්වන්නා වූ ප්‍රකාශය යි. පරමාර්ථ ධර්මයන් සතර ම බෙදා දක්වන්නා වූ ප්‍රකාශයක් නො වේ.

සනිදස්සනසප්පටිඝා - (සනිදස්සනා ච තෙ සප්පටිඝා'ති = සනිදස්සනසප්පටිඝා). සනිදර්ශන වන්නා වූ ද සප්පටිඝ වන්නා වූ ද ධර්මයෝ ය. රූපාරම්මණය යි.

සනිදස්සනසප්පටිඝා ධම්මා යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අටවිසි රූපය අතුරෙන් එක ම වර්ණ රූපය ලැබෙන්නේය.

අනිදස්සනසප්පටිඝා ධම්මා යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වර්ණ රූපය වර්ජිත එකොළොස් ඖදාරික රූපයෝ ලැබෙන්නාහ.

අනිදස්සනඅප්පටිඝා ධම්මා යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන්අනූ චිත්තය ද දෙපනස් චෛතසිකය ද සුඛුම රූප සොළොස ද නිර්වාණය ද ලැබෙන්නේය.

අනිදස්සනසප්පටිඝා - (අනිදස්සනා ච තෙ සප්පටිඝා'ති = අනිදස්සනසප්පටිඝා). සනිදර්ශන නොවන්නා වූ ද සප්පටිඝ වන්නා වූ ද ධර්මයෝ ය. රූපාරම්මණය හැර ඖදාරික රූප එකොළොස යි.

අනිදස්සනඅප්පටිඝා - (අනිදස්සනා ච තෙ අප්පටිඝා'ති = අනිදස්සනසප්පටිඝා). සනිදර්ශන සප්පටිඝ දෙක ම නොවන්නා වූ ද ධර්මයෝ ය. සිත් එකුන්අනූව, චෛතසික දෙපනස, සුඛුම රූප සොළොස සහ නිර්වාණය යි.

ත්‍රික පිළිබඳව

- **ආදිලබ්ධනාම ත්‍රික, සර්වලබ්ධනාම ත්‍රික** - ත්‍රිකමාතිකා දෙවිස්සෙන් වේදනා ත්‍රිකය හැර සෙසු එක්විසි ත්‍රිකයෝ **ආදිලබ්ධනාම ත්‍රික** නම් වේ. වේදනා ත්‍රිකය **සර්වලබ්ධනාම ත්‍රිකය** වේ.

- **සප්‍රදේශ ත්‍රික** - (පදිස්සන්ති අපදිස්සන්ති යෙහී'ති = පදෙසා) ත්‍රිකයක් තුළ වූ පද තුනෙහි ඇතුළත් නො වූ (ඉතිරි නො වූ), පරමාර්ථ ධර්මයන් ඇති ත්‍රිකදුකයෝ 'පදෙස' නම් වෙති.

  (සංවිජ්ජන්ති පදෙසා යෙසන්ති = සප්පදෙසා) ත්‍රිකයක් තුළ වූ පද තුනෙහි ඇතුළත් නො වූ පරමාර්ථ ධර්මයන් ඇති ත්‍රිකයෝ 'සප්‍රදේශ' නම් වෙති. මෙම ක්‍රමයට අනුව 'පදෙස' ශබ්දය 'කොටස' යන අර්ථය නො දක්වයි. අනුටීකාවේ 'කොටස' යන අර්ථය දක්වා ඇත.

- **නිප්‍රදේශ ත්‍රික** - (නත්ථි පදෙසා යෙසන්ති = නිප්පදෙසා)) ත්‍රිකපද තුනෙහි ඇතුළත් නො වූ, පරමාර්ථ ධර්මයන් නැති ත්‍රිකයෝ 'නිප්‍රදේශ' නම් වෙති.

මෙම ත්‍රික මාතිකාවන්හි සප්‍රදේශ ත්‍රික 9කි. (1) වෙදනා ත්‍රිකය (2) විතර්ක ත්‍රිකය (3) ප්‍රීති ත්‍රිකය (4) උප්පන්න ත්‍රිකය (5) අතීත ත්‍රිකය (6) පරිත්තාරම්මණ ත්‍රිකය (7) මග්ගාරම්මණ ත්‍රිකය (8) අතීතාරම්මණ ත්‍රිකය (9) අජ්ඣත්තාරම්මණ ත්‍රිකය

සෙසු ත්‍රිකයන් නිප්‍රදේශ ත්‍රිකයෝ වෙති. (1) කුසල ත්‍රිකය (2) විපාක ත්‍රිකය (3) උපාදින්න ත්‍රිකය (4) සංකිලිට්ඨ ත්‍රිකය (5) දස්සන ත්‍රිකය (6) දස්සනහෙතු ත්‍රිකය (7) ආචයගාමී ත්‍රිකය (8) සෙක්ඛ ත්‍රිකය (9) පරිත්ත ත්‍රිකය (10) හීන ත්‍රිකය (11) මිච්ඡත්ත ත්‍රිකය (12) අජ්ඣත්ත ත්‍රිකය (13) සනිදස්සන ත්‍රිකය

ත්‍රිකමාතිකා නිමි

ත්‍රික මාතිකා - විශ්ලේෂණය

- ත්‍රික මාතිකා, දුක මාතිකා දෙක අතරින් කවර හේතුවක් නිසා ත්‍රික මාතිකා මුලින් ම වදාළ සේක් ද?

  ධාරණයට පහසු බැවින් ද, නානා නය ක්‍රම රාශියක් ඇති බැවින් ද ත්‍රික මාතිකාව මුලින් ම දේශනා කළ සේක.

- ත්‍රික මාතිකා දෙවිස්ස අතරින් කවර හේතුවක් නිසා කුසල ත්‍රිකය මුලින් ම වදාළ සේක් ද?

  සියලු පරමාර්ථ ධර්මයන් ඇතුළත් වන බැවින් ද අමිශ්‍ර බැවින් ද කුසල නම් වූ ආදි කල්‍යාණ වූ ධර්මය සමඟ යෙදෙන බැවින් ද කුසල ත්‍රිකය පළමුවෙන් ම වදාළ සේක.

- කුසල ත්‍රිකයේ දී කවර හේතුවක් නිසා පළමුවෙන් ම **කුසලා ධම්මා** පළමුවෙන් ම දේශනා කළ සේක් ද?

  උත්තරීතර බැවින් ද ප්‍රශංසා කළයුතු බැවින් ද මෙලොව පරලොව වශයෙන් හිතසුව එළවන බැවින් ද කුසල පදය මුලින් ම දේශනා කළ සේක.

- කුසල පදයට අනතුරුව කවර හේතුවක් නිසා අකුසල පදය දේශනා කළ සේක් ද?

  කුසලයට ප්‍රතිපක්ෂ වීම හේතුවෙන් දේශනා කළ සේක.

- අකුසල පදයට අනතුරුව කවර හේතුවක් නිසා අබ්‍යාකත පදය දේශනා කළ සේක් ද?

  කුසල අකුසල යන දෙකින් ම වෙන් වුණු ස්වභාවය පැවතීම හේතුවෙන් දේශනා කළ සේක.

- කුසල ත්‍රිකයට අනතුරුව කවර හේතුවක් නිසා වේදනා ත්‍රිකය දේශනා කළ සේක් ද?

  කුසල ත්‍රිකයෙන් පිඬු කොට දක්වූ කුසල, අකුසල, අබ්‍යාකත යන ධර්මයන්ට සුදුසු පරිදි සුඛ සම්ප්‍රයුක්ත, දුක්ඛ සම්ප්‍රයුක්ත, අදුක්ඛම සුඛ සම්ප්‍රයුක්ත වේදනා ආකාරයන් දක්වනු කැමැත්තෙන් කුසල ත්‍රිකයට අනතුරුව වේදනා ත්‍රිකය වදාළ සේක. (ත්‍රිකයක් සමඟ

ත්‍රිකයක්, දුකයක් සමඟ දුකයක් අතර මෙම ක්‍රමයෙන් සම්බන්ධ කරගන්න)

ලක්ෂණය	ත්‍රිකය	ලැබෙන ත්‍රික පදයන්
රූප ස්කන්ධය පමණක් ලැබෙන ත්‍රික පද - 2	සනිදස්සන ත්‍රිකය	ප දු
නාම ස්කන්ධ තුනක් පමණක් ලැබෙන ත්‍රික පද - 5	වේදනා ත්‍රිකය ප්‍රීති ත්‍රිකය	ප දු ත දු ත
නාම ස්කන්ධ සතරක් පමණක් ලැබෙන ත්‍රික පද- 32	කුසල ත්‍රිකය විපාක ත්‍රිකය සංකිලිට්ඨ ත්‍රිකය විතර්ක ත්‍රිකය ප්‍රීති ත්‍රිකය දස්සන ත්‍රිකය දස්සනහෙතු ත්‍රිකය ආචයගාමී ත්‍රිකය සෙක්ඛ ත්‍රිකය පරිත්ත ත්‍රිකය පරිත්තාරම්මණ ත්‍රිකය හීන ත්‍රිකය මිච්ඡත්ත ත්‍රිකය මග්ගාරම්මණ ත්‍රිකය අතීතාරම්මණ ත්‍රිකය අජ්ඣත්තාරම්මණ ත්‍රිකය	ප දු ප දු ප ප දු ප ප දු ප දු ප දු ප දු දු ප දු ත ප ප දු ප දු ත ප දු ත ප දු ත
ස්කන්ධ පස ම ලැබෙන්නා වූ ත්‍රික පද - 23	කුසල ත්‍රිකය විපාක ත්‍රිකය උපාදින්න ත්‍රිකය සංකිලිට්ඨ ත්‍රිකය විතර්ක ත්‍රිකය දස්සන ත්‍රිකය දස්සනහෙතු ත්‍රිකය ආචයගාමී ත්‍රිකය සෙක්ඛ ත්‍රිකය පරිත්ත ත්‍රිකය හීන ත්‍රිකය	ත ත ප ත දු ත ත ත ත ත ප දු

පටුන වෙත

	මිච්ඡත්ත ත්‍රිකය			ත
	උප්පන්න ත්‍රිකය	ප	දු	ත
	අතීත ත්‍රිකය	ප	දු	ත
	අජ්ඣත්ත ත්‍රිකය	ප	දු	ත
	සනිදස්සන ත්‍රිකය			ත
නාම ස්කන්ධ සතර සහ නිර්වාණය ලැබෙන්නා වූ ත්‍රික පද - 4	උපාදින්න ත්‍රිකය			ත
	සංකිලිට්ඨ ත්‍රිකය			ත
	පරිත්ත ත්‍රිකය			ත
	හීන ත්‍රිකය			ත
නාම ස්කන්ධ සතර සහ රූප ඒකදේශයක් ලැබෙන්නා වූ ත්‍රික පද - 3	උපාදින්න ත්‍රිකය	ප	දු	
	උප්පන්න ත්‍රිකය		දු	ත
රූප ඒකදේශයක් පමණක් ලැබෙන්නා වූ ත්‍රික පද - 2	සනිදස්සන ත්‍රිකය	ප	දු	
ලෞකික ධර්මයන් පමණක් උද්ධරණය කරන ත්‍රික පද - 27	කුසල ත්‍රිකය		දු	
	වේදනා ත්‍රිකය		දු	
	උපාදින්න ත්‍රිකය	ප	දු	
	සංකිලිට්ඨ ත්‍රිකය	ප	දු	
	දස්සන ත්‍රිකය	ප	දු	
	දස්සනහෙතු ත්‍රිකය	ප	දු	
	ආචයගාමී ත්‍රිකය	ප	දු	
	පරිත්ත ත්‍රිකය	ප	දු	
	පරිත්තාරම්මණ ත්‍රිකය	ප	දු	
		ප	දු	
	හීන ත්‍රිකය	ප		
	මිච්ඡත්ත ත්‍රිකය	ප		
	මග්ගාරම්මණ ත්‍රිකය	ප	දු	ත
	අතීතාරම්මණ ත්‍රිකය	ප		
	අජ්ඣත්තාරම්මණ ත්‍රිකය	ප	දු	
	සනිදස්සන ත්‍රිකය			
ලෝකෝත්තර ධර්මයන් පමණක් උද්ධරණය කිරීමට	උපාදින්න ත්‍රිකය			ත
	සංකිලිට්ඨ ත්‍රිකය			ත
	ආචයගාමී ත්‍රිකය		දු	
	සෙක්ඛ ත්‍රිකය	ප	දු	

පටුන වෙත

ලැබෙන ත්‍රික පද - 27	පරිත්ත ත්‍රිකය			ත
	හීන ත්‍රිකය			ත
	මිච්ඡත්ත ත්‍රිකය		දු	
	මග්ගාරම්මණ		දු	
ස්කන්ධ, ආයතන, ධාතු සියල්ල ලැබෙන ත්‍රික පද - 16	කුසල ත්‍රිකය			ත
	සංකිලිට්ඨ ත්‍රිකය		දු	
	දස්සන ත්‍රිකය			ත
	දස්සනහෙතු ත්‍රිකය			ත
	ආචයගාමී ත්‍රිකය			ත
	සෙක්ඛ ත්‍රිකය			ත
	පරිත්ත ත්‍රිකය	ප		
	හීන ත්‍රිකය		දු	
	මිච්ඡත්ත ත්‍රිකය			ත
	උප්පන්න	ප		
	අතීත ත්‍රිකය	ප	දු	ත
	අජ්ඣත්ත ත්‍රිකය			
නිර්වාණය පමණක් ත්‍රික මුක්ත ලෙස උද්ධරණය කරන ත්‍රික -2	උප්පන්න ත්‍රිකය			
	අතීත ත්‍රිකය			
චෛතසික පමණක් ත්‍රික මුක්ත ලෙස උද්ධරණය කරන්නා ත්‍රික - 1	විතර්ක ත්‍රිකය			
චෛතසික, රූප, නිර්වාණ පමණක් ත්‍රික මුක්ත ලෙස උද්ධරණය කරන්නා වූ ත්‍රික - 1	වෙදනා ත්‍රිකය			
නාම ස්කන්ධ සතර, රූප, නිර්වාණය ත්‍රික මුක්ත ලෙස උද්ධරණය කරන්නා වූ ත්‍රික - 5	ප්‍රීති ත්‍රිකය			
	පරිත්තාරම්මණ ත්‍රිකය			
	මග්ගාරම්මණ ත්‍රිකය			
	අතීතාරම්මණ ත්‍රිකය			
	අජ්ඣත්තාරම්මණ ත්‍රිකය			

ත්‍රික මාතිකා - අභ්‍යාස

1. කුසල ත්‍රිකය

1. තික මාතිකා හා දුක මාතිකවන්ගේ ස්වභාව අභිප්‍රායයන් විස්තර කොට දක්වන්න.
2. අනවජ්ජසුඛවිපාකලක්ඛණා යන්නෙහි වජ්ජ, අවජ්ජ, අනවජ්ජ, සුඛවිපාක යන පද පිළිබඳව වෙන වෙන ම විස්තර කරන්න.
3. අනවජ්ජ, සුඛවිපාක යන පද දෙක දේශනා කිරීමේ හේතුව දක්වන්න.
4. 'අ' ශබ්දයාගේ අර්ථය ප්‍රකට කරමින් 'අකුසලා' යන පදයේ අර්ථය පැහැදිලි කරන්න.
5. 'සාවජ්ජා' සහ 'දුක්ඛවිපාකා' යන ධර්මයන්ගේ ස්වරූපාර්ථ වෙන වෙන ම දක්වන්න.
6. අබ්‍යාකත ධර්මයන් සහ අබ්‍යාකත ධර්මයන් වෙන් වෙන් වශයෙන් දක්වන්න.
7. සෝතාපත්ති මාර්ගාංගයෝ අටදෙන එක් වරක් ද සම්මා සංකප්ප වර්ජජිත සත්දෙන සතර වරක් ද යන ප්‍රකාශය කවරක් අපේක්ෂා කරමින් දක්වන ලද්දක් ද?
8. මාර්ගචිත්තෝත්පාද 29 නම් කරන්න.
9. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත යැයි කියනුයේ කවර හේතුවක් නිසා ද?
10. ඵල චිත්තෝත්පාද 37 විස්තර සහිතව දක්වන්න.
11. ආදිලබ්ධනාම ත්‍රිකය, සර්වලබ්ධනාම ත්‍රිකය, සප්‍රදේශ ත්‍රිකය, නිප්‍රදේශ ත්‍රිකය යන ත්‍රිකයන්ගේ ස්වභාවයන් විස්තර කරන්න.

2. වේදනා ත්‍රිකය

12. වේදනා, සුඛ, දුක්ඛ සහ අදුක්ඛමසුඛ යන පදයන්හි අර්ථ දක්වන්න.
13. ලෞකික සුඛසහගත සිත්, මාර්ග සුඛසහගත සිත් දක්වන්න.

පටුන වෙත

14. වේදනා ත්‍රිකයේ ප්‍රථම පදයේ ස්වරූපාර්ථයන්හි ඇති මාර්ග චිත්තෝත්පාද 28, ඵල චිත්තෝත්පාද 36 ලැබෙන ආකාරය දක්වන්න.

15. ලෞකික උපෙක්ඛා සහගත සිත්, මාර්ග උපෙක්ඛා සහගත සිත් දක්වන්න.

16. වේදනා ත්‍රිකයේ තෘතීය පදය සත්‍ය සංග්‍රහයේ 'සෝවාන් මාර්ගාංග සත්දෙන' ආදි ලෙස දැක්වෙන ප්‍රකාශය පැහැදිලි කරන්න.

17. වේදනා ත්‍රිකයේ තෘතීය පදයේ ස්වරූපාර්ථයන්හි මාර්ග චිත්තෝත්පාද 26, ඵල චිත්තෝත්පාද 33 ලැබෙන ආකාරය දක්වන්න.

18. වේදනා ත්‍රිකය සර්වලබ්ධනාම ත්‍රිකයක් වනුයේ කෙසේ ද?

19. කවර හේතුවක් නිසා සුඛ වෙදනා 63 ආදි වශයෙන් කීමට ලැබෙන්නේ ද?

20. වේදනා ත්‍රිකය තුළ වූ පදත්‍රයෙහි ස්වරූපාර්ථයන්හි ඇතුළත් නොවන්නා වූ ධර්මයන් දක්වන්න.

3. විපාක ත්‍රිකය

21. 'විපාකා ධම්මා' පදයෙහි 'වි' ශබ්දයේ අර්ථය ප්‍රකට කරමින් කවර හේතුවකින් 'විපාක' යැයි කීමට ලැබෙන්නේ ද යැයි දක්වන්න.

22. නාම විපාක, රූප විපාක යන අර්ථ දෙක 'විපාකා ධම්මා' සඳහා ගැනීමට සුදුසු වනුයේ කවර හේතූන් නිසා ද? විස්තර කරන්න.

23. 'විපාකා ධම්මා' පදයේ ස්වරූපාර්ථ ලෙස චෛතසික 38 ක් උද්ධරණය කරනුයේ නමුදු දුක්ඛ සත්‍ය සංග්‍රහයේ දී චෛතසික 35 යැයි උද්ධරණය කරනුයේ කවර හේතුවක් නිසා ද යැයි දක්වා 'විපාකධම්මධම්මා' පදයෙහි ඇතුළත් 'ධම්ම' යන ශබ්ද දෙකෙහි අර්ථ වෙනස පැහැදිලි කරන්න.

4. උපාදින්න ත්‍රිකය

24. උපාදින්නුපාදානියා යන්නෙහි උපාදාන, උපාදානිය, උපාදින්න යන පදයන්ගේ ස්වරූපාර්ථ වෙන වෙනම දක්වන්න.

පටුන වෙත

25. අභිධර්මාර්ථ සංග්‍රහයේ දී කර්මජ රූප 18 යැයි දක්වනුයේ නමුදු මෙහි දී කර්මජ රූප 20 යැයි කවර නය ක්‍රමයකින් දක්වනුයේ ද?

26. දෙවන සහ තෙවන පදයේ ස්වරූපාර්ථ සඳහා සුඛුමරූප නවය හා ඒකාදශයත් සුඛුමරූප දශය හා දොළොසත් ලැබෙන ආකාරය විස්තර කරන්න.

5. සංකිලිට්ඨ ත්‍රිකය

27. සංකිලිට්ඨ, සංකිලෙස, සංකිලෙසික නම් ධර්මයන්ගේ ස්වරූපාර්ථ වෙන් වෙන් වශයෙන් දක්වන්න.

28. සංකිලිට්ඨ වන්නා වූ සංකිලෙස නොවන්නා වූ ධර්මයන්, සංකිලිට්ඨ නො වී සංකිලෙස වන්නා වූ ධර්මයන්, සංකිලිට්ඨ ද වන්නා වූ සංකිලෙස ද වන්නා වූ ධර්මයන්, සංකිලිට්ඨ ද නොවන්නා වූ සංකිලෙස ද නොවන්නා වූ ධර්මයන් දක්වන්න.

29. සංකිලිට්ඨ වන්නා වූ සංකිලෙසික වන්නා වූ ධර්මයන්, සංකිලිට්ඨ නො වී සංකිලෙසික වන්නා වූ ධර්මයන්, සංකිලිට්ඨ නොවන්නා වූ සංකිලෙසික වන්නා වූ ධර්මයන්, සංකිලිට්ඨ වන්නා වූ සංකිලෙසික ද නොවන්නා වූ ධර්මයන්, සංකිලිට්ඨ ද නොවන්නා වූ සංකිලෙසික ද නොවන්නා වූ ධර්මයන් දක්වන්න.

6. විතර්ක ත්‍රිකය

30. සවිතක්ක ධර්ම, සවිචාර ධර්ම, අවිතක්ක ධර්ම, අවිචාර ධර්ම වෙන් වෙන් වශයෙන් දක්වන්න.

31. සවිතක්කසවිචාර, අවිතක්කවිචාරමත්ත, විතක්කමත්තඅවිචාර, අවිතක්කඅවිචාර ධර්මයන්ගේ ස්වරූපාර්ථ වෙන් වෙන් වශයෙන් දක්වන්න.

32. ලෞකික සවිතක්කසවිචාර සිත් දක්වා විතර්ක ත්‍රිකයෙහි මාර්චිත්තෝත්පාද ධර්මයන් 28, ඵල චිත්තෝත්පාද 35 ලැබෙන ආකාරය දක්වන්න.

33. විතර්ක 55 සත්‍ය සංග්‍රහයෙහි ඇතුළත් කොට විතර්ක ත්‍රිකයෙහි ඇතුළත් නොවන පද දක්වන්න.

34. ලෞකික අවිතක්කඅවිචාර සිත් දක්වා ද්විතීයධ්‍යාන සිත් ඒකාදශයෙහි ඇති විචාර 11 සත්‍ය සංග්‍රහයට ඇතුළත් කොට දක්වන්න.

7. ප්‍රීති ත්‍රිකය

35. 'ප්‍රීතිසහගතා' පදයෙහි 'සහගතා' පදය සම්පයෝග වශයෙන් පැවතීම, සහජාත වශයෙන් පැවතීම යන දෙක අතරින් කවරක් අර්ථය ලෙස ගැනීම සුදුසු වන්නේ ද යැයි දක්වා කවර හේතුවකින් 'උපෙක්ඛා' යැයි කීමට ලැබෙන්නේ ද යැයි දක්වන්න.

36. ප්‍රීති ත්‍රිකයේ ප්‍රථම පදය පමණක් විශේෂ වේ. ද්විතීය සහ තෘතීය පදයන් වේදනා ත්‍රිකයෙන් ගෙන දේශනා කරන ලද්දේ ද?

37. ප්‍රීති ත්‍රිකයේ මාර්ග චිත්තෝත්පාද 38, ඵල චිත්තෝත්පාද 36 ලැබෙන ආකාරය පැහැදිලි කොට ත්‍රික මුක්ත පදයන් සියල්ල දක්වන්න.

38. සප්‍රීතික සුඛය, නිප්‍රීතික සුඛය වෙන් වෙන් වශයෙන් දක්වන්න.

8, 9. දස්සන ත්‍රිකය සහ දස්සනහෙතු ත්‍රිකය

39. 'දස්සන' යැයි ලැබෙන ධර්මයන් හේතු සහිතව දක්වමින් ගෝත්‍රභූ සිත දස්සන නාමය නොලැබීමට හේතුව ද පැහැදිලි කරන්න.

40. කවර හේතුවක් නිසා 'භාවනා' යැයි කියනු ලබන්නේ ද ? හේතු සහිතව පැහැදිලි කරන්න.

41. ප්‍රහාණය කටයුතු ධර්මතාවන් සහ ඒ ප්‍රහාණ කටයුතු ධර්මතාවන් සමඟ ප්‍රහාණය වන්නා වූ ක්ලේශයන් ද දක්වන්න.

42. ප්‍රහාණය කරනු ලබන ධර්මතාවන් සහ ඒවායින් ප්‍රහාණය කරන්නා වූ ධර්මයන් දක්වන්න.

43. සෝතාපත්ති මාර්ගය විසින් පමණක් ම ප්‍රහාණ කටයුතු ධර්මතාවන්, අර්හත් මාර්ගය විසින් පමණක් ම ප්‍රහාණ කටයුතු ධර්මතාවන්, යට මාර්ගත්‍රය විසින් ප්‍රහාණ කටයුතු ධර්මතාවන්, මාර්ගය සතර විසින් ප්‍රහාණ කටයුතු ධර්මතාවන් දක්වන්න.

44. 'නෙවදස්සනෙන න භාවනාය පහාතබ්බා ධම්මා' සඳහා ස්වරූපාර්ථ ලෙස පෙර පද දෙකින් ශේෂ වූ පද සියල්ල කවර හේතුවක් නිසා උද්ධරණය කරන ලද්දේ ද ?

45. 'දස්සනෙන පහාතබ්බහෙතුක', 'භාවනාය පහාතබ්බහෙතුක' යැයි කවර ධර්මයන් විශේෂයකට කියනු ලබයි ද ? වෙන වෙනම දක්වන්න.

10. ආචයගාමී ත්‍රිකය

46. 'ආචය' ධර්මයන් යනු මොනවාද? හේතු දක්වමින් පැහැදිලි කරන්න. මෙහි 'රැස් කිරීම' යනුවෙන් අදහස් කරනුයේ කුමක් ද?

47. ලෞකික කුශලාකුශලයන් ආචයගාමී යැයි කියනුයේ කවරක් නිසා දැයි දක්වන්න.

48. 'චය' නම් වූ ධර්මයන්, 'අපචය' නම් වූ ධර්මයන්, 'අපචයගාමී' නම් ධර්මයන් හේතු සහිතව දක්වන්න.

11. සෙක්ඛ ත්‍රිකය

49. 'සික්ඛා' සහ 'සෙක්ඛා' යැයි කියනු ලබන ධර්මයෝ කවරහු ද? එම ධර්මයන් සඳහා ඒ ඒ නම් ලැබීමට හේතු වෙන් වෙන්ව පැහැදිලි කරන්න.

50. 'අසෙක්ඛ' සඳහා ඒ නම ලැබෙන ආකාරය නය ක්‍රම දෙකෙන් ම පැහැදිලි කරන්න.

51. සෙක්ඛ ධර්මයන් සත අතරින් වෘද්ධතම ධර්මය වන අර්හත් මාර්ගය 'අසෙක්ඛ' යන නම ලැබීමට සුදුසු වුවත් අර්හත් ඵලය ම කවර හේතුවක් නිසා 'අසෙක්ඛ' සඳහා උද්ධරණය කරනු ලබන්නේ ද?

12. පරිත්ත ත්‍රිකය

52. කවර ධර්මයන් කවර හේතුන් නිසා පරිත්ත, මහග්ගත යැයි කියනු ලබන්නේ ද? විස්තර කරන්න.

53. 'පමාණ' නම් වූ ධර්මතා, 'අප්පමාණ' නම් වූ ධර්මතා හේතු සමඟින් පැහැදිලි කරන්න.

13. පරිත්තාරම්මණ ත්‍රිකය

54. "පරිත්ත ධර්මයෝ ම අරමුණු කිරීම් ඇත්තා වූ" යන පාඨයේ අදහස විස්තර කරන්න.

55. "ඒකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ" සහ "අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ" යන විශේෂණ පාඨයන්ගේ අදහස පැහැදිලි කරන්න.

56. පරිත්තාරම්මණ ත්‍රිකයෙහි ප්‍රථම පදයෙහි ස්වරූපාර්ථ සඳහා අප්පමඤ්ඤා ද ද්විතීය පදයේ ස්වරූපාර්ථ සඳහා විරති, අප්පමඤ්ඤාවන් කවර හේතුවක් නිසා අත්හරිනු ලබන්නේ ද?

57. පරිත්තාරම්මණ ත්‍රිකයෙහි තෘතීය පදයෙහි ස්වරූපාර්ථ සඳහා විරතිත්‍රය අත්හැරීමට සුදුසු වීමේ සහ නොඅත්හැරීමට සුදුසු වීමේ හේතු පැහැදිලි කරන්න.

58. පරිත්තාරම්මණ ත්‍රිකයෙහි කවර ධර්ම ත්‍රික මුක්ත වේ ද යන්න හේතු සහිතව පැහැදිලි කරන්න.

59. රූපාවචර සිත්හි අභිඥා ද්වය අත්හරිනු ලබනුයේ නමුදු සිත් ගණන උද්ධරණයේ දී ඒ සිත් නොඅත්හැරීමට හේතුව දක්වන්න.

60. පරිත්තාරම්මණ ත්‍රිකයේ ආරම්මණයන්ට අනුව ත්‍රිකවලට ඇතුළත් වන්නා වූ ධර්මයන් ද ත්‍රික මුක්ත වන්නා වූ ධර්මයන් ද දක්වන්න.

14. හීන ත්‍රිකය

61. කවර ධර්මයන් හීන, මජ්ඣිම, පණීත යැයි කියනු ලබන්නේ ද? හේතු සහිතව පැහැදිලි කරන්න.

62. මාර්ග, ඵල හා නිර්වාණය සඳහා පණීත යැයි නම ලැබෙනුයේ කුමක් නිසා දැයි විස්තර කරන්න.

15. මිච්ඡත්ත ත්‍රිකය

63. පඤ්චානන්තර්ය කර්ම සහ නියත මිථ්‍යාදෘෂ්ටිය සඳහා 'මිච්ඡත්ත' යන නම ලැබෙනුයේ කුමක් නිසා ද? 'නියත' යන නම ලැබීමට හේතුව කුමක් ද? වෙන් වෙන් වශයෙන් දක්වන්න.

පටුන වෙත

64. පඤ්චානන්තර්‍ය කර්ම සිදුකළ කල්හි කවර කර්මයක් විපාක දෙන්නේ ද? සියලු කර්ම ප්‍රතිසන්ධි විපාක ගෙන දෙන්නේ ද? විපාක දීමට අවසරයක් නොලබන්නා වූ කර්මයෝ ආනන්තරිය ස්වභාව වන්නාහු ද? නියත ස්වභාව වන්නාහු ද? විස්තර සහිතව විනිශ්චය දක්වන්න.

65. නියත මිථ්‍යාදෘෂ්ටියේ ස්වභාවය ස්වරූප, අභිප්‍රාය සමඟ පැහැදිලි කරන්න.

66. ආනන්තර්‍ය සහ පඤ්චානන්තර්‍යන්ගේ ස්වභාවය වෙන වෙනම විස්තර කරන්න.

67. ආනන්තර්‍ය කර්ම පස සිදුකළහොත් ඒවායේ ශක්ති සම වේ ද? ඉන් කවර කර්මයක් ගරුක වේ ද?

68. මිච්ඡත්ත ත්‍රිකයේ ප්‍රථම පදයේ ස්වරූපාර්ථ සඳහා දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරෙහි සප්තම ජවනය සහ ද්වේෂ මූල සිත් දෙකෙහි සප්තම ජවනය උද්ධරණය කිරීමේ හේතුව දක්වමින්, සෙසු ජවනයන් කවර පදයක ඇතුළත් වේ ද යන්න හේතු සහිතව පැහැදිලි කරන්න.

69. මාර්ග සිත් සතර සඳහා 'සම්මත්ත' යන නම සහ 'සම්මත්තනියත' යන නම ලැබෙනුයේ කවරක් නිසා දැයි දක්වන්න.

16. මග්ගාරම්මණ ත්‍රිකය

70. 'මග්ග' යැයි කීමට හේතුව දක්වා මාර්ගය අරමුණු කරන්නා වූ සිත් සහ අරමුණු කරන්නා වූ පුද්ගලයන් ද දක්වන්න.

71. යට යට මාර්ග ඵලලාභීන් හට මතු මතු මාර්ග කවර හේතුවක් නිසා අරමුණු කිරීමට නො හැකි වේ ද?

72. පෘථග්ජන පුද්ගලයන්ට සහ මාර්ගඵල ලාභීන්ට මාර්ගය අරමුණු කිරීමට හැකිවීමට හෝ නොහැකිවීමට හේතූන් වෙන් වෙන් වශයෙන් දක්වන්න.

73. මාර්ගය අරමුණු කිරීමට හැකි පුද්ගලයන්ගේ මාර්ගය අරමුණු කරන්නා වූ සිත් සහ ඒ ඒ අරමුණු කරන්නා වූ මාර්ගයන් වෙන් වෙන් වශයෙන් දක්වන්න.

74. මග්ගාරම්මණ ත්‍රිකයේ පළමු පදයේ ස්වරූපාර්ථයන්හි විරති සහ අප්‍රමාණ්‍යයන් කවර හේතුවක් නිසා අත්හරිනු ලබන්නේ ද?

75. මාර්ගය අරමුණු කරන්නා වූ සිත් ඒකාන්තාරම්මණික ද? අනේකාන්තාරම්මණික ද? පැහැදිලි කරන්න.

76. 'මග්ගාහෙතුකා ධම්මා' පදයේ ප්‍රථම නය ක්‍රමයේ අදහසට අනුව 'මග්ගහෙතු', 'මග්ගහෙතුක' පදයන්හි ස්වරූපාර්ථයන් දක්වන්න.

77. ද්විතීය සහ තෘතීය නය ක්‍රමවල අදහසට අනුව 'මග්ගහෙතු', 'මග්ගහෙතුක' පදයන්හි ස්වරූපාර්ථයන් දක්වන්න.

78. 'අධිපති' පදයේ අර්ථය දක්වා 'මග්ගාධිපතිනො' යන පදයේ අර්ථය ද විස්තර කරන්න.

79. මාර්ගය ගරු කරමින් අරමුණු කරන්නා වූ සිත් හා ගරු කරමින් අරමුණු කරන්නා වූ පුද්ගලයන් දක්වන්න.

80. මාර්ගය ගරු කරමින් අරමුණු කරන්නා වූ පුද්ගලයන් සහ ඒ පුද්ගලයන් විසින් ගරුකරමින් අරමුණු කරන්නා වූ සිත් සහ මාර්ග දක්වන්න.

81. සහජාතාධිපති ධර්මයන් සාධක සහිතව දක්වා "මාර්ගය ම සහජාතාධිපති ප්‍රත්‍යය කොට ඇත්තා වූ" ධර්මයන් ද දක්වන්න.

82. 'මග්ගාධිපතිනො ධම්මා' පදයේ දෙවන අර්ථ විකල්පයට අනුව 'විරියාධිති ප්‍රත්‍යය ලැබෙන කල්හි වීර්ය වර්ජිත චෛතසික පන්තිස් චෛතසිකයෝ ද වීමංසාධිපති ප්‍රත්‍යය ලැබෙන කල්හි වීමංසා වර්ජිත පන්තිස් චෛතසිකයෝ ද ලැබෙන්නාහ' යන ප්‍රකාශනයේ හේතුව දක්වන්න.

83. "මාර්ගය ම සහජාතාධිපති ප්‍රත්‍යය කොට ඇත්තා වූ" යන තෘතීය පදයේ තුන්වන අර්ථ විකල්පයේ ස්වරූපාර්ථ සඳහා අධිපති බවට පත් වන්නා වූ විරිය, වීමංසා චෛතසික ලැබීමේ හේතුව දක්වන්න.

84. මාර්ගය කිසිසේත් අරමුණු කිරීමට නො හැකි සිත් සියල්ල දක්වන්න.

85. මාර්ග සිත් සතර මාර්ගය අරමුණු කිරීමට නො හැකි ධර්මයෝ නො වෙත් ද? එසේ නම් කවර හේතුවක් නිසා මාර්ගය අරමුණු නොකරන ස්වරූපාර්ථයන්හි මාර්ග සිත් සතර අත්හැරේ ද?

86. මග්ගාරම්මණ ත්‍රිකයේ ත්‍රික මුක්ත ධර්මයන්හි 'මාර්ගය අරමුණු කිරීමට නො හැකි, මාර්ගය අරමුණු නොකරන්නා වූ (මාර්ගය අරමුණු නොකරන අවස්ථාවල දී)' යන පාඨයන්හි අදහස පැහැදිලි කරන්න.

17. උප්පන්න ත්‍රිකය

87. 'උප්පන්න' නම් වූ ධර්මයන් හේතු සහිතව පැහැදිලි කොට ප්‍රත්‍යුත්පන්න තුන හා ප්‍රත්‍යුත්පන්න සතර දක්වමින් 'උප්පන්නා ධම්මා' සඳහා අදහස් කෙරෙන ප්‍රත්‍යුත්පන්නය දක්වන්න.

88. 'අනුප්පන්නා ධම්මා' පදයේ 'උපන්න' නම් වූ ධර්මයන්, 'අනුප්පන්න' නම් වූ ධර්මයන්, 'අනුප්පන්නා ධම්මා' සඳහා ගත යුතු ධර්මයන් වෙන් වෙන් වශයෙන් දක්වන්න.

89. 'උප්පාදිනො' ධර්මයන් කවරක්දැයි දක්වා උප්පන්න ත්‍රිකයේ අතීතයට අයත් (අතීත වන්නා වූ) චිත්ත, චෛතසික, රූප යන ධර්මයන් ත්‍රික මුක්ත ලෙස උද්ධරණය නොකිරීමේ හේතුව දක්වන්න.

18. අතීත සහ අතීතාරම්මණ ත්‍රිකය

90. අතීත, අනාගත, ප්‍රත්‍යුත්පන්න පදයන්ගේ අභිප්‍රායයන් වෙන වෙන ම දක්වන්න.

91. අතීත ත්‍රිකයෙහි නිර්වාණය කවර හේතුවක් නිසා ත්‍රික මුක්ත වන්නේ ද?

92. අතීතාරම්මණ ත්‍රිකයේ පද තුනෙහි ම අප්‍රමාණ්‍ය අත්හරිමින් ස්වරූපාර්ථ දක්වනුයේ කවර හේතුවක් නිසා ද?

93. අනාගතාරම්මණා පදයේ විරති අත්හැරීමට හා නොඅත්හැරීමට හේතු විස්තර කරන්න.

94. අතීතාරම්මණ ත්‍රිකයේ ත්‍රික මුක්ත ධර්මයන් දක්වන ස්ථානයෙහි "අප්‍රමාණ්‍ය ධර්මය ඒකාන්තයෙන් අරමුණු කරන" යන

ප්‍රකාශනයෙහි කවර ධර්මයක් අප්‍රමාණ්‍ය යැයි දැක්වීමට සුදුසු වේ ද?

95. ත්‍රික මුක්තකයන් දැක්වීමේදී "අප්‍රමාණ්‍ය ධර්මයන් අනේකාන්තයෙන් අරමුණු කරන" යන තැන විරති අප්‍රමාණ්‍ය ධර්මයන් අත්හරිනු ලබන්නේ කවර හේතු නිසා ද?

21. අජ්ඣත්තාරම්මණ ත්‍රිකය

96. අජ්ඣත්ත, බහිද්ධ යන පදයන්ගේ අභිප්‍රාය දක්වන්න.

97. 'අජ්ඣත්තා ධම්මා' පදයෙහි අජ්ඣත්ත ස්වරූපය අභිප්‍රාය, ස්වරූපාර්ථ සමඟින් දක්වා මෙහි අදහස් කෙරෙන අජ්ඣත්තය ද දක්වන්න.

98. 'අජ්ඣත්තාරම්මණා ධම්මා' පදයෙහි ස්වරූපාර්ථ සඳහා කවර හේතුවක් නිසා ඉස්සා, මච්ඡරිය අත්හරිනු ලබයි ද?

99. අජ්ඣත්තාරම්මණ ත්‍රිකයේ පද තුනෙහි ම මච්ඡරිය ඇතුළත් නොකිරීමේ හේතු දක්වන්න.

22. සනිදස්සන ත්‍රිකය

100. 'නිදස්සන', 'සනිදස්සන' පදයන්ගේ අභිප්‍රායයන් දක්වන්න.

101. සනිදස්සන, අනිදස්සන, සප්පටිඝ, අප්පටිඝ යන ධර්මයන්ගේ ස්වරූපාර්ථ දක්වන්න.

102. සනිදස්සන ද වන්නා වූ සප්පටිඝ ද වන්නා ධර්මයන්, සනිදස්සන නොවන්නා වූ සප්පටිඝ ධර්මයන්, සනිදස්සන පමණක් වන්නා වූ සප්පටිඝ නොවන්නා වූ ධර්මයන්, සනිදස්සන ද නොවන්නා වූසප්පටිඝ ද නො වන්නා වූ ධර්මයන් වෙන වෙන ම දක්වන්න.

103. ආදිලබ්ධනාම ත්‍රිකයන් සහ සර්වලබ්ධනාම ත්‍රිකයන් දක්වන්න.

104. සප්‍රදේශ සහ නිප්‍රදේශ ත්‍රික දක්වන්න.

- ත්‍රික මාතිකා ස්වරූපාර්ථ නිමි -

පටුන වෙත

පටුන වෙත

අභිධර්ම දුක මාතිකා ස්වරූපාර්ථ

01. හේතු ගොච්ඡකය

තිකමාතිකා දේශනාවට අනතුරුව දුකමාතිකාව දේශනා කොට වදාළ සේක. ඒ දුක මාතිකාව ද හේතු ගොච්ඡකය, චුල්ලන්තර දුකය, ආසව ගොච්ඡකය, සඤ්ඤෝජන ගොච්ඡකය, ගන්ථ ගොච්ඡකය, ඕඝ ගොච්ඡකය, යෝග ගොච්ඡකය, නීවරණ ගොච්ඡකය, පරාමාස ගොච්ඡකය, මහන්තර දුකය, උපාදන ගොච්ඡකය, කිලේස ගොච්ඡකය, පිට්ඨිදුකය වශයෙන් තෙළෙස් වැදෑරුම් වන්නේය.

හේතු ගොච්ඡකය

දුකය	පාලිය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
			ස්	ආ	ධා	ස
හේතු	හෙතු ධම්මා	ලොභ -පෙ- අමෝහ (හේතු 6)	1	1	1	3
	න හෙතු ධම්මා	සිත් 89, චෛ-46, රූප-28, නිර්වාණය	5	12	18	3
සහේතුක	සහෙතුකා ධම්මා	සහේතුක සිත්-71, මෝහමූල දෙසිතේ මෝහය හැර චෛ-52	4	2	2	3
	අහෙතුකා ධම්මා	අහේතුක සිත්-18, චෛ-12 (ඡන්දය හැර), මෝහමූල දෙසිතේ මෝහය, රූප-28, නිර්වාණය	5	12	18	2
හේතුසම්පයුත්ත	හෙතුසම්පයුත්තා ධම්මා	සහේතුක සිත්-71, මෝහමූල දෙසිතේ මෝහය හැර චෛ-52	4	2	2	3
	හෙතුවිප්පයුත්තා ධම්මා	අහේතුක සිත්-18, චෛ-12 (ඡන්දය හැර), මෝහමූල දෙසිතේ මෝහය, රූප-28, නිර්වාණය	5	12	18	2

පටුන වෙත

හේතුසහිත	හෙතු චෙව ධම්මා සහෙතුකා ච	මෝහමූල දෙසිතේ මෝහය හැර හේතු 6	1	1	1	3
	සහෙතුකා චෙව ධම්මා න ච හෙතු	සහේතුක සිත්-71, චෙ-46 (හේතු 6 හැර)	4	2	2	2
	දුක මුක්ත	අහේතුකා ධම්මාහි පැමිණෙන ස්වරූපාර්ථ අහේතුක සිත්-18, චෙ-12 (ඡන්දය හැර), මෝහමූල දෙසිතේ මෝහය, රූප-28, නිර්වාණය				
හේතුසම්පයුත්ත	හෙතු චෙව ධම්මා හෙතුසම්පයුත්තා ච	මෝහමූල දෙසිතේ මෝහය හැර හේතු 6	1	1	1	3
	හෙතුසම්පයුත්තා චෙව ධම්මා න ච හෙතු	සහේතුක සිත්-71, චෙ-46 (හේතු 6 හැර)	4	2	2	2
	දුක මුක්ත	හේතුවිප්පයුත්තා ධම්මා වල පැමිණෙන ස්වරූපාර්ථ අහේතුක සිත්-18, චෙ-12 (ඡන්දය හැර), මෝහමූල දෙසිතේ මෝහය, රූප-28, නිර්වාණය				
හේතුරහිත	න හෙතු ඛො පන ධම්මා සහෙතුකාපි	සහේතුක සිත්-71, චෙ-46	4	2	2	2
	න හෙතු ඛො පන ධම්මා අහෙතුකාපි	අහේතුක සිත්-18, චෙ-12 (ඡන්දය හැර), රූප-28, නිර්වාණය	5	12	18	2
	දුක මුක්ත	හෙතු ධම්මා හි පැමිණෙන ස්වරූපාර්ථ ලොභ -පෙ- අමෝහ (හේතු 6)				

පටුන වෙත

ඔවුන් තෙළෙස අතුරෙන් හේතුගොච්ඡකය[1] පළමු කොට වදළ සේක. එය ද හේතු දුකය, සහේතුක දුකය, හේතු සම්ප්‍රයුත්ත දුකය, හේතු සහේතුක දුකය, හේතු හේතු සම්පයුත්ත දුකය, නහේතු සහේතුක දුකයයි සවැදැරුම් වන්නේය.

හෙතු දුකය

ඔවුන් අතුරෙන් හෙතු දුකය පළමු කොට වදළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදැරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළසේක. කෙසේ වදළ සේක්ද

---

1. **ගොච්ඡක** - (ගුපතී'ති = ගොච්ඡකො). මලින් මල එකතු කොට සකසනා ලද මල් ඉති, මල් කළඹ, මල් දාම, මල් වඩම් "ගොච්ඡක" නම් වේ. (ගුපො භූ ගොපනින්දාසු, දි බ්‍යාකුලෙ චු ද්විත්තියං - ධාත්වත්ථ සඞ්ගහ).

මල් ඉත්තක්, මල් කළඹක්, මල් දාමයක්, මල් වඩමක් මෙන් හෙතු, සහෙතුක ආදී වශයෙන් දුකයෙන් දුකය සම්බන්ධ කරමින් සමූහගත කොට ඇත්තා වූ දුක සමූහය සදිසූපාරචාර නයෙන් "ගොච්ඡක" නම් වේ.

මල් ඉත්තක පොහොට්ටු ආදිය ගොනු වී පවතියි. මල් දමක පහල ඇති මල් ඉහළ ඇති මල් නටු සමඟ බැඳ සම්බන්ධ කොට සමූහගත වී පවතියි. මල් වඩම්වල ද මල් ඉති සෙසු මල් වල ඉති සමඟ සම්බන්ධ කොට සමූහගත වී පවතී. මල් කළඹවල්හි ද එසේ සමූහගත වී පවතී.

එමෙන් හෙතු දුකය හා සමඟ සහෙතුකා දී දුකයන් ද හේතු ශබ්දය විසින් ශබ්දාර්ථ වශයෙන් එකිනෙකට සම්බන්ධ කරයි. එම නිසා ඒ දුකයන්ගේ සමූහයට "හෙතුගොච්ඡක" යැයි කියනු ලැබේ. "ආසවගොච්ඡක" ආදිය සඳහා ද නම ලැබෙන්නේ මේ ක්‍රමයට ය. (මල් කළඹ, මල් දාම මෙන් ශබ්දාර්ථ වශයෙන් සමූහගත ව ඇත්තා වූ දුක සමූහය "ගොච්ඡක" නම් වේ යැයි දත යුතු වේ).

පටුන වෙත

යත්, **හේතු ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක, කෙසේ වදාළ සේක්ද යත්, **න හේතු ධම්මා** යනුවෙනි.

හෙතු ධම්මා [2] - මූලාර්ථයෙන් හේතු නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නහෙතු ධම්මා - මූලාර්ථයෙන් හේතු නම් නොවන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

හෙතු ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වාරූපාර්ථ වශයෙන් වනාහි, ලෝභ දෝස මෝහ ආලෝභ අදෝස අමෝහ නම් වූ චෛතසික සයදෙන ලැබෙන්නාහ.

ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් එකම සංස්කාර ස්කන්ධයකි. ආයතන වශයෙන්, ධර්මායතනයකි. ධාතු වශයෙන්, ධර්මධාතුවකි. ආර්ය සත්‍ය වශයෙන් වනාහි තුනකි.

ලෞකික සහේතුක තෙසැටක් සිත්හි යෙදුනා වූ ලෝභය වර්ජිත හේතු ධර්ම පස් දෙන දුක්ඛ සත්‍යය නම් වන්නේය. ලෝභ හේතුව

---

2. **හෙතු** - (හිනොති පතිට්ඨාති එත්ථා'ති = හෙතු). ගසක මුලක් එම ගස ශක්තිමත් කරන්නාක් මෙන් සහේතුක නාමස්කන්ධ, සහේතුක චිත්තජ රූප, සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූප යන ප්‍රත්‍යයෝත්පන්න ධර්ම ශක්තිමත් කරන්නා වූ ලෝභ ආදී හේතු සය "හේතු" නම් වේ. එම හේතු වර්ග සතරකි

(අ) හෙතුහෙතු - හේතු සය

(ආ) උත්තමහෙතු - කුසල අකුසල

(ඉ) පච්චයහෙතු - පට්ඨානයේ ප්‍රත්‍යය යැයි පැමිණෙන හේතු

(ඊ) සාධාරණහෙතු - අවිද්‍යාදි පටිච්චසමුප්පාද හේතු

මෙම හේතු වර්ග සතර අතරින් මෙහිදී 'හෙතුහෙතු' අදහස් කරනු ලැබේ. එම නිසා හේතු සඳහා හේතු සය ගනු ලැබේ. (මූලට්ඨෙන හේතුසඞ්ඛාතා ධම්මා - අට්ඨකථා).

සමුදය සත්‍යය නම් වන්නේය. සතර මාර්ග සම්ප්‍රයුක්ත වූ අමෝහ හේතු සතර දෙන මාර්ග සත්‍යය නම් වන්නේය. සතර මාර්ග සම්ප්‍රයුක්ත වූ අලෝභ අදෝස හේතු ධර්ම දෙක සහ ඵල සම්ප්‍රයුක්ත අලෝභ අදෝස අමෝහ හේතු ධර්මයෝ සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

නහෙතු ධම්මා - ද්විතිය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි, සිත් එකුන් අනූව ද, හේතු සදෙන වර්ජිත චෛතසික සසාලිස ද, රූප අටවිස්ස ද නිර්වාණය ද ලැබෙන්නාහ.

ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේද යත්, අට විසි රූපය රූපස්කන්ධය නම් වන්නේය. චෛතසික සසාලිස අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේය. සඤ්ඤව සංඥස්කන්ධය නම් වන්නේය. ඉතිරි සූසාලිස් චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේය. එකුන් අනූ චිත්තය විඥනස්කන්ධය නම් වන්නේය. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත නම් වන්නේය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේය. ස්‍රෝත්‍ර ප්‍රසාදය සෝතායතනය නම් වන්නේය. ඝ්‍රාණ ප්‍රසාදය ඝානායතනය නම් වන්නේය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේය.

වර්ණ රූපය රූපායතනය නම් වන්නේය. ශබ්ද රූපය සද්දයතනය නම් වන්නේය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේය. රස රූපය රසායතනය නම් වන්නේය. පඨවි තෙජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේය. එකුන් අනූ චිත්තය මනායතනය නම් වන්නේය.

චෛතසික සසාලිසද, ආපෝධාතු ඉත්ථින්ද්‍රිය පුරිසින්ද්‍රිය හදය රූප ජීවිත රූප ආහාර රූප ආකාස රූප කායවිඤ්ඤත්ති රූප වචීවිඤ්ඤත්ති රූප ලහුතා රූප මුදුතා රූප කම්මඤ්ඤතා රූප

උපචය රූප සන්තති රූප ජරතා රූප අනිච්චතා රූප යන සුඛුමරූප සොළස ද නිර්වාණය ද ධම්මායතනය නම් වන්නේය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත් අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේය. සෝත්‍ර ප්‍රසාදය සෝතධාතුව නම් වන්නේය. ඝ්‍රාණ ප්‍රසාදය ඝාන ධාතුව නම් වන්නේය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේය.

වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේය. රස රූපය රස ධාතුව නම් වන්නේය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේය.

චක්ඛු විඤ්ඤාණ යුගලය චක්ඛු විඤ්ඤාණ ධාතුව නම් වන්නේය. සෝත විඤ්ඤාණ යුගලය සෝත විඤ්ඤාණ ධාතුව නම් වන්නේය. ඝාන විඤ්ඤාණ යුගලය ඝාන විඤ්ඤාණ ධාතුව නම් වන්නේය. ජිව්හා විඤ්ඤාණ යුගලය ජිව්හා විඤ්ඤාණ ධාතුව නම් වන්නේය. කාය විඤ්ඤාණ යුගලය කාය විඤ්ඤාණ ධාතුව නම් වන්නේය. පඤ්චද්වාරාවර්ජන චිත්තය සහ සම්පටිච්ඡන යුගලය මනෝ ධාතුව නම් වන්නේය. ඉතිරි සසැත්තෑ චිත්තය මනෝ විඤ්ඤාණ ධාතුව නම් වන්නේය.

චෛතසික සසාලිස ද, ආපෝධාතු ඉත්ථින්ද්‍රිය පුරිසින්ද්‍රිය හදය රූප ජීවිත රූප ආහාර රූප ආකාශ රූප - කාය විඤ්ඤත්ති රූප වචීවිඤ්ඤත්ති රූප ලහුතා රූප මුදුතා රූප කම්මඤ්ඤතා රූප උපචය රූප සන්තති රූප ජරතා රූප අනිච්චතා රූප යන සුඛුමරූප සොළස ද නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේය. මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නාහ.

ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේද යත්, ලෞකික සිත් එක් අසූව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සසාලිසද, අටවිසි රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේය. නිර්වාණය නිරෝධ සත්‍යය නම් වන්නේය. සතර මාර්ග සම්ප්‍රයුක්ත සම්මා දිට්ඨි වර්ජිත මාර්ගාංග සත්දෙන එක් වරක් ද සම්මා සංකප්ප වර්ජිත සය දෙන

සතර වරක් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද සත්විසි දෙන ද ඵල චිත්තෝත්පාද සූතිස් දෙන ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.[3] [4]

ස්වරූප බෙදීම

හේතු - හේතු නම් වූ ධර්මයන්හි ලෝභ, දෝස, මෝහ, අලෝභ, අදෝස, අමෝහ යනුවෙන් හේතු සයක් වේ. (සෙසු පරමාර්ථ ධර්මයෝ 'න හෙතු' නම් ධර්මයෝ වෙත්.)

සහෙතුක (හෙතු සම්පයුත්ත) - හේතු සමඟ සම්ප්‍රයුක්ත වන්නා වූ සහේතුක සිත් 71, මෝහ මූල සිත් දෙකෙහි ඇති මෝහය හැර චෛතසික 52 වේ. (සෙසු පරමාර්ථ ධර්මයෝ 'අහේතුක - හෙතුවිප්පයුත්ත' - හේතුන් හා සමඟ විප්‍රයුක්ත නම් ධර්මයෝ වෙත්)

මෝහ මූල සිත් දෙකෙහි ඇති මෝහය වෙනත් හේතු ධර්මයක් සමඟ සම්ප්‍රයුක්ත නොවන අතර 'සහෙතුක' හෝ 'හෙතු සම්පයුත්ත' යන කීමට නො හැක. 'අහෙතුක' 'හෙතු විප්පයුත්ත' යැයි කියනු ලැබේ. එම නිසා ඒ සහෙතුකා සහ හෙතුසම්පයුත්තා සඳහා වන ස්වරූපාර්ථයන්හි ඇතුලත් නොකොට අහේතුකා සහ

---

3. **මාර්ග චිත්තෝත්පාද සත්විසි දෙන** - 'න හෙතු ධම්මා' පදයේ ස්වරූපාර්ථයන්හි මාර්ග සිත් සතරෙහි අලෝභ, අද්වේෂ, අමෝහ හැර චෛතසික 33ක් යෙදෙයි. ඒවා අතරින් සත්‍ය සංග්‍රහයට යන්නා වූ මාර්ගාංග සත අඩුකළ විට චෛතසික 26ක් ඉතිරි වේ. මාර්ග සිත් සතර ඒකත්වයෙන් ගෙන එම චෛතසික එකතු කළ විට මාර්ග චිත්තෝත්පාද 27ක් ලැබේ.

4. **ඵල චිත්තෝත්පාද සූතිස් දෙන** - ඵලසිත් සතරෙහි ද අලෝභ, අද්වේෂ, අමෝහ හැර චෛතසික 33ක් යෙදෙත්. ඵල සිත් සතර ඒකත්වයෙන් ගෙන එම චෛතසික එකතු කළ විට මාර්ග චිත්තෝත්පාද 34ක් ලැබේ.

හෙතුවිප්පයුත්තා සඳහා වන ස්වරූපාර්ථයන්හි ඇතුලත් කරනු ලැබේ.

එම මෝහ මූල සිත් දෙකෙහි ඇති මෝහය ඉවත් කරනුයේ නමුදු ලෝභ මූල, දෝස මූල සිත් දෙකෙහි යෙදෙන මෝහය ඉතිරි ව ඇති බැවින් චෛතසික ගණනයේ දී අඩු කරනු නො ලැබේ. චෛතසික දෙපණස ම ගනු ලැබේ.

හෙතු දුකය යි.

සහෙතුක දුකය

හෙතු දුකයට අනතුරුව සහෙතුක දුකය වදළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **සහේතුකා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **අහේතුකා ධම්මා** - යනුවෙනි.

සහෙතුකා ධම්මා - සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් සම්ප්‍රයුක්ත හේතු ඇත්තා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අහෙතුකා ධම්මා[5] - සම්ප්‍රයුක්ත හේතු නැත්තා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සහෙතුකා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි සහේතුක සිත් එක් සැත්තෑව ද මෝහ මූල දෙසිතෙහි මෝහය වර්ජිත චෛතසික දෙපණසද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි.

---

5. **සහෙතුකා** - (සහ හෙතුනා යෙ වත්තන්තී'ති = සහෙතුකා). හේතු සමඟ පවතින්නා වූ (යෙදෙන්නා වූ) ධර්මයෝ 'සහෙතුක' නම් වේ. (සම්පයොගො පවත්තෙන සහහෙතුනා'ති=සහෙතුකා).

අහෙතුකා - (නත්ථි හෙතු එතෙසන්'ති = අහෙතුකා). සම්ප්‍රයුක්ත හේතු නොමැති ධර්මයන් "අහෙතුක" නම් වේ.

ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙර සේ විස්තර කරනු)

අහෙතුකා ධම්මා - යන ද්විතිය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි අහේතුක සිත් අටළොස ද, ඡන්ද වර්ජිත අන්‍ය සමාන චෛතසික දොළස ද, මෝහ මූල දෙසිතෙහි මෝහය ද, අටවිසි රූපය ද නිර්වාණයද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ විස්තර කරනු)

මේ ශබ්දවලිය හෙවත් සහේතුක දුකය. පරමාර්ථ ධර්මයන් පද දෙකක් කොට වදළ හෙයින් දුක නම් වන්නේය. මුල් පදයෙන් ලත් නම් ඇති හෙයින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේය. සියලු පරමාර්ථ ධර්ම මෙහි ඇතුලත් හෙයින් නිස්ප්‍රදේශ දුක නම් වන්නේය.

සහෙතුක දුකය යි.

හෙතුසම්පයුත්ත දුකය

සහෙතුක දුකයට අනතුරුව හෙතුසම්පයුත්ත දුකය වදළ සේක. එයද ප්‍රථම පදය ද්විතිය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **හෙතුසම්පයුත්තා ධම්මා** - යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **හෙතුවිප්පයුත්තා ධම්මා** - යනුවෙනි.

හෙතුසම්පයුත්තා ධම්මා - හේතු ධර්මයන් සමඟ ඒකෝත්පාදාදී භාවයෙන් මිශ්‍ර වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

හෙතුවිප්පයුත්තා ධම්මා[6] - හේතු ධර්මයන් සමඟ එසේ මිශ්‍ර

---

6. **හෙතුසම්පයුත්තා** - (හෙතුනා සම්පයුත්තාති = හෙතුසම්පයුත්තා). හේතු ධර්මයන් සමඟ ඒකෝත්පාදාදී ලක්ෂණ ඇත්තාවූ ධර්මයෝ "හෙතු සම්පයුත්තා" නම් වේ.

නොවූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

හෙතුසම්පයුත්ත දුකය යි.

හෙතු සහෙතුක දුකය

හේතු සම්ප්‍රයුක්ත දුකයට අනතුරුව හෙතු සහෙතුක දුකය වදළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමුකොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **හෙතු චෙව ධම්මා සහෙතුකාච** - යනුවෙනි. ඉන් අන්තුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්,

---

හෙතුවිප්පයුත්තා - (හෙතුනා විප්පයුත්තා'ති = හෙතුවිප්පයුත්තා). හේතු ධර්මයන් සමඟ ඒකෝත්පාදාදී ලක්ෂණ නැත්තාවූ ධර්මයෝ "හෙතුවිප්පයුත්තා" නම් වේ.

ශබ්දය වෙනස් වන ස්වරූපාර්ථ සමාන වූ ද්විකයන් නැවතත් දේශනාකොට වදාළේ ඇයි? - සහේතුක ද්විකය සහ හෙතුසම්ප්‍රයුක්ත ද්විකයන්ගේ ශබ්ද පමණක් වෙනස් වේ. ස්වරූපාර්ථ වශයෙන් වෙනසක් නැත. මීට හේතුව නම් දේසනා විලාශ වශයෙන් (සහෙතුක, හෙතුසම්පයුත්ත ආදී වශයෙන් නොයෙක් ආකාරයෙන් පැවතීමෙන් මනෝඥ කරවන්නා වූ සර්වඥතාඥානය වශයෙන්) සහ පුද්ගල අධ්‍යාශය වශයෙනි (සහෙතුක, හෙතුසම්පයුත්ත ආදී වශයෙන් දේශනා කිරීමෙන් ම දේශනාව ශ්‍රවණය කරන ඇතැම් පුද්ගලයන්ගේ ආධ්‍යාශයට අනුකූල වේ).

සහේතුක සහ හේතු සම්ප්‍රයුක්ත දුකවල ශබ්දයෙන් දක්වන වෙනස - 'සහෙතුක' යන්නෙහි 'සහ' ශබ්දයෙන් චිත්තෝත්පාදයක උත්පාදයේ පටන් භංගය දක්වා හේතු ධර්ම සමඟ ආරම්මණ, වස්තු ආදී වශයෙන් සමාන වන්නා වූ සහේතුක ධර්මයන්ගේ හේතු ආදී ශක්තීන්ගෙන් (හේතු ප්‍රත්‍යය ආදී ප්‍රත්‍යයන් සමඟ) නොවෙන්ව පැවතීම දක්වයි. 'සම්පයුත්ත' ශබ්දය සහේතුක ධර්මයන්ගේ ඒකෝත්පාද ආදී ලක්ෂණයන්ගෙන් එක්ව පැවැත්ම දක්වයි.

සහෙතුකා චේව ධම්මා නව හෙතු - යනුවෙනි.

හෙතු චේව ධම්මා සහෙතුකා ච - හේතු නම් වූ ද හේතුන් සමඟ යෙදුනාවූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සහෙතුකා චේව ධම්මා නව හෙතු - හේතුන් සමඟ යෙදුනා වූ ද හේතුන් නොවන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සහෙතුකා චේව ධම්මා නව හෙතු - යන ද්විතිය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි, සහේතුක සිත් එක් සැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත හේතුන් සදෙන වර්ජිත සසාලිස් චෛතසිකයෝද ලැබෙන්නාහ. (පෙර සේ විස්තර කරනු)

ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේද යත්, ලෞකික සිත් තෙසැට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සසාලිස ද, දුක්ඛ සත්‍යය නම් වන්නේය. සතර මාර්ග සම්ප්‍රයුක්ත සම්මා දිට්ඨි වර්ජිත මාර්ගාංග සත්දෙන එක් වරක් ද සම්මා සංකප්ප වර්ජිත සය දෙන සතර වරක් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේය.

මේ ශබ්දවලිය හෙවත් හේතු සහේතුක දුකය වනාහි පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදළ බැවින් දුක නම් වන්නේය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේය. අහේතුක සිත් අටළොස ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දොළස ද මෝහ මූල දෙසිතෙහි මෝහය ද අටවිසි රූපය ද නිර්වාණය ද මේ දුකයට ඇතුලත් නොවන බැවින් සප්‍රදේශ දුක නම් වන්නේය.

හෙතු සහෙතුක දුකය යි.

හෙතු හෙතුසම්පයුත්ත දුකය

හෙතු සහෙතුක දුකයට අනතුරුව හෙතු හෙතුසම්පයුත්ත දුකය වදළ සේක. එය් ද ප්‍රථම පදය ද්විතීය පදය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමුකොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **හෙතු චේව ධම්මා හෙතුසම්පයුත්තා ච** යනුවෙනි.

ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **හෙතු සම්පයුත්ත චේව ධම්මා නව හෙතු** - යනුවෙනි.

හෙතු චේව ධම්මා හෙතුසම්පයුත්තා ච - හේතු නම් වූ ද හේතු ධර්මයන් සමඟ මිශ්‍ර වූද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

හෙතුසම්පයුත්තා චේව ධම්මා නව හෙතු - හේතු ධර්මයන් සමඟ සම්ප්‍රයුක්ත වූ ද එහෙත් හේතු නම් නොවූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

හෙතු චේව ධම්මා හෙතු සම්පයුක්තා ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි, මෝහ මූල දෙසිතෙහි මෝහ වර්ජිත හේතු ධර්ම සදෙන ලැබෙන්නාහ. (පෙර සේ විස්තර කරනු).

හෙතුසම්පයුත්තා චේව ධම්මා න ච හෙතු - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි සහේතුක සිත් එක් සැත්තෑවද, හේතු ධර්ම සදෙන වර්ජිත චෛතසික සසාලිස ද ලැබෙන්නාහ. (පෙර සේ විස්තර කරනු).

මේ ශබ්දවලිය හෙවත් හේතු හේතු සම්ප්‍රයුක්ත දුකය වනාහි, පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදාළ බැවින් දුක නම් වන්නේ ය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේය. අහේතුක සිත් අටළොසද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දොළස ද, මෝහ මූල දෙසිතෙහි මෝහය ද අටවිසි රූපය ද නිර්වාණය ද ඇතුලත් නොවන බැවින් සප්ප්‍රදේශ දුක නම් වන්නේය.

හෙතු හෙතුසම්පයුත්ත දුකය යි.

න හෙතු සහෙතුක දුකය

හෙතු හෙතුසම්පයුත්ත දුකයට අනතුරුව න හෙතු සහෙතුක දුකය වදළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **න හෙතු ඛො පන ධම්මා සහෙතුකාපි** - යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **න හෙතු ඛො පන ධම්මා අහෙතුකාපි** යනුවෙනි.

න හෙතු ඛො පන ධම්මා සහෙතුකාපි - හේතු ධර්ම නොවූ ද එහෙත් හේතුන් සමඟ යෙදුනාවූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

න හෙතු ඛො පන ධම්මා අහෙතුකාපි - හේතු ධර්ම නොවූ ද, හේතුන් සමඟ නොයෙදුනා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

න හෙතු ඛො පන ධම්මා සහෙතුකාපි - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි, සහේතුක සිත් එක්සැත්තෑව ද හේතුන් සදෙන වර්ජිත චෛතසික සසාලිස ද ලැබෙන්නාහ.(පෙර සේ විස්තර කරනු).

න හෙතු ඛො පන ධම්මා අහෙතුකාපි - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි, අහේතුක සිත් අටළොස ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දොළසද, අටවිසි රූපයද නිර්වාණයද ලැබෙන්නාහ. (පෙර සේ විස්තර කරනු).

මේ ශබ්දවලිය හෙවත් න හේතු සහේතුක දුකය වනාහි පරමාර්ථ ධර්මයන් පද දෙකක් කොට වදළ බැවින් දුක නම් වන්නේය. දෙපදෙන් ලත් නම් ඇති බැවින් සර්වලබ්ධ නාම දුක නම් වන්නේය. හේතු ධර්ම සදෙන ඇතුලත් නොවන බැවින් සප්‍රදේශ දුක නම් වන්නේය.

න හෙතු සහෙතුක දුකය යි.

පටුන වෙත

හේතුගොච්ඡකය - මිශ්‍රක දුකයෝ

වාචනය - අටුවාගත වශයෙන් "හෙතුචෙව ධම්මා සහෙතුකාව සහෙතුකාචෙව ධම්මා න ච හෙතු" යන මේ චතුර්ථ දුකය හටගත්තාක් මෙන් ප්‍රථම දුකයෙහි දෙවෙනි දුකයාගේ දෙවෙනි පදය බහා "හෙතුචෙව ධම්මා අහෙතුකාව අහෙතුකාචෙව ධම්මා න ච හෙතු" යන දුකයක් ද විය යුත්තේ යි. ඒ දුකයෙහි "හෙතුචෙව ධම්මා අහෙතුකාව" යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම්, මෝහ මූලික දෙසිතෙහි මෝහ චෛතසිකය ලැබේ. "අහෙතුකාචෙව ධම්මා න ච හෙතු" යන දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් අහේතුක සිත් අටලොස ය ඡන්ද වර්ජිත වූ අන්‍යසමාන දොළොස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන මොවුහු ය. (බෙදා වෙන් කිරීම සුගම යි) මේ දුකයෙහි සහේතුක සිත් එක්සැත්තෑව ය. මෝහ මූලික දෙසිතෙහි මෝහය හැර දෙපණස් චෛතසිකය යන මොවුන් මේ දුකයෙන් බැහැර වූ හෙයින් සප්‍රදේශ දුක නම්.

පළමුවෙනි දුකයාගේ හා තුන්වෙනි දුකයාගේ ප්‍රථම පදය බහා "හෙතුචෙව ධම්මා හෙතු සම්පයුත්තා ච හෙතුසම්පයුත්තාචෙව ධම්මා න ච හෙතු" යන පස්වෙනි දුකය හටගන්නාක් මෙන් ප්‍රථම දුකයෙහි තුන්වන දුකයාගේ දෙවෙනි පදය බහා **"හෙතුචෙව ධම්මා හෙතුවිප්පයුත්තා ච හෙතුවිප්පයුත්තාචෙව ධම්මා න ච හෙතු"** යන දුකයක් ද වියයුත්තේ යි. ඒ දුකයෙහි පදාර්ථයන්ගේ විභාගය හෙතුචෙව ධම්මා අහෙතුකාව අහෙතුකාචෙව ධම්මා නව හෙතු යන දුකයට සමාන යි.[7]

---

7. **මිශ්‍රක දුක** - පාළියෙහි පැමිණෙන දුක ශුද්ධ දුක වේ. එම ශුද්ධ දුක සුදුසු පරිදි මිශ්‍ර වෙමින් සකස් වන දුක මිශ්‍රක දුක් වේ. ඒවා සම්භව දුක සහ අතිරේක දුක වශයෙන් දෙවැදෑරුම් වේ.

සම්භව දුක - ව්‍යාකරණ ආචාර්යයන් වහන්සේලා පක්ෂ වැඩි ගණනක් හා සමඟ සම්බන්ධ වන සාමඤ්ඤ වන්නා වූ අර්ථය 'සම්භව' යනුවෙන් දක්වත්. එසේ සම්භව වන්නා වී, ඒ මේ අර්ථ ආදී වශයෙන් බොහෝ ආකාරවලින් අර්ථ ඇතුලත් වීම "ව්‍යභිචාර" යැයි කියනු ලැබේ. මෙහිදී ද වෙනත් දුකයන් ගැනීමට හැකිවීම (වෙනත්

න හෙතු ධම්මා සහෙතුකාපි අහෙතුකාපි යනුවෙන් වදාළ යුත්තේ නමුදු සද්දාධික අත්ථාධිකො හොති යන පාරිභාෂා ක්‍රමයට අනුව බොපන යන ශබ්දයන් අධික කොට දේශනා කළ බැවින් ඒ බො පන යන ශබ්දය කරණකොටගෙන දක්වන ලද්දා වූ ද අතිරේක දුක සමූහයා අතුරෙන් අර්ථකථා නය වශයෙන් දෙවෙනි දුකයෙහි ප්‍රථම දුකයාගේ දෙවෙනි පදය බහා න හෙතු ධම්මා සහෙතුකාපි අහෙතුකාපි යන සවැනි දුකය වන්නාක් මෙන් තුන්වෙනි දුකයෙහි ප්‍රථම පදයාගේ දෙවෙනි පදය බහා "**න හෙතු ධම්මා හෙතු සම්පයුත්තාපි හෙතු විප්පයුත්තාපි**" යන දුකයක් ද විය යුත්තේ යි.[8] ඒ දුකයාගේ පදාර්ථයෝ හා සියලු විභාගය න හෙතු ධම්මා සහෙතුකාපි යන දුකට සමාන යි.

දුකයන් ඇතුලත් කරගැනීමේ හේතුව) "සම්භව" යැයි කියනු ලැබේ. (සම්භවොති ගහණස්ස කාරණං - ටීකා) එබැවින් පාලියෙහි නොපැමිණෙන අටුවාචාරීන් වහන්සේලා විසින් ගන්නා ලද (ඇතුලත් කරන) දුකයන් "සම්භව දුක" වේ.

8. **අතිරේක දුක** - භාග්‍යවතුන් වහන්සේ 'න හෙතු ධම්මා සහෙතුකාපි, අහෙතුකාපි' යන දුකය වදාරා 'සද්දාධිකා අත්ථාධිකො හොති' යන පරිභාෂාවට අනුව අර්ථාධිකය දැක්වීම පිණිස "බො පන" යන ශබ්දාධිකය ඇතුලත් කරමින් දේශනා කළ සේක. එම "බො පන" යන ශබ්දාධිකයෙන් දක්වන්නාවූ දුකයන් "අතිරේක දුක" නම් වේ.

මිශ්‍රක දුකයන්ගේ දුක මුක්ත ධර්ම - මිශ්‍රක දුකයන්හි මිශ්‍ර වන්නා වූ දුක දෙකෙහි ඇති පද සතර අතරින් පද තුනක් පමණක් මිශ්‍ර වේ. සැමවිට ම එක් පදයක් ඉතිරි වේ. (උදා - ප්‍රථම දුකයෙහි දෙවෙනි දුකයාගේ දෙවෙනි පදය බහා "හෙතුචෙව ධම්මා අහෙතුකාච අහෙතුකාචෙව ධම්මා න ච හෙතු" යනුවෙන් මිශ්‍රක දුකයක් ගොඩනැගූ විට පළමු දුකයාගේ පළමු පදය ඉතිරි වේ) ඒ ඉතිරි වන දුක පදයේ ස්වරූපාර්ථයන් අදාළ මිශ්‍රක දුකයෙහි දුක මුක්තකය බවට පත් වේ. පරාමාස ගොච්ඡකය හැර සෙසු සියලු ගොච්ඡකයන්ට මෙම ක්‍රමය අදාළ වේ.

දෙවෙනි දුකයෙහි ප්‍රථම දුකයාගේ ප්‍රථම පදය බහා "**හෙතු ධම්මා සහෙතුකාපි අහෙතුකාපි**" යන දුකයක් ද විය යුත්තේ යි. ඒ දුකයෙහි ප්‍රථම පදයාගේ අභිධ්‍යෙයාර්ථයෝ නම්, මෝහමූලික දෙසිතෙහි මෝහය හැර ෂට්හෙතුහු යි. එම දුකයෙහි දුතිය පදයාගේ අභිධ්‍යෙයාර්ථයෝ නම් මෝහ මූලික දෙසිතෙහි මෝහය යි. (ස්කන්ධාදිය බෙදීම සුගම යි). මේ දුකයෙහි එකුන් අනූවක් චිත්තය ෂට් හේතුන් වර්ජිත කොට ඇත්තාවූ සසාලිස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයන් ඇතුළත් නොවූ හෙයින් සප්පදෙස දුක නම්.

මූලටීකානය වශයෙන් තුන්වෙනි දුකයෙහි ප්‍රථම දුකයාගේ ප්‍රථම පදය බහා "**හෙතු ධම්මා හෙතු සම්පයුත්තාපි හෙතු විප්පයුත්තාපි**" යන දුකයක් ද විය යුත්තේ යි. ඒ දුකයෙහි සියලු අර්ථ විභාගය "හේතු ධම්මා සහෙතුකාපි අහෙතුකාපි " යන දුකයට සමාන යි.

අනූටීකානය වශයෙන් - ප්‍රථම දුකයෙහි දෙවෙනි දුකයාගේ ප්‍රථම පදය බහා "**සහෙතුකා ධම්මා හෙතුපි න හෙතුපි**" යන දුකයක් ද විය යුත්තේ යි. ඒ දුකයෙහි සහෙතුකා ධම්මා හෙතුපි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම්, මෝහ මූලික දෙසිතෙහි මෝහය හැර අවශේෂ ෂට්හේතුහු යි. සහෙතුකා ධම්මා න හෙතුපි යන දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම්, සහෙතුක එක් සැත්තෑවක් චිත්තය ෂට් හේතුන් වර්ජිත කොට ඇත්තා වූ සසාලිස් චෛතසිකය යන මොවුහු යි. ස්කන්ධායතන ධාතු සත්‍ය වශයෙන් බෙදීම යටකී නයින් දත යුතු. මේ දුකය වනාහි මුල් පෙදින් නම් ලත් හෙයින් ආදිලබ්ධනාම දුක නම්. අටලොස් අහෙතුක චිත්තය තත් සම්පයුක්ත දොළොස් චෛතසිකය මෝහමූලික දෙසිතෙහි මෝහය අටවිසි රූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයන් ඇතුළත් නොවූ බැවින් සප්පදේශ දුක නම් වේ.

ප්‍රථම දුකයෙහි දෙවෙනි දුකයාගේ දෙවෙනි පදය බහා "**අහෙතුකා ධම්මා හෙතුපි න හෙතුපි**" යන දුකයක් ද විය යුත්තේ ය. ඒ දුකයෙහි අහෙතුකා ධම්මා හෙතුපි යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම්, මෝහ මූලික දෙසිතෙහි මෝහයයි. අහෙතුකා ධම්මා න හෙතුපි යන දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම්, අටලොස් අහේතුක චිත්තය තත් සම්ප්‍රයුක්ත දොළොස් චෛතසිකය අටවිසිරූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝයි. (ඔවුන්ගේ

ස්කන්ධාදිය බෙදීම යටකී නයමැයි). මුල් පෙදින් නම් ලත් හෙයින් ආදිලබ්ධනාම දුක නමි. සහේතුක සිත් එක්සැත්තෑව මෝහ මූල ද්වයෙහි මෝහය වර්ජිත දෙපණස් චෛතසිකය මෙහි ඇතුළත් නොවූ හෙයින් සප්පදෙස දුක නමි.

ප්‍රථම දුකයෙහි තුන්වෙනි දුකයාගේ ප්‍රථම පදය බහා " **හෙතුසම්පයුත්තා ධම්මා හෙතුපි න හෙතුපි**" යන දුකයක් ද විය යුතු ය. ඒ දුකෙහි සියලු අර්ථ විභාග සහෙතුකා ධම්මා හෙතුපි නහෙතුපි යන දුකයට සමාන ය.

ප්‍රථම දුකයෙහි තෘතිය දුකයාගේ ද්විතිය පදය බහා "**හෙතුවිප්පයුත්තා ධම්මා හෙතුපි න හෙතුපි**" යන දුකයක් ද විය යුතු යි. ඒ දුකයාගේ සියලු අර්ථ විභාගය අහෙතුකා ධම්මා හෙතුපි න හෙතුපි යන දුකයට සමාන යි.

හේතු ගොච්ඡකය සමාප්ත ය.

02. චුල්ලන්තර දුකය

සප්පච්චයා ධම්මා - අප්පච්චයා ධම්මාති

හෙතු ගොච්ඡකය දේශනා කොට වදරා ඉන් අනතුරුව චුල්ලන්තර දුකය වදළ සේක. එය ද සප්පච්චය දුකය, සංඛත දුකය, සනිදස්සන දුකය, සප්පටිඝ දුකය, රූපී දුකය, ලෝකීය දුකය, කෙනචි විඤ්ඤෙය්‍ය දුකය යනුවෙන් සත් වැදැරුම් වන්නේය.[9] [10]

---

9. **චූළන්තර දුකය** - 'චූළ+අන්තර+දුක' යැයි පද බෙදා ගන්න. (අන්තරෙ ඨපිතා දුකා අන්තරදුකා. චූළා ච තෙ අන්තරදුකාචා'ති චූළන්තරදුකා.) ගොච්ඡකයන් අන්තරයෙහි තබනා ලද බැවින් "අන්තරදුක" නම් වේ. මහන්තර දුකයට වඩා කුඩා බැවින් "චූළ" නම් වේ. ඒ නම් දෙක එකතු කොට "චූළන්තරදුක" යැයි කියනු ලැබේ.

එක් දුකයක් සමඟ තවත් දුකයක් ශබ්ද සහ අර්ථ වශයෙන් සම්බන්ධ නොවී හුදු දුක භාවයෙන් (දුක සාමාන්‍යයෙන්) පමණක් වෙන වෙන ම තෝරා, ගොච්ඡකයන්ගේ අන්තරයෙහි තබන ලද බැවින් ද, මහන්තර දුකයට වඩා කුඩා බැවින් ද "චූළන්තරදුක" යැයි කියනු ලැබේ.

10. **ගොච්ඡක සහ දුක අතර වෙනස** - ගොච්ඡකයක් තුල ඇතුලත් වන සියලු දුක ශබ්ද-අර්ථ වශයෙන් එකිනෙකාට සම්බන්ධ වේ. චූළන්තර දුක ආදියෙහි ඇතුලත් වන්නාවූ දුක ශබ්ද-අර්ථ වශයෙන් එකිනෙකට සම්බන්ධ නොවී වෙන වෙන ම පවතී. මෙය ගොච්ඡක සහ දුක අතර වෙනස යි.

පටුන වෙත

චුල්ලන්තර දුකය

දුකය	පාලිය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
			ස්	ආ	ධා	ස
සප්පච්චය	සප්පච්චයා ධම්මා	සිත්-89, චෛ-52, රූප-28	5	12	18	3
	අප්පච්චයා ධම්මා	නිර්වාණය	×	1	1	1
සඞ්ඛත	සඞ්ඛතා ධම්මා	සිත්-89, චෛ-52, රූප-28	5	12	18	3
	අසඞ්ඛතා ධම්මා	නිර්වාණය	×	1	1	1
සනිදස්සන	සනිදස්සනා ධම්මා	රූපාරම්මණය	1	1	1	1
	අනිදස්සනා ධම්මා	සිත්-89, චෛ-52, රූප-27, නිර්වාණය	5	11	17	4
සප්පටිඝ	සප්පටිඝා ධම්මා	ඕළාරික රූප-12	1	10	10	1
	අප්පටිඝා ධම්මා	සිත්-89, චෛ-52, සුඛුම රූප-16, නිර්වාණය	5	2	8	4
රූපී	රූපිනො ධම්මා	රූප-28	1	11	11	1
	අරූපිනො ධම්මා	සිත්-89, චෛ-52, නිර්වාණය	4	2	8	4
ලෞකික	ලොකියා ධම්මා	ලෞකික සිත්-81, චෛ-52, රූප-28	5	12	18	2
	ලොකුත්තරා ධම්මා	ලෝකෝත්තර සිත්-8, චෛ-36, නිර්වාණය	4	2	2	2
කෙනචි විඤ්ඤෙය්‍යය	කෙනචි විඤ්ඤෙය්‍යා ධම්මා	සිත්-89, චෛ-52, රූප-28, නිර්වාණය	5	12	18	4
	කෙනචි නවිඤ්ඤෙය්‍යා ධම්මා	සිත්-89, චෛ-52, රූප-28, නිර්වාණය	5	12	18	4

පටුන වෙත

සප්පච්චය දුකය

ඔවුනතුරෙන් සප්පච්චය දුකය පළමුකොට වදළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදැරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක, කෙසේ වදළ සේක්ද යත්, **සප්පච්චයා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතිය පදය වදළ සේක, කෙසේ වදළ සේක්ද යත් අප්පච්චයා ධම්මා - යනුවෙනි.

සප්පච්චයා ධම්මා - අවිද්‍යා- තෘෂ්ණා-උපාදාන-කර්ම-චිත්ත-ඍතු ආහාරාදි හේතූන්ගෙන් හටගන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අප්පච්චයා ධම්මා - හේතූන්ගෙන් හට නොගන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[11]

---

11. **සප්පච්චයා** - (සහ පච්චයෙන යෙ වත්තන්තී'ති = සප්පච්චයා) සමානකාල ප්‍රත්‍ය (සමානකාල වන්නා වූ හේතු, සහජාතාදී ප්‍රත්‍ය), අසමානකාල ප්‍රත්‍ය (අසමානකාල වන්නා වූ අන්නතරාදී ප්‍රත්‍ය), කාල විමුක්ත ප්‍රත්‍ය (කාලවිමුක්ත වන්නා වූ නිර්වාණ, ප්‍රඥප්ති යන ආරම්මණාදී ප්‍රත්‍යයන් ඇත්තා වූ) සමඟ උපදින්නා වූ ධර්ම "සප්පච්චය" නම් වේ. ප්‍රත්‍ය නිසා ජනිත වන ඵල ධර්ම "සප්පච්චය" නම් වේ යැයි අදහස් කෙරේ.

සප්පච්චයා - ප්‍රත්‍යයන් සමඟ පවතින්නා වූ; නොහොත් - හේතු, සහජාත ආදී සමාන කාල ප්‍රත්‍යයන්, අනන්තර සමනන්තර ආදී අසමානකාල ප්‍රත්‍යයන් ඇත්තා වූ, ආරම්මණ ආදි කාල විමුක්ත ප්‍රත්‍යයන් සමඟ පවතින්නා වූ යනුවෙන් අර්ථ දැක්විය යුතුයි. (සමානකාලෙන අසමානකාලෙන කාලවිමුත්තෙන ච පච්චයෙන - ටීකා)

අප්පච්චයා - (නත්ථි පච්චයො එතෙසන්'ති = අප්පච්චයා) උත්පාද ස්ථිති ක්ෂණයන්හි හේතු-ප්‍රත්‍යයන් නොමැති ධර්ම "අප්පච්චය" නම් වේ. ඵල භාවයෙන් නූපදින්නා වූ නිර්වාණය "අප්පච්චය" යැයි අදහස් කෙරේ.

පටුන වෙත

සප්පච්චයා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධ්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි, එකුන් අනූ චිත්තයද දෙපණස් චෛතසිකද අටවිසි රූපය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළසකි. ධාතු වශයෙන් අටළොසකි. ආයතී වශයෙන් තුනකි.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේද යත්, අටවිසි රූපය රූපස්කන්ධය නම් වන්නේය, දෙපණස් චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේය. සඤ්ඤාව සඤ්ඤාස්කන්ධය නම් වන්නේය. ඉතිරි සමපණස් චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේය. ස්‍රෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේය. ඝ්‍රාණ ප්‍රසාදය ඝානායතනය නම් වන්නේය. ජිහ්වා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේය.වර්ණ රූපය රූපායතනය නම් වන්නේය, ශබ්ද රූපය සද්දයතනය නම් වන්නේය, ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේය, රස රූපය රසායතනය නම් වන්නේය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේය.

එකුන් අනූ චිත්තය මනායතනය නම් වන්නේය, දෙපනස් චෛතසිකයද, අපෝධාතු ඉත්ථීන්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදයරූප, ජීවිත රූප, ආහාර රූප, ආකාශ රූප, කායවිඤ්ඤත්තිරූප වචීවිඤ්ඤත්ති රූප, ලහුතාරූප, මුදුතා රූප, කම්මඤ්ඤතා රූප, උපචය රූප, සන්තති රූප, ජරතා රූප, අනිච්චතා රූප යන සුඛුම රූප සොළස ද ධම්මායතනය නම් වන්නේය, මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නාහු කෙසේද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේය, ස්‍රෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේය, ඝ්‍රාණ ප්‍රසාදය ඝානධාතුව නම් වන්නේය, ජිහ්වා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේය.

පටුන වෙත

වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේය, ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේය, ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේය, රස රූපය රස ධාතුව නම් වන්නේය, පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බධාතුව නම් වන්නේය.

චක්ඛුවිඤ්ඤණ යුගලය චක්ඛුවිඤ්ඤණ ධාතුව නම් වන්නේය. සෝතවිඤ්ඤණ යුගලය සෝතවිඤ්ඤණ ධාතුව නම් වන්නේය. ඝානවිඤ්ඤණ යුගලය ඝාණවිඤ්ඤණ ධාතුව නම් වන්නේය. ජිව්හාවිඤ්ඤණ යුගලය ජිව්හා විඤ්ඤණ ධාතුව නම් වන්නේය. කාය විඤ්ඤණ යුගලය කායවිඤ්ඤණ ධාතුව නම් වන්නේය. පඤ්චද්වාරාවර්ජනය සහ සම්පටිච්ඡන යුගලය මනෝධාතුව නම් වන්නේය, ඉතිරි සසැත්තෑ චිත්තය මනෝ විඤ්ඤණ ධාතුව නම් වන්නේය.දෙපණස් චෛතසිකයද, අපෝධාතු, ඉත්ථීන්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදයරූප, ජීවිතරූප, ආහාර රූප, ආකාශරූප, කායවිඤ්ඤතිරූප, වචීවිඤ්ඤත්ති රූප, ලහුතාරූප, මුදුතාරූප, කම්මඤ්ඤතා රූප, උපචය රූප, සන්තති රූප, ජරතා රූප, අනිච්චතා රූප යන සුඛුම රූප සොළසද, ධම්ම ධාතුව නම් වන්නේය. මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නාහ.

ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේද යත්, ලෞකික සිත් එක් අසූවද, තත්සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත එක පණස් චෛතසිකයද අටවිසි රූපයද දුක්ඛ සත්‍යය නම් වන්නේය. ලෝභය සමුදය සත්‍ය නම් වන්නේය.

සතර මාර්ග සම්ප්‍රයුක්ත සම්මාදිට්ඨි ආදි මාර්ගාංග අටදෙන එක් වර බැගින්ද සත්දෙන සතර වර බැගින්ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේය, ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිසද ඵලචිත්තෝත්පාද සත්තිසද සත්‍ය විනිර්මුක්තයි, මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

අප්පච්චයා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි, එකම නිර්වාණ ධර්මය ලැබෙන්නේය, නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්තයි, ආයතන වශයෙන් එකම ධර්මායතනයකි, ධාතු වශයෙන් එකම ධර්මධාතුවකි, ආර්ය සත්‍ය වශයෙන් එකම නිරෝධ සත්‍යයකි.

මේ ශබ්දවලිය හෙවත් සප්පච්චය දුකය, පරමාර්ථ ධර්මයන් පද දෙකක් කොට වදළ බැවින් දුක නම් වන්නේය, මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේය, සියලු පරමාර්ථ ධර්ම මෙහි ඇතුළත් බැවින් නිස්ප්‍රදේශ දුක නම් වන්නේය.

සප්පච්චය දුකය යි.

සංඛත දුකය

සංඛතා ධම්මා - අසංඛතා ධම්මාති,

සප්පච්චය දුකයට අනතුරුව සංඛත දුකය වදළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක්දයත් **සංඛතා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතිය පදය වදළ සේක, කෙසේ වදළ සේක් ද යත් **අසංඛතා ධම්මා** යනුවෙනි.

සඞ්ඛතා ධම්මා[12] - අවිද්‍යා තෘෂ්ණා උපාදාන කර්ම චිත්ත ඍතු ආහාරාදි ප්‍රත්‍යයන් විසින් සකස් කරන ලද්දාවූ , නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අසංඛතා ධම්මා[13] - ප්‍රත්‍යයන් විසින් සකස් නොකරන ලද්දාවූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

---

12. **සඞ්ඛතා** - (පච්චයෙහි සමාගන්ත්වා කතා'ති = සඞ්ඛතා) ප්‍රත්‍ය ධර්මයෝ මනාව පැමිණ සිදු කරනා ලද ධර්මයන් "සඞ්ඛත" නම් වේ.

13. **අසඞ්ඛතා** - (න සඞ්ඛතා = අසඞ්ඛතා) ප්‍රත්‍ය ධර්මයෝ මනාව පැමිණ සිදු කරනා ලද ධර්මයන්ගෙන් අන්‍ය වූ ධර්මයෝ "අසඞ්ඛත" නම් වේ.

අප්පච්චයා, අසඞ්ඛතා යන පදයන්හි ස්වරූපාර්ථ ලෙස නිර්වාණය යන එක් ධර්මය පමණක් ලැබේ. නමුත් එය "අප්පච්චයා, අසඞ්ඛතා" යනුවෙන් බහුවචනයෙන් දේශනා කොට ඇත. කවර හේතුවක් නිසා ද යත් - එක් ධර්මයක් පමණක් ලැබෙන්නේ නමුදු මාතෘකා තබන අවස්ථාවේ දී එහි පිළිතුර සඳහා කවර ධර්ම ලැබෙන්නේ ද යැයි

(සංඛත දුකයෙහි ස්වරූපාර්ථ සම්පූර්ණයෙන් ම සප්පච්චය දුකයට සමානය. ඒ අනුවම විස්තර කරනු).

සංඛත දුකය යි.

සනිදස්සන දුකය

සනිදස්සනා ධම්මා - අනිදස්සනා ධම්මාති,

සංඛත දුකයට අනතුරුව සනිදස්සන දුකය වදළ සේක, එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය, ඔවුනතුරෙන් පළමු කොට ප්‍රථම පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **සනිදස්සනා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක්ද යත්, **අනිදස්සනා ධම්මා** යනුවෙනි.

සනිදස්සනා ධම්මා - ඇසට ලක්වන ස්වභාවය වූ දැකීම් සහිත වූ , නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අනිදස්සනා ධම්මා - ඇසට ලක් නොවන්නා වූ දැකීම් රහිත වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[14]

සනිදස්සනා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකම වර්ණරූපය ලැබෙන්නේය. වර්ණ රූපය වනාහි රූපස්කන්ධයකි, රූපායතනකි, රූපධාතුවකි, දුක්ඛාර්ය සත්‍යයකි.

පැමිණ නැත. එබැවින් මාතෘකා තැබීමේ දී බහුවචනයෙන් දේශනා කළ සේක.

සප්පච්චය සහ සඞ්ඛත දුකයන්වල ශබ්දර්ථ වෙනස - 'සප්පච්චය' පදයෙන් ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන්ගේ ප්‍රත්‍ය ශක්තියෙන් ම ප්‍රත්‍ය ධර්මයන්ගේ පැවතීම දක්වයි. 'සඞ්ඛත' පදයෙන් ප්‍රත්‍ය ධර්මයන්ගේ සමවායෙන් ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන්ගේ සිද්ධවීම දක්වයි.

14. **සනිදස්සනා** - සනිදස්සන ආදි පදයන්ගේ අර්ථයන් ත්‍රික මාතිකාවලදී විස්තර කරන ලදී.

අනිදස්සන්නා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි, එකුන් අනූ චිත්තයද දෙපණස් චෛතසිකයද, රූප අරමුණ වර්ජිත සත්විසි රූපයද නිර්වාණයද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් එකොළසකි. ධාතු වශයෙන් සතලොසකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙර සේ ස්වරූප උදුරනු).

සනිදස්සන දුකයයි

සප්පටිඝ දුකය

සප්පටිඝා ධම්මා - අප්පටිඝා ධම්මාති.

සනිදස්සන දුකයට අනතුරුව සප්පටිඝ දුකය වදළ සේක. එයද ප්‍රථම පදය ද්විතිය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක්ද යත්, **සප්පටිඝා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතිය පදය වදළ සේක. කෙසේ වදළ සේක්ද යත්, **අප්පටිඝා ධම්මා** යනුවෙනි.

සප්පටිඝා ධම්මා - ද්වාරාරම්මණ වශයෙන් හැපීම් සහිත වූ නොහොත් හැපීම් සහිතව හටගන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අප්පටිඝා ධම්මා - ද්වාරාරම්මණ වශයෙන් හැපීම් නැත්තා වූ හැපීම් සහිතව හටනොගන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සප්පටිඝා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි ඖදරික රූප දොළස ලැබෙන්නාහ, ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකම රූපස්කන්ධයකි. ආයතන වශයෙන් දශයකි. ධාතු වශයෙන් දශයකි. ආර්ය සත්‍ය වශයෙන් එකම දුක්ඛාර්ය සත්‍යයකි. (පෙර සේ බෙදා දක්වනු).

අප්පටිඝා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි එකුන් අනූ චිත්තයද දෙපණස් චෛතසිකයද සුඛුමරූප සොළසද නිර්වාණයද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් අටකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙර සේ බෙදා දක්වනු).

සප්පටිඝ දුකය යි.

පටුන වෙත

රූපී දුකය

රූපිනො ධම්මා - අරූපිනො ධම්මාති

සප්පටිඝ දුකයට අනතුරුව රූපී දුකය වදළ සේක. එයද ප්‍රථම පදය ද්විතිය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක්ද යත්, **රූපිනො ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක් ද යත් **අරූපිනො ධම්මා** යනුවෙනි.

රූපිනො ධම්මා [15]- සීතෝෂ්ණාදී විරෝධ ප්‍රත්‍යයෙන් විකාර වන ස්වභාවය ඇත්තාවූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අරූපිනො ධම්මා - සීතෝෂ්ණාදියෙන් විකාර නොවන ස්වභාවය ඇත්තා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

රූපිනො ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි අට විසි රූපයෝ ලැබෙන්නාහ. ඒ ධර්මයෝ එකම රූපස්කන්ධයකි. ආයතන එකළොසකි. ධාතු එකොළොසකි. එකම දුක්ඛාර්ය සත්‍යයකි, (පෙර සේ විස්තර කරනු).

---

15. **රූපිනො** - (රූපං එතෙසං අත්ථීතී'ති = රූපිනො). රූපායතන ඇත්තා වූ ධර්මයෝ "රූපී" නම් වේ. දෙවන නය ක්‍රමය - පඨවි ආදී රූප ධර්ම (බෙදා වෙන් කළ නොහැකි ලෙස) ඇතුලත් වී ඇති ධර්මයන් "රූපී" නම් වේ. (මෙම ක්‍රමයෙහි අදහසට අනුව රූප සඳහා රූපාරම්මණය ද, දෙවන ක්‍රමයේ අදහසට අනුව පඨවි ආදී රූපයන් ද ගනු ලැබේ).

තෙවන - රුප්පන ලක්ෂණය ඇත්තා වූ ධර්මයන් "රූපී" නම් වේ (මෙම ක්‍රමයෙහි අදහසට අනුව රූප සඳහා රුප්පන ලක්ෂණය ගනු ලැබේ). අටවිසි රූපය ම මීට ඇතුලත් වේ.

පටුන වෙත

අරූපිනො ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි, එකුන් අනූ චිත්තයද දෙපනස් චෛතසිකයද නිර්වාණයද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් අටකි. ආර්ය වශයෙන් සතරකි. (පෙර සේ විස්තර කරනු).

රූපී දුකය යි.

<u>ලෝකිය දුකය</u>

ලොකියා ධම්මා - ලොකුත්තරා ධම්මාති.

රූපී දුකයට අනතුරුව ලෝකිය දුකය වදළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක ද යත් **ලොකියා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක්ද යත් **ලොකුත්තරා ධම්මා** යනුවෙනි.

ලොකියා ධම්මා[16] - තෘෂ්ණා දෘෂ්ටී නම් වූ උපාදානයන්හට

---

16. **ලොකියා** - (ලුජ්ජති පලුජ්ජතී'ති = ලොකො). බිඳෙන්නා වූ, නොයෙක් ආකාරයෙන් බිඳෙන්නාවූ ත්‍රෛභූමික ධර්මයෝ (ලෞකික සිත්, චෛතසික, රූප) "ලෝක" නම් වේ.

බිඳෙන්නා වූ ධර්ම ඒ බිඳීම හේතුවෙන් "ලෝක" යැයි කිවහොත් "ලෝකුත්තර (චිත්ත,චෛතසික)" ධර්මයන් ද භඞ්ගක්ෂණයේ දී බිඳෙන බැවින් "ලෝක" යැයි කීමට ලැබෙන්නේ ද යන පැනය මතු වේ. නමුත් පෘථග්ජනයෝ ත්‍රෛභූමික ධර්ම නිත්‍ය ය යැයි ග්‍රහණය කරනු ලබත්. එම නිත්‍ය ග්‍රහණය වැළැක්වීම සඳහා ත්‍රෛභූමික වෘත්තයට අයත් වන්නා වූ ධර්මයන් ම "ලෝක" (බිඳෙන්නා වූ ධර්මයෝ) යැයි කීම යෝග්‍ය ය.

ලෝකෝත්තර ධර්ම වනාහි පෘථග්ජන පුද්ගලයන්ගේ වස්තූන් නො වේ. ආර්ය පුද්ගලයන්ට අයිති වස්තු වේ. පෘථග්ජන පුද්ගලයන්ට එම ලෝකෝත්තර ධර්මයන් අරමුණු කිරීමට නොහැක. ආර්ය පුද්ගලයන්ට ම පමණක් අරමුණු කිරීමට හැක. ආර්යන් වහන්සේලා

අරමුණු වන්නා වූ සංසාර වට්ට දුක්ඛයට ඇතුලත් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ලොකුත්තරා ධම්මා[17] - උපාදානයන්හට අරමුණු නොවන්නාවූ ද සංසාර වට්ට දුක්ඛයෙන් එතර වන්නාවූ ද එතර වූද, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

කිසිදු සඞ්ඛත ධර්මයක් නිත්‍ය වශයෙන් අරමුණු නොකරයි. එම නිසා ඒ ලෝකෝත්තර ධර්මවලට "ලෝක" යැයි පැවසීමට නොහැක.

පෘථග්ජන පුද්ගලයෝ නොබිඳේ ය යැයි මුළා බවින් ගන්නා ලද ත්‍රෛභූමික ධර්ම නොබිඳෙන්නේ නො වේ. බිඳෙන්නේ ම වෙයි. (න ලුජ්ජති න පලුජ්ජතී'ති යො ගහිතො තථා න හොති. සො ලොකො'ති තං ගහණං ගහණරහිතානං ලොකුත්තරානං නත්ථි ලොකතා - ටීකා).

(තස්මිං පරියාපන්නෙ ලොකෙ නියුත්තා = ලොකියා). ත්‍රෛභූමික වෘත්තයෙහි ඇත්තා වූ ධර්මයන්හි ඇතුලත්වීම් වශයෙන් (ඒ ත්‍රෛභූමික ධර්මයන්හි) ඒ හා සම්බන්ධ වූ ධර්ම ද "ලොකිය" නම් වේ.

දෙවන ක්‍රමය - (ලොකෙ විදිතා = ලොකියා). දුක්ඛ සත්‍යය යන ලෝකයෙහි දුක්ඛ ස්වභාව වශයෙන් ප්‍රකට වන්නා වූ ධර්ම "ලොකිය" නම් වේ.

17. **ලොකුත්තරා** - (ලොක+උත්තර) යැයි පද බෙදා ගන්න. (උත්තිණ්ණා'ති = උත්තරා). එතෙර වූ ධර්ම, උසස් වූ ධර්ම "උත්තර" නම් වේ.

(ලොකෙ අපරියාපන්නභාවෙන ලොකතො උත්තරා'ති=ලොකුත්තරා). බිඳීම් වශයෙන් ත්‍රෛභූමික වෘත්තයට අයත් ධර්මයන්හි ඇතුලත් නොවන භාවයෙන් ත්‍රෛභූමික ධර්මයන්ගෙන් එතෙර කරන්නාවූ ද, එතෙර වූද ධර්ම "ලොකුත්තරා" නම් වේ. නොහොත් - දුක්ඛ සත්‍යය නම් වූ ලෝකයෙහි ඇතුලත් නොවන භාවයෙන්, දුක්ඛ සත්‍යය නම් ලෝකයෙන් එතෙර කරන්නා වූ යැයි අර්ථ දැක්වීම සුදුසු වේ.

ලොකියා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි, ලෞකික සිත් එක් අසූවද, තත් සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකයද අටවිසි රූපයද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු).

ලොකුත්තරා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි ලෝකෝත්තර සිත් අටද තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද නිර්වාණයද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්‍ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු).

ලෝකිය දුකය යි.

<u>කෙනචි විඤ්ඤෙය්‍ය දුකය</u>

කෙනචි විඤ්ඤෙය්‍යා ධම්මා - **කෙනචි නවිඤ්ඤෙය්‍යා ධම්මාති.**

ලෝකිය දුකයට අනතුරුව කේනචි විඤ්ඤෙය්‍ය දුකය වදළ සේක. එයද ප්‍රථම පදය ද්විතිය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක්ද යත්, **කෙනචි විඤ්ඤෙය්‍යා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක්ද යත් **න කෙනචි විඤ්ඤෙය්‍යා ධම්මා** යනුවෙනි.

කෙනචි විඤ්ඤෙය්‍යා ධම්මා - චක්ඛු විඤ්ඤාණාදී ඇතැම් විඤ්ඤාණයකින් ම දත හැකි වූ , නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

කෙනචි න විඤ්ඤෙය්‍යා ධම්මා- ඇතැම් විඤ්ඤාණයකින් දත නොහැක්කා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ

ඇත්තාහ.[18]

---

18. **කෙනචි විඤ්ඤෙය්‍යා ධම්මා** - මෙහි ඇති "කෙනචි" පදය කවර ධර්මයක්ද'යි සෘජුව නො දක්වන්නා වූ ශබ්දයකි. එසේ වුව ද "විඤ්ඤෙය්‍යා" යන ක්‍රියාව පදනම් කරගෙන අරමුණු දැනගන්නා වූ චක්ඛු විඤ්ඤාණාදී වශයෙන් ඇත්තා වූ විඤ්ඤාණයන් අතරින් එක් එක් විඤ්ඤාණයක් ප්‍රකාශ කරයි. (චක්ඛුවිඤ්ඤාණාදීසු කෙනචි එකෙන චක්ඛුවිඤ්ඤාණෙන වා සොතවිඤ්ඤාණෙන වා විජානිතබ්බා - අට්ඨකථා)

න කෙනචි විඤ්ඤෙය්‍යා ධම්මා - 'කෙනචි' යන පදයෙහි ස්වරූපාර්ථය සඳහා චක්ඛු විඤ්ඤාණය ගන්නා කල්හි 'න කෙනචි' සඳහා ද චක්ඛු විඤ්ඤාණය ම ගනු ලැබේ. එබැවින් 'කෙනචි' සහ 'න කෙනචි' යන කර්තෘන්ගේ ස්වරූප වන ආරම්මණික සිත් සමාන වේ ය යනුවෙන් අදහස් කෙරේ.

එම නිසා 'කෙනචි විඤ්ඤෙය්‍යා ධම්මා' යන ප්‍රථම පදයේ ස්වරූපාර්ථ සඳහා - "චක්ඛු විඤ්ඤාණයෙන් දත හැකි රූපාරම්මණය ලැබේ." 'න කෙනචි විඤ්ඤෙය්‍යා ධම්මා' යන දුතිය පදය සඳහා - "චක්ඛු විඤ්ඤාණයෙන් දත නොහැකි සිත් 89, චෛතසික-52, රූපාරම්මණය හැර රූප 27, නිර්වාණය ලැබේ" ආදී වශයෙන් ස්වරූපාර්ථ උද්ධරණය කළ යුතු ය. මේ ආකාරයට ස්වරූපාර්ථ උද්ධරණය කිරීමෙන් ම ප්‍රථම පදයේ ස්වරූපාර්ථ සමඟ දුතිය පදයේ ස්වරූපාර්ථ ප්‍රභින්න වීම හේතුවෙන් දුකයක් බවට වේ. (එවං සන්තෙ ද්වින්නංපි පදානං අත්ථනානත්ථතො දුකො හොති - අට්ඨකථා)

විශේෂ කරුණු - සර්වාරම්මණික චිත්තයන් දුතිය පදයේ ස්වරූපාර්ථ ලෙස ගතහොත් දුකය බිඳේ. කවර හේතුවක් නිසා ද යත් සර්වාරම්මණික චිත්තය මඟින් අරමුණු නොකරන ධර්මයන් නොමැති බැවිනි. එබැවින් සර්වාරම්මණික චිත්තයන් කර්තෘ ස්ථානයෙහි තබා ස්වරූපාර්ථ උද්ධරණය නොකළ යුතු යි. තව ද මෙම දුකයෙහි පරමාර්ථ ධර්ම පමණක් ම ස්වරූපාර්ථ වශයෙන් උද්ධරණය කළ යුතු

කෙනචි විඤ්ඤෙය්‍යා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි, එකුන් අනූ චිත්තයද, දෙපණස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පහකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙර සේ ස්වරූප උදුරනු).

කෙනචි න විඤ්ඤෙය්‍යා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධ්‍යෙයර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි එකුන් අනූ චිත්තයද, දෙපණස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි. ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙර සේ ස්වරූප උදුරනු).

කෙනචි විඤ්ඤෙය්‍ය දුකයයි

<u>අටුවා නයක්‍රමයට අනුව කෙනචි න විඤ්ඤෙය්‍ය දුකයේ ස්වරූපාර්ථ</u>

ප	කර්තෘ (ආරම්මණික) විඤ්ඤාණ	කර්ම (ආරම්මණ) ස්වරූපාර්ථ	සංග්‍රහය			
			ස්	ආ	ධා	ස
ප	චක්ඛු විඤ්. දතහැකි	රූපාරම්මණය	1	1	1	1
දු	චක්ඛු විඤ්. දතනොහැකි	සිත්-89,චෛ-52, රූප-27, නිර්වාණය	5	11	17	4
ප	සෝත විඤ්. දතහැකි	ශබ්දාරම්මණය	1	1	1	1
දු	සෝත විඤ්. දතනොහැකි	සිත්-89,චෛ-52, රූප-27, නිර්වාණය	5	11	17	4
ප	ඝාන විඤ්. දතහැකි	ගන්ධාරම්මණය	1	1	1	1

වන බැවින් ඒකාන්තයෙන් ප්‍රඥප්ති අරමුණු කරන්නා වූ සිත් ද කර්තෘ ස්ථානයෙහි නොතැබිය යුතු ය.

පටුන වෙත

දු	ඝාන විඤ්. දතනොහැකි	සිත්-89,චෛ-52, රූප-27, නිර්වාණය	5	11	17	4
ප	ජිව්හා විඤ්. දතහැකි	රසාරම්මණය	1	1	1	1
දු	ජිව්හා විඤ්. දතනොහැකි	සිත්-89,චෛ-52, රූප-27, නිර්වාණය	5	11	17	4
ප	කාය විඤ්. දතහැකි	ඵොට්ඨබ්බාරම්මණය	1	1	1	1
දු	කාය විඤ්. දතනොහැකි	සිත්-89,චෛ-52, රූප-27, නිර්වාණය	5	11	17	4
ප	මනො ධාතුවෙන් දතහැකි	පඤ්චාරම්මණ	1	5	5	1
දු	මනො ධාතුවෙන් දතනොහැකි	සිත්-89,චෛ-52, රූප-21, නිර්වාණය	5	7	13	4
ප	තදා-11, හසිතු දතහැකි	කාමවචර සිත්-54, චෛ-52, රූප-28	5	12	18	2
දු	තදා-11, හසිතු දතනොහැකි	මහද්ගත ලොකු-35, චෛ-36. නිර්වාණය	4	2	2	3
ප	අකු,කුඤ්ඤාවි-4,ක්‍රිඤ්ඤාවි 4 දතහැකි	ලෞකික සිත්-81, චෛ-52, රූප-28	5	12	18	2
දු	අකු,කුඤ්ඤාවි-4,ක්‍රිඤ්ඤාවි4 දත නොහැකි	ලොකෝ-08, චෛ-36, නිර්වාණය	4	2	2	2
ප	මහාකුඤ්ඤාසම් 4, කුඅභිඤ්. දතහැකි	සිත්-87, චෛ-52, රූප-28, නිර්වාණය	5	12	18	4
දු	මහාකුඤ්ඤාසම් 4, කුඅභිඤ්. දතනොහැකි	අර්හත් මාර්ගඵල-02, චෛ-36	4	2	2	1
ප	විඤ්ඤා-3 දතහැකි	ආකාසඤ් කුසල ක්‍රියා-02, චෛ-30	4	2	2	1

පටුන වෙත

දු	විඤ්ඤා-3 දතනොහැකි	සිත්-87, චෙ-52, රූප-28, නිර්වාණය	5	12	18	4
ප	නෙවසඤ්ඤ-3 දතහැකි	ආකිඤ්ඤ කුසල ක්‍රියා-02, චෙ-30	4	2	2	1
දු	නෙවසඤ්ඤ-3 දතනොහැකි	සිත්-87, චෙ-52, රූප-28, නිර්වාණය	5	12	18	4
ප	ලෝකෝ-8 දතහැකි	නිර්වාණය	×	1	1	1
දු	ලෝකෝ-8 දතනොහැකි	සිත්-81, චෙ-52, රූප-28, නිර්වාණය	5	12	18	4

චුල්ලන්තර ගොච්ඡකය සමාප්ත ය.

පටුන වෙත

03. ආසව ගොච්ඡකය

ස්වරූප බෙදීම

චිත්ත,චෛතසික,රූප,නිර්වාණ යන පරමාර්ථ සතර අතරින්-

(අ) ලෝභ, දිට්ඨි, මෝහ යන ආශ්‍රව ධර්ම තුන 'ආසව' නම් වේ. (චත්තාරො ආසවා කාමාසවො භවාසවො දිට්ඨාසවො අවිජ්ජාසවො -අට්ඨකථාකණ්ඩ)[19]

---

19. ආසවා - (ආසවන්තී'ති = ආසවා). ෂඩ්ද්වාරයෙන් වැගිරෙන බැවින් ලෝභ, දිට්ඨි, මෝහ යන ධර්ම "ආසව" නම් වේ. චක්ෂුරාදී ෂඩ්ද්වාරයන්ගෙන් ලෝභ, දිට්ඨි, මෝහයන් වැගිරෙන්නේ නො වේ. කුසලාදී සෙසු ධර්මයන් ද වැගිරෙනුයේ නො වේ ද යන පැනය මතු වේ. එසේ වුව ද කවර හේතුවක් නිසා ලෝභය, දිට්ඨිය සහ මෝහ "ආසව" යැයි කියනු ලබන්නේ ද? ලෝභ, දිට්ඨි, මෝහයන් වණයකින් සැරව ගලන්නාක් මෙන් ෂඩ්ද්වාරයන්ගෙන් පිළිකුල් සහගත ලෙස ගලනු ලැබේ. ආසව ශබ්දය ද එසේ අපිරිසිදු ලෙස ගලන්නා වූ ධර්මයන් වාචනය කරන්නා වූ අත්ථරූළ්හී ශබ්දයකි. ඒ හේතුවෙන් "ලෝභ, දිට්ඨි, මෝහ" යන ධර්මයන්ට ම "ආසව" යැයි කියනු ලැබේ.

දෙවන ක්‍රමය - (භූමිතො ආභවග්ගං, ධම්මතො ආගොත්‍රභූං සවන්තී'ති = ආසවා). අරමුණ කරන්නා වූ ධර්ම වශයෙන් සෝවාන් ආදී මාර්ග චිත්තවීථීන්හි ගෝත්‍රභූ සිත දක්වා ද, පවත්නා වූ භව වශයෙන් භවාග්‍රය දක්වා වහනය වෙමින් පවතින බැවින් "ආසව" නම් වෙති.

තෙවන ක්‍රමය - (චිරපාරිවාසයට්ඨෙන මදිරාදයො ආසවා වියා'ති = ආසවා). බොහෝ දීර්ඝ කාලාන්තරයක් තිස්සේ පල් වූ අර්ථයෙන් ද, පල් කරන ලද මීරා ආදී ආසව අරිෂ්ඨ වර්ග හා සමාන බැවින් ද ලෝභ, දිට්ඨි, මෝහයන් ද "ආසව" යැයි කියනු ලැබේ.

සතරවන ක්‍රමය - (ආයතිං සංසාරදුක්ඛං සවන්තී'ති = ආසවා) අතී දීර්ඝ වූ සංසාර දුක්ඛය උපදවන්නා වූ ලෝභ, දිට්ඨි, මෝහයන් " ආසව" නම් වේ. ('ආයතසව' යැයි කිවයුත්තේ නමුදු 'යත' ලොප් කොට 'ආසව' යැයි පදසිද්ධිය වේ).

පටුන වෙත

(ආ) එම ධර්ම හැර සෙසු ධර්ම 'නො ආසව' නම් වේ.

(ඉ) ලෞකික සිත් 81, චෛතසික 52, රූප 28 යන ධර්මයෝ 'සාසව' නම් වේ. (සංයෝජනයන්ගේ, ග්‍රන්ථයන්ගේ, ඕඝයන්ගේ, යොගයන්ගේ, නීවරණයන්ගේ, පරාමාසයන්ගේ, උපාදානයන්ගේ, කිලෙසයන්ගේ අරමුණ වන්නා වූ ධර්මයෝ මෙම ධර්මයෝ ම ය)[20]

(ඊ) සෙසු ලෝකෝත්තර සිත් 8, චෛතසික 36, නිර්වාණය යන ධර්මයෝ 'අනාසව' නම් වේ.[21]

(උ) අකුසල් සිත් 12, ද්වේෂ මූල සිත් 02, මෝහ මූල සිත් දෙකෙහි මෝහය හැර චෛතසික 27 'ආසව සම්පයුත්ත' ධර්මයෝ නම් වේ.

(ඌ) කුසල සිත් 21, විපාක සිත් 36, ක්‍රියා සිත් 20, චෛතසික 38, ද්වේෂ මූල සිත් දෙක සහ මෝහ මූල සිත් දෙකෙහි ඇති මෝහය,

---

20. **සාසවා** - (සහ ආසවෙහි යෙ වත්තන්තී'ති = සාසවා). අරමුණු වීම් වශයෙන් ආශ්‍රවයන් සමඟ පවත්නේ නුයි සාසව නම් වෙයි. මෙහි 'සහ + ආසවෙහි' යන දෙපදය සමාස වීමේ දී 'සහ' ශබ්දයට සකාරාදේශයෙන් සන්ධි වී 'සාසව' කියා පදය සෑදේ. ආශ්‍රව සමඟ මිශ්‍ර වූ බව ද ආශ්‍රවයන් හට අරමුණු වූ බව ද ගොදුරු වූ බව එයින් කියැවේ. ලෞකික චිත්ත චෛතසික රූප ධර්ම සියල්ල ම ආශ්‍රව ධර්මයන් හට අරමුණු වන බැවින් "සාසව" නම් වෙයි. (අත්තානං ආරමණං කත්වා පවත්තෙහි සහ ආසවෙහී'ති = සාසවා).

21. **අනාසවා** - (නත්ථි එතෙසං ආසවා'ති = අනාසවා). - සම්ප්‍රයුක්ත වශයෙන් හෝ අරමුණු කිරීම් වශයෙන් හෝ ආශ්‍රව නොමැති බැවින් අනාසවා නම් වෙති, න + ආසවා = අනාසවා; 'න' යන නිපාතයට 'අන්' ආදේශ වී සන්ධි වූ විට අනාසව පදය සෑදේ, ලෝකෝත්තර චිත්ත, චෛතසික, නිර්වාණ යන සියල්ල ආශ්‍රවයන්ට අරමුණ වන්නේ ම නැත. එහෙයින් ලෝකෝත්තර ධර්මයෝ "අනාසව" නම් වෙති. (සෙසු පදයන් හේතු ගොච්ඡකයෙහි දක්වන ලද ක්‍රමයෙන් ම දත යුතු වේ).

රූප 28, නිර්වාණය 'ආසව විප්පයුත්ත' ධර්මයන් නම් වේ.

මෙම සය පදයන් මනාව ග්‍රහණය කරගැනීම ආසවගොච්ඡකයේ ස්වරූපාර්ථ සඳහා අවශ්‍ය වේ.

ආශ්‍රව ධර්මයන් සම්ප්‍රයුක්ත-විප්‍රයුක්ත වන ආකාරය - ලෝභ මූල සිත් අතරින් දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරෙහි ලෝභය, දිට්ඨිය සහ මෝහය යන ආශ්‍රව ධර්මයන් තුන ඇතුලත් වේ. ඒවා අතරින් ලෝභය දිට්ඨි සහ මෝහය සමඟ සම්ප්‍රයුක්ත වේ. දිට්ඨිය ලෝභය සහ මෝහය සමඟ සම්ප්‍රයුක්ත වේ.

දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ලෝභය සහ මෝහය යන ආශ්‍රව ධර්මයන් දෙක ඇතුලත් වේ. ඒවා අතරින් ලෝභය මෝහය සමඟ සම්ප්‍රයුක්ත වන අතර මෝහය ලෝභය සමඟ සම්ප්‍රයුක්ත වේ. මෙසේ එකිනෙකාට සම්ප්‍රයුක්ත වන ආශ්‍රව ධර්මයන් ඇති හෙයින් ලෝභ මූල සිත්වල ඇති ආශ්‍රව ධර්මයන් 'ආසව සම්පයුත්තා (ආශ්‍රව සම්ප්‍රයුක්ත)' වේ.

ද්වේෂ මූල සිත් දෙකෙහි සහ මෝහ මූල සිත් දෙකෙහි ඇති මෝහය ආශ්‍රව ධර්මයක් ලෙස තනිව පවතී. ඒ මෝහාශ්‍රවය සෙසු ආශ්‍රව සමඟ සම්ප්‍රයුක්ත නො වේ. එම නිසා ද්වේෂ මූල සිත් දෙකෙහි සහ මෝහ මූල සිත් දෙකෙහි ඇති මෝහය 'ආසව විප්පයුත්තා (ආශ්‍රව විප්‍රයුක්ත)' වේ.

මෙම ක්‍රමයට අනුව අදාළ දුක පදයන්හි ආශ්‍රව ධර්මයන්ගේ සම්ප්‍රයක්ත විප්‍රයුක්ත භාවය දැන ඒ ඒ දුක පදයන්හි ඇතුලත් කළ යුතු තැන්හි ඇතුලත් කරමින් ද, ඇතුලත් නොකළ යුතු තැන්හි ඇතුලත් නොකරමින් ද ස්වරූපාර්ථ උද්ධරණය කළ යුතු වේ.

ආසව ගොච්ඡකය

දුකය	පාලිය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
			ස්	ආ	ධා	ස
ආසව	ආසවා ධම්මා	ලෝභ, දිට්ඨි, මෝහ ධර්ම-03	1	1	1	2
	නො ආසවා ධම්මා	සිත්-89, චෛ-49, රූප-28, නිර්වාණය	5	12	18	3
සාසව	සාසවා ධම්මා	ලෞකික සිත්-81, චෛ-52, රූප-28	5	12	18	2
	අනාසවා ධම්මා	ලෝකෝත්තර සිත්-08, චෛ-36, නිර්වාණය	4	2	2	2
ආසවසම්ප	ආසවසම්පයුත්තා ධම්මා	අකුසල සිත්-12, දෝස මූල මොහ මූල දෙසිතේ මෝහය හැර චෛ-27	4	2	2	2
	ආසවවිප්පයුත්තා ධම්මා	කුසල විපාක ක්‍රියා සිත් -77, චෛ-38, දෝස මූල මොහ මූල සිත් හතරේ මෝහය, රූප-28, නිර්වාණය	5	12	18	3
ආසවසාසව	ආසවා චෙව ධම්මා සාසවා ච	ලෝභ, දිට්ඨි, මෝහ ධර්ම-03	1	1	1	2
	සාසවා චෙව ධම්මා නො ච ආසවා	ලෞකික සිත්-81, චෛ-49, රූප-28	5	12	18	1
	දුක මුක්ත	අනාසවා පදයේ ස්වරූපාර්ථ–ලෝකෝත්තර සිත්-08, චෛ-36, නිර්වාණය				
ආසව ආසවස	ආසවා චෙව ධම්මා ආසවසම්පයුත්තාව	ලෝභ මූල සිත් 08 හි ඇති ලෝභ, දිට්ඨි, මෝහ ධර්ම තුන	1	1	1	2

පටුන වෙත

	ආසවසම්පයුත්තා චෙව ධම්මා නො ච ආසවා	අකුසල සිත්-12, චෙ-24 (ලෝභ, දිට්ඨි, මෝහ වර්ජිත)	4	2	2	1
	දුක මුක්ත	ආසවවිප්පයුත්තා පදයේ ස්වරූපාර්ථ කුසල විපාක ක්‍රියා සිත් -77, චෙ-38, දෝස මූල මොහ මූල දෙසිතේ මෝහය, රූප-28, නිර්වාණය				
ආසවවිප්පයුත්ත සාසව	ආසවවිප්පයුත්තා ඛො පන ධම්මා සාසවාපි	ලෞකික කුසල සිත් 17, ලෞ.විපාක 32, ලෞ.ක්‍රියා 20,චෙ 38, දෙස මූල මෝහ මූල සිත් හතරේ මෝහය, රූප-28	5	12	18	1
	ආසවවිප්පයුත්තා ඛො පන ධම්මා අනාසවාපි	ලෝකෝත්තර සිත්-08, චෙ-36, නිර්වාණය	4	2	2	2
	දුක මුක්ත	ආසවසම්පයුත්තා පදයේ ස්වරූපාර්ථ අකුසල සිත්-12, දෝස මූල මොහ මූල සිත් හතරේ මෝහය හැර චෙ-27				

ආසව දුකය

ආසවා ධම්මා - නො ආසවා ධම්මාති.

චුල්ලන්තර දුකය දේශනා කොට වදරා ඉන් අනතුරුව ආසව ගොච්ඡකය දේශනා කොට වදළ සේක. එය ද ආසව දුකය - සාසව දුකය, ආසව සම්පයුත්ත දුකය - ආසව සාසව දුකය, ආසව ආසව සම්පයුත්ත දුකය - ආසව විප්පයුත්ත සාසව දුකයාගේ වශයෙන් සවැදැරුම් වන්නේය. ඔවුනතුරෙන් පළමු කොට ආසව දුකය වදළ සේක.

පටුන වෙත

ඒ ආසව දුකය ද ප්‍රථම පදය ද්විතිය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත් **ආසවා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතිය පදය වදළ සේක, කෙසේ වදළ සේක් ද යත්, නෝ ආසවා ධම්මා යනුවෙනි.

ආසවා ධම්මා - ආශ්‍රව නම් වන්නා වූ ද, භූමි වශයෙන් භවාග්‍රය දක්වා ද ධර්ම වශයෙන් ගෝත්‍රභූ සිත දක්වා ද වහනය වෙමින් පවත්නා බැවින් ද ආශ්‍රව නම් වූ ද, බොහෝ කල් පල් වූ සුරා මේරයක් වැනි බැවින් ආශ්‍රව නම් වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නො ආසවා ධම්මා - ආශ්‍රව නම් නො වන්නා වූ ද, භූමි වශයෙන් භවාග්‍රය දක්වා ද ධර්ම වශයෙන් ගෝත්‍රභූ සිත දක්වා ද වහනය වෙමින් නො පවත්නා බැවින් ද ආශ්‍රව නම් වූ ද, බොහෝ කල් පල් වූ සුරා මේරයක් වැනි බැවින් ආශ්‍රව නම් නොවූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ආසවා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි ලෝභ දිට්ඨි මෝහ නම් වූ චෛතසික තිදෙනා ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකම සංස්කාර ස්කන්ධයකි. ආයතන වශයෙන් එකම ධර්මායතනයකි. ධාතු වශයෙන් එකම ධර්ම ධාතුවකි. ආර්ය සත්‍ය වශයෙන් දිට්ඨි මෝහ දෙක දුක්ඛසත්‍යයකි, ලෝභය සමුදය සත්‍යයකි.

නො ආසවා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි එකුන් අනූ චිත්තයද, ආශ්‍රව ධර්ම තිදෙන වර්ජිත එකුන් පණස් චෛතසිකද, අටවිසි රූපය ද නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළසකි. ධාතු වශයෙන් අටලොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේද යත්, අටවිසි රූපය රූපස්කන්ධය නම් වන්නේය. එකුන් පණස් චෛතසික අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේය. සඤ්ඤාව සඤ්ඤාස්කන්ධය නම් වන්නේය. ඉතිරි සත් සාලිස් චෛතසිකය

සංස්කාරස්කන්ධය නම් වන්නේය. එකුන් අනූ චිත්තය විඤ්ඤාණස්කන්ධය නම් වන්නේය. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්තයි. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේය. ශ්‍රෝත්‍ර ප්‍රසාදය සෝතායතනය නම් වන්නේය. ඝ්‍රාණ ප්‍රසාදය ඝානායතනය නම් වන්නේය. ජිහ්වා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේය.

වර්ණ රූපය රූපායතනය නම් වන්නේය. ශබ්ද රූපය සද්දයතනය නම් වන්නේය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේය. රස රූපය රසායතනය නම් වන්නේය. පඨවි තේජෝ වායෝ යන භූත ත්‍රය සංඛ්‍යාත ස්ඵර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේය. එකුන් අනූ චිත්තය මනායතනය නම් වන්නේය.

එකුන් පණස් චෛතසිකයද, ආපෝ ධාතු - ඉත්ථීන්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූප, ජීවිත රූප, ආහාර රූප, ආකාශ රූප, කාය විඤ්ඤත්ති රූප, වචී විඤ්ඤත්ති රූප, ලහුතා රූප, මුදුතා රූප, කම්මඤ්ඤතා රූප, උපචය රූප, සන්තති රූප, ජරතා රූප, අනිච්චතා රූප යන සුඛුමරූප සොළසද නිර්වාණය ද ධර්මායතනය නම් වන්නේය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛුධාතුව නම් වන්නේය. ශ්‍රෝත්‍ර ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේය. ඝ්‍රාණ ප්‍රසාදය ඝාන ධාතුව නම් වන්නේය. ජිහ්වා ප්‍රසාදය ජිහ්වා ධාතුව නම් වන්නේය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේය.

වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේය. රස රූපය රස ධාතුව නම් වන්නේය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්ඵර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේය.

චක්ඛු විඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේය. සෝත විඤ්ඤාණ යුගලය සෝත විඤ්ඤාණ ධාතුව නම් වන්නේය. ඝාණ විඤ්ඤාණ යුගලය ඝාණ විඤ්ඤාණ ධාතුව නම් වන්නේය. ජිව්හා

විඤ්ඤාණ යුගලය ජිව්හා විඤ්ඤාණ ධාතුව නම් වන්නේය. කාය විඤ්ඤාණ යුගලය කාය විඤ්ඤාණ ධාතුව නම් වන්නේය. පඤ්චද්වාරාවර්ජන චිත්තය සහ සම්පටිච්ඡන යුගලය මනෝ ධාතුව නම් වන්නේය. ඉතිරි සසැත්තෑ චිත්තය මනෝ විඤ්ඤාණ ධාතුව නම් වන්නේය.

එකුන් පණස් චෛතසිකද, ආපෝධාතු, ඉත්ථීන්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූප ජීවිත රූප, ආහාර රූප, ආකාශ රූප, කාය විඤ්ඤත්ති රූප, වචී විඤ්ඤත්ති රූප, ලහුතා රූප, මුදුතා රූප, කම්මඤ්ඤතා රූප, උපචය රූප, සන්තති රූප, ජරතා රූප, අනිච්චතා රූප යන සුඛුම රූප සොළස ද නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේය. මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නාහ.

ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේද යත්, ලෞකික සිත් එක් අසූවද, තත් සම්ප්‍රයුක්ත ලෝභ දිට්ඨි මෝහ වර්ජිත එකුන් පණස් චෛතසිකද, අටවිසි රූපයද දුක්ඛ සත්‍යය නම් වන්නේය. නිර්වාණය නිරෝධ සත්‍ය නම් වන්නේය. සතර මාර්ග සම්ප්‍රයුක්ත සම්මාදිට්ඨි ආදී මාර්ගාංග අටදෙන එක්වර බැගින් ද සත් දෙන සතර වර බැගින් ද මාර්ග සත්‍යය නම් වන්නේය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන් තිසද ඵල චිත්තෝත්පාද සත්තිස ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තුන් වැදෑරුම් වන්නාහ.

මේ ශබ්දවලිය හෙවත් ආසව දුකය වනාහි පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදළ බැවින් දුක නම් වන්නේය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදී ලබ්ධ නාම දුක නම් වන්නේය. සියලු පරමාර්ථ ධර්ම මෙහි ඇතුලත් බැවින් නිස්ප්‍රදේශ දුක නම් වන්නේය.

ආසව දුකය යි.

සාසව දුකය

සාසවා ධම්මා - අනාසවා ධම්මාති.

ආසව දුකයට අනතුරුව සාසව දුකය වදළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **සාසවා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක, කෙසේ වදළ සේක්ද යත්, අනාසවා ධම්මා යනුවෙනි.

සාසවා ධම්මා - කාමාසව භවාසව දිට්ඨාසව අවිජ්ජාසව නම් වූ ආශ්‍රවයන්ට අරමුණු වන්නා වූ , නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අනාසවා ධම්මා - ආශ්‍රවයන්ට අරමුණු නොවන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සාසවා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෞකික සිත් එක් අසූවද, තත්සම්ප්‍රයුක්ත චෛතසික දෙපණසද, අටවිසි රූපයද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළොසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ උදුරනු)

අනාසවා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත්සම්ප්‍රයුක්ත චෛතසික සතිසද නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ සතරකි. ආයතන දෙකකි. ධාතු දෙකකි. ආර්යසත්‍ය දෙකකි. (පෙර සේ උදුරනු ආදිලබ්ධ නාම දුකයකි. නිප්‍රදේශ දුකයකි. අර්ථ පුරවා කියනු).

සාසව දුකය යි.

ආසවසම්පයුත්ත දුකය

ආසව සම්පයුත්තා ධම්මා - ආසව විප්පයුත්තා ධම්මාති.

සාසව දුකයට අනතුරුව ආසවසම්පයුත්ත දුකය වදළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය.

ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදුළ සේක. කෙසේ වදුළ සේක් ද යත්, **ආසවසම්පයුත්තා ධම්මා** යනු වෙනි, ඉන් අනතුරුව ද්විතීය පදය වදුළ සේක, කෙසේ වදුළ සේක් ද යත්, ආසව විප්පයුත්තා ධම්මා - යනුවෙනි.

ආසවසම්පයුත්තා ධම්මා - ආශ්‍රව ධර්මයන් සමඟ ඒකෝත්පාදාදී වශයෙන් සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් මිශ්‍ර වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ආසවවිප්පයුත්තා ධම්මා - එසේ මිශ්‍ර නොවූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ආසවසම්පයුත්තා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, අකුසල් සිත් දොළසද, ද්වේෂ මූල - මෝහමූල සිත් සතරෙහි මෝහ වර්ජිත චෛතසික සත්විස්සද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ උදුරනු).

ආසවවිප්පයුත්තා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දොළොස් අකුසල් සිත් වර්ජිත සත් සැත්තෑ චිත්තයද තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද, ද්වේෂ මූල මෝහමූල් සිත් සතරෙහි මෝහයද අටවිසි රූපයද නිර්වාණයද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙරසේ ස්වරූප උදුරනු ආදි ලබ්ධ නාම දුකයකි, නිප්‍රදේශ දුකයකි,)

ආසව සම්පයුක්ත දුකය යි.

ආසව සාසව දුකය

ආසවා චෙව ධම්මා සාසවාච - සාසවා චෙව ධම්මා නොච ආසවාති.

ආසවසම්පයුත්ත දුකයට අනතුරුව ආසව සාසව දුකය වදුළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමුකොට වදුළ සේක. කෙසේ

වදළ සේක් ද යත්, **ආසවා චෙව ධම්මා සාසවාච** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක, කෙසේ වදළ සේක්ද යත්, **සාසවා චෙව ධම්මා නෝච ආසවා** යනුවෙනි.

ආසවා චෙව ධම්මා සාසවාච - ආශ්‍රව නම් වූස ආශ්‍රවයන්හට අරමුණු නම් වූද , නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සාසවා චෙව ධම්මා නොච ආසවා - ආශ්‍රවයන්හට අරමුණු වන්නාවූ ආශ්‍රව නොවූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ආසවා චෙව ධම්මා සාසවාච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ දිට්ඨි මෝහ නම් වූ ආශ්‍රව ධර්ම තිදෙන ලැබෙන්නාහ. එකම සංස්කාර ස්කන්ධයකි, එකම ධම්මායතනයකි. එකම ධර්ම ධාතුවකි, ආර්ය සත්‍ය වශයෙන් දිට්ඨි මෝහ දෙක දුක්ඛ සත්‍යයකි, ලෝභය සමුදය සත්‍යයකි.

සාසවා චෙව ධම්මා නොච ආසවා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි ලෞකික සිත් එක් අසූවද, ආශ්‍රව ධර්ම වර්ජිත චෛතසික එකුන් පණසද, අටවිසි රූපයද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් එකම දුක්ඛ සත්‍යයකි. (ආදිලබ්ධ නාම දුකයකි, ලෝකෝත්තර ධර්ම ඇතුළත් නොවන බැවින් සප්‍රදේශ දුකයකි. ස්වරූප උදුරනු)

ආසව සාසව දුකය යි.

ආසව ආසවසම්පයුත්ත දුකය

ආසවා චෙව ධම්මා ආසව සම්පයුත්තාව - ආසව සම්පයුත්තා චෙව ධම්මා නෝච ආසවාති,

ආසව සාසව දුකයට අනතුරුව ආසව ආසවසම්පයුත්ත දුකය වදළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමුකොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත් **ආසවා චෙව ධම්මා ආසවසම්පයුත්තා ච** යනුවෙනි.

පටුන වෙත

ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක්ද යත්, **ආසවසම්පයුත්තා චෙව ධම්මා නොච ආසවා** යනුවෙනි.

ආසවා චෙව ධම්මා ආසවාසම්පයුත්තා ච - ආශ්‍රව නම් වූද ආශ්‍රවයන් සමඟ සම්ප්‍රයුක්ත වූද , නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ආසවසම්පයුත්තා චෙව ධම්මා නොච ආසවා - ආශ්‍රවයන් සමඟ සම්ප්‍රයුක්ත වූ එහෙත් ආශ්‍රව නම් නොවූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ආසවා චෙව ධම්මා ආසවසම්පයුත්තා ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝභ මූල අකුශල් සිත් අටෙහි යෙදුනාවූ ලෝභ දිට්ඨි මෝහ නම් වූ ආශ්‍රව ධර්ම තුන ලැබෙන්නාහ. (සංස්කාරස්කන්ධයකි, ධර්මායතනයකි, ධර්ම ධාතුවකි, ආර්ය සත්‍ය දෙක්කි ස්වරූප උදුරනු).

ආසවසම්පයුත්තා චෙව ධම්මා නොච ආසවා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළසද ආශ්‍රව ධර්ම වර්ජිත චෛතසික සූවිස්ස ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (ස්වරූප උදුරනු).

මේ ශබ්දවලිය හෙවත් ආසව ආසවසම්පයුත්ත දුකය වනාහි පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදළ බැවින් දුක නම් වන්නේය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේය. දොළොස් අකුසල් සිත් වර්ජිත සත්සැත්තෑ චිත්තයද, චෛතසික අටතිසද අටවිසි රූපයද නිර්වාණය ද මේ දුකයට ඇතුලත් නොවන බැවින් සප්‍රදේශ දුක නම් වන්නේය.

ආසව ආසවසම්පයුත්ත දුකය යි.

ආසවවිප්පයුත්ත සාසව දුකය

ආසවවිප්පයුත්තා ඛො පන ධම්මා සාසවාපි - ආසවවිප්පයුත්තා ඛො පන ධම්මා අනාසවාපී'ති

ආසව ආසවසම්පයුත්ත දුකයට අනතුරුව ආසවවිප්පයුත්ත සාසව දුකය වදළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් පථම පදය පළමු කොට වදළ සේක, කෙසේ වදළ සේක් ද යත්, **ආසවවිප්පයුත්තා ඛො පන ධම්මා සාසවාපි** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **ආසවවිප්පයුත්තා ඛො පන ධම්මා අනාසවාපි** යනුවෙනි.

ආසවවිප්පයුත්තා ඛො පන ධම්මා සාසවාපි - ආශ්‍රව ධර්මයන්ගෙන් විප්‍රයුක්ත වූද ආශ්‍රවයන් හට අරමුණු වූද,නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ආසවවිප්පයුත්තා ඛො පන ධම්මා අනාසවාපි[22] - ආශ්‍රව ධර්ම සමඟ විප්‍රයුක්ත වූද ආශ්‍රවයන් හට අරමුණු නොවූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

---

22. **ආසවවිප්පයුත්තා ඛො පන ධම්මා** - හේතු ගොච්ඡකයේ අවසානයේ "නහෙතු ඛො පන ධම්මා සහෙතුකාපි අහෙතුකාපි" යනුවෙන් දේශනා කළාක් මෙන් දේශනා නොකොට ආසව ගොච්ඡකයේ අවසාන දුකය "ආසවවිප්පයුත්තා ඛො පන ධම්මා සාසවාපි, අනාසවාපි" යැයි දේශනා කරන ලද්දේ ඇයි?

හේතු ගොච්ඡකයේ අවසාන දුකය "න හෙතු ඛො පන ධම්මා සහෙතුකාපි, අහෙතුකාපි" යැයි ප්‍රථම දුකයෙහි දෙවන පදය විශේෂණ කොට දේශනා කරන ලද්දාක් මෙන් ආසව ගොච්ඡකයෙහි අවසාන දුකය ද "නො ආසවා ඛො පන ධම්මා සාසවාපි, අනාසවාපි" යනුවෙන් ප්‍රථම දුක පදයේ දුතිය පදය ම විශේෂණ කරමින් දේශනා කළ යුතු වන්නේ නො වේ ද? කවර හේතුවක් නිසා තුන්වන දුකයෙහි දෙවන පදය විශේෂණයෙහි තබමින් "ආසවවිප්පයුත්තා ඛො පන ධම්මා සාසවාපි, අනාසවාපි" යනුවෙන් දේශනා කරන ලද්දේ ද? යන පැනය මෙහි ඇති වේ.

සම්ප්‍රයුක්ත වූ හේතු සමඟ පැවතීම නිසා 'සහේතුක' යැයි කියනු ලබන්නාක් මෙන් සම්ප්‍රයුක්ත වන්නා වූ ආශ්‍රව ධර්මයන් සමඟ

ආසවවිප්පයුත්තා ඛො පන ධම්මා සාසවපි - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දොළොස් අකුසල් සිත් වර්ජිත ලෞකික සිත් එකුන් සැත්තෑව ද තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද ද්වේෂ මූල මෝහ මූල සිත් සතරෙහි මෝහය ද, අටවිසි රූපයද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙර සේ ස්වරූප උදුරනු).

පැවතීම 'සාසව' යැයි කියනු නො ලැබේ. ආශ්‍රව සමඟ සම්ප්‍රයුක්ත වීම නොව ආශ්‍රවයන්ට අරමුණු වන ධර්මයන්ට ම 'සාසව' යැයි කියනු ලැබේ ය යන මෙම විශේෂ අර්ථය දැක්වීම පිණිස ආසව ගොච්ඡකයේ අවසාන දුකය "ආසව විප්පයුත්තා ඛො පන ධම්මා සාසවාපි, අනාසවාපි" යැයි වදාළ සේක. සෙසු සංයොජන ආදී ගොච්ඡකයන්හි ද විප්පයුත්ත පදය විශේෂණ කරමින් අවසාන දුකය දේශනා කිරීමේ හේතුව ද සුදුසු පරිදි දත යුතු වේ. (ඔසානදුකෙ නො ආසවා ඛො පනාති අවත්වා ආසවවිප්පයුත්තා ඛො පනාති වචනං සාසවානං සහෙතුකානං විය සම්පයුත්තෙහි තං සහිතතා න හොතීති දස්සනත්ථං - මූලටීකා).

මෙසේ ඇති කල්හි හේතු ගොච්ඡකයෙහිදී හෙතුවිප්පයුත්ත පදය විශේෂණ කරමින් දේශනා නොකොට කවර හේතුවක් නිසා නහෙතු පදය විශේෂණ කරමින් අවසාන දුකය දේශනා කළ සේක්ද? හේතු ගොච්ඡකයෙහි හෙතුවිප්‍රයුක්ත ධර්මයන්හි සහේතුක භාවය නොමැති වීම හේතුවෙන් හේතුවිප්පයුත්ත පදය විශේෂණ කොට දේශනා කිරීමට නොහැකිවීම හේතුවෙන් නහෙතුක පදය ම විශේෂණ කොට දේශනා කළ සේක. (හෙතු ගොච්ඡකෙ පන හෙතුවිප්පයුත්තානං සහෙතුකතා නත්ථී'ති තෙ ගහෙත්වා දුකයොජනාය අසක්කුණෙය්‍යත්තා නහෙතුපදං ගහෙත්වා ඔසානදුකයොජනා කතා - මූලටීකා).

ආසවවිප්පයුත්තා ඛො පන ධම්මා අනාසවාපි - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිසද, නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු).

මේ ශබ්දවලිය හෙවත් ආසව විප්පයුත්ත සාසව දුකය වනාහි පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදළ බැවින් දුක නම් වන්නේය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදි ලබ්ධ නාම දුක නම් වන්නේය. අකුසල් සිත් දොළස ද, ලෝභ මූල සිත් අටෙහි ලෝභ දිට්ඨි මෝහ වර්ජිත පස් විසි චෛතසිකය ද මෙහි ඇතුලත් නොවන බැවින් සප්‍රදේශ දුක නම් වන්නේය.

ආසවවිප්පයුත්ත සාසව දුකය යි.

ආසවගොච්ඡකය - මිශ්‍රක දුකයෝ

අටුවා නයින් වනාහි ප්‍රථම දුකයෙහි තෘතිය දුකයාගේ ප්‍රථම පදය බහා "ආසවාචෙව ධම්මා ආසවසම්පයුත්තාච ආසවසම්පයුත්තාචෙව ධම්මා නොච ආසවා" යන පස්වෙනි දුකය වුවාක් මෙන් ප්‍රථම දුකයෙහි තෘතිය දුකයාගේ දුතිය පදය බහා "**ආසවා චෙව ධම්මා ආසවවිප්පයුත්තාච ආසවවිප්පයුත්තා චෙව ධම්මා නොච ආසවා**" යන දුකයක් ද විය යුත්තේ ය.

ආසවාචෙව - ආශ්‍රවා නම් වූ ද; ආසව විප්පයුත්තාච- ආශ්‍රව විප්‍රයුක්ත නම් වූද ධර්මයෝ ඇත්තාහ. ආසව විප්පයුත්තා චෙව - ආශ්‍රව විප්‍රයුක්ත වුද; නොච ආසවා- ආශ්‍රව නම් නොවූද ධර්මයෝ ඇත්තාහ.

එහි ආසවා චෙව ධම්මා ආසවවිප්පයුත්තාච යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ද්වේෂ මූල මෝහ මූලයන්හි යෙදුනා වූ මෝහයෝ සිව්දෙන ලැබෙති. ආසවවිප්පයුත්තා චෙව ධම්මා නොච ආසවා යන දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් අකුසල් සිත් වර්ජිත සත් සැත්තෑ චිත්තය තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන ධර්මයෝ ලැබෙති. (බෙදා වෙන් කිරීම

සුගමයි) ආදි ලබ්ධනාම දුකයයි. අකුසල සිත් දොළස ද්වේෂ මූල මෝහ මූලයන්හි මෝහයෝ වර්ජිත සත්විසි චෛතසිකය මෙහි ඇතුලත් නොවූ හෙයින් සප්පදේශ දුක නම්.

ආසවවිප්පයුත්තා ධම්මා සාසවාපි අනාසවාපි යනුවෙන් වදාළ යුතු වුවද සද්දාධිකා අත්ථාධිකෝ හොති යන පරිභාෂා ක්‍රමයට අනුව අධිකාර්ථවාචක "බොපන" යන ශබ්ද සමුදාය එක් කොට වදාළ බැවින් ඒ "බොපන" යන ශබ්දයෙන් ලැබිය යුතු අතිරේක දුකයන් අතුරෙන් දුතිය දුකයෙහි තෘතිය දුකයාගේ දුතිය පදය බහා ආසව විප්පයුත්තා ධම්මා සාසවාපි අනාසවාපි , යන සවෙනි දුකය වූවාක් මෙන් දෙවෙනි දුකයෙහි ප්‍රථම දුකයාගේ දුතිය පදය බහා **"නො ආසවා ධම්මා සාසවාපි අනාසවාපි"** යන දුකයක් ද විය යුත්තේ යි.

නො ආසවාචෙව - ආසව නම් නොවූ ද; සාසවාපි - ආශ්‍රවයන්ට අරමුණු වූ ද (ධම්මා සන්ති). නො ආසවාචෙව - ආසව නම් නොවූ ද; අනාසවාපි - ආශ්‍රවයන්ට අරමුණු නොවූ ද (ධම්මා සන්ති)

නො ආසවා ධම්මා සාසවාපි යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලෞකික සිත් එක් අසූව ආශ්‍රව ධර්ම වර්ජිත එකුන් පණස් චෛතසිකය අටවිසි රූපය ලැබෙති. නො ආසවා ධම්මා අනාසවාපි යන දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලෝකොත්තර සිත් අට සතිස් චෛතසිකය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. (විසතර සුගමයි) මෙහි ආසව ධර්මයන් ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම් වෙයි.

තෘතිය දුකයෙහි ප්‍රථම දුකයාගේ ප්‍රථම පදය බහා **"ආසවා චෙව ධම්මා ආසවසම්පයුත්තාපි ආසවවිප්පයුත්තාපි"** යන දුකයක් ද විය යුතු යි. මෙහි ආසවා චෙව ධම්මා ආසව සම්පයුත්තාපි යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලෝභ මූලික සිත් අටෙහි යෙදුනා වූ ආශ්‍රව ධර්මයෝ තුන් දෙනා ලැබෙති. ආසවා චෙව ධම්මා ආසව විප්පයුත්තාපි යන දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දෝස මූලික මෝහ මූලික චිත්තයන්හි යෙදුනාවූ මෝහයෝ සිව්දෙන ලැබෙති. ආදි ලබ්ධනාම දුකය යි.එකුන් අනූ චිත්තය ආශ්‍රව ධර්ම වර්ජිත එකුන් පණස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයන් ඇතුළත් නොවූ බැවින් සප්පදෙස දුක නම්.

පටුන වෙත

තෘතිය දුකයෙහි ප්‍රථම දුකයාගේ දෙවෙනි පදය බහා "**නො ආසවාචෙව ධම්මා ආසවසම්පයුත්තාපි ආසවවිප්පයුත්තාපි**" යන දුකයක් ද විය යුත්තේ යි. එහි නො ආසවාචෙව ධම්මා ආසවසම්පයුත්තාපි යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දොළොස් අකුසල් ය ආශ්‍රව ධර්ම වර්ජිත සූවිසි චෛතසිකයය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. නො ආසවාචෙව ධම්මා ආසවවිප්පයුත්තාපි යන දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් අකුසල් සිත් වර්ජිත සත් සැත්තෑ චිත්තය තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන ධර්මයේ ලැබෙති. ආදි ලබ්ධනාම දුකයයි. ආසව ධර්මයන් මෙහි ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස නම්.

තෘතිය දුකයෙහි දෙවෙනි දුකයාගේ ප්‍රථම පදය බහා "**ආසවා ධම්මා ආසවසම්පයුත්තාපි ආසවවිප්පයුත්තාපි**" යන දුකයක් ද විය යුත්තේ යි. ඒ දුකයෙහි ආසවා ධම්මා ආසවසම්පයුත්තාපි යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දොළොස් අකුසල් ය දෝස මූලික මෝහ මූලික සිත් සතරෙහි යෙදුනා වූ මෝහය හැර සත්විසි චෛතසිකය යන මොවුහු ය. ආසවා ධම්මා ආසවවිප්පයුත්තාපි යන දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් අකුසල් සිත් වර්ජිත ලෞකික එකුන් සැත්තෑ චිත්තය තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද්වේෂ මූල මෝහ මූලයන්හි මෝහය අටවිසි රූපය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. ආදිලබ්ධනාම දුකය යි. ලෝකෝත්තර සිත් අට තත් සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකය නිර්වාණය මෙහි ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම්.

ප්‍රථම දුකයෙහි දුතිය දුකයාගේ ප්‍රථම පදය බහා "**සාසවා චෙව ධම්මා ආසවාපි නො ආසවාපි**" යන දුකයක් ද විය යුත්තේ යි. එහි සාසවා චෙව ධම්මා ආසවාපි යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ආසව ධර්මයෝ තිදෙනා ය. සාසවා චෙව ධම්මා නො ආසවාපි යන දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලෞකික සිත් එක් අසූව ආසව ධර්ම වර්ජිත එකුන් පණස් චෛතසිකය අටවිසි රූපයෝ ලැබෙති. ආදිලබ්ධනාම දුකය යි. ලෝකෝත්තර සිත් අටය සතිස් චෛතසිකය නිර්වාණය මෙහි ඇතුලත් නොවූ බැවින් සප්පදෙස දුක නම්.

ප්‍රථම දුකයෙහි තෘතිය දුකයාගේ ප්‍රථම පදය බහා " **ආසවසම්පයුත්තා ධම්මා ආසවාපි නොආසවාපි**" යන දුකයක් ද විය යුත්තේ යි. එහි ආසවසම්පයුත්තා ධම්මා ආසවාපි යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලෝභ මූලික සිත් අටෙහි යෙදුනා වූ ආශ්‍රව ධර්මයෝ තුන්දෙනා ලැබෙති. ආසවසම්පයුත්තා ධම්මා නොආසවාපි යන දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දොළොස් අකුසල් ය ආශ්‍රව වර්ජිත සූවිසි චෛතසිකය යන මොව්හු ලැබෙති. ආදිලබ්ධනාම දුකය යි. දොළොස් අකුසල් වර්ජිත සත් සැත්තෑ චිත්තය අටතිස් චෛතසිකය ද්වේෂ මූල මෝහ මූලයන්හි යෙදුනා වූ මෝහය අටවිසි රූපය නිර්වාණය මෙහි ඇතුලක් නොවූ බැවින් සප්පදෙස දුක නම්.

ප්‍රථම දුකයෙහි තෘතිය දුකයාගේ දුතිය පදය බහා " ආසවවිප්පයුත්තා ධම්මා ආසවාපි නො ආසවාපි" යන දුකයක් ද විය යුත්තේ යි. එහි ආසව විප්පයුත්තා ධම්මා ආසවාපි යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දෝස මූලික මෝහ මූලික සිත් සතරෙහි යෙදුනාවූ මෝහයයි. මෙහි ආසවවිප්පයුත්තා ධම්මා නො ආසවාපි යන දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දොළොස් අකුසල් වර්ජිත සැත්තෑ චිත්තය අටතිස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන ධර්මයෝ ලැබෙති. ආදි ලබ්ධනාම දුකයයි. දොළොස් අකුසල් හා ද්වේෂ මූල මෝහ මූලයන්හි මෝහය වර්ජිත සත්විසි චෛතසිකයන් මෙහි ඇතුළත් නොවූ හෙයින් සප්පදෙස දුක නම්. කියන ලද සියලු පදයන්හි ම ස්කන්ධාදිය බෙදා වෙන් කිරීම කල යුතු ය.

මෙම ගොච්ඡකයෙහි මිශ්‍රක දුක සමඟ මුළු දුක ගණන දහහතරක් වේ.

ආසව ගොච්ඡකය සමාප්ත ය.

04. සංයෝජන ගොච්ඡකය

ස්වරූප බෙදීම

දසසංයොජනානි - කාමරාගසංයොජනං, පටිඝසංයොජනං, මානසංයොජනං, දිට්ඨිසංයොජනං, විචිකිච්ඡාසංයොජනං, සීලබ්බතපරාමාසසංයොජනං, භවරාගසංයොජනං, ඉස්සාසංයොජනං, මච්ඡරියසංයොජනං, අවිජ්ජාසංයොජනං.[23] - අට්ඨකතා කාණ්ඩ පාලිය

(අ) මෙම සංයෝජන දසය සඳහා ලෝභ, දෝස, මාන, දිට්ඨි, විචිකිච්ඡා, ඉස්සා, මච්ඡරිය, මෝහ වශයෙන් පරමාර්ථ ධර්ම (චෛතසික) අටකි. ලෝභ සහ දිට්ඨි යන ධර්ම යන ධර්ම දෙක සංයෝජනවල තැන් දෙක බැගින් සඳහන් වේ. කලින් දක්වන ලද සාසව ධර්ම ම සංයොජනීය ධර්ම වේ.[24]

---

23. **සංයොජනා** - (සංයොජෙන්ති බන්ධන්ති'ති = සංයොජනානි). සංයෝජනයන්ගෙන් වෙන් නොවුණු පුද්ගලයා (ක්ලේෂ, කර්ම, විපාක යන) ත්‍රිවිධ වෘත්තයෙහි බඳවන්නා වූ ධර්මයන් "සංයෝජන" නම් වේ. සංයෝජනයන්ගෙන් වෙන් නොවුණු පුද්ගලා කර්ම සිදුකරන කල්හි අනාගතයෙහි විපාක ජනනය කිරීම සඳහා කර්මයේ විපාක ශක්තිය අවශේෂ කරවයි. එසේ කර්මයාගේ විපාක ශක්තිය අවශේෂ කරවීම ම සංයෝජනය මඟින් සංයෝජනයන්ගෙන් වෙන් නොවුණු පුද්ගලයා කර්ම වෘත්තයෙහි බඳිනු ලැබේ. ඒ කර්මයාගේ විපාකය ලැබීම මඟින් විපාක වෘත්තයෙහි බැඳ තබනු ලැබේ. පෙර පෙර සංයෝජන ක්ලේෂයන් පැවති බැවින් මතු මතු ක්ලේෂයන් ඇතිවීම නිසා ක්ලේෂ වෘත්තය ද ඇති වේ.

ත්‍රිවිධ වෘත්තයන්හි හේතුව වන්නා වූ ධර්මයන් සංයෝජන නම් වේ යැයි අදහස් කෙරේ. (කිලෙසකම්මවිපාකවට්ටානං පච්චයභාවෙන තත්ථ සංයොජෙන්ති - මූලටීකා).

24. **සංයෝජනියා** - (සංයොජනානං හිතා = සංයොජනීයා). සංයොජන ධර්මයන්ගේ හිතෙශී ධර්ම වන්නා වූ ධර්ම (සංයෝජන

(ආ) අකුසල සිත් 12, උද්ධච්ච සිතෙහි ඇති මෝහය හැර චෛතසික 27 'සංයෝජන සම්පයුත්ත (සංයෝජන සම්ප්‍රයුක්ත) ධර්මයන් වේ.

(ඉ) කුසල් සිත් 21, විපාක සිත් 36, ක්‍රියාසිත් 20, චෛතසික 38, උද්ධච්ච සහගත සිතෙහි ඇති මෝහය, රූප 28 සහ නිර්වාණය යන ධර්මයන් 'සංයොජනවිප්පයුත්ත' නම් වේ.

සංයෝජන ධර්මයන් සම්ප්‍රයුක්ත-විප්‍රයුක්ත වන ආකාරය - සංයෝජන ධර්ම දසය වන්නා වූ චෛතසික 08 අකුසල සිත් දෙළොසෙහි සුදුසු පරිදි සම්ප්‍රයුක්ත වේ. ඒ කෙසේද යත් -

- දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරෙහි ලෝභ, දිට්ඨි, මෝහ යන සංයෝජන තුන යෙදේ.
- දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ලෝභ, මාන, මෝහ යන සංයෝජන තුන යෙදේ.
- ද්වේෂ මූල සිත් දෙකෙහි ද්වේෂ, ඉස්සා, මච්ඡරිය, මෝහ යන සංයෝජන සතර යෙදේ.
- විචිකිච්ඡා සහගත සිතෙහි විචිකිච්ඡා, මෝහ යන සංයෝජන දෙක යෙදේ.
- යට දැක්වූ සිත්වල ඇති සංයෝජන ධර්මයන්හි ඒ ඒ සංයෝජන ධර්මය සඳහා සම්ප්‍රයුක්ත වන තවත් සංයෝජන ඇති බැවින් සංයෝජන සම්ප්‍රයුක්ත ධර්මයෝ වෙත්.
- උද්ධච්ච සහගත සිතෙහි ඇති මෝහ සංයෝජනය සංයෝජන වශයෙන් තනිව පවතී. වෙනත් සංයෝජන ධර්මයන් නැත. එම

ධර්මයන්ගේ අරමුණු වන්නා වූ) "සංයොජනිය" නම් වේ.

දෙවන ක්‍රමය - (සංයොජෙතබ්බා'ති = සංයොජනීයා). සංයෝජනය කරනු ලබන ධර්ම "සංයොජනිය" නම් වේ. - ටීකා

තෙවන ක්‍රමය - (සංයොජනෙ නියුත්තා = සංයොජනියා). සංයෝජනයන්හි නියුක්ත ධර්ම "සංයොජනිය" නම් වේ. - ටීකා

නිසා ඒ උද්ධච්ච සහගත සිතෙහි ඇති මෝහය සංයෝජන විප්‍රයුක්ත වේ.

දුක මුක්ත - ස්කන්ධාදිය බෙදා දක්වන්න. හේතු ගොච්ඡකයෙහි දක්වා ඇති ක්‍රමයට අනුව සුදුසු පරිදි දුක මුක්ත ධර්මයන් උද්ධරණය කරන්න.

සංයෝජන ගොච්ඡකය

දුකය	පාලිය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
			ස්	ආ	ධා	ස
සංයෝජන	සංයොජනා ධම්මා	සංයොජන - ලෝභ, දෝස, මාන, දිට්ඨි, විචිකිච්ඡා, ඉස්සා, මච්ඡරිය, මෝහ යන චෛතසික 8	1	1	1	2
	නො සංයොජනා ධම්මා	සිත්-89, චෙ-44, රූප-28, නිර්වාණය	5	12	18	3
සංයෝජනීය	සංයොජනියා ධම්මා	ලෞකික සිත්-81, චෙ-52, රූප-28	5	12	18	2
	අසංයොජනියා ධම්මා	ලෝකෝත්තර සිත්-08, චෙ-36, නිර්වාණය	4	2	2	2
සංයෝජනසම්ප යුත්ත	සංයොජනසම්පයුත්තා ධම්මා	අකුසල සිත්-12, උද්ධච්ච සිතේ මෝහය හැර චෙ-27	4	2	2	2
	සංයොජනවිප්පයුත්තා ධම්මා	කුසල විපාක ක්‍රියා සිත්-77, චෙ-38, උද්ධච්ච සිතේ මෝහය, රූප-28, නිර්වාණය	5	12	18	3
සංයෝජන-සංයෝජනීය	සංයොජනා චෙව ධම්මා සංයොජනියා ච	සංයොජන- ලෝභ, දෝස, මාන, දිට්ඨි, විචිකිච්ඡා, ඉස්සා, මච්ඡරිය, මෝහ යන චෛතසික 8	1	1	1	2

පටුන වෙත

	සංයොජනියා චෙව ධම්මා නො ච සංයොජනා	ලෞකික සිත්-81, චෙ-44, රූප-28	5	12	18	1
	දුක මුක්ත	අසංයොජනියා පදයේ ස්වරූපාර්ථ ලෝකෝත්තර සිත්-08, චෙ-36, නිර්වාණය				
සංයොජනා- සංයොජනසම්පයුත්ත	සංයොජනා චෙව ධම්මා සංයොජනසම්පයුත්තා ච	උද්ධච්ච සිතේ මෝහය හැර සංයොජන වන්නාවූ-ලෝභ, දෝස, මාන, දිට්ඨි, විචිකිච්ඡා, ඉස්සා, මච්ඡරිය, මෝහ යන චෛතසික 8	1	1	1	2
	සංයොජනසම්පයුත්තා චෙව ධම්මා නො ච සංයොජනා	අකුසල සිත්-12, චෙ-19	4	2	2	1
	දුක මුක්ත	සංයොජනවිප්පයුත්තා පදයේ ස්වරූපාර්ථ කුසල විපාක ක්‍රියා සිත්-77, චෙ-38, උද්ධච්ච සිතේ මෝහය, රූප-28, නිර්වාණය				
සංයොජන විප්පයුත්ත-සංයොජනිය	සංයොජනවිප්පයුත්තා ඛො පන ධම්මා සංයොජනියාපි.	ලෞකික කුසල විපාක ක්‍රියා සිත්-69, චෙ-38, උද්ධච්ච සිතේ මෝහය, රූප-28	5	12	18	1
	සංයොජනවිප්පයුත්තා ඛො පන ධම්මා අසංයොජනියාපි.	ලෝකෝත්තර සිත්-08, චෙ-36, නිර්වාණය	4	2	2	2
	දුක මුක්ත	සංයොජනසම්පයුත්තා පදයේ ස්වරූපාර්ථ				

පටුන වෙත

		අකුසල සිත්-12, උද්ධච්ච සිතේ මෝහය හැර චෙ-27				

සංයොජන දුකය

සංයොජනා ධම්මා - නො සංයොජනා ධම්මා'ති.

ආසව ගොච්ඡකය දේශනා කොට වදරා ඉන් අනතුරුව සංයොජන ගොච්ඡකය වදළ සේක. එයද සංයොජන දුකය, සංයොජනීය දුකය, සංයොජනසම්පයුත්ත දුකය, සංයොජන සංයොජනීය දුකය, සංයොජන සංයොජනසම්පයුත්ත දුකය, සංයොජනවිප්පයුත්ත සංයොජනීය දුකයාගේ වශයෙන් සය වැදෑරුම් වන්නේය.

ඔවුනතුරෙන් සංයොජන දුකය පළමුකොට වදළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය, පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක්ද යත්, **සංයොජනා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත් **නො සංයොජනා ධම්මා** යනුවෙනි.

සංයොජනා ධම්මා - සංසාරික සත්වයන් භවරථයෙහි බැඳ දමන අර්ථයෙන් සංයෝජන නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නො සංයොජනා ධම්මා - භවරථයෙහි නොයොදන අර්ථයෙන් සංයෝජන නම් නොවෙන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සංයොජනා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ දෝස මාන දිට්ඨි විචිකිච්ඡා ඉස්සා මච්ඡරිය මෝහ සංඛ්‍යාත චෛතසික ධර්මයෝ අට දෙන ලැබෙන්නාහ. ඒ ධර්මයෝ එකම සංස්කාරස්කන්ධයකි. එකම ධර්මායතනයකි. එකම ධර්ම ධාතුවකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු)

නො සංයොජනා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන් අනූ චිත්තය ද, සංයෝජන ධර්ම අට දෙන වර්ජිත සූ සාලිස් චෛතසිකයද අට විසි රූපයද නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේද යත්, අටවිසි රූපය රූපස්කන්ධය නම් වන්නේය, සූසාලිස් චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේය, සඤ්ඤව සංඥස්කන්ධය නම් වන්නේය. ඉතිරි දෙසාලිස් චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේය, එකුන් අනූචිත්තය විඥනස්කන්ධය නම් වන්නේය, නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්තය. මෙසේ ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම් වන්නාහ.

ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේය. සෝතප්‍රසාදය සෝතායතනය නම් වන්නේය, ඝ්‍රාණප්‍රසාදය ඝානායතනය නම් වන්නේය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේය. කායප්‍රසාදය කායායතනය නම් වන්නේය.

වර්ණරූපය රූපායතනය නම් වන්නේය, ශබ්ද රූපය සද්දයතනය නම් වන්නේය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේය, රස රූපය රසායතනය නම් වන්නේය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේය, එකුන් අනූ චිත්තය මනායතනය නම් වන්නේය.

චෛතසික සූසාලිස ද, අපෝධාතු ඉත්ථින්ද්‍රිය පුරිසින්ද්‍රිය හදය රූප ජීවිත රූප ආහාර රූප ආකාස රූප, කායවිඤ්ඤත්ති රූප වචීවිඤ්ඤත්ති රූප ලහුතා රූප මුදුතා රූප කම්මඤ්ඤතා රූප උපචය රූප සන්තතිරූප ජරතාරූප අනිච්චතා රූප යන සුඛුම රූප සොළස ද නිර්වාණයද ධම්මායතනය නම් වන්නේය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නාහු කෙසේද යත් අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛුධාතුව නම් වන්නේය.

ශ්‍රෝත ප්‍රසාදය සෝතධාතුව නම් වන්නේය. ඝ්‍රාණ ප්‍රසාදය ඝානධාතුව නම් වන්නේය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේය.

වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේය. ශබ්ද රූපය ශබ්ද ධාතුව නම් වන්නේය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේය. රස රූපය රස ධාතුව නම් වන්නේය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේය.

චක්ඛු විඤ්ඤාණ යුගලය චක්ඛු විඤ්ඤාණ ධාතුව නම් වන්නේය. සෝත විඤ්ඤාණ යුගලය සෝත විඤ්ඤාණ ධාතුව නම් වන්නේය. ඝාණ විඤ්ඤාණ යුගලය ඝාණ විඤ්ඤාණ ධාතුව නම් වන්නේය. ජිව්හා විඤ්ඤාණ යුගලය ජිව්හා විඤ්ඤාණ ධාතුව නම් වන්නේය. කාය විඤ්ඤාණ යුගලය කාය විඤ්ඤාණ ධාතුව නම් වන්නේය. පඤ්චද්වාරවර්ජන චිත්තය සහ සම්පටිච්ඡන යුගලය මනෝධාතුව නම් වන්නේය. ඉතිරි සසැත්තෑ චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේය.

චෛතසික සූසාලිසද, අපෝධාතු ඉත්ථීන්ද්‍රිය පුරිසින්ද්‍රිය හදයරූප ජීවිතරූප ආහාරරූප ආකාසරූප, කායවිඤ්ඤත්තිරූප වචීවිඤ්ඤත්තිරූප ලහුතාරූප මුදුතාරූප කම්මඤ්ඤතාරූප. උපචයරූප සන්තතිරූප ජරතාරූප අනිච්චතාරූප යන සුඛුමරූප සොළසද නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේය. මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නාහ.

ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේද යත්, ලෞකික සිත් එක් අසූව ද තත් සම්ප්‍රයුක්ත චෛතසික සූසාලිසද අටවිසි රූපයද දුක්ඛසත්‍ය නම් වන්නේය. නිර්වාණය නිරෝධ සත්‍ය නම් වන්නේය. සතර මාර්ග සම්ප්‍රයුක්ත සම්මාදිට්ඨි ආදී මාර්ගාංග අටදෙන එක්වර බැගින් ද සත්දෙන සතරවර බැගින් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍ය නම් වන්නේය, ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිසද ඵල චිත්තෝත්පාද සත්තිසද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

මේ ශබ්දවලිය හෙවත් සංයෝජන දුකය, පරමාර්ථ ධර්මයන් පද දෙකක් කොට වදළ බැවින් දුක නම් වන්නේය. මුල් පදයෙන් ලත්

නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේය. සියලු පරමාර්ථ ධර්ම මෙහි ඇතුලත් වන බැවින් නිප්‍රදේශ දුක නම් වන්නේය.

සංයොජන දුකය යි.

සංයොජනීය දුකය

සංයොජනීයා ධම්මා - අසංයොජනීයා ධම්මාති

සංයොජන දුකය දේශනා කොට වදරා ඉන් අනතුරුව සංයොජනීය දුකය දේශානා කොට වදළ සේක, එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමුකොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්. **සංයොජනීයා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක්ද යත්, **අසංයොජනීයා ධම්මා** යනුවෙනි.

සංයොජනීයා ධම්මා - සංයෝජන ධර්මයන් හට අරමුණු වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අසංයොජනීයා ධම්මා[25] - සංයෝජන ධර්මයන්ට අරමුණු නොවූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සංයොජනීයා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක් අසූවද චෛතසික දෙපණසද අටවිසි රූපයද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ සකන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු)

අසංයොජනීයා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝකෝත්තර සිත් අටද චෛතසික

---

25. **අසංයොජනීයා** - (න සංයොජනියා = අසංයොජනියා). සංයෝජනයන්ගේ හිතෙශී නොවන්නා වූ (සංයෝජනයන්ගේ අරමුණු නොවන්නා වූ) ධර්ම "අසංයොජනිය" නම් වේ.

සෙසු පදයන්ගේ අර්ථයන් දක්වනා ලද ක්‍රමයන් ඇසුරෙන් දත යුතු වේ.

පටුන වෙත

සතිසද නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු. - ආදිලබ්ධනාම - නිප්‍රදේශ දුකයකි).

සංයොජනීය දුකය යි.

සංයොජනසම්පයුත්ත දුකය

සංයොජනසම්පයුත්තා ධම්මා - සංයොජනවිප්පයුත්තා ධම්මාති,

සංයොජනීය දුකයට අනතුරුව සංයොජනසම්පයුත්ත දුකය දේශනා කොට වදාළ සේක, එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, සංයෝජන සම්පයුත්තා ධම්මා යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක්ද යත්, සංයෝජන විප්පයුත්තා ධම්මා යනුවෙනි.

සංයොජනසම්ප්‍රයුත්තා ධම්මා - සංයෝජන ධර්මයන් සමඟ මිශ්‍ර වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සංයොජනවිප්පයුත්තා ධම්මා - සංයෝජන ධර්මයන් සමඟ මිශ්‍ර නොවූ , නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සංයොජනසම්පයුත්තා ධම්මා යන ප්‍රථම පාදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළොස ද උද්ධච්ච සහගත සිතෙහි මෝහය වර්ජිත සත්විසි චෛතසිකද ලැබෙන්නේය. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු)

සංයොජනවිප්පයුත්තා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි, දොළොස් අකුසල් සිත් වර්ජිත සත්සැත්තෑ චිත්තයද තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද උද්ධච්ච සහගත සිතෙහි මෝහයද අටවිසි රූපය ද නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය

වශයෙන් තුනකි. (ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම - නිප්‍රදේශ දුකයකි).

සංයොජනසම්පයුත්ත දුකය යි.

සංයොජන සංයොජනීය දුකය

සංයොජනා චේව ධම්මා සංයොජනීයාච - සංයොජනීයා චේව ධම්මා නෝච සංයොජනාති.

සංයොජනසම්පයුත්ත දුකයට අනතුරුව සංයොජන සංයොජනීය දුකය වදළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදල සේක් ද යත්, **සංයොජනා චේව ධම්මා සංයොජනීයා ච** - යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක, කෙසේ වදළ සෙක් ද යත්, **සංයොජනීයා චේව ධම්මා නොච සංයොජනා** -යනුවෙනි.

සංයොජනා චේව ධම්මා සංයොජනීයාච - සංයෝජන නම් වූ ද සංයෝජනයන්ට අරමුණු වන්නා වූද , නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සංයොජනීයා චේව ධම්මා නොච සංයොජනා - සංයෝජන ධර්මයන්ට අරමුණු වූ ද එහෙත් සංයෝජන නම් නොවූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සංයොජනා චේව ධම්මා සංයොජනීයා ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සංයෝජන ධර්ම අට දෙන ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සංස්කාරස්කන්ධයකි, ධර්මායතනයකි, ධර්ම ධාතුවකි, ආර්ය සත්‍ය දෙකකි. (ස්වරූප උදුරනු).

සංයොජනීයා චේව ධම්මා නොච සංයොජනා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි ලෞකික සිත් එක් අසූවද තත් සම්ප්‍රයුක්ත සංයෝජන ධර්ම වර්ජිත චෛතසික සූසාලිස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන්

අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි, (ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම - ලෝකෝත්තර ධර්ම කිසිවක් ඇතුළත් නොවූ බැවින් සප්‍රදේශ දුක නම් වෙයි).

සංයොජන සංයොජනීය දුකය යි.

සංයොජන සංයොජනසම්පයුත්ත දුකය

සංයොජනා චේව ධම්මා සංයොජනසම්පයුත්තාව - සංයොජනසම්පයුත්තා චේව ධම්මා නොව සංයොජනා.

සංයොජන සංයොජනීය දුකයට අනතුරුව සංයොජන සංයොජනසම්පයුත්ත දුකය වදළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමුකොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, සංයෝජනාචේව ධම්මා සංයෝජන සම්පයුත්තා ච යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **සංයොජනසම්පයුත්තා චේව ධම්මා නොව සංයොජනා** යනුවෙනි.

සංයොජනා චේව ධම්මා සංයොජනසම්පයුත්තා ච - සංයෝජන නම් වූ ද සංයෝජනයන් සමඟ සම්ප්‍රයුක්ත වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සංයොජනසම්පයුත්තා චේව ධම්මා නොව සංයොජනා - සංයෝජන සම්ප්‍රයුක්ත වූද එහෙත් සංයෝජන නම් නොවූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සංයොජනා චේව ධම්මා සංයොජනසම්පයුත්තා ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් උද්ධච්ච සිතෙහි මෝහය වර්ජිත සංයෝජන ධර්ම අටදෙන ලැබෙන්නාහ. ස්කන්ධ එකකි. ආයතන එකකි, ධාතු එකකි, ආර්ය සත්‍ය දෙකකි. (ස්වරූප උදුරනු).

සංයොජනසම්පයුත්තා චේව ධම්මා නොව සංයොජනා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, අකුසල සිත් දොළසද සංයෝජන ධර්ම වර්ජිත චෛතසික එකුන් විස්ස ද ලැබෙන්නාහ. ස්කන්ධ සතරකි. ආයතන දෙකකි. ධාතු දෙකකි. ආර්ය

සත්‍ය එකකි. (ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි - අකුසල චිත්තෝත්පාද වර්ජිත ඉතිරි පරමාර්ථ ධර්ම කිසිවක් ඇතුලත් නොවන බැවින් සප්‍රදේශ දුකයකි).

සංයොජන සංයොජන සම්ප්‍රයුත්ත දුකය යි.

සංයොජනවිප්පයුත්ත සංයෝජනීය දුකය

සංයොජනවිප්පයුත්තා ඛො පන ධම්මා සංයොජනීයාපි, සංයොජනවිප්පයුත්තා ඛො පන ධම්මා අසංයොජනීයාපීති

සංයොජන සංයොජනසම්පයුත්ත දුකයට අනතුරුව සංයෝජනවිප්පයුත්ත සංයොජනීය දුකය වදළ සේක, එයද දෙවැදෑරුම් වන්නේය, ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක, කෙසේ වදළ සේක් ද යත්, **සංයොජනවිප්පයුත්තා ඛො පන ධම්මා සංයොජනීයාපි** - යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක, කෙසේ වදළ සේක් ද යත්, **සංයොජනවිප්පයුත්තා ඛො පන ධම්මා අසංයොජනීයාපි** යනුවෙනි.

සංයොජනවිප්පයුත්තා ඛො පන ධම්මා සංයොජනීයා පි - සංයෝජන ධර්මයන් සමඟ විප්‍රයුක්ත වූ ද එහෙත් සංයෝජනයන්ට අරමුණු වූද,නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සංයොජනවිප්පයුත්තා ඛො පන ධම්මා අසංයොජනියා පි - සංයෝජන ධර්මයන් සමඟ විප්‍රයුක්ත වූද සංයෝජනයන්ට අරමුණු නොවූද,නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සංයොජනවිප්පයුත්තා ඛො පන ධම්මා සංයොජනීයාපි - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළස වර්ජිත ලෞකික සිත් එකුන් සැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද උද්ධච්ච සහගත සිතෙහි මෝහය ද අටවිසි රූපය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්‍ය්‍ය සත්‍ය වශයෙන් එකකි, (පෙර සේ ස්වරූප උදුරනු).

සංයෝජනවිප්පයුත්තා ඛො පන ධම්මා අසංයොජනීයාපි - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්

ලෝකෝත්තර සිත් අට ද තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු).

මේ ශබ්දවලිය හෙවත් සංයෝජන විප්පයුත්ත සංයෝජනීය දුකය වනාහි පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදළ බැවින්, දුක නම් වන්නේය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදි ලබ්ධ නාම දුක නම් වන්නේය. අකුසල් සිත් දොළෂ ද, උද්ධච්ච සහගත සිතෙහි මෝහය වර්ජිත සත්විසි චෛතසිකය ද මෙහි ඇතුලත් නොවන බැවින් සප්‍රදේශ දුක නම් වන්නේය.

සංයොජනවිප්පයුත්ත සංයොජනීය දුකයයි

සංයෝජන ගොච්ඡකය - මිශ්‍රක දුකයන්

ප්‍රථම දුකයෙහි තෘතිය දුකයාගේ ප්‍රථම පදය බහා සඤ්ඤොජනාචෙව ධම්මා සඤ්ඤොජන සම්පයුත්තා ච සඤ්ඤොජන සම්පයුත්තා චෙව ධම්මා නොච සඤ්ඤොජනා යන පස්වෙනි දුකය හටගත්තාක් මෙන් ප්‍රථම දුකයෙහි දුතිය දුකයාගේ දුතිය පදය බහා **"සඤ්ඤොජනා චෙව ධම්මා සඤ්ඤොජනවිප්පයුත්තාච සඤ්ඤොජනවිප්පයුත්තා චෙව ධම්මා නොච සඤ්ඤොජනා"** යන දුකයක් ද විය යුත්තේ යි. ඒ දුකයෙහි සඤ්ඤොජනා චෙව ධම්මා සඤ්ඤොජනවිප්පයුත්තාච යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් උද්ධච්ච සහගත චිත්තයෙහි යෙදුනා වූ මෝහය ලැබේ. සඤ්ඤොජනවිප්පයුත්තා චෙව ධම්මා නොච සඤ්ඤොජනා යන දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් එක්විසි කුසල් ය සතිස් විපාක ය විසි ක්‍රියා ය අටතිස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. ආදිලබ්ධනාම දුකය යි. මේ දුකයෙහි දොළොස් අකුසල් ය උද්ධච්ච සහගත සිතෙහි මෝහය හැර අතිරික්ත සත්විසි චෛතසිකයන් ඇතුළත් නොවූ බැවින් සප්පදෙස දුක නම්.

සඤ්ඤොජනවිප්පයුත්තා ඛො පන ධම්මා සඤ්ඤොජනීයාපි අසඤ්ඤොජනීයාපි යන දුකයෙහි සද්දාධිකා අත්ථාධිකො හොති යන

පරිභාෂා නයින් ඛො පන අධික ශබ්දයාගේ බලයෙන් ලැබිය යුතු අතිරේක දුකයන් අතුරෙන් දෙවෙන් දුකයෙහි තෘතිය දුකයාගේ දුතිය පදය බහා සඤ්ඤොජනවිප්පයුත්තා ඛො පන ධම්මා සඤ්ඤොජනීයාපි අසඤ්ඤොජනීයාපි යන සවැනි දුකය වූවාක් මෙන් දෙවෙනි දුකයෙහි ප්‍රථම දුකයාගේ දෙවෙනි පදය බහා **"නොසඤ්ඤොජනා ධම්මා සඤ්ඤොජනීයාපි අසඤ්ඤොජනීයානිපි"** යන දුකයක් ද විය යුත්තේ යි. මෙහි නොසඤ්ඤොජනා ධම්මා සඤ්ඤොජනීයාපි යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලෞකික සිත් එක් අසූව සඤ්ඤොජන ධර්ම වර්ජිත සූසාලිස් චෛතසිකය අටවිසි රූපය ලැබෙති. නොසඤ්ඤොජනා ධම්මා අසඤ්ඤොජනීයානිපි යන දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලෝකෝත්තර ධර්ම සියල්ල ලැබෙති. ආදිලබ්ධනාම දුක නම්. සඤ්ඤොජන ධර්ම අට ඇතුලත් නොවූ හෙයින් සප්පදේස දුක නම්.

තෘතිය දුකයෙහි ප්‍රථම දුකයාගේ ප්‍රථම පදය බහා **"සඤ්ඤොජනා ධම්මා සඤ්ඤොජනසම්පයුත්තාපි සඤ්ඤොජනවිප්පයුත්තාපි"** යන දුකයක් ද විය යුත්තේ යි. එහි සඤ්ඤොජනා ධම්මා සඤ්ඤොජනසම්පයුත්තාපි යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් උද්ධච්ච සහගත සිතෙහි මෝහය හැර සඤ්ඤොජන ධර්මයෝ අටදෙන ලැබෙති. සඤ්ඤොජනා ධම්මා සඤ්ඤොජනවිප්පයුත්තාපි යන දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් උද්ධච්ච සහගත සිතෙහි මෝහය ලැබේ. ආදිලබ්ධනාම දුක නම්. එකුන් අනූ චිත්තය සඤ්ඤොජන වර්ජිත සූසාලිස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය මෙහි ඇතුළත් නොවූ බැවින් සප්පදෙස දුක නම්.

තෘතිය දුකයෙහි ප්‍රථම දුකයාගේ දෙවෙනි පදය බහා **"නොසඤ්ඤොජනා ධම්මා සඤ්ඤොජනසම්පයුත්තාපි සඤ්ඤොජනවිප්පයුත්තාපි"** යන දුකයක් ද විය යුතු ය. මෙහි නොසඤ්ඤොජනා ධම්මා සඤ්ඤොජනසම්පයුත්තාපි යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දොළොස් අකුසල සිත් ය. සඤ්ඤොජන ධර්ම වර්ජිත එකුන් විසි චෛතසිකයෝ ලැබෙති. නොසඤ්ඤොජනා ධම්මා සඤ්ඤොජනවිප්පයුත්තාපි යන දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දොළොස් අකුසල චිත්තෝත්පාද

වර්ජිත සියලු පරමාර්ථ ධර්ම ලැබෙති. ආදිලබ්ධනාම දුක නම්. සඤ්ඤොජන ධර්ම මෙහි ඇතුලත් නොවූ බැවින් සප්පදෙස දුක නම්.

තෘතිය දුකයෙහි දෙවෙනි දුකයාගේ ප්‍රථම පදය බහා **"සඤ්ඤොජනියා ධම්මා සඤ්ඤොජනසම්පයුත්තාපි විප්පයුත්තාපි"** යන දුකයක් ද විය යුතු ය. මෙහි සඤ්ඤොජනියා ධම්මා සඤ්ඤොජනසම්පයුත්තාපි යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දොළොස් අකුසල් සිත් ය. උද්ධච්ච සහගත සිතෙහි මෝහය වර්ජිත සත්විසි චෛතසිකය ලැබෙති. සඤ්ඤොජනියා ධම්මා සඤ්ඤොජනවිප්පයුත්තාපි යන දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දොළොස් අකුසල වර්ජිත ලෞකික සිත් එකුන් සැත්තෑව අටතිස් චෛතසිකය උද්ධච්ච සහගත සිතෙහි මෝහය අටවිසි රූපය යන ධර්මයෝ ලැබෙති. ආදිලබ්ධනාම දුක නම්. ලෝකෝත්තර ධර්ම සියල්ල මෙහි ඇතුළත් නොවූ බැවින් සප්පදෙස දුක නමුදු වෙයි.

ප්‍රථම දුකයෙහි දෙවෙනි දුකයාගේ ප්‍රථම පදය බහා **"සඤ්ඤොජනියා ධම්මා සඤ්ඤොජනාපි නො සඤ්ඤොජනාපි"** යන දුකයක් ද විය යුත්තේ යි. මෙහි සඤ්ඤොජනියා ධම්මා සඤ්ඤොජනාපි යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් සංයෝජන ධර්මයෝ අටදෙන ලැබෙති. සඤ්ඤොජනියා ධම්මා නො සඤ්ඤොජනාපි යන දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලෞකිකයෝ සිත් එක් අසූව සංයෝජන ධර්ම වර්ජිත සුසාලිස් චෛතසිකය අටවිසි රූපය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. (සෙස්ස සුගම ය).

ප්‍රථම දුකයෙහි තෘතිය පදයාගේ ප්‍රථම පදය බහා **"සඤ්ඤොජන සම්පයුත්තා ධම්මා සඤ්ඤොජනාපි නොසඤ්ඤොජනාපි"** යන දුකයක් ද විය යුත්තේ යි. එහි සඤ්ඤොජන සම්පයුත්තා ධම්මා සඤ්ඤොජනාපි යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් උද්ධච්ච සහගත සිතෙහි මෝහය වර්ජිත සංයෝජන ධර්මයෝ අටදෙනා ලැබෙති. සඤ්ඤොජන සම්පයුත්තා ධම්මා නොසඤ්ඤොජනාපි යන දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දොළොස් අකුසල සිත් හා සංයෝජන ධර්ම වර්ජිත එකුන් විසි චෛතසිකයෝ ලැබෙති. (සෙස්ස සුගම ය).

ප්‍රථම දුකයෙහි තෘතිය දුකයාගේ ප්‍රථම පදය බහා "**සඤ්ඤොජන විප්පයුත්තා චෙව ධම්මා සඤ්ඤොජනාපි නොසඤ්ඤොජනාපි**" යන දුකයක් ද විය යුතු ය. එහි සඤ්ඤොජන විප්පයුත්තා චෙව ධම්මා සඤ්ඤොජනාපි යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් උද්ධච්ච සහගත සිතෙහි මෝහය ලැබේ. සඤ්ඤොජන විප්පයුත්තා චෙව ධම්මා නොසඤ්ඤොජනාපි යන දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දොළොස් අකුසල් වර්ජිත සත් සැත්තෑ චිත්තය අටතිස් චෛතසිකය අටවිසි රූපය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. (සෙස්ස සුගමයි).

සඤ්ඤොජන ගොච්ඡකය සමාප්ත ය

පටුන වෙත

05. ගන්ථ ගොච්ඡකය

ගන්ථා - ගන්ථා "යස්ස සංවිජ්ජන්ති තං චුතිපටිසන්ධිවසේන වට්ටස්මිං ගන්ථෙන්ති සටෙන්තීති = ගන්ථා." (අට්ඨසාලිනි) යමෙකුගේ සන්තානයෙහි ඇත්තාහු නම්, ඔහු චුති පටිසන්ධි වශයෙන් සංසාර වට්ටයෙහි ගැටගසත්නුයි, සන්ධි කරත්නුයි ග්‍රන්ථ නම් වෙති.

ස්වරූප බෙදීම

චත්තාරො ගන්ථා - අභිජ්ඣාකායගන්ථො, බ්‍යාපාදො කායගන්ථො, සීලබ්බතපරාමාසො කායගන්ථො, ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො. (අට්ඨකතාකාණ්ඩ පාලි).

(අ) ලෝභ, ද්වේෂ, දිට්ඨි යන චෛතසික තුන 'ගන්ථ' සඳහා ලැබෙන පරමාර්ථ ධර්ම වේ.

(ආ) ලෝභ මූල සිත් අට, ද්වේෂ මූල සිත් දෙක, දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ඇති ලෝභය, ද්වේෂ මූල සිත් දෙකෙහි ඇති ද්වේෂය, විචිකිච්ඡාව හැර චෛතසික 25 'ගන්ථසම්පයුත්තා' නම් වේ.

(ඉ) මෝහ මූල සිත් දෙක, කුසල් සිත් 21, විපාක සිත් 36, ක්‍රියා සිත් 20, ලෝභ දිට්ඨි මාන දෝස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ඡ ථීනමිද්ධ හැර චෛතසික 43, දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ඇති ලෝභය, ද්වේෂ මූල සිත් දෙකෙහි ඇති ද්වේෂය, රූප 28, නිර්වාණය යන මෙම ධර්මයෝ 'ගන්ථවිප්පයුත්තා නම් වේ'.

ග්‍රන්ථ ධර්ම සම්ප්‍රයුක්ත-විප්‍රයුක්ත වන ආකාරය - ග්‍රන්ථ ධර්ම සතරෙ සඳහා ලැබෙන චෛතසික 03 ලෝභ මූල සිත් අට සහ ද්වේෂ මූල සිත් දෙකෙහි සුදුසු පරිදි යෙදේ. දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරෙහි ලෝභය සහ දිට්ඨිය යන ග්‍රන්ථ දෙක යෙදේ. ඒ ග්‍රන්ථ දෙක අතරින් ලෝභය සමඟ දිට්ඨිය යන එක් ග්‍රන්ථයක් යෙදේ. දිට්ඨිය සමඟ ඇති ලෝභය යන එක් ග්‍රන්ථයක් යෙදේ. මෙසේ එකිනෙකට සම්ප්‍රයුක්ත වන ග්‍රන්ථ ධර්ම ඇති හෙයින් දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත්වල ඇති ලෝභය සහ දිට්ඨිය ග්‍රන්ථ සම්ප්‍රයුක්ත (ගන්ථසම්පයුත්ත) වේ.

දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ඇති ලෝභය ද, ද්වේෂ මූල සිත් දෙකෙහි ඇති ද්වේෂය ද යන මෙම ග්‍රන්ථ තනිව යෙදේ. එබැවින්

දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ඇති ලෝභය ද, ද්වේෂ මූල සිත් දෙකෙහි ඇති ද්වේෂය ද සම්ප්‍රයුක්ත වන වෙනත් ග්‍රන්ථයක් නොමැති බැවින් ග්‍රන්ථ විප්‍රයුක්ත (ගන්ථවිප්පයුත්ත) වේ. එම නිසා ඒ දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ඇති ලෝභය ද, ද්වේෂ මූල සිත් දෙකෙහි ඇති ද්වේෂය ද 'ගන්ථසම්පයුත්ත' පදයට ඇතුලත් නොවී 'ගන්ථවිප්පයුත්ත' පදයට ඇතුලත් වේ.

ලෝභ -පෙ- චෛතසික 25 - දිට්ඨිගත විප්‍රයුක්ත සිත්වල ලෝභය අත්හරිනුයේ නමුදු ස්වරූපාර්ථ ගැනීමේ දී ලෝභය අත් නො හරියි. දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරෙහි ඇති ලෝභය ඉතිරි වන බැවින් චෛතසික ගණනින් අඩු නො කෙරේ. ද්වේෂ මූල සිත් දෙකෙහි ඇති ද්වේෂය ඉවත් කළ විට ඉතිරි වන වෙනත් ද්වේෂයක් නොමැති බැවින් චෛතසික ගණනින් අඩු කොරේ. විචිකිච්ඡා සිතෙහි ලෝභ මූල, ද්වේෂ මූල සිත්වල නොයෙදෙන බැවින් චෛතසික ගණනින් ඉවත් කර ඇත. එබැවින් " ලෝභ මූල සිත් අට -පෙ- ද්වේෂ මූල සිත් දෙක, දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ඇති ලෝභය, ද්වේෂ මූල සිත් දෙකෙහි ඇති ද්වේෂය, විචිකිච්ඡාව හැර චෛතසික 25" යනුවෙන් දැක්වීය.

මෝහ මූල සිත් දෙක -පෙ- චෛතසික 43 - මෝහ මූල සිත් 02, කුසල් සිත් 21, විපාක සිත් 36, ක්‍රියා සිත් 20 යන් සිත්වල අකුශල රාශිය, අන්‍යසමාන රාශිය, සෝභන රාශිය යන රාශි ත්‍රයට අයත් චෛතසිකයන් සුදුසු පරිදි යෙදේ. ලෝභ මූල සිත් මෙහි ඇතුලත් නොවන අතර ලෝභ මූල සිත්වල පමණක් යෙදෙන ලෝභ, දිට්ඨි, මාන චෛතසික නො යෙදේ. මීට අමතරව ද්වේෂ මූල සිත් ද ඇතුලත් නොවීම නිසා ඒ ද්වේෂ මූල සිත් දෙකෙහි යෙදෙන දෝස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ඡ චෛතසික ඉවත් වේ. තව ද ලෝභ මූල ද්වේෂ මූල සිත්වල පමණක් යෙදෙන ථීනමිද්ධ චෛතසික ද ඉවත් වේ. එබැවින් "මෝහ මූල සිත් දෙක -පෙ- චෛතසික 43" යනුවෙන් දැක්වීය.

ග්‍රන්ථ ගොච්ඡකය

දුකය	පාලිය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
			ස්	ආ	ධා	ස
ගන්ථ	ගන්ථාධම්මා	ලෝභ, ද්වේෂ, දිට්ඨි යන ධර්ම-03	1	1	1	2
	නො ගන්ථා ධම්මා	සිත්-89, චෙ-49, රූප-28, නිර්වාණය	5	12	18	3
ගන්ථනියා	ගන්ථනියා ධම්මා	ලෞකික සිත්-81, චෙ-52, රූප-28	5	12	18	2
	අගන්ථනියා ධම්මා	ලෝකෝත්තර සිත්-08, චෙ-36, නිර්වාණය	4	2	2	2
ගන්ථසම්පයුත්තා	ගන්ථසම්පයුත්තා ධම්මා	ලෝභ-08, ද්වේෂ-2, දිට්ඨි විප් සිත්වල ලෝභය, ද්වේෂ සිත්වල ඇති ද්වේෂය, විචිකිච්ඡා හැර චෛතසික-25	4	2	2	2
	ගන්ථවිප්පයුත්තා ධම්මා	මෝහ සිත්-2, කුසල, විපාක, ක්‍රියා සිත් 77 චෙ- 38, දිට්ඨි විප්පයුත්ත සිත්වල ලෝභය, ද්වේෂ සිත්වල ඇති ද්වේෂය, රූප 28, නිර්වාණය	5	12	18	4
ගන්ථගන්ථනිය	ගන්ථා චෙව ධම්මා ගන්ථනියා ච	ලෝභ, ද්වේෂ, දිට්ඨි යන ධර්ම-03	1	1	1	2
	ගන්ථනියා චෙව ධම්මා නො ච ගන්ථා	ලෞකික සිත්-81, චෙ-49, රූප-28	5	12	18	1
	දුක මුක්ත	අගන්ථනියා පදයේ ස්වරූපාර්ථ ලෝකෝත්තර සිත්-08, චෙ-36, නිර්වාණය				

පටුන වෙත

ගන්ථ ගන්ථසම්පයුත්ත	ගන්ථා චෙව ධම්මා ගන්ථසම්පයුත්තා ච	දිට්ඨි සම්පයුත්ත සිත් සතරෙහි ඇති ලෝභ දිට්ඨි යන ග්‍රන්ථ 02	1	1	1	2
	ගන්ථසම්පයුත්තා චෙව ධම්මා නො ච ගන්ථා	ලෝභ සිත්-08, ද්වේෂ සිත්-02, ලෝභ ද්වේෂ දිට්ඨි විචිකිච්ඡා වර්ජිත චෙ - 23	4	2	2	1
	දුක මුක්ත	ගන්ථවිප්පයුත්තා පදයේ ස්වරූපාර්ථ මෝහ සිත්-2, කුසල, විපාක, ක්‍රියා සිත් 77 38, දිට්ඨි විප්පයුත්ත සිත්වල ලෝභය, ද්වේෂ සිත්වල ඇති ද්වේෂය, රූප 28, නිර්වාණය				
ගන්ථවිප්පයුත්ත ගන්ථනිය	ගන්ථවිප්පයුත්තා බො පන ධම්මා ගන්ථනියාපි	මෝහ සිත්-2, ලෞකික කුසල විපාක ක්‍රියා සිත් 69, චෙ-~~43~~, 52, දිට්ඨි විප් සිත්වල ලෝභය, ද්වේෂ සිත්වල ඇති ද්වේෂය, රූප-28	5	12	18	1
	ගන්ථවිප්පයුත්තා බො පන ධම්මා අගන්ථනියාපි	ලෝකෝත්තර සිත්-08, චෙ-36, නිර්වාණය	4	2	2	2
	දුක මුක්ත	ගන්ථසම්පයුත්තා පදයේ ස්වරූපාර්ථ ලෝභ-08, ද්වේෂ-2, දිට්ඨි විප් සිත්වල ලෝභය, ද්වේෂ සිත්වල ඇති ද්වේෂය, විචිකිච්ඡා හැර චෛතසික-25				

පටුන වෙත

ගන්ථ දුකය

ගන්ථා ධම්මා - නො ගන්ථා ධම්මාති.

සඤ්ඤෝජන ගොච්ඡකයට අනතුරුව ගන්ථ ගොච්ඡකය දේශනා කොට වදළ සේක. එය ද ගන්ථ දුකය - ගන්ථනිය දුකය - ගන්ථ සම්පයුත්ත දුකය - ගන්ථ ගන්ථනිය දුකය - ගන්ථ ගන්ථ සම්පයුත්ත දුකය - ගන්ථ විප්පයුත්ත ගන්ථනීය දුකයාගේ වශයෙන් සය වැදෑරුම් වන්නේය.

ඔවුනතුරෙන් ගන්ථ දුකය පළමු කොටස වදළ සේක. එය ද ප්‍රථම පදය දුතිය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය, ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **ගන්ථා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **නො ගන්ථා ධම්මා** යනුවෙනි.

ගන්ථා ධම්මා - සංසාරයෙහි සත්වයන් ගැට ගසන අර්ථයෙන් ග්‍රන්ථ නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නො ගන්ථා ධම්මා - ග්‍රන්ථ නම් නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ගන්ථා ධම්මා : යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ - ද්වේශ - දිට්ඨි යන ග්‍රන්ථ ධර්ම තිදෙනා ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකම සංස්කාරස්කන්ධයකි, ආයතන වශයෙන් එකම ධර්මායතනයකි, ධාතු වශයෙන් එකම ධර්ම ධාතුවකි, ආර්ය සත්‍ය වශයෙන් වනාහි දෙකකි, දොස දිට්ඨි දෙක දුක්ඛ සත්‍ය නම් වන්නේය. ලෝභය සමුදය සත්‍ය නම් වන්නේය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

නො ගන්ථා ධම්මා : යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි ග්‍රන්ථ ධර්ම වර්ජිත සියලු පරමාර්ථ ධර්මයෝ ලැබෙන්නා හ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය රූපස්කන්ධය නම් වන්නේය, එකුන් පණස් චෛතසික

අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේය, සඤ්ඤාව සංඥස්කන්ධය නම් වන්නේය. ඉතිරි සත් සාළිස් චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේය. එකුන් අනූ චිත්තය විඥණස්කන්ධය නම් වන්නේය, නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්තයි, මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂුප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේය. ශ්‍රෝත්‍රප්‍රසාදය සෝතායතනය නම් වන්නේය, ඝ්‍රාණප්‍රසාදය ඝාණායතනය නම් වන්නේය, ජිහ්වාප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේය, කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේය.

වර්ණ රූපය රූපායතනය නම් වන්නේය. ශබ්ද රූපය සද්දයතනය නම් වන්නේය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේය. රස රූපය රසායතනය නම් වන්නේය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රයසංඛ්‍යාත ස්ඵර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේය. එකුන් අනූ චිත්තය මනායතනය නම් වන්නේය.

එකුන් පණස් චෛතසිකය ද, ආපෝ ධාතු, ඉත්ථීන්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූප, ජීවිත, රූප, ආහාර රූප, ආකාශ රූප, කාය විඤ්ඤත්ති රූප, වචී විඤ්ඤත්ති රූප, ලහුතා රූප, මුදුතා රූප, කම්මඤ්ඤතා රූප, උපචය රූප, සන්තති රූප, ජරතා රූප, අනිච්චතා රූප යන සුඛුම රූප සොළස ද, නිර්වාණය ද ධම්මායතනය නම් වන්නේය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නාහු කෙසේද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂුප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේය. ශ්‍රෝත්‍රප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේය. ඝ්‍රාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේය. ජිහ්වාප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේය. කායප්‍රසාදය කාය ධාතුව නම් වන්නේය.

වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේය. රස රූපය රස ධාතුව නම් වන්නේය, පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්ඵර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේය.

චක්ඛු විඤ්ඤාණ යුගලය චක්ඛු විඤ්ඤාණ ධාතුව නම් වන්නේය.

පටුන වෙත

සෝත විඤ්ඤාණ යුගලය සෝත විඤ්ඤාණ ධාතුව නම් වන්නේය. ඝාණ විඤ්ඤාණ යුගලය ඝාණ විඤ්ඤාණ ධාතුව නම් වන්නේය. ජිව්හා විඤ්ඤාණ යුගලය ජිව්හා විඤ්ඤාණ ධාතුව නම් වන්නේය. කාය විඤ්ඤාණ යුගලය කාය විඤ්ඤාණ ධාතුව නම් වන්නේය. පඤ්චද්වාරාවර්ජන චිත්තය හා සම්පටිච්ඡන යුගලය මනෝ ධාතුව නම් වන්නේය. ඉතිරි සසැත්තෑ චිත්තය මනෝ විඤ්ඤාණ ධාතුව නම් වන්නේය.

එකුන් පණස් චෛතසිකය ද, ඉත්ථීන්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූප, ජීවිත රූප, ආහාර රූප, ආකාශ රූප, කාය විඤ්ඤත්ති රූප, වචී විඤ්ඤත්ති රූප, ලහුතා රූප, මුදුතා රූප, කම්මඤ්ඤතා රූප, උපචය රූප, සන්තති රූප, ජරතා රූප, අනිච්චතා රූප යන සුඛුම රූප සොළසද, නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේ ය, මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නාහ.

ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේද යත්, ලෞකික සිත් එක් අසූව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික එකුන් පණස ද, අටවිසි රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේය. නිර්වාණය නිරෝධ සත්‍යය නම් වන්නේය. සතර මාර්ග සම්ප්‍රයුක්ත සම්මා දිට්ඨි ආදී මාර්ගාංග අට දෙන එක් වරක් බැගින් ද, සංකප්ප වර්ජිත සත්දෙන සතර වරක් බැගින් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන් තිස ද, ඵල චිත්තෝත්පාද සත්තිස ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

මේ ශබ්දවලිය හෙවත් ගන්ථ දුකය වනාහි පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදළ බැවින් දුක නම් වන්නේය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදී ලබ්ද්ධ නාම දුක නම් වන්නේ ය. සියලු පරමාර්ථ ධර්ම ඇතුළත් බැවින් නිප්‍රදේශ දුක නම් වන්නේය.

ගන්ථනිය දුකය

ගන්ථනියා ධම්මා - අගන්ථනියා ධම්මාති

ගන්ථ දුකයට අනතුරුව ගන්ථනිය දුකය වදළ සේක. එය ද, ප්‍රථම පදය ද්විතිය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක, කෙසේ වදළ

සේක්ද යත්, **ගන්ථනියා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතිය පදය වදළ සේක. කෙසේ වදළ සේක්ද යත්, **අගන්ථනිය ධම්මා** යනුවෙනි.

ගන්ථනියා ධම්මා - ග්‍රන්ථ ධර්මයන්ට හිත වූ නොහොත් ග්‍රන්ථ ධර්මයන්ට හට අරමුණු වන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[26]

අගන්ථනියා ධම්මා - ග්‍රන්ථ ධර්මයන් හට හිත නොවූ ග්‍රන්ථ ධර්මයන් හට අරමුණු නොවන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ගන්ථනියා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෞකික සිත් එක් අසූවද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණසද, අටවිසි රූපයද, ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු).

අගන්ථනියා ධම්මා - යන ද්විතිය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝකෝත්තර සිත් අටද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිසද නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු. ආදි ලබ්ධ නාම දුකයකි. නිප්‍රදේශ දුකයකි).

---

26. **ගන්ථනියා** - (ගන්ථෙහි ගන්ථීතබ්බා'ති = ගන්ථනියා). ග්‍රන්ථ ධර්මයන්ට අරමුණු වන ධර්මයන් "ගන්ථනිය" නම් වේ - (අට්ඨකථා).

(ගන්ථීයතෙ = ගන්ථනං; ගන්ථෙ නියුත්තා = ගන්ථනියා; ගන්ථනං අරහන්තී'ති වා = ගන්ථනියා). ග්‍රන්ථයන්හි යෙදුණා වූ ධර්මයෝ "ගන්ථනිය" නම් වේ. දෙවන ක්‍රමය ග්‍රන්ථයට සුදුසු වූ ධර්මයෝ "ගන්ථනිය" නම් වේ.

පටුන වෙත

ගන්ථසම්පයුත්ත දුකය

ගන්ථ සම්පයුත්තා ධම්මා - ගන්ථ විප්පයුත්තා ධම්මාති.

ගන්ථනිය දුකයට අනතුරුව ගන්ථසම්පයුත්ත දුකය වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතිය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ගන්ථ සම්පයුත්තා ධම්මා** - යනුවෙනි, ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක, කෙසේ වදාළ සේක් ද යත්, **ගන්ථ විප්පයුත්තා ධම්මා** - යනුවෙනි.

ගන්ථ සම්පයුත්තා ධම්මා - ග්‍රන්ථ ධර්මයන් සමඟ එකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ගන්ථ විප්පයුත්තා ධම්මා - ග්‍රන්ථ ධර්මයන් සමඟ මිශ්‍ර නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ගන්ථ සම්පයුත්තා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝභ මූල දෝස මූල අකුසල් සිත් දශයද, දෝස විචිකිච්ඡා වර්ජිත තත් සම්ප්‍රයුක්ත පස්විසි චෛතසිකයද, ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු).

ගන්ථ විප්පයුත්තා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝභ මූල දෝස මූල අකුසල් සිත් දශය වර්ජිත එකුන් අසූ චිත්තයද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිසද, දෝස විචිකිච්ඡා දෙකද, අටවිසි රූපයද, නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙර සේ ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, නිප්‍රදේශ දුකයකි).

ගන්ථ ගන්ථනිය දුකය

ගන්ථා චෙව ධම්මා ගන්ථනියා ච, ගන්ථනියා චෙව ධම්මා නො ච ගන්ථාති.

පටුන වෙත

ගන්ථ සම්පයුත්ත දුකයට අනතුරුව ගන්ථ ගන්ථනිය දුකය වදළ සේක. එයද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදල සේක්ද යත්, **ගන්ථා චෙව ධම්මා ගන්ථනියා ච** - යනුවෙනි. ඉන් අනතුරුව ද්විතිය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **ගන්ථනියා චෙව ධම්මා නො ච ගන්ථා** - යනුවෙනි.

ගන්ථා චෙව ධම්මා ගන්ථනියා ච - ග්‍රන්ථ නම් වූද ග්‍රන්ථයන් හට අරමුණු වන්නාවූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ගන්ථනියා චෙව ධම්මා නො ච ගන්ථා - ග්‍රන්ථයන්ට අරමුණු වන්නා වූ ද එහෙත් ග්‍රන්ථ නම් නොවූ ද , නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ගන්ථා චෙව ධම්මා ගන්ථනියා ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝභ දෝස දිට්ඨි නම් වූ ග්‍රන්ථ ධර්මයෝ තිදෙනා ලැබෙන්නාහ. ස්කන්ධ වශයෙන් එකකි, ආයතන වශයෙන් එකකි, ධාතු වශයෙන් එකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු).

ගන්ථනියා චෙව ධම්මා නො ච ගන්ථා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි ලෞකික සිත් එක් අසූවද, තත් සම්ප්‍රයුක්ත ග්‍රන්ථ ධර්ම තුන වර්ජිත චෛතසික එකුන් පණසද, අටවිසි රූපයද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි. ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙර සේ ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, ලෝකෝත්තර ධර්ම ඇතුළත් නොවන බැවින් සප්‍රදේශ දුකයකි).

ගන්ථ ගන්ථසම්පයුත්ත දුකය

ගන්ථා චෙව ගන්ථසම්පයුත්තා ච - ගන්ථසම්පයුත්තා චෙව ධම්මා නො ච ගන්ථා

ගන්ථා ගන්ථනිය දුකයට අනතුරුව ගන්ථ ගන්ථ සම්පයුත්ත දුකය වදළ සේක. එය ද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන්

දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **ගන්ථා චෙව ධම්මා ගන්ථසම්පයුත්තා ච** - යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **ගන්ථසම්පයුත්තා චේව ධම්මා නො ච ගන්ථා** - යනුවෙනි.

ගන්ථා චෙව ධම්මා ගන්ථ සම්පයුත්තා ච - ග්‍රන්ථ නම් වූ ද , ග්‍රන්ථ ධර්මයන් සමඟ මිශ්‍ර වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ගන්ථ සම්පයුත්තා චෙව ධම්මා නො ච ගන්ථා - ග්‍රන්ථ ධර්මයන් සමඟ සම්ප්‍රයුක්ත වූ ද ග්‍රන්ථ නම් නොවූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ගන්ථා චෙව ධම්මා ගන්ථ සම්පයුත්තා ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝභ දිට්ඨි යන ග්‍රන්ථ ධර්ම දෙදෙනා ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි, ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු).

ගන්ථ සම්පයුත්තා චෙව ධම්මා නො ච ගන්ථා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි ලෝභ මූල දෝස මූල අකුසල් සිත් දශයද, ග්‍රන්ථ ධර්ම තුන හා විචිකිච්ඡා වර්ජිත තත් සම්පයුක්ත තෙවිසි චෛතසික ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි.

(පෙර සේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි, ලෝභ මූල දෝස මූල අකුසල් සිත් දශය වර්ජිත ඉතිරි සිත් එකුන් අසූවද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකද, දෝසයද, විචිකිච්ඡාවද, අටවිසි රූපයද, නිර්වාණය ද ඇතුළත් නොවන බැවින් සප්‍රදේශ දුකයකි).

ගන්ථ විප්පයුත්ත ගන්ථනිය දුකය

ගන්ථ විප්පයුත්තා ඛො පන ධම්මා ගන්ථනියාපි, ගන්ථ විප්පයුත්තා ඛො පන ධම්මා අගන්ථනියාපි.

ගන්ථ ගන්ථ සම්පයුත්ත දුකයට අනතුරුව ග්‍රන්ථ විප්පයුත්ත ගන්ථනිය දුකය වදාළ සේක. එය ද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ගන්ථ විප්පයුත්තා ඛො පන ධම්මා ගන්ථනියාපි** - යනුවෙනි, ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ගන්ථ විප්පයුත්තා ඛො පන ධම්මා අගන්ථනියාපි** - යනුවෙනි.

ගන්ථ විප්පයුත්තා ඛො පන ධම්මා ගන්ථනියා පි - ග්‍රන්ථ ධර්මයන් සමඟ මිශ්‍ර නොවූ ද , එහෙත් ග්‍රන්ථයන්ට අරමුණු වන්නා වූ ද, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ගන්ථ විප්පයුත්තා ඛො පන ධම්මා අගන්ථනියා පි - ග්‍රන්ථ ධර්මයන් සමඟ මිශ්‍ර නො වූ ද ග්‍රන්ථයන්ට අරමුණු නොවන්නා වූ ද, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ගන්ථ විප්පයුත්තා ඛො පන ධම්මා ගන්ථනියාපි - යන ප්‍රථම පදයා ග් අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝභ මූල දෝස මූල අකුසල් සිත් දශය වර්ජිත ඉතිරි ලෞකික සිත් එක් සැත්තෑවද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිසද, දෝසයද, විචිකිච්ඡාවද, අටවිසි රූපය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙර සේ ස්වරූප උදුරනු).

ගන්ථ විප්පයුත්තා ඛො පන ධම්මා අගන්ථනියාපි - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අටද, තත් සම්පයුක්ත චෛතසික සතිසද, නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, ලෝභ මූල දෝස මූල අකුසල් සිත් දශය ද, දෝස විචිකිච්ඡා වර්ජිත තත් සම්පයුක්ත පස්විසි චෛතසිකද ඇතුළත් නොවන බැවින් සප්‍රදේශ දුකයකි).

ගන්ථ ගොච්ඡකය - මිශ්‍රක දුකයන්

ප්‍රථම දුකයෙහි ප්‍රථම පදය බහා ගන්ථාචෙව ධම්මා ගන්ථසම්පයුත්තා ච ගන්ථසම්පයුත්තාචෙව නො ච ගන්ථා යන පස්වෙනි දුකය හටගන්නාක් මෙන් පළමුවෙනි දුකයෙහි තෘතිය දුකයාගේ දෙවෙනි පදය බහා "**ගන්ථාචෙව ධම්මා ගන්ථ විප්පයුත්තා ච ගන්ථවිප්පයුත්තා චෙව නොච ගන්ථා**" යන දුකයක් ද විය යුත්තේ ය.

ගන්ථාචෙව - ග්‍රන්ථ නම් වූ ද; ගන්ථවිප්පයුත්තාච-ග්‍රන්ථයන් හා විප්‍රයුක්ත වූ ද ධර්මයෝ ඇත්තාහ; ගන්ථ විප්පයුත්තාචෙව - ග්‍රන්ථ හා විප්‍රයුක්ත වූ ද; නොච ගන්ථා- ග්‍රන්ථ නම් නොවන්නාවූ ද ධර්මයෝ ඇත්තාහ.

එහි ගන්ථාචෙව ධම්මා ගන්ථ විප්පයුත්තා ච යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ලෝභය හා ද්වේෂ මූල දෙසිතෙහි ද්වේෂය ලැබේ. ගන්ථවිප්පයුත්තා චෙව නොච ගන්ථා යන දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලෝභ මූල ද්වේෂ මූල වර්ජිත එකුන් අසූ චිත්තය ලෝභ දිට්ඨි මාන දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච ථීනමිද්ධ වර්ජිත තෙසාළිස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය ලැබෙති. ආදිලබ්ධනාම දුකය නමි. ලෝභ මූලික සිත් අට ය ද්වේෂ මූල දෙසිත ය දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ලෝභය ද්වේෂ මූල දෙසිතෙහි ද්වේෂය විචිකිච්ඡා වර්ජිත පස්විසි චෛතසිකය දුක මුක්ත වූ හෙයින් සප්පදේස දුක නමි.

ගන්ථවිප්පයුත්තා ඛොපන ධම්මා ගන්ථනීයාපි අගන්ථනීයාපි යන දේශනාවෙහි 'සද්දාධිකා අත්ථාධිකො හොති' යන පරිභාෂා නයින් ඛො පන යන අධිකාර්ථ ශබ්දයන් කරණකොට ගෙන ලැබෙන්නා වූ අතිරේක දුකයන් අතුරෙන් දෙවෙනි දුකයෙහි තෘතිය දුකයාගේ දෙවෙනි පදය බහා ගන්ථවිප්පයුත්තා චෙව ධම්මා ගන්ථනීයාපි අගන්ථනීයාපි යන සවෙනි දුකය හටගන්නාක් මෙන් දෙවෙනි දුකයෙහි ප්‍රථම දුකයාගේ දෙවෙනි පදය බහා "**නො ගන්ථා ධම්මා ගන්ථනීයාපි අගන්ථනීයාපි**" යන දුකයක් ද විය යුත්තේ ය. එහි නො ගන්ථා ධම්මා ගන්ථනීයාපි යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලෞකික සිත් එක් අසූව ග්‍රන්ථ ධර්ම වර්ජිත

එකුන්පණස් චෛතසිකය අටවිසි රූපය ලැබෙති. නො ගන්ථා ධම්මා අගන්ථනීයාපි දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලෝකෝත්තර ධර්ම සියල්ල ලැබෙති. (සෙස්ස සුගම ය.)

තෘතිය දුකයෙහි ප්‍රථම දුකයාගේ දුතිය පදය බහා නොගන්ථා ධම්මා ගන්ථසම්පයුත්තාපි ගන්ථවිප්පයුත්තාපි යන දුකයක් ද විය යුත්තේ ය. එහි නොගන්ථා ධම්මා ගන්ථසම්පයුත්තාපි යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලෝභ සිත් අට ය ද්වේෂ මූල දෙසිත ය ලෝභ දිට්ඨි ද්වේෂ විචිකිච්ඡා වර්ජිත තෙවිසි චෛතසිකය ලැබෙති. නොගන්ථා ධම්මා ගන්ථවිප්පයුත්තාපි යන දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලෝභ මූල ද්වේෂ මූල වර්ජිත එකුන් අසූ චිත්තය ලෝභ දිට්ඨි මාන දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච ථීනමිද්ධ වර්ජිත තෙසාළස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. (සෙස්ස සුගම ය.)

තෘතිය දුකයෙහි ප්‍රථම දුකයාගේ ප්‍රථම පදය බහා "**ගන්ථාධම්මා ගන්ථසම්පයුත්තාපි ගන්ථවිප්පයුත්තාපි**" යන දුකයක් ද විය යුත්තේ ය. ගන්ථාධම්මා ගන්ථසම්පයුත්තාපි යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරෙහි ඇති ලෝභ දිට්ඨි යන දෙදෙන ලැබෙති. ගන්ථාධම්මා ගන්ථවිප්පයුත්තාපි යන දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ද්වේෂ මූල දෙසිතෙහි ද්වේෂය ලැබේ. (සෙස්ස සුගම ය.)

ප්‍රථම දුකයෙහි දුතිය දුකයාගේ ප්‍රථම පදය බහා "**ගන්ථනීයා ධම්මා ගන්ථාපි නොගන්ථාපි**" යන දුකයක් ද විය යුත්තේ ය. ගන්ථනීයා ධම්මා ගන්ථාපි යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලෝභ දිට්ඨි ද්වේෂ යන ධර්මයෝ තිදෙනා යි. ගන්ථනීයා ධම්මා නොගන්ථාපි යන දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ග්‍රන්ථ ධර්ම වර්ජිත ලෞකික ධර්ම සියල්ල ලැබෙති. (සෙස්ස සුගම ය.)

ප්‍රථම දුකයෙහි තෘතිය දුකයාගේ දුතිය පදය බහා "**ගන්ථවිප්පයුත්තා ධම්මා ගන්ථාපි නොගන්ථාපි**" යන දුකයක් ද විය යුත්තේ යි. එහි ගන්ථවිප්පයුත්තා ධම්මා ගන්ථාපි යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ලෝභය හා ද්වේෂ මූල දෙසිතෙහි ද්වේෂය ලැබේ. ගන්ථවිප්පයුත්තා ධම්මා නොගන්ථාපි යන දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලෝභ මූල

ද්වේෂ මූල වර්ජිත එකුන් අසූ චිත්තය ලෝභ දිට්ඨි මාන දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච ථීනමිද්ධ වර්ජිත තෙසාලිස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන මෙම ධර්මයෝ ලැබෙති. ආදිලබ්ධනාම දුකය නම්. ලෝභමූල ද්වේෂමූල සිත් දසය දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ඇති ලෝභය හා ද්වේෂමූල දසය දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ලෝභය හා ද්වේෂමූල දෙසිතෙහි ද්වේෂය හැර පස්විසි චෛතසිකය දුක මුක්තයහ.

ගන්ථ ගොච්ඡකය සමාප්ත ය

06. ඔඝ ගොච්ඡකය

ඕඝ - (ඔහනන්ති ඔසීදාපෙන්තීති ඔඝා) - යමෙකුගේ සන්තානයෙහි ලෝභ දිට්ඨි මෝහ යන මේ පාප ධර්ම ඇතොත් ඒ පුද්ගලයා සංසාර වට්ටයෙහි - සංසාර සාගරයෙහි පත්ලට ම ගිල්වා දමත්නුයි ඔඝ නම් වන්නාහ.

"චත්තාරො ඔඝා කාමොඝො භවොඝො දිට්ඨොඝො අවිජ්ජොඝො." ලෝභ, දිට්ඨි, මෝහ වන්නාවූ ඕඝ ධර්මයන් "ඕඝ" නම් වේ. මෙහි ආසව ධර්මයන් සමඟ වෙනසක් නැත. ආසව ගොච්ඡකය මෙන් ස්වරූපාර්ථාදිය ගත යුතු යි.

<u>ඔඝ දුකය</u>

ඔඝා ධම්මා - නො ඔඝා ධම්මාති

ගන්ථ ගොච්ඡකයට අනතුරුව ඕඝ ගොච්ඡකය දේශනා කොට වදළ සේක. එය ද ඕඝ දුකය, ඕඝනීය දුකය, ඕඝ සම්පයුත්ත දුකය, ඕඝ ඕඝනීය දුකය, ඕඝ ඕඝ සම්පයුත්ත දුකය, ඕඝ විප්පයුත්ත ඕඝනීය දුකයන්ගේ වශයෙන් සය වැදෑරුම් වන්නේය.

ඔවුනතුරෙන් පළමු කොට ඕඝ දුකය දේශනා කොට වදළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය, ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **ඔඝා ධම්මා** යනුවෙනි, ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **නො ඔඝා** ධම්මා යනුවෙනි.

ඔඝා ධම්මා - සත්වයන් සංසාර සාගර පත්ලෙහි ගසන්නා වූ අර්ථයෙන් ඔඝ නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නො ඔඝා ධම්මා - ඔඝ නම් නොවන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ඔඝා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ, දිට්ඨි, මෝහ නම් වූ ඕඝ ධර්මයෝ තිදෙන ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි, ආයතන වශයෙන් එකකි, ධාතු වශයෙන් එකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු).

පටුන වෙත

නො ඔසා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන් අනූ චිත්තය ද ඕස ධර්ම තුන වර්ජිත කොට ඇති එකුන් පණස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය රූපස්කන්ධය නම් වන්නේය, එකුන් පණස් චෛතසික අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේය. සඤ්ඤාව සංඥස්කන්ධය නම් වන්නේය. ඉතිරි සත්සාළිස් චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේය, එකුන් අනූ චිත්තය විඥනස්කන්ධය වන්නේය, නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්තයි, මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂුප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේය. ස්‍රෝත්‍රප්‍රසාදය සෝතායතනය නම් වන්නේය, ඝ්‍රාණප්‍රසාදය ඝානායතනය නම් වන්නේය, ජිහ්වාප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේය, කායප්‍රසාදය කායායතනය නම් වන්නේය.

වර්ණ රූපය රූපායතනය නම් වන්නේය, ශබ්ද රූපය සද්දයතනය නම් වන්නේය, ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේය, රස රූපය රසායතනය නම් වන්නේය, පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්ඵශ්‍ය රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේය, එකුන් අනූ චිත්තය මනායතනය නම් වන්නේය.

එකුන් පණස් චෛතසිකය ද, ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූප, ජීවිත රූප, ආහාර රූප, ආකාශ රූප, කායවිඤ්ඤත්ති රූප, වචීවිඤ්ඤත්ති රූප, ලහුතා රූප, මුදුතා රූප, කම්මඤ්ඤතා රූප, උපචය රූප, සන්තති රූප, ජරතා රූප, අනිච්චතා රූප යන සුඛුම රූප සොළෂ ද, නිර්වාණය ද ධම්මායතනය නම් වන්නේය, මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂුප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේය,

ශ්‍රෝත්‍රප්‍රසාදය සොත ධාතුව නම් වන්නේය, ඝ්‍රාණ ප්‍රසාදය ඝාන ධාතුව නම් වන්නේය, ජිහ්වාප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේය, කායප්‍රසාදය කාය ධාතුව නම් වන්නේය.

වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේය, ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේය, ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේය, රස රූපය රස ධාතුව නම් වන්නේය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේය.

චක්ඛු විඤ්ඤාණ යුගලය චක්ඛු විඤ්ඤාණ ධාතුව නම් වන්නේය, සෝත විඤ්ඤාණ යුගලය සෝත විඤ්ඤාණ ධාතුව නම් වන්නේය, ඝාණ විඤ්ඤාණ යුගලය ඝාණ විඤ්ඤාණ ධාතුව නම් වන්නේය, ජිව්හා විඤ්ඤාණ යුගලය ජිව්හා විඤ්ඤාණ ධාතුව නම් වන්නේය, කාය විඤ්ඤාණ යුගලය කාය විඤ්ඤාණ ධාතුව නම් වන්නේය, පඤ්චද්වාරාවර්ජන චිත්තය හා සම්පටිච්ඡන යුගලය මනෝ ධාතුව නම් වන්නේය, ඉතිරි සසැත්තෑ චිත්තය මනෝ විඤ්ඤාණ ධාතුව නම් වන්නේය.

එකුන් පණස් චෛතසිකය ද, ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූප, ජීවිත රූප, ආහාර රූප, ආකාශ රූප, කායවිඤ්ඤත්ති රූප, වචීවිඤ්ඤත්ති රූප, ලහුතා රූප, මුදුතා රූප, කම්මඤ්ඤතා රූප, උපචය රූප, සන්තති රූප, ජරතා රූප, අනිච්චතා රූප යන සුඛුම රූප සොළස ද, නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේය. මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නාහ.

ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේද යත්, ලෞකික සිත් එක් අසූව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික එකුන් පණස ද, අටවිසි රූපය ද දුක්ඛාර්ය සත්‍ය නම් වන්නේය, නිර්වාණය නිරෝධ සත්‍ය නම් වන්නේය. සතර මාර්ග සම්ප්‍රයුක්ත සම්මා දිට්ඨි ආදී මාර්ගාංග සත් දෙන එක් වර බැගින් ද සංකප්ප වර්ජිත මාර්ගංග සත් දෙන සතර වර බැගින් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍ය නම් වන්නේය, ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන් තිසද ඵල චිත්තෝත්පාද සත්තිස ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ, මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

මේ ශබ්දවලිය හෙවත් ඕඝ දුකය, පරමාර්ථ ධර්මයන් පද දෙකක් කොට වදළ බැවින් දුක නම් වන්නේය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදි ලබ්ධ නාම දුක නම් වන්නේය. සියලු පරමාර්ථ ධර්ම මෙහි ඇතුලත් වන බැවින් නිප්‍රදේශ දුක නම් වන්නේය.

ඔඝනීය දුකය

ඔඝනීයා ධම්මා - අනොඝනීයා ධම්මාති.

ඔඝ දුකය දේශනා කොට වදරා ඉන් අනතුරුව ඔඝනීය දුකය දේශනා කොට වදළ සේක. එය ද, ප්‍රථම පදය ද්විතිය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය, ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **ඔඝනීයා ධම්මා** - යනුවෙනි, ඉන් අනතුරුව ද්විතිය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත් **අනොඝනීයා ධම්මා** - යනුවෙනි.

ඔඝනීයා ධම්මා - ඔඝ ධර්මයන්ට හිත වූ නොහොත් ඔඝයන් හට අරමුණු වන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අනොඝනීයා ධම්මා - ඔඝයන්ට අරමුණු නොවන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[27]

ඔඝනීයා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක් අසූව ද තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර මෙන් ස්වරූප උදුරනු).

අනොඝනීයා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට දෙන ද, තත්

---

27. **ඔඝනීයා** - (ඔඝෙහි අතික්කමිතබ්බා = ඔඝනීයා). "අරමුණු කොට ඔඝයන් විසින් ගිලගනිත්නු'යි ඔඝනීය නම් වෙති." - (අට්ඨකතා).

සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

(පෙර සේ ස්වරූප උදුරනු, - ආදිලබ්ධ නාම දුකයකි, නිප්‍රදේශ දුකයකි).

ඔඝසම්පයුත්ත දුකය

ඔඝසම්පයුත්තා ධම්මා - ඔඝවිප්පයුත්තා ධම්මාති

ඔඝනිය දුකය දේශනා කොට වදරා ඉන් අනතුරුව ඔඝ සම්පයුත්ත දුකය දේශනා කොට වදළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **ඔඝ සම්පයුත්තා ධම්මා** - යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත් **ඔඝ විප්පයුත්තා ධම්මා** - යනුවෙනි.

ඔඝ සම්පයුත්තා ධම්මා - ඔඝ ධර්මයන් සමඟ එකෝත්පාදා දී සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් මිශ්‍ර වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ඔඝ විප්පයුත්තා ධම්මා - ඔඝ ධර්මයන් සමඟ මිශ්‍ර නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ඔඝ සම්පයුත්තා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල සිත් දොළස ද, දෝස මූල මෝහ මූල සිත්හි මෝහය වර්ජිත සත්විසි චෛතසිකය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

(පෙර සේ ස්වරූප උදුරනු).

ඔඝ විප්පයුත්තා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ වශයෙන් දොළොස් අකුසල සිත් වර්ජිත ඉතිරි සත් සැත්තෑ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද, දෝස මූල මෝහ මූල සිත්හි මෝහය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ

ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

(පෙර සේ ස්වරූප උදුරනු).

(ආදිලබ්ධ නාම දුකයකි, නිප්‍රදේශ දුකයකි).

ඔඝ ඔඝනීය දුකය

ඔඝා චෙව ධම්මා ඔඝනීයා ච - ඔඝනීයා චෙව ධම්මා නො ච ඔඝාති.

ඔඝ සම්පයුත්ත දුකයට අනතුරුව ඔඝ ඔඝනීය දුකය දේශනා කොට වදළ සේක. එය ද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **ඔඝා චෙව ධම්මා ඔඝනීයා ච** - යනුවෙනි.

ඔඝා චෙව ධම්මා ඔඝනියා ච - ඔඝ නම් වූ ද , ඔඝ ධර්මයන්ට අරමුණු වන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ඔඝනියා චෙව ධම්මා නො ච ඔඝා - ඔඝයන්ට අරමුණු වන්නා වූ ද එහෙත් ඔඝ නම් නොවන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ඔඝා චෙව ධම්මා ඔඝනීයා ච - යන ප්‍රථම පදයා ගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ දිට්ඨි මෝහ නම් වූ ඔඝ ධර්ම තිදෙන ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි, ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි,

(පෙර සේ ස්වරූප උදුරනු).

ඔඝනීයා චේව ධම්මා නො ච ඔඝා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක් අසූව ද, තත් සම්ප්‍රයුත්ත ඔඝ ධර්ම තුන වර්ජිත චෛතසික එකුන් පණස ද, අටවිසි රූපය ද, ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය

සත්‍ය වශයෙන් එකකි. (පෙර සේ ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, ලෝකෝත්තර ධර්ම සියල්ල ඇතුලත් නොවන බැවින් සප්‍රදේශ දුකයකි).

ඔඝ ඔඝසම්පයුත්ත දුකය

ඔඝා චෙව ධම්මා ඔඝ සම්පයුත්තා ච - ඔඝ සම්පයුත්තා චෙව ධම්මා නො ච ඔඝාති.

ඔඝ ඔඝනීය දුකය දේශනා කොට වදරා ඉන් අනතුරුව ඔඝ ඔඝ සම්පයුත්ත දුකය දේශනා කොට වදළ සේක. එය ද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **ඔඝා චෙව ධම්මා ඔඝ සම්පයුත්තා ච** යනුවෙනි, ඉන් අනතුරුව ද්විතීය පදය දේශනා කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **ඔඝ සම්පයුත්තා චෙව ධම්මා නොච ඔඝා** යනුවෙනි.

ඔඝා චෙව ධම්මා ඔඝ සම්පයුත්තා ච - ඔඝ නම් වූ ද ඔඝ ධර්මයන් සමඟ මිශ්‍ර වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ඔඝ සම්පයුත්තා චෙව ධම්මා නො ච ඔඝා - ඔඝ ධර්මයන් සමඟ සම්ප්‍රයුත්ත වූ ද , එහෙත් ඔඝ නම් නොවූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

ඔඝා චේව ධම්මා ඔඝ සම්පයුත්තා ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ මූල අකුසල් සිත් අටෙහි යෙදුනා වූ ඔඝ ධර්ම තිදෙන ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකකි, ධාතු වශයෙන් එකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

(පෙර සේ ස්වරූප උදුරනු).

ඔඝ සම්පයුත්තා චේව ධම්මා නෝ ච ඔඝා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළස ද, තත් සම්ප්‍රයුක්ත ඔඝ ධර්ම තුන වර්ජිත සූවිසි චෛතසිකය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන

වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි.

(පෙර සේ ස්වරූප උදුරනු - ආදි ලබ්ධ නාම දුකයකි, අකුසල ධර්ම වර්ජිත සත් සැත්තෑ චිත්තය ද තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ඇතුලත් නොවන බැවින් සප්‍රදේශ දුකයකි).

ඔඝවිප්පයුත්ත ඔඝනිය දුකය

ඔඝ විප්පයුත්තා ඛො පන ධම්මා ඔඝනීයාපි - ඔඝ විප්පයුත්තා ඛො පන ධම්මා අනොඝනීයපීති

ඔඝ ඔඝ සම්පයුත්ත දුකයට අනතුරුව ඔඝ විප්පයුත්ත ඔඝනීය දුකය වදළ සේක. එය ද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **ඔඝවිප්පයුත්තා ඛො පන ධම්මා ඔඝනීයාපි** - යනුවෙනි, ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **ඔඝවිප්පයුත්තා ඛො පන ධම්මා අනොඝනීයාපි** යනුවෙනි.

ඔඝ විප්පයුත්තා ඛො පන ධම්මා ඔඝනීයාපි - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දොළොස් අකුසල් සිත් වර්ජිත ලෞකික සිත් එකුන් සැත්තෑවද, තත් සම්පයුක්ත අටතිස් චෛතසික ද දෝස මූල මෝහ මූල අකුසල් සිත් සතරෙහි මෝහය ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි.

(පෙර සේ ස්වරූප උදුරනු).

ඔඝ විප්පයුත්තා ඛො පන ධම්මා අනොඝනීයාපි - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට දෙනා ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

(පෙර සේ ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, දෝස මූල මෝහ මූල අකුසල් සිත් සතරෙහි මෝහය හැර සෙසු අකුසල් සිත් දොළස ද, චෛතසික සත් විස්ස ද ඇතුලත් නොවන් බැවින් සප්‍රදේශ දුකයකි).

ඛොපන යන අධිකාර්ථ පදයක් නිසා අටුවාටිකානයින් ගනු ලබන සමහව දුකයන් ද ආසව ගොච්ඡකය හා සමාන වන බැවින් පාලිමාත්‍රය පමණක් දක්වන්නෙමු.

1. නො ඔසා ධම්මා ඔසනීයාපි, අනොසනියාපි
2. ඔසා ධම්මා ඔස සම්පයුත්තාපි ,ඔස විප්පයුත්තාපි
3. නො ඔසා ධම්මා ඔස සම්පයුත්තාපි, ඔස විප්පයුත්තාපි
4. ඔසනීයා ධම්මා ඔස සම්පයුත්තාපි ඔස විප්පයුත්තාපි
5. ඔසනීයා ධම්මා ඔසාපි නො ඔසාපි
6. ඔස සම්පයුත්තා ධම්මා ඔසාපි නො ඔසාපි
7. ඔස විප්පයුත්තා ධම්මා ඔසාපි ස නො ඔසාපි

මෙයට අදළ අර්ථ වර්ණාව ආසව ගොචඡකය බලා දත යුත්තේය. දේශනා විලාශ වශයෙන් ද හා පුග්ගලාධ්‍යාශ වශයෙන් ද ආසව ඔස යොග ගොචඡකයන් වදාළේ වී නමුත් ධර්ම වශයෙන් වෙනසක් නැත්තේ ය. වෙනස වනාහි ව්‍යඤ්ජනය පමණමැ යි.

ඕස ගොච්ඡකය සමාප්ත ය

පටුන වෙත

07. යොග ගොච්ඡකය

යොගා - (වට්ටස්මිං යොජෙන්තීති = යොගා). යමෙකුගේ සන්තානයෙහි ලෝභ දිට්ඨි මෝහයෝ ඇත්තාහු ද, ඒ පුද්ගලයා සංසාර වට්ට දුක්ඛයෙහි යොදවන්නාහ යන අර්ථයෙන් යෝග නම් වෙති.

"චත්තාරො යොගා කාමයොගො භවයොගො දිට්ඨියොගො අවිජ්ජායොගො." ලෝභ, දිට්ඨි, මෝහ වන්නාවූ ඕඝ ධර්මයන් "යොග" නම් වේ.

<u>යොග දුකය</u>

යොගා ධම්මා - නො යොගා ධම්මාති.

ඕඝ ගොච්ඡකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව යෝග ගොච්ඡකය දේශනා කොට වදළ සේක. එය ද යෝග දුකය, යෝගනීය දුකය, යෝග සම්පයුත්ත දුකය, යෝග යෝගනීය දුකය, යෝග යෝග සම්පයුත්ත දුකය, යෝග විප්පයුත්ත යෝගනීය දුකයාගේ වශයෙන් සය වැදෑරුම් වන්නේය.

ඔවුනතුරෙන් යෝග දුකය පළමු කොට වදළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදල සේක. කෙසේ වදළ සේක් ද යත්, **යොගා ධම්මා - යනුවෙනි.** ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **නො යොගා ධම්මා** යනුවෙනි.

යොගා ධම්මා - සත්වයන් සංසාර වට්ට දුක්ඛයෙහි යොදවන අර්ථයෙන් යෝග නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නො යොගා ධම්මා - යෝග නම් නොවන්නා වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

යොගා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝභ දිට්ඨි මෝහ නම් වූ චෛතසික තිදෙන ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි, ආයතන වශයෙන් එකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු).

පටුන වෙත

නො යොගා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, එකුන් අනූ චිත්තයද, යෝග ධර්ම තුන වර්ජිත එකුන් පණස් චෛතසිකයද, අටවිසි රූපයද නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේද යත්, අටවිසි රූපය රූපස්කන්ධය නම් වන්නේය, එකුන් පණස් චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේය, සඤ්ඤාව සංඥස්කන්ධය නම් වන්නේය, ඉතිරි සත් සාළිස් චෛතසික සංස්කාරස්කන්ධය නම් වන්නේය, එකුන් අනූ චිත්තය විඤ්ඤාණස්කන්ධය නම් වන්නේය. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්තය, මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

ආයතන වශයෙන්, දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේය. ශ්‍රෝත්‍ර ප්‍රසාදය සෝතායතනය නම් වන්නේය, ඝාණ ප්‍රසාදය ඝානායතනය නම් වන්නේය. ජිහ්වා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේය, කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේය.

වර්ණ රූපය රූපායතනය නම් වන්නේය, ශබ්ද රූපය සද්දයතනය නම් වන්නේය, ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේය, රස රූපය රසායතනය නම් වන්නේය, පඨවි - තේජෝ - වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්ඵර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේය, එකුන් අනූ චිත්තය මනායතනය නම් වන්නේය.

එකුන් පණස් චෛතසිකද, ආපෝ ධාතු, ඉත්ථීන්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූප, ජීවිත රූප, ආහාර රූප, ආකාශ රූප, කාය විඤ්ඤත්ති රූප, වචීවිඤ්ඤත්ති රූප, ලහුතා රූප, මුදුතා රූප, කම්මඤ්ඤතා රූප, උපචය රූප, සන්තති රූප, ජරතා රූප, අනිච්චතා රූප, යන සුඛුම රූප සොළසද, නිර්වාණයද, ධම්මායතනය නම් වන්නේය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නාහු කෙසේද යත්,

අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේය, සෝත ප්‍රසාදය සෝතධාතුව නම් වන්නේය, ඝාණ ප්‍රසාදය ඝාණධාතුව නම් වන්නේය, ජිහ්වා ප්‍රසාදය ජිව්හාධාතුව නම් වන්නේය, කාය ප්‍රසාදය කායධාතුව නම් වන්නේය.

වර්ණ රූපය රූපධාතුව නම් වන්නේය, ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේය, ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේය, රස රූපය රස ධාතුව නම් වන්නේය, පඨවි - තේජෝ - වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේය, පඤ්චද්වාරාවර්ජන චිත්තය හා සම්පටිච්ඡන යුගලය මනෝ ධාතුව නම් වන්නේය. ඉතිරි සසැත්තෑ චිත්තය මනෝ විඤ්ඤාණ ධාතුව නම් වන්නේය.

එකුන් පණස් චෛතසිකයද, ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූප, ජීවිත රූප, ආහාර රූප, ආකාශ රූප, කායවිඤ්ඤත්ති රූප, වචීවිඤ්ඤත්ති රූප, ලහුතා රූප, මුදුතා රූප, කම්මඤ්ඤතා රූප, උපචය රූප, සන්තති රූප, ජරතා රූප, අනිච්චතා රූප යන සුඛුම රූප සොළසද, නිර්වාණය ද, ධම්ම ධාතුව නම් වන්නේය. මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නාහ.

ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේද යත්, ලෞකික සිත් එක් අසූවද, තත් සම්ප්‍රයුක්ත චෛතසික එකුන් පණසද, අටවිසි රූපයද දුක්ඛ සත්‍ය නම් වන්නේය, නිර්වාණය නිරෝධ සත්‍යය නම් වන්නේය, සතර මාර්ග සම්ප්‍රයුක්ත සම්මා දිට්ඨි ආදී මාර්ගාංග අට දෙන එක් වර බැගින් හා සංකප්ප වර්ජිත සත්දෙන සතරවර බැගින් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේය, ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන් තිසද, ඵල චිත්තෝත්පාද සත් තිසද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

මේ ශබ්දවලිය හෙවත් යෝග දුකය පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදළ බැවින් දුක නම් වන්නේය. මූල පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේය, සියලු පරමාර්ථ ධර්ම ඇතුළත් වන බැවින් නිප්‍රදේශ දුක නම් වන්නේය.

යෝග දුක යයි.

පටුන වෙත

යොගනිය දුකය

යොගනීයා ධම්මා - අයොගනීයා ධම්මාති.

යෝග දුකය දේශනා කොට වදරා ඉන් අනතුරුව යෝගනීය දුකය වදළ සේක. එයද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක්ද යත්, **යෝගනීයා ධම්මා** - යනුවෙනි, ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක්ද යත්, **අයෝගනීයා ධම්මා** - යනුවෙනි.[28]

යොගනියා ධම්මා -යෝග ධර්මයන්ට හිත වූ නොහොත් යෝගයන් හට අරමුණු වන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අයොගනියා ධම්මා - යෝගයන්ට අරමුණු නොවන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

යොගනීයා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක් අසූවද, තත් සම්ප්‍රයුක්ට චෛතසික දෙපණස ද, අටවිසි රූපයද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

(පෙර සේ ස්වරූප උදුරනු).

අයොගනියා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝකෝත්තර සිත් අටද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, නිප්‍රදේශ දුකයකි).

යෝගනීය දුකයයි.

---

28. **යොගනියා** - (යොගෙහි අතික්කමිතබ්බා = යොගනියා). "අරමුණු කොට යෝගයන් විසින් යොදවත්නුයි යොඝනීය නම් වෙති." - (අට්ඨකථා)

යොගසම්පයුත්ත දුකය

යොගසම්පයුත්තා ධම්මා - යොගවිප්පයුත්තා ධම්මා ති.

යෝගනීය දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව යෝග සම්පයුත්ත දුකය වදාළ සේක. එයද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමුකොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **යොගසම්පයුත්තා ධම්මා** - යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක්ද යත්, **යොගවිප්පයුත්තා ධම්මා** - යනුවෙනි.

යොගස ම්ප්පයුත්තා ධම්මා - යෝග ධර්මයන් සමඟ එකෝත්පාදා දී සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් මිශ්‍ර වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

යොග විප්පයුත්තා ධම්මා - යෝග ධර්මයන් සමඟ මිශ්‍ර නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

යොග සම්පයුත්තා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, අකුසල් සිත් දොළස ද, දෝස මූල මෝහ මූල සිත් සතරෙහි මෝහය වර්ජිත චෛතසික සත් විස්සද, ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු).

යොග විප්පයුත්තා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, දොළොස් අකුසල් සිත් වර්ජිත ඉතිරි සත් සැත්තෑ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද, දෝස මූල මෝහ මූල සිත් සතරෙහි මෝහය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද, ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙර සේ ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, නිප්‍රදේශ දුකයකි).

යෝග සම්පයුත්ත දුකයයි

පටුන වෙත

යොග යොගනිය දුකය

යොග සම්පයුත්තා ධම්මා - යොග විප්පයුත්තා ධම්මාති.

යෝග සම්ප්‍රයුක්ත දුකය දේශනා කොට වදරා ඉන් අනතුරුව යෝග යෝගනීය දුකය වදළ සේක. එය ද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය, ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක ද යත්, **යොගා චෙව ධම්මා යොගනීයා ච** යනුවෙනි, ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **යොගනීයා චෙව ධම්මා නො ච යොගා** යනුවෙනි.

යොගා චේව ධම්මා යොගනියා ච - යෝග නම් වූ ද , යෝග ධර්මයන්හට අරමුණු වන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

යොගනියා චේව ධම්මා නො ච යොගා - යෝග ධර්මයන් හට අරමුණු වන්නා වූ ද එහෙත් යෝග නම් නොවන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

යොගා චේව ධම්මා යොගනීයා ච - යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝභ දිට්ඨි මෝහ නම් වූ යෝග ධර්මයෝ තිදෙන ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි, ආයතන වශයෙන් එකකි, ධාතු වශයෙන් එකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු)

යොගනීයා චේව ධම්මා නො ච යොගා - යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෞකික සිත් එක් අසූව ද, තත් සම්ප්‍රයුක්ත යෝග ධර්ම වර්ජිත එකුන් පණස් චෛතසිකය ද, අටවිසි රූපයද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි. ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙර සේ ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, ලෝකෝත්තර ධර්ම සියල්ල ඇතුලත් නොවන බැවින් සප්‍රදේශ දුකයකි).

යෝග යෝගනීය දුකයයි.

පටුන වෙත

යොග යොගසම්පයුත්ත දුකය

යොගා චෙව ධම්මා යොග සම්පයුත්තා ච - යොගසම්පයුත්තා චෙව ධම්මා නො ච යොගාති.

යෝග යෝගනීය දුකය දේශනා කොට වදරා ඉන් අනතුරුව යෝග යෝග සම්පයුත්ත දුකය වදළ සේක. එයද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමුකොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **යොගා චෙව ධම්මා යොග සම්පයුත්තා ච** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **යොග සම්පයුත්තා චෙව ධම්මා නො ච යොගා** යනුවෙනි.

යොගා චෙව ධම්මා යොග සම්පයුත්තා ච - යෝග නම් වූ ද යෝග ධර්මයන් සමඟ ඒකෝත්පාදාදී භාවයෙන් මිශ්‍ර වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

යොග සම්පයුත්තා චෙව ධම්මා නො ච යොගා - යෝග ධර්මයන් සමඟ සම්ප්‍රයුත්ත වූ ද , එහෙත් යෝග නම් නොවන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

යොගා චෙව ධම්මා යොග සම්පයුත්තා ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි, ලෝභ මූල අකුසල සිත් අටෙහි වූ යෝග ධර්ම තිදෙන ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි, ආයතන වශයෙන් එකකි, ධාතු වශයෙන් එකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු)

යෝග සම්පයුත්තා චේව ධම්මා නෝ ච යෝගා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි, අකුසල් සිත් දොළස ද, තත් සම්ප්‍රයුක්ත යෝග ධර්ම වර්ජිත සූවිසි චෛතසිකයෝ ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි, (පෙර සේ ස්වරූප උදුරනු - දොළොස් අකුසල් සිත් වර්ජිත ඉතිරි සත් සැත්තෑ චිත්තයද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසික ද, දෝස මූල මෝහ මූල සිත් සතරෙහි මෝහය ද, අටවිසි රූපයද, නිර්වාණය ද, ඇතුලත් නොවන බැවින් සප්‍රදේශ දුකයකි. ආදි ලබ්ධ නාම දුකයකි).

යෝග යෝග සම්පයුත්ත දුකයයි.

පටුන වෙත

යොගවිප්පයුත්ත යොගනිය දුකය

යොග විප්පයුත්තා ඛො පන ධම්මා යොගනීයාපි - යොගවිප්පයුත්තා ඛො පන ධම්මා අයොගනීයාපීති.

යෝග යෝග සම්පයුත්ත දුකය දේශනා කොට වදරා ඉන් අනතුරුව යෝග විප්පයුත්ත යෝගනීය දුකය වදළ සේක. එය ද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **යොගවිප්පයුත්තා ඛො පන ධම්මා යොගනීයාපි** - යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **යොගවිප්පයුත්තා ඛො පන ධම්මා අයොගනීයාපි** යනුවෙනි.

යොග විප්පයුත්තා ඛො පන ධම්මා යොගනීයාපි - යෝග ධර්මයන් සමඟ මිශ්‍ර නොවූ ද , නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

යොග විප්පයුත්තා ඛො පන ධම්මා අයොගනීයාපි - යෝග ධර්මයන් සමඟ මිශ්‍ර නොවූ ද , යෝග ධර්මයන් හට අරමුණු නොවන්නාවූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

යොග විප්පයුත්තා ඛො පන ධම්මා යොගනීයාපි - යන ප්‍රථම පදයා ගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, දොළොස් අකුසල් සිත් වර්ජිත ලෞකික සිත් එකුන් සැත්තෑව ද, තත් සම්ප්‍රයුත්ත චෛතසික අට තිස ද, දෝස මූල මෝහ මූල සිත් සතරෙහි මෝහය ද, අටවිසි රූපයද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙර සේ ස්වරූප උදුරනු).

යොග විප්පයුත්තා ඛො පන ධම්මා අයොගනීයාපි - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝකෝත්තර සිත් අට දෙන ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු - අකුසල් සිත් දොළස ද, දෝස මූල මෝහ මූල සිත් සතරෙහි මෝහය වර්ජිත තත් සම්ප්‍රයුක්ත සත්විසි

පටුන වෙත

චෛතසිකය ද ඇතුළත් නොවන බැවින් සප්‍රදේශ දුකයකි, ආදිලබ්ධ නාම දුකයකි).

යෝග විප්පයුත්ත යෝගනීය දුකය යි.

යොග ගොච්ඡකය සමාප්ත ය.

08. නීවරණ ගොච්ඡකය

නීවරණ - (චිත්තං නීවරන්ති පරියොනද්ධන්තීති = නීවරණා) කුසල් සිත් හාත්පසින් වෙලාගෙන ධ්‍යාන මාර්ග ඵලයන්ට පැමිණිය නොහෙන සේ බාධා කෙරෙන බැවින් නීවරණ නම් වෙති.

ඡ නීවරණා - කාමච්ඡන්දනීවරණං, බ්‍යාපාදනීවරණං, ථීනමිද්ධනීවරණං, උද්ධච්චකුක්කුච්චනීවරණං, විචිකිච්ඡානීවරණං, අවිජ්ජානීවරණං -අට්ඨකතා කාණ්ඩ පාලි

(අ) ලෝභ, ද්වේෂ, ථීන, මිද්ධ, උද්ධච්ච, කුක්කුච්ච, විචිකිච්ඡා, මෝහ යන චෛතසික අට 'නීවරණ' සඳහා අදළ වන පරමාර්ථ ධර්ම වේ.

(ආ) නීවරණ සම්ප්‍රයුක්ත ධර්ම නම් අකුසල් සිත් 12 සහ චෛතසික 27 වේ. (නීවරණය ධර්මයන්හි සර්වාකුසල සාධාරණ වන්නා වූ උද්ධච්ච සහ මෝහය ඇතුලත් වේ. එම නිසා අකුසල චිත්ත චෛතසික සමඟ සම්ප්‍රයුක්ත නොවන්නා වූ නීවරණයක් නැත. නීවරණයක් වේ නම් නීවරණ සම්ප්‍රයක්ත ද වේ.)

(ඉ) නීවරණ විප්‍රයුක්ත ධර්ම නම් කුසල් සිත් 21, විපාක සිත් 36, ක්‍රියා සිත් 20, චෛතසික 38, රූප 28 සහ නිර්වාණයයි.

නීවරණ ගොච්ඡකය

දුකය	පාලිය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
			ස්	ආ	ධා	ස
නීවරණී	නීවරණා ධම්මා	ලෝභ, ද්වේෂ, ථීන, මිද්ධ, උද්ධච්ච, කුක්කුච්ච, විචිකිච්ඡා, මෝහ යන නීවරණ 08	1	1	1	2
	නො නීවරණා ධම්මා	සිත්-89, චෛ-44, රූප-28, නිර්වාණය	5	12	18	3
නීවරණීය	නීවරණියා ධම්මා	ලෞකික සිත්-81, චෛ-52, රූප-28	5	12	18	2

පටුන වෙත

	අනීවරණියා ධම්මා	ලෝකෝත්තර සිත්-08, චෛ-36, නිර්වාණය	4	2	2	2
නීවරණසම්ප.	නීවරණසම්පයුත්තා ධම්මා	අකුසල් සිත්-12, චෛ-27,	4	2	2	2
	නීවරණවිප්පයුත්තා ධම්මා	කුසල විපාක ක්‍රියා සිත් 77, චෛ-38, රූප 28, නිර්වාණය	5	12	18	3
නීවරණනීවරණිය	නීවරණා චෙව ධම්මා නීවරණියා ච	ලෝභ, ද්වේෂ, ථීන, මිද්ධ, උද්ධච්ච, කුක්කුච්ච, විචිකිච්ඡා, මෝහ යන නීවරණ 08	1	1	1	2
	නීවරණියා චෙව ධම්මා නො ච නීවරණා	ලෞකික සිත්-81, චෛ-44, රූප-28	5	12	18	1
	දුක මුක්ත	අනීවරණියා පදයේ ස්වරූපාර්ථ ලෝකෝත්තර සිත්-08, චෛ-36, නිර්වාණය				
නීවරණනීවරණි සම්පයුත්ත	නීවරණා චෙව ධම්මා නීවරණසම්පයුත්තා ච	ලෝභ, ද්වේෂ, ථීන, මිද්ධ, උද්ධච්ච, කුක්කුච්ච, විචිකිච්ඡා, මෝහ යන නීවරණ 08	1	1	1	2
	නීවරණසම්පයුත්තා චෙව ධම්මා නො ච නීවරණා	අකුසල් සිත්-12, චෛ-19	4	2	2	1
	දුක මුක්ත	නීවරණවිප්පයුත්තා පදයේ ස්වරූපාර්ථ කුසල විපාක ක්‍රියා සිත් 77, චෛ-38, රූප 28, නිර්වාණය				
නීවරණවිප්පයුත්ත	නීවරණවිප්පයුත්තා ඛො පන ධම්මා නීවරණියාපි	ලෞකික කුසල, විපාක, ක්‍රියා සිත් 69, චෛ-38, රූප-28	5	12	18	1

පටුන වෙත

	නීවරණවිප්පයුත්තා බො පන ධම්මා අනීවරණියාපි	ලෝකෝත්තර සිත්-08, චෙ-36, නිර්වාණය	4	2	2	2
	දුක මුක්ත	නීවරණසම්පයුත්තා පදයේ ස්වරූපාර්ථ අකුසල් සිත්-12, චෙ-27				

නීවරණ දුකය

නීවරණා ධම්මා - නො නීවරණා ධම්මාති.

යෝග ගොච්ඡකය දේශනා කොට වදරා ඉන් අනතුරුව නීවරණ ගොච්ඡකය වදළ සේක. එය ද, නීවරණ දුකය, නීවරණීය දුකය, නීවරණ සම්පයුත්ත දුකය, නීවරණ නීවරණීය දුකය, නීවරණ සම්පයුත්ත දුකය, නීවරණ විප්පයුත්ත නීවරණීය දුකයාගේ වශයෙන් සවැදැරුම් වන්නේය.

ඔවුනතුරෙන් නීවරණ දුකය පළමු කොට වදළ සේක. එය ද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදැරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **නීවරණා ධම්මා** - යනුවෙනි, ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **නෝ නීවරණා ධම්මා** - යනුවෙනි.

නීවරණාධම්මා - නිවන් මඟ හාත්පසින්ම ආවරණය කරන අර්ථයෙන් නීවරණ නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නො නීවරණා ධම්මා - නිවන් මග ආවරණය නොකරන බැවින් නීවරණ නම් නොවූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නීවරණා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝභ දෝස මෝහ ථීන මිද්ධ උද්ධච්ඡ කුක්කුච්ඡ විචිකිච්ඡා යන නීවරණ ධර්මයෝ අටදෙන ලැබෙන්නාහ.

පටුන වෙත

ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි, ආයතන වශයෙන් එකකි, ධාතු වශයෙන් එකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

(පෙර සේ ස්වරූප උදුරනු).

නො නීවරණ ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, එකුන් අනූ චිත්තය ද, නීවරණ ධර්ම වර්ජිත සසාළිස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. සසාළිස් චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේය, සඤ්ඤව සංඥස්කන්ධය නම් වන්නේය, ඉතිරි සූසාළිස් චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේය, එකුන් අනූ චිත්තය විඤ්ඤාණස්කන්ධය නම් වන්නේය, නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්තය, මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂුප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේය, සෝත්‍රප්‍රසාදය සෝතායතනය නම් වන්නේය, ඝාණප්‍රසාදය ඝානායතනය නම් වන්නේය, ජිහ්වාප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේය, කායප්‍රසාදය කායායතනය නම් වන්නේය.

වර්ණ රූපය රූපායතනය නම් වන්නේය, ශබ්ද රූපය සද්දයතනය නම් වන්නේය, ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේය. රස රූපය රසායතනය නම් වන්නේය, පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේය, එකුන් අනූ චිත්තය මනායතනය නම් වන්නේය.

සසාළිස් චෛතසිකය ද, ආපෝ ධාතු, ඉත්ථීන්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූප, ජීවිත රූප, ආහාර රූප, ආකාශ රූප, කායවිඤ්ඤත්ති රූප, වචීවිඤ්ඤත්ති රූප, ලහුතා රූප, මුදුතා රූප, කම්මඤ්ඤතා රූප, උපචය රූප, සන්තති රූප, ජරතා රූප, අනිච්චතා රූප යන සුඛුම

රූප සොළස ද, නිර්වාණය ද ධම්මායතනය නම් වන්නේය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂුප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේය, සෝත්‍රප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේය, ඝාණප්‍රසාදය ඝාන ධාතුව නම් වන්නේය, ජිහ්වාප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේය, කායප්‍රසාදය කාය ධාතුව නම් වන්නේය.

වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේය, ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේය, ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේය, රස රූපය රස ධාතුව නම් වන්නේය, පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්ඵර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේය, පඤ්චද්වාරාවර්ජන චිත්තය හා සම්පටිච්ඡන යුගලය මනෝ ධාතුව නම් වන්නේය, ඉතිරි සසැත්තෑ චිත්තය මනෝ විඤ්ඤාණ ධාතුව නම් වන්නේය.

සසාළිස් චෛතසිකය ද, ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූප, ජීවිත රූප, ආහාර රූප, ආකාශ රූප, කාය විඤ්ඤත්ති රූප, වචීවිඤ්ඤත්ති රූප, ලහුතා රූප, මුදුතා රූප, කම්මඤ්ඤතා රූප, උපචය රූප, සන්තති රූප, ජරතා රූප, අනිච්චතා රූප යන සුබුම රූප සොළස ද, නිර්වාණය ද, ධම්ම ධාතුව නම් වන්නේ ය, මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නාහ.

ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එක් අසූව ද, තත් සම්ප්‍රයුක්ත සසාළිස් චෛතසිකය් ද, අටවිසි රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේය, නිර්වාණය නිරෝධ සත්‍ය නම් වන්නේය. සතර මාර්ග සම්ප්‍රයුක්ත වූ සම්මා දිට්ඨි ආදී මාර්ගාංගයෝ අට දෙන එක්වර බැගින් ද, සංකප්ප වර්ජිත මාර්ගාංගයෝ සත් දෙන සතර වර බැගින් ද, යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේය, ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන් තිස ද, ඵල චිත්තෝත්පාද සත් තිස ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍යය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

මේ ශබ්දවලිය හෙවත් නීවරණ දුකය වනාහි, පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදළ බැවින් දුක නම් වන්නේය. මුල් පදෙන් ලත් නම්

ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේය. සියලු පරමාර්ථ ධර්ම ඇතුලත් වන බැවින් නිප්‍රදේශ දුක නම් වන්නේය.

නීවරණ දුකයයි.

නීවරණිය දුකය

නීවරණියා ධම්මා - අනීවරණියා ධම්මාති

නීවරණ දුකය දේශනා කොට වදරා ඉන් අනතුරුව නීවරණිය දුකය දේශනා කොට වදළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **නීවරණියා ධම්මා** - යනුවෙනි, ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **අනීවරණියා ධම්මා** - යනුවෙනි.

නීවරණියා ධම්මා[29] - නීවරණ ධර්මයන්ට හිත වූ නොහොත් ඔසයන් හට අරමුණු වන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අනීවරණියා ධම්මා - නීවරණයන් හට අරමුණු නොවන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නීවරණියා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෞකික සිත් එක් අසූව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු).

අනීවරණියා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත්, ස්වරූපාර්ථ වශයෙන්, ලෝකෝත්තර සිත් අට දෙන ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ

---

29. **නීවරණියා** - (නීවරණං හිතා = නීවරණියා). නිවරණ ධර්මයන්ට හිතෛශී වූ නීවරණයන්ගේ අරමුණු වන්නා වූ ධර්මයන් "නීවරණිය" නම් වේ.

ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු, - ආදිලබ්ධ නාම දුකයකි, නිප්‍රදේශ දුකයකි).

නීවරණීය දුකයයි.

නීවරණ සම්ප්‍රයුක්ත දුකය

නීවරණ සම්පයුත්තා ධම්මා - නීවරණ විප්පයුත්තා ධම්මාති.

නීවරණීය දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව නීවරණ සම්පයුත්ත දුකය වදාළ සේක. එය ද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාල සේක් ද යත්, **නීවරණ සම්පයුත්තා ධම්මා** - යනුවෙනි, ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නීවරණ විප්පයුත්තා ධම්මා** - යනුවෙනි.

නීවරණ සම්පයුත්තා ධම්මා - නීවරණ ධර්මයන් සමඟ සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් මිශ්‍ර වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නීවරණ විප්පයුත්තා ධම්මා - නීයරණ ධර්මයන් සමඟ මිශ්‍ර නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නීවරණ සම්පයුත්තා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, අකුසල් සිත් දොළස ද, තත් සම්ප්‍රයුක්ත සත්විසි චෛතසිකය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු).

නීවරණ විප්පයුත්තා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, දොළොස් අකුශල් සිත් වර්ජිත ඉතිරි සත් සැත්තෑ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙර සේ ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, නිප්‍රදේශ දුකයකි).

නීවරණ සම්පයුත්ත දුකයයි.

පටුන වෙත

නීවරණ නීවරණිය දුකය

නීවරණා චෙව ධම්මා නීවරණියා ච - නීවරණියා චෙව ධම්මා නො ච නීවරණාති.

නීවරණ සම්පයුත්ත දුකය දේශනා කොට වදරා ඉන් අනතුරුව නීවරණ නීවරණිය දුකය වදළ සේක. එය ද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **නීවරණා චෙව ධම්මා නීවරණියා ච** - යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **නීවරණියා චෙව ධම්මා නො ච නීවරණා** - යනුවෙනි.

නීවරණා චෙව ධම්මා නීවරණියා ච - නීවරණ නම් වූ ද , නීවරණ ධර්මයන්ට අරමුණු වන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නීවරණියා චෙව ධම්මා නො ච නීවරණා - නීවරණයන්ට අරමුණු වන්නා වූ ද එහෙත් නීවරණ නම් නොවන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නීවරණා චෙව ධම්මා නීවරණියා ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, නීවරණ අට දෙනා ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි, ආයතන වශයෙන් එකකි, ධාතු වශයෙන් එකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු).

නීවරණියා චෙව ධම්මා නො ච නීවරණා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෞකික සිත් එක් අසූව ද, නීවරණ ධර්ම වර්ජිත සසාළිස් චෛතසිකය ද, අටවිසි රූපය ද, ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙර සේ ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, ලෝකෝත්තර ධර්ම ඇතුලත් නොවන බැවින් සප්‍රදේශ දුකයකි).

නීවරණ නීවරණිය දුකයයි.

පටුන වෙත

නීවරණ නීවරණ සම්ප්‍රයුක්ත දුකය

නීවරණා චෙව ධම්මා නීවරණ සම්පයුත්තා ච - නීවරණ සම්පයුත්තා චෙව ධම්මා නො ච නීවරණාති

නීවරණ නීවරණිය දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව නීවරණ නීවරණ සම්පයුත්ත දුකය වදළ සේක. එය ද, ප්‍රථම පදය ද්විතීය පදයා ගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **නීවරණා චෙව ධම්මා නීවරණ සම්පයුත්තා ච** - යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **නීවරණ සම්පයුත්තා චෙව ධම්මා නො ච නීවරණා** - යනුවෙනි.

නීවරණ චෙව ධම්මා නීවරණ සම්පයුත්තා ච - නීවරණ නම් වූ ද නීවරණ ධර්මයන් සමඟ මිශ්‍ර වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නීවරණා සම්පයුත්තා චෙව ධම්මා නො ච නීවරණා - නීවරණා ධර්මයන් සමඟ මිශ්‍ර වූ ද , එහෙත් නීවරණ නම් නොවූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නීවරණා චෙව ධම්මා නීවරණ සම්පයුත්තා ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් නීවරණ ධර්ම අට දෙන ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් ඒකකි, ආයතන වශයෙන් එකකි, ධාතු වශයෙන් එකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු).

නීවරණ සම්පයුත්තා චේව ධම්මා නො ච නීවරණා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දොළොස් අකුසල් චිත්තයෝ ද, නීවරණ ධර්ම වර්ජිත එකුන් විසි චෛතසිකයෝ ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙර සේ ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, අකුශල ධර්ම වර්ජිත ඉතිරි සත් සැත්තෑ චිත්තය ද, අටතිස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ඇතුලත් නොවන බැවින් සප්‍රදේශ දුකයකි).

පටුන වෙත

නීවරණ විප්පයුත්ත නීවරණිය දුකය

නීවරණවිප්පයුත්තා ඛො පන ධම්මා නීවරණියාපි - නීවරණ විප්පයුත්තා ඛො පන ධම්මා අනීවරණියාපීති.

නීවරණ විප්පයුත්තා ඛො පන ධම්මා නිවරණියා පි - නීවරණයන් සමඟ මිශ්‍ර නොවූ ද , එහෙත් නීවරණයන් හට අරමුණු වන්නා වූ ද,නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නීවරණ විප්පයුත්තා ඛො පන ධම්මා අනීවරණියා පි - නීවරණයන් සමඟ මිශ්‍ර නො වූ, නීවරණයන් හට අරමුණ ද, නොවන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නීවරණ විප්පයුත්තා ඛෝ පන ධම්මා නීවරණියාපි - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දොළොස් අකුශල සිත් වර්ජිත ඉතිරි ලෞකික සිත් එකුන් සැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙර සේ ස්වරූප උදුරනු).

නීවරණ විප්පයුත්තා ඛෝ පන ධම්මා අනීවරණියාපි - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝකෝත්තර සිත් අට දෙනා ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද, නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, අකුශල් සිත් දොළස ද, චෛතසික සත් විස්ස ද ඇතුලත් නොවන බැවින් සප්‍රදේශ දුකයකි).

නීවරණ විප්පයුත්ත නීවරණිය දුකය යි.

නීවරණ ගොච්ඡකය සමාප්ත ය.

නීවරණ ගොච්ඡකය - මිශ්‍රක දුකයන්

නීවරණ සම්පයුත්තා ධම්මා නීවරණාපි, නොනීවරණාපි අටුවාගත ටිකාගත දුක පංචකයාගේ අර්ථ වර්ණනාව යට ගොචඡකයන්ට කියන ලද ක්‍රමයට අනුව දත යුත්තේය.

නීවරණ ගොච්ඡකයෙහි ආසව ගොච්ඡක ආදිය මෙන් දුක දහතරක් නොලැබේ. එහි ඇත්තේ දුක එකොළොසක් පමණි. ආසව ගොච්ඡක ආදියෙහි ලැබෙන සත්වන, නවවන, දහහතරවන දුකයන් මෙයින් ඉවත් වේ.

- සත්වැන්නෙහි "නීවරණාචෙව ධම්මා නීවරණවිප්පයුත්තා ච" (නීවරණ ද නීවරණ විප්‍රයුක්ත වන ධර්ම) නොමැති බැවින් මෙම දුකය නොලැබේ.
- නවවැන්නෙහි "නීවරණාචෙව ධම්මා නීවරණසම්පයුත්තාපි" යනුවෙන් පළමු පදය සඳහා ධර්ම (නීවරණ ද නීවරණ සම්ප්‍රයුක්ත ද වන ධර්ම) පැවතුණ ද "නීවරණ විප්පයුත්තාපි" (නීවරණ ද නීවරණ විප්‍රයුක්ත ධර්ම) සඳහා ධර්ම නොමැති බැවින් මෙම දුකය නොලැබේ.
- දහහතරවැන්නෙහි "නීවරණවිප්පයුත්තාචෙව ධම්මා නීවරණාපි" (නීවරණ විප්‍රයුක්ත ද නීවරණ ද වන ධර්ම) නොමැති බැවින් මෙම දුකය ද නොලැබේ.

නීවරණ ගොච්ඡකය යි

පටුන වෙත

09. පරාමාස ගොච්ඡකය

පරාමාස ගොච්ඡකය

දුකය	පාලිය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
			ස්	ආ	ධා	ස
පරාමාස	පරාමාසා ධම්මා	පරාමාස වන දිට්ඨි චෛතසිකය	1	1	1	1
	නො පරාමාසා ධම්මා	සිත්-89, චෛ-51 රූප-28, නිර්වාණය	5	12	18	4
පරාමට්ඨ	පරාමට්ඨා ධම්මා	ලෞකික සිත්-81, චෛ-52, රූප-28	5	12	18	2
	අපරාමට්ඨා ධම්මා	ලෝකෝත්තර සිත්-08, චෛ-36, නිර්වාණය	4	2	2	2
පරාමාසසම්ප	පරාමාසසම්පයුත්තා ධම්මා	දිට්ඨි සම් සිත්-4, දිට්ඨිය වර්ජිත චෛ-20	4	2	2	2
	පරාමාසවිප්පයුත්තා ධම්මා	දිට්ඨි විප් 04 වර්ජිත සිත් 85, චෛ-51, රූප-28, නිර්වාණය	5	12	18	4
	දුක මුක්ත	දිට්ඨි				
පරාමාසපරාමට්ඨ	පරාමාසා චෙව ධම්මා පරාමට්ඨා ච	පරාමාස වන දිට්ඨි චෛතසිකය	1	1	1	1
	පරාමට්ඨා චෙව ධම්මා නො ච පරාමාසා	ලෞකික සිත්-81, චෛ-51, රූප-28	5	12	18	2
	දුක මුක්ත	අපරාමට්ඨ පදයේ ස්වරූපාර්ථ ලෝකෝත්තර සිත්-08, චෛ.36, නිර්වාණය				

පටුන වෙත

පරාමාසසම්ප්පයුත්තා පරාමට්ඨා	පරාමාසා විප්පයුත්තා ඛො පන ධම්මා පරාමට්ඨාපි	දිට්ඨි විප් සිත්-4,දෝස මූල-2,මෝහ මූල-2, ලෞකික කුසල විපාක ක්‍රියා, චෛ-51, රූප 28	5	12	18	2
	පරාමාසා විප්පයුත්තා ඛො පන ධම්මා අපරාමට්ඨාපි	ලෝකෝත්තර සිත්-08, චෛ-36, නිර්වාණය	4	2	2	2
	දුක මුක්ත	නීවරණසම්පයුත්තා පදයේ ස්වරූපාර්ථ දිට්ඨි සම්ප්‍රයුක්ත සිත්-4, චෛ -21				

පරාමාස - (පරාමාස ගොචිජකෙ ධම්මානං යථාභූතං අනිච්චාදි ආකාර අතිත්කමිත්වා නිච්චන්ති ආදි පවත්තමානා, පරතො ආමසන්තීති = පරාමාසා) පර+ආමාස යැයි පද බෙදාගන්න. ධර්මයන්ගේ තත්වාකාරයෙන් ඇත්තා වූ අනිත්‍යාදී ආකාරය ඉක්මවා නිත්‍යාදී වශයෙන් සිතා විපරීතව අල්වා ගන්නා බැවින් "පරාමාස" නම් වේ.

කතමෙ ධම්මා පරාමාසා? දිට්ඨිපරාමාසො - නික්ඛෙප කාණ්ඩ පාලි.

(අ) පරමාර්ථ ධර්මයක් වශයෙන් දිට්ඨි චෛතසිකය 'පරාමාස' නම් වේ.

(ආ) දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතර, දිට්ඨි මාන දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡා හැර චෛතසික විස්ස යන මෙම ධර්මයෝ 'පරාමාසසම්පයුත්ත (පරාමාස සම්ප්‍රයුක්ත)' ධර්ම නම් වේ.

දිට්ඨිය සමඟ වෙනත් පරාමාස ධර්මයක් නොයෙදෙන බැවින් අත්හරිනු ලැබේ. එම දිට්ඨිය ආශ්‍රවාදියෙහි මෙන් පරමාර්ථ ධර්මයන් බොහෝ ගණනක් නැත. සැමවිට ම තනිව පවතී. එම නිසා දෙවෙනි දුකයේ දී පරාමාස සම්ප්‍රයුක්ත, පරාමාස විප්‍රයුක්ත යන පද දෙකෙහිම ඇතුලත් නොවී පරාමාස සම්ප්‍රයුක්ත දුකයේ දුක මුක්ත ධර්මයක් වේ. (පරාමාසො න වත්තබ්බො - පරාමාසසම්පයුත්තොතිපි,

පරාමාසවිප්පයුත්තොතිපි - අට්ඨකතාකාණ්ඩ පාලි) මාන ආදී සෙසු ධර්මයන් ඒ දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත්හි නොයෙදෙන බැවින් අත්හරිනු ලැබේ.

(ඉ) දිට්ඨිගත විප්‍රයුක්ත සිත් 4, ද්වේෂ මුල සිත් 2, මෝහ මූල සිත් 2, කුසල් සිත් 21, විපාක සිත් 36, ක්‍රියා සිත් 20, දිට්ඨිය හැර චෛතසික 51 යන මෙම ධර්මයෝ 'පරාමාසවිප්පයුත්තා (පරාමාස විප්‍රයුක්ත)' නම් වේ. (දිට්ඨිය වනාහි දිට්ඨිය සම්ප්‍රයුක්ත වන දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් ඇතුලත් නොවන බැවින් අත්හරිනු ලැබේ.)

පරාමාස දුකය

පරාමාසා ධම්මා - නෝ පරාමාසා ධම්මාති.

නීවරණ ගොච්ඡකය දේශනා කොට වදරා ඉන් අනතුරුව පරාමාස ගොච්ඡකය වදළ සේක. එය ද, පරාමාස දුකය, පරාමට්ඨ දුකය, පරාමාස සම්පයුත්ත දුකය, පරාමාස පරාමට්ඨ දුකය, පරාමාස විප්පයුත්ත පරාමට්ඨ දුකයාගේ වශයෙන් පස් වැදෑරුම් වන්නේය.

ඔවුනතුරෙන් පරාමාස දුකය පළමු කොට වදළ සේක. එය ද, ප්‍රථම පදය ද්විතීය පදයා ගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත් **පරාමාසා ධම්මා** - යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත් **නො පරාමාසා ධම්මා** - යනුවෙනි.

පරාමාසා ධම්මා - මිථ්‍යා වශයෙන් විපරීතග්‍රහණයෙන් අල්වා ගන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නො පරාමාසා ධම්මා - මිථ්‍යා වශයෙන් විපරීතග්‍රහණයෙන් නොගන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

පරාමාසා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, එකම දිට්ඨි චෛතසිකය ලැබෙන්නේය. ඒ දිට්ඨි චෛතසිකය ස්කන්ධ වශයෙන් එකකි, ආයතන වශයෙන් එකකි, ධාතු වශයෙන් එකකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙර සේ ස්වරූප උදුරනු).

පටුන වෙත

නො පරාමාසා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, එකුන් අනූ චිත්තය ද, දිට්ඨිය වර්ජිත එක් පණස් චෛතසික ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය රූපස්කන්ධය නම් වන්නේය. එක් පණස් චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේය, සඤ්ඤාව සංඥස්කන්ධය නම් වන්නේය. ඉතිරි එකුන් පනස් චෛතසික සංස්කාරස්කන්ධය නම් වන්නේය. එකුන් අනූ චිත්තය විඤ්ඤානස්කන්ධය නම් වන්නේය, නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුත්තය, මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂුප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේය, සෝත්‍රප්‍රසාදය සෝතායතනය නම් වන්නේය. ඝාණ ප්‍රසාදය ඝානායතනය නම් වන්නේය. ජිහ්වාප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේය. කායප්‍රසාදය කායායතනය නම් වන්නේය.

වර්ණ රූපය රූපායතනය නම් වන්නේය, ශබ්ද රූපය සද්දයතනය නම් වන්නේය, ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේය, රස රූපය රසායතනය නම් වන්නේය, පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්ඵර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේය, එකුන් අනූ චිත්තය මනායතනය නම් වන්නේය.

එක් පණස් චෛතසික ද, ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූප, ජීවිත රූප, ආහාර රූප, ආකාශ රූප, කායවිඤ්ඤත්ති රූප, වචීවිඤ්ඤත්ති රූප, ලහුතා රූප, මුදුතා රූප, කම්මඤ්ඤතා රූප, උපචය රූප, සන්තති රූප, ජරතා රූප, අනිච්චතා රූප, යන සුඛුම රූප සොළස ද නිර්වාණය ද, ධම්මායතනය නම් වන්නේය, මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නේය.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂුප්‍රසාද රූපය චක්ඛු ධාතුව නම් වන්නේය, සෝතප්‍රසාද රූපය සෝත ධාතුව නම් වන්නේය,

ඝ්‍රාණප්‍රසාද රූපය ඝ්‍රාන ධාතුව නම් වන්නේය, ජිහ්වාප්‍රසාද රූපය ජිව්හා ධාතුව නම් වන්නේය, කායප්‍රසාද රූපය කාය ධාතුව නම් වන්නේය.

වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේය, ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේය, ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේය, රස රූපය රස ධාතුව නම් වන්නේය, පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්ඵර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේය.

චක්ඛුවිඤ්ඤණ යුගලය චක්ඛුවිඤ්ඤණ ධාතුව නම් වන්නේය, සෝතවිඤ්ඤණ යුගලය සෝත විඤ්ඤන ධාතුව නම් වන්නේය, ඝ්‍රාණ විඤ්ඤණ යුගලය ඝ්‍රාණ විඤ්ඤණ ධාතුව නම් වන්නේය, ජිව්හා විඤ්ඤණ යුගලය ඝ්‍රාණ විඤ්ඤණ ධාතුව නම් වන්නේ ය, ජිව්හාවිඤ්ඤණ යුගලය ජිව්හාවිඤ්ඤණ ධාතුව නම් වන්නේය, කායවිඤ්ඤණ යුගලය කායවිඤ්ඤණ ධාතුව නම් වන්නේය, පඤ්චද්වාරාවර්ජන චිත්තය හා සම්පටිච්ඡන යුගලය මනෝ ධාතුව නම් වන්නේය, ඉතිරි සසැත්තෑ චිත්තය මනෝවිඤ්ඤණ ධාතුව නම් වන්නේය.

එක් පණස් චෛතසිකය ද, ආපෝ ධාතු, ඉත්ථීන්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූප, ජීවිත රූප, ආහාර රූප, ආකාශ රූප, කායවිඤ්ඤත්ති රූප, වචීවිඤ්ඤත්ති රූප, ලහුතා රූප, මුදුතා රූප, කම්මඤ්ඤතා රූප, උපචය රූප, සන්තති රූප, ජරතා රූප, අනිච්චතා රූපයන් සුඛුම රූප සොළස ද, නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේය, මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නේය.

ආර්ය සත්‍ය වශයෙන් සිවු වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එක් අසූව ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ දිට්ඨි වර්ජිත සම පණස් චෛතසික ද, අටවිසි රූපයද දුක්ඛ සත්‍යය නම් වන්නේය, ලෝභය සමුදය සත්‍යය නම් වන්නේය.

නිර්වාණය නිරෝධ සත්‍යය නම් වන්නේය, සතර මාර්ග සම්ප්‍රයුක්ත සම්මා දිට්ඨි ආදී මාර්ගාංග අට දෙන එක් වර බැගින් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේය, ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන් තිස ද, ඵල චිත්තෝත්පාද සත්තිස ද සත්‍යය

විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍යය වශයෙන් සිවු වැදෑරුම් වන්නාහ.

මේ ශබ්දවලිය හෙවත් පරාමාස දුකය, පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදාළ බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේය, සියලු පරමාර්ථ ධර්ම මෙහි ඇතුලත් වන බැවින් නිප්‍රදේශ දුක නම් වන්නේය.

පරාමාස දුකයයි.

පරාමට්ඨ දුකය

පරාමට්ඨා ධම්මා - අපරාමට්ඨා ධම්මාති.

පරාමාස දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව පරාමට්ඨ දුකය වදාළ සේක. එය ද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **පරාමට්ඨා ධම්මා** - යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අපරාමට්ඨා ධම්මා** - යනුවෙනි.

පරාමට්ඨා ධම්මා - පරාමාසයන්ට අරමුණු වන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ, **අපරාමට්ඨා ධම්මා** - පරාමාසයන්ට අරමුණු නොවන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[30]

පරාමට්ඨා ධම්මා - යන ප්‍රථම පදයා ගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෞකික සිත් එක් අසූව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ

---

30. **පරාමට්ඨ** - පර+ආමට්ඨ ලෙස පද බෙදා ගත යුතු වේ. (ආමසීයන්තෙත = ආමට්ඨා; පරතො ආමට්ඨා = පරාමට්ඨා). අරමුණු කිරීම මඟින් ධර්මයන්ගේ තත්වාකාරයෙන් ඇත්තා වූ අනිත්‍යාදී ආකාරය ඉක්මවා නිත්‍යාදී වශයෙන් සිතා විපරීතව අල්වා ගනු ලබන ධර්මයන් "පරාමට්ඨ" නම් වේ.

ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු).

අපරාමට්ඨා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝකෝත්තර සිත් අට දෙනා ද, තත් සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකය ද, නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, නිප්‍රදේශ දුකයකි).

පරාමට්ඨ දුකයයි.

<u>පරාමාස සම්පයුත්ත දුකය</u>

පරාමාස සම්පයුත්තා ධම්මා - පරාමාස විප්පයුත්තා ධම්මාති.

පරාමට්ඨ දුකයට අනතුරුව පරාමාස සම්පයුත්ත දුකය වදළ සේක. එය ද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **පරාමාස සම්පයුත්තා ධම්මා** - යනුවෙනි, ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **පරාමාස විප්පයුත්තා ධම්මා** - යනුවෙනි.

පරාමාස සම්පයුත්තා ධම්මා - දිට්ඨි පරාමාසය සමග ඒකෝත්පාදදී සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් මිශ්‍ර වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ. **පරාමාස විප්පයුත්තා ධම්මා** - පරාමාසය සමඟ මිශ්‍ර නොවූ නිස්සත්ව නිර්ජීව පරාමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

පරාමාස සම්පයුත්තා ධම්මා - යන පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතර ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි වර්ජිත සමවිසි චෛතසිකය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු).

පරාමාස විප්පයුත්තා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ඉතිරි පස්අසූ චිත්තය ද, දිට්ඨිය වර්ජිත එක් පණස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙර සේ ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, නිප්‍රදේශ දුකයකි).

පරාමාස සම්පයුත්ත දුකයයි.

පරාමාස පරාමට්ඨ දුකය

පරාමාසා චෙව ධම්මා පරාමට්ඨා ච - පරාමට්ඨා චෙව ධම්මා නො ච පරාමාසාති.

පරාමාස සම්ප්‍රයුක්ත දුකය දේශනා කොට වදරා ඉන් අනතුරුව පරාමාස පරාමට්ඨ දුකය වදළ සේක. එයද, ප්‍රථම පදය ද්විතීය පදයා ගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **පරාමාසා චෙව ධම්මා පරාමට්ඨා ච** - යනුවෙනි, ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **පරාමට්ඨා චෙව ධම්මා නො ච පරාමාසා** - යනුවෙනි.

පරාමාසා චෙව ධම්මා පරාමට්ඨා ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකම දිට්ඨි පරාමාස ධර්මය ලැබෙන්නේය. ඒ ධර්ම ස්කන්ධ වශයෙන් එකකි, ආයතන වශයෙන් එකකි, ධාතු වශයෙන් එකකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙර සේ ස්වරූප උදුරනු).

පරාමට්ඨා චෙව ධම්මා නො ච පරාමාසා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෞකික සිත් එක් අසූවද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි වර්ජිත එක් පණස් චෛතසිකයද, අටවිසි රූපයද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි ලෝකෝත්තර ධර්ම කිසිවක් ඇතුළත් නොවන බැවින් සප්‍රදේශ දුකයකි).

පරාමාස පරාමට්ඨ දුකයයි.

පටුන වෙත

පරාමාස විප්පයුත්ත පරාමට්ඨ දුකය

පරාමාස විප්පයුත්තා ඛෝ පන ධම්මා පරාමට්ඨාපි - පරාමාස විප්පයුත්තා ඛෝ පන ධම්මා අපරාමට්ඨාපීති.

පරාමාස පරාමට්ඨ දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව පරාමාස විප්පයුත්ත පරාමට්ඨ දුකය වදාළ සේක. එය ද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක්ද යත්, **පරාමාස විප්පයුත්තා ඛො පන ධම්මා පරාමට්ඨාපි** යනුවෙනි, ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **පරාමාස විප්පයුත්තා ඛො පන ධම්මා අපරාමට්ඨාපි** - යනුවෙනි.

පරාමාස විප්පයුත්තා ඛො පන ධම්මා පරාමට්ඨාපි - පරාමාස ධර්මයන් සමග මිශ්‍ර නොවූ එහෙත් පරාමාසයන්ට අරමුණු වන්නාවූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ. **පරාමාස විප්පයුත්තා ඛො පන ධම්මා අපරාමට්ඨාපි** - පරාමාස ධර්මයන් සමග මිශ්‍ර නොවූ ද, පරාමාස ධර්මයන්ට අරමුණු ද නොවන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

පරාමාස විප්පයුත්තා ඛො පන ධම්මා පරාමට්ඨාපි - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතර වර්ජිත ඉතිරි ලෞකික සිත් සත් සැත්තෑවද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි වර්ජිත එක් පණස් චෛතසිකයද, අටවිසි රූපයද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු).

පරාමාස විප්පයුත්තා ඛො පන ධම්මා අපරාමට්ඨාපි - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝකෝත්තර සිත් අට දෙන ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණය ද, ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරද, තත් සම්ප්‍රයුක්ත චෛතසික එක් විස්සද මේ දුකයට ඇතුළත් නොවන බැවින් සප්‍රදේශ දුකයකි).

පටුන වෙත

පරාමාස විප්පයුත්ත පරාමට්ඨ දුකයයි.

පෙර ගොච්ඡකයන් මෙන් පරාමාසපරාමාසසම්පයුත්ත දුකය කවර හේතුවක් නිසා දේශනා නොකළේ ද? 'පරාමාසාචෙව ධම්මා නොච පරාමාසා' යන දෙවන පදය සඳහා ස්වරූපාර්ථ පැමිණේ. 'පරාමාසාචෙව ධම්මා පරාමාසසම්පයුත්තා ච' යන ප්‍රථම පදය සඳහා පරාමාස ධර්මය වන දිට්ඨිය පමණක් පැමිණ සෙසු පරාමාස නොමැති හෙයින් ඒ සඳහා ලැබෙන ධර්ම නොමැත. ඒ හේතුවෙන් එක් පදයක් පමණක් ඇති දුක නැති බැවින් 'පරාමාස පරාමාසසම්ප්‍රයක්ත' දුකයක් දේශනා නොකළ සේක.

පරාමාස ගොච්ඡකය - මිශ්‍රක දුකයන්

දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතර හා තත් සම්ප්‍රයුක්ත එක් විසි චෛතසිකය මේ දුකයෙහි ඇතුළත් නොවූහ. මෙහි ඛොපන ශබ්දයාගේ අතිරේක අර්ථ ග්‍රහණය වන බැවින් අටුවා නයින්,

1. නො පරාමසා ධමමා පරමට්ඨාපි , අපරාමට්ඨාපි.
2. නො පරාමසා ධමමා පරාමාස සම්පයුත්තාපි, පරාමාස විප්පයුත්තාපි කියා දුකයෝ දෙදෙනෙක් වෙති.

මූලටීකා නයින්

1. පරාමටඨා ධම්මා පරාමාස සම්පයුත්තාපි, පරාමාස විප්පයුත්තාපි.
2. පරාමට්ඨා ධම්මා පරාමාසාපි නොපරාමාසාපි, යැයි දුකයෝ දෙදෙනෙක් විය යුත්තාහ.

මෙහි විස්තරාර්ථ වර්ණාව යටකී නයානුසාරයෙන් දත යුත්තේය.

- **පෙර ගොච්ඡකයන් මෙන් පරාමාසපරාමාසසම්පයුත්ත දුකයක් නොවදාළේ කවර හේතුවක් නිසා ද?** පරාමාසා චෙව ධම්මා පරාමාසසම්පයුත්තා ච (පරාමාස ද පරාමාස සම්ප්‍රයුක්ත ද වන ධර්ම) යන පළමු පදයේ ස්වරූපාර්ථ ගැනීමේදී පරාමාස ධර්මයන් එකක් පමණක් ඇති බැවින් ඒ හා සම්ප්‍රයුක්ත වෙනත් පරාමාස ධර්මයන් නැති බැවින් ස්වරූපාර්ථ නොලැබේ. නමුත් පරාමාසසම්පයුත්තාචෙව ධම්මා නොච පරාමාසා (පාරාමාස සම්ප්‍රයුක්ත ද පරාමාස ද නොවන ධර්ම) යන දුතිය පදයෙහි

ස්වරූපාර්ථ ලැබේ. එසේ වුව ද එක් පදයකින් පමණක් දුකයක් නොපවතින බැවින් පරාමාසපරාමාසසම්පයුත්ත දුකයක් නො වදාළහ.

- පරාමාසාචෙව ධම්මා පරාමාසසම්පයුත්තාපි ... විප්පයුත්තාපි (පරාමාස ද වන පරාමාස සම්ප්‍රයුක්ත ද වන ධර්ම සහ පරාමාස විප්‍රයුක්ත ද වන ධර්ම) යන මෙහි පද දෙක සඳහා පරමාර්ථ ධර්ම නොමැති බැවින් මෙම දුකය නොලැබේ.
- පරාමාසසම්පයුත්තාචෙව ධම්මා පරාමාසාපි .... නො පරාමාසා (පරමාස සම්ප්‍රයුක්ත ද වන පරාමාස ද වන ධර්ම සහ පරාමාස නොවන ධර්ම) යන මෙහි ප්‍රථම පදය සඳහා පරමාර්ථ ධර්ම නොමැති බැවින් මෙම දුකය නොලැබේ.
- පරාමාසවිප්පයුත්තාචෙව ධම්මා පරාමාසාපි .... නො පරාමාසා (පරමාස සම්ප්‍රයුක්ත ද වන පරාමාස ද වන ධර්ම සහ පරාමාස නොවන ධර්ම) යන මෙහි ද ප්‍රථම පදය සඳහා පරමාර්ථ ධර්ම නොමැති බැවින් මෙම දුකය නොලැබේ.
- මෙම දුකයෙහි ඇත්තේ පද පසක් පමණි.

පරාමාස ගොච්ඡකය සමාප්තයි.

10. මහන්තර දුකය

මහන්තර දුකය

දුකය	පාලිය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
			ස්	ආ	ධා	ස
සාරම්මණ	සාරම්මණා ධම්මා	සිත්-89, චෛ-52	4	2	8	3
	අනාරම්මණා ධම්මා	රූප-28, නිර්වාණය	1	11	11	2
චිත්ත	චිත්තා ධම්මා	සිත්-89	1	1	7	1
	නො චිත්තා ධම්මා	චෛතසික-52, රූප-28, නිර්වාණය	4	11	11	4
චෛතසික	චෛතසිකා ධම්මා	චෛතසික-52	3	1	1	3
	අචෛතසිකා ධම්මා	සිත්-89, රූප-28, නිර්වාණය	2	12	18	2
චිත්තසම්පයුත්ත	චිත්තසම්පයුත්තා ධම්මා	චෛතසික-52	3	1	1	3
	චිත්තවිප්පයුත්තා ධම්මා	රූප-28, නිර්වාණය	1	11	11	2
	දුක මුක්ත	සිත් 89				
චිත්තසංසට්ඨ	චිත්තසංසට්ඨා ධම්මා	චෛතසික-52	3	1	1	3
	චිත්තවිසංසට්ඨා ධම්මා	රූප-28, නිර්වාණය	1	11	11	2
	දුක මුක්ත	සිත් 89				

පටුන වෙත

චිත්තසමුට්ඨානා	චිත්තසමුට්ඨානා ධම්මා	චෛතසික-52, චිත්තජ රූප-17	4	6	6	4
	නො චිත්තසමුට්ඨානා ධම්මා	සිත්-89, ත්‍රිජ රූප, නිර්වාණය	2	12	18	2
චිත්තසහභූ	චිත්තසහභූනො ධම්මා	චෛතසික-52, විඤ්ඤත්ති රූප-2	4	1	1	3
	නො චිත්තසහභූනො ධම්මා	සිත් 89, රූප-26, නිර්වාණය	2	12	18	2
චිත්තානුපරිවත්තිනො	චිත්තානුපරිවත්තිනො ධම්මා	චෛතසික-52, විඤ්ඤත්ති රූප-2	4	1	1	3
	නො චිත්තානුපරිවත්තිනො ධම්මා	සිත් 89, රූප-26, නිර්වාණය	2	12	18	2
චිත්තසංසට්ඨසමුට්ඨානා	චිත්තසංසට්ඨසමුට්ඨානා ධම්මා	චෛතසික-52	3	1	1	3
	නො චිත්තසංසට්ඨසමුට්ඨානා ධම්මා	සිත්-89, රූප-28, නිර්වාණය	2	12	18	2
චිත්තසංසට්ඨසමුට්ඨානසහභූනො	චිත්තසංසට්ඨසමුට්ඨානසහභූනො ධම්මා	චෛතසික-52	3	1	1	3
	නො චිත්තසංසට්ඨසමුට්ඨානසහභූනො ධම්මා	සිත්-89, රූප-28, නිර්වාණය	2	12	18	2
චිත්තසංසට්ඨ	චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො ධම්මා	චෛතසික-52	3	1	1	3

පටුන වෙත

	නො චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො ධම්මා	සිත්-89, රූප-28, නිර්වාණය	2	12	18	2
අජ්ඣත්තික	අජ්ඣත්තිකා ධම්මා	සිත්-89, ප්‍රසාද රූප-5	2	6	12	1
	බාහිරා ධම්මා.	චෛතසික-52, රූප-23, නිර්වාණය	4	6	6	4
උපාදා	උපාදා ධම්මා	උපාදා රූප-24 (සතර මහා භූත වර්ජිත)	1	10	10	1
	නොඋපාදා ධම්මා	සෙසු සියලු පරමාර්ථ ධර්ම	5	3	9	4
උපාදින්නා	උපාදින්නා ධම්මා	ලෞකික විපාක සිත් 32, චෛතසික 35, කර්මජ රූප 20	5	11	17	1
	නො උපාදින්නා ධම්මා	සිත් 57, චෛ 52, චිත්තජ රූප-17, ඍතුජ රූප 15, ආහාරජ රූප-14, නිර්වාණය	5	7	8	4

සාරම්මණ දුකය

සාරම්මණා ධම්මා - අනාරම්මණා ධම්මාති.

මාගේ ස්වාමි වූ බුදුරජාණන් වහන්සේ, පරාමාස ගොච්ඡකයට අනතුරුව මහන්තර දුකය දේශනා කොට වදාළ සේක. එය ද,

සාරම්මණ දුකාදීන්ගේ වශයෙන් තුදුස් වැදෑරුම් වන්නේ ය.[31]

ඔවුනතුරෙන් සාරම්මණ දුකය පළමු කොට වදළ සේක. එයද, ප්‍රථම පදය ද්විතීය පදයා ගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත් **සාරම්මණා ධම්මා** - යනුවෙනි, ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත් **අනාරම්මණා ධම්මා** - යනුවෙනි.

සාරම්මණා ධම්මා[32] - අරමුණු ගැනීම ස්වභාව කොට ඇත්තා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අනාරම්මණා ධම්මා[33] - අරමුණු නොගැනීමේ ස්වභාව ඇත්තා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සාරම්මණා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, එකුන් අනූ චිත්තය ද, දෙපණස් චෛතසික ද

---

31. **මහන්තර දුක** - මහන්ත+අන්තර+දුක යනුවෙන් පද බෙදාගත යුතු වේ. (අන්තරෙ ඨිතා දුකා = අන්තරදුකා; මහන්තාව තෙ අන්තරදුකාචා'ති=මහන්තරදුකා). එක් දුකයක් සමඟ තවත් දුකයක් ශබ්ද සහ අර්ථ වශයෙන් සම්බන්ධ නොවී හුදු දුක භාවයෙන් (දුක සාම්‍යයෙන්) පමණක් වෙන වෙන ම තෝරා ගොච්ඡකයන්ගේ අන්තරයෙහි තබන ලද බැවින් ද, චූළන්තර දුකයට වඩා කුඩා බැවින් ද "මහන්තරදුක" යැයි කියනු ලැබේ.

32. **සාරම්මණා** - (සහ ආරම්මණෙන යෙ වත්තන්තී'ති = සාරම්මණා). අරමුණු නොපැවතියහොත් පැවතීමට නොහැකි වීම හේතුවෙන් අරමුණු සමඟ පවතින්නා වූ ධර්මයන් 'සාරම්මණ' නම් වේ. අරමුණු කිරීමට හැකි ආරම්මණික ධර්මයන් සාරම්මණ නම් වේ යැයි අදහස් කෙරේ.

33. **අනාරම්මණා** - (නත්ථි ආරම්මණං එතෙසන්'ති = අනාරම්මණා). අරමුණු නැත්තා වූ අරමුණු කිරීමට නොහැකි ධර්මයන් "අනාරම්මණ" නම් වේ.

ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් අටකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

ස්කන්ධ වශයෙන් සතර වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, දෙපණස් චෛතසික අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේය. සඤ්ඤව සංඥස්කන්ධය නම් වන්නේය. ඉතිරි සමපණස් චෛතසික සංස්කාරස්කන්ධය නම් වන්නේය. එකුන් අනූ චිත්තය විඤ්ඤානස්කන්ධය නම් වන්නේය. මෙසේ ස්කන්ධ වශයෙන් සතර වැදෑරුම් වන්නාහ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, එකුන් අනූ චිත්තය මනායතනය නම් වන්නේය. දෙපණස් චෛතසිකය ධම්මායතනය නම් වන්නේය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, එකුන් අනූ චිත්තයන් අතුරෙන් චක්ඛුවිඤ්ඤණ යුගලය චක්ඛුවිඤ්ඤණ ධාතුව නම් වන්නේය, සෝත විඤ්ඤණ යුගලය සෝත විඤ්ඤණ ධාතුව නම් වන්නේය, ඝාණ විඤ්ඤණ යුගලය ඝාණ විඤ්ඤණ ධාතුව නම් වන්නේය, ජිව්හා විඤ්ඤණ යුගලය ජිව්හා විඤ්ඤණ ධාතුව නම් වන්නේය, කාය විඤ්ඤණ යුගලය කාය විඤ්ඤණ ධාතුව නම් වන්නේය, පඤ්චද්වාරාවර්ජන සිත හා සම්පටිච්ඡන යුගලය මනෝ ධාතුව නම් වන්නේය, ඉතිරි සසැත්තෑ චිත්තය මනෝ විඤ්ඤණ ධාතුව නම් වන්නේය. මෙසේ ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නාහ.

ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එක් අසූවද, ලෝභ වර්ජිත චෛතසික එක් පණස ද, දුක්ඛ සත්‍ය නම් වන්නේය, ලෝභය සමුදය සත්‍ය නම් වන්නේය.

සතර මාර්ග සම්ප්‍රයුක්ත වූ සම්මාදිට්ඨි ආදී මාර්ගාංගයෝ අට දෙන එක් වර බැගින් ද, සත් දෙන සතර වර බැගින් ද, මාර්ග සත්‍යය නම් වන්නේය. අවශේෂ මාර්ග චිත්තෝත්පාද එකුන් තිස ද, ඵල චිත්තෝත්පාද සත් තිසද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

අනාරම්මණා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අටවිසි රූපය ද නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි, ආයතන වශයෙන් එකොළසකි, ධාතු වශයෙන් එකොළොසකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

ස්කන්ධ වශයෙන් වනාහි එකම රූපස්කන්ධය ලැබෙන්නේය. නිර්වාණ ධාතුව ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත වන්නේය. ආයතන වශයෙන් එකොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේය, සෝතප්‍රසාදය සෝතායතනය නම් වන්නේය, ඝාණප්‍රසාදය ඝානායතනය නම් වන්නේය, ජිව්හාප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේය. කායප්‍රසාදය කායායතනය නම් වන්නේය.

වර්ණ රූපය රූපායතනය නම් වන්නේය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේය, ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේය, රස රූපය රසායතනය නම් වන්නේය, පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේය.

ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදයරූප, ජීවිතරූප, ආහාරරූප, ආකාසරූප, කායවිඤ්ඤත්ති රූප, වචීවිඤ්ඤත්ති රූප, ලහුතා රූප, මුදුතා රූප, කම්මඤ්ඤතා රූප, උපචය රූප, සන්තති රූප, ජරතා රූප, අනිච්චතා රූප යන සුඛුම රූප සොළස ද, නිර්වාණ ධාතුව ද ධම්මායතනය නම් වන්නේය, මෙසේ ආයතන වශයෙන් එකොළොස් වැදෑරුම් වන්නාහ.

ධාතු වශයෙන් එකොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂුප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේය, සෝතප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේය, ඝාණප්‍රසාදය ඝාන ධාතුව නම් වන්නේය, ජිව්හාප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේය, කායප්‍රසාදය කාය ධාතුව නම් වන්නේය.

වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේය, ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේය, ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේය, රස රූපය රස ධාතුව නම් වන්නේය, පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය

සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේය.

ආපෝ ධාතු, ඉත්ථීන්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදයරූප, ජීවිතරූප, ආහාරරූප, ආකාශරූප, කායවිඤ්ඤත්ති රූප, වචීවිඤ්ඤත්ති රූප, ලහුතා රූප, මුදුතා රූප, කම්මඤ්ඤතා රූප, උපචය රූප, සන්තති රූප, ජරතා රූප, අනිච්චතා රූප යන සුඛුම රූප සොළස ද, නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේය, මෙසේ ධාතු වශයෙන් එකොළොස් වැදැරුම් වන්නාහ.

ආර්ය සත්‍ය වශයෙන් දෙවැදැරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය දුක්ඛ සත්‍යය නම් වන්නේය, නිර්වාණ ධාතුව නිරෝධ සත්‍යය නම් වන්නේය, මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදැරුම් වන්නාහ.

මේ ශබ්දවලිය හෙවත් සාරම්මණ දුකය වනාහි පරමාර්ථ ධර්ම දෙපදයකින් වදල බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේය, පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් බැවින් නිප්‍රදේශ දුක නම් වන්නේය.

සාරම්මණ දුකයයි

<u>චිත්ත දුකය</u>

චිත්තා ධම්මා - නො චිත්තා ධම්මාති.

සාරම්මණ දුකය දේශනා කොට වදරා ඉන් අනතුරුව චිත්ත දුකය වදළ සේක. එයද, ප්‍රථම පදය ද්විතීය පදයා ගේ වශයෙන් දෙවැදැරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **චිත්තා ධම්මා** - යනුවෙනි, ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **නො චිත්තා ධම්මා** - යනුවෙනි.

චිත්තා ධම්මා - චින්තනාර්ථයෙන් චිත්ත නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නො චිත්තා ධම්මා - චින්තනාර්ථයෙන් චිත්ත නම් නො වූ

නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[34]

චිත්තා ධම්මා - යන ප්‍රථම පදයා ගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන් අනූ චිත්තය ලැබෙන්නේය. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි, ආයතන වශයෙන් එකකි, ධාතු වශයෙන් සතකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි. (ස්වරූප උදුරනු)[35]

නො චිත්තා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අටවිසි රූපයද, දෙපණස් චෛතසික ද, නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් එකොළොසකි, ධාතු වශයෙන් එකොළොසකි, ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (ස්වරූප උදුරනු)

මේ ශබ්දවලිය හෙවත් චිත්ත දුකය, පරමාර්ථ ධර්ම දෙපදයකින් වදල බැවින් දුක නම් වන්නේය, මුල පදෙන් ලත්, නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේය, සියලු පරමාර්ථ ධර්ම මෙහි ඇතුළත් බැවින් නිප්පදේස දුක නම් වන්නේය.

චිත්ත දුකයයි.

---

34. **චිත්තා** - (ආරම්මණං චින්තෙතී'ති = චිත්තං). අරමුණු දැන ගැනීමට හැකි ධර්මය "චිත්ත" නම් වේ.

දෙවන ක්‍රමය - 'චිත්ත' ශබ්දය 'විචිත්ත - විචිත්‍ර' යන්නට අර්ථ සමාන වූ අනිෂ්පන්න පාටිපදික පදය යි. විචිත්‍ර යන අර්ථය ඇති බැවින් "චිත්ත" නම් වේ යැයි අදහස් කෙරේ. ධාතු, ප්‍රත්‍යය ආදියෙන් සිද්ධ වන පද නිෂ්පන්න පද වේ. ඉහත පළමුවන විග්‍රහයෙහි 'චිත්ත' පදය සිද්ධ වනුයේ 'චින්ත, චි, චිත' ආදී ධාතූන්ට ප්‍රත්‍යයන් එක් වීමෙනි. ඒ ආකාරයට ධාතු ප්‍රත්‍යය ආදියෙන් සිද්ධ නොවී (නිෂ්පන්න නොවී), ප්‍රකෘතියෙන් සිද්ධ වන නාම පද අනිෂ්පන්න පාටිපදික වේ. මෙම දෙවන ක්‍රමයෙහි 'චිත්ත' පදයෙහි ප්‍රකෘතියෙන් ම 'විචිත්‍ර' අර්ථය ඇත.

35. **ආර්ය සත්‍ය වශයෙන් එකකි** - සිත පමණක් මෙම පදයේ පරමාර්ථ ධර්ම සඳහා ලැබේ. මාර්ගාංග නොලැබේ. එබැවින් දුක්ඛාර්ය සත්‍යය පමණක් මෙහි ලැබේ.

චෙතසික දුකය

චෙතසික ධම්මා - අචෙතසිකා ධම්මාති.

චිත්ත දුකයට අනතුරුව **චේතසික** දුකය දේශනා කොට වදාළ සේක. එයද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **චේතසිකා ධම්මා** - යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අචේතසිකා ධම්මා** - යනුවෙනි.

චෙතසිකා ධම්මා - ඒකෝත්පාදදී වශයෙන් සිතෙහි හටගන්නා බැවින් චෛතසික නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අචෙතසිකා ධම්මා - ඒකෝත්පාදදී වශයෙන් සිතෙහි හටනොගන්නා බැවින් අචේතසික නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[36]

චෙතසිකා ධම්මා - යන ප්‍රථම පදයා ගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් චෛතසික ධර්ම දෙපණස ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් තුනකි, ආයතන වශයෙන් එකකි, ධාතු වශයෙන් එකකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (ස්වරූප උදුරනු)

අචෙතසිකා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන් අනූ චිත්තය ද, අටවිසි රූපයද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් දෙකකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු)

මේ ශබ්දවලිය හෙවත් චෛතසික දුකය වනාහි, පරමාර්ථ ධර්ම දෙපදයකින් වදාළ බැවින් දුක නම් වන්නේය. මුල් පදෙන් ලත් නම්

---

36. **චෙතසිකා** - (චෙතසි නියුත්තා = චෙතසිකා). සිත සමඟ නියුක්ත වූ ධර්මයන් "චෙතසික" නම් වේ. (චෙතසා සංසට්ඨා = චෙතසිකා). සිත සමඟ මිශ්‍ර වූ ධර්මයන් "චෙතසික" නම් වේ.

ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේය, පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් බැවින් නිප්පදේස දුක නම් වන්නේය.

චෛතසික දුකයයි

චිත්තසම්පයුත්ත දුකය

චිත්ත සම්පයුත්තා ධම්මා - චිත්ත විප්පයුත්තා ධම්මාති.

චෛතසික දුකයට අනතුරුව චිත්ත සම්පයුත්ත දුකය දේශනා කොට වදළ සේක, එය ද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **චිත්ත සම්පයුත්තා ධම්මා** - යනුවෙනි, ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක, කෙසේ වදළ සේක් ද යත්, **චිත්ත විප්පයුත්තා ධම්මා** - යනුවෙනි.

චිත්ත සම්පයුත්තා ධම්මා - ඒකෝත්පාදදී වශයෙන් සිත් සමඟ මිශ්‍ර වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ. **චිත්තවිප්පයුත්තා ධම්මා** - ඒකෝත්පාදදී වශයෙන් සිත සමඟ මිශ්‍ර නොවූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

චිත්ත සම්පයුත්තා ධම්මා - යන ප්‍රථම පදයා ගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දෙපණස් චෛතසික ධර්මයෝ ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් තුනකි, ආයතන වශයෙන් එකකි, ධාතු වශයෙන් එකකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (ස්වරූප උදුරනු)

චිත්ත විප්පයුත්තා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දෙපණස් චෛතසික ද, අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් දෙකකි. ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේම ස්වරූප උදුරනු, - ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි)

නික්ෂේප කාණ්ඩයෙහි "චිත්තං න වත්තබ්බං චිත්තෙන සම්පයුත්තන්තිපි චිත්තෙන විප්පයුත්තන්තිපි - සිත සිත සමඟ සම්ප්‍රයුක්ත යැයි ද සිත සමඟ විප්‍රයුක්ත යැයි ද නොකිව යුතු ය"

යනුවෙන් පැමිණෙයි. එබැවින් මෙම දුකයෙහි සිත් 89 දුක මුක්ත ධර්ම වේ. චිත්ත සංසට්ඨ දුකය ද මේ ක්‍රමයෙන් වටහා ගත යුතු ය.

චිත්ත සම්ප්‍රයුත්ත දුකයයි.

චිත්ත සංසට්ඨ දුකය

චිත්ත සංසට්ඨා ධම්මා - චිත්ත විසංසට්ඨා ධම්මාති

චිත්ත සම්පයුත්ත දුකයට අනතුරුව චිත්ත සංසට්ඨ දුකය දේශනා කොට වදළ සේක. එය ද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **චිත්තසංසට්ඨා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **චිත්තවිසංසට්ඨා ධම්මා** යනුවෙනි.

චිත්තසංසට්ඨා ධම්මා[37] - ඒකෝත්පාදදී සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් සිත සමග මිශ්‍රවූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

චිත්තවිසංසට්ඨා ධම්මා - ඒකොත්පාදදී සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් සිත සමග මිශ්‍ර නොවූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ. (චෛතසික දුකයටත්, චිත්ත සම්ප්‍රයුක්ත දුකයටත් සමානය, පෙර සේ ස්වරූප උදුරනු).

---

37. **චිත්තසංසට්ඨා** - (චිත්තෙන සංසට්ඨා = චිත්තසංසට්ඨා). මෙම ධර්මය ඵස්සය ය, මෙම ධර්මය වේදනාව ය, මෙම ධර්මය සිත ය යැයි ඒ ඒ ධර්මයේ විශේෂ ලක්ෂණය වෙන් කොට දැන ගැනීමට අපහසු වන තරමට ම සිත සමඟ මිශ්‍ර වූ ධර්ම දෙපණස චෛතසික චිත්තසංසට්ඨ ධර්ම ය. සිත සමඟ එකට ඉපදීම, එකට නිරුද්ධ වීම, එක අරමුණක් ගැනීම හා එක ම වස්තුවක් නිශ්‍රය කර ගැනීම යන ලක්ෂණ සතරින් යුක්ත වූ චෛතසික පමණක් චිත්ත සංසට්ඨ නම් වෙති. චිත්තජ රූප වනාහි සිත සමඟ එකට උපදින නමුත් ඉහත සඳහන් සම්ප්‍රයෝග ලක්ෂණ සතර යුක්ත නොවන බැවින් චිත්තසංසට්ඨ නො වේ.

පටුන වෙත

චිත්ත සංසට්ඨ දුකයයි.

චිත්ත සමුට්ඨාන දුකය

චිත්තසමුට්ඨානා ධම්මා - නො චිත්තසමුට්ඨානා ධම්මාති.

චිත්ත සංසට්ඨ දුකයට අනතුරුව චිත්ත සමුට්ඨාන දුකය දේශනා කොට වදළ සේක. එය ද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **චිත්තසමුට්ඨානා ධම්මා** - යනුවෙනි, ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදල සේක් ද යත්, **නො චිත්තසමුට්ඨානා ධම්මා** - යනුවෙනි.

චිත්තසමුට්ඨානා ධම්මා - සිත හේතු කොට හටගන්නා වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නො චිත්තසමුට්ඨානා ධම්මා - සිත හේතු කොට හට නොගන්නා වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[38]

චිත්තසමුට්ඨානා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි, චෛතසික දෙපණස ද, චිත්තජ රූප සතළොසද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් සයකි, ධාතු වශයෙන් සයකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (ස්වරූප උදුරනු)

නො චිත්ත සමුට්ඨානා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන් අනූ චිත්තය ද, කර්මජ රූප විස්ස ද, උතුජ රූප පසළොස ද, ආහාරජ රූප තුදුස ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් දෙකකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි,

---

38. **චිත්තසමුට්ඨානා** - (සමුට්ඨහන්ති එතෙනා'ති = සමුට්ඨානං; චිත්තං සමුට්ඨානං එතෙසන්'ති = චිත්තසමුට්ඨානං). සිත හේතුවෙන් උපදින්නා වූ ධර්මයෝ "චිත්තසමුට්ඨාන" නම් වේ.

ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු, - ආදිලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි).

චිත්ත සමුට්ඨාන දුකයයි.

චිත්තසහභූ දුකය

චිත්ත සහභූනො ධම්මා - නො චිත්ත සහභූනො ධම්මාති.

චිත්ත සමුට්ඨාන දුකයට අනතුරුව චිත්ත සහභූ දුකය දේශනා කොට වදළ සේක. එය ද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **චිත්තසහභූනො ධම්මා** - යනුවෙනි, ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **නො චිත්තසහභූනො ධම්මා** - යනුවෙනි.

චිත්තසහභූනො ධම්මා- සිත හා සමඟ එකට හට ගන්නා වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නො චිත්තසහභූනො ධම්මා - සිත හා සමඟ එකට හට නොගන්නා වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[39]

චිත්තසහභූනො ධම්මා - යන ප්‍රථම පදයා ගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් චෛතසික දෙපණස ද, විඤ්ඤත්ති රූප දෙක ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් එකකි, ධාතු වශයෙන් එකකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (ස්වරූප උදුරනු)

නො චිත්ත සහභූනොධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන් අනූ චිත්තය ද, විඤ්ඤත්ති රූප වර්ජිත සවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් දෙකකි, ආයතන

---

39. **චිත්තසහභූ** - (සහ භවන්තී'ති සහභූ; චිත්තෙන සහභූනො = චිත්තසහභූ). සිත සමඟ එකට හට ගන්නා වූ ධර්මයෝ "චිත්තසහභූ" නම් වේ.

වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු, - ආදිලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි)

චිත්ත සහභූ දුකයයි.

චිත්තානුපරිවත්ති දුකය

චිත්තානුපරිවත්තිනො ධම්මා - නෝ චිත්තානුපරිවත්තිනො ධම්මාති.

චිත්ත සහභූ දුකයට අනතුරුව චිත්තානුපරිවත්ති දුකය දේශනා කොට වදළ සේක. එය ද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **චිත්තානුපරිවත්තිනො ධම්මා** - යනුවෙනි, ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **නො චිත්තානුපරිවත්තිනො ධම්මා** - යනුවෙනි.

චිත්තානුපරිවත්තිනො ධම්මා - සිත හා සමඟ හට ගෙන සිත සමගම පෙරළෙන්නා වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නො චිත්තානුපරිවත්තිනො ධම්මා - සිත හා සමඟ හට නොගෙන සිත සමඟම නොපෙරලෙන්නාවූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තා හ.[40] (චිත්ත සහභූ දුකයට සමාන ය, ඒ අනුව ස්වරූප උදුරනු, - ආදිලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි)

චිත්තානුපරිවත්ති දුක යයි.

---

40. **චිත්තානුපරිවත්ති** - (අනුපරිවත්තන්තී'ති = අනුපරිවත්තිනො; චිත්තස්ස අනුපරිවත්තිනො = චිත්තානුපරිවත්තිනො). සිත හා සමඟ හට ගෙන සිත සමඟ ම පෙරළෙන්නා වූ ධර්මයෝ "චිත්තානුපරිවත්තිනො" නම් වේ.

චිත්තසංසට්ඨසමුට්ඨාන දුකය

චිත්තසංසට්ඨසමුට්ඨානා ධම්මා - නො චිත්තසංසට්ඨසමුට්ඨානා ධම්මාති.

චිත්තානුපරිවත්ති දුකයට අනතුරුව චිත්ත සංසට්ඨ සමුට්ඨාන දුකය දේශනා කොට වදාළ සේක. එය ද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාල සේක් ද යත්, **චිත්තසංසට්ඨසමුට්ඨානා ධම්මා** - යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නොචිත්තසංසට්ඨසමුට්ඨානා ධම්මා** - යනුවෙනි.

චිත්තසංසට්ඨසමුට්ඨානා ධම්මා - ඒකෝත්පාදදී වශයෙන් සිත හා සමඟ මිශ්‍ර වූ ද, සිත නිසා හටගන්නා වූ ද, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නො චිත්තසංසට්ඨසමුට්ඨානා ධම්මා - සිත හා සමඟ මිශ්‍ර නොවූ සිත සමඟ හට නොගන්නා වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[41] (චෛතසික දුකයට සම්පූර්ණයෙන් සමානය, - ස්වරූප උදුරනු, ආදි ලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි)

චිත්ත සංසට්ඨ සමුට්ඨාන දුකයයි.

චිත්තසංසට්ඨසමුට්ඨානසහභූ දුකය

චිත්තසංසට්ඨසමුට්ඨානසහභූනො ධම්මා - නො චිත්තසංසට්ඨසමුට්ඨානසහභූනො ධම්මාති.

---

41. **චිත්තසංසට්ඨසමුට්ඨාන** - (චිත්තසංසට්ඨාව තෙ චිත්තසමුට්ඨානාචා'ති = චිත්තසංසට්ඨසමුට්ඨානා). සිත සමඟ මිශ්‍ර වූ ද සිත හේතුවෙන් උපදින්නා වූ ද ධර්ම "චිත්තසංසට්ඨසමුට්ඨාන" නම් වේ. (දෙවෙනි පදයෙහි "චිත්ත" පදය ලොප් කොට ඇත. ඉදිරියේ එන පදවල ද මේ ආකාරය වේ).

චිත්තසංසට්ඨසමුට්ඨානසහභූනො ධම්මා- සිත සමග මිශ්‍ර වූ ද, සිත නිසා හටගන්නා වූ ද, සිත සමඟ හට ගන්නා වූ ද, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නො චිත්තසංසට්ඨසමුට්ඨානසහභූනො ධම්මා - සිත සමඟ මිශ්‍ර නො වූ ද, සිත නිසා හට නොගන්නා වූ ද, සිත සමඟ හට නොගන්නා වූ ද, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[42]

(චෛතසික දුකයට සම්පූර්ණයෙන් සමානය, - ස්වරූප උදුරනු, - ආදිලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි)

චිත්ත සංසට්ඨ සමුට්ඨාන සහභූ දුකයයි.

<u>චිත්තසංසට්ඨසමුට්ඨානුපරිවත්ති දුකය</u>

චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො ධම්මා - නො චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො ධම්මාති.

චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො ධම්මා - සිත හා සමඟ මිශ්‍ර වූ ද, සිත නිසා හට ගන්නා වූ ද, සිත අනුව පෙරළෙන්නා වූ ද, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නො චිත්ත සංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො ධම්මා - සිත හා සමඟ මිශ්‍ර නොවූ ද, සිත නිසා හට නොගන්නා වූ ද, සිත අනුව නොපෙරළෙන්නා වූ ද, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[43]

---

42. **චිත්තසංසට්ඨසමුට්ඨානසහභූ** - (චිත්තසංසට්ඨාව තෙ චිත්තසමුට්ඨානාව චිත්තසහභූනො එවා'ති = චිත්තසංසට්ඨසමුට්ඨාන සහභූ). සිත සමඟ මිශ්‍ර වූ ද සිත හේතුවෙන් උපදින්නා වූ ද සිත සමඟ එකට හට ගන්නා වූ ද ධර්මයෝ "චිත්තසංසට්ඨසමුට්ඨානසහභූ" නම් වේ.

43. **චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්ති** - (චිත්තසංසට්ඨාව තෙ චිත්තසමුට්ඨානාව චිත්තානුපරිවත්තිනො එවාති = චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්ති). සිත සමඟ මිශ්‍ර වූ ද සිත

(චෛතසික දුකයට අනුවම ස්වරූප උදුරනු, - ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි)

චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්ති දුකයයි.

අජ්ඣත්තික දුකය

අජ්ඣත්තිකා ධම්මා - බාහිරා ධම්මාති.

අජ්ඣත්තිකා ධම්මා - ආත්ම භාවය අධිපති කොට ඇත්තා වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

බාහිරා ධම්මා - ආත්ම භාවය අධිපති කොට නැත්තා වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[44]

හේතුවෙන් උපදින්නා වූ ද) සිත හා සමඟ හට ගෙන සිත සමඟ ම පෙරළෙන්නා වූ ධර්මයෝ "චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්ති" නම් වේ.

44. **අජ්ඣත්තිකා** - (අජ්ඣත්තෙ භවා = අජ්ඣත්තිකා). ආධ්‍යාත්මික සන්තානයෙහි උපදින්නා වූ (ආධ්‍යාත්මික සන්තානයෙහි ඇතුලත් වන) ධර්මයන් "අජ්ඣත්තික" නම් වේ. ත්‍රික මාතිකාවල විස්තර කරනා ලද (1) ගෝචරඅජ්ඣත්ත (2) නියකඅජ්ඣත්ත (3) අජ්ඣත්තජ්ඣත්ත (4) විසයඅජ්ඣත්ත යන අජ්ඣත්ත සතර අතරින් මෙම දුක මාතිකාව අජ්ඣත්තජ්ඣත්ත වේ.

නික්ෂේප කාණ්ඩ පාලියෙහි "කතමෙ ධම්මා අජ්ඣත්තිකා? චක්ඛායතනං -පෙ- මනායතනං - ඉමෙ ධම්මා අජ්ඣත්තිකා" (ආධ්‍යාත්මික ධර්මයෝ කවරහු යත්: චක්ෂුරායතන යැ ... මනායතන යැ යන මේ ධර්මයෝ ආධ්‍යාත්මිකයෝ යි) යැයි වදාළ සේක.

බාහිරා - (බහි භූතා = බාහිරා). ආධ්‍යත්මික ආයතන සයෙන් බැහැරව ඇති ධර්මයෝ "බාහිර" නම් වේ. ඒ නිසා නික්ෂේප කාණ්ඩ පාලියෙහි "කතමෙ ධම්මා බාහිරා? රූපායතනං -පෙ- ධම්මායතනං - ඉමෙ ධම්මා බාහිරා" (බාහ්‍ය ධර්මයෝ කවරහු යත්: රූපායතන යැ ... ධර්මායතන යැ යන මේ ධර්මයෝ බාහ්‍යයෝ යි) යැයි වදාළ සේක.

අජ්ඣත්තිකා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, අධ්‍යාත්මික ආයතන සයට ඇතුලත් වූ එකුන් අනූ චිත්තය ද, ප්‍රසාද රූප පස ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් දෙකකි, ආයතන වශයෙන් සයකි. ධාතු වශයෙන් දොළසකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි, (පෙර සේ ස්වරූප උදුරනු).

බාහිරා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, චෛතසික දෙපණස ද, ප්‍රසාද රූප වර්ජිත රූප තෙවිස්ස ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් සයකි, ධාතු වශයෙන් සයකි, ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙර සේ ස්වරූප උදුරනු, - ආදිලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි).

<u>අජ්ඣත්තික දුකයයි.</u>

<u>උපාදු දුකය</u>

උපාදු ධම්මා - නෝ උපාදු ධම්මාති

උපාදු ධම්මා - නිශ්‍රය - ආධාරය - පිහිට - පිළිසරණ නිසා හට ගන්නා වූ ද, පවත්නා වූ ද, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නො උපාදු ධම්මා - නිශ්‍රය - ආධාරය - පිහිට - පිළිසරණ නිසා නොම හට ගන්නා වූ ද, නොම පවත්නා වූ ද, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[45]

මෙය පදනම් කරගෙන 'අජ්ඣත්තා ධම්මා' යන ත්‍රික පදයේ ස්වරූපාර්ථ සහ 'අජ්ඣත්තිකා ධම්මා' යන දුක පදයෙහි ස්වරූපාර්ථ වෙනස් වන ආකාරය ද, 'බහිද්ධා ධම්මා' යන ත්‍රික පදයේ ස්වරූපාර්ථ සහ 'බාහිරා ධම්මා' යන දුක පදයෙහි ස්වරූපාර්ථ වෙනස් වන ආකාරය ද දත යුතු වේ.

45. **උපාදා** - (උපාදියන්තී'ති = උපාදා) මහාභූත රූපයන් නිශ්‍රය කරගන්නා ධර්මයන් "උපාදා" නම් වේ. මහාභූත රූප තුනක් එක්

උපාදා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, අටවිසි රූපය අතුරෙන් සතර මහා භූත රූප වර්ජිත වූ උපාදා රූප සූවිස්ස ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි, ආයතන වශයෙන් දසයකි, ධාතු වශයෙන් දසයකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි. (ස්වරූප උදුරනු).

නො උපාදා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, එකුන් අනූ චිත්තය ද, දෙපනස් චෛතසිකය ද, භූතරූප සතර ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් තුනකි, ධාතු වශයෙන් නවයකි, ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙර සේ ස්වරූප උදුරනු, - ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි).

උපාදා දුකයයි.

<u>උපාදින්න දුකය</u>

උපාදින්නා ධම්මා - නො උපාදින්නා ධම්මාති.

මාගේ ස්වාමි බුදුරජාණන් වහන්සේ උපාදා දුකය දේශනා කොට වදරා ඉන් අනතුරුව උපාදින්න දුකය දේශනා කොට වදළ සේක. එය

මහාභූත රූපයක් ද, එක් මහාභූත රූපයක් මහාභූත රූප තුනක් ද, මහාභූත රූප දෙකක් මහාභූත රූප දෙකක් ද නිශ්‍රය කර ගනී. මහාභූත රූප තුනක් නිශ්‍රය වන කල්හි එක් මහාභූත රූපයක් නිශ්‍රිත වේ. මහාභූත රූප දෙකක් නිශ්‍රය වන කල්හි මහාභූත රූප දෙකක් නිශ්‍රිත වේ. මේ නිසා මහාභූත රූපයෝ හුදෙක් නිශ්‍රය වන්නා වූ ධර්මයන් පමණක් නො වේ. නිශ්‍රය වන්නා වූ ද නිශ්‍රිත වන්නා වූ ද ධර්මයන් වෙත්. එම නිසා මහාභූතයන් "උපාදා" යැයි නොකියනු ලැබේ. ("උපාදින්න" ආදියෙහි නිර්වචනය සතර වන ත්‍රිකමාතිකාවේ පැමිණේ.)

ද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **උපාදින්නා ධම්මා** - යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **නො උපාදින්නා ධම්මා** - යනුවෙනි.

උපාදින්නා ධම්මා - තෘෂ්ණා දෘෂ්ටීන් විසින් ගන්නා ලද අරමුණක් අනුව, කර්ම ක්ලේශයන් විසින් ස්වකීය ඵලය වශයෙන් ලඟා කොට ගන්නා ලද්ද වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නො උපාදින්නා ධම්මා - තෘෂ්ණා දෘෂ්ටීන් විසින් ගන්නා ලද අරමුණක් අනුව, කර්ම ක්ලේශයන් විසින් ස්වකීය ඵලය වශයෙන් ලඟා කොට නො ගන්නා ලද්ද වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

උපාදින්නා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෞකික විපාක සිත් දෙතිස් දෙනාද, තත් සම්ප්‍රයුක්ත වූ චෛතසික පන්තිස් දෙන ද, කර්මජ රූප විස්සද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් එකොළසකි, ධාතු වශයෙන් සතළොසකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි. (ස්වරූප උදුරනු).

නො උපාදින්නා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෞකික විපාක සිත් වර්ජිත ඉතිරි සිත් සත් පණසද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණසද, චිත්තජ රූප සතළොස ද, උතුජ රූප පසළොසද, ආහාරජ රූප තුදුසද, නිර්වාණ ධාතුවද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් සතකි. ධාතු වශයෙන් අටකි. ආර්ය වශයෙන් සතරකි. (පෙර සේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි).

මහන්තර දුකය සමාප්තයි

II. උපාදාන ගොච්ඡකය

ස්වරූප බෙදීම

උපාදාන - (උපාදියන්ති'ති = උපාදානා). මම ය, මාගේ ය යැයි අරමුණු දැඩිකොට ගන්නා වූ ධර්මයෝ "උපාදාන" නම් වේ.

කාමූපාදානං දිට්ඨූපාදානං සීලබ්බතූපාදානං අත්තවාදූපාදානං - නික්ඛේප කාණ්ඩ

(අ) පරමාර්ථ ධර්මයන් වශයෙන් ලෝභ-දිට්ඨි චෛතසිකයන් 'උපාදාන' නම් වේ.

(ආ) ලෝභ මූල සිත් 08, දිට්ඨිගත විප්‍රයුක්ත සිතෙහි ලෝභය, ද්වේෂය, ඊර්ෂ්‍යාව, මච්ඡරිය, කුක්කුච්චය, විචිකිච්ඡාව හැර සෙසු චෛතසික 22 'උපාදානසම්පයුත්තා' නම් වේ.

(ඉ) ද්වේෂ මූල සිත් 02, මෝහ මූල සිත් 02, කුසල සිත් 21, විපාක සිත් 36, ක්‍රියා සිත් 20, ලෝභ දිට්ඨි මාන හැර චෛතසික 49, දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ඇති ලෝභය, රූප 28, නිර්වාණය 'උපාදානවිප්පයුත්ත' ධර්මයන් නම් වේ.

උපාදාන ධර්ම සම්ප්‍රයුක්ත සහ විප්‍රයුක්ත වන ආකාරය - දිට්ඨිගත සම්පයුක්ත සිත් සතරෙහි ඇති ලෝභය සහ දිට්ඨිය යන උපාදාන ධර්ම දෙක 'උපාදානසම්පයුත්ත' නම් වේ. දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ඇති ලෝභය 'උපාදානවිප්පයුත්ත' නම් වේ.

උපාදාන ගොච්ඡකය

දුකය	පාලිය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
			ස්	ආ	ධා	ස
උපාදාන	උපාදානා ධම්මා	උපාදාන වන ලෝභ-දිට්ඨි චෛ-02	1	1	1	2
	නො උපාදානා ධම්මා	සිත්-89, චෛ-50, රූප-28, නිර්වාණය	5	12	18	3

පටුන වෙත

උපාදානියා	උපාදානියා ධම්මා	ලෞකික සිත්-81, චෛ-52, රූප-28	5	12	18	2
	අනුපාදානියා ධම්මා	ලෝකෝත්තර සිත්-08, චෛ-36, නිර්වාණය	4	2	2	2
උපාදානසම්පය	උපාදානසම්පයුත්තා ධම්මා	ලෝභ සිත්-08, චෛතසික-22* (දේස ඉස්සා මච්ඡරිය කුක්කුච්ඡ විචික්ච්ඡා සහ දි. වි. 4 ලෝභය වර්ජිත)	4	2	2	2
	උපාදානවිප්පයුත්තා ධම්මා	ලෝභ මූල සිත් වර්ජිත-81, චෛ-49 (ලෝභ, දිට්ඨි, මාන), දි. වි. 4 ලෝභය, රූප 28, නිර්වාණය	5	12	18	4
උපාදානඋපාදානියා	උපාදානා චෙව ධම්මා උපාදානියා ච	උපාදාන වන ලෝභ-දිට්ඨි චෛ-02	1	1	1	2
	උපාදානියා චෙව ධම්මා නොච උපාදානා	ලෞකික සිත්-81, චෛ-50, රූප-28	5	12	18	1
	දුක මුක්ත	අනුපාදානියා පදයේ ස්වරූපාර්ථ ලෝකෝත්තර සිත්-08, චෛ-36, නිර්වාණය				
උපාදානඋපාදානසම්පය	උපාදානා චෙව ධම්මා උපාදානසම්පයුත්තා ච	දිට්ඨි සම්පයුත්ත සිත් සතරෙහි ඇති ලෝභ, දිට්ඨි යන උපාදාන 02	1	1	1	2
	උපාදානසම්පයුත්තා චෙව ධම්මා නො ච උපාදානා	ලෝභ සිත්-08, චෛ-20	4	2	2	1
	දුක මුක්ත	උපාදානවිප්පයුත්තා පදයේ ස්වරූපාර්ථ				

පටුන වෙත

		ලෝභ මූල සිත් වර්ජිත-81, චෛ-49 (ලෝභ, දිට්ඨි, මාන), දි. වි. 4 ලෝභය, රූප 28, නිර්වාණය				
උපාදානවිප්පයුත්ත උපාදානිය	උපාදානවිප්පයුත්තා ඛො පන ධම්මා උපාදානියාපි	ද්වේෂ සිත්-2,මෝහ සිත්-2, ලෞකික කුසල, විපාක, ක්‍රියා, චෛ-49 (ලෝභ, දිට්ඨි, මාන), දිට්ඨි විප් සිත්වල ලෝභය, රූප-28	5	12	18	1
	උපාදානා විප්පයුත්තා ඛො පන ධම්මා අනුපාදානියාපි	ලෝකෝත්තර සිත්-08, චෛ-36, නිර්වාණය	4	2	2	2
	දුක මුක්ත	උපාදානසම්පයුත්තා පදයේ ස්වරූපාර්ථ ලෝභ සිත්-08, චෛතසික-22* (දේස ඉස්සා මච්ඡරිය කුක්කුච්ඡ විචික්ච්ඡා සහ දි. වි. 4 ලෝභය වර්ජිත)				

<u>උපාදන දුකය</u>

උපාදනා ධම්මා - නො උපාදනා ධම්මාති.

මාගේ ස්වාමි වූ බුදුරජාණන් වහන්සේ මහන්තර දුකය දේශනා කොට වදරා ඉන් අනතුරුව උපාදන ගොච්ඡකය දේශනා කොට වදළ සේක. එයද, උපාදන දුකාදී වශයෙන් සය වැදැරුම් වන්නේය. ඔවුනතුරෙන් උපාදන දුකය පළමු කොට වදළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදැරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **උපාදනා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **නො උපාදනා ධම්මා** යනුවෙනි.

පටුන වෙත

උපාදනා ධම්මා - මම මාගේ යයි තෘෂ්ණා දෘෂ්ටී වශයෙන් දැඩි කොට අල්වා ගන්නා අර්ථයෙන් උපාදන නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නො උපාදන ධම්මා - එසේ දැඩි කොට නො ගන්නා බැවින් උපාදන නම් නොවූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

උපාදනා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ දිට්ඨි නම් වූ චෛතසික දෙදෙනා ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු).

නො උපාදනා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන් අනූ චිත්තය ද, ලෝභ දිට්ඨි වර්ජිත සමපණස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙර සේ ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි).

උපාදන දුකයයි

<u>උපාදනියා දුකය</u>

උපාදනියා ධම්මා - අනුපාදනියා ධම්මාති.

උපාදනියා ධම්මා - තෘෂ්ණා දෘෂ්ටී නම් වූ උපාදනයන්ට අරමුණු වන්නාවූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අනුපාදනියා ධම්මා - උපාදනයන් හට අරමුණු නොවන්නාවූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

උපාදනියා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෞකික සිත් එක් අසූවද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණසද, අටවිසි රූපයද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප පෙර සේ

උදුරනු).

අනුපාදනියා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි).

උපාදන දුකයයි.

උපාදන සම්පයුත්ත දුකය

උපාදන සම්පයුත්තා ධම්මා - උපාදන විප්පයුත්තා ධම්මාති.

උපාදන සම්පයුත්තා ධම්මා - තෘෂ්ණා දෘෂ්ටි උපාදනයන් සමග ඒකෝත්පාදදී වශයෙන් මිශ්‍රවූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

උපාදන විප්පයුත්තා ධම්මා - උපාදනයන් සමඟ සම්ප්‍රයුක්ත නොවූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

උපාදන සම්පයුත්තා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝභ මූල අකුශල සිත් අට දෙනාද, දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡා සහ දිට්ඨිගත විප්පයුත්ත සිත් සතරෙහි ලෝභය ද, වර්ජිත චෛතසික දෙවිස්ස ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු).

උපාදන විප්පයුත්තා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ මූල සිත් වර්ජිත, එක් අසූ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ දිට්ඨි මාන වර්ජිත එකුන් පණස් චෛතසික ද අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද, ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි).

උපාදන සම්පයුත්ත දුකයයි.

පටුන වෙත

උපාදන උපාදනිය දුකය

උපාදනා චෙව ධම්මා උපාදනියා ච - උපාදනියා චෙව ධම්මා නෝ ච උපාදනාති.

උපාදනා චේව ධම්මා උපාදනියා ච - උපාදන නම්වූ ද උපාදනයන් හට අරමුණු වුද, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ. **උපාදනියා චේව ධම්මා නෝ ච උපාදනා** - උපාදනයන්ට අරමුණු වන්නාවූ උපාදන නම් නො වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ත ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

උපාදනා චෙව ධම්මා උපාදනියා ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි, ලෝභ දිට්ඨි නම් වූ චෛතසික දෙක ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු).

උපාදනා චෙව ධම්මා නො ච උපාදනා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි, ලෞකික සිත් එක් අසූව ද, ලෝභ දිට්ඨි වර්ජිත චෛතසික සපණස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළසකි. ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි. (ස්වරූප උදුරනු, ආදිලබ්ධ නාම දුකයකි. ලෝකෝත්තර ධර්ම ඇතුළත් නොවූ බැවින් සප්පදේස දුකයකි).

උපාදන උපාදනිය දුකයයි.

උපාදන උපාදනා සම්පයුත්ත දුකය

උපාදනා චෙව ධම්මා උපාදන සම්පයුත්තා ච - උපාදන සම්පයුත්තා චෙව ධම්මා නො ච උපාදනාති.

උපාදනා චෙව ධම්මා උපාදන සම්පයුත්තා ච - උපාදන නම් වූ ද උපාදනයන් සමග සම්ප්‍රයුක්තවූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

උපාදන සම්පයුත්තා චෙව ධම්මා නො ච උපාදනා - උපාදනයන් සමග සම්ප්‍රයුත්ත වූ ම උපාදන නම් නොවූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

පටුන වෙත

උපාදන චෙව ධම්මා උපාදන සම්පයුත්තා ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරෙහි වූ ලෝභ දිට්ඨි නම් වූ උපාදන ධර්මයෝ ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි, ආයතන වශයෙන් එකකි, ධාතු වශයෙන් එකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප පෙර සේ උදුරනු).

උපාදන සම්පයුත්තා චෙව ධම්මා නො ච උපාදනා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝභ මූල සිත් අට දෙනාද, ලෝභ දිට්ඨි වර්ජිත චෛතසික සමවිස්ස ද ලැබෙන්නාහ, ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි. (ස්වරූප උදුරනු, - ආදිලබ්ධ නාම දුකයකි, ලෝභ මූල සිත් වර්ජිත එක් අසූ චිත්තයද, නිර්වාණ ධාතුවද මෙහි ඇතුලත් නොවූ බැවින් සප්පදේස දුකයකි.

උපාදන උපාදන සම්පයුත්ත දුකයයි

<u>උපාදන විප්පයුත්ත උපාදනීය දුකය</u>

උපාදන විප්පයුත්තා ඛො පන ධම්මා උපාදනියාපි - උපාදන විප්පයුත්තා ඛො පන ධම්මා අනූපාදනියාපීති.

උපාදන විප්පයුත්තා ඛො පන ධම්මා උපාදනියාපි - උපාදනයන් සමග විප්‍රයුත්ත වූ ද, උපාදනයන්ට අරමුණු වූ ද, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

උපාදන විප්පයුත්තා ඛො පන ධම්මා අනූපාදනියාපි - උපාදනයන් සමග විප්‍රයුක්ත වූ ද, උපාදනයන්ට අරමුණු නොවූ ද, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

උපාදන විප්පයුත්තා ඛො පන ධම්මා උපාදනියාපි - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝභ මූල සිත් වර්ජිත ලෞකික සිත් තෙසැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ දිට්ඨි මාන වර්ජිත චෛතසික එකුන් පණසද, අටවිසි රූපයද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි. ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි. (ස්වරූප උදුරනු)

පටුන වෙත

උපාදන විප්පයුත්තා ඛො පන ධම්මා අනුපාදනියාපි - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි, ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු, - ආදිලබ්ධ නාම දුකයකි, ලෝභ මූල සිත් අට ද, දිට්ඨි ගත විප්‍රයුක්ත සිත් සතරෙහි ලෝභයද, දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡාවන් ද ඇතුළත් නොවන බැවින් සප්පදේස දුකයකි).

උපාදන විප්පයුත්ත උපාදනීය දුකයයි.

<u>උපාදාන ගොච්ඡකය - මිශ්‍රක දුකයන්</u>

ඛො පන යන සවන දුකයෙහි අධික පදයාගේ අධිකාර්ථ වශයෙන්

1. උපාදනාචෙවධම්මා උපාදාන විප්පයුත්තාච උපාදාන විප්පයුත්තා චෙව ධම්මා නොච උපාදානා
2. උපාදාන විප්පයුත්තා ධම්මා උපාදානීයාපි, අනුපාදානීයාපි
3. උපාදානා ධම්මා උපාදාන සම්පයුත්තාපි, උපාදාන විප්පයුත්තාපි
4. නො උපාදාන ධම්මා උපාදාන සම්පයුත්තාපි උපාදාන විප්පයුත්තාපි කියා දුකයෝ සිව්දෙනෙක් ලැබිය යුත්තාහ.

මූලටීකා නය වශයෙන්

1. උපාදානියා ධම්මා උපාදානසම්පයුත්තාපි, උපාදානවිප්පයුත්තාපි
2. උපාදානියා ධම්මා උපාදානාපි, නොඋපාදානාපි කියා දුකයෝ දෙදෙනෙක් ලැබිය යුත්තාහ. ඔවුන්ගේ සියලු අර්ථවර්ණනා යටකී නයානුසාරයෙන් සුගම යි.

අනුටීකානය වශයෙන්

1. උපාදාන සම්පයුත්තා ධම්මා උපාදානාපි, නොඋපාදානාපි
2. උපාදාන විප්පයුත්තා ධම්මා උපාදානාපි, නොඋපාදානාපි කියා දුකයෝ දෙදෙනෙක් ලැබිය යුතු බැව් දැක්වේ. ඔවුන්ගේ අර්ථවර්ණනා ද සුගම යි.

උපාදන ගොච්ඡකය සමාප්තයි

පටුන වෙත

12. කිලෙස ගොච්ඡකය

කිලෙසා - (කිලෙසෙන්ති උපතාපෙන්තී'ති = කිලෙසා). අකුශල කර්ම සිදු කෙරෙන කල්හි ද, එහි විපාකය අපායාදියෙහි විඳින කල්හි ද, සිත් සතන් දවන තවන උපතාපන හිංසන පීඩන කරවන ධර්මයන් "කිලෙස" නම් වේ.

දෙවන ක්‍රමය - (සංකිලිස්සති එතෙනා'ති = කිලෙසා). එයින් සිත දූෂ්‍ය කරන බැවින් ලෝභ ආදී ධර්මයන් "කිලෙස" නම් වේ. (සංකිලෙසික ආදී පදයන්ගේ විවරණය සංකිලිට්ඨ ත්‍රිකයෙහි දක්වන ලදී).

ස්වරූප බෙදීම

කතමෙ ධම්මා කිලෙසා? දස කිලෙසවත්ථූනි - ලොභො, දොසො, මොහො, මානො, දිට්ඨි, විචිකිච්ඡා, ථීනං, උද්ධච්චං, අහිරීකං, අනොත්තප්පං - නික්ඛේප කාණ්ඩ පාලි

(අ) පරමාර්ථ ධර්මයන් වශයෙන් ලෝභ, ද්වේෂ, මෝහ, මාන, දිට්ඨි, විචිකිච්ඡා, ථීන, උද්ධච්ච, අහිරික, අනොත්තප්ප යන චෛතසිකයන් දසය 'කිලෙස' නම් වේ.

(ආ) මෙම කෙළෙස් ධර්ම සමඟ සම්ප්‍රයුක්ත වන ධර්ම 'කිලෙසසම්පයුත්ත' නම් වේ. කෙළෙස් ධර්මයන්ට අරමුණු වන, කෙළෙස් ධර්මයන්ට හිතෙශී වන ධර්ම 'සංකිලිට්ඨ' වේ. සියලු සාසවා, සංයොජනීයා ආදියෙහි මෙන් ලෞකික ධර්ම මීට අයත් වේ. එබැවින් අකුසල සිත් 12, චෛතසික 27 යන ධර්මයන් 'සංකිලිට්ඨ' වූද, 'කිලෙසසම්පයුත්ත' වූද ධර්මයන් වේ.

(ඉ) කුසල සිත් 21, විපාක සිත් 36, ක්‍රියා සිත් 20, චෛතසික 38, රූප 28, නිර්වාණය යන ධර්මයන් 'අසංකිලිට්ඨ' වූද, 'කිලෙසවිප්පයුත්ත' වූද වේ.

කිලෙස ධර්මයන්හි මෝහ, උද්ධච්ච, අහිරික, අනොත්තප්ප යන සබ්බාකුසල සාධාරණ චෛතසික සතර ඇතුලත් වන බැවින් විප්‍රයුක්ත ධර්මයන් නැත.

කිලෙස ගොච්ඡකය

දුකය	පාලිය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
			ස්	ආ	ධා	ස
කිලෙසා	කිලෙසා ධම්මා	ක්ලේෂ වන චෛතසික-10	1	1	1	2
	නො කිලෙසා ධම්මා	සිත්-89, චෛ-42, රූප-28, නිර්වාණය	5	12	18	3
සංකිලෙසිකා	සංකිලෙසිකා ධම්මා	ලෞකික සිත්-81, චෛ-52, රූප-28	5	12	18	2
	අසංකිලෙසිකා ධම්මා	ලෝකෝත්තර සිත්-08, චෛ-36, නිර්වාණය	4	2	2	2
සංකිලිට්ඨා	සංකිලිට්ඨා ධම්මා	අකුසල් සිත්-12, චෛ-27	4	2	2	2
	අසංකිලිට්ඨා ධම්මා	කුසල-විපාක-ක්‍රියා, චෛ-38, රූප-28, නිර්වාණය	5	12	18	3
කිලෙසසම්පයුත්තා	කිලෙසසම්පයුත්තා ධම්මා	අකුසල් සිත්-12, චෛ-27	4	2	2	2
	කිලෙසවිප්පයුත්තා ධම්මා	කුසල-විපාක-ක්‍රියා, චෛ-38, රූප-28, නිර්වාණය	5	12	18	3
කිලෙසසංකිලෙසිකා	කිලෙසා චෙව ධම්මා සංකිලෙසිකා ච	ක්ලේෂ වන චෛතසික-10	1	1	1	2
	සංකිලෙසිකා චෙව ධම්මා නො ච කිලෙසා	ලෞකික සිත්-81, චෛ-42, රූප-28	5	12	18	1
	දුක මුක්ත	අසංකිලෙසිකා පදයේ ස්වරූපාර්ථ ලෝකෝත්තර සිත්-08, චෛ-36, නිර්වාණය				

පටුන වෙත

සංකිලිට්ඨ	කිලෙසා චෙව ධම්මා සංකිලිට්ඨා ච	ක්ලේෂ වන චෛතසික-10	1	1	1	2
	සංකිලිට්ඨා චෙව ධම්මා නො ච කිලෙසා	අකුසල් සිත්-12, චෙ-17	4	2	2	1
	දුක මුක්ත	අසංකිලිට්ඨ පදයේ ස්වරූපාර්ථ කුසල-විපාක-ක්‍රියා සිත්-77, චෙ-38, රූප-28, නිර්වාණය				
සකිලෙසම්ප	කිලෙසා චෙව ධම්මා කිලෙසසම්පයුත්තා ච	ක්ලේෂ වන චෛතසික-10	1	1	1	2
	කිලෙසසම්පයුත්තා චෙව ධම්මා නො ච කිලෙසා	අකුසල සිත්-12, චෙ-17	4	2	2	1
	දුක මුක්ත	කිලෙසවිප්පයුත්ත පදයේ ස්වරූපාර්ථ කුසල-විපාක-ක්‍රියා සිත්-77, චෙ-38, රූප-28, නිර්වාණය				
සකිලෙසම්ප-සංකිලෙසික	කිලෙසවිප්පයුත්තා ඛො පන ධම්මා සංකිලෙසිකාපි	ලෞකික කුසල විපාක ක්‍රියා සිත්-69, චෙ-38, රූප-28	5	12	18	1
	කිලෙසවිප්පයුත්තා ඛො පන ධම්මා අසංකිලෙසිකාපි	ලෝකෝත්තර සිත්-08, චෙ-36, නිර්වාණය	4	2	2	2
	දුක මුක්ත	උපාදානසම්පයුත්තා පදයේ ස්වරූපාර්ථ අකුසල් සිත්-12 චෙ-27				

කිලේස දුකය

කිලෙසා ධම්මා - නො කිලෙසා ධම්මාති.

මාගේ ස්වාමි වූ බුදුරජාණන් වහන්සේ උපාදන ගොචිඡකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව කිලේස ගොචිඡකය දේශනා කොට වදළ සේක. එයද කිලේස දුකාදීන්ගේ වශයෙන් අට වැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් කිලේස දුකය පළමු කොට වදළ සේක.

එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **කිලෙසා ධම්මා** - යනුවෙනි, ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **නො කිලෙසා ධම්මා** - යනුවෙනි.

කිලෙසා ධම්මා - සත්ව සන්තානය කෙලෙසන්නා වූද, දවන තවන උපතාපනය හිංසන පීඩන කරන්නා වූ ද අර්ථයෙන් ක්ලේශ නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නො කිලෙසා ධම්මා සන්තානය නොකෙලෙසන බැවින් කෙලෙස් නම් නොවූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

කිලෙසා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ - දෝස - මෝහ - මාන - දිට්ඨි - විචිකිච්ඡා - ථීන - උද්ධච්ච - අහිරික - අනොත්තප්ප යන ක්ලේශ වස්තු නම් වූ චෛතසික දස දෙනා ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු).

නො කිලෙසා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, එකුන් අනු චිත්තය ද දශ ක්ලේශ වස්තු වර්ජිත චෛතසික දෙසාළිස ද, අටවිසි රූපය ද, නිර්වාණ ධාතුවද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (ස්වරූප උදුරනු, - ආදිලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි).

කිලේස දුකයයි.

පටුන වෙත

සංකිලේස දුකය

සංකිලෙසිකා ධම්මා - අසංකිලෙසිකා ධම්මාති.

සංකිලෙසිකා ධම්මා - කෙලෙසුන් හට අරමුණු වන්නාවූ හෙවත් කෙලෙසුන්ට ගෝචර වන්නා වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අසංකිලෙසිකා ධම්මා - කෙලෙසුන් හට අරමුණු නොවන්නාවූ, කෙලෙසුන්ට ගොදුරු නොවන්නා වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සංකිලෙසා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෞකික සිත් එක් අසූව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු)

අසංකිලෙසිකා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝකෝත්තර සිත් අට දෙනා ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණ ධාතුවද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි).

සංකිලේස දුකයයි

සංකිලිට්ඨ දුකය

සංකිලිට්ඨා ධම්මා - අසංකිලිට්ඨා ධම්මාති.

සංකිලිට්ඨා ධම්මා - කෙලෙසුන් විසින් කෙලෙසන ලද්ද වූ සංකිලිට්ඨ නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අසංකිට්ලිඨා ධම්මා - කෙලෙසුන් විසින් නොකෙලෙසන ලද්දවූ අසංකිලිට්ඨ නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සංකිලිට්ඨා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සත් විස්ස ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු).

අසංකිලිට්ඨා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, දොළොස් අකුසල් සිත් වර්ජිත සත් සැත්තෑ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකයද, අටවිසි රූපයද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළොසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි).[46]

සංකිලිට්ඨ දුකයයි.

කිලෙස සම්පයුත්ත දුකය

කිලෙස සම්පයුත්තා ධම්මා - කිලෙස විප්පයුත්තා ධම්මාති.

කිලෙස සම්පයුත්තා ධම්මා - කෙලෙසුන් සමග සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් මිශ්‍ර වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

කිලෙස විප්පයුත්තා ධම්මා - කෙලෙසුන් සමග සම්ප්‍රයුක්ත නොවූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ. (සංකිලිට්ඨ පදය මෙනි, ඒ අනුව ස්වරූප උදුරනු).

කිලේස සම්පයුත්ත දුකයයි.

---

46. මෙම ගොච්ඡකයෙහි "සංකිලිට්ඨ" යන පදය ඇතුලත් වූ බැවින් අතිරේක එක් ශුද්ධ දුකයක් ද, එක් මිශ්‍රක දුකයක් ද පැමිණීම හේතුවෙන් දුක අටක් ඇත.

කිලේස සංකිලේසික දුකය

කිලෙසා චෙව ධම්මා සංකිලේසිකා ච - සංකිලෙසිකා චෙව ධම්මා නො ව කිලෙසාති.

කිලෙසා චෙව ධම්මා සංකිලෙසිකා ච - කෙලෙස් නම් වූ ද කෙලෙසුන්ට අරමුණු වූ ද, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සංකිලෙසිකා චෙව ධම්මා නො ව කිලෙසා - කෙලෙසුන්ට අරමුණු වූ ද කෙලෙස් නම් නොවූ ද, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

කිලෙසා චෙව ධම්මා සංකිලෙසිකා ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, දශ ක්ලේශ ධර්මයෝ ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි, ආයතන වශයෙන් එකකි, ධාතු වශයෙන් එකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු).

සංකිලෙසිකා චෙව ධම්මා නො ව කිලෙසා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෞකික සිත් එක් අසූව ද, තත් සම්ප්‍රයුක්ත වූ දශ කෙලෙස් වර්ජිත දෙසාළිස් චෛතසිකය ද, අටවිසි රූපයද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි. (ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, ලෝකෝත්තර ධර්ම මෙහි ඇතුළත් නොවන බැවින් සප්පදේස දුකයකි).

කිලේස සංකිලේසික දුකයයි

කිලේස සංකිලිට්ඨ දුකය

කෙලෙසා චෙව ධම්මා සංකිලිට්ඨා ච - සංකිලිට්ඨා චෙව ධම්මා නො ව කිලෙසාති.

කිලෙසා චෙව ධම්මා සංකිලිට්ඨා ච - කෙලෙස් නම් වූ ද, කෙලෙසුන් විසින් කෙලෙසන ලද්ද වූ ද, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

පටුන වෙත

සංකිලිට්ඨා චෙව ධම්මා නො ච කිලේසා - කෙලෙසුන් විසින් කෙලෙසන ලද්ද වූ ද, කෙලෙස් නම් නොවූ ද, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

කිලේසා චෙව ධම්මා සංකිලිට්ඨා ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දශ ක්ලේශ ධර්මයෝ ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි, ආයතන වශයෙන් එකකි, ධාතු වශයෙන් එකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි, (ස්වරූප උදුරනු).

සංකිලිට්ඨා චෙව ධම්මා නො ච කිලේසා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි, අකුසල් සිත් දොළසද, දශ කෙලෙස් වර්ජිත තත් සම්ප්‍රයුක්ත චෛතසික සතළොසද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි. (ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, දොළොස් අකුශල වර්ජිත සත් සැත්තෑ චිත්තය ද, අටතිස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද ඇතුළත් නොවන බැවින් සප්පදේස දුකයකි).

කිලේස සංකිලිට්ඨ දුකයයි

කිලෙස කිලෙසසම්පයුත්ත දුකය

කිලෙසා චෙව ධම්මා කිලෙස සම්පයුත්තා ච - කිලෙස සම්පයුත්තා චෙව ධම්මා නො ච කිලෙසාති.

කිලෙසා චෙව ධම්මා කිලෙස සම්පයුත්තා ච - කෙලෙසුන් සමඟ මිශ්‍ර වූ ද, කෙලෙස් නම් වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

කිලෙස සම්පයුත්තා චෙව ධම්මා නො ච කිලේසා - කෙලෙසුන් සමග මිශ්‍ර වූ ද, කෙලෙස් නම් නොවූ ද, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

කිලෙසා චෙව ධම්මා කිලෙස සම්පයුත්තා ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, දශ ක්ලේශ ධර්මයෝ ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි,

ආයතන වශයෙන් එකකි, ධාතු වශයෙන් එකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු).

කිලෙස සම්පයුත්තා චෙව ධම්මා නො ච කිලේසා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, අකුශල් සිත් දොළසද, දශ කෙලෙස් වර්ජිත චෛතසික සතළොස ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි. (ස්වරූප උදුරනු - සියල්ලම කිලේස සංකිලිට්ඨ දුකයට සමානය).

කිලේස කිලේස සම්පයුත්ත දුකයයි.

කිලෙසවිප්පයුත්ත සංකිලේසික දුකය

කිලෙස විප්පයුත්තා ඛො පන ධම්මා සංකිලෙසිකාපි - කිලෙස විප්පයුත්තා ඛො පන ධම්මා අසංකිලෙසිකාපීති.

කිලෙස විප්පයුත්තා ඛො පන ධම්මා සංකිලෙසිකාපි - කෙලෙසුන් කෙරෙන් විප්‍රයුක්ත වූ ද, කෙලෙසුන්ට අරමුණු වූ ද, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

කිලෙස විප්පයුත්තා ඛො පන ධම්මා අසංකිලෙසිකාපි - කෙලෙසුන් කෙරෙන් විප්‍රයුක්ත වූ ද, කෙලෙසුන්ට අරමුණු නො වූ ද, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

කිලෙස විප්පයුත්තා ඛො පන ධම්මා සංකිලෙසිකාපි - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි, දොළොස් අකුසල් සිත් වර්ජිත ලෞකික සිත් එකුන් සැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි, (ස්වරූප උදුරනු).

කිලෙස විප්පයුත්තා ඛො පන ධම්මා අසංකිලෙසිකාපි - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝකෝත්තර සිත් අට දෙනා ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකකි, ආර්ය

සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, අකුසල ධර්ම ඇතුළත් නොවන බැවින් සප්පදේස දුකයකි).

කිලේස විප්පයුත්ත සංකිලේස දුකයයි

කිලෙස ගොච්ඡකය - මිශ්‍රක දුකයන්

මෙහි ඛොපන යන පදයාගේ අධිකාර්ථයෙන් අටුවා නයින්

1. නොකිලෙසා ධම්මා සඞ්කිලෙසිකාපි, අසඞ්කිලෙසිකාපි
2. නොකිලෙසා ධම්මා සඞ්කිලිට්ඨාපි, අසඞ්කිලිට්ඨාපි
3. නොකිලෙසා ධම්මා කිලෙසසම්පයුත්තාපි, කිලෙසවිප්පයුත්තාපි
4. සඞ්කිලෙසිකා ධම්මා අසඞ්කිලිට්ඨාපි, සඞ්කිලිට්ඨාපි කියා දුකයෝ සිවුදෙනෙක් ඇත්තාහ

මූලටීකා නයින්

1. සඞ්කිලෙසිකා ධම්මා, කිලෙසසම්පයුත්තාපි, කිලෙස විප්පයුත්තාපි
2. සඞ්කිලෙසිකා ධම්මා කිලෙසාපි නොකිලෙසාපි කියා දුකයෝ දෙදෙනෙක් ලැබිය යුත්තාහ.

අනුටීකා නයින්

1. සඞ්කිලිට්ඨා ධම්මා කිලෙසාපි, නොකිලෙසාපි
2. කිලෙස සම්පයුත්තා ධම්මා කිලෙසාපි, නොකිලෙසාපි කියා දුකයෝ දෙදෙනෙක් ලැබිය යුත්තෝ ය. මොවුන්ගේ සියලු අර්ථවර්ණනාව යටකී නයානුසාරයෙන් දත යුතු ය.

කිලේස ගොච්ඡකය සමාප්ත ය.

පටුන වෙත

13. පිටිඨිදුකය

දුකය	පාලිය	ස්වරූපාර්ථ	සංග්‍රහය			
			ස්	ආ	ධා	ස
දස්සනේන පහාතබ්බා	දස්සනෙන පහාතබ්බා ධම්මා	සෝ මාර්ග (ප්‍රහාණය කරන) දිට්ඨි සම්-4, විචි-1, චෙ-22 (මාන, දෙස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච හැර) (තනුක කරන) අපායගාමිනී දිට්ඨි විප්-4, දෝ-2, චෙ-25 (දිට්ඨි, විචිකිච්ඡා හැර)	4	2	2	2
	න දස්සනෙන පහාතබ්බා ධම්මා	(සෝ මාර්ගය ප්‍රහාණය නොකරන) අපායගාමිනී නොවන දිට්ඨි විප්-4, දෝ-2, සෝ මාර්ගය ප්‍රහාණය නොකරන උද්-1, කු-21, වි-36, ක්‍රි-20, දිට්ඨි විචි හැර චෙ-50, රූප-28, නිර්වාණය	5	12	18	4
භාවනාය පහාතබ්බා	භාවනාය පහාතබ්බා ධම්මා	(සක-තනුක කරන) ඔළාරික දිට්ඨි විප්-4, දෝ-2, චෙ-25 (දිට්ඨි, විචිකිච්ඡා හැර) (අනා-ප්‍රහාණය කරන) කාමරාග සං දිට්ඨි විප්-4, දෝ-2, චෙ-25 (දිඨි, විචිකිච්ඡා හැර) (අර්-ප්‍රහාණය කරන) රූප අරූප සං දිට්ඨි විප්-4, උද්-1, චෙ -21 (දිට්ඨි, විචිකිච්ඡා, දෙස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ඡා හැර)	4	2	2	2
	න භාවනාය පහාතබ්බා ධම්මා	(මතු මාර්ග ත්‍රය ප්‍රහාණය නොකරන) අපායගාමිනී වන දිට්ඨි විප්-4, දෝ-2, මාර්ගය ප්‍රහාණය නොකරන දිට්ඨි සම්-4,	5	12	18	4

පටුන වෙත

		විචි-1, කු-21, වි-36, ක්‍රි-20, චෙ-52, රූප-28, නිර්වාණය				
දස්සනෙන පහාතබ්බහෙතුකා ධම්මා	දස්සනෙන පහාතබ්බහෙතුකා ධම්මා	සෝ මාර්ග(ප්‍රහාණය කරන) දිට්ඨි සම්-4, විචි-1, විචි. සිතේ මෝහය හැර චෙ-22, (දෙස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ඡය, මාන, මොහය හැර) (තනුක කරන) අපායගාමිනී දිට්ඨි විප්-4, දෝ-2, චෙ-25 (දිට්ඨි, විචිකිච්ඡා හැර)	4	2	2	2
	න දස්සනෙන පහාතබ්බහෙතුකා ධම්මා	(සෝ මාර්ගය ප්‍රහාණ කටයුතු හේතු නැත්තාවූ) අපායගාමිනී නොවන දිට්ඨි විප්-4, දෝ-2, සෝ මාර්ගය ප්‍රහාණය නොකරන උද්-1, කු-21, වි-36, ක්‍රි-20, දිට්ඨි විචි හැර විචිකිච්ඡා සිතේ මෝහය හැර චෙ-50, රූප-28, නිර්වාණය	5	12	18	4
භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා	භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා	(සක-තනුක කරන) ඔරාරික දිට්ඨි විප්-4, දෝ-2, (දිට්ඨි, විචිකිච්ඡා හැර) (අනා-ප්‍රහාණය කරන) කාමරාග සං දිට්ඨි විප්-4, දෝ-2, චෙ-25 (අර්-ප්‍රහාණය කරන) රූප අරූප සං දිට්ඨි විප්-4, උද්-1, චෙ -21 (දිට්ඨි, දෙස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්චය, විචික්ච්ඡා හැර) මොහ දෙසිතේ මෝහය හැර	4	2	2	2
	න භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා	(මතු මාර්ග ත්‍රය ප්‍රහාණය කටයුතු හේතු නැත්තාවූ) අපායගාමිනී වන දිට්ඨි විප්-4,	5	12	18	4

		දෝ-2, මතු මාර්ග ත්‍රය ප්‍රහාණය නොකරන දිට්ඨි විප්-4, විචි-1, කු-21, වි-36, ක්‍රි-20, උද්ධච්ච සිතේ මෝහය හැර චෙ-52, රූප-28, නිර්වාණය				
සවිතක්ක	සවිතක්කා ධම්මා	සවිතර්ක සිත්-55, විතර්ක හැර චෙ-51	4	2	3	3
	අවිතක්කා ධම්මා	අවිතර්ක සිත්-66, චෙ-37, සවිතර්ක සිත්වල විතර්ක-55, රූප-28, නිර්වාණ	5	12	17	3
සවිචාර	සවිචාරා ධම්මා	සවිචාර සිත්-66, විචාර හැර චෙ-51	4	2	3	3
	අවිචාරා ධම්මා	අවිචාර සිත්-55, චෙ-36 (විතර්ක විචාර හැර), විචාර-66, රූප-28, නිර්වාණ	5	12	17	3
සප්පීතික	සප්පීතිකා ධම්මා	ප්‍රීති සහගත සිත්-51, චෙ-46 (පීති, දෙස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, විචිකිච්ඡා හැර)	4	2	2	3
	අප්පීතිකා ධම්මා	අප්‍රීතික සිත් 70, චෙ-51, ප්‍රීති සිත් 51හි ප්‍රීති චෛතසිකය, රූප-28, නිර්වාණය	5	12	18	4
පීතිසහගත	පීතිසහගතා ධම්මා	ප්‍රීති සහගත සිත්-51, චෙ-46 (පීති, දෙස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, විචිකිච්ඡා හැර)	4	2	2	3
	න පීතිසහගතා ධම්මා	අප්‍රීතික සිත් 70, චෙ-51, ප්‍රීති සිත් 51 ප්‍රීති චෛතසිකය, චෙ-51, රූප-28, නිර්වාණය	5	12	18	4
සුඛසහගත	සුඛසහගතා ධම්මා	සුඛ සහගත සිත්-63, චෙ-46 (වේදනා, දෙස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, විචිකිච්ඡා හැර)	3	2	3	3

පටුන වෙත

	න සුඛසහගතා ධම්මා	දුක්ඛ-3, උපෙ-55, පීති හැර චෙ-51, සුඛ වෙදනා-63, රූප-28, නිර්වාණය	5	12	17	4
උපෙක්ඛාසහගත	උපෙක්ඛාසහගතා ධම්මා	උපෙක්ඛා සහගත සිත්-55, චෙ-46 (වේදනා, ප්‍රීති, දෙස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, හැර)	3	2	7	3
	න උපෙක්ඛාසහගතා ධම්මා	සුඛ වෙදනා-63, දුක්ඛ-3, විචි. හැර චෙ-51, උපෙ. සිත් 55 උ. වෙදනා-55, රූප-28, නිර්වාණය	5	12	13	4
කාමාවචර	කාමාවචරා ධම්මා	කාමාවචර සිත්-54, චෙ-52, රූප-28	5	12	18	2
	න කාමාවචරා ධම්මා	මහද්ගත ලෝකුත්තර සිත්-35, චෙ-38, නිර්වාණය	4	2	2	3
රූපාවචර	රූපාවචරා ධම්මා	රූපාවචර සිත්-15 චෙ-35	4	2	2	1
	න රූපාවචරා ධම්මා	කාම-54, අරූප-12, ලෝකු සිත්-8, චෙ-52, රූප-28, නිර්වාණය	5	12	18	4
අරූපාවචර	අරූපාවචරා ධම්මා	අරූපාවචර සිත්-12, චෙ-30	4	2	2	1
	න අරූපාවචරා ධම්මා	කාම-54, රූප-15, ලෝකු සිත්-8, චෙ-52, රූප-28, නිර්වාණය	5	12	18	4
පරියාපන්න	පරියාපන්නා ධම්මා	ලෞකික සිත්-81, චෙ-52, රූප-28	5	12	18	2
	අපරියාපන්නා ධම්මා	ලෝකුත්තර සිත් 8, චෙ-36, රූප-28, නිර්වාණ	4	2	2	2
නියාන්තික	නියාන්තිකා ධම්මා	ලෝ මාර්ග සිත්-4, චෙ-36	4	2	2	1
	අනියාන්තිකා ධම්මා	ලෞකික සිත්-81, ඵල සිත්-4 චෙ-52, රූප-28, නිර්වාණ	5	12	18	3

පටුන වෙත

නියත	නියතා ධම්මා	(නියත මිථ්‍යා) දිට්ඨි සම්-4 සත්වැනි ජවනය, චෙ-21 (මාන, දෙස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච විචිකිච්ඡා) (පඤ්චානන්) දෝ-2, සත්වැනි ජවනය, චෙ-22 (ප්‍රීති, ලෝභ, දිඨි, මාන, විචිකිච්ඡා) මාර්ග සිත් -4, චෙ-36	4	2	2	3
	අනියතා ධම්මා	(නියත මිථ්‍යා) දිට්ඨි සම්-4 සත්වැනි ජවනය හැර, (පඤ්චානන්) දෝ-2, සත්වැනි ජවනය හැර අකුසල-12, ලෞකික-කු වි ක්‍රියා චෙ 52, රූප -28, නිර්වාණ	5	12	18	3
සඋත්තර	සඋත්තරා ධම්මා	ලෞකික සිත්-81, චෙ-52, රූප-28	5	12	18	2
	අනුත්තරා ධම්මා	ලෝකෝත්තර සිත්-8, චෙ-36, නිර්වාණය	4	2	2	2
අරණ	සරණා ධම්මා	අකුසල-12, චෙ-27	4	2	2	2
	අරණා ධම්මා	කුසල විපාක ක්‍රියා-77, චෙ-38, රූප28, නිර්වාණය	5	12	18	3

<u>දස්සනෙන පහාතබ්බ දුකය</u>

දස්සනෙන පහාතබ්බා ධම්මා - න දස්සනෙන පහාතබ්බා ධම්මාති.

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ කිලේස ගොච්ඡකය දේශනා කොට වදරා ඉන් අනතුරුව පිට්ඨි දුකය දේශනා කොට වදළ සේක. එය ද, දස්සනෙන පහාතබ්බ දුකාදීන්ගේ වශයෙන් අටළොස් වැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් දස්සනෙන පහාතබ්බ දුකය පළමු

කොට වදළ සේක.[47]

එය ද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය, ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කේසේ වදළ සේක් ද යත්, **දස්සනෙන පහාතබ්බා ධම්මා** - යනුවෙනි, ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **න දස්සනෙන පහාතබ්බා ධම්මා** - යනුවෙනි.

දස්සනෙන පහාතබ්බා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, සෝවාන් මාර්ගයෙන් සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය වන්නා වූ දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතර ද, විචිකිච්ඡා සහගත චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත වූ මාන දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච වර්ජිත චෛතසික දෙවිස්ස ද.

සෝවාන් මාර්ගර්යෙන් තුනී කිරීම් වශයෙන් ප්‍රහාණය කටයුතු වූ අපාය ගාමිනී ශක්තිය ඇත්තා වූ, දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර ද, දෝස මූල දෙක ද, තත් සම්ප්‍රයුක්ත වන දිට්ඨි විචිකිච්ඡා වර්ජිත පස්විසි චෛතසික ද, ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු. මෙම පදයේ ස්වරූපාර්ථ දස්සන ත්‍රිකයේ ප්‍රථම පදය හා සමඟ සමාන වේ).

න දස්සනෙන පහාතබ්බා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සෝවාන් මාර්ගයෙන් ප්‍රහාණය නොවන්නා වූ අපාගාමී ශක්තියෙන් තොර වූ, දිට්ඨිගත විප්පයුත්ත සිත් සතර ද දෝස මූල දෙසිත ද, සෝවාන් මාර්ගයෙන් ඒකාන්තයෙන් ප්‍රහාණය නොවන්නා වූ, උද්ධච්ච සහගත සිත ද, දොළොස් අකුශල් වර්ජිත සත් සැත්තෑ චිත්තය ද, දිට්ඨි විචිකිච්ඡා වර්ජිත චෛතසික සමපණස ද, අටවිසි රූපයද නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන්

---

47. **පිට්ඨිදුකය** - (පිට්ඨියං ඨපිතා දුකා = පිට්ඨිදුකා) අභිධර්ම මාතෘකාවන්ගේ අවසානයේ (පිටුපසින් ම) තබා ඇති දුකයන් "පිට්ඨිදුක" නම් වේ.

සතරකි. (ස්වරූප උදුරනු, - ආදි ලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි).

දස්සනෙන පහාතබ්බ දුක යයි.

භාවනාය පහාතබ්බ දුකය

භාවනාය පහාතබ්බා ධම්මා - න භාවනාය පහාතබ්බා ධම්මාති.

භාවනාය පහාතබ්බා ධම්මා - සකදාගාමී අනාගාමී අර්හත් යන මතු මාර්ගත්‍රයෙන් ප්‍රහාණය කටයුතු වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්ත හ.

න භාවනාය පහාතබ්බා ධම්මා - මතු මාර්ගත්‍රයෙන් ප්‍රහාණය නොකටයුතු වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

භාවනාය පහාතබ්බා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, සකදාගාමී මාර්ගයෙන් තුනී කිරීමෙන් ප්‍රහාණය කටයුතු වූ, ඖදරික දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර ද, ඖදරික ද්වේෂ මූල දෙසිත ද, අනාගාමි මාර්ගයෙන් නිරවශෙෂයෙන් ප්‍රහාණය කටයුතු වූ කාමරාගයෙන් යුක්ත වූ, දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර ද, ද්වේෂ මූල දෙසිත ද, අර්හත් මාර්ගයෙන් නිරවශේෂයෙන් ප්‍රහාණය කටයුතු වූ, රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජාවන් සමඟ යෙදුනා වූ, දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර ද, උද්ධච්ච සහගත සිත ද දිට්ඨි විචිකිච්ඡා වර්ජිත තත් සම්ප්‍රයුක්ත සත්විසි චෛතසිකය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙර සේ ස්වරූප උදුරනු මෙම පදයේ ස්වරූපාර්ථ දස්සන ත්‍රිකයේ දුතිය පදය හා සමඟ සමාන වේ).

න භාවනාය පහාතබ්බා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සෝවන් මගින් නිරවශේෂව ප්‍රහාණය වන දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතර ද, විචිකිච්ඡා සහගත සිත ද, අපායගාමී ශක්තියෙන් යුක්ත දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර ද, ද්වේෂ මූල දෙසිත ද, චෛතසික සත්විස්ස ද, දොළොස් අකුශල් වර්ජිත ඉතිරි සිත් සත් සැත්තෑව ද, චෛතසික

අටතිස ද, අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (ස්වරූප උදුරනු, - අදිලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි).

භාවනාය පහාතබ්බ දුක යයි.

දස්සනෙන පහාතබ්බහෙතුක දුකය

දස්සනෙන පහාතබ්බහෙතුකා ධම්මා - න දස්සනෙන පහාතබ්බ හේතුකා ධම්මාති.

දස්සනෙන පහාතබ්බහෙතුකා ධම්මා - සෝවාන් මාර්ගයෙන් ප්‍රහාණය කටයුතු හේතු ඇත්තා වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

න දස්සනෙන පහාතබ්බහෙතුකා ධම්මා - සෝවාන් මාර්ගයෙන් ප්‍රහාණය කටයුතු හේතු නැත්තා වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

දස්සනෙන පහාතබ්බහෙතුකා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, සෝවාන් මාර්ගයෙන් නිරවශේෂව ප්‍රහාණය වන්නා වූ දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතර ද, විචිකිච්ඡා සහගත සිත ද තත් සම්ප්‍රයුක්ත වූ, මාන දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච හා විචිකිච්ඡා සහගත සිතෙහි මෝහය ද, වර්ජිත කොට ඇති චෛතසික දෙවිස්ස ද, සෝවාන් මගින් තුනී කටයුතු වූ අපායගාමී ශක්තියෙන් යුක්ත වූ, දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරද, ද්වේෂ මූල සිත් දෙක ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා වර්ජිත පස්විසි චෛතසික ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන දෙකකි. (ස්වරූප උදුරනු මෙම පදයේ ස්වරූපාර්ථ දස්සනහේතු ත්‍රිකයේ ප්‍රථම පදය හා සමඟ සමාන වේ).

න දස්සනෙන පහාහබ්බහෙතුකා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, සෝවාන් මාර්ගයෙන්ම ප්‍රහාණය වන්නා වූ ධර්මයන් වර්ජිත කොට, අපායගාමී ශක්තියෙන් ද තොර වූ දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර ද, දෝස මූල දෙසිත ද,

සෝවාන් මගින් ප්‍රහාණය නොවන උද්ධච්ච සහගත සිත ද, දිට්ඨි විචිකිච්ඡා වර්ජිත සත්විසි චෛතසිකය ද, විචිකිච්ඡා සහගත සිතෙහි මෝහය ද, අවශේෂ සත් සැත්තෑ චිත්තය ද, අටතිස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (ස්වරූප උදුරනු, - ආදිලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි).

දස්සනෙන පහාතබ්බ හේතුක දුකයයි.

භාවනාය පහාතබ්බ හේතුක දුකය

භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා - න භාවනාය පහාතබ්බහෙතුකා ධම්මාති.

භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා - සකදාගාමී අනාගාමී අර්හත් නම් වූ මාර්ගත්‍රයෙන් ප්‍රහාණය කටයුතු හේතු ඇත්තා වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

න භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා - මතු මාර්ගත්‍රයෙන් ප්‍රහාණය කටයුතු හේතු නැත්තා වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සකදාගාමි මාර්ගයෙන් තුනී කිරීම වශයෙන් ප්‍රහාණය කටයුතු වූ, ඖදරික දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර ද ඖදරික ද්වේෂ මූල දෙසිත ද අනාගාමී මාර්ගයෙන් නිරවශේෂව ප්‍රහාණය කටයුතු වූ කාම රාගයෙන් යුක්ත වූ, දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර ද, ද්වේෂ මූල දෙසිත ද, අර්හත් මාර්ගයෙන් නිරවශේෂව ප්‍රහාණය කටයුතු වූ, රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජාවන් සමග යෙදුනා වූ, දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර ද උද්ධච්ච සහගත සිත ද, දිට්ඨි විචිකිච්ඡාවන් හා උද්ධච්ච සිතෙහි මෝහය ද වර්ජිත පස්විසි චෛතසිකය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු. මෙම පදයේ ස්වරූපාර්ථ දස්සනහෙතු ත්‍රිකයේ ප්‍රථම පදය හා සමඟ සමාන වේ).

න භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, සෝවාන් මගින්ම ප්‍රහාණය කටයුතු වන දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතර ද, විචිකිච්ඡා සහගත සිත ද සෝවාන් මගින් අනේකාන්තයෙන් ප්‍රහාණය කටයුතු වූ අපායගාමී ශක්තියෙන් යුක්ත වූ දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර ද, ද්වේෂ මූල දෙසිත ද, චෛතසික සත් විස්ස ද, දොළොස් අකුශල සිත් වර්ජිත වූ, අවශේෂ සත් සැත්තෑ චිත්තය ද, අටතිස් චෛතසිකය ද, උද්ධච්ච සහගත සිතෙහි මෝහය ද, අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, නිප්‍රදේශ දුකයකි).

භාවනාය පහාතබ්බ හේතුක දුකයයි.

සවිතක්ක දුකය

සවිතක්කා ධම්මා - අවිතක්කා ධම්මාති.

සවිතක්කා ධම්මා - විතර්කය සමග සම්ප්‍රයුක්ත වන බැවින් සවිතක්ක නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අවිතක්කා ධම්මා - විතර්කය සමග සම්ප්‍රයුක්ත නො වූ, අවිතක්ක නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සවිතක්කා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, සවිතර්ක සිත් පස් පණස ද, තත් සම්ප්‍රයුක්ත විතර්ක වර්ජිත චෛතසික එක් පණස ද, ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් තුනකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙර සේ ස්වරූප උදුරනු).

අවිතක්කා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, අවිතර්ක සිත් සැට දෙනා ද, විතර්ක වර්ජිත තත් සම්ප්‍රයුක්ත චෛතසික සත් තිස ද, අටවිසි රූපය ද, නිර්වාණය ද, සවිතර්ක සිත් පස් පණසෙහි විතර්ක පස් පණස ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි,

ධාතු වශයෙන් සතළොසකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි).

සවිතක්ක දුකයයි.

සවිචාර දුකය

සවිචාරා ධම්මා - අවිචාරා ධම්මාති.

සවිචාරා ධම්මා - සම්ප්‍රයුක්ත වශයෙන් විචාරය සහිත වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අවිචාරා ධම්මා - සම්ප්‍රයුක්ත වශයෙන් විචාරය රහිත වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සවිචාරා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, සවිචාර සිත් සසැට දෙනා ද, තත් සම්ප්‍රයුක්ත විචාර වර්ජිත චෛතසික එක් පණස ද, ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් තුනකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (ස්වරූප උදුරනු).

අවිචාරා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, අවිචාර සිත් පස් පණස ද, තත් සම්ප්‍රයුක්ත විතර්ක විචාර වර්ජිත චෛතසික සතිස ද, සවිචාර සිත් සසැටෙහි විචාර චෛතසික සසැට දෙනා ද, අටවිසි රූපය ද, නිර්වාණයද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් සතළොසකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (ස්වරූප උදුරනු - ආදි ලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි).

සවිචාර දුකයයි.

සප්පීතික දුකය

සප්පීතිකා ධම්මා - අප්පීතිකා ධම්මාති.

සප්පීතිකා ධම්මා - සම්ප්‍රයුක්ත වශයෙන් ප්‍රීතිය සමග යෙදුනා වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අප්පීතිකා ධම්මා - සම්ප්‍රයුක්ත වශයෙන් ප්‍රීතිය රහිත වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සප්පීතිකා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, සප්පීතික සිත් එක් පණස ද, ප්‍රීති දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡා වර්ජිත චෛතසික සසාළිස ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (ස්වරූප උදුරනු).

අප්පීතිකා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, අප්‍රීතික සිත් සම සැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත එක් පණස් චෛතසිකය ද, සප්‍රීතික සිත් එක් පණසෙහි ප්‍රීති චෛතසික එක් පණස ද අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (ස්වරූප උදුරනු, - ආදිලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි).

සප්පීතික දුකයයි.

පීති සහගත දුකය

පීති සහගතා ධම්මා - න පීති සහගතා ධම්මාති.

පීති සහගතා ධම්මා - ඒකෝත්පාදදී වශයෙන් ප්‍රීතිය සමඟ මිශ්‍ර වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

න පීති සහගතා ධම්මා - ප්‍රීතිය සමඟ මිශ්‍ර නොවූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ. (ඉතිරි සියල්ල සප්පීතික දුකයට සමානය, - ස්වරූප උදුරනු).

පීති සහගත දුකයයි.

සුඛ සහගත දුකය

සුඛ සහගතා ධම්මා - න සුඛ සහගතා ධම්මාති.

සුඛ සහගතා ධම්මා - යන ප්‍රථම පදයා ගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, සුඛ සහගත සිත් තෙසැට දෙනා ද, තත් සම්ප්‍රයුක්ත වේදනා දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡා වර්ජිත චෛතසික සසාළිස ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් තුනකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් තුනකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (ස්වරූප උදුරනු).

න සුඛ සහගතා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දෝස මූල දෙසිත ද, දුක්ඛ සහගත කායවිඤ්ඤාණය ද, උපේක්ෂා සහගත සිත් පස් පණස ද, ප්‍රීති වර්ජිත තත් සම්ප්‍රයුක්ත එක් පණස් චෛතසිකය ද, සුඛ වේදනා තෙසැට දෙනා ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් සතළොසකි, ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි).

සුඛ සහගත දුකයයි.

උපේක්ඛා සහගත දුකය

උපේක්ඛා සහගතා ධම්මා - න උපෙක්ඛා සහගතා ධම්මාති.

උපේක්ඛා සහගතා ධම්මා - ඒකෝත්පාදදී වශයෙන් උපෙක්ෂා වේදනාව සමඟ මිශ්‍ර වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

න උපෙක්ඛා සහගතා ධම්මා - උපේක්ෂා වේදනාව සමඟ මිශ්‍ර නො වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

උපෙක්ඛා සහගතා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, උපේක්ෂා සහගත සිත් පස් පණස ද, තත් සම්ප්‍රයුක්ත ප්‍රීති වේදනා දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච වර්ජිත චෛතසික සසාළිස ද, ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන්

තුනකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් සතරකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (ස්වරූප උදුරනු).

න උපෙක්ඛා සහගතා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, සුඛ සහගත සිත් තෙසැට දෙනා ද, දුක්ඛ සහගත සිත් තුන ද, විචිකිච්ඡා වර්ජිත චෛතසික එක් පණස ද, උපෙක්ෂා සහගත සිත් පස් පණසෙහි උපෙක්ෂා වේදනා පස් පණස ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් තෙළසකි, ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (ස්වරූප උදුරනු, - ආදිලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි).

උපෙක්ඛා සහගත දුකයයි.

කාමාවචර දුකය

කාමාවචරා ධම්මා - න කාමාවචරා ධම්මාති.

කාමාවචරා ධම්මා[48] - කාම තණ්හාවට අරමුණු වන බැවින් ද, එකොළොස් කාම භූමියට ඇතුලත් බැවින් ද කාමාවචර නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

න කාමාවචරා ධම්මා - කාමාවචර නම් නො වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

කාමාවචරා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, කාමාවචර සිත් සිවු පණස ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු).

න කාවාවචරා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝකෝත්තර සිත් පන් තිස ද, තත්

---

48. **කාමාවචරා** - (කාමෙ අවචරන්තී'ති = කාමාවචරා). කාම භවයන්හි ඇතුලත් වන ධර්මයෝ "කාමාවචර" නම් වේ.

සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද, නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි).

කාමාවචර දුකයයි.

රූපාවචර දුකය

රූපාවචරා ධම්මා - න රූපාවචරා ධම්මාති.

රූපාවචරා ධම්මා - රූපභව තණ්හාවට අරමුණු වන්නා වූ ද, පසළොස් රූප භූමියට අයත් වූ ද රූපාවචර නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

න රූපාවචරා ධම්මා - රූපාවචර නම් නො වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[49]

රූපාවචරා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, රූපාවචර සිත් පසළොස ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික පන් තිස ද, ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි. (ස්වරූප උදුරනු).

න රූපාවචරා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, කාමාවචර අරූපාවචර සහ ලෝකෝත්තර සිත් සිවු සැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, අටවිසි රූපය ද නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි).

රූපාවචර දුකයයි

---

49. **රූපාවචරා** - (රූපෙ අවචරන්තී'ති = රූපාවචරා). රූප භවයන්හි ඇතුලත් වන ධර්මයෝ "රූපාවචර" නම් වේ.

අරූපාවචර දුකය

අරූපාවචරා ධම්මා - න අරූපාවචරා ධම්මාති.

අරූපාවචරා ධම්මා - අරූපභව තණ්හාවට අරමුණු වන බැවින් ද, අරූපාවචර භූමියට ඇතුලත් වන බැවින් ද, අරූපාවචර නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[50]

න අරූපාවචරා ධම්මා - අරූපාවචර නම් නොවූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අරූපාවචරා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, අරූපාවචර සිත් දොළසද, තත් සම්ප්‍රයුක්ත වූ චෛතසික සමතිස ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි. ස්වරූප උදුරනු).

න අරූපාවචරා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, කාමාවචර රූපාවචර සහ ලෝකෝත්තර සිත් සත් සැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (ස්වරූප උදුරනු, - ආදිලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි).

අරූපාවචර දුකයයි.

පරියාපන්න දුකය

පරියාපන්නා ධම්මා - අපරියාපන්නා ධම්මාති.

පරියාපන්නා ධම්මා - කර්මවට්ට විපාකවට්ට කිලේසවට්ට නම් වූ, ත්‍රිවිධ සංසාරවට්ට දුක්ඛයට ඇතුලත් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

---

50. **අරූපාවචරා** - (අරූපෙ අවචරන්තී'ති = අරූපාවචරා). කාම භවයන්හි ඇතුලත් වන ධර්මයෝ "අරූපාවචර" නම් වේ.

අපරියාපන්නා ධම්මා - ත්‍රිවිධ සංසාරවට්ට දුක්ඛයට ඇතුළත් නො වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[51]

පරියාපන්නා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෞකික සිත් එක් අසූවද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු).

අපරියාපන්නා ධම්මාති - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝකෝත්තර සිත් අට දෙනා ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි).

පරියාපන්න දුකයයි

<u>නියාන්‍යානික දුකය</u>

නියාන්‍යානිකා ධම්මා - අනියාන්‍යානිකා ධම්මාති.

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ පරියාපන්න දුකයට අනතුරුව නියාන්‍යානික දුකය වදළ සේක. එය ද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය

---

51. **පරියාපන්නා** - (පරිච්ඡිජ්ජ ගාහිකාය තණ්හාය ආපන්නා'ති = පරියාපන්නා). තණ්හාව මඟින් පිරිසිඳ ගැනීමට පැමිණියා වූ ත්‍රෛභූමික ධර්මයන් "පරියාපන්න" නම් වේ. දෙවන ක්‍රමය - ත්‍රෛභූමික වෘත්තයෙහි ඇතුලත් ධර්මයන් පරියාපන්න නම් වේ.

අපරියාපන්නා - (න පරියාපන්නා'ති = අපරියාපන්නා). තණ්හාව මඟින් පිරිසිඳ ගැනීමට නොපැමිණියා වූ ධර්මයන් "අපරියාපන්න" නම් වේ. දෙවන ක්‍රමය - ත්‍රෛභූමික වෘත්තයෙහි ඇතුලත් නොවන ධර්මයන් අපරියාපන්න නම් වේ.

පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **නියාානිකා ධම්මා** - යනුවෙනි, ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **අනියාානිකා ධම්මා** - යනුවෙනි.

නියාානිකා ධම්මා - සංසාරවට්ට දුක්ඛයෙන් එතෙර කරවන බැවින් නෛර්යාණික නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අනියාානිකා ධම්මා - නෛර්යාණික නම් නොවූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[52]

නියාානිකා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝකෝත්තර මාර්ග සිත් සතරද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් එකකි. (ස්වරූප උදුරනු)

අනියාානිකා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, අවශේෂ පස් අසූ චිත්තය ද, දෙපණස් චෛතසිකය ද, අටවිසි රූපයද, නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (ස්වරූප උදුරනු, - ආදිලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි).

නියාානික දුකයයි

---

52. **නියාානිකා** - (වට්ටතො නියාන්තී'ති = නියාානිකා). අවිද්‍යාව නැමැති වෘත්තය සිඳිමින් නිර්වාණය අරමුණු කරමින් සංසාර වෘත්තයෙන් එතෙර කරවන ධර්මයන් "නියාානික" නම් වේ.

අනියාානිකා - (න නියාානිකා = අනියාානිකා). අවිද්‍යාව නැමැති වෘත්තය සිඳිමින් නිර්වාණය අරමුණු කරමින් සංසාර වෘත්තයෙන් එතෙර කරවීමට සමත් නොවන ධර්මයන් "අනියාානික" නම් වේ.

නියත දුකය

නියතා ධම්මා - අනියතා ධම්මාති.

නියතා ධම්මා- චුතියට අනතුරුව හෝ තමාගේ පැවැත්මට අනතුරුව, ඒකාන්තයෙන් විපාක දෙන බැවින් නියත නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අනියතා ධම්මා - චුතියට අනතුරුව හෝ තමාගේ පැවැත්මට අනතුරුව, ඒකාන්ත වශයෙන් විපාක නොදෙන බැවින් අනියත නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[53]

නියතා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, නියත මිථ්‍යා දෘෂ්ඨි වශයෙන් පහළ වන්නාවූ, දිට්ඨිගත සම්ප්‍රයුක්ත චිත්ත වීථි සතරෙහි සත්වන ජවනයෝ ද තත් සම්ප්‍රයුක්ත මාන දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ඡ විචිකිච්ඡා වර්ජිත එක්විසි චෛතසිකයෝ ද, පඤ්චානන්තර්ය කර්ම වශයෙන් පහළ වන්නා වූ දෝස මූල දෙසිතෙහි සත් වන ජවනයෝ ද, ප්‍රීති ලෝභ දිට්ඨි මාන විචිකිච්ඡා වර්ජිත තත් සම්ප්‍රයුක්ත දෙවිසි චෛතසිකයෝද, සතර මාර්ග චිත්තයෝද, තත් සම්ප්‍රයුක්ත දෙවිසි චෛතසිකයෝද, සතර මාර්ග චිත්තයෝද, තත් සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකයෝද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (ස්වරූප උදුරනු).

අනියතා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, නියතමිථ්‍යා දෘෂ්ඨි වශයෙන් සහ ආනන්තර්ය කර්ම වශයෙන් පැවැතියා වූ, ලෝභ මූල දෝස මූල සත් වන

---

53. **නියතා** - (නියමන්තී'ති = නියතා). චුතියට අනතුරුව හෝ තමාගේ පැවැත්මට අනතුරුව ඒකාන්තයෙන් විපාක ගෙන දෙන ධර්මයන් "නියතා" නම් වේ.

අනියතා - (න නියතා'ති = අනියතා). චුතියට අනතුරුව හෝ තමාගේ පැවැත්මට අනතුරුව ඒකාන්තයෙන් විපාක ගෙන නොදෙන ධර්මයන් "අනියතා" නම් වේ.

ජවනයන් ද සතර මාර්ගය ද වර්ජිත කොට ඇත්තා වූ අවශේෂ පස් අසූ, චිත්තය ද, දෙපණස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (ස්වරූප උදුරනු, - ආදිලබ්ධ නාම දුකයකි නිප්පදේස දුකයකි).

නියත දුකයයි.

සඋත්තර දුකය

සඋත්තරා ධම්මා - අනුත්තරා ධම්මාති.

සඋත්තරා ධම්මා - තමහට වඩා උත්තරීතර ධර්ම ඇති බැවින් සඋත්තර නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අනුත්තරා ධම්මා - තමහට වඩා උත්තරීතර ධර්මයක් නොමැති බැවින් අනුත්තර නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[54]

සඋත්තරා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක් අසූව ද, තත් සම්පයුක්ත චෛතසික දෙපණස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප උදුරනු).

---

54. **සඋත්තරා** - (උත්තරන්තී'ති = උත්තරා; සම උත්තරෙහි'ති=සඋත්තරා). ස්වකීය ධර්මයන්ගෙන් අන්‍ය වූ ලෞකික ධර්මයන් ඉක්මවා යෑමට සමත් වූ ලෝකෝත්තර ධර්මයන් "උත්තර" නම් වේ. උත්තර ධර්මයන් සමඟ පවතින්නා වූ ලෞකික ධර්මයන් " සඋත්තර" නම් වේ.

අනුත්තරා - (නත්ථි උත්තරා තෙසන්'ති = අනුත්තරා). ස්වකීය ධර්මයන් ඉක්මවා යෑමට සමත් වූ ධර්මයන් නැත්තා වූ ලෝකෝත්තර ධර්මයන් "අනුත්තර" නම් වේ.

අනුත්තරා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝකෝත්තර සිත් අට දෙනා ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

(ස්වරූප උදුරනු - ආදිලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි).

සඋත්තර දුකයයි

සරණ දුකය

සරණා ධම්මා - අරණා ධම්මාති.

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ, සඋත්තර දුකය දේශනා කොට වදරා ඉන් අනතුරුව සරණ දුකය දේශනා කොට වදළ සේක. එය ද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **සරණා ධම්මා** - යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **අරණා ධම්මා** - යනුවෙනි.

සරණා ධම්මා - සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාසයන් ගෙන දෙන්නා වූ කෙලෙසුන් සමඟ මිශ්‍ර වූ බැවින් සරණ නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අරණා ධම්මා - සෝක පරිදේවාදියට හේතු වන කෙලෙසුන් සමඟ මිශ්‍ර නො වූ බැවින් අරණ නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[55]

---

55. **සරණා** - (රණන්ති එතෙහී'ති = රණා; සහ රණෙහි යෙ වත්තන්තී'ති = සරණා). සෝක පරිදේවාදිය ඇති කරවන බැවින් රාග, ද්වේෂ, මෝහයන් "රණ" නම් වෙති. සෝක පරිදේවාදිය ඇති කිරීම හේතුවෙන් රාග, ද්වේෂාදී කෙළෙස් ධර්මයන් සමඟ පවතින්නා වූ අකුසල ධර්මයෝ "සරණ" නම් වේ.

සරණා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, අකුසල් සිත් දොළස ද තත් සම්ප්‍රයුක්ත චෛතසික සත් විස්ස ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සත්විසි චෛතසිකයන් අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේය, සඤ්ඤව සංඥස්කන්ධය නම් වන්නේය, ඉතිරි පස්විසි චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේය, මෙසේ ස්කන්ධ වශයෙන් සතර වැදෑරුම් වන්නාහ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් දොළස මනායතනය නම් වන්නේය. චෛතසික සත්විස්ස ධම්මායතනය නම් වන්නේය, මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්. අකුසල් සිත් දොළස මනෝවිඤ්ඤණ ධාතුව නම් වන්නේය. චෛතසික සත්විස්ස ධම්මධාතුව නම් වන්නේය, මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නා හු කෙසේ ද යත්, අකුසල් සිත් දොළස ද, ලෝභය වර්ජිත සවිසි චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේය, ලෝභය සමුදය සත්‍යය නම් වන්නේය, මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

අරණා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, දොළොස් අකුසල් සිත් වර්ජිත සෙසු සත් සැත්තෑ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ

අරණා - (නත්ථි රණා එතෙසන්'ති = අරණා). සෝක පරිදේවාදියේ හේතුව වන්නා වූ රාගාදී කෙළෙස් නැත්තා වූ කුසලාදී ධර්මයන් "අරණා" නම් වේ.

පටුන වෙත

වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි, ධාතු වශයෙන් අටළොසකි, ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය රූපස්කන්ධය නම් වන්නේය, අටතිස් චෛතසික අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේය, සඤ්ඤව සංඥස්කන්ධය නම් වන්නේය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්තයි.

ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂුප්‍රසාදය චක්‍රායතනය නම් වන්නේය, ස්‍රෝත්‍රප්‍රසාදය ශ්‍රෝතායතනය නම් වන්නේය, ඝ්‍රාණප්‍රසාදය ඝ්‍රාණායතනය නම් වන්නේය, ජිහ්වාප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේය, කායප්‍රසාදය කායායතනය නම් වන්නේය.

වර්ණ රූපය රූපායතනය නම් වන්නේය, ශබ්ද රූපය සද්දයතනය නම් වන්නේය, ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේය, රස රූපය රසායතනය නම් වන්නේය, පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේය, සත් සැත්තෑ චිත්තය මනායතනය නම් වන්නේය.

අටතිස් චෛතසිකය ද, ආපෝ ධාතු, ඉත්ථීන්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූප, ජීවිතරූප, ආහාරරූප, ආකාශරූප, කායවිඤ්ඤත්තිරූප, වචිවිඤ්ඤත්තිරූප, ලහුතාරූප, මුදුතාරූප, කම්මඤ්ඤතා රූප, උපචයරූප, සන්තතිරූප, ජරතාරූප, අනිච්චතා රූප, යන සුඛුමරූප සොළස ද, නිර්වාණ ධාතුව ද ධම්මායතනය නම් වන්නේය, මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන්, චක්ෂුප්‍රසාදය චක්ඛුධාතුව නම් වන්නේය, ස්‍රෝත්‍රප්‍රසාදය ශ්‍රෝතධාතුව නම් වන්නේය, ඝ්‍රාණ ප්‍රසාදය ඝ්‍රානධාතුව නම් වන්නේය, ජිහ්වාප්‍රසාදය ජිව්හාධාතුව නම් වන්නේය, කායප්‍රසාදය කායධාතුව නම් වන්නේය.

වර්ණ රූපය රූපධාතුව නම් වන්නේය, ශබ්ද රූපය සද්දධාතුව නම් වන්නේය, ගන්ධ රූපය ගන්ධධාතුව නම් වන්නේය, රස රූපය

රසධාතුව නම් වන්නේය, පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බධාතුව නම් වන්නේය.

චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේය, සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේය, ඝානවිඤ්ඤාණ යුගලය ඝානවිඤ්ඤාණ ධාතුව නම් වන්නේය, ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේය, කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේය, පඤ්චද්වාරාවර්ජන චිත්තය සහ සම්පටිච්ඡන යුගලය මනෝධාතුව නම් වන්නේය, ඉතිරි සූසැට චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේය.

චෛතසික අටතිස ද, ආපෝ ධාතු, ඉත්ථීන්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදයරූප, ජීවිතරූප, ආහාරරූප, ආකාශරූප, කායවිඤ්ඤත්තිරූප, වචිවිඤ්ඤත්තිරූප, ලහුතාරූප, මුදුතාරූප, කම්මඤ්ඤතා රූප, උපචයරූප, සන්තතිරූප, ජරතාරූප, අනිච්චතා රූප, යන සුඛුමරූප සොළස ද, නිර්වාණ ධාතුව ද ධම්මධාතුව නම් වන්නේය, මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නාහ.

ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික අරණ සිත් එකුන් සැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද, අටවිසි රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේය, නිර්වාණ ධාතුව නිරෝධ සත්‍යය නම් වන්නේය, සතර මාර්ග සම්ප්‍රයුක්ත සම්මාදිට්ඨි ආදී මාර්ගාංග අට දෙන එක් වර බැගින් ද, සත් දෙන සතර වර බැගින් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේය, ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන් තිස ද, ඵල චිත්තෝත්පාද සත්තිස ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

මේ ශබ්දවලිය හෙවත් සරණ දුකය, පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදළ බැවින් දුක නම් වන්නේය. මුල පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේය, සියලු පරමාර්ථ ධර්ම ඇතුලත් කොට වදළ බැවින් නිප්පදේස දුක නම් වන්නේය.

සරණ දුකයයි

පිට්ඨි දුකය සමාප්ත ය

පටුන වෙත

සප්‍රදේශ නිප්ප්‍රදේශ දුක ගණන - ඉහත ඇති දුක සියය අතරින් හේතු ගොච්ඡකය, ආසව ගොච්ඡකය, සංයෝජන ගොච්ඡකය, ගන්ථ ගොච්ඡකය, ඕඝ ගොච්ඡකය, යෝග ගොච්ඡකය, නීවරණ ගොච්ඡකය, පරාමාස ගොච්ඡකය, උපාදාන ගොච්ඡකය යන ගොච්ඡක නවයෙහි අවසානයේ ඇති දුක තුන බැගින් දුක සත්විස්ස (9×3) ද, කිලෙස ගොච්ඡකයේ අවසානයෙහි ඇති දුක සතර ද, මහන්තර දුකයෙන් චිත්තසම්පයුත්ත,චිත්තසංසට්ඨ වශයෙන් දුක දෙකක් ද වශයෙන් සප්ප්‍රදේශ දුකයන් තෙතිසක් වේ. සෙසු දුක පදයන් සත් සැට (67) නිප්ප්‍රදේශ ත්‍රික වේ

- අභිධර්ම දුක මාතිකා ස්වරූපාර්ථ නිමි -

අභිධර්ම දුක මාතිකා - අභ්‍යාස

1. හේතු ගොච්ඡකය

1. ගොච්ඡකයක් යනු කුමක්ද? විස්තර කරන්න.
2. හෙතුධම්මා යන්නෙහි ඇතුලත් 'හෙතු' පදයේ අදහස කුමක්ද?
3. හේතු වර්ග දක්වා 'හෙතුධම්මා' සඳහා අදහස් වන හේතුව නම් කරන්න.
4. කවර ධර්ම 'සහෙතුක' සහ 'අහෙතුක' නමින් දැක්වෙන්නේ ද?
5. හේතු ද වන හේතු සමඟ සම්ප්‍රයුක්ත ද වන ධර්ම ද, හේතු පමණක් වන හේතු සමඟ සම්ප්‍රයුක්ත ද වන ධර්ම දක්වන්න.
6. න හෙතුධම්මා යන පදයේ ස්වරූපාර්ථ සත්‍ය වශයෙන් දක්වා මාර්ග චිත්තෝත්පාදයන් 27, ඵල චිත්තෝත්පාදයන් 34 ලැබෙන ආකාරය විස්තර කරන්න.
7. සහේතුක දුකය සමඟ අර්ථ සහ ස්වරූපාර්ථ වෙනස්ක නොමැති වුවද හේතුසම්පයුත්ත දුකය දේශනා කරන ලද්දේ කවර හේතුවක් නිසාද?
8. හේතු සය සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත වන ආකාරය විස්තර කරන්න.
9. කවර දුක වර්ගයක් "සම්භව දුක, අතිරේක දුක" යැයි කියනු ලබන්නේද?

පටුන වෙත

10. ගොච්ඡකයන්හි පැමිණි මිශ්‍රක දුකයන්හි කවර ධර්මයන් විශේෂයක් දුකමුක්ත යැයි දැක්වීමට සුදුසු වේද? විස්තර කරන්න.

2. චූළන්තර දුකය

11. චූළන්තර දුකය සඳහා එම නම ලැබෙනුයේ කවර හේතුවක් නිසා ද?

12. ගොච්ඡක සහ දුකයන්ගේ වෙනස දක්වන්න.

13. 'සප්පච්චයා' යන්නෙහි 'පච්චය' සඳහා කවර ප්‍රත්‍යය ධර්ම ගත යුතු ද? ටීකාචාර්යයන් වහන්සේගේ අදහස ද දක්වන්න.

14. අප්පච්චයා, අසඞ්ඛතා යන පද සඳහා නිර්වාණය නම් එක ම ධර්මය ලැබෙන්නේ නමුදු කවර හේතුවක් නිසා බහුවචනයෙන් දේශනා කළ සේක් ද?

15. 'රූපිනොධම්මා' පදයෙහි 'රූපිනො' සඳහා ස්වරූපාර්ථ දක්වන්න.

16. ලොකියාධම්මා පදයෙහි කවර ධර්මයන් ලෝක නම් වේ ද?

17. භඞ්ගක්ෂණයේදී නිරුද්ධ වන්නා වූ ලෝකෝත්තර චිත්ත චෛතසිකයන් කවර හේතුවක් නිසා 'ලෝක' යැයි නොකියනු ලැබේ ද?

18. ලෝකිය, ලෝකුත්තර යන පදයන් විග්‍රහ කරන්න.

19. කෙනචි විඤ්ඤෙය්‍යා ධම්මා පදයෙහි කෙනචි සඳහා කවර ධර්මයන් ලැබිය යුතුදැයි විස්තර කරන්න.

3. ආසව ගොච්ඡකය

20. ලෝභ, දිට්ඨි, මෝහයන් සඳහා 'ආසව' යන නම භාවිතා කරන්නේ ඇයි?

21. සාසව. අනාසව යන පද විග්‍රහ කරන්න.

22. හේතු ගොච්ඡකයේ අවසාන දුකය මෙන් දේශනා නොකොට ආසව ගොච්ඡකයේ අවසාන දුකය ආසවවිප්පයුත්තා ඛො පන ධම්මා ආදී වශයෙන් දේශනා කරන ලද්දේ ඇයි?

23. හේතු ගොච්ඡකයෙහි අවසාන දුකයේදී හේතුවිප්පයුත්ත පදය විශේෂණ නොකරමින් නහෙතු පදය ම විශේෂණ කරමින් දේශනා කරන ලද්දේ ඇයි?

24. ආශ්‍රව නම් වූ ද ආශ්‍රව සමඟ සම්ප්‍රයුක්ත වූ ද, ආශ්‍රව නම් වූ ද ආශ්‍රව සමඟ විප්‍රයුක්ත වූ ද ධර්ම දක්වන්න.

25. ආශ්‍රව ධර්ම සතර සම්ප්‍රයුක්ත සහ විප්‍රයුක්ත වන ආකාරය විස්තර කරන්න.

4. සඤ්ඤෝජන ගොච්ඡකය

26. කවර ධර්ම සංයෝජන ධර්ම වේ ද?

27. සංයෝජන ධර්ම ප්‍රහාණය නොකරන ලද පුද්ගලයා ත්‍රිවිධ වෘත්තයන්හි යොදවන්නේ කෙසේද?

28. සංයොජනිය, අසංයොජනිය යන පදයන් අර්ථ දක්වන්න.

29. සංයෝජන ද වන සංයෝජනයන් සමඟ සම්ප්‍රයුක්ත ද වන ධර්ම ද, සංයෝජන වන සංයෝජනයන් සමඟ විප්‍රයුක්ත වන ධර්ම ද දක්වන්න.

30. සංයෝජන ධර්ම සමඟ සම්ප්‍රයුක්ත සහ විප්‍රයුක්ත වන ධර්මයන් දක්වා එම සංයෝජන ධර්ම එකිනෙකා සමඟ සම්ප්‍රයුක්ත සහ විප්‍රයුක්ත වන ආකාරය ද පැහැදිලි කරන්න.

5. ගන්ථ ආදී ගොච්ඡකයන්

31. ගන්ථා, ගන්ථනියා යන පදයන් අර්ථ දක්වන්න.

32. ග්‍රන්ථ ද වන ග්‍රන්ථ සමඟ සම්ප්‍රයුක්ත ද වන ධර්ම ද, ග්‍රන්ථ ද වන ග්‍රන්ථ සමඟ විප්‍රයුක්ත ද වන ධර්ම ද දක්වන්න.

33. ග්‍රන්ථ සමඟ සම්ප්‍රයුක්ත සහ විප්‍රයුක්ත වන ධර්ම දක්වා ග්‍රන්ථ ධර්ම එකිනෙකා සමඟ සම්ප්‍රයුක්ත සහ විප්‍රයුක්ත වන ආකාරය ද පැහැදිලි කරන්න.

34. ඕඝ සහ ඕඝනියා පදයන් අර්ථ දක්වන්න.

35. යොග සහ යොගනියා පදයන් අර්ථ දක්වන්න.

36. නීවරණා සහ නීවරණීයා පදයන් අර්ථ දක්වන්න.

37. නීවරණ ද වන නීවරණ හා සමඟ සම්ප්‍රයුක්ත ද වන ධර්ම පැවතීමට හෝ නොපැවතීමට හේතු දක්වන්න.

38. පරාමාසා සහ පරාමට්ඨා යන පද අර්ථ දක්වන්න.

39. පරාමාස ද වන පරාමාස සමඟ සම්ප්‍රයුක්ත ද වන ධර්ම සහ පරාමාස ද වන පරාමාස සමඟ විප්‍රයුක්ත ධර්ම ද පැවතීමට හෝ නොපැවතීමට හේතු දක්වන්න.

40. පරාමාස පරාමාස සම්ප්‍රයුක්ත දුකය දේශනා නොකිරීමට හේතු දක්වන්න.

41. පරාමාස හා සමඟ සම්ප්‍රයුක්ත සහ විප්‍රයුක්ත ධර්ම දක්වා පරාමාස ධර්මයන්ගේ අරමුණ පමණක් වී පරාමාස හා සමඟ විප්‍රයක්ත ධර්ම ද දක්වන්න.

6. මහන්තර දුක

42. මහන්තර දුකයන් 14 පිළිවෙළින් දක්වා චෙතසිකා ධම්මා පදයේ ස්වරූපාර්ථ ස්කන්ධ, ආයතන, ධාතු, සත්‍ය වශයෙන් දක්වන්න.

43. සාරම්මණ, චිත්ත සංසට්ඨ යන පදයන් අර්ථ දක්වන්න.

44. චිත්තජරූපයන් සිත සමඟ උපදින්නේ නමුදු කවර හේතුවක් නිසා "චිත්තසංසට්ඨ" යැයි නොකියනු ලබන්නේ ද?

45. අජ්ඣත්ත වර්ග සතර දක්වා අජ්ඣත්තිකා ධම්මා යන්නෙන් අදහස් වනුයේ කවර අජ්ඣත්තිකය ද යැයි දක්වන්න.

46. අජ්ඣත්තා ධම්මා, අජ්ඣත්තිකා ධම්මා, බහිද්ධා ධම්මා, බාහිරා ධම්ම යන පදයන්ගේ ස්වරූපාර්ථ දක්වන්න.

47. නිශ්‍රය වීම හේතුවෙන් "උපාදා" යැයි කීමට ලැබුණත් එකිනෙකාට නිශ්‍රය වන්නා වූ මහාභූත කවර හේතුවක් නිසා "උපාදා" යැයි කීමට නොලැබෙන්නේ ද?

48. උපාදා ධම්මා, නො උපාදා ධම්මා, උපාදින්නා ධම්මා, අනුපාදින්නා ධම්මා, අනුපාදින්නා ධම්මා යන පදයන්ගේ ස්වරූපාර්ථ වෙන වෙන ම දක්වන්න.

පටුන වෙත

49. කවර හේතුවක් නිසා "මහන්තරදුක" යැයි කියනු ලැබේ ද?

7. උපාදාන ආදී ගොච්ඡක

50. උපාදාන, උපාදානිය පදයන් අර්ථ දක්වන්න.

51. නො උපාදා ධම්මා සහ නො උපාදානා ධම්මා යන පදයන්ගේ ස්වරූපාර්ථ දක්වන්න.

52. උපාදන ද වන උපාදනයන් සමග සම්ප්‍රයුක්ත ද වන ධර්ම සහ උපාදාන ද වන උපාදාන සමඟ විප්‍රයුක්ත ද වන ධර්ම දක්වන්න.

53. උපාදාන ධර්මයන් එකිනෙකා සමඟ සම්ප්‍රයුක්ත සහ විප්‍රයුක්ත වන ආකාරය දක්වන්න.

54. කිලෙසා යන පදය අර්ථ දක්වන්න.

55. කිලෙස ද වන කිලෙස සමඟ විප්‍රයුක්ත ද වන ධර්ම නොමැති වීමට හේතු දක්වන්න.

56. සංකිලෙසික ද වන සංකිලිට්ඨ නොවන ධර්ම, සංකිලිට්ඨ ද වන සංකිලෙසික නොවන ධර්ම ද, සංකිලෙසික ද වන අසංකිලිට්ඨ ද වන ධර්ම, සංකිලෙසික ද අසංකිලිට්ඨ ද නොවන ධර්ම වෙන වෙන ම දක්වන්න.

57. පිට්ඨිදුකයේ පැමිණෙන දුකයන් දහඅට පිළිවෙළින් ලියා දක්වා දස්සනෙන පහාතබ්බා ධම්මා, භාවනාය පහාතබ්බා ධම්මා පදයන්ගේ ස්වරූපාර්ථ ලියා දක්වන්න.

58. න දස්සනෙන පහාතබ්බා පදයේ ස්වරූපාර්ථ දක්වන්න.

59. පහළ මාර්ගත්‍රය මඟින් ප්‍රහාණය නොකරන ධර්මයන් දක්වන්න.

60. න සුඛසහගතා ධම්මා පදයේ ස්වරූපාර්ථ දක්වා ස්කන්ධ, ආයතන, ධාතු, සත්‍ය ගණන දක්වන්න.

61. නියත දුකයේ ප්‍රථම පදය සහ දෙවෙනි පදයේ ස්වරූපාර්ථ වෙන වෙන ම දක්වන්න.

62. සඋත්තරා ධම්මා යන්නෙහි උත්තර, සඋත්තර නම් වූ ධර්මයන් දක්වන්න.

63. සරණා ධම්මා යන්නෙහි 'රණ' නම් ධර්මයන්, 'සරණ' නම් ධර්මයන් වෙන් වෙන් වශයෙන් දක්වන්න.

පටුන වෙත

64. කවර හේතුවක් නිසා පිට්ඨිදුකය යැයි කියනු ලබන්නේ ද?

65. දුක මාතෘකාවන්හි ඇති සප්‍රදේශ දුක, නිප්‍රදේශ දුක දක්වන්න.

පටුන වෙත

සූත්‍රාන්තික දුක මාතිකා ස්වරූපාර්ථ

01. විජ්ජාභාගි දුකය

විජ්ජාභාගිනො ධම්මා - අවිජ්ජාභාගිනො ධම්මාති.

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට වදරණ ලද්ද වූ ශ්‍රී සද්ධර්මය වනාහි, ධර්ම විනය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. විනය - සූත්‍රාන්ත - අභිධර්ම යන පිටක වශයෙන් තෙවැදෑරුම් වන්නේය. දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුක්ත නිකාය, අංගුත්තර නිකාය, ඛුද්දක නිකාය යන නිකාය වශයෙන් පස් වැදෑරුම් වන්නේය. සූත්‍ර, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධර්ම, වේදල්ල යන අංග වශයෙන් නව වැදෑරුම් වන්නේය. ධර්මස්කන්ධ වශයෙන් වනාහි, සූවාසූ දහසක් වන්නේය.

අභිධර්මය හදරන්නා වූ ශ්‍රාවකයන් හට සූත්‍රාන්ත පිටකය පිළිබඳ නොපැකිල අවබෝධය පහසු වනු පිණිස වනාහි ධර්මසේනාධිපති අග්‍රශ්‍රාවක ශාරිපුත්‍ර මහ රහතන් වහන්සේ විසින් බුද්ධ භාෂිත වූ දීඝනිකායෙහි සංගීති - දසුත්තර සූත්‍රයන්ගෙන් ද අංගුත්තර නිකායෙහි ඒකක නිපාත දුක නිපාතයන්ගෙන් ද ගෙන හැර දක්වන ලද්ද වූ සූත්‍රාන්ත මාතෘකාව විජ්ජාභාගි දුකය ආදි කොට දෙසාළිස් වැදෑරුම් වන්නේය.[56]

ඒ සූත්‍රාන්ත මාතෘකාව ද ධම්මසංගණී ආදී අභිධර්ම සප්තප්‍රකරණය අතුරෙන් ධම්මසංගණී ප්‍රකරණයෙහි නික්ඛෙප කාණ්ඩයෙහි ම වදරණ ලද බැවින් අභිධම්ම මාතිකා නම් වන්නාහ.

සූත්‍රාන්ත මාතෘකාවන් වනාහි, බුද්ධ භාෂිත වූ ම දීඝනිකාය අංගුත්තර නිකායන්ගෙන් මතු කොට ධම්සෙනවි සැරියුත් මහරහතන්

---

56. එකුත්තරියං පන එකනිපාතදුකනිපාතං සඞ්ගීතිදසුත්තර සුත්තන්තෙහි සමොධානෙත්වා ආභිධම්මිකත්ථෙරානං සුත්තන්තං පත්වා අකිලමනත්ථං ඨපිතා - අත්ථසාලිනී ද්වාරකථා

වහන්සේ විසින් ආභිධාර්මිකයන්ගේ පහසුව පිණිස සංග්‍රහ කොට වදළ බැවින් සූත්‍රාන්ත මාතිකා නම් වන්නාහ. ඔවුනතුරෙන් විප්ජාභාගී දුකය පළමු කොට වදළහ.

ඒ විප්ජාභාගී දුකය ද, ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **විප්ජාභාගිනො ධම්මා** - යනුවෙනි, ඉන් අනතුරුව ද්විතීය පදය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **අවිප්ජාභාගිනො ධම්මා** - යනුවෙනි.

විප්ජාභාගිනො ධම්මා - සම්ප්‍රයුක්ත වශයෙන් අෂ්ඨ විද්‍යාවන් භජනය කරන බැවින් විප්ජාභාගී නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අවිප්ජාභාගිනො ධම්මා - සම්ප්‍රයුක්ත වශයෙන් චතුරාර්ය සත්‍යය මුවහ කරන ලක්ෂණ මෝහය භජනය කරන්නාවූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[57]

---

57. **විප්ජාභාගිනො ධම්මා** - (භජතී'ති = භාගිනො; විප්ජං භාගිනො = විප්ජාභාගිනො) සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ වශයෙන් අෂ්ට විද්‍යාවන් භජනය කරන සම්ප්‍රයුක්ත ධර්ම "විප්ජාභාගී" නම් වේ. මෙම නය ක්‍රමයට අනුව ස්වරූපාර්ථ ලෙස ගනුයේ සම්ප්‍රයුක්ත ධර්ම ය. අෂ්ට විද්‍යා නොගනු ලැබේ.

දෙවන ක්‍රමය - (භජතී'ති භාගො = විප්ජාභාගො; විප්ජාභාගෙ වත්තන්තී'ති = විප්ජාභාගිනො) අෂ්ට විද්‍යා කොට්ඨාශයට ඇතුලත් වන්නා වූ අෂ්ටවිද්‍යා ඥාන ම "විප්ජාභාගී" නම් වේ. මෙම ක්‍රමයට අනුව අෂ්ට විද්‍යා බෙදා එකක් බැගින් බෙදා දැක්වූ විට කොටස් අටක් ලැබේ. ඒවා අතරින් එක් එක් ධර්මයක් "විප්ජා(විද්‍යා)" නම් වේ. සෙසු සත "විප්ජාභාගිනො" නම් වේ. ඒ නිසා විප්ජාභාගී පදයේ ස්වරූපාර්ථ සඳහා අෂ්ට විද්‍යා ලැබේ. මෙම ක්‍රමයට අනුව "විප්ජාභාගිනො - විද්‍යා කොටසට අයත්" යැයි අර්ථ දැක්විය යුතු වේ.

විප්ජං භජතීති යන ප්‍රථම අර්ථයට අනුව "අෂ්ට විද්‍යාවන් භජනය කරන සම්ප්‍රයුක්ත ධර්ම" පමණක් ස්වරූපාර්ථ ලෙස ලැබේ. විද්‍යාවන්

නොලැබේ. දෙවන අර්ථයට අනුව අෂ්ට විද්‍යා අතරින් එක් එක් ධර්මයක් "විජ්ජා" නම් වේ. සෙසු ධර්ම "විජ්ජාභාගී" නම් වේ. එම නිසා මෙම ක්‍රමයන් දෙක සම්පිණ්ඩනය කළ කල්හි ස්වරූපාර්ථ සඳහා "අෂ්ට විද්‍යා ද ලැබේ, අෂ්ට විද්‍යා සමඟ සම්ප්‍රයුක්ත ධර්මයන් ද ලැබේ" යැයි දත යුතු බැවින් අත්ථුද්ධාරයක් දැක්වීය. (අත්ථුද්ධාර වශයෙන් දැක්වීම නම් යම් පදයක් සම්බන්ධයෙන් ලැබිය හැකි සියලු අර්ථයන් උද්ධරණය කරමින් පෙන්වීමයි)

මෙම දුක පදයේ ස්වරූපාර්ථ සඳහා අෂ්ට විද්‍යා නොගත යුතු ය, සම්ප්‍රයුක්ත ධර්ම පමණක් ගත යුතු ය යන්න දැක්වීම සඳහා "ඉධ පන සම්පයුත්තධම්මාව අධිපෙත්තා-මෙහි සම්ප්‍රයුක්ත ධර්ම ම අදහස් වේ" යැය අත්ථුද්දෙස වාක්‍යය දැක්වූහ. (අත්ථුද්දෙස නම් අත්ථුද්ධාරයේ පැමිණෙන අර්ථ වලින් එම ස්ථානයේ අදහස් වන අර්ථය කවරක්දැයි ප්‍රකාශ කිරීමයි) නික්ෂේප කාණ්ඩ පාලියෙහි "කතමෙ ධම්මා විජ්ජාභාගිනො? විජ්ජාය සම්පයුත්තා ධම්මා, ඉමෙ ධම්මා විජ්ජාභාගිනො - විද්‍යාභාගීධර්මයෝ කවරහ යත් - අෂ්ටවිද්‍යායෙන් සම්ප්‍රයුක්ත වූ ධර්මයෝ යැ. මොහු විද්‍යභාගීධර්මයෝ ය" යැයි වදාළහ.

අෂ්ට විද්‍යාවන් -

1. **විදර්ශනාඥානය** - (විසෙසෙන පස්සතීති = විපස්සනා) විශේෂ වන්නා වූ අනිත්‍යාදී වශයෙන් බලන්නා වූ මහාකුසල, මහාක්‍රියා ඥාන සම්ප්‍රයුක්ත සිත්වල ඇති ඥානය "විදර්ශනාඥානය" නම් වේ.

2. **මනෝමයඍඩිඥානය** - (මනසා නිබ්බත්තා = මනොමයා; මනොමයාච සා ඉද්ධිචාති = මනොමයිද්ධි) සිතෙන් උපදනා ඍඩිය "මනෝමයඍඩි" නම් වේ. තමන්ගේ කය තුළ තමා හා සමාන වූ සර්වාංග කොපුවක බහා තිබූ දෙයක් පිටතට ගන්නාක් මෙන් එය තමන්ගේ කයින් පිටතට ගැනීම "මනෝමයඍඩි" වේ. මෙය ඍඩිවිධ අභිඥාවේ කොටසකි. එම නිසා මනෝමයඍඩිය

සඳහා ස්වරූපාර්ථ ලෙස අභිඥාවෙහි ඇති ඥානය උද්ධරණය කළ යුතු වේ.

3. **ඍද්ධිවිධඥානය** - (ඉජ්ඣතී = ඉද්ධි; ඉද්ධිවිධො යස්සාති = ඉද්ධිවිධං) අෂ්ට සමාපත්තීන් වශීභාවයට පමුණුවා ගත් යෝගාවචරයා හට සිදු කළ හැකි බොහේ රූප නිර්මාණය කොට තමාට ම බොහෝ දෙනකුන් සේ පෙනී සිටීම, බොහෝ දෙනකුන් වී සිට එකකු වීම, ප්‍රාකාර භිත්ති වලින් ගමන් කිරීම ආදි ඍඩි " ඍඩිවිධඥානය" නම් වේ.

4. **පරචිත්තවිජානන ඥානය** - (පරෙසං චිත්තං විජානාතීති = පරචිත්තවිජානනා) අන්‍යන්ගේ සිත් දැනගන්නා වූ අභිඥාව " පරචිත්තවිජානන" නම් වේ. චෙතොපරිය අභිඥාව යැයි ද කියනු ලැබේ.

5. **පූර්වේනිවාසානුස්මෘතිඥාව** - (නිවාසීයිංසූති = නිවාසා; පුබ්බෙනිවාස = පුබ්බෙනිවාසා; පුබ්බෙනිවාසානුස්සති) පෙර විසූ ස්කන්ධයන්, ඒ ස්කන්ධයන්ගේ පිළිවෙළ දකින්නා වූ සතිය සමඟ සම්ප්‍රයුක්ත වූ ඥානය "පූර්වේනවාසානුස්මෘතිඅභිඥාව" නම් වේ.

6. **දිව්‍යංචක්ෂුරභිඥානය** - (දිවං භවං = දිබ්බං; දිබ්බඤ්ච තං චක්ඛුඤ්චාති = දිබ්බචක්ඛු; දිබ්බචක්ඛුවියාති = දිබ්බචක්ඛු) දෙවියන්ගේ චක්ෂුව මෙන් දුරින් ඇති වස්තූන්, කුඩා වස්තූන් දැකීමට හැකි අභිඥාව "දිව්‍යංචක්ෂුරභිඥා" නම් වේ. චුති සහ ප්‍රතිසන්ධි අවස්ථාවලට ආසන්නයේ සිටින සත්ත්වයන් දැකිය හැකි බැවින් "චුතුපපාතඥානය" යැයි ද කියනු ලැබේ.

7. **දිව්‍යශ්‍රෝත්‍ර ඥානය** - දෙවියන්ගේ සෝත ප්‍රසාදය මෙන් දුරින් ඇති ශබ්දයන්, සියුම් ශබ්දයන් වුවද ඇසීමට හැකි අභිඥාව "දිබ්බසෝත" නම් වේ.

8. **ආශ්‍රවක්ෂයකර ඥානය** - (ඛීයන්ති එත්ථාති = ඛයං; ආසවානං ඛයං = ආසවක්ඛයං) ආශ්‍රව ධර්මයන් ක්ෂය කරන්නා වූ අර්හත් මාර්ගයේ ඇති ඥානය "ආශ්‍රවක්ෂයකර ඥානය" නම් වේ.

විජ්ජාභාගිනෝ ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, විදර්ශනා ඤාණ වශයෙන් ලැබෙන්නාවූ, ඤාණ සම්ප්‍රයුක්ත මහා කුශල සිත් සතර ද, ඤාණ සම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත් සතර ද, තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය අමෝහ වර්ජිත චෛතසික දෙතිස ද, මනෝමයඍද්ධි ඤාණය - ඍද්ධිවිධ ඤාණය - දිව්‍යශ්‍රෝත ඤාණය - පරචිත්තවිජානන ඤාණය - පූර්වේනිවාසානුස්මෘති ඤාණය සහ දිව්‍යංචක්ෂුර්අභිඥා ඤාණය සම්ප්‍රයුක්ත වූ, කුශලාභිඥ ක්‍රියාභිඥ දෙසිත ද, තත් සම්ප්‍රයුක්ත විතර්ක විචාර ප්‍රීති විරති අප්‍රමාණ්‍ය අමෝහ වර්ජිත චෛතසික එකුන් තිස ද, අර්හත් මාර්ග චිත්තයද, තත් සම්ප්‍රයුක්ත අමෝහ වර්ජිත චෛතසික පන්තිස ද, ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

අවිජ්ජාභාගිනො ධම්මා - (අවිජ්ජං භජතී'ති = අවිජ්ජාභාගිනො) සම්ප්‍රයක්ත ධර්මයන් වශයෙන් අවිද්‍යාව (මෝහය) භජනය කරන්නා වූ සම්ප්‍රයුක්ත ධර්මයන් "අවිජ්ජාභාගී" නම් වේ.

දෙවන - (අවිජ්ජාය භාගො = අවිජ්ජාභාගො; අවිජ්ජාභාගෙ වත්තන්තී'ති = අවිජ්ජාභාගො) අවිද්‍යා කොටසට ම අයිති වන්නා වූ අවිද්‍යාව ම "අවිජ්ජාභාගී" නම් වේ.

දුක්ඛ සත්‍යය මුවහ කරන්නා වූ මෝහය, සමුදය සත්‍යය මුවහ කරන්නා වූ මෝහය, නිරෝධ සත්‍යය මුවහ කරන්නා වූ මෝහය, මාර්ග සත්‍යය මුවහ කරන්නා වූ මෝහය වශයෙන් අවිද්‍යාවන් සතරක් ඇත. ඒ ධර්මයන් එක් එක් වශයෙන් බෙදා දැක්වූ විට කොටස් සතරක් ලැබේ. ඒ එක් එක් කොටස "අවිජ්ජා" නම් වේ. සෙසු තුන "අවිජ්ජාභාගී" නම් වේ. එම නිසා මෙම ක්‍රමයට අනුව අවිජ්ජාභාගී පදයේ ස්වරූපාර්ථ සඳහා අවිද්‍යා සතර ම ලැබේ. එසේ වුවද ඉහත කී ක්‍රමයට අනුව සම්ප්‍රයුක්ත ධර්මයන් ම පමණක් ස්වරූපාර්ථ ලෙස ගනු ලැබේ.

ස්කන්ධ වශයෙන් සතර වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, පන්තිස් චෛතසික අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේය. සඤ්ඤව සංඥස්කන්ධය නම් වන්නේය, ඉතිරි තෙතිස් චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේය, සිත් එකොළස විඥනස්කන්ධය නම් වන්නේය, මෙසේ ස්කන්ධ වශයෙන් සතර වැදෑරුම් වන්නාහ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේද යත්, විද්‍යාභාගී සිත් එකොළස මනායතනය නම් වන්නේය. චෛතසික පන්තිස ධම්මායතන නම් වන්නේය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේද යත්, විද්‍යාභාගී සිත් එකොළස මනෝවිඤ්ඤණ ධාතුව නම් වන්නේය, චෛතසික පන්තිස ධම්ම ධාතුව නම් වන්නේය, මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, විද්‍යාභාගී ලෞකික සිත් දස දෙනාද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙතිසද, දුක්ඛ සත්‍යය නම් වන්නේය, අර්හත් මාර්ග චිත්තය සමග සම්ප්‍රයුක්ත වූ සම්මා දිට්ඨි වර්ජිත මාර්ගාංග සත් දෙන මාර්ග සත්‍ය නම් වන්නේය. අවශේෂ මාර්ග චිත්තෝත්පාද අටවිසි දෙන සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ, මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

අවිජ්ජාභාගිනො ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, අකුසල් සිත් දොළසද, තත් සම්ප්‍රයුක්ත මෝහය වර්ජිත චෛතසික සවිස්ස ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි, ආයතන වශයෙන් දෙකකි, ධාතු වශයෙන් දෙකකි, ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

ස්කන්ධ වශයෙන් සතර වැදෑරුම් වන්නාහු කෙසේද යත්, සවිසි චෛතසික අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේය. සංඥව සංඥස්කන්ධය නම් වන්නේය, ඉතිරි සූවිසි චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේය. දොළොස් අකුශල චිත්තය

විඥානස්කන්ධය නම් වන්නේය, මෙසේ ස්කන්ධ වශයෙන් සතර වැදෑරුම් වන්නාහ.

ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේද යත්, අකුසල් සිත් දොළස මනායතනය නම් වන්නේය, චෛතසික සවිස්ස ධම්මායතනය නම් වන්නේය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේද යත්, අකුශල් සිත් දොළස මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේය, චෛතසික සවිස්ස ධම්ම ධාතුව නම් වන්නේය, මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේද යත්, අකුසල් සිත් දොළසද, තත් සම්ප්‍රයුක්ත ලෝභ මෝහ වර්ජිත චෛතසික පස් විස්ස ද දුක්ඛ සත්‍යය නම් වන්නේය, ලෝභය සමුදය සත්‍යය නම් වන්නේය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

මේ විජ්ජාභාගී දුකය වනාහි, පරමාර්ථ ධර්මයන් දෙපදයකින් වදළ බැවින් දුක නම් වේ. මුල පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වේ. දොළොස් අකුශල චිත්තය ද, අර්හත් මාර්ග චිත්තය ද, අෂ්ඨ විද්‍යාවන් භජනය කෙරෙන් අවස්ථාවෙහි වූ ඤාණ සම්ප්‍රයුක්ත මහා කුශල මහා ක්‍රියා සිත් අට දෙන හා අභිඥ දෙසිතද, වර්ජිත අවශේෂ සසැත්තෑ චිත්තයද, තත් සම්ප්‍රයුක්ත අටසිත් චෛතසිකය ද, මෝහ චෛතසික දොළසද, අටවිසි රූපය ද, නිර්වාණය ද, මේ දුකයෙහි ඇතුලත් නොවූ බැවින් සප්පදේස දුක නම් වන්නේය.

විජ්ජාභාගී දුකයයි.

02. විජ්ජූපම දුකය

විජ්ජූපමා ධම්මා - වජිරූපමා ධම්මාති.

විජ්ජූපමා ධම්මා - විදුලියකට බඳු උපමා ඇත්තා වූ විජ්ජූපම නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

වජිරූපමා ධම්මා - වජ්‍රයකට හෙවත් හෙන පහරකට සමාන උපමා ඇත්තා වූ වජිරූපම නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[58]

---

58. **විජ්ජූපමා ධම්මා** - (විජ්ජු උපමා එතෙසන්'ති = විජ්ජූපමා) නැවත මැඩ පැවැත්විය නොහැකි ආකාරයෙන් කෙලෙස් අඳුර නැසීමට අසමත් බැවින් විදුලියට උපමා ඇත්තා වූ සෝවාන් මාර්ගාදිය "විජ්ජූපම" නම් වෙති.

වජිරූපමා ධම්මා - (වජිරං උපමා එතෙසන්'ති = වජිරූපමා) කෙලෙස් අන්ධකාරය නිරවශේෂව නැසීමට සමත් වජ්‍රයකට උපමා ඇත්තා වූ අර්හත් මාර්ගඥානය "වජිරූපමා" නම් වේ.

විදුලියකට උපමා ඇති යට මාර්ගඥාන ත්‍රය සහ වජ්‍රයකට උපමා ඇති අර්හත් මාර්ගඥානය (අත්ථසාලිනියෙන්) - ඇස් ඇති පුරුෂයෙක් මේඝන්ධකාරය ඇති රාත්‍රියක් මාර්ගයකට පැමිණියේය. ඔහුට අන්ධකාරය නිසා මාර්ගය ප්‍රකට නොවීය. විදුලි කෙටීමක් නිසා අඳුර දුරු වීය. අඳුර නැතිවීමෙන් මාර්ගය ප්‍රකට වීය. ඔහු දෙවන වතාවට ද ගමන ඇරඹුවේය. දෙවන වරට අඳුර ඇති වීය. මාර්ගය ප්‍රකට නොවීය. විදුලියක් කොටා ඒ අඳුර ද දුරු කළේය. අඳුර නැති වූ කල්හි මාර්ගය ප්‍රකට වීය. තෙවන වතාවට ද ඔහු ගමන ඇරඹුවේය. අඳුර ඇති වීය. මාර්ගය ප්‍රකට නොවීය. විදුලියක් කොටා අඳුර නැවතත් දුරු කළේය.

මේ උපමාවේ ඇස් ඇති පුරුෂයා අන්ධකාරයෙහි මාර්ගයට පිවිසීම ආර්යශ්‍රාවකයාගේ සෝවාන් මාර්ගය පිණිස විදර්ශනා භාවනාව ඇරඹීම මෙනි. අන්ධකාරයෙහි මාර්ගය ප්‍රකට නොවූ අවස්ථාව චතුරාර්ය සත්‍යය මුවහ කරන (මෝහය නැමැති) අන්ධකාරය මෙනි. විදුලි කෙටීමෙන් අන්ධකාරය දුරු වූ අවස්ථාව සෝවාන් මාර්ගය නම් වූ ආලෝකය ඉපිද සත්‍යය මුවහ කරන (මෝහය නැමැති) අන්ධකාරය දුරුකිරීම මෙනි. අන්ධකාරය දුර වූ කල්හි මාර්ගය ප්‍රකට වූ අවස්ථාව සෝවාන් මාර්ගයට චතුරාර්ය සත්‍යයන් ප්‍රකට වූ කාලය මෙනි. මාර්ගයට ප්‍රකට වන්නා වූ සත්‍යය මාර්ගසමඞ්ගී පුද්ගලයාට ප්‍රකට වේ ම ය. දෙවන වරට ගමන ඇරඹීම මෙන් සකෘදාගාමී මාර්ගය පිණිස

විජ්ජූපමා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, සෝවාන් සකදාගාමී අනාගාමී යන මාර්ග සිත් තුනෙහි යෙදුනා වූ ප්‍රඥ, චෛතසික තිදෙනා ලැබෙන්නාහ. **වජිරූපමා**

විදර්ශනා භාවනාව ඇරඹීම මෙනි. අන්ධකාරයෙහි මාර්ගය ප්‍රකට නොවූ අවස්ථාව චතුරාර්ය සත්‍යය මුවහ කරන (මෝහය නැමැති) අන්ධකාරය මෙනි. දෙවන අවස්ථාවේ විදුලි කෙටීමෙන් අන්ධකාරය දුරු වූ අවස්ථාව සකෘදාගාමී මාර්ගය නම් වූ ආලෝකය ඉපිද සත්‍යය මුවහ කරන (මෝහය නැමැති) අන්ධකාරය දුරුකිරීම මෙනි. අන්ධකාරය දුර වූ කල්හි මාර්ගය ප්‍රකට වූ අවස්ථාව සකෘදාගාමී මාර්ගයට චතුරාර්ය සත්‍යයන් ප්‍රකට වූ කාලය මෙනි. මාර්ගයට ප්‍රකට වන්නා වූ සත්‍යය මාර්ගසමඞ්ගී පුද්ගලයාට ප්‍රකට වේ ම ය. තෙවන වරට ගමන ඇරඹීම මෙන් සකෘදාගාමී මාර්ගය පිණිස විදර්ශනා භාවනාව ඇරඹීම මෙනි. අන්ධකාරයෙහි මාර්ගය ප්‍රකට නොවූ අවස්ථාව චතුරාර්ය සත්‍යය මුවහ කරන (මෝහය නැමැති) අන්ධකාරය මෙනි. තෙවන අවස්ථාවේ විදුලි කෙටීමෙන් අන්ධකාරය දුරු වූ අවස්ථාව අනාගාමී මාර්ගය නම් වූ ආලෝකය ඉපිද සත්‍යය මුවහ කරන (මෝහය නැමැති) අන්ධකාරය දුරුකිරීම මෙනි. අන්ධකාරය දුර වූ කල්හි මාර්ගය ප්‍රකට වූ අවස්ථාව අනාගාමී මාර්ගයට චතුරාර්ය සත්‍යයන් ප්‍රකට වූ කාලය මෙනි. මාර්ගයට ප්‍රකට වන්නා වූ සත්‍යය මාර්ගසමඞ්ගී පුද්ගලයාට ප්‍රකට වේ ම ය.

වජ්‍රයකට බිඳිය නොහැකි රුවනක් හෝ පාෂාණයක් නැත. යම් තැනක ගැටෙයි ද එය විනිවිද යයි. වජ්‍රය යමක් කපනා කල්හි ඉතිරියක් නැතිව කපයි. වජ්‍රය ගමන් කළ මාර්ගය නැවත ප්‍රකෘති තත්වයට පත් කළ නොහැක. එමෙන් අර්හත් මාර්ගයට නැසිය නොහැකි ක්ලේෂයක් නොමැත. වජ්‍රය මෙන් සියලු ක්ලේෂයන් විනිවිද යයි. අරහත් මාර්ගය ක්ලේෂයන් කපනා නසනා කල්හි අවශේෂයක් නොමැතිව කපයි. වජ්‍රය ගමන් කළ මාර්ගය නැවත ප්‍රකෘති තත්වයට පත් කළ නොහැක්කාක් මෙන් අර්හත් මාර්ගයෙන් ප්‍රහීණ වූ ක්ලේෂයන්ගේ නැවත පැමිණීමක් (ආපසු හැරීමක්) නම් නැත.

ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, අර්හත් මාර්ග චිත්තයෙහි ප්‍රඥ චෛතසිකය ලැබෙන්නේය. සිත් 89, මාර්ග සිත් සතරෙහි ඇති ප්‍රඥාව හැර චෛතසික 52, රූප 28, නිර්වාණය දුකමුක්ත ය. (ස්වරූප උදුරනු, - ආදිලබ්ධ නාම දුකයකි, සප්පදේස දුකයකි).

විජ්ජූපම දුකයයි.

03. බාල දුකය

බාලා ධම්මා - පණ්ඩිතා ධම්මාති.

බාලා ධම්මා - අඥන බැවින් ද අඥනයන් කෙරෙහි පිහිටි බැවින් ද, බාල නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

පණ්ඩිතා ධම්මා - පණ්ඩිත බැවින් ද, පණ්ඩිතයන් කෙරෙහි පිහිටි බැවින් ද පණ්ඩිත නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[59]

---

59. **බාලා ධම්මා** - (අස්සාසපස්සාසිතමත්තෙන බලති, ජීවතී'ති = බාලො). සත්පුරුෂ ඥානවනත්යන්ගෙන් බැහැර වී ආශ්වාස ප්‍රශ්වාස මාත්‍රයෙන් ම ජීවිතය ගෙවන්නා වූ අඥානයන් "බාල"නම් වේ.

දෙවන ක්‍රමය - (ද්වෙ අනත්ථෙ ලාති ගණ්හාතී'ති = බාලා). මෙලොව අනර්ථය ද පරලොව අනර්ථය ද ගන්නා වූ පුද්ගලයා "බාල" නම් වේ.

ඉහත දැක්වූ ක්‍රම දෙකෙහි දී ම ඒ අඥාන පුද්ගලයාගේ සන්තානය අකුසල ධර්මයන් ඇතිවන ස්ථානය බව ප්‍රකට වේ. අනුවණ පුද්ගලයා වනාහි ඒ අකුසල ධර්ම ඇතිවන්නා වූ "ඨාන (ස්ථානය)" නම් වේ. ඒ අකුසල ධර්ම වනාහි අඥාන පුද්ගලයාගේ සන්තානයෙහි ඇතිවන "ඨානී (ස්ථානය ඇත්තා වූ)" නම් වේ. ඒ දෙක අතරින් අඥාන පුද්ගලයා යන අර්ථය "බාල" ශබ්දය ප්‍රකාශ කරන අතර අකුසල යන අර්ථය ප්‍රකාශ නො කරයි. එසේ වුව ද ස්ථානය (ඨාන) වන අඥානයන් "බාල" නම් වූ නාමය ස්ථානී (ඨානී) වන අකුසලයන්හි ව්‍යවහාර කරන්නා වූ ස්ථානූපචාර (ඨානූපාචාර) වශයෙන්

බාලා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, අකුශල් සිත් දොළස ද තත් සම්ප්‍රයුක්ත චෛතසික සත් විස්ස ද ලැබෙන්නාහ. (ස්කන්ධ සතරකි, ආයතන දෙකකි, ධාතු දෙකකි ආර්ය සත්‍ය දෙකකි. - ස්වරූප උදුරනු).

පණ්ඩිතා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, කුශල සිත් එක් විස්ස ද, තත් සම්ප්‍රයුක්ත

අකුසලයන්ට ද "බාල" යන නම කීමට අවසර ලැබේ. එම නිසා "බාලා ධම්මා" සඳහා ස්වරූපාර්ථ ලෙස අකුසල සිත් දොළොස උද්ධරණය කරනු ලැබේ. (බාලෙසු ඨිතත්තා යත්ථ ඨිතා තදුපචාරෙන බාලා. ඉහත දක්වා ඇති අර්ථ විකල්ප දෙක අතරින් පළමුවැන්න උපචාර අර්ථය වන අතර දෙවන අර්ථය මුඛ්‍යාර්ථය වේ).

පණ්ඩිතා ධම්මා - (ගම්භීරට්ඨානෙසු පණ්ඩති ගච්ඡතී'ති = පණ්ඩා; පඤ්ඤා. පණ්ඩාය ඉතො ගතො'ති = පණ්ඩිතො). ප්‍රඥාවන්ත පුද්ගලයා "පණ්ඩිත" නම් වේ.

දෙවන ක්‍රමය - (උභොසු අත්ථෙසු ඤාණගතියා පණ්ඩති ගච්ඡතී'ති = පණ්ඩිතො). මෙලොව අර්ථය ද පරලොව අර්ථය ද යන උභයාර්ථයෙහි ඥාන ගතියෙන් (ගමනයෙන්) යා හැකි පුද්ගලයා " පණ්ඩිත" නම් වේ.

මෙහිදී ද ක්‍රම දෙකෙහි දී ම ප්‍රඥාවන්තයාගේ සන්තානය කුසල ධර්මයන් ඇතිවන ස්ථානය බව ප්‍රකට ය. එසේ වුවද ස්ථානය වන වූ ප්‍රඥාවන්තයාගේ "පණ්ඩිත" යන නම, ස්ථානී වන කුසලයන්හි ව්‍යවහාර කරමින් කුසල ධර්මයන් ද "පණ්ඩිත" යැයි කියනු ලැබේ. එම නිසා පණ්ඩිතා සඳහා ස්වරූපාර්ථ ලෙස කුසල ධර්ම උද්ධරණය කරනු ලැබේ.

තෙවන ක්‍රමය - (පණ්ඩිතං පණ්ඩිතභාවං කරොන්ති'ති = පණ්ඩිතා). ප්‍රඥාවන්තයෙක් වීම සඳහා සිදුකරන කුසල ධර්ම ද "පණ්ඩිත" නම් වේ. මෙම ක්‍රමයට අනුව "පණ්ඩිතා - ප්‍රඥාවන්තයාගේ භාවය ඇති කරන්නා වූ" යැයි අර්ථ ගත යුතු වේ.

චෛතසික අටතිස ද ලැබෙන්නාහ. (ස්කන්ධ සතරකි, ආයතන දෙකකි, ධාතු දෙකකි, ආර්ය සත්‍ය දෙකකි - ස්වරූප උදුරනු, ආදිලබ්ධ නාම දුකයකි, විපාක සිත් 32, ක්‍රියා සිත් 20, තත් සම්ප්‍රයුක්ත චෛතසික 38, රූප 28, නිර්වාණ ධාතුව ඇතුලත් නොවන බැවින් සප්පදේශ දුකයකි).

බාල දුකයයි.

04. කණ්හ දුකය

කණ්හා ධම්මා - සුක්කා ධම්මාති.

කණ්හා ධම්මා - කාල වර්ණ වූ බැවින් ද, සතර අපායාදියෙහි දුක් විපාක ගෙන දෙන බැවින් ද කණ්හ නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

සුක්කා ධම්මා - ස්වේත වර්ණ වූ බැවින් ද, ලෞකික ලෝකෝත්තර සැප විපාක ගෙන දෙන බැවින් ද සුක්ල ධර්ම නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ. (මේ කණ්හ දුකය බාල දුකයටම සමානය, ඒ අනුව ස්වරූප උදුරනු).

කණ්හ දුකයයි[60]

---

60. **කණ්හා ධම්මා** - (කසතී'ති = කණ්හො). සැපය නසන්නා වූ අකුසල ධර්මයෝ "කණ්හ" නම් වේ. (කුයතෙ කුච්ඡියතෙ'ති = කණ්හො). දුගතියට සුදුසු වූ අඳුරු ධර්මයෝ "කණ්හ" නම් වේ.

දෙවන ක්‍රමය - සතර අපායික සත්ත්වයන්ගේ ජාතිය අඳුරු සහ පහත් බැවින් "කණ්හජාති" නම් වේ. මනුෂ්‍ය භවයෙහි ඓශ්වර්ය නොමැති දුබිත, පිළිසරණක් නොමැති පුද්ගලයන් කණ්හජාති නම් වේ. අකුසල ධර්මයෝ ඒ කණ්හජාතිය ඇති කරන්නා වූ අභිජාතියෙහි හේතුව වේ. ඒ නිසා ඵලය වන්නා වූ අභිජාතියෙහි "කණ්හ" යන නම හේතුව වන්නා වූ අකුසල ධර්මයන්හි ව්‍යවහාර කරන්නා වූ ඵලූපචාර වශයෙන් අකුසල ධර්මයෝ ද "කණ්හ" යැයි කියනු ලැබේ. (කණ්හාභිජාතා'ති හෙතුතො වා කණ්හා-අට්ඨකථා; කණ්හාභිජාතා'ති-අපායා වුච්චන්ති මනුස්සෙසු දොසග්ගියං-ටීකා).

සුක්කා ධම්මා - (සූචතී'ති = සුක්කා). පිරිසිදු වන්නා වූ, සිත කාන්තිමත් කිරීමට හැකි කුසලධර්මයන් "සුක්ක" නම් වේ.

05. තපනීය දුකය

තපනීයා ධම්මා - අතපනීයා ධම්මාති.

තපනීයා ධම්මා - මෙලොවත් පරලොවත් දෙලොවෙහිම තැවීම ගෙන දෙන බැවින් තපනීය නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අතපනීයා ධම්මා - මෙලොවත් පරලොවත් තැවීමක් ගෙන නොදෙන බැවින් අතපනීය නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[61] (තපනීය දුකය ද, බාල දුකයට ම සමානය, ඒ අනුව ස්වරූප උදුරනු).

දෙවන ක්‍රමය - මනුෂ්‍ය භවයෙහි ඓශ්වර්යමත් බව ආදී උසස් සම්පත්තීන් ඇත්තා වූ පුද්ගලයන් සහ දිව්‍ය බ්‍රහ්මයන් "සුක්කාභිජාති" නම් වේ. කුසල ධර්මයෝ ඒ සුක්ක නම් වූ අභිජාතියෙහි හේතුව වේ. එම නිසා ඵලය වන්නා වූ අභිජාතියෙහි "සුක්ක" යන නම හේතුව වන්නා වූ කුසලයන්හි ව්‍යවහාර කරන්නා වූ ඵලූපචාර වශයෙන් කුසල ධර්මයෝ ද "සුක්ක" යැයි කියනු ලැබේ. (සුක්කාභිජාතිහෙතුතො සුක්කා-අට්ඨකථා).

61. **තපනීයා ධම්මා**- (තාපෙන්තී'ති = තපනීයා). මෙලොව පරලොව යන දෙභවයෙහිදී තවන්නා වූ, දුඛිත බවට පත් කරන්නා වූ අකුසලයෝ "තපනීය" නම් වේ.

දෙවන ක්‍රමය - (තාපෙතී'ති = තපනං; තපනස්ස හිතා = තපනීයා). ස්වකීය ස්ථානයෙහි ඇති සත්ත්වයන් තවන්නා වූ දුකට පත් කිරීමට හිතෙශී වූ ධර්මයන් "තපනීය" නම් වේ. -ටීකා

අතපනීයා ධම්මා - (න තපනීයා = අතපනීයා). මෙලොව පරලොව යන දෙභවයෙහිදී නොතවන්නා වූ, දුඛිත බවට පත් නොකරන්නා වූ කුසලයෝ "අතපනීය" නම් වේ.

දෙවන ක්‍රමය - ස්වකීය ස්ථානයෙහි ඇති සත්ත්වයන් නොතවන්නා වූ දුකට පත් කිරීමට හිතෙශී නොවන ධර්මයන් "අතපනීය" නම් වේ.

තපනීය දුකයයි

06. අධිවචන දුකය

අධිවචනා ධම්මා - අධිවචනපථා ධම්මාති.

අධිවචනා ධම්මා - ශබ්ද මාත්‍රයක් අධිපති කොට ගන්නා වූ ශබ්ද ප්‍රඥප්තිය යැයි කියනා ලද, නාම නාමකර්ම, නාමධෙය්‍ය, නාමනිරුක්ති, නාමව්‍යඤ්ජන, නාමාභිලාප නම් වූ ශබ්ද ප්‍රඥප්තිය යැයි කියනා ලද, වාග් ද්වාරයෙන් නිකුත් වන ශබ්ද ප්‍රඥප්තිය නම් වූ අර්ථයට නමන අර්ථයෙන් නාම නම් වූ ද, අර්ථයෙහි නැමෙන අර්ථයෙන් නාමකර්ම නම් වූ ද, අර්ථයෙහි නැමී පිහිටි අර්ථ නැමති නාමධෙය්‍ය නම් වූ ද, අර්ථය නිකුත් කොට කියන ලද හෙයින් නාම නිරුක්ති නම් වූ ද, අර්ථ ප්‍රකාශ කරන වාක්‍යය නමැති නාම ව්‍යඤ්ජන නම් වූ ද, අර්ථයට අභිමුඛව නැමෙන හෙයින් නාමාභිලාප නම් වූ ද, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

අධිවචන පථා ධම්මා - ශබ්ද මාත්‍රයක් අධිපති කොට ගන්නා වූ ඒ ශබ්ද ප්‍රඥප්තියට හේතු කාරණ වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[62]

---

62. **අධිවචනා ධම්මා** - (වචනං අධිකිච්ච පවත්තා'ති = අධිවචනා). ශබ්ද මාත්‍රය ම පමණක් අපේක්ෂා කරමින් පවත්නා වූ සිරිවඩ්ඪක, ධනවඩ්ඪක ආදී ශබ්දයන් "අධිවචන" නම් වේ. "අධි" ශබ්දය අජ්ඣත්තා ධම්මා පදයේ විග්‍රහයේදී මෙන් 'අධිකිච්චපවත්ත' අර්ථය දක්වයි. 'අධිකාරං කත්වා' සහ 'අධිකිච්ච' යන පද අර්ථ වශයෙන් සමාන ය. එම නිසා "වචනං+අධිකිච්ච පවත්තා=අධිවචනා" යැයි විග්‍රහ කෙරේ. 'අධිකාරය' යනු නම් තබන්නා වූ දෙමාපියන් ආදී පුද්ගලයන්ගේ අපේක්ෂාව යි. නම් තබන්නන් අර්ථයේ නිරවද්‍යතාව නොසලකමින් ශබ්ද මාත්‍රය ම පමණක් අපේක්ෂා කරමින් (ශබ්දයේ අලංකාරය බව පමණක් සලකමින්) දාසයෙක් සඳහා "සිරිවඩ්ඪක" යන ආදී නම් ද, දුප්පත් පුද්ගලයෙකු සඳහා "ධනවඩ්ඪක" ආදී නම් ද තබනු ලැබේ. ඒ සිරිවඩ්ඪක, ධනවඩ්ඪක ආදී ශබ්දයන් මෙන් සෙසු ශබ්දයන් වැරදි හෝ වේවා නිවැරදි අර්ථය හෝ වේවා අර්ථය ප්‍රකට කරන්නා වූ ශබ්දභාවයෙන් සමාන බැවින් සදිසූපචාර වශයෙන්

"අධිවචන" යැයි කියනු ලැබේ. (සබ්බඤ්ච වචනං අධිවචනාධිභාවං භජති-ටීකා). මේ අනුව මෙහි ස්වරූපාර්ථ සඳහා ලැබෙනුයේ පරමාර්ථ ධර්මයන් නොව ශබ්ද ප්‍රඥප්තිය ය. එම නිසා ස්වරූපාර්ථ උද්ධරණයේ දී "අසන්නන්හට අර්ථාවබෝධය ගෙන දෙන ශබ්ද ප්‍රඥප්තිය නම් වූ වචීවිඤ්ඤත්තිය සහිත වචී ශබ්දය ලැබෙන්නේ ය" යනුවෙන් පරමාර්ථ ධර්ම දක්වමින් විඤ්ඤත්තා සහ ශබ්ද රූපය උද්ධරණය කරන ලදී.

දෙවන ක්‍රමය - (උපරි වචනං අධිවචනං). ප්‍රකට වන්නා වූ දැක්විය යුතු අර්ථය මත්තෙහි ප්‍රකාශ කරන ශබ්දය "අධිවචන" නම් වේ. (ටීකා)

තෙවන ක්‍රමය - (අධීනං වචනං = අධිවචනං). අර්ථය හා සමඟ සම්බන්ධ වන ශබ්දය "අධිවචන" නම් වේ.

ඉහත දක්වා ඇති 'නාම, නාමකර්ම' ආදී අර්ථයන් නික්ෂේප කාණ්ඩ පාළියට අනුව දී ඇත. එහි අර්ථ පහත පරිදි වේ.

නාම - (අත්ථෙ නමෙතී'ති = නාමං; අත්තනි අත්ථෙ නාමෙතී'ති = නාමං). වාග් ද්වාරයෙන් නිකුත් වන ශබ්ද ප්‍රඥප්තිය නම් වූ අර්ථයට නමන බැවින් නාම නම් වූ ද, තමා වෙත අර්ථයන් නමන බැවින් නාම වූ ද යැයි අර්ථ දක්වා ඇත. සාමඤ්ඤ නාම, ගුණ නාම, කිත්ති නාම, ඕපපාතික නාම යන නාම වර්ග සතර ම මෙහිදී ගත යුතු වේ.

නාම කම්ම - (කරීයතී'ති = කම්මං; නාමමෙව කම්මං = නාමකම්මං). අර්ථයට නමන බැවින් නාම නම් වූ ද, තමා වෙත අර්ථයන් නමන බැවින් පෙර නුවණැත්තන් විසින් කරනා ලද නම් ඇති.

නාමධෙය්‍ය - (ධීයති ඨපීයතී'ති = ධෙය්‍යං; නාමමෙව ධෙය්‍යං = නාමධෙය්‍යං). අර්ථයට නමන බැවින් නාම නම් වූ ද, තමා වෙත අර්ථයන් නමන බැවින් පෙර නුවණැත්තන් විසින් තබනා ලද නම් ඇති.

නාමනිරුත්ති - (උච්චතෙ'ති = උත්ති; නීහරිත්වා උත්ති = නිරුත්ති; නාමමෙව නිරුත්ති = නාමනිරුත්ති). අර්ථයට නමන බැවින් නාම නම්

අධිවචනා ධම්මා - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, අසන පුද්ගලයන්ගේ ඥානයට ප්‍රත්‍ය වන්නා වූ ගෙන දෙන ශබ්ද ප්‍රඥප්තිය නම් වූ අවයවභූත වූ ශබ්දය සමඟ අවිනාභාවී වූ බැවින් වචීවිඤ්ඤත්තිය සහිත (සවිඤ්ඤත්තික) වචී ශබ්දය ලැබෙන්නේ ය. රූපස්කන්ධයකි. සද්දයතන, ධම්මායතන දෙකකි, සද්දධාතු ධම්මධාතු දෙකකි. දුක්ඛ සත්‍යයකි, (ස්වරූප උදුරනු).

වූ ද, තමා වෙත අර්ථයන් නමන බැවින් නිද්ධාරණය කරමින් හේතු සහිතව ප්‍රකාශ කරන්නා වූ වචනයන්.

නාමබ්‍යඤ්ජන - (අත්ථං බ්‍යඤ්ජීවතී'ති පකාසෙතී'ති = බ්‍යඤ්ජනං; නාමමෙව බ්‍යඤ්ජනං = නාමබ්‍යඤ්ජනං). අර්ථයට නමන බැවින් නාම නම් වූ ද, තමා වෙත අර්ථය නමන බැවින් නාම වූ ද යැයි අර්ථය ප්‍රකාශ කරන්නා වූ ව්‍යඤ්ජනයන්.

නාමාභිලාප - (අභිලප්පතී'ති = අභිලාපො; නාමමෙව අභිලාපො=නාමාභිලාපො). අර්ථයට නමන බැවින් නාම නම් වූ ද, තමා වෙත අර්ථය නමන බැවින් අර්ථයට අභිමුඛව නැමෙන නාමාභිලාප.

අධිවචනපථා ධම්මා - (අධිවචනානං පථා = අධිවචනපථා). ශබ්ද මාත්‍රය ම පමණක් අපේක්ෂා කරමින් පවත්නා වූ නාම ප්‍රඥප්තියට හේතුව වන අර්ථ ප්‍රඥප්තිය "අධිවචනපථ" නම් වේ. මෙපමණකින් ම පරමාර්ථ ධර්මයන් ප්‍රකාශ වූයේ නො වේ. එම නිසා "ඒ අර්ථ ප්‍රඥප්තිය නම් වූ හේතු සඞ්ඛ්‍යාත අර්ථය සමඟ අවිනාභාවී වීම සඳහා (වෙන් නොවීම සඳහා) සිත් එකුන් අනූව ද -පෙ- නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ" යැයි ස්වරූපාර්ථයන්හි දක්වා ඇත.

"සබ්බෙපි ධම්මා අධිවචනපථා" (සියළු ධර්මයෝ අධිවචනාපථයෝ ය) යනුවෙන් නික්ෂේප කාණ්ඩ පාලියෙහි වදාළ බැවින් අධිවචනපථ නොවන ධර්මයෝ නැත. එම නිසා සතර පරමාර්ථ ධර්මයන් ම උද්ධරණය කරන ලදී.

පටුන වෙත

අධිවචන පථා ධම්මා - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, වචන කථා කරන පුද්ගලයන්ගේ ඥානයට ප්‍රත්‍ය වන්නා වූ කාරණභූත වූ අර්ථය සමඟ අවිනාභාවී වූ බැවින් සිත් එකුන් අනූව ද, චෛතසික දෙපණස ද, රූප අටවිස්ස ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. (ස්කන්ධ පසකි, ආයතන දොළසකි, ධාතු අටළොසකි, ආර්ය සත්‍ය සතරකි, ආදි ලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි, - ස්වරූප උදුරනු).

අධිවචන දුකයයි

07. නිරුත්ති දුකය

නිරුත්ති ධම්මා - නිරුත්ති පථා ධම්මාති.

නිරුත්ති ධම්මා - නිද්ධාරණය කරමින් ප්‍රකාශ කරන්නා වූ ශබ්ද ප්‍රඥප්තිය යැයි කියනා ලද, නාම -පෙ- යැයි කියනා ලද, වාග් -පෙ- නාම වූ ද, අර්ථයෙහි -පෙ- නාම කර්ම වූ ද, අර්ථයෙහි -පෙ- නාම නිරුත්ති වූ ද, අර්ථය -පෙ- නිරුක්ති නම් වූ ද, අර්ථ -පෙ- නාම ව්‍යඤ්ජන නම් වූ ද, අර්ථයට -පෙ- නාමාභිලාප නම් වූ ද, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

නිරුත්ති පථා ධම්මා - නිද්ධාරණය කරමින් ප්‍රකාශ කරන්නා වූ ශබ්ද ප්‍රඥප්තියට හේතු කාරණ වන්නා වූ අර්ථ ප්‍රඥප්ති නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ. (අධිවචන දුකයටම සමානය. ඒ අනුව ස්වරූප උදුරනු).[63]

---

63. **නිරුත්ති** - (නීහරිත්වා උච්චෙන්තී'ති = නිරුත්ති). නිද්ධාරණය කරමින් හේතු සහිතව ප්‍රකාශ කරන්නා වූ ශබ්දයන් "නිරුත්ති" නම් වේ. හේතු සහිත ව අර්ථයන් නිද්ධාරණය නොකරන්නා වූ ශබ්දයන් ද අර්ථය ප්‍රකාශ කරයි. එම අර්ථ ප්‍රකාශ වන බැවින් සදිසූපචාර වශයෙන් "නිරුත්ති" යන නම ලබයි.

දෙවන ක්‍රමය - (නිච්චිතා උත්ති = නිරුත්ති). අර්ථ ප්‍රකාශනයේ නිශ්චිත ශබ්දය "නිරුත්ති" නම් වේ.

නිරුත්ති දුකයයි.

08. පඤ්ඤත්ති දුකය

පඤ්ඤත්ති ධම්මා - පඤ්ඤත්ති පථා ධම්මාති.

පඤ්ඤත්ති ධම්මා - ප්‍රභේද වශයෙන් අවබෝධ කරවන්නා වූ ශබ්ද ප්‍රඥප්තිය යැයි කියනා ලද, නාම -පෙ- යැයි කියනා ලද, වාග් -පෙ- නාම වූ ද, අර්ථයෙහි -පෙ- නාම කර්ම වූ ද, අර්ථයෙහි -පෙ- නාම නිරුත්ති වූ ද, අර්ථය -පෙ- නිරුක්ති නම් වූ ද, අර්ථ -පෙ- නාම ව්‍යඤ්ජන නම් වූ ද, අර්ථයට -පෙ- නාමාභිලාප නම් වූ ද, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

පඤ්ඤත්තිපථා ධම්මා - ප්‍රභේද වශයෙන් අවබෝධ කරවන්නා වූ, ශබ්ද ප්‍රඥප්තියට හේතු කාරණ වන්නා වූ අර්ථ ප්‍රඥප්ති නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[64]

තෙවන ක්‍රමය - (නියතං වා වචනං = නිරුත්ති). අර්ථ ප්‍රකාශනයේ නියත ශබ්දය "නිරුත්ති" නම් වේ.

නිරුත්තිපථා - (නිරුත්තීනං පථ = නිරුත්තිපථා). නිද්ධාරණය කරන ශබ්ද ප්‍රඥප්තින්ගේ හේතුව වන අර්ථය (අර්ථ ප්‍රඥප්තිය) "නිරුත්තිපථ" නම් වේ.

64. **පඤ්ඤත්ති** - (පකාරෙන ඤාපෙතී'ති = පඤ්ඤත්ති). එක් අර්ථයක් නොයෙක් ආකාරයෙන් තේරුම් කරවන්නා වූ ශබ්දයන් "පඤ්ඤත්ති" නම් වේ. විතර්කය නම් පරමාර්ථ ධර්මය "තක්කො, විතක්කො, සඞ්කප්පො" ආදි නොයෙක් ආකාරයෙන් තේරුම් කරවයි. එසේ නොයෙක් ආකාරයෙන් තේරුම් නොකොට එක් පදයකින් පමණක් අර්ථය සම්පූර්ණ කරන (ප්‍රකාශ කරන) සෙසු ශබ්දයන් ද අර්ථ ප්‍රකට කිරීමේ සමාන බැවින් "පඤ්ඤත්ති" යැයි කියනු ලැබේ.

පටුන වෙත

(අධිවචන දුකයට සමාන ය - ඒ අනුව ස්වරූප උදුරනු).

පඤ්ඤත්ති දුකයයි

09. නාමරූප දුකය

නාමඤ්ච - රූපඤ්චාති.

නාමඤ්ච - අරමුණට අභිමුඛව නැමෙන අර්ථයෙන් නාම නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

රූපඤ්ච - ශීතෝෂ්ණාදී විරෝධ ප්‍රත්‍යයෙන් රුප්පනය වීම හෙවත් විකාර වීම වෙනස් වීම ස්වභාව කොට ඇති බැවින් රූප නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.[65]

පඤ්ඤත්තිපථා - (පඤ්ඤත්තීනං පථා = පඤ්ඤත්තිපථා). නොයෙක් ආකාරයෙන් තේරුම් කරවන්නා වූ ශබ්ද ප්‍රඥප්තියේ හේතුව වන්නා වූ අර්ථ ප්‍රඥප්තිය "පඤ්ඤත්තිපථ" නම් වේ.

65. **නාම** - (නාමං කරොතී'ති = නාමං). "නාමකරණ" යැයි අදහස් කළ ද "කරණ" යන දෙවන පදය ලොප්කොට ඇත. තමාගේ නාමය තමා විසින් ම පණවා ගැනීමට හැකි නාමස්කන්ධ සතර සහ නිර්වාණය
"නාම" නම් වේ. පැහැසීම, විඳීම ආදී ලක්ෂණ ඇත්තා වූ ඵස්ස, වේදනා ආදිය සඳහා තමාගේ ස්වභාවයනට අනුව ඵස්ස, වේදනා ආදී නාම ලැබෙයි. එබැවින් "නාම" යන නම ලබයි.

නාමය පණවා ගැනීමට හැකි බැවින් නාම යැයි කළහොත් පඨවී ආදී රූප ධර්මවලට "නාම" යැයි නොකියා නාමස්කන්ධ සතර සහ නිර්වාණයට ම පමණක් "නාම" යැයි කියනු ලබන්නේ කවර හේතුවක් නිසා ද? පඨවී ආදී රූප ධර්මයන් ස්වකීය ස්වභාවයන්ට අනුව ලබන්නා වූ නාමවලට අමතරව කෙසා (කෙස්), කුම්භ (කළය) ආදී වශයෙන් සුදුසු පරිදි වෙනත් නාමයන් ද ලබයි. නාම ධර්ම ඒ ආකාරයෙන් වෙනත් නම් නොලබයි. ඒ නිසා පඨවී ආදී රූප

(මෙහි ප්‍රථම පදයට සිත් 89, චෛතසික 52, හා නිර්වාණය ද, ද්විතීය පදයට රූප 28 ද, ලැබෙන්නාහ. - ස්වරූප උදුරනු, - සර්වලබ්ධ නාම දුකයකි, නිප්පදේස දුකයකි).

නාමරූප දුකයයි

10. අවිජ්ජා දුකය

අවිජ්ජා ච - භවතණ්හා චාති.

අවිජ්ජා ච - චතුරාර්ය සත්‍යය මුවහ කරන බැවින් මෝහ යයි කියන ලද අවිද්‍යා නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයක් ඇත්තේය.

ධර්මවලට 'නාම' යැයි නොකියා ඵස්ස ආදී ධර්මවලට ම නාම යැයි කියනු ලැබේ. (ටීකාව ඇසුරෙනි).

දෙවන ක්‍රමය - (නමතී'ති = නාමං). අරමුණට නමන බැවින් නාමස්කන්ධ සතරට "නාම" යැයි කියනු ලැබේ. අරමුණු කරන්නා වූ ආරම්මණික ධර්මවලට "නාම" යැයි කියනු ලැබේ යැයි මින් අදහස් කෙරේ. නාමස්කන්ධ සතර කවර අවස්ථාවකදීවත් අරමුණු වලින් වෙන් වී පවතින්නේ නැත. අරමුණු කරමින් ම පවතී. එසේ පවතින්නා වූ ස්වභාවය 'අරමුණට නැමීම' යනුවෙන් අදහස් වේ.

තෙවන ක්‍රමය - (අත්තනි ආරම්මණිකධම්මෙ නාමෙතී'ති = නාමං). තමා වෙත ආරම්මණික ධර්ම නමවන බැවින් නාමස්කන්ධ සතර සහ නිර්වාණය "නාම" නම් වේ. ආරම්මණික ධර්මයන්ගේ අරමුණ වන්නා වූ ධර්ම "නාම" නම් වේ යැයි මින් අදහස් කෙරේ.

රූප - (සීතුණ්හාදිවිරොධිපච්චයෙහි රුප්පතී'ති = රූපං). ශීතෝෂ්ණාදී විරුද්ධ ප්‍රත්‍යයන් නිසා විකාරයට පත්වන ධර්මයන් "රූප" නම් වේ.

දෙවන ක්‍රමය - ශීතෝෂ්ණාදී ප්‍රතිවිරුද්ධ ප්‍රත්‍ය මගින් විකාරයට පත් කරන්නා වූ ධර්මයන් "රූප" නම් වේ.

පටුන වෙත

භවතණ්හා ච - සාස්වත දෘෂ්ටියෙන් යුක්ත වූ ද, භවයට ඇලුම් කරන බැවින් ලෝභ නම් වූ ද, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්ම කෙනෙක් ඇත්තේය.[66]

---

66. **අවිජ්ජා** - (විදති ජානාතී'ති = විජ්ජා; න විජ්ජා = අවිජ්ජා). දැන ගන්නා වූ නුවණ "විජ්ජා" නම් වේ. ඒ දැන ගන්නා වූ නුවණෙන් ප්‍රතිවිරුද්ධ වූ මෝහය "අවිජ්ජා" නම් වේ.

(විදති පටිලභතී'ති = විජ්ජා; න විජ්ජා = අවිජ්ජා). - නොලැබිය යුතු කාය දුෂ්චරිතාදිය නොලැබිය යුතු කාය සුචරිතාදිය ලබාදෙන ඥානය "විජ්ජා" නම් වේ. ඒ ඥානයට ප්‍රතිවිරුද්ධ වූ මෝහය "අවිජ්ජා" නම් වේ. නොලැබිය යුතු කාය දුෂ්චරිතාදිය ලබාදෙන්නා වූ මොහය ද, ලැබිය යුතු කාය සුචරිතයන් ලබා නොදෙන්නා වූ මෝහය ද "අවිජ්ජා" නම් වේ යැයි මින් අදහස් වේ.

(අන්තවිරහිතෙ ජවාපෙතී'ති = අවිජ්ජා). අනවරාග්‍ර වූ සංසාරයෙහි සත්ත්වයන් ධාවනය කරවවන්නා වූ මෝහය "අවිජ්ජා" නම් වේ. "අන්ත+විරහිත+ජව" යැයි අදහස් කළද "අ+වි+ජ" යන ශබ්දයන් ඉතිරිකොට සෙස්ස ලොප් කොට ඇත. 'ජ'කාරය ද්විත්ව වී 'ආ' ප්‍රත්‍යය පැමිණීමෙන් "අවිජ්ජා" යන පදය සිද්ධ වේ. (විසුද්ධිමාර්ග මහාටීකාව)

(අවිජ්ජමානෙසු ජවතී'ති = අවිජ්ජා). පරමාර්ථ වශයෙන් විද්‍යමාන නොවන්නා වූ ස්ත්‍රී පුරුෂාදියෙහි ධාවනය කරවන්නා වූ මෝහය "අවිජ්ජා" නම් වේ. පරමාර්ථයන් නිවැරදිව නොදකිමින් ස්ත්‍රී පුරුෂාදිය ප්‍රකට වීම දක්වා මුලා කරවන මෝහය "අවිජ්ජා" නම් වේ යැයි අදහස් කෙරේ. 'පරමාර්ථ වශයෙන් විද්‍යමාන වන ස්කන්ධාදිය නොදකින්නා වූ මෝහය' යැයි මින් අදහස් කෙරේ. (මෙහිදී ද "විජ්ජමානඅජව" යැයි අදහස් කළද "වි+අ+ජ" යන ශබ්දයන් ඉතිරිකොට සෙස්ස ලොප් කරනු ලැබේ. 'වි' සහ 'අ' විපරියාය වේ. 'ජ'කාරය ද්විත්ව වී 'ආ' ප්‍රත්‍යය පැමිණීමෙන් "අවිජ්ජා" යන පදය සිද්ධ වේ).

භවතණ්හා - (තසතී'ති = තණ්හා; භවං තණ්හා = භවතණ්හා). තමා සිටින්නා වූ භවය කෙරෙහි ඇත්තා වූ ලෝභය "භවතණ්හා" නම් වේ.

(මෙහි ප්‍රථම පදයෙන් මෝහය ද, ද්විතීය පදයෙන් ලෝභය ද ගැනෙති. ඉතිරි සියලු ධර්මයෝ දුක මුක්තයෝය. - ස්වරූප උදුරනු).

අවිජ්ජා දුකය යි.

11. භවදිට්ඨි දුකය

භවදිට්ඨි ච - විභවදිට්ඨි චාති.

භවදිට්ඨි ච - නිත්‍ය සදකාලික ආත්ම භාවයක් ඇතැයි පිළිගන්නා වූ මිථ්‍යා දෘෂ්ඨි නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයක් ඇත්තේය.

විභවදිට්ඨි ච - මරණින් මතු ඉපදීමක් නැතැයි පිළිගන්නා වූ මිථ්‍යා දෘෂ්ටි නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයක් ඇත්තේය.[67]

විභවදිට්ඨි ච - මරණින් මතු ඉපදීමක් නැතැයි පිළිගන්නා වූ මිථ්‍යා දෘෂ්ටි නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයක් ඇත්තේය. (මෙහි දෙපදයෙන් ම දිට්ඨි චෛතසිකය ගැනේ, සෙසු සියලු ධර්ම දුක මුක්ත වෙති. - ස්වරූප උදුරනු).

භවදිට්ඨි දුකයයි.

12. සස්සතදිට්ඨි දුකය

සස්සත දිට්ඨි ච - උච්ඡේද දිට්ඨි චාති.

දෙවන ක්‍රමය - (භවෙසු තණ්හා = භවතණ්හා). ඒ ඒ භවයන් කෙරෙහි ඇත්තා වූ ලෝභය "භවතණ්හා" නම් වේ.

67. **භවදිට්ඨි** - (භවො වුච්චති සස්සතං, සස්සතවසේන උප්පජ්ජනදිට්ඨි = භවදිට්ඨි). භවය යනු ශාස්වත යයි. සාස්වත වශයෙන් උපදින දෘෂ්ටිය "භවදිට්ඨි" නම් වේ.

විභවදිට්ඨි - (විභවො වුච්චති උච්ඡෙදං, උවච්ඡෙදවසේන උප්පජ්ජනදිට්ඨි = විභවදිට්ඨි). විභව යනු උච්ඡේද යයි. උච්ඡෙද වශයෙන් උපදින දිට්ඨිය "විභවදිට්ඨි" නම් වේ.

පටුන වෙත

සස්සත දිට්ඨි ච - ලෝකය ද ආත්මභාවය ද නිත්‍ය යයි ද සදකාලික යයි ද පිළිගන්නා වූ මිථ්‍යා දෘෂ්ඨි සංඛ්‍යාත ධර්මයක් ඇත්තේය.

උච්ඡේද දිට්ඨි ච - ලෝකය ද ආත්මභාවය ද විනාශ වීමෙන් පසු නැවත නූපදින්නේ යයි පිළිගන්නා වූ, මිථ්‍යා දෘෂ්ඨි සංඛ්‍යාත ධර්මයක් ඇත්තේය.[68]

(දෙපදයෙන් ම දිට්ඨි චෛතසිකය ගැනේ, සෙසු ධර්ම දුක මුක්තයහ. - ස්වරූප උදුරනු, - භව දිට්ඨි දුකයට සමාන ය).

සස්සත දිට්ඨි දුකයයි.

13. අන්තවාදිට්ඨි දුකය

අන්තවා දිට්ඨි ච - අනන්තවා දිට්ඨිචාති.

අන්තවා දිට්ඨිච - ලෝකය ද ආත්මභාවය ද කෙළවර සහිත යයි පිළිගන්නා වූ, මිථ්‍යා දෘෂ්ඨි සංඛ්‍යාත ධර්මයක් ඇත්තේය.

අනන්තවා දිට්ඨි ච - ලෝකය ද ආත්ම භාවය ද කෙළවරක් නොමැත්තේ යයි පිළිගන්නා වූ, මිථ්‍යා දෘෂ්ඨි සංඛ්‍යාත ධර්මයක් ඇත්තේය.[69]

---

68. **සස්සත දිට්ඨි** - (සස්සතො අත්තා ච ලොකො චා ති පවත්තා දිට්ඨි = සස්සතදිට්ඨි). ආත්මයත් ලෝකයත් සදකාලික යයි ගන්නා දෘෂ්ඨිය සාස්වත දෘෂ්ඨි යයි.

උච්ඡේද දිට්ඨි - (උච්ඡිජ්ජිස්සතී'ති පවත්තා දිට්ඨි = උච්ඡේදදිට්ඨි). මරණින් මතු නැවත නූපදින්නේ යයි පැවැති දෘෂ්ඨිය උච්ඡේද දෘෂ්ඨි යයි.

69. **අන්තවා දිට්ඨිච** - (අන්තවා'ති පවත්තා දිට්ඨි = අන්තවාදිට්ඨි). ආත්මයත් ලෝකයත් කෙළවර සහිත යයි පැවති දෘෂ්ඨිය අන්තවා දිට්ඨි යයි.

(මෙහි ද දෙපදයෙන් ම දිට්ඨි චෛතසිකය ගැනේ, සෙසු ධර්ම දුක මුක්ත වෙති. - ස්වරූප උදුරනු).

අන්තවා දිට්ඨි දුකයයි.

14. පුබ්බන්තානුදිට්ඨි දුකය

පුබ්බන්තානු දිට්ඨි ච - අපරන්තානු දිට්ඨි චාති.

පුබ්බන්තානු දිට්ඨි ච - සංසාරයෙහි පූර්වාන්තය හෙවත් අතීතය අරමුණු කොට විපරීතව පිළිගන්නා වූ, මිථ්‍යා දෘෂ්ඨි සංඛ්‍යාත ධර්මයක් ඇත්තේය.

අපරන්තානු දිට්ඨි ච - සංසාරයෙහි අපරාන්තය හෙවත් අනාගතය අරමුණු කොට විපරීතව පිළිගන්නා වූ, මිථ්‍යා දෘෂ්ඨි සංඛ්‍යාත ධර්මයක් ඇත්තේය.[70] (මෙහි ද දෙපදයෙහි ම දිට්ඨි චෛතසිකය ගැනේ, සෙසු ධර්ම සියල්ල දුක මුක්තය, ස්වරූප උදුරනු).

පුබ්බන්තානු දිට්ඨි දුකයයි.

15. අහිරික දුකය

අහිරිකඤ්ච අනොත්තප්පඤ්චාති.

අනන්තවා දිට්ඨි ච - (අනන්තවා'ති පවත්තා දිට්ඨි = අනන්තවාදිට්ඨි). ආත්මයත් ලෝකයත් කෙළවරක් නැතැයි පැවති දෘෂ්ඨිය අනන්තවා දිට්ඨි යයි.

70. **පුබ්බන්තානු දිට්ඨි** - (පුබ්බන්තං අනුගතා දිට්ඨි = පුබ්බන්තානුදිට්ඨි). පෙර අතීතයකදී හටගත් ස්කන්ධ, ආයතන, ධාතුවලට අනුව පැවති දෘෂ්ඨිය පුබ්බන්තානුදිට්ඨි යයි.

අපරන්තානු දිට්ඨි - (අපරන්තං අනුගතා දිට්ඨි = අපරන්තානුදිට්ඨි). අනාගතයේදී උපදින්නා වූ ස්කන්ධ, ආයතන, ධාතු අනුව පැවති දෘෂ්ඨිය අපරන්තානු දිට්ඨි යයි.

අහිරිකඤ්ච - කාය වාග් මනෝ දුශ්චරිතා දී පාපයෙහි ලජ්ජා නොවීම ලක්ෂණ කොට ඇත්තා වූ අහිරික නම් වූ ධර්මයක් ඇත්තේය.

අනොත්තප්පඤ්ච - පාපයෙහි බිය නොවීම ලක්ෂණ කොට ඇත්තා වූ අනොත්තප්ප නම් වූ ධර්මයක් ඇත්තේය.[71]

(මෙහි අහිරික අනොත්තප්ප චෛතසික දෙක ලැබෙති. සෙසු ධර්ම දුක මුක්ත වෙති. - ස්වරූප උදුරනු).

අහිරික දුකයයි.

16. හිරි දුකය

හිරී ච - ඔත්තප්පඤ්ච්‍ චාති.

හිරී ච - පාපයෙහි ලජ්ජා වීම පිළිකුල් කිරීම ලක්ෂණ කොට ඇත්තා වූ, හිරි නම් වූ ධර්මයක් ඇත්තේය.

ඔත්තප්පඤ්ච්‍ - පාපයෙහි බිය වීම තැති ගැනීම ලක්ෂණ කොට ඇත්තා වූ, ඔත්තප්ප නම් ධර්මයක් ඇත්තේය.[72]

---

71. **අහිරික** - (හිරියනා-හිරි; න හිරිකං = අහිරිකං). පාපයට ලජ්ජා වීම හිරි යයි, ලජ්ජා නොමැති වීම අහිරික නම් වේ.

දෙවන ක්‍රමය - (න හිරීයති හිරීයතබ්බෙනා'ති = අහිරිකො; අහිරිස්සභාවො = අහිරිකං). ලැජ්ජා විය යුතු කාය දුෂ්චරිතාදියෙන් ලැජ්ජාවට පත් නොවන පුද්ගලයාගේ (සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ) හේතුව වන ධර්මතාවන් "අහිරික" නම් වේ.

අනොත්තප්ප - (ඔත්තප්පායනා = ඔත්තප්පං; න ඔත්තප්පං = අනොත්තප්පං). පාපයට බිය වීම ඔත්තප්ප යයි, බිය නොවීම අනොත්තප්ප යයි.

72. **හිරී** - (හිරීයති පාපා'ති = හිරි). පාපයෙන් ලැජ්ජා වේ නුයි "හිරි" නම් වේ.

දෙවන ක්‍රමය - ලැජ්ජාවට පත්විය යුතු කාය දුෂ්චරිතාදියෙන් ලැජ්ජාවට පත් වන්නා වූ ධර්මය "හිරී"

(මෙහි හිරි ඔත්තප්ප චෛතසික දෙක ලැබෙති. සෙසු ධර්ම දුක මුක්තයහ. - ස්වරූප උදුරනු).

හිරි දුකයයි.

17. දොවචස්සතා දුකය

දොවචස්සතා ච - පාපමිත්තතා චාති.

දොවචස්සතා ච - අවවාද අනුශාසනා මුදුනින් නොපිළිගන්නා වූ දුර්වච හෙවත් අකීකරු පුද්ගලයාගේ ස්වභාවය නම් වූ, දෝවචස්සාතාව නම් ධර්මයක් ඇත්තේය.

පාපමිත්තතාච - පවිටු වූ ද, තෙරුවන් නොඅදහන්නා වූ ද මිත්‍රයන් ඇසුරු කරන පුද්ගලයාගේ ස්වභාවය නම් වූ, පාපමිත්තතාව නම් ධර්මයක් ඇත්තේය.[73]

දොවචස්සතා ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ශීලාදී ගුණයෙන් උසස් උතුමන් විසින් අවවාද අනුශාසනා කිරීමේ දී ද පටහැනි වචන කියමින් දුර්වච බවපාන්නා වූ

ඔත්තප්ප - (ඔත්තප්පති භායති පාපතො'ති = ඔත්තප්පං). පාපයෙන් තැති ගනී බිය වේ නුයි "ඔත්තප්ප" නම් වේ.

73. **දොවචස්සතා** - (දුක්ඛං වචො එතස්මිං විප්පටිකූලගාහිම්හි විපච්චනිකසාතෙ අනාදරෙ පුග්ගලෙ'ති = දුබ්බචො. තස්ස කම්මං = දොවචස්සං, තස්ස භාවො = දොවචස්සතා). අවවාදයට කිපෙන අගෞරව කරන විපරීතව පිළිගන්නා වූ පුද්ගලයා දුර්වචයා ය. ඔහුගේ ක්‍රියාව දෝවචස්ස නම්. ඔහුගේ ස්වභාවය දෝවචස්සතාව යි.

පාපමිත්තතාච - (පාපා අස්සද්ධාදයො පුග්ගලා ඒතස්ස මිත්තා'ති = පාප මිත්තො, තස්ස භාවො = පාප මිත්තතා). පවිටු වූ ද, තෙරුවන් නොඅදහන්නා වූ ද මිත්‍රයන් ඇසුරු කරන්නේ නුයි පාපමිත්‍ර නම්. ඔහුගේ ස්වභාවය පාපමිත්‍රතාව යි.

පුද්ගලයාගේ, ද්වේෂ මූල දෙසිත ද, තත් සම්ප්‍රයුක්ත දෙවිසි චෛතසිකය ද ලැබෙන්නාහ.

පාපමිත්තතා ච - යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, පාපමිත්‍රයන් භජනය කිරීමේ වරද නොදැනීම් වශයෙන් ද, ඔවුන් කෙරෙහි ඇලුම් කිරීම් වශයෙන් ද, පහළ වන්නා වූ ලෝභ මූල සිත් අට ද, මෝහ මූල සිත් දෙක ද, තත් සම්ප්‍රයුක්ත දෝස චතුෂ්ක වර්ජිත චෛතසික තෙවිස්ස ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු). ශීලාදී ගුණයෙන් උසස් උතුමන් විසින් අවවාද අනුශාසනා කිරීමේ දී ද පටහැනි වචන කියන්නා වූ අවස්ථාවේදී උපදින ද්වේෂ මූල දෙසිත ද, , පාපමිත්‍රයන් භජනය කිරීමේ වරද නොදැනීම් වශයෙන් ද, ඔවුන් කෙරෙහි ඇලුම් කිරීම් වශයෙන් ද, පහළ වන්නා වූ ලෝභ මූල සිත් අට ද, මෝහ මූල සිත් දෙක ද, හැර සිත් 89, චෛතසික 52, රූප 28, නිර්වාණය දුකමුක්ත ය.

දොවචස්සතා දුකයයි.

18. සොවචස්සතා දුකය

සොවචස්සතා ච - කල්‍යාණමිත්තතා චාති.

සොවචස්සතා ච - අවවාද අනුශාසනා මුදුනින් පිළිගන්නා වූ පුද්ගලයාගේ ස්වභාව ලක්ෂණය නම් වූ, සෝවචස්සතා ධර්මයක් ඇත්තේය.

කල්‍යාණමිත්තතා ච - කල්‍යාණ මිත්‍රයන් කෙරෙහි භක්තිය පිළිගැනීම ඇත්තා වූ පුද්ගලයාගේ ස්වභාව ලක්ෂණය නම් වූ, කල්‍යාණමිත්තතා ධර්මයක් ඇත්තේය.[74]

---

74. **සොවචස්සතා** - (සුඛං වචො එතෙසන්'ති = සුවචො; සුවචස්ස කම්මං=සොවචස්සං; සොවචස්ස භාවො = සොවචස්සං) පහසුවෙන් අවවාද දිය හැකි අවවාද හිස් මුදුනින් පිළිගන්නා ස්වභාවය ඇති පුද්ගලයාගේ ඒ ස්වභාවයට හේතු වන්නා වූ මහාකුසල-ක්‍රියා චිත්තෝපාදය "සොවචස්සතා" නම් වේ.

සෝවචස්සතා ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ශීලාදී ගුණයෙන් උසස් උතුමන් විසින් අවවාද අනුශාසනා කිරීමේ දී ද, බුද්ධ ප්‍රඥප්ති විනය ධර්මයකින් අනුශාසනා කිරීමේ දී ද, ගෞරව සම්ප්‍රයුක්තව මුදුනින් පිළිගන්නා වූ පුද්ගලයාට ලැබෙන මහා කුසල මහා ක්‍රියා සිත් සොළස ද, තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික තෙතිස ද ලැබෙන්නාහ. (ද්විතීය පදයට ද එම ධර්මයෝ ම ලැබෙන්නාහ. ස්වරූප උදුරනු). අවවාද අනුශාසනා මුදුනින් පිළිගන්නා වූ අවස්ථාවේදී ද, කල්‍යාණ මිත්‍රයන් කෙරෙහි භක්තිය පිළිගැනීම ඇති වන අවස්ථාවේදී ද ඇතිවන මහා කුසල මහා ක්‍රියා සිත් සොළස ද, තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික තෙතිස හැර සිත් 89, චෛතසික 52, රූප 28 සහ නිර්වාණය දුකමුක්ත ය.

සොවචස්සතා දුකයයි.

19. ආපත්ති කුසලතා දුකය

ආපත්ති කුසලතා ච - ආපත්ති වුට්ඨාන කුසලතා චාති.

ආපත්ති කුසලතා ච - ආපත්ති දැනගැනීමෙහි දක්ෂ පුද්ගලයාගේ ස්වභාව ලක්ෂණය වූ, ආපත්ති කුසලතා ධර්මයක් ද ඇත්තේය.

ආපත්ති වුට්ඨාන කුසලතා ච - පැමිණි ඇවතින් නැගී සිටීමේ දක්ෂ පුද්ගලයාගේ ලක්ෂණය වූ, ආපත්ති වුට්ඨාන කුසලතා ධර්මයක් ද ඇත්තේය.[75]

කළ්‍යාණමිත්තතා - (කළ්‍යාණ මිත්‍රයන්ගේ ඇති පුද්ගලයාගේ හේතුව වන මහාකුසල-ක්‍රියා චිත්තෝත්පාදය "කළ්‍යාණමිත්තතා" නම් වේ.)

75. **ආපත්ති කුසලතා** - (පඤ්ච පි ආපත්තික්ඛන්ධා ආපත්තියො. සත්තපි ආපත්තික්ඛන්ධා ආපත්තියො'ති එවං වුත්තාසු ආපත්තීසු කුසලභාවො = ආපත්තිකුසලතා). මාතිකාවල ඇතුලත් "පාරාජිකා, සංඝාදිසේස, පාචිත්තිය, පාටිදේසනීය, දුකුළා" යන ඇවැත් කඳු ද, පදභාජනීය සහ ඛන්ධකයන්හි ඇතුලත් "පාරාජිකා, සංඝාදිසේස, ථුල්ලච්චය, පාචිත්තිය, පාටිදේසනීය, දුකුළා, දුබ්භාසිත" යන ඇවැත්

ආපත්ති කුසලතා ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, සප්ත ආපත්තිස්කන්ධයන් දැනගැනීමෙහි දක්ෂ පුද්ගලයාගේ ඥාණ සම්ප්‍රයුක්ත මහා කුසල මහා ක්‍රියා සිත් අටෙහි ප්‍රඥා චෛතසික අට දෙනා ලැබෙන්නාහ. ද්විතීය පදයාගේ ද, පැමිණි ඇවතින් නැගී සිටිමෙහි දක්ෂ පුද්ගලයාගේ එම ප්‍රඥා චෛතසික අට දෙනා ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු). ආපත්ති සහ ආපත්තීන්ගෙන් නැගී සිටීමේදී ඇතිවන මහාකුසල මහා ක්‍රියා ඥාන සම්ප්‍රයුක්ත සිත් හැර සෙසු සිත් 89, චෛතසික 52, රූප 28, නිර්වාණය දුකමුක්ත ය.

ආපත්ති කුසලතා දුකයයි.

20. සමාපත්ති කුසලතා දුකය

සමාපත්ති කුසලතා ච - සමාපත්ති වුට්ඨාන කුසලතා චාති.

සමාපත්ති කුසලතා ච - රූපාරූප ධ්‍යාන නම් වූ අෂ්ට සමාපත්තීන්හිද, නවානුපූර්ව විහාර සමාපත්තීන්හි ද දක්ෂතාව නම් වූ, සමාපත්ති කුසලතා ධර්මයක් ද ඇත්තේය.

සමාපත්ති වුට්ඨාන කුසලතා ච - අෂ්ඨ සමාපත්තියෙන් ද, නවානුපූර්ව විහාර සමාපත්තියෙන් ද නැගී සිටීමේ දක්ෂතාව නම් වූ සමාපත්ති වුට්ඨාන කුසලතා ධර්මයක් ද ඇත්තේය.[76]

කඳු සතෙහි දක්ෂ පුද්ගලයාගේ ඇති වීමට හේතු වන ප්‍රඥාව (ආපත්ති වස්තුව සහ ඒ ආපත්තිය පැහැදිලිව වටහා ගන්නා නුවණ) "ආපත්ති කුසලතා" නම් වේ.

ආපත්ති වුට්ඨාන කුසලතා - (තාහි ආපත්තීහි වුට්ඨානෙ කුසලභාවො- ආපත්ති වුට්ඨාන කුසලතා). ඒ ඇවැත්වලින් නැගී සිටීමේ දක්ෂ පුද්ගලයාගේ ඇති වීමට හේතු වන ප්‍රඥාව (කර්ම වාක්‍යය සමඟ ආපත්තියෙන් නැගිටීම වටහා ගන්නා නුවණ) "ආපත්ති වුට්ඨාන කුසලතා" නම් වේ.

76. **සමාපත්ති කුසලතා** - (සමාපත්තීසු කුසලභාවො = සමාපත්ති කුසලතා). ධ්‍යාන සමාපත්තීන් කෙරෙහි දක්ෂ පුද්ගලයාගේ ඇති වීමට

(ස්වරූපාර්ථ ආපත්ති කුසලතා දුකයට සමානමය, ඒ අනුව ස්වරූප උදුරනු.)

සමාපත්ති කුසලතා දුකයයි.

21. ධාතු කුසලතා දුකය

ධාතු කුසලතා ච - මනසිකාර කුසලතා චාති.

ධාතු කුසලතා ච - අටළොස් ධාතුන් දැන ගැනීමෙහි දක්ෂතාව නම් වූ, ධාතු කුසලතා ධර්මයක් ද ඇත්තේය.

මනසිකාර කුසලතා ච - අටළොස් ධාතුන් මෙනෙහි කිරීමෙහි දක්ෂතාව නම් වූ, මනසිකාර කුසලතා ධර්මයක් ද ඇත්තේය.[77]

හේතු වන ප්‍රඥාව (පරිකර්ම සහ අර්පණා වටහා ගන්නා නුවණ) "සමාපත්ති කුසලතා" නම් වේ.

සමාපත්ති වුට්ඨාන කුසලතා - (සමාපත්තීහි වුට්ඨානෙ කුසලභාවො = සමාපත්තිවුට්ඨානකුසලතා). අධිෂ්ඨාන කළ කාල පරිච්ඡේදය අවසානයේදී නිවැරදි ව සමාපත්තීන්ගෙන් නැගී සිටීමේ දක්ෂ පුද්ගලයාගේ ඇති වීමට හේතු වන ප්‍රඥාව "සමාපත්ති වුට්ඨාන කුසලතා" නම් වේ.

77. **ධාතු කුසලතා** - (අට්ඨාරසසු ධාතුසු කුසලභාවො = ධාතුකුසලතා). අටළොස් ධාතුන් කෙරෙහි දක්ෂ පුද්ගලයාගේ ඇති වීමට හේතු වන ප්‍රඥාව "ධාතු කුසලතා" නම් වේ. අටළොස් ධාතුන් සම්බන්ධව උද්ග්‍රහණ ප්‍රඥාව, මනසිකාර ප්‍රඥාව, ශ්‍රවණ ප්‍රඥාව, ධාරණ ප්‍රඥාව, යථාභූත ස්වභාවයන් දැන ගන්නා වූ ප්‍රඥාව මීට ඇතුලත් වේ.

මනසිකාර කුසලතා - (තාසං යෙව ධාතූනං මනසිකාරෙ කුසලභාවො = මනසිකාරකුසලතා). ඒ ධාතුන්ගේ ම මනසිකාරයෙහි දක්ෂ පුද්ගලයාගේ ඇති වීමට හේතු වන ප්‍රඥාව "මනසිකාර කුසලතා" නම් වේ. චක්ඛු ආදී ධාතුන්ගේ උද්ග්‍රහණය, ලක්ෂණාදිය සහ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ස්වභාවයන් මනසිකාරය මීට ඇතුලත් වේ. (සම්මර්ශනය, ප්‍රතිවේධය සහ ප්‍රත්‍යවේක්ෂණය) ඒ හේතුවෙන් මහා

ධාතු කුසලතා ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, අටළොස් ධාතූන් දැනගන්නා වූ, මහා කුසල මහා ක්‍රියා ඥාන සම්ප්‍රයුක්ත සිත් අටෙහි ද, අභිඥ දෙසිතෙහි ද, මාර්ග සිත් සතරෙහි ද, උපදින්නා වූ ප්‍රඥ, චෛතසික තුදුස ලැබෙන්නාහ. (ද්විතීය පදයට ද එසේම ය - ස්වරූප උදුරනු). අටළොස් ධාතූන් දැන ගැනීම සහ මනසිකාරය කරන මහා කුසල මහා ක්‍රියා ඥාන සම්ප්‍රයුක්ත සිත් සතර අභිඥා දෙසිත සතර මාර්ගයන්හි ඇති ප්‍රඥාව හැර සිත් හැර සෙසු සිත් 89, චෛතසික 52, රූප 28, නිර්වාණය දුකමුක්ත ය.

ධාතු කුසලතා දුකයයි

22. ආයතන කුසලතා දුකය

ආයතන කුසලතා ච - පටිච්චසමුප්පාද කුසලතාචාති.

ආයතන කුසලතා ච - දොළොස් ආයතනයන් දැන ගැනීමෙහි දක්ෂතාව නම් වූ, ආයතන කුසලතා ධර්මයක් ද ඇත්තේය.

පටිච්චසමුප්පාද කුසලතාච - ද්වාදසාංග පටිච්චසමුප්පාද ධර්මය දැන ගැනීමෙහි දක්ෂතාව නම් වූ, පටිච්චසමුප්පාද කුසලතා ධර්මයක් ද ඇත්තේය.[78] (ස්වරූපාර්ථ ධාතු කුසලතා දුකයට ම සමානය, ඒ

කුසල-මහා ක්‍රියා ඥාන සම්ප්‍රයුක්ත සිත්, අභිඥා සිත් දෙක, මාර්ග සිත් සතරෙහි ඇති ප්‍රඥාව ස්වරූපාර්ථ ලෙස ගනු ලැබේ.

78. **ආයතන කුසලතා** - (චක්ඛායතනාදීසු කුසලභාවො = ආයතනකුසලතා). චක්ඛායතනාදියෙහි දක්ෂ පුද්ගලයාගේ ඇති වීමට හේතු වන ප්‍රඥාව "ආයතන කුසලතා" නම් වේ.

ධාතු කුසලතා ආදියෙහි "උද්ග්‍රහණ, මනසිකාර, ශ්‍රවණ, සම්මර්ශන, ප්‍රතිවේධ, ප්‍රත්‍යවේක්ෂණ" යනාදි ප්‍රඥා සයක් ඇත. ඒ සය අතරින් ශ්‍රවණ, උද්ග්‍රහණ, ප්‍රත්‍යවේක්ෂණ ලෞකික වේ. ප්‍රතිවේධය

අනුව ස්වරූප උදුරනු.) දොළාස් ආයතන සහ ද්වාදසාංග පටිච්චසමුත්පාදය දැනගන්නා වූ මහා කුසල මහා ක්‍රියා ඥාන සම්ප්‍රයුක්ත සිත් සතර අභිඥා දෙසිත සතර මාර්ගයන්හි ඇති ප්‍රඥාව හැර සිත් හැර සෙසු සිත් 89, චෛතසික 52, රූප 28, නිර්වාණය දුකමුක්ත ය.

ආයතන කුසලතා දුකයයි

23. ඨාන කුසලතා දුකය

ඨාන කුසලතා ච - අට්ඨාන කුසලතා චාති.

ඨාන කුසලතා ච - ස්ථාන හෙවත් නියමිත - හේතුව - ප්‍රත්‍යය සමුදය - නිදනය - කාරණය පිළිබඳ දක්ෂතාව නම් වූ, ඨාන කුසලතා ධර්මයක් ද ඇත්තේය.

අට්ඨාන කුසලතා ච - අස්ථාන හෙවත්, නොම හේතුව - නොම ප්‍රත්‍යය - නොම සමුදය - නොම නිදනය - නොම කාරණය පිළිබඳ දක්ෂතාව නම් වූ, අට්ඨාන කුසලතා ධර්මයක් ද ඇත්තේය.[79]

ලෝකෝත්තර වේ. සම්මර්ශන, මනසිකාර සඳහා ලෞකික සහ ලෝකෝත්තර යන දෙක ම ලැබේ.

පටිච්ච සමුප්පාද කුසලතා - (ද්වාදසංගෙපටිච්චසමුප්පාදෙ කුසලභාවො = පටිච්චසමුප්පාදකුසලතා). දොළොස් අංගයක් ඇති පටිච්ච සමුප්පාදයෙහි දක්ෂ පුද්ගලයාගේ ඇති වීමට හේතු වන ප්‍රඥාව "පටිච්ච සමුප්පාද කුසලතා" නම් වේ.

79. **ඨාන කුසලතා** - (තස්මිං තස්මිං ඨානෙ කුසලභාවො = ඨානකුසලතා). ඒ ඒ හේතු කාරණයෙහි ලා දක්ෂ පුද්ගලයාගේ ඇති වීමට හේතු වන ප්‍රඥාව "ඨාන කුසලතාව" නම් වේ.

චක්ඛු ප්‍රසාදය රූපාරම්මණය අරමුණු කරමින් ඇති වන්නා වූ චක්ඛු විඤ්ඤාණය ඇති වේ ය යනාදී ආකාරයෙන් චක්ඛු විඤ්ඤාණාදීන්ගේ හේතුන් ද, අඹ බීජයකින් අඹ ගස හට ගනියි ආදී වශයෙන් ද දකින්නා

ඨාන කුසලතා ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, නියමිත හේතුව දැනීමෙහි දක්ෂ වූ ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල මහා ක්‍රියා සිත් අටෙහි ද, අභිඥ දෙසිතෙහි ද උපදින්නා වූ ප්‍රඥ චෛතසික දස දෙනා ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු)

අට්ඨාන කුසලතා ච - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, පොල් ගෙඩියෙන් තල් පැලයක් හට නොගන්නා සේ. චක්ෂු ප්‍රසාදය සෝත විඥනයට හෙතුවක් නොවන්නේය. යනාදී වශයෙන් අස්ථාන හෙවත් නොම හේතුව දැනීමෙහි සමත් වූ, ඉහත සඳහන් ප්‍රඥ චෛතසික දස දෙනා ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු). අස්ථානය සහ ස්ථානය දැන ගැනීම සිදුකරන මහා කුසල මහා ක්‍රියා ඥාන සම්ප්‍රයුක්ත සිත් සතර අභිඥා දෙසිත සතර මාර්ගයන්හි ඇති ප්‍රඥාව හැර සිත් හැර සෙසු සිත් 89, චෛතසික 52, රූප 28, නිර්වාණය දුකමුක්ත ය.

ඨාන කුසලතා දුකයයි

24. අජ්ජව දුකය

අජ්ජවො ච - මද්දවො චාති.

වූ මහා කුසල-මහා ක්‍රියා අභිඥා සිත් දෙකෙහි ඇති ප්‍රඥාව "ඨාන කුසලතා" වේ යැයි අදහස් කෙරේ.

අට්ඨානකුසලතා - (අට්ඨානෙ කුසලභාවො = අට්ඨානකුසලතා). ඒ ඒ හේතු කාරණයෙහි ලා දක්ෂ භාවය ඨාන කුසලතාවය. අහේතු අකාරණයෙහි ලා දක්ෂ භාවය අට්ඨාන කුසලතාව යි.

චක්ඛු ප්‍රසාදය ශබ්දාරම්මණය අරමුණු කරමින් සෝත විඤ්ඤාණය ඇති නො වේ ය යනාදි ආකාරයෙන් සෝත විඤ්ඤාණාදීන්ගේ හේතුන් නොවන බව ද, අඹ බීජයකින් දඹ ගස හට නො ගනියි ආදී වශයෙන් ද හේතුන් නොවන දේ දකින්නා වූ මහා කුසල-මහා ක්‍රියා අභිඥා සිත් දෙකෙහි ඇති ප්‍රඥාව "ඨාන කුසලතා" වේ යැයි අදහස් කෙරේ.

අජ්ජවො ච - අවංක අකුටිල ඍජු සිත් ඇති පුද්ගලයාගේ ස්වභාවය නම් වූ, අජ්ජව ධර්මයක් ඇත්තේය.

මද්දවො ච - මෘදු මොළොක් සිත් ඇති පුද්ගලයාගේ ස්වභාවය නම් වූ, මද්දව ධර්මයක් ද ඇත්තේය.[80]

(මෙහි පළමු පදයට කායුජ්ජුකතා - චිත්තුජ්ජුකතා චෛතසික දෙක ද, දෙවැනි පදයට කාය මුදුතා - චිත්ත මුදුතා චෛතසික දෙක ද ලැබෙති, සෙස්ස දුක මුක්ත ය. ස්වරූප උදුරනු).

අජ්ජව දුකයයි.

25. ඛන්තී දුකය

ඛන්තී ච - සොරච්චඤ්චාති.

ඛන්තී ච අධිවාසන ක්ෂාන්තිය හෙවත් ඉවසීම් ස්වභාව ඇත්තා වූ ඛන්තී නම් ධර්මයක් ඇත්තේය.

සොරච්චඤ්ච - සුරත බව හෙවත් සීලාදී ගුණ ධර්මයෙහි ඇල්ම නම් වූ සෝරච්ච ධර්මයක් ද ඇත්තේය.[81]

---

80. **අජ්ජවො** - (උජුභාවො = අජ්ජවො). තිදොර පැවැත්මෙහි ඍජු බව සඳහා හේතු වන්නා වූ කායුජ්ජුකතා, චිත්තුජ්ජුකතා චෛතසික "අජ්ජව" නම් වේ.

මද්දවො - (මුදුභාවො = මද්දවො). මෘදු මොළොක් බව සඳහා හේතු වන්නා වූ කායමුදුතා, චිත්තමුදුතා චෛතසික "මද්දව" නම් වේ.

81. **ඛන්ති** - (අධිවාසනසංඛතො ඛමනභාවො = ඛන්ති). අධිවාසන නම් වූ ඉවසන සුළු බව ඛන්තිය යි. අන් පුද්ගලයන්ගේ විරුද්ධ කායික ක්‍රියා සහ අපවාදයන්වලට එකටෙක නොකර, දරාගන්නා වූ ස්වභාවය යි. පරමාර්ථ වශයෙන් අද්වේෂය ප්‍රධාන වූ මහා කුසල මහා ක්‍රියා චිත්තෝත්පාදය යි.

ඛන්තී ච - යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ඉවසීම නම් වූ අද්වේෂය ප්‍රධාන වූ, මහා කුසල මහා ක්‍රියා සිත් සොළස ද, තත් සම්ප්‍රයුක්ත වූ අටතිස් චෛතසිකයෝ ද ලැබෙන්නාහ. දෙවන පදයට සීල චේතනාව ප්‍රධාන කොට ඇත්තා වූ මහා කුසල මහා ක්‍රියා සිත් සොළස ද, අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික සතිස ද ලැබෙති, (ස්වරූප උදුරනු) අධිවාසනා ක්ෂාන්තිය ඇති ද්වේෂය සීලාදී ගුණ ධර්මයන් දක්වන්නා වූ මහා කුසල මහා ක්‍රියා හැර ලෞකික සිත් 81, චෛතසික 52, රූප 28 සහ නිර්වාණය දුක මුක්ත ය.

ඛන්තී දුකයයි

26. සාබල්‍ය දුකය

සාබල්‍යඤ්ච - පටිසන්ථාරෝ චාති.

සාබල්‍යඤ්ච - මෘදු මොළොක් පරිපූර්ණ වචන කථා කරන්නාගේ ස්වභාවය නම් වූ, සාබල්‍යතා ධර්මයක් ද ඇත්තේය.

පටිසන්ථාරෝ ච - ධර්ම ප්‍රතිසන්ථාර - ආමිස ප්‍රතිසන්ථාර නම් වූ, පිළිසඳර පැවැත්වීමේ පටිසන්ථාර ධර්මයක් ද ඇත්තේය.[82]

සොරච්චං - (සුරතභාවො = සොරච්චං). උතුම් වූ කාය, වාග්, මනෝ සුචරිතයන්හි ප්‍රමෝදයට පත්වන පුද්ගලයාගේ හේතුව වන මහා කුසල මහා ක්‍රියා ලෝකෝත්තර චිත්තෝත්පාද "සොරච්ච" නම් වේ. පිරිසිදු සුසිල්වත් බව "සොරච්ච" නම් වේ යැයි අදහස් වේ.

82. **සාබල්‍යං** - (සම්මොදකමුදුභාවසංඛාතො සඛිලභාවො = සාබල්‍යං). සතුටු මුහුණින් යුතු වූ සාදර ගෞරව පිරිපුන් වචන ඇති බව පුද්ගලයාගේ හේතුව වන මහා කුසල මහා ක්‍රියා චිත්තෝත්පාදයන් "සාබල්‍ය" නම් වේ. (යා තත්ථ සණ්හවාචතා සඛිලවාචතා අඵරුසවාචතා ඉදං වුච්චති සාබල්‍යං).

පටිසන්ථාරෝ - (ධම්මාමිසෙහි පටිසන්ථරණං = පටිසන්ථාරෝ). - ධර්මයෙන් ආමිසයෙන් සංග්‍රහ කරන බව පටිසන්ථාරය යි.

සාඛල්‍යඤ්ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, මෘදු මොළොක් වචන භාවිතයේ දී උපදින්නා වූ මහා කුසල මහා ක්‍රියා සිත් සොළස ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකයෝ ද ලැබෙන්නාහ. දෙවැනි පදයට වනාහි, කුදු මහත් වත් පිළිවෙත් පිරීමේ දි උපදින ඉහත සඳහන් ධර්මයෝම ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු), මෘදු මොළොක් වචන භාවිතයේ දී උපදින්නා වූ ද, කුදු මහත් වත් පිළිවෙත් පිරීමේ දි උපදින්නා වූ ද මහා කුසල මහා ක්‍රියා සිත් හැර සිත් 89, චෛතසික 52, රූප 28 සහ නිර්වාණය දුක මුක්ත ය.

සාඛල්‍ය දුකයයි.

27. ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා දුකය

ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා ච - භොජනෙ අමත්තඤ්ඤුතා චාති.

ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා ච - චක්ෂුරාදී ෂඩේන්ද්‍රියන් හි අසංවර ස්වභාව නම් වූ, ධර්මයක් ද ඇත්තේය.

භෝජනෙ අමත්තඤ්ඤුතා ච - සිවුපස පරිභෝගයෙහි පමණ නොදන්නා ස්වභාව නම් වූ, ධර්මයක් ද ඇත්තේය.[83]

ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, සදොර අසංවර වීමේ දී උපදින ලෝභ මූල - ද්වේෂ මූල සිත් දසය ද, විචිකිච්ඡා වර්ජිත චෛතසික සවිස්ස ද ලැබෙන්නාහ. දෙවැනි පදයට වනාහි,

---

83. **ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා** - (ඉන්ද්‍රියසංවරභෙදසංඛාතො මනච්ඡට්ඨෙසු ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරභාවො = ඉන්ද්‍රියෙසුඅගුත්තද්වාරතා). ඉන්ද්‍රිය සංවරය බිඳීම නම් වූ මනායතනය සවැනි කොට ඇති ඉන්ද්‍රියන් කෙරෙහි දොර නොවැසූ බව ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතාව යි.

භෝජනෙ අමත්තඤ්ඤුතා - (පටිග්ගහණපරිභොගවසෙන මත්තං අජානනභාවො = භොජනෙඅමත්තඤ්ඤුතා). - සිවුපසය පිළිගැනීමෙහි ද, පරිභෝගයෙහි ද පමණ නොදන්නා බව භෝජනෙ අමත්තඤ්ඤුතාව යි.

පටුන වෙත

සිවුපසයෙහි පමණ නොදැනීමේ දී උපදින ලෝභ මූල - මෝහ මූල සිත් දසය ද, දෝස චතුෂ්ක වර්ජිත චෛතසික තෙවිස්ස ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු) කුසල් සිත් 21, විපාක සිත් 36, ක්‍රියා සිත් 20, චෛතසික 38, රූප 28 සහ නිර්වාණය දුකමුක්ත ය.

ඉන්ද්‍රියේසු අගුත්තද්වාරතා දුකයයි.

28. ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා දුකය

ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා ච - භෝජනෙ මත්තඤ්ඤුතා චාති.

ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා ච - චක්ෂුරාදී ෂඩේන්ද්‍රියන් හි සංවර ස්වභාව නම් වූ, ධර්මයක් ද ඇත්තේය.

භොජනෙ මත්තඤ්ඤුතා ච - සිවුපස පරිභෝගයෙහි පමණ දන්නා ස්වභාව නම් වූ, ධර්මයක් ද ඇත්තේය.[84]

ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා - නම් වූ ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, මහා කුසල මහා ක්‍රියා සිත් සොළස ද, ලෝකෝත්තර සිත් අට ද, අටතිස් චෛතසික ද ලැබෙන්නාහ. දෙවැනි පදයට වනාහි ප්‍රත්‍යවේක්ෂාවෙන් සිවුපස පරිභෝගයේ දී උපදින, මහා කුසල මහා ක්‍රියා සිත් සොළස ද, විරති අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික තෙතිස ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු) මහා කුසල මහා ක්‍රියා සිත් හැර ලෞකික සිත් 65 චෛතසික 52, රූප 28 සහ නිර්වාණය දුක මුක්ත ය.

ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා දුකයයි.

---

84. **ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා** - (ඉන්ද්‍රියසංවරභෙදසංඛාතො මනච්ඡට්ඨෙසු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරභාවො = ඉන්ද්‍රියෙසුගුත්තද්වාරතා). ඉන්ද්‍රිය සංවරය බිඳීම නම් වූ මනායතනය සවැනි කොට ඇති ඉන්ද්‍රියන් කෙරෙහි දොර වැසූ බව ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතාව යි.

භොජනෙ මත්තඤ්ඤුතා - (පටිග්ගහණපරිභොගවසෙන මත්තං ජානනභාවො = භොජනෙමත්තඤ්ඤුතා). - සිවුපසය පිළිගැනීමෙහි ද, පරිභෝගයෙහි ද පමණ දන්නා බව භෝජනෙ මත්තඤ්ඤුතාව යි.

29. මුට්ඨ සච්ච දුකය

මුට්ඨ සච්චඤ්ච - අසම්පජඤ්ඤඤ්චාති.

මුට්ඨ සච්චඤ්ච - සිහි මුලා බව නම් වූ මුට්ඨස්සති ධර්මයක් ද ඇත්තේය.

අසම්පජඤ්ඤඤ්ච - සාර්ථක - සත්ප්‍රාය - ගෝචර - අසම්මෝහ නම් වූ සතර සම්‍යග්ප්‍රඥාවෙන් තොර වූ ස්වභාවය නම් වූ, අසම්ප්‍රජණ්‍ය ධර්මයක් ද ඇත්තේය.[85]

මුට්ඨසච්චඤ්ච - සතියට ප්‍රතිපක්ෂ වන අකුසල සිත් දොළොස ද තත් සම්ප්‍රයුක්ත සත්විසි චෛතසිකයන් ද ලැබෙන්නේ ය.

අසම්පජඤ්ඤඤ්ච - ප්‍රඥාවට ප්‍රතිපක්ෂ වන අකුසල සිත් දොළොස ද තත් සම්ප්‍රයුක්ත සත්විසි චෛතසිකයන් ද ලැබෙන්නේ ය. (ස්වරූප උදුරනු) කුසල් සිත් 21, විපාක සිත් 36, ක්‍රියා සිත් 20, චෛතසික 38, රූප 28 සහ නිර්වණය දුක මුක්ත ය.

මුට්ඨ සච්ච දුකයයි.

30. සති දුකය

සති ච - සම්පජඤ්ඤඤ් චාති.

සතිච - ඇත අතීතයේ දී කළ කී දේ නම් වූ චිරකෘතාදිය සිහි කිරීමෙහි සමත් බව නම් වූ, ස්මෘති ධර්මයක් ද ඇත්තේය.

---

85. **මුට්ඨසච්චං** - (මුසති පමුස්සතී'ති = මුට්ඨං; මුට්ඨා සති එතස්සා'ති = මුට්ඨසති; මුට්ඨසතිනො භාවො = මුට්ඨසච්චං). සිහි මුලා බව නම් වූ මුට්ඨස්සති බව ඇති පුද්ගලයාගේ හේතුව වන අකුසල චිත්තෝත්පාදය "මුට්ඨසච්ච" නම් වේ.

අසම්පජඤ්ඤං - (සම්පජානා'ති = සම්පජානො; න සම්පජානො = අසම්පජානො; අසම්පජඤ්ඤස්ස භාවො=අසම්පජඤ්ඤං). නුවණින් මෙනෙහි නොකරන බව ඇති පුද්ගලයාගේ හේතුව වන අකුසල චිත්තෝත්පාදය "අසම්පජඤ්ඤ" නම් වේ.

සම්පජඤ්ඤඤ්ච - සාර්ථකාදී සතර සම්‍යග් ප්‍රඥාවෙන් සමන්විත බව නම් වූ සම්ප්‍රජණ්‍ය ධර්මයක් ද ඇත්තේය.[86]

සතිච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, එකම සති චෛතසිකය ලැබෙන්නේය. දෙවැනි පදයට එකම ප්‍රඥ චෛතසිකය ලැබෙන්නේය. (ස්වරූප උදුරනු) සිත් 89, සති ප්‍රඥා හැර චෛතසික 52, රූප 28 සහ නිර්වාණය දුකමුක්ත ය.

සති දුකයයි.

31. පටිසංඛාන දුකය

පටිසංඛාන බලඤ්ච - භාවනා බලඤ්චාති.

පටිසංඛාන බලඤ්ච - ප්‍රත්‍යවේක්ෂා කිරීම් වශයෙන් නොසැලෙන බලවත් බවට පත් වූ ප්‍රඥව නම් වූ පටිසංඛාන බල ධර්මයක් ද ඇත්තේය.

භාවනා බලඤ්ච - නුවණින් වීර්‍යත් පෙරටු කොට ගෙන සප්ත බොජ්ඣංග ධර්ම වැඩීමේ දී ලැබෙන්නා වූ නොසැලෙන සුළු භාවනා බල නම් වූ ධර්මයක් ද ඇත්තේය.[87]

---

86. **සති** -(සරතීති = සති). ඈත අතීතයේ කළ කී දේ පවා සිහි කෙරෙනුයි සති නම් වේ.

සම්පජඤ්ඤං - (සම්පජානාතී'ති = සම්පජඤ්ඤං). සාර්ථක ආදී සතරාකාරයෙන් නුවණින් මෙනෙහි කරන ධර්මය "සම්පජඤ්ඤ" නම් වේ.

දෙවන ක්‍රමය - (සම්පජානාතී'ති = සම්පජානො; සම්පජඤ්ඤස්ස භාවො = සම්පජඤ්ඤං). සාර්ථක ආදී සතරාකාරයෙන් නුවණින් මෙනෙහි කරන පුද්ගලයාගේ ස්වභාවය වූ හේතුවන කුසල ඥානය "සම්පජඤ්ඤ" නම් වේ.

87. **පටිසංඛානබලං** - (අප්පටිසංඛානෙ අකම්පනට්ඨෙන පටිසංඛානසංඛාතං බලං = පටිසංඛානබලං). ප්‍රත්‍යවේක්ෂාවෙහි නොසැලෙන බව නම් වූ බලය පටිසංඛාන බලයයි. කරුණු කාරණා

පටිසංඛාන බලඤ්ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ප්‍රඥා චෛතසිකය ලැබෙන්නේය. දෙවැනි පදයට වනාහි කුශල් සිත් එක් විසි දෙනා ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස් දෙනා ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු) අකුසල් සිත් 12, විපාක සිත් 36, ක්‍රියා සිත් 20, ප්‍රඥාව හැර චෛතසික 51, රූප 28, නිර්වාණය දුකමුක්ත ය.

පටිසංඛාන දුකයයි.

32. සමථ දුකය

සමථො ච - විපස්සනා චාති.

සමථො ච - කුශලයට පටහැනි වූ නීවරණාදී උපක්ලේශයන් සංසිඳුවීමෙහි සමත් වූ සමථ නම් ධර්මයක් ද ඇත්තේය.

විපස්සනා ච - තෛත්‍රභූමික නාමරූප සංස්කාරයන් ස්කන්ධාදී වශයෙන් ද අනිත්‍යාදී වශයෙන් ද විවිධාකාරයෙන් දකින්නා වූ විපස්සනා ඤාණ නම් වූ ධර්මයක් ද ඇත්තේ ය.[88]

අනුව දකින්නා වූ ඥානය යැයි කියනා ලද බලය "පටිසංඛානබල" නම් වේ යැයි අදහස් කෙරේ. ඒ පටිසංඛන නම් වූ ඥානය කරුණු කාරණා වශයෙන් දැකීමට නොහැකි මෝහය හේතුවෙන් නොසැලේ. එම නිසා බල ශබ්දය එකතු කොට පටිසංඛාන බල යැයි කියනු ලැබේ.

භාවනාබලං - (විරියසීසෙන සත්තබොජ්ඣංගෙ භාවෙන්තස්ස උප්පන්නං බලං = භාවනාබලං). වීර්ය ප්‍රධාන කොට සප්ත බොජ්ඣංග වඩන්නාගේ බලය භාවනා බලය නම් වේ.

88. **සමථො** - (පච්චනිකධම්මෙ සමෙතී'ති = සමථො. අනිච්චාදීවසෙන විවිධෙන ආකාරෙන පස්සතී'ති = විපස්සනා). චිත්ත සමාධියට පටහැනි වූ නීවරණාදී උප්ක්ලේශ ධර්ම සංසිඳුවන්නේ නුයි සමථ නම් වේ.

විපස්සනා - (විවිධෙන ආකාරෙන පස්සතී'ති = විපස්සනා). අනිච්චාදීවසෙන විවිධෙන ආකාරෙන පස්සතී'ති = විපස්සනා.

සමථො ච - යන ප්‍රථම පදයා ගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ඒකාග්‍රතා චෛතසිකය ලැබෙන්නේය. දෙවැනි පදයට වනාහි ප්‍රඥ චෛතසිකය ලැබෙන්නේය. (ස්වරූප උදුරනු) සිත් 89, ශෝභන චිත්තයන්හි ඇති ඒකග්‍රතා ප්‍රඥා චෛතසික හැර චෛතසික 51, රූප 28 සහ නිර්වාණය දුකමුක්ත ය.

සමථ දුකයයි.

33. සමථ නිමිත්ත දුකය

සමථ නිමිත්තඤ්ච - පග්ගාහ නිමිත්තඤ් චාති.

සමථ නිමිත්තඤ්ච - උපචාර අර්පණා සමාධියට කාරණ වූ සමථ නිමිත්ත නම් වූ ධර්මයක් ද ඇත්තේය.

පග්ගාහ නිමිත්තඤ්ච - සම්‍යක් ව්‍යායාමයට කාරණ වූ පග්ගාහ නිමිත්ත නම් වූ ධර්මයක් ද ඇත්තේය.[89]

සමථ නිමිත්තඤ්ච - යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, පශ්චිම පශ්චිම උපචාර අර්පණා ධ්‍යානයට හේතු වන්නා වූ පූර්ව පූර්ව සමාධිය ලැබෙන්නේය. දෙවැනි පදයට වනාහි, පශ්චිම පශ්චිම සම්‍යක් ව්‍යායාම වීර්යයට හේතු වන්නා වූ, පූර්ව පූර්ව සම්‍යක් ව්‍යායාම වීර්යය ලැබෙන්නේය. (ස්වරූප උදුරනු) සිත් 89, සම්මා සමාධි සම්මා වායාම හැර චෛතසික 52, රූප 28 සහ නිර්වාණය දුකමුක්ත ය.

අනිත්‍ය, දුක්ඛ, අනත්ත, අසුභාදී විවිධාකාරයෙන් නුවණින් බලන්නේ නුයි විපස්සනා නම් වේ.

89. **සමථ නිමිත්තං** - (සමෙථො ච තං ආකාරං ගහෙත්වා පුන පවත්තෙතබ්බස්ස සමථස්ස නිමිත්තංචා'ති = සමථ නිමිත්තං, පග්ගහනිමිත්තෙපි එසෙව නයො). පෙර පෙර සමථය ම, ඒ නිමිත්ත ගෙන නැවත පැවැත්විය යුතු පසුව උපදින සමථයේ නිමිත්ත වශයෙන් වේනුයි "සමථ නිමිත්ත නම් වේ. පග්ගහනිමිත්තෙහි ද මේ ක්‍රමය ම යි.

සමථ නිමිත්ත දුකයයි.

34. පග්ගාහ දුකය

පග්ගාහො ච - අවික්ඛේපො චාති.

පග්ගාහො ච - සම්ප්‍රයුක්ත චිත්ත චෛතසික ධර්මයන්ට රුකුල් දෙන්නා වූ, පග්ගාහ වීර්යය නම් වූ ධර්මයක් ද ඇත්තේය.

අවික්ඛේපො ච - සම්ප්‍රයුක්ත චිත්ත චෛතසික ධර්මයන් විසිර යා නොදී ඒකග්‍රතාවෙහි පිහිටුවන්නා වූ, අවික්ෂේප නම් වූ ධර්මයක් ද ඇත්තේය.[90]

පග්ගාහො ච - යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, වීර්ය චෛතසිකය ද දෙවැනි පදයට ඒකාග්‍රතා චෛතසිකය ද ලැබෙන්නේය. (ස්වරූප උදුරනු). සිත් 89, සම්මා සමාධි වායාම සම්මා සමාධි හැර චෛතසික 52, රූප 28 සහ නිර්වාණය දුකමුක්ත ය.

පග්ගාහ දුකයයි.

35. සීල විපත්ති දුකය

සීල විපත්ති ච - දිට්ඨි විපත්ති චාති.

සීල විපත්ති ච - සමාදන්වී ගන්නා ලද ශීලයාගේ සිකපද බිඳීම නම් වූ සීල විපත්ති ධර්මයක් ද ඇත්තේය.

---

90. **පග්ගාහො** - (සම්පයුත්තධම්මේ පග්ගණ්හාතී'ති = පග්ගාහො). සම්ප්‍රයුක්ත චිත්ත චෛතසික ධර්මයන්ට රුකුල් දී ඔසවා තබන්නේ නුයි "පග්ගාහ" නම් වේ.

අවික්ඛෙපො - (චිත්තං වික්ඛිපතීති = වික්ඛෙපො; න වික්ඛෙපො = අවික්ඛෙපො). සිත විසිරීමට පත් කරවන උද්ධච්චය "වික්ඛෙප" නම් වේ. ඒ උද්ධච්චය මෙන් සිත විසිරීමට ලක් නොකර චිත්ත චෛතසික ධර්මයන් විසිර යාමට ඉඩ නොදෙන්නේ නුයි "අවික්ඛෙප" නම් වේ.

දිට්ඨි විපත්ති ච - විපරීත දෘෂ්ඨි නම් වූ දිට්ඨි විපත්ති ධර්මයක් ද ඇත්තේය.[91]

සීල විපත්ති ච - යන ප්‍රථම පදයා ගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, අකුශල සිත් දොළස ද තත් සම්ප්‍රයුක්ත චෛතසික සත් විස්ස ද ලැබෙන්නාහ. දෙවැනි පදයට වනාහි, මිථ්‍යා දෘෂ්ඨි චෛතසිකය ම ලැබෙන්නේය. (ස්වරූප උදුරනු). කුසල් සිත් 21, විපාක සිත් 36, ක්‍රියා සිත් 21, චෛතසික 38, රූප 28, නිර්වාණය දුකමුක්ත ය.

සීල විපත්ති දුකයයි.

36. සීල සම්පද දුකය

සීල සම්පද ච - දිට්ඨි සම්පද චාති.

සීල සම්පද ච - අඛණ්ඩ අච්ඡිද්‍රාදී වශයෙන් රක්නා ලද සීල සම්පත්තියාගේ පරිපූර්ණ භාවය නම් වූ, සීල සම්පද ධර්මයක් ද ඇත්තේය.

දිට්ඨි සම්පද ච - සම්‍යක් දෘෂ්ඨියගේ පරිපූර්ණ භාවය නම් වූ, දිට්ඨි සම්පද ධර්මයක් ද ඇත්තේය.[92]

---

91. **සීලවිපත්ති** - (සීලවිනාසකා අසංවර සංඛාතා සීලස්ස විපත්ති = සීලවිපත්ති). සීලය නසන අසංවර බව නම් වූ විපත සීලවිපත්තිය යි.

දිට්ඨිවිපත්ති - (සම්මාදිට්ඨිවිනාසකා මිච්ඡාදිට්ඨි සංඛාතා දිට්ඨියා විපත්ති = දිට්ඨිවිපත්ති). සම්‍යක් දෘෂ්ඨිය නසන මිසදිටු බව නම් වූ විපත දිට්ඨිවිපත්තිය යි.

92. **සීලසම්පද** - (සොරච්චමෙව සීලස්ස සම්පාදනතො සීලපරිපූරණතො සීලස්සසම්පද = සීලසම්පද). සුරත බවම - සංවර බවම සීලය සම්පාදනය කරන බැවින් - සීලය පුරණ බැවින් සීලසම්පද නම් වේ. නික්ෂේප කාණ්ඩ පාලියෙහි "සබ්බොපි සීලසංවරො සොරච්චං" (හැම සීලසංවර "සොරච්ච" නමි) යනුවෙන් සොරච්ච පදයෙහි නිර්දේශයේ ද සීලසම්පදා පදයෙහි නිර්දේශයේ ද

සීල සම්පදා ච - යන ප්‍රථම පදයා ගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, සීල සම්පන්නයාගේ, මහා කුශල මහා ක්‍රියා සිත් සොළස ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද ලැබෙන්නාහ. දෙවැනි පදයට වනාහි සම්‍යක් දෘෂ්ටි නම් වූ, ප්‍රඥා චෛතසිකය

ස්වරූපාර්ථ සමාන වන ආකාරයට දක්වා වදාළහ. එබැවින් " සොරච්ච, සීලසම්පදා" පද දෙකෙහි ස්වරූපාර්ථ සඳහා පිරිසිදු වූ සුසිල්වත් හේතු ශීලය සහ ඵල ශීලය (ලෞකික ශීල, ලෝකෝත්තර ශීල) සියල්ල උද්ධරණය කළ යුතු වේ ය යන්න දැක්වීම සඳහා " සොරච්චමෙව - පෙ- සීලසම්පදා" යනුවෙන් දැක්වූහ.

සීලස්ස-ශීලයාගේ; සම්පදා-පරිපූර්ණ බව; සීලසම්පදා. ද්‍රව්‍යයන් දෙකක් පැවතීමෙන් ම සම්පූර්ණ වන යමක් සඳහා පළමු ද්‍රව්‍යය දෙවෙනි ද්‍රව්‍යයෙහි පරිපූර්ණ බවට ද හේතු වන අතර, දෙවැනි ද්‍රව්‍යය ද පළමු ද්‍රව්‍යයේ පරිපූර්ණ බවට හේතු වන්නාක් මෙන් මුලින් උපදින හේතු (කාරණ) ශීලය පසුව උපදින ඵල සීලයෙහි පරිපූර්ණ භාවයට හේතුව වන අතර පසුව උපදින ඵල ශීලය මුලින් උපදින කාරණ (හේතු) සීලයෙහි පරිපූර්ණ බවට හේතුව වේ.

මේ අනුව "සීලසම්පදා" යන්නෙහි හේතු ශීලය හෝ වේවා ඵල ශීලය හෝ වේවා එක් වර්ගයක් පමණක් ගත යුතු වුව ද එක් එක් අවයවයකගේ සීලසම්පදා යන නම සීල යන සමුදායෙහි ප්‍රකට කරමින් ඒකදේසූපචාර වශයෙන් සියලු ම ශීලයන් සීලසම්පදා යැයි ගත යුතු බව පෙනේ. (සීලසම්පදාති කාරණසීලම්පි ඵලසීලම්පි සම්පන්නසමුදායස්ස එකදෙසෙන වුත්තං-ටීකා).

(නමුත් සීලසම්පදා පදයේ ස්වරූපාර්ථ සඳහා ලෞකික ශීලය පමණක් ගැනීමට හේතුව සීලවිසුද්ධි පදයේ පැහැදිලි කිරීමෙහි දැක්වේ).

දිට්ඨිසම්පදා - (දිට්ඨිපරිපූරිභූතං ඤාණං දිට්ඨියා සම්පද'ති = දිට්ඨිසම්පදා). සුරත බවම සම්මා දිට්ඨියගේ පිරිපුන් බව නම් වූ ඤාණය ම දිට්ඨිසම්පදා නම් වේ. කම්මස්සකතා සම්මාදිට්ඨිය, ධ්‍යාන සම්මාදිට්ඨිය, විදර්ශනා සම්මා දිට්ඨිය, මාර්ග සම්මාදිට්ඨිය, ඵල සම්මාදිට්ඨිය මෙයට ඇතුලත් වේ.

ලැබෙන්නේය. (ස්වරූප උදුරනු). අකුසල් සිත් 12, අහේතුක සිත් 18, මහා විපාක සිත් 8, මහද්ගත ලෝකෝත්තර සිත් 35, ප්‍රඥාව හැර චෛතසික 51, රූප 28 සහ නිර්වාණය දුකමුක්ත ය.

සීල සම්පද දුකයයි.

37. සීල විසුද්ධි දුකය

සීල විසුද්ධි ච - දිට්ඨි විසුද්ධි චාති.

සීල විසුද්ධි ච - සිවු පිරිසිදු සීලයක් ඇති බව හෙවත්, පරිපූර්ණ සිල් ඇති බව නම් වූ සීල විසුද්ධි ධර්මයක් ද ඇත්තේය.

දිට්ඨි විසුද්ධි ච - පිරිසිදු සම්‍යක් දෘෂ්ඨි ඇති බව හෙවත්, සම්‍යක් දෘෂ්ඨියගේ පරිපූර්ණ බව නම් වූ දිට්ඨි විසුද්ධි ධර්මයක් ද ඇත්තේය.[93]

---

93. **සීලවිසුද්ධි** - (විසුද්ධිභාවං සම්පත්තා සීලසංඛාතා සීලස්ස විසුද්ධි = සීලවිසුද්ධි). විසුද්ධ බවට පැමිණියා වූ සීලය ම සීලවිසුද්ධි නම් වේ.

"සබ්බොපි සීලසංවරො සීලසම්පදා" (හැම ශීලසංවර ශීලසම්පද නමි) යැයි ද, "සබ්බොපි සීලසංවරො සීලවිසුද්ධි" (හැම ශීලසංවරය ශීලවිශුද්ධි යි) යැයි ද නික්ෂේප කාණ්ඩ පාලියේ වදාළ බැවින් මෙම පද දෙකෙහි ස්වරූපාර්ථ සඳහා මහාකුසල, මහාක්‍රියා, ලෝකෝත්තර චිත්තෝත්පාදයන් ගැනීමට සුදුසු බව පෙනේ. නමුත් "සීලවිසුද්ධිනිද්දෙසො කිඤ්චාපි සීලසම්පදානිද්දෙසෙන සමානො. තත්ථ පන විසුද්ධිසම්පාපකං පාතිමොක්ඛසංවරසීල කථිතං. ඉධ විසුද්ධිප්පත්තං සීලං" (සීලවිසුද්ධි නිර්දේශය සීලසම්පදා නිර්දේශය හා සමාන ය. සීලසම්පදා නිර්දේශයෙහි විශුද්ධියට පමුණුවන්නා වූ ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය ම කියනා ලදී. සීලවිසුද්ධි නිර්දේශයෙහි විශුද්ධිප්‍රාප්ත ශීලය කියනා ලදි) යනුවෙන් නික්ෂේප කාණ්ඩ අටුවාවේ දක්වා ඇත. "විසුද්ධිප්පත්තන්ති මග්ගඵලසීලං වුච්චති" (විසුද්ධිපත්තං යන පාලියෙන් මාර්ගඵල ශීලය කියනු ලැබේ) යැයි මූලටීකාවේ තවදුරටත් විස්තර කර ඇත. මේ අටුවා ටීකා විවරණයන් පදනම් කරගෙන සීලසම්පදා පදය සඳහා ලෞකික සීලය ද, සීලවිසුද්ධි සඳහා ලෝකෝත්තර සීලය ද ස්වරූපාර්ථ සඳහා ගෙන ඇත.

සීල විසුද්ධි ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝකෝත්තර සිත් අට දෙන ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද ලැබෙන්නාහ. දෙවැනි පදයට වනාහි, කම්මස්සකතා ඥාණය ද, මස්තකප්‍රාප්ත විදර්ශනා ඥාන සංඛ්‍යාත සත්‍යානුලෝමික ඥානය ද, ලෝකෝත්තර මාර්ග ඵල ඥාන අට දෙන ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු) ලෞකික සිත් 81, කම්මස්සකතා ඥානය, සච්චානුලෝමික ඥානය නම් වූ විදර්ශනා ඥාන හැර චෛතසික 52, රූප 28 සහ නිර්වාණය දුකමුක්ත ය.[94]

දිට්ඨිවිසුද්ධි - (නිබ්බානසංඛාතං විසුද්ධි පාපෙතුං සමත්ථා දස්සනසංඛාතා දිට්ඨියා විසුද්ධි = දිට්ඨිවිසුද්ධි). නිර්වාණ සංඛ්‍යාත විසුද්ධියට පැමිණ වීමට සමත් වූ ඥානය ම දිට්ඨි විසුද්ධි නම් වේ.

94. **කම්මස්සකතා ඤාණය** - මෙය තමාට අයත් ය, මෙම කර්මය තමාට අයත් නො වේ ය යනුවෙන් බෙද දැනගන්නා වූ ප්‍රඥාව කම්මස්කතා ඤාණය යි.

මෙම තමාට අයත් සහ තමාට අයත් නොවන යන දෙක අතරින් තමා විසින් සිදුකරන ලද්දක් වේවා, වෙනත් කෙනෙකු සිදු කරන ලද්දක් වේවා සියළු අකුසල කර්මයන් තමාට අයත් වූවක් නො වේ. කවර හේතුවක් නිසා ද යත් ඒවා විසින් යහපත නැති කරවන බැවින් ද අනර්ථයන් ඇති කරවන බැවිනි. කුසල කර්ම අනර්ථයන් නසන බැවින් ද යහපත ඇති කරවන බැවින් ද ස්වකීය වූවකි.

ධනවත් වූ භවභෝග සම්පත් ඇති පුරුෂයෙක් දුර ගමනක් යෑමට මාර්ගයට පිළිපන් කල්හි අතරමග ගම් නියම්ගම්වල නැකැත් සෝෂා කළ විට "මම ආගන්තුකයෙක්මි. කවරෙක් නිශ්‍රය කරගෙන නැකත් කෙළින්නෙම් ද" යැයි නොසිතා යම් යම් ආකාරයකින් නැකැත් කෙළියට කැමති වේ ද ඒ ආකාරයට නැකැත් කෙළිමින් දුෂ්කර මාර්ගය තරණය කරයි. මේ ආකාරයට මෙම කම්මස්සකතා ඤාණයෙහි පිහිටා බොහෝ වට්ටගාමී කර්ම රැස්කොට සුවසේ ඒවායේ විපාක විඳ අර්හත් ඵලයට පැමිණියා වූ සත්තවයෝ ගණනපථය ඉක්මවූහ. - අට්ඨකථා

සීල විසුද්ධි දුකයයි.

38. දිට්ඨි විසුද්ධි දුකය

දිට්ඨි විසුද්ධි ඛො පන යථා දිට්ඨිස්ස ච පධානං.

දිට්ඨි විසුද්ධි ඛො පන - සම්‍යක් දෘෂ්ඨියගේ සුවිශේෂ පිරිසිදු බව නම් වූ දිට්ඨි විසුද්ධි ධර්මයක් ද ඇත්තේය.

යථා දිට්ඨිස්ස ච පධානං - විශේෂයෙන් සුවිසුද්ධ වූ සම්‍යක් දෘෂ්ඨියට අනුරූප වූ සම්‍යක් ප්‍රධාන වීර්යය නම් වූ ධර්මයක් ද ඇත්තේය.[95]

දිට්ඨි විසුද්ධි ඛො පන - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, කම්මස්සකතා ඥාණය ද, මස්තකප්‍රාප්ත විදර්ශනා ඥාන සංඛ්‍යාත සත්‍යානුලෝමික ඥානය ද, මාර්ග ඵල ඥාන අට දෙනා ද ලැබෙන්නාහ. දෙවැනි පදයට වනාහි, යථෝක්ත සතරාකාර ප්‍රඥාව ද, ඥාන සම්ප්‍රයුක්ත මහා කුශල මහා ක්‍රියා සිත්

(වට්ටගාමීකම්මං - "කුසල කර්මයන් ස්වකීය ය" යැයි දැනගන්නා වූ ඥානය, කර්මය කර්මඵලය අදහන ඥානය යන ඥානයන්ගෙන් සමන්විත පුද්ගලයා එක් භවයකදී භුක්ති විඳීමට හැකි ප්‍රමාණයට වඩා භව රාශියක දී භුක්ති විඳිය හැකි අනේකවිධ කුසල කර්ම විචිත්‍රාකාරයෙන් සිදු කරයි. එසේ සිදුකරන ලද කර්ම බොහෝ සෙයින් ලොව පවතින්නා වූ අබුද්ධෝත්පාද කාලවල දී නිර්වාණ සම්පත්තිය ලබා නොදෙන බැවින් සංසාර වෘත්තයෙහි යොදවන වට්ටගාමිණී කර්මයක් වුව ද, සත්පුරුෂයන් සමඟ ඇසුරු කිරීමට ලැබෙන බුද්ධෝත්පාද කාලවල දී විවට්ටගාමී කර්මයන්ට උපනිශ්‍රය වන බැවින් (වට්ටගාමී කර්මය විවට්ටගාමී කර්මයට ප්‍රකෘති උපනිශ්‍රය ශක්තියෙන් ප්‍රත්‍ය වන බැවින්) "අර්හත් ඵලයට පැමිණියා වූ සත්වයෝ ගණනපථය ඉක්මවූහ" යැයි අටුවාචාරීන් වහන්සේ දැක්වූහ).

95. **යථා දිට්ඨිස්ස ච පධානං** - (අනුරූපං දිට්ඨි යස්සා'ති = යථාදිට්ඨි). වීර්යයට අනුරූප වන්නා වූ ඥානයකින් හෙබි පුද්ගලයාගේ එම ඥානය සමඟ යෙදෙන්නා වූ වීර්යය "යථාදිට්ඨස්සපධාන" නම් වේ.

අටෙහි සහ ලෝකෝත්තර සිත් අටෙහි යෙදෙන්නා වූ වීර්ය චෛතසික සොළස ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු). සිත් 89, දුකයෙහි ස්වරූපාර්ථ වන්නා වූ ප්‍රඥාව සහ වීර්යය හැර චෛතසික 52, රූප 28 සහ නිර්වාණය දුක මුක්ත ය.

දිට්ඨි විසුද්ධි දුකයයි.

39. සංවේජනීයට්ඨාන දුකය

සංවෙගො ච සංවෙජනීයෙසු ඨානෙසු - සංවිග්ගස්ස ච යොනිසො පධානන්ති.

සංවේජනීයෙසු ඨානෙසු සංවේගො ච - සංවේග විය යුතු වූ ජාති ජරා ව්‍යාධි මරණාදී කාරණයක් ඇති කල්හි, සංවේග වීම නම් වූ ධර්මයක් ද ඇත්තේය.

සංවිග්ගස්ස ච යොනිසො පධානං - සංවේගයට පත් වූ පුද්ගලයෙකු විසින් නුවණින් වඩන වීර්යය නම් වූ ධර්මයක් ද ඇත්තේය.[96]

---

96. **සංවේජනීයෙසු ඨානෙසු සංවේගො ච** - (සංවිජ්ජති එතෙනා'ති = සංවෙගො). සංවේගයට පත් කරන්නා වූ ජාති ජරා ආදිය නිසා භයට පත්වීම නම් වූ ඔත්තප්පය ප්‍රධාන වූ ඤාණය "සංවෙග" නම් වේ. දෙවන නය ක්‍රමයෙන් ඔත්තප්පය ම "සංවෙග" නම් වේ. (සංවෙගො'ති සහොතප්පඤාණං; ඔත්තප්පමෙව-මූලටීකා; සහොත්තප්පං ඤාණන්'ති ඔත්තප්පස්ස ඤාණප්පධානතං ආහ, න පන ඤාණස්ස ඔත්තප්පසහිතතාමත්තං. න හි ඔත්තප්පරහිත තං ඤාණං අත්ථී'ති).

ඤාණ විප්‍රයුක්ත වූ ඔත්තප්පයක් ද ඇති බැවින් "ඔත්තප්පමෙව වා" යනුවෙන් නැවතත් දෙවන නය ක්‍රමයේදී ටීකාචාර්යයන් වහන්සේ විවරණය කළහ.

පටුන වෙත

සංවේගො ච සංවෙජනීයෙසු ඨානෙසු - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, සංවේග වස්තුවක් ඇති කල්හි උපදින්නා වූ ඥාන සම්ප්‍රයුක්ත මහා කුශල් සිත් සතරෙහි ප්‍රඥා චෛතසික සතර ලැබෙන්නාහ. දෙවැනි පදයට වනාහි, කුශල් සිත් එක් විස්සෙහි ද, ඵල සිත් සතරෙහි ද යෙදුනා වූ වීර්ය චෛතසික පස්විසි දෙනා ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු). සිත් 89, සංවේග ප්‍රඥාව වන කුසල් සිත් 21, ඵල සිත් සතරෙහි ඇති සම්මා වායාම හැර චෛතසික 52, රූප 28 සහ නිර්වාණය දුක මුක්ත ය.

සංවේජනීයට්ඨාන දුකයයි.

මෙම සංවෙගය ජාති ආදී භයට පත්විය යුතු හේතු නිසා ඇතිවන ඥානයයි. සතුරෙකු නිසා ඇතිවන භය සංවේගයක් නො වේ. ද්වේෂය, දෝමනස්සය වේ.

(සංවෙජෙතී'ති = සංවෙජනං; සංවෙජනමෙව සංවෙජනීයං). භයට පත්කරවන්නා වූ ජාති ආදිය "සංවෙජනීය" නම් වේ. දක්වා ඇති ආකාරයට අනුව මෙම ස්ථානයේදී ද ඨාන ශබ්දය "හේතු" අර්ථය ප්‍රකාශ කරයි. භයට පත් කරවන්නා වූ ජාති ආදී හේතුන් නිසා භයට පත්වීම නම් වූ සහොත්තප්ප ඤාණය "සංවෙගොච සංවෙජනියෙසු ඨානෙසු" නම් වේ.

සංවිග්ගස්ස ච යොනිසො පධානං - (සංවෙජතී'ති = සංවිග්ගො). ජාති ආදිය හේතුවෙන් භයට පත්වන්නා වූ පුද්ගලයා "සංවිග්ග" නම් වේ. (පදහන්ති එතෙනාති = පධානං). වීර්යය "පධාන" නම් වේ. "යොනි" ශබ්දය 'සුදුසු පරිදි' යන අර්ථය ප්‍රකාශ කරයි.

ජාති ආදිය නිසා භයට පත්වන්නා වූ පුද්ගලයා සුදුසු පරිදි නුවණින් යුතුව සිදුකරන වීර්යය "සංවිගස්ස ච යොනිසො පධානං" නම් වේ.

ඇතැම් පුද්ගලයෝ භයට පත් වන්නා වූ අවස්ථාවල දී සියදිවි හානි කරගැනීමට තැත් කරත්. මෙබඳු අධාර්මික වීර්යයන් ඇති බැවින් "යොනිසො" යන පදය ඇතුලත් කොට වදාළ සේක.

40. අසන්තුට්ඨිතා දුකය

අසන්තුට්ඨිතා ච කුසලෙසු ධම්මෙසු - අප්පටිවාණිතා ච පධානස්මිං.

අසන්තුට්ඨිතා ච කුසලෙසු ධම්මෙසු - දාන සීල භාවනාදී කුශල ධර්මයන්හි තෘප්තියකට සෑහීමකට පත් නොවීම නම් වූ අසන්තුට්ඨිතා ධර්මයක් ද ඇත්තේය.

අප්පටිවාණිතා ච පධානස්මිං - සීල සමාධි ප්‍රඥාදී කුශල ධර්මයන් වැඩීමෙහි නොපසුබස්නා උත්සාහ ස්වභාව නම් වූ අප්පටිවාණිතා ධර්මයක් ද ඇත්තේය.[97]

අසන්තුට්ඨිතා ච කුසලෙසු ධම්මෙසු - යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, කුශල් සිත් එක් විස්ස ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද ලැබෙන්නාහ. දෙවැනි පදයට

---

97. **අසන්තුට්ඨිතා ච කුසලෙසු ධම්මෙසු** - (තුස්සනං = තුට්ඨි; සම්මා තුට්ඨි-සන්තුට්ඨි; නත්ථි සන්තුට්ඨි එතස්සා'ති = අසන්තුට්ඨි; අසන්තුට්ඨස්ස භාවො = අසන්තුට්ඨිතා). කුශල ධර්මයන්හි තෘප්තියකට පත් නොවන නිදහස් නොවන පුද්ගලයාගේ ස්ථානය වන්නා වූ කුසල චිත්තෝත්පාදය "අසන්තුට්ඨිතාච කුසලෙසු ධම්මෙසු" නම් වේ.

අප්පටිවානිතා ච පධානස්මිං - (පටිවනීයතෙ = පටිවනො; පටිවනො අස්ස අත්ථී'ති = පටිවානී; න පටිවානී = අප්පටිවානී; අප්පටිවානිනො භාවො = අප්පටිවානිතා; වනු ධාතුව 'ව්‍යාපාර' අර්ථය ප්‍රකාශ කරයි; වන (භූ-ව්‍යාපාරෙ; ධාත්වත්ථසඞ්ගහ; පටිවනීයතෙ - විරුද්ධ දිශාවට හැරේ; වා - පසුබසිනු ලැබේ). නොපසුබස්නා වීර්යයකින් යුතුව ඉදිරියට යා යුතුව තිබිය යුතු අවස්ථාවේදී වීර්යය වැඩීම නතර කොට පසුබැසීම "අප්පටිවාන" නම් වේ.

අර්හත් මාර්ගයට පැමිණීම තෙක් කර්මස්ථානයන් වැඩීමේදී පසුබැස්මක් නොමැති බවට ස්ථානය වන්නා වූ සම්මා වායාමය "අප්පටිවානිතාච පධානස්මිං" නම් වේ.

පටුන වෙත

වනාහි, කුශල් සිත් එක් විස්සෙහි යෙදුනා වූ වීර්ය චෛතසික එක්විසි දෙනා ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු). අකුසල් සිත් 12, විපාක සිත් 36, ක්‍රියා සිත් 20, චෛතසික 52, රූප 28 සහ නිර්වාණය දුකමුක්ත ය.

අසන්තුට්ඨිතා දුකයයි.

41. විජ්ජා දුක

විජ්ජා ච - විමුක්ති චාති.

විජ්ජා ච - ධර්මස්වභාවයන් විවිධාකාරයෙන් විනිවිද දක්නා අර්ථයෙන් විජ්ජා නම් වූ ධර්මයක් ද ඇත්තේය.[98]

විමුත්ති ච - උත්තරීමනුෂ්‍ය ධර්මයන්ට සතුරු වූ නීවරණාදී උපක්ලේශයන් ගෙන් මනාසේ මිදුනා වූ අෂ්ඨ සමාපත්ති නම් වූ විමුක්තියක් ද, සකලක්ලේශයන් කෙරෙන් සර්වාකාරයෙන් මිදුනා වූ නිර්වාණ ධාතුව නම් වූ විමුක්ති ධර්මයක් ද ඇත්තේය.

විජ්ජා ච - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, පූර්වේනිවාසානුස්මෘති ඥනය ද, දිව්‍යං චක්ෂුරහි ඥනය ද, ආශ්‍රවක්ෂයකර ඥනය ද ලැබෙන්නාහ. දෙවැනි පදයට වනාහි, මහත්ගත කුශල් සිත් නවය ද, ක්‍රියා සිත් නවය ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික පන්තිස ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු). කාමාවචර සිත් 54, මහද්ගත විපාක සිත් 9, ලෝකෝත්තර සිත් 8, ත්‍රිවිද්‍යාවන් හැර චෛතසික 52, රූප 28 සහ නිර්වාණය දුකමුක්ත ය.

විජ්ජා දුකයයි.

42. බයෙ ඤාණ දුකය

බයෙ ඤාණං - අනුප්පාදෙ ඤාණන්ති.

---

98. **විජ්ජා ච** - (විදති ජානාතී'ති = විජ්ජා). විශේෂයෙන් දැනගන්නා වූ ත්‍රිවිද්‍යාවන් "විජ්ජා" නම් වේ. ත්‍රිවිද්‍යාවන් පිළිබඳව විජ්ජාභාගී දුකයේදී දක්වන ලදී.

ඛයෙ ඤාණං - සමුච්ඡේද ප්‍රහාණයෙන් කෙලෙසුන් ගෙවා දැමීමට සමත් වූ මාර්ග ඥන නම් වූ, ඛයේ ඤාණ ධර්මයක් ද ඇත්තේය.

අනුප්පාදෙ ඤාණං - සතර මාර්ග ඥනයෙන් නැසූ කෙලෙසුන් නැවත නූපදනා බවට පමුණුවන්නා වූ සතර ඵලයෙහි යෙදුනා වූ ප්‍රඥව නම් වූ, අනුප්පාදේ ඤාණ ධර්මයක් ද ඇත්තේය.[99]

ඛයෙ ඤාණං - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, සතර මාර්ග සිත්හි යෙදුනා වූ, ප්‍රඥ චෛතසික සතර දෙනා ලැබෙන්නාහ. දෙවැනි පදයට වනාහි, සතර ඵල සිත්හි යෙදුනා වූ ප්‍රඥ චෛතසික සතර දෙන ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකම සංස්කාරස්කන්ධයකි, ආයතන වශයෙන් එකම ධර්මායතනයකි, ධාතු වශයෙන් එකම ධර්ම ධාතුවකි, ආර්ය සත්‍ය වශයෙන් සතර මාර්ග ඥනය එකම මාර්ග සත්‍යයකි. සතර ඵල ඤාණයෝ සත්‍ය විනිර්මුක්ත වන්නාහ. සිත් 89, මාර්ග ඥාන ඵල ඥාන හැර චෛතසික 52, රූප 28 සහ නිර්වාණය දුකමුක්ත ය.

මේ ශබ්දවලිය හෙවත් ඛයේ ඤාණ දුකය, පරමාර්ථ ධර්ම දෙපදයකින් වදළ බැවින් දුක නම් වන්නේය. මුල පදයෙන් ලත් නම් ඇති බැවින් ආදි ලබ්ධ නාම දුක නම් වන්නේය. මාර්ග ඵල ඥන පමණක් ලැබෙන බැවින් සප්පදේස දුක නම් වන්නේය.

ඛයේ ඤාණ දුකයයි.

---

99. **ඛයෙ ඤාණං** - (කිලෙසා ඛීයන්'ති එතෙනාති = ඛයො). ක්ලේෂයන්ගේ ක්ෂය වීමේ හේතුව වන්නා වූ අර්හත් මාර්ගය "ඛය" නම් වේ. ඒ ක්ලේෂයන්ගේ ක්ෂය වීම පිණිස ආර්ය මාර්ගයේ ඇති සම්මාදිට්ඨිය "ඛයෙ ඤාණ" නම් වේ.

අනුප්පාදෙ ඤාණං - (උප්පජ්ජති එතෙනා'ති = උප්පාදො; න උප්පාදො=අනුප්පාදො). ප්‍රතිසන්ධි වශයෙන් අනුත්පාදයට හේතු වූ ඒ ඒ මාර්ගයෙන් නසනා ලද ක්ලේෂයන්ගේ අනුත්පාදය සිදුකරන්නා වූ මාර්ගය අවසානයේදී උපන් ආර්යඵල ඥානයයි. ආර්ය ඵලයේ ඇති සම්මා දිට්ඨිය "අනුප්පාදෙ ඤාණ" නම් වේ.

පටුන වෙත

සූත්‍රාන්තික දුක පිළිබඳව - සූත්‍රාන්තික දුක දෙසාළිස අතරින් නාමරූප දුකය, සතිසම්පජඤ්ඤ දුකය, සමථවිපස්සනා දුකය යන මෙම දුක තුන සර්වලබ්ධනාම දුක වේ. සෙසු දුක තිස්නවය ආදිලබ්ධ නාම දුකයන් වේ. අධිවචන දුකය, නිරුත්ති දුකය, පඤ්ඤත්ති දුකය, නාමරූප දුකය යන මෙම දුක සතර නිෂ්ප්‍රදේශ දුක නම් වේ. සෙසු දුක තිස් අට සප්‍රදේශ දුක වේ.

සුත්තන්තික දුකමාතිකා නිමි

පටුන වෙත

සුත්තන්තික දුක මාතිකා - අභ්‍යාස

1. සුත්තන්තික දුක මාතිකාවන්හි පැමිණි දුක දෙසාළිස පිළිවෙළින් ලියා දක්වන්න.
2. සුත්තන්තික දුක මාතිකා කවර ප්‍රයෝජනයක් පිණිස, කවර ආකාරයකින්, කවරෙකු විසින් තබනා ලද්දේ ද?
3. සුත්තන්තික මාතිකා ධම්මසඞ්ගණියේ විස්තර කරනුයේ කවර කාණ්ඩයේදී ද?

1. විජ්ජාභාගී ආදී දුක පඤ්චකය

1. විජ්ජා, විජ්ජාභාගී, අවිජ්ජා, අවිජ්ජාභාගී යන පදයන්ගේ ස්වරූපාර්ථ වෙන් වෙන් වශයෙන් දක්වන්න.
2. මෝහයන් සතර ලියා දක්වන්න.
3. විද්‍යාවන් අට ලියා දක්වන්න.
4. "විපස්සනාඤාණ" යනු කවරේද?
5. "මනොමයිද්ධි" යනු කවරේද? එසේ කීමට හේතුව දක්වා "මනොමයිද්ධි" සඳහා ස්වරූපාර්ථ දක්වන්න.
6. "ඉද්ධිවිධඤාණ" යනු කවරේද?
7. "පරචිත්තවිජානන" යනු කවරේද? එය සඳහා භාවිතා වන සෙසු නම් ද හේතු සහිතව දක්වන්න.
8. "පුබ්බෙනිවාසානුස්සති අභිඥාව" යනු කවරේද?
9. "දිබ්බචක්ඛු" යනු කවරේද? ඒ සඳහා ඇති වෙනත් නම් හේතු සහිතව පැහැදිලි කරන්න.
10. "දිබ්බසෝත" යනු කවරේද?
11. "ආසවක්ඛයඤාණ" යනු කවරේද?
12. සෝවාන් මාර්ගය විදුලියකට උපමා කරන්නේ ඇයි?
13. අර්හත් මාර්ගය වජ්‍රයකට උපමා කරන්නේ ඇයි?

පටුන වෙත

14. කවර ධර්මයන් "බාල" සහ "බාලධම්ම" වේද? වෙන් වෙන් ව විස්තර කරන්න.

15. කවර ධර්මයන් "පණ්ඩිත" සහ "පණ්ඩිතධම්ම" වේද? වෙන් වෙන් ව විස්තර කරන්න.

16. අකුසල ධර්මයන් කවර හේතුවක් නිසා "කණ්හ" යනුවෙන් ප්‍රකාශ කරන්නේද?

17. කුසල ධර්මයන් "සුක්ක" යනුවෙන් හඳුන්වනුයේ ඇයි? විස්තර කරන්න.

18. "තපනීය" සහ "අතපනීය" පදයන්ගෙන් අදහස් කරනුයේ කුමක්ද?

2. අධිවචන ආදී දුක පඤ්චකය

1. අධිවචන දුකයේ ප්‍රථම පදයේ අර්ථය, ස්වරූපාර්ථයන් සහ ස්කන්ධාදිය බෙදා දක්වන්න.

2. කවර ශබ්ද විශේෂයක් "අධිවචන" යනුවෙන් කියනු ලබන්නේද? හේතු දක්වන්න.

3. "අධිවචනපථ" යනු කවරේද?

4. නාම වර්ග සතර ලියා දක්වන්න.

5. ශබ්ද ප්‍රඥප්ති සය විස්තර කරන්න.

6. නිරුත්ති, නිරුත්තිපථ, පඤ්ඤත්ති, පඤ්ඤත්තිපථ යන ධර්මයන් දක්වන්න.

7. කවර ධර්මයන් "නාම" යැයි හඳුන්වනු ලබන්නේද? හේතු සහිතව පැහැදිලි කරන්න.

8. "නාමය පණවා ගැනීමට හැකි බැවින් නාම වේ ය" යැයි කිවහොත් පඨවී ආදී රූප ධර්මයන්ට "නාම" යැයි නොකියා නාමස්කන්ධයන් සතර සහ නිර්වාණයට ම පමණක් "නාම" යැයි කියනු ලබන්නේ කවර හේතුවක් නිසා ද? විස්තර කරන්න.

9. "අරමුණට නමන බැවින්" යන්නෙන් අදහස් කරනුයේ කුමක්ද?

10. කවර ධර්මයන් "රූප" යනුවෙන් හඳුන්වනු ලබන්නේද?

11. අවිජ්ජා පදයේ අර්ථයන් සහ භවතණ්හා පදයේ අර්ථය ද ලියා දක්වන්න.

3. විජ්ජාභාගී ආදී දුක පඤ්චකය

1. භවදිට්ඨි, විභවදිට්ඨි යනුවෙන් අදහස් වනුයේ කුමක්ද?

2. සස්සතදිට්ඨි, උච්ඡේදදිට්ඨි, අන්තවාදිට්ඨි, අනන්තවාදිට්ඨි පදයන්ගෙන් අදහස් වනුයේ කුමක්ද?

3. පුබ්බන්තානුදිට්ඨි, අපරන්තානුදට්ඨි පදයන්ගෙන් අදහස් වනුයේ කුමක්ද?

4. අහිරික, අනොත්තප්ප පදයන්ගෙන් අදහස් වනුයේ කුමක්ද?

4. විජ්ජාභාගී ආදී දුක පඤ්චකය

1. හිරී, ඔත්තප්ප පදයන්ගෙන් අදහස් වනුයේ කුමක්ද?

2. දොවචස්සතා, පාපමිත්තතා පදයන්ගෙන් අදහස් වනුයේ කුමක්ද?

3. සොවචස්සතා, කළ්‍යාණමිත්තතා පදයන්ගෙන් අදහස් වනුයේ කුමක්ද?

4. මාතිකාවන්හි පැමිණි ආපත්ති, පදභාජනීය සහ ඛන්ධක වල ඇති ආපත්ති දක්වන්න.

5. ආපත්ති කුසලතා, ආපත්ති වුට්ඨාන කුසලතා පදයන්ගෙන් අදහස් වනුයේ කුමක්ද?

6. සමාපත්ති කුසලතා සඳහා ස්වරූපාර්ථ දක්වා ස්කන්ධාදි බෙදා දක්වන්න.

7. කවරක් සමාපත්ති යන නමින් හැඳින්වේද? ඒවායේ ප්‍රභේද දක්වන්න.

8. සමාපත්ති කුසලතා සහ සමාපත්ති පදයන්ගෙන් අදහස් වනුයේ කුමක්ද?

5. ධාතු කුසලතා ආදී දුක පඤ්චකය

1. ධාතු කුසලතා, මනසිකාර කුසලතා පදයන්ගෙන් අදහස් වනුයේ කුමක්ද?

2. ආයතන කුසලතා, පටිච්චසමුප්පාද කුසලතා පදයන්ගෙන් අදහස් වනුයේ කුමක්ද?

3. ධාතු කුසලතා ආදියෙහි ලැබිය යුතු ප්‍රඥාවෙහි ප්‍රභේද සය දක්වා එය ලෞකික සහ ලෝකෝත්තර වශයෙන් බෙදා දක්වන්න.

4. ඨාන කුසලතා, අට්ඨාන කුසලතා පදයන්ගෙන් අදහස් වනුයේ කුමක්ද?

5. අජ්ජව, මද්දව, ඛන්ති, සොරච්ච පදයන්ගෙන් අදහස් වනුයේ කුමක්ද?

6. සාඛල්‍ය ආදී දුක පඤ්චකය

1. සාඛල්‍ය, පටිසන්ථාර පදයන්ගෙන් අදහස් වනුයේ කුමක්ද?

2. ආමිස, ධම්ම පදයන්ගෙන් අදහස් වනුයේ කුමක්ද? විස්තර කරන්න.

3. ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා පදය අර්ථ දක්වා ඒ සඳහා කවර ධර්මයන් ස්වරූපාර්ථ වශයෙන් දැක්විය යුතුදැයි හේතු සහිතව පැහැදිලි කරන්න.

4. භොජනෙ අමත්තඤ්ඤුතා පදයෙන් අදහස් වනුයේ කුමක්ද?

5. ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා, භොජනෙ මත්තඤ්ඤුතා පදයේ අර්ථය සහ ස්වරූපාර්ථ දක්වන්න.

6. මුට්ඨසච්ච, අසම්පජඤ්ඤ, සති, සම්පජඤ්ඤ පදයන්ගෙන් අදහස් වනුයේ කුමක්ද?

7. පටිසඞ්ඛාන බල ආදී දුක පඤ්චකය

1. පටිසඞ්ඛාන බල, භාවනා බල පදයන්ගෙන් අදහස් වනුයේ කුමක්ද?

2. පටිසඞ්ඛාන බල පදයේ කවර හේතුවක් නිසා "බල" ශබ්දය සම්බන්ධ කොට දේශනා කළ සේක්ද?

3. සමථ, විපස්සනා, සමථ නිමිත්ත, පග්ගාහ නිමිත්ත පදයන්ගෙන් අදහස් වනුයේ කුමක්ද?

4. පග්ගාහ, අවික්ඛෙප, සීලවිපත්ති, දිට්ඨිවිපත්ති පදයන්ගෙන් අදහස් වනුයේ කුමක්ද?

8. සීලසම්පදා ආදී දුක සප්තකය

1. සීල සම්පදා, දිට්ඨිසම්පදා පදයන්ගෙන් අදහස් වනුයේ කුමක්ද?

2. හේතු ශීලය සහ ඵල ශීලය සීල සම්පදා සඳහා ගතයුත්තේ ඇයි? පැහැදිලි කරන්න

3. සීලවිසුද්ධි, දිට්ඨිවිසුද්ධි පදයන්ගෙන් අදහස් වනුයේ කුමක්ද?

4. නික්ෂේප කාණ්ඩ පාලියෙහි සමාන වුවද සීලසම්පදා සඳහා ලෞකික ශීලය ද සීලවිසුද්ධි සඳහා ලෝකෝත්තර ශීලය ද ගැනීමට හේතුව කුමක්ද?

5. කම්මස්කතා ඥානය යනු කුමක්ද?

6. "යථාදිට්ඨස්සච පධානං" යන පදයෙන් අදහස් වනුයේ කුමක්ද?

7. "සංවෙජනීයට්ඨාන, සංවෙග" යැයි කවර හේතුන් නිසා කියනු ලබන්නේද? වෙන් වෙන් ව පැහැදිලි කරන්න.

8. සතුරෙක් භයකිරීම "සංවෙග" යැයි කියනු ලබන්නේද? කවර හේතුවක් නිසා සංවෙග යැයි කියනු ලබන්නේද?

9. සංවිගස්සච යොනිසො පධානං යන්නෙහි "සංවිග්ග, පධාන" යැයි කවර හේතුන් නිසා කියනු ලබන්නේද? වෙන් වෙන් ව පැහැදිලි කරන්න.

10. සංවිගස්සච යොනිසො පධානං පදයට ඇතුලත් 'යොනිසො' ශබ්දය ඇතුලත් කිරීමට හේතුව පැහැදිලි කරන්න.

11. "අසන්තුට්ඨීතාව කුසලෙසු ධම්මෙසු" යන පදයෙන් අදහස් වනුයේ කුමක්ද?

12. අප්පටිවානිතාව පධානස්මිං පදයෙහි "පටිවාන" යැයි කවර හේතුවක් නිසා වේදැයි දක්වා සම්පූර්ණ පදයේ ම අර්ථය දක්වන්න.

13. විජ්ජා, විමුත්ති පදයන්ගෙන් අදහස් වනුයේ කුමක්ද?

14. ඛයෙඤාණං යන්නෙහි ඛය, ඛයෙඤාණ පදයන්ගෙන් අදහස් වනුයේ කුමක්ද?

15. අනුප්පාදෙඤාණං යන්නෙහි අනුප්පාද, අනුප්පාදෙඤාණ පදයන්ගෙන් අදහස් වනුයේ කුමක්ද?

16. සුත්තන්තික මාතිකා වල සර්වලබ්ධ නාම දුක, ආදිලබ්ධ නාම දුක, නිෂ්ප්‍රදේශ දුක, සප්ප්‍රදේශ දුක දක්වන්න.

- දුක මාතිකා ස්වරූපාර්ථ නිමි -

අභිධර්ම මාතිකා අධ්‍යයන ප්‍රවේශය නිමි

පටුන වෙත

අභිධර්ම මාතිකා අධ්‍යයන ප්‍රවේශය

බුරුමයේ උතුරු ශැන් ප්‍රාන්තයේ නෞන්ජෝ නගරයේ ත්‍රිපිටක කාම්හෝජ විහාරයෙහි වැඩ වාසය කරමින් බුද්ධ දේශිත ශ්‍රී සද්ධර්මයෙහි ඇතුළත් අභිධර්ම දේශනා පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගනු පිණිස මහදුත්සාහයෙන් කැපවීමෙන් කටයුතු කරන ත්‍රිපිටකාචාර්ය, ශාස්ත්‍රපති පූජ්‍ය කඩුවෙල අතුලඤාණ ස්ථවිරපාදයන් වහන්සේ මීට පෙර ද කරන ලද ධර්ම ශාස්ත්‍රීය සේවාවන් වෙනුවෙන් අප නිකායේ ගෞරවයට සම්භාවනාවට පාත්‍ර වූ හිමි නමකි. මියන්මාරයේ අධ්‍යයන-අධ්‍යාපන කාර්යයන්හි නිරත වන උන්වහන්සේ ,අභිධර්ම මාතිකා අධ්‍යයන ප්‍රවේශය, නමින් නවතම ග්‍රන්ථයක් නිකුත් කොට ඇත. අභිධර්ම මාතෘකාවන්හි ස්වරූපාර්ථයන් මැනවින් වටහාගනු හැකිවන පරිදි මියන්මාරයේ ප්‍රචලිතව ඇති අර්ථකථන ක්‍රමවේදයන් ද සැලකිල්ලට ගනිමින් අභිධර්මාචාර්යවරුන්ගේ විස්තර කථනයන් කෙරෙහි ද අවධානය යොමු කරමින් ථෙරවාද මහා විහාරීය සම්ප්‍රදාය ම අනුගමනය කරමින් සිදු කර ඇති ශාසන සංග්‍රහය පිළිබඳව උන්වහන්සේට අපගේ කෘතඥතාවත් ආශීර්වාදයත් පළ කළ යුතුය.

අභිධර්ම මාතිකා හොඳින් අධ්‍යයනය කොට ධම්මසංගණී ප්‍රකරණය පහසුවෙන් අවබෝධ කර ගැනීමට උපස්ථම්භක වේය යන අදහසින් මෙම ග්‍රන්ථය සම්පාදනය කළ බව අතුලඤාණ ස්ථවිරයන් වහන්සේ සිය සංඥාපනයෙහි සඳහන් කොට ඇත. එසේ ම අපේ අතිපූජණීය නාදයනේ අරියධම්මාභිධාන අනුනායක ස්වාමීන්දයන් වහන්සේගේ අභිධර්ම ග්‍රන්ථයන්හි සැලැස්ම හා අර්ථකථන ක්‍රමවේදයන් ද අනුගමනය කළ බව ද ගෞරවයෙන් දන්වා ඇත.

අභිධර්මීය විෂයෙහි සුවිශේෂී නිපුණතාවයකින් යුත් උන්වහන්සේගේ මෙම ප්‍රයත්නය ධර්මාවබෝධයෙහි උත්සුක සාධූන්ගේ ප්‍රසාදය පිණිස හේතු වේවා.

අග්ගමහා පණ්ඩිත
මකුලෑවේ ශ්‍රී විමල මහ නාහිමි
(ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ අතිපූජ්‍ය මහානායක)
විද්‍යාවාස පිරිවෙන් විහාරය
මිණිඔළුව-මීරිගම
2023/01/01

Theravada Publications Society Limited.
Saddhathissarama Mahaviharaya,
Madagammana Mawatha,
Katukeliyawa, Anuradhapura,
Sri Lanka, 5006.

9 786246 357016

ISBN 978-624-6357-00-9